පටුන

මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ භාවිතයට පහසු යුනිකෝඩ අකුරු ක්‍රමයට සකසා http://pitaka.lk වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# ඛුද්දක නිකාය

# 4

10. ජාතක. 11. නිද්දෙස පාළි.

ධර්මවිනය උගත් පණ්ඩිත
මහාස්ථවිරයන් වහන්සේලාගේ
ආධාර ඇතුව

ආචාර්ය්‍ය අධිනීතිඥ
ඒ. පී. ද සොයිසා මහතා
විසින්
සිංහලට පරිවර්තනය කරන ලදී.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# අනුශාසක මණ්ඩලය

පැලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යොදය පිරිවෙනේ B.A., PH.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

අම්බලම්ගොඩ මහා විහාරස්ථ විද්‍යාලොක විද්‍යාලයාධිපති ශ්‍රී සද්ධර්මභාරතීශ්වර පණ්ඩිතාචාර්ය විලේගොඩ ශ්‍රී ධර්මානන්ද මහාස්ථවිරපාදයන් වහන්සේ

වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ මහාචෛතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ

අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්ය‍ය ආර්‍ය්‍යරත්න රේරුකාන මහතා

# ඛුද්දක නිකාය

# 4

10. ජාතක. 11. නිද්දෙස පාළි.

ධර්මවිනය උගත් පණ්ඩිත

**මහාස්ථවිරයන් වහන්සේලාගේ**

ආධාර ඇතුව

**ආචාර්ය්‍ය අධිනීතිඥ**

**ඒ. පී. ද සොයිසා මහතා**

**විසින්**

**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**

**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1956
දෙවැනි මුද්‍රණය - 2014

**ත්‍රිපිටකය**

**ඛුද්දක නිකාය 4**

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.
http://pitaka.lk

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක ‘පාළි’ නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැගීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත් යොමු

කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඤාණවිමල මහානායක ස්ථවිර**

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මඟ පෙන්වූ

මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඥාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මඟ පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2014 පෙබරවාරි

# සංඥාපනය

සූත්‍ර පිටකයේ පස්වෙනි නිකායවූ ඛුද්දක නිකාය කාණ්ඩ පසළොසකින් යුක්තයි. මේ නිකායේ ජාතක කථා ආදී ධර්ම රස ඇතිකරන කථා රාශියක් අන්තර්ගත කර තිබේ. කාව්‍ය රසය දක්වන පද්‍ය රචනා බොහෝ වෙත්. මේ පොතට ඛුද්දක නිකායේ ජාතක කාණ්ඩයේ වෙස්සන්තර ජාතකය සහ නිද්දේස පාළියේ මහානිද්දේසය ඇතුළත් කළෙමි.

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම්වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කරුණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයන් විසින්ද මේ පොත් පිළිවෙළට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක, ශාසන ආලයෙන් ආචාර්ය ආයඹිරත්න රේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයඹිරත්න රේරුකාන මහත්මයාගෙන් ආධාර ලැබුණා පමණක් නොව රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන් වහන්සේද, ඩී. එන්. ඒ. මුදලිගේ මහතාද, ඒ. ඇස්. බී. ඩබ්ලිව්. නානායක්කාර මහතාද, ඇල්. ජී. පෙරේරා මහතාද ආධාර කළෝය.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

28 - 6 - 56.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

*x*

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස **bookmarks** තීරුව භාවිතා කරන්න.

# පටුන

පිට

10 ජාතක
546 වෙස්සන්තර ජාතකය 1479
11. නිද්දෙස පාළිය
මහා නිර්දෙශය
1. කාම සූත්‍ර නිර්දෙශය 1548
2. ගුහට්ඨක සූත්‍ර නිර්දෙශය 1566
3. දුට්ඨට්ටක සූත්‍ර නිර්දෙශය 1597
4. සුඬට්ඨක සූත්‍ර නිර්දෙශය 1613
5. පරමට්ඨක සූත්‍ර නිර්දෙශය 1628
6. ජරා සූත්‍ර නිර්දෙශය 1639
7. මෛත්තෙය්‍ය සූත්‍ර නිර්දෙශය 1653
8. පසුර සූත්‍ර නිර්දෙශය 1669
9. මාගන්දිය සූත්‍ර නිර්දෙශය 1683
10. පුරාභේද සූත්‍ර නිර්දෙශය 1704
11. කලහවිවාද සූත්‍ර නිර්දෙශය 1741
12. චූල වියූහ සූත්‍ර නිර්දෙශය 1765
13. මහා වියූහ සූත්‍ර නිර්දෙශය 1776
14. තුවටක සූත්‍ර නිර්දෙශය 1800
15. අත්තදණ්ඩ සූත්‍ර නිර්දෙශය 1846
16. ශාරිපුත්‍ර සූත්‍ර නිර්දෙශය 1888

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# ඛුද්දක නිකාය

## 10. ජාතක.

### 546 වෙස්සන්තර ජාතකය.

1 සක්දෙව් රජ:- "ඵුසති දෙවීනි, උතුම් වර්ණ හා ආලොක ඇත්තිය, දස වැදෑරුම් වරයක් ගනුව. උතුම් ලකුණින් යුත් තැනැත්තිය යමක් තොපගේ සිතට ප්‍රිය නම් පොළොවින් එය ගනුව."

2 ඵුසති දේවී:- "දිව්‍යරාජය, ඔබට නමස්කාර වේවා. මා විසින් කිනම් පාපයක් කරණ ලද්දේද, ගසක් වාතයෙන් මෙන් මා සිටින යහපත් තැනින් පහකරන්නෙහිද?"

3 "තොප විසින් කරණ ලද පවක් නැත. මට තොප අප්‍රියද නොවේ. මම යමක් නිසා තොපට මෙසේ කියම්ද, එනම් තොපගේ පින ක්ෂය විය.

4 "තොපගේ මරණය ආසන්නයේදී වෙන්වීම වන්නේය. මා විසින් දෙන්නාවූ මේ වර දසය පිළිගනුව"

5 "සියලු සත්වයන්ට අධිපතිවූ සක්දෙව් රජාණෙනි,

ඉදින් මට වරයක් දුන්නෙහි නම්, ඔබට යහපතක් වේවා. ස්වාමීනි, සිවිරජහුගේ මාලිගයෙහි අග්‍ර මහෙෂිකා වන්නෙමි.

6 "සක්දෙව් රජුනි, එහිද නිල්වන් නෙත් ඇති මුව දෙනක මෙන් නිල් බැම ඇති, නිල් ඇස් ඇති ඵුසති යන නමින් වන්නෙමි.

7 "කැමති වස්තු දෙන්නාවූ ඉල්ලීමට යොග්‍යවූ නොමසුරුවූ කීර්ති ඇත්තාවූ යශස් ඇත්තාවූ යටත් රජුන් විසින් පුදන ලද්දාවූ පුත්‍රයකු ලබන්නෙමි.

8 ගැබ දරණ මගේ මැදකොටස උස් නොවේවා. සමව ලියවූ දුන්නක් මෙන් බඩ උස් නොවූවක් වේවා.

9 "සක්දෙව් රජුනි, මාගේ පයෝධර නොඑල්බේවා. පැසුණු කෙස් නොවේවා. ශරීරයෙහි ධූලි නොතැවරේවා. වධයට අසුවූවන් මුදන්නටද හැකිවේවා.

10-11 "ස්වාමීනි මොණරුන් විසින් හෝ කොස්වා ලිහිණියන් විසින් නාද කරණ ලද ශ්‍රෙෂ්ඨ ස්ත්‍රී සමූහයා ගෙන් යුක්තවූ කුදුහුය, සළු වඩන්නෝ යන මොවුන් ගෙන් ගැවසුණු භොජන කාලය දන්වන, සූත මාගධයන් විසින් වර්ණනා කළ, සත්රුවනින් විසිතුරුවූ දොරකවුළුවලින් විසිතුරු ශබ්ද පවත්වන්නාවූ සුරා මස්වලින් ප්‍රබොධ කරවන ජනයා ඇත්තාවූ එහි සිවි රජහුගේ අගමෙහෙසිය වන්නෙමි.

12 "සියලු අංගයෙන් උතුම්වූ යම් ඒ වර දසය මා විසින් දෙන ලදී ඔබ ඒ සියළු වරයන් සිවි රජුගේ රටෙහිදී ලබන්නෙහිය."

13 මඝ නම්වූ සුජාතාවගේ හිමියාවූ දිව්‍යරාජවූ සක්දෙව් රජ මෙසේ කියා ඵුසතියට වර දී සතුටු සිත් ඇත්තේ විය.

14 ඉක්බිති ඒ ඵුසතිතොමෝ ඉන් චුතවූවා ක්ෂත්‍රිය කුලයෙහි උපන්නීය. ජෙතුත්තර නම් නුවර සඤ්ජය සමාගම් වූවාය.

15 "මාස දහයක් දරා නගර ප්‍රදක්ෂිණාව කරන්නී වෙළඳ වීථිය මැද ඵුසති තොමෝ මා වැදුවාය.

16 "මගේ නම, මවු පසට අයත් නොවේ. පිය පසට අයත් නොවේ. වෙළඳ වීථියක උපන්නෙමි. එනිසා වෙස්සන්තර වීය.

17 "යම් කලෙක මම උත්පත්තියෙන් අට හැවිරිදිවූ ළදරුවෙක් වූයෙම්ද, එකල්හි ප්‍රාසාදයෙහි හිඳ දන් දෙන්නට සිතුවෙමි.

18 "ඉදින් යමෙක් මගෙන් ඉල්වන්නේ නම් පපු මස දෙන්නෙමි. ඇස්ද, මස්ද, ලේද, විචාර, ශරීරය පවා දෙන්නෙමි.

19 "නොසෙල්වෙන, නොපිහිටන ස්වභාවය සිතන්නාට මහමෙර හා වන නමැති මුදුන් මල්කඩ ඇති පෘථිවිය කම්පා විය.

20 "බෙහෙවින් වැඩුණු කිසිලි ලොම් හා නිය ඇති මල බැඳුනු දත් ඇති ධූලි තැවරුණ හිස් ඇති බමුණෝ දකුණු අත ඔසවා මගෙන් කුමක් ඉල්වත්ද?

21 "සිවීන්ගේ රට වර්ධනය කරණ රජතුමනි, වටිනා දෙයක් ඉල්වමු. නගුලිස් වැනි දළ ඉසිළීමට සුදුසු ශ්‍රෙෂ්ඨ ඇතා දෙනු මැනව."

22 "බමුණෝ මගෙන් යමක් ඉල්වත්ද? මද බිඳුණු දළ ඇත්තාවූ රාජවාහනවූ ඇත් රජු දෙමි. වෙනස් නොකරමි'

23 දීමට සිත් ඇති සිවිරට වඩන රජතෙම ඇත් කඳින් බැස බමුණන්ට ඇතු දන් දුන්නේය.

24 ශ්‍රෙෂ්ඨ ඇතා දුන් කල්හි පොළොව කම්පා විය. එකල්හි එයින් භය ඉපදීම විය. ලොමුදැහැගැන්ම විය.

25 ශ්‍රෙෂ්ඨ ඇතා දුන් කල්හි එදා නුවර කැළඹුණේය. එදින භය ඉපදීම විය. ලොමු දැහැගැන්ම විය.

26 සිවිරට වඩන රජු ශ්‍රෙෂ්ඨ ඇතා දුන් කල්හි නුවර අවුල් විය. මහත් සොෂාවක්ද විය.

27 ශ්‍රෙෂ්ඨ ඇතා දන් දුන් විට පොළොව කම්පා වූයේය. මහත්වූ භයානකවූ ශබ්දයක් එකල්හි ඇතිවිය. මහත් ලොමු දැහැගැනීමක්ද එහි ඇති විය.

28 ශ්‍රෙෂ්ඨ ඇතා දුන් කල්හි එදා නුවර කැළඹුණේය. ඉක්බිති මහත්වූ, විශාලවූ, භයානකවූ ශබ්දයක් මෙහි පවතී.

29 සිවිරට වඩන රජු ඇත්රාජයා දුන් කල්හි එයින් මහත්වූ, විශාලවූ, භයානකවූ, ශබ්දයක් මෙහි පවතී.

30 ප්‍රසිද්ධ මනුෂ්‍යයෝද, රාජ පුත්‍රයෝද, වෛශ්‍යයෝද, බ්‍රාහ්මණයෝද, ඇතුන් නගින්නෝද, රජුගේ ආරක්ෂකයෝද, රියැදුරෝද, පාබලසෙනඟද,

31 (i) මුළු නියම්ගම් වැස්සෝද, සිවිරට වාසීහුද, (ii) රැස්ව ඇතු ගෙනයන ඔවුන් දැක රජුට දැන්වූහ.

32 "දෙවයන් වහන්ස, නුඹ වහන්සේගේ පුත්‍රවූ වෙස්සන්තරතෙමේ රට වනසමින් රටවැසියා විසින් පුදන ලද අපේ ශ්‍රෙෂ්ඨ හස්තියා කෙසේ දෙන්නේද?

33 "නගුලිස් පමණ දළ ඇති ඉසිළීමට සුදුසු සියලු යුදවල ජයබිම දන්නා අපගේ උතුම් සුදු ඇතා කෙසේ දෙන්නේද,

34 "පඬුවන් පලස් වලින් වසන ලද මද බිඳුණු සතුරන් මර්දනය කරණ දළ ඇති, වල් විදුනා සහිත, කෛලාස පර්වතය මෙන් සුදු පැහැති.

35 "සුදු කුඩය සහිත ඇතිරිලි සහිත, ඇත්වෙදුන් සහිත පිරිවර සහිත රජුන් ගෙනයන අග්‍ර යානාව වූ ධනය බමුණන්ට දුන්නේය.

36 "ආහාරද පානද වස්ත්‍රද සයනාසනද හෙතෙම දෙන්නේ නම් ඒවා දානයට සුදුසුය, ඒවා බමුණන්ට සුදුසුය.

37 "සඤ්ජයයෙනි, සිවින්ගේ රට වඩන මේ ඇත් තෙමේ ප්‍රවේණියෙන් පැමිණියේය. වෙස්සන්තර නම් පුත්‍ර තෙමේ කෙසේ ඇතා දෙයිද?

38 "ඉදින් ඔබවහන්සේ සිවිරටවාසීන්ගේ මේ වචනය නොපිළිගන්නෙහි නම් පුත්‍රයා සහිත ඔබ සිවිරට වාසීහු අත් අඩංගුවට ගනිතියි සිතමි."

39 "ඒකාන්තයෙන් ජනපදය නැතිවේවා. රටද වැනසේවා. මම රටවාසීන්ගේ වචනයෙන් නිවැරදි රාජ පුත්‍රයා ස්වකීය රටින් පිට නොකරන්නෙමි. එසේමැයි මාගේ ළෙහි නලවා හදාගත් පුත්‍රයාය.

40 (39 ඡේදය මෙනි. 'ළෙහි නලවා හදාගත්' වෙනුවට 'මගෙන් උපන්' කියා යොදාගත යුතුයි.)

41 "මම ඔහුට ද්‍රොහිකම් නොකරන්නෙමි. හෙතෙම උතුම් සිල් ඇත්තෙකි. මට අවනම්බුවක් වන්නේය. බොහෝ පව්ද රැස් වෙයි. වෙස්සන්තර පුත්‍රයා කෙසේ ආයුධයකින් නසම්ද?

42 "ඔහු දඬුවමින්වත් ආයුධයකින්වත් නොපෙළමි. හෙතෙම හිරගෙටත් නුසුදුසුය. ඔහු රටින් පිට යවාවා වංක (ඇද) පර්වතයෙහි වසාවා

43 "සිවිරට වාසීන්ගේ කැමැත්ත මෙසේ නම් කැමැත්ත වෙනස් නොකරමි හෙතෙම මේ රාත්‍රිය වසාවා. කැමති සම්පත්ද වළඳාවා."

44 "ඉක්බිති රාත්‍රිය අවසන්ව ඉරපායන වේලාවෙහි සිවිරටවාසීහු සමගිව් ඔහු රටින් පිට කරත්වා.

45 "දූතයෙනි, (i) ඉක්මනට නැගිටින්න. ගොස් වෙස්සන්තරට මෙසේ කියව. "දේවයිනි, සිවිරට වාසීහුද නියම්ගම් වැස්සෝද ඔබ කෙරෙහි කිපුණාහ.

46 (මෙහි 30 සහ 31 (i) යෙදිය යුතුයි)

47 "මේ රාත්‍රිය අවසන්ව ඉරපායන වේලාවෙහි සිවිරට වාසීහු සමගිවී ඔබ රටින් පිට කරත්"

48 සිවිරජු විසින් යවන ලද ඒ පනිවුඩකරු ඉක්මනින් වළළු පැළඳ යහපත්ව ඇඳගෙන සඳුනින් අලංකාරව

49 හිසේ පටන් නා තෙත් හිසින් යුක්තව පැළඳගත් මැණික් කර්ණාභරණ ඇත්තේ වෙස්සන්තරගේ වාසස්ථානයවූ යහපත් නුවරට පැමිණියේය.

50 ඒ දූතතෙම ස්වකීය නුවරෙහි ප්‍රීතිවන්නාවූ තවුතිසා වැස්සන් මැද ශක්‍රයා මෙන් අමාත්‍යයන් විසින් පිරිවරණලද කුමාරයා දුටුවේය.

51 ඒ පණිවුඩකරු ප්‍රීතිවන්නාවූ වෙස්සන්තරට මෙසේ කීවේය "රජතුමනි, 'ඔබට දුකක් දන්වන්නෙමි.' මට නොකිපෙනු මැනව."

52 ඒ පණිවුඩකරු එහි ගොස් රජුට වැඳ අඬමින් මෙසේ කීවේය. මහරජ, ඔබ සියළු කැමති රසයන්ට සුදුසුවූ මාගේ ස්වාමියාවෙහිය. ඔබට දුකින් ප්‍රකාශ කරන්නෙමි. එහි මට සහනයක් දෙත්වා.

53 "දෙවයන් වහන්ස, සිවිහු නියම්ගම් වැස්සෝද ඔබට කිපුණාහ. (මෙහි 30-31 (i) යෙදිය යුතුයි.)

54 (මේ ඡේදය 47 ඡේදය මෙනි)

55 "කුමක් හෙයින් මට සිවිහු කිපුනාහුද? මම නපුරක් කළ බවක් නොදකිමි. පණිවුඩකරුව එය මට කියව, කුමක් හෙයකින් මා රටින් පිට කරත්ද?"

56 "ප්‍රසිද්ධ මනුෂ්‍යයෝද රාජ පුත්‍රයෝද වෛශ්‍යයෝද බ්‍රාහ්මණයෝද ඇතුන් නගින්නෝද රජුගේ ආරක්ෂකයෝද රියැදුරෝද පාබල සෙනගද ඇතා දන්දුන් බැවින් කිපෙත්. එහෙයින් ඔබ රටින් පිටුවහල් කරත්."

57 "පපුවද ඇස්ද දෙන්නෙමි. ඉන් පිට මාගේ රත්රන් හෝ අමුරන් හෝ මුතු හෝ වෙරළුමිනි හෝ යන මේ බාහිර ධනය ගැන කියනුම කවරේද?

58 "මම පැමිණි යාචකයන්ද දැක දකුණු අත හෝ දෙන්නෙමි. නොවරද්දන්නෙමි. මාගේ සිත දානයෙහි ඇලේ.

59 "සියලු සිවීහු මා නොකැමැති පරිද්දෙන් රටින් පිට කරත්වා. නොහොත් මරත්වා, ඒකාන්තයෙන් සත්කඩකට කපත් නමුත් දීමෙන් වෙන් නොවන්නෙමි.

60 "රැස්වූ නියම්ගම් වැස්සෝද සිවීහුද කොන්ති මාරා නම් ගං තෙර ආරඤ්ජර නම් පර්වතයට අභිමුඛව පැවිද්දෝ යම් තැනකට යද්ද, එතැනට හොඳ පැවතුම් ඇත්තායේවා

61 "වැරදිකරුවෝ යම් තැනකට යත්ද, ඒ මම එහි යන්නෙමි. මම දනක් දෙමි. එතෙක් එක් රෑ දවාලක් මට ඉවසව්."

62 රජතෙමේ, සියලු අවයවයන්ගෙන් යහපත්වූ ඒ මද්‍රිදෙවියට ආමන්ත්‍රණය කෙළේය. "මා විසින් තොපට දෙනලද යම් ධන ධාන්‍යයක් ඇත්තේද?

63 "රත්රන් අමුරන් හෝ බොහෝවූ මුතු හා වෙරළුමිනී හෝ තොපගේ පිය සතු ධනය හෝ යමක් ඇත්නම්, ඒ සියල්ල නිදන් කරන්නෙහිය."

64 "සියලු අවයවයෙන් ලක්ෂණවූ මද්‍රී නම් රාජ දුව " දෙවයන් වහන්ස, කොහි නිදන් කරන්නෙම්ද, විචාරණ ලද මට එය කියවයි" කීවාය.

65 "මද්‍රීදේවීනි, සුදුසු පරිද්දෙන් සිල්වතුන් කෙරෙහි දන් දෙන්නෙහිය. සියලු ප්‍රාණීන්ට දීමට වඩා පිහිටක් නැත.

66 "මද්‍රීදෙවීනි, නැදිමයිලන් කෙරෙහිද පුත්‍රයන් කෙරෙහිද මෛත්‍රිය පතුරුවන්නෙහිය. යමෙක් තොප ස්වාමියායයි සිතන්නේ නම් ඔහු සකස්කොට උපස්ථාන කරව.

67 මාගේ වෙන්වීමෙන් තොපට ඒ මා ස්වාමියෙකු ලෙස නොසිතන්නේය. අන් ස්වාමියකු සොයව. මගෙන් වෙන්වී කෘශවූවක් නොවෙව.

68 "නපුරුවූ චණ්ඩ මෘගයන්ගෙන් ගැවසී ගත්තාවූ මහවනයට යමි. මහා වනයෙහි ජීවත්වීම සැක සහිතය.

69 "සියළු අවයවයන් යහපත්වූ මද්‍රිදේවිය වෙස්සන්තර රජුට මෙසේ කීවාය. 'අපොයි' පෙර නොකී කථාවක් කියන්නෙහිය. ඒකාන්තයෙන් නපුරක් කියන්නෙහිය.

70 "යම්බඳුවූ ඔබ තනිව යන්නේ නම් එය යහපත් ස්වභාවයක් නොවේ. රජ්ජුරුවෙනි, යම්තැනකට යන්නේ නම් මමත් එහි යමි.

71 "ඔබ සමග මරණය හෝ ඔබගෙන් වෙන්ව ජීවත් වීම හෝ යන දෙකින් ඒ මරණයම ඔබගෙන් වෙන්ව ජීවත් වීමට වඩා උතුම්ය.

72 "එකට දැලින් වෙළුනු ගින්න දල්වා එහි මාගේ මරණය ඔබගෙන් වෙන්වී ජීවත්වීමට වඩා වටනේය.

73 "යම්සේ කුලයෙහි සිටින ඇතින්නක් සමවූත් විසමවූත් යානොහැකි පර්වතවල හැසිරෙන්නාවූ දළ ඇති ඇතු අනුව යයිද,

74 "එසේ දරුවන් ගෙන ඔබ පිටිපසින් අනුව එන්නෙමි. ඔබට සුවසේ පොෂ්‍ය කටහැක්කක් වන්නෙමි. දුකසේ පොෂ්‍ය කටහැක්කක් නොවන්නෙමි.

75 (ii) "වනලැහැබෙහි හුන් (ii) මිහිරි කථා ඇති සුරතල් වචන කියන මේ කුමරුවන් දක්නේ රාජ්‍යය සිහි නොකරන්නේය.

76 'වනලැහැබෙහි ක්‍රීඩා කරණ (75 (ii) යෙදිය යුතුයි)

77 "සිත්කළු ආශ්‍රමයෙහි (75 (ii) යෙදිය යුතුයි)

78 සිත්කළු ආශ්‍රමයෙහි ක්‍රීඩා කරණ (75 (ii) යෙදිය යුතුයි.)

79 යහපත් ආශ්‍රමයෙහි මල් පැළඳගෙන නටන කුමරුවන් යම් දවසක දක්නේද රාජ්‍යය සිහිනොකරන්නේය.

80 "යහපත් ආශ්‍රමයෙහි මල් පැළඳ නටන කුමරුවන් යම්කලක දක්නෙහිද රාජ්‍යය සිහි නොකරන්නේය.

81 "යහපත් ආශ්‍රමයෙහි මල් පැළඳ නටන කුමරුවන් දක්නෙහිද රාජ්‍යය සිහි නොකරන්නේය.

82 "හුදකලාව වනයෙහි හැසිරෙන්නාවූ සැටවයස් පිරි (ii) මාතංග ඇතු ඉදින් දක්නේද, රාජ්‍යය සිහි නොකරන්නේය.

83 සවසත් උදයේත් හැසිරෙන්නාවූ සැටවයස් පිරුණු මාතංග ඇතු යම්තාක් දක්නෙහිද රාජ්‍යය සිහිනොකරන්නේය.

84 "යම්කලක ඇත් රංචුවේ ඉදිරිපිට යන්නාවූ සැට වයස් පිරි මාතංග නම් ඇත්තෙමේ ශබ්ද පවත්වන්නේය. නාද කරන්නාවූ ඔහුගේ ඒ නාදය අසා රාජ්‍යය සිහි නොකරන්නේය.

(85-95 ඡේද අගට "රාජ්‍යය සිහි නොකරන්නෙහිය" යෙදිය යුතුයි)

85 "කැමතිදේ දෙන්නාවූ දෙපයෙහිවූ වල් මුවන්ගෙන් ගැවසීගත් වන පෙදෙස් යම්කලෙක දක්නෙහිද,

86 "සවස් කාලයෙහි ආවාවූ අං මාලා පසක් ඇති මුවාද නටන කිම් පුරුෂයන්ද දැක,

87 "බැස යන්නාවූ සින්ධු ගංගාවගේ ශබ්දය යම් කලෙක අසන්නෙහිද කිම් පුරුෂයන්ගේ ගී හඬ අසන්නෙහිද එකල්හි

88 "පර්වත ගුහාවන්හි හැසිරෙන නාදකරණ බකමුහුණන්ගේ ශබ්දය යම්කලෙක අසන්නෙහිද,

89 "යම්කලෙක වනයෙහි දරුණු සිංහයන්ගේද ව්‍යාඝ්‍රයන්ගේද කඟමුවන්ගේද ගවරුන්ගේද ශබ්ද ඇසෙන්නේද,

90 "යම්කලෙක පිල්වලින් ගැවසීගත් පර්වත මත්තෙහි සිටි, මොණරියන් (සෙබඩුන්) විසින් පිරිවරාගත් නටන්නාවූ මොණරා දක්නෙහිද රාජ්‍යය සිහි නොකරන්නෙහිය.

91 යම්කලෙක බිජුවටින් උපන් (විසිතුරු දැකුම් ඇති මොණරියන් (සෙබඩුන්) විසින් පිරිවරාගත් මොණරා දක්නෙහිද,

92 "යම්කලෙක නිල් බෙල්ලක් ඇති හිස කුඩුම්බි ඇති මොණරියන් විසින් පිරිවරන ලද නටන්නාවූ මොණරා දක්නෙහිද,

93 "යම්කලෙක්හි හිම කාලයෙහි පිපුනාවූ සුවඳ වගුරු වන ගස් දක්නෙහිද

94 "යම්කලෙක්හි හිම වැටෙන කාලයෙහි රතු ඉඳු ගොච්චන්ගෙන් ගැවසීගත් නිල් පොළොව දක්නෙහිද,

95 "යම්කලෙක්හි හිම වැටෙන කාලයෙහි පිපුනාවූ කෙළිඳ ගස්ද රත්කරව්ද ලොමපද්මකද යන මේ ගස් ද සුවඳ පතුරුවන කල්හි,

96 "යම් කලෙක්හි හිමවැටෙන මාසයෙහි පිපුනාවූ වනය දක්නෙහිද වැටී තිබෙන නෙළුම් මල් දකිත්ද රාජ්‍යය සිහි නොකරන්නෙහිය.

97 ඒ පුත්‍රයාගේද ලේලිගේද විලාපය අසා කීර්තිමත් මද්‍රරජහුගේ දූවූ ඵුසති දේවිය කරුණාවෙන් වැළපුණාය.

98 "මවිසින් විෂ කන ලද්දේ නම් යහපත. මම පර්වතයකින් පනින්නෙම් නම් හොඳය. මම කඹයෙන් එල්ලී මැරෙම් (ii) නිවරදවූ වෙස්සන්තර පුත්‍රයා කුමක් හෙයින් රටින් පිට කෙරෙත්ද?

99 "වෙදගුරුවූ දානපතියෙක්වූ, ඉල්වීමට සුදුසු නොමසුරුවූ උප රජුන් විසින් පුදන ලද්දාවූ කීර්ති හා සම්පත් ඇති (98 (ii) යෙදිය යුතුයි)

100 "මවුපියන් පොෂ්‍යකරණ කුලදෙටුවන් පුදන (98 (ii) යෙදිය යුතුයි.)

101 "රජුට හිතවත්වූ දෙවියන්ට හිතවත්වූ නෑයන්ට යහළුවන්ට හිතවත්වූ සියලු රටට හිතවත්වූ (98 (ii) යෙදිය යුතුයි.)

102 "නිවරද නැමැත්තා පිටුවහල් කරන්නාවූ ඔබගේ රටවැස්සන් පලාගිය මී වදයක් මෙන්ද බිම වැටුණ අඹ මෙන්ද වේ.

103 "රජතුමනි දියනැති වේලුණ මඩෙහි පියාපත් නැති හංසයෙකු මෙන්ද, අමාත්‍යයන් විසින් හැරදමන ලද්දේ තනිවී මැලවෙයි

104 "මහරජ, ඔබට ඒ කරුණ කියමි. තොපගේ යහපත ඉක්ම නොයේවා. සිවින්ගේ වචනයෙන් නිවැරදි තැනැත්තා පිටුවහල් නොකරව.

105 "සොඳුර මම සිවීන්ට කොඩියක් වැනිවූ ස්වකීය පුත්‍රයා පිටුවහල් කරන්නේ ප්‍රවෙණි ධර්මයට සැලකීම වූ හික්මවීම කරමි. ඔහු මාගේ ප්‍රාණයටත් වඩා අතිශයින් ප්‍රියය.

106 "පිපුණ කිණිහිරි මල්ගසක් මෙන් පෙර යමකුගේ කොඩි මුදුන් යන්නහු අනුව යත්ද, හෙතෙම අද තනිව යන්නේය. (107-110 මේ ඡෙද අගට "හෙතෙම අද තනිව යන්නේය" යෙදිය යුතුයි.

107 "කිණිහිරි මල් ගස් ඇති වනයන් මෙන් පෙර යමෙකුගේ කොඩි මුදුන් යන්නහු අනුව යත්ද,

108 "පිපුණු කිණිහිරිමල් රුක් මෙන් පෙර යමෙකුගේ සේනාවෝ යන්නහු අනුව යෙත්ද

109 "යමෙකුගේ සේනාවෝ පිපුණු කිණිහිරි මල් ගස් වනයක් මෙන් යන්නාහු අනුව යෙත්ද,

110 "ඉඳිගොච්චන්ගේ පාට ඇති ගන්ධාර රටට අයත් රත් කම්බිලි යන්නහු අනුව යත්.

111 "යමෙක් පෙර ඇතුපිටින්ද, දෝලා පල්ලැක්කි වලින්ද රථයෙන්ද යයි ද, ඒ වෙස්සන්තර රජතෙම අද කෙසේ පයින් යන්නේද?

112 "සඳුන් ගානලද අවයව ඇති නැටීම් ගී කීම්වලින් පුබුදුවන රජතෙම රළු අඳුන් දිවිසම් පොරවා පොරොව හා කත්ලීය කරේ තබාගෙන කෙසේ යන්නේද?

113 "මහ වනයට යන්නහු කසට පෙවූ වස්ත්‍ර හෝ අඳුන් දිවිසම් හෝ කෙසේ ගෙන නොයත්ද, කුමක් හෙයින් වැහැරී නොබඳිත්ද?

114 "කෙසේද, රජකුලයෙන් පැවිදිවූ ජනයෝ වැහැරී සිවුරු කෙසේ දරත්ද, කුසතණවලින් කළ වැහැරි සිවුරු කෙසේ මද්‍රිදේවිය පොරවත්ද?

115 "කසීසළුද, බොචරටේ හා කොදුම්බර රටේ උපන් වස්ත්‍රද, දරා සිටි මද්‍රිදේවිය කෙසේ වැහැරි සිවුරු දරත්ද?

116 "සිවිගෙයින්ද, රියෙන්ද, උසුලා හාත්පස ඇවිදි නොකැලැල් ඇඟ ඇති ඕ අද කෙසේ පයින් මාර්ගයට යන්නේද?

117 "මෘදුවූ අත්ලද, සුවසේ වැඩුණු දෙපාද යමක්හුගේ නොකැලැල් අවයව ඇති බිය සහිතවූ ඕ කෙසේ අද වනයට යත්ද?

118 "යමක්හුගේ මෘදු පතුල්ද කකුල්ද සුවසේ වැඩුණේද රන්මිරිමැඩි වලින් දුනු පෙලෙන්නාසේ යයිද උතුම් අවයව ඇති තොමෝ අද කෙසේ පයින් මගට බසීද?

119 "යම් ස්ත්‍රියක් මල් මාලා පැළඳ ස්ත්‍රීන් දහසකට පෙරටුව යයිද, නොකැලැල් අවයව ඇති ඕතොමෝ තනිව අද කෙසේ වනයට යේද?

120 "යම් ස්ත්‍රියක් තොමෝ පෙර සිවල්දෙනකගේ ශබ්දයක් අසා නිතර ත්‍රස්තවේද, නොකැලැල් අවයව ඇති භයවනසුළු ඕතොමෝ කෙසේ අද වනයට යේද?

121 "නාදකරන්නාවූ බසු වර්ගයාගේද, බකමුහුණාගේද අඬ අසා බියවූ ආවේශවූවෙකු මෙන් වෙවුලයිද, අද නොකැලැල් අවයව ඇති බියවන ස්වභාව ඇති ඕතොමෝ කෙසේ වනයට යාද?

122 (i) "හිස් කූඩුව දැක නැතිවූ දරුවන් ඇති පක්ෂි ධෙනුවක් මෙන් ශූන්‍යවූ මේ නුවරට පැමිණ (ii) බොහෝ කලක් දුකින් කල්පනා කරන්නෙමි.

123 "හිස් කූඩුව දැක නැතිවූ දරුවන් ඇති පක්ෂි ධෙනුවක් මෙන් (ii) ප්‍රිය දරුවන් නොදක්නී කෘශද පඬුවන්ද වන්නෙමි.

124 (i) හිස් කූඩුව දැක නැතිවූ දරුවන් ඇති පක්ෂි ධෙනුවක් මෙන් (ii) ප්‍රිය පුත්‍රයන්ද නොදක්නී ඒ ඒ තැන දුවන්නීය.

125 "නැසෙනලද දරුවන් ඇති කුරිර පක්ෂියෙකුමෙන් හිස් කූඩුව දැක ශූන්‍යවූ මේ නුවරට පැමිණ (124 (ii) යෙදිය යුතුයි.)

126 "හිස් කූඩුව දැක නසන ලද දරුවන් ඇති කුරිර පක්ෂියෙකු මෙන් (124 (ii) යෙදිය යුතුයි.)

127 "දිය නැති පැළුණු මඩෙහි සක්වා ලිහිණියක මෙන් ඒ ඔබ හිස්වූ මේ නුවරට පැමිණ 123 (ii) යෙදිය යුතුයි.)

128 "දිය නැති පැළුණු මඩෙහි සක්වාලිහිණියක මෙන් (124 (ii) යෙදිය යුතුයි.)

129 "දිය නැති පැළුණු මඩෙහි සක්වාලිහිණියක මෙන් ඒ මම හිස්වූ මේ නුවරට පැමිණ (122 (ii) යෙදිය යුතුයි.)

130 "මා විසින් මෙසේ විලාප කියද්දී නිවැරදි රාජ පුත්‍රයා රටින් වනයට පිටුවහල් කෙළේය. මගේ ජීවිතය විනාශවේයයි සිතමි"

131 ඇගේ විලාප කීම අසා රැස්වූ ඇතුළුනුවර සියලු සිවි කන්‍යාවෝ දෙඅත් හිස බැඳ ඇඬුවාහුය.

132 වෙස්සන්තර රජුගේ භවනයෙහි අඹුදරුවෝද සුළඟින් විශෙෂයෙන් කම්පාවූ සල් රුක් මෙන් මැඩුණාහු වැටී හඬත්.

133 අන්තඃපුර ස්ත්‍රීහුද, කුමාරයෝද, වෛශ්‍යයෝද, බ්‍රාහ්මණයෝද යන වෙස්සන්තර රජුගේ භවනයෙහි හැම දෙනම දෙඅත් හිස බැඳ ඇඬුවාහුය.

134 ඇත්ගොව්වෝද, ආරක්ෂකයෝද, රියැදුරෝද, පාබල සෙනඟද වෙස්සන්තර රජුගේ ගෘහයෙහිදී දෙඅත් හිස බැඳ ඇඬූහ.

135 ඉක්බිති රාත්‍රිය අවසානයෙහි හිර පායන වේලාවෙහි වෙස්සන්තර රජතෙම දන් දෙන්නට පැමිණියේය.

136 වස්ත්‍ර කැමැත්තන්ට වස්ත්‍රද, රසබීම බොන්නන්ට එය ද, රැ කෑම ඕනෑ අයට කෑමද යහපත්කොට දෙව ප්‍රදානය කරව.

137 මෙහි පැමිණි කිසි ඉල්වන්නෙක් නොපෙළවා. ආහාර පානයෙන් සතුටු කරවව. ඔව්හු මට ස්තුති කරමින් යෙත්වා.

138 සිවීන්ගේ රට වඩන මහරජ නික්මෙන කල්හි ඔවුන් අතරෙහි ඉල්වන්නෝ මත්වූවාහු ක්ලාන්තවූවාහුම වෙත්.

139 "(i) පින්වත්නි, නිවැරැදි වෙස්සන්තර රජ රටින් පිටුවහල් කරත්ද, (ii) ඒකාන්තයෙන් නොයෙක් ඵලදරණ ගසක් සින්දාක් මෙනි.

140 (139 (i) යෙදිය යුතුයි.) නොයෙක් කැමති දේ දෙන වෘක්ෂයක් සින්දාක් මෙනි.

141 (139 (i) යෙදිය යුතුයි.) එය සියළු කැමති රස ගෙන දෙන ගසක් සිඳින්නාක් මෙනි."

142 සිවින්ගේ රට වඩන මහරජ නික්මෙන කල්හි යම් වෘද්ධයෙක් අද්ද යම් බාලයෝ වෙත්ද, යම් මධ්‍යම පුරුෂයෝ වෙත්ද, දෙ අත් හිස බැඳ ඇඬුවාහුය

143 සිවිරට වඩන මහරජ, නික්මෙන කල්හි නිමිති කියන්නෝද ඇතුළුනුවර පාලකයෝද, ඇතුළුනුවර වාසීහුද රජවරුද, දෙඅත් හිසබැඳ ඇඬුහ.

144 සිවීන්ගේ රට වඩන මහරජ නික්මෙන කල්හි ඒ නුවර යම් ස්ත්‍රීහු වෙත්ද, ඒ ස්ත්‍රීහුද ඒ කරුණෙහිදී හැඬූහ.

145 යම් බමුණෝද යම් ශ්‍රමණයෝද, සෙසු ගුණ කියා ඉල්වන්නේද, එම්බා අධර්මයකැයි දෙඅත් ඉස බැඳ ඇඬූහ.

146 වෙස්සන්තර රජතෙම තම නුවර යම්සේ පුදන්නේම සිවීන්ගේ වචන හේතුකොට ගෙන තමන්ගේ රටින් නික්මෙයි.

147 සියලු ආභරණයෙන් අලංකාරවූද රන්බඳපටි ඇති සුවඳ කවනලද රන් සැරසිල්ලෙන් යුත් ඇතුන් සත් සියයක් දී

148 හෙල්ල හා හෙණ්ඩුව ඔසවාගත් අත් ඇති ගම්මුළාදැනින් පිරිවරා සිටිකල්හි මේ වෙස්සන්තර රජතෙමේ තමන්ගේ රටින් නික්මෙයි.

149 සියලු ආභරණයෙන් අලංකාරවූ ඉක්මන් ගමන් ඇති උත්පත්තියෙන් ආජානෙයවූ අශ්වයන් සත්සීයක් දි

150 මෙසේ වෙස්සන්තර රජතෙම දුනු හී දරණ ගම්මුළාදැනීන් පිරිවරා සිටිකල්හි ඒ නුවරින් නික්මෙයි.

151 සියලු අලංකාරයෙන් බබළන සැරසූ දිවි සමින් හා ව්‍යාඝ්‍ර සමින් යුත්, නංවන ලද කොඩි ඇති, රථ සත්සීයක් දන් දී,

152 දුනු ගත් අත් ඇති යුද්ධ ඇඳුමින් සැරසුන ගම්මුළාදැනීන් විසින් පිරිවරා සිටි කල්හි වෙස්සන්තර රජතෙමේ තම රටින් නික්මෙයි.

153 රන් කෙන්දෙන් සැරසී රනින් අලංකාරවූ එක් රථයක එක්කෙනෙකු බැගින් සිටි ස්ත්‍රීන් සත්සියයක් දන් දී,

154 කෙසේවූ ස්ත්‍රීන්ද, රනින් අලංකාරවූ රන් වස්ත්‍ර අඳින, රන් අබරණින් සැරසි මහත් ඇස් ගුලි ඇති මඳ සිනා පෙරටුකොට ඇති කථා කරණ යහපත් උකුළු ඇති හීන් ඉඟ ඇති ස්ත්‍රීහුය. මෙසේ දී වෙස්සන්තර රජතෙම තම රටින් නික්මෙයි.

155 සියල්ල රනින් යුත් දෙනුන් සත් සීයක් දී මේ වෙස්සන්තර රජතෙම තම රටින් නික්මෙයි.

156 දාසියන් සත් සියයක්ද දාසයන් සත්සියයක්ද දී මේ වෙස්සන්තර රජතෙම තම රටින් නික්මෙයි.

157 ඇතුන්ද, අශ්වයන්ද, රථද දී සැරසූ ස්ත්‍රීන් ද දී මේ වෙස්සන්තර රජතෙම තම රටින් නික්මෙයි.

158 මහා දානය දුන් කල්හි පොළොව කම්පාවිය. එවිට බිය ඉපදීමක් විය. එවිට ලොමුදැහැගැන්මක් විය.

159 "භයජනකවූ මෙය ඒ වේලාවේ වූයේය. භයජනක වූ ලොම් කෙලින් සිටීමක් ඒ වේලාවේ වූයේය. දන් දී දොහොත් මුදුන් දී බුදුබව ප්‍රාර්ථනා කළ රජතෙම ඒ නුවරින් නික්මෙයි.

160 නැවත මෙහි දීම නිසා ඔබ රටින් පිටුවහල් කරති. නැවතත් ඔබ දන්දුන්නේ යයි මහත් භයානක ඝොෂාවක් පවතී

161 ධාර්මික රජුන් අතරෙහි ශ්‍රෙෂ්ඨවූ සඤ්ජය රජුට ආමන්ත්‍රණය කෙළේය. "දේවයන් වහන්ස, මා රටින් පිට කරන්නෙහිද එසේ නම් වංක පර්වතයට යන්නෙමි."

162 මහරජවූවෝද, වන්නෝද යන යම් කෙනෙක් වෙත්ද, ඔව්හු කාමයන්ගෙන් සතුටට පත්නොවී මරුමුවටයත්.

163 "ඒ මම මගේ නුවරම දන්දෙන්නේ නගරවාසීන් විසින් පෙළනුලැබීමි. සිවිරට වාසීන්ගේ වචනයෙන් තම රටින් මම නික්මෙන්නෙමි.

164 "වල් මෘගයන් ගැවසීගත් කඟවේනුන් හා දිවියන් ගැවසුනු වනයෙහි යම් දුකක්වේද, එය විඳින්නෙමි. මම පින් කරන්නෙමි. තෙපි කාම මඩෙහි එරෙන්න.

165 "මැණියෙනි, මට අවසර දෙන්න, මට මහණකම ප්‍රියය, ඒ මම දන් දෙන්නේ මගේ නුවර ජනයන් විසින් පෙළනු ලැබිමි.

166 "සිවීන්ගේ වචනයෙන් මගේ රටින් පිටඋණෙමි කඟමුවන් හා කොටින් හා දරුණු මෘගයන් හැසිරෙන වනයෙහි යම් දුකක්වේද, එය විඳිමි. පින්කරමි. ඔබ මඩෙහි එරෙන්නෙහිය."

167 "පුත්‍රය, ඊට අවසර දෙමි. තොපගේ මහණකම ඉෂ්ටවේවා. යහපත් උකුලක් ඇති හීන් මධ්‍ය ප්‍රදෙශය ඇති යහපත්වූ මේ මන්ද්‍රිදේවිය පුත්‍රයන් සමග මෙහි සිටීවා. වනයෙහි කුමක් කරන්නේද?

168 "මම නොකැමැති පරිද්දෙන් දාසියකුදු කැලේට ගෙනයන්ට නොවෙහෙසෙමි. ඉදින් කැමැත්තේ නම් එවා, නොකැමැත්තේ නම් නොකැමැති වේවා.

169 මහරජතෙමේ ඉක්බිති ලේලිගෙන් අසන්නට ගියේය. "සඳුන් තවරණ ලද ශරීරයෙන් රජස් නොදරව.

170 "කසීසළු දරා වැහැරි සිවුරු නොදරව. වනයෙහි වාසය දුක්ය. යහපත් ලක්ෂණයෙන් යුක්තවූ ඔබ අරණ්‍ය නොයව."

171 සියලු අවයවයෙන් ශෝභනවූ මද්‍රි දේවිය මාමාට මෙසේ කීවාය. "වෙස්සන්තර රජු හැර මට යම් සැපක් ලැබේද, මම ඒ සැපය බලාපොරොත්තු නොවන්නෙමි."

172 සිවීන්ගේ රට වඩන මහරජතෙම "මද්‍රිය, එසේ නම් වනයෙහි යම් ඉවසිය නොහැකි දුක් ඇත්තාහුද, එය අසව.

173 "බොහෝ කුඩා සත්තුද පලඟැටියෝද මදුරුවෝද මීමැස්සෝද ඇත්තාහ. ඔව්හු ඔබට හිංසා කරත්. එය ඔබට ඉතා දුකක් වන්නේය.

174 "අනික් සිත් තැවීම බලව. ගංගා අද්දර සිටින්නාවූ මහත් ශක්ති ඇති විෂ ඇති පිඹුරන් නම් සර්පයෝ ඇත්තාහ.

175 "ඔව්හු සමීපයට පැමිණි මිනිසකු හෝ මුවෙකු හෝ දරණවැලින් වටකොට තමාගේ වසඟයට ගනිත්.

176 "අන්‍යවූ ද කළු රෝම ඇති වලස්සු නම් දුක් දෙන මෘග කොටසක් ඇත්තේය. ඔවුන් විසින් දක්නාලද පුරුෂයා ගසකට නැංගත් නොබේරෙන්නේය.

177 "උල් තුඩ සහිත අං එකට හපමින් හැසිරෙන්නාවූ මීහරක් සොතුම්බරා නම් නදිය අයිනේ එහි හැසිරෙත්.

178 "වනයෙහි හැසිරෙන ගව රංචු හා මුව රංචු දැක වසු පැටවෙකු කෙරෙහි ගිජුවූ දෙනක් වැනිවූ මද්‍රී දේවිය කුමක් කරන්නෙහිද,

179 "ගස් මුදුන්හි පනින්නාවූ දරුණුවූ වඳුරන් දැක කැලය පුරුදු නැති බැවින් මද්‍රිය, ඔබට මහත් භය හටගනී.

180 "යම්බඳුවූ ඔබ සිවල් දෙනකගේ ශබ්දයක් අසා පෙර නැවත නැවත තැතිගත්තීය. වංකගිරියට ගිය ඔබ කුමක් කරන්නීද,

181 "මධ්‍යාහ්න කාලය නැවතුණ කල්හි පක්ෂීහු කූඩුවල සිටි කල්හි මහ කැලේ නාද කෙරේමය. කිමෙක්ද එහි යන්නට කැමැත්තෙහිද?"

182 සියලු අවයවයන් යහපත්වූ මිද්‍රි රජකුමරිය ඔහුට මෙසේ කීවාය. 'මහරජාණෙනි, මට වනයෙහිවූ යම් මේ බියක් කියන ලද්දේද, සියල්ල ඉවසන්නෙමි. යන්නේමය.

183 "බට ගස්ද, කුසතණද, පොටකිල නම් තණද, සැවැන්නද මුදුතණ හා බබුස් තණද පපුවෙන් දෙපැත්තට දමා ඉදිරියට යන්නෙමි. නපුරකට නොපැමිණෙන්නෙමි.

184 "තරුණියක් තොමෝ බොහෝ හැසිරීම් වලින් ස්වාමියකු ලබයි. එනම්, නොකා සිටීමෙන්ද ගවහක්කෙන් මධ්‍ය ප්‍රදේශය ඉලීමෙන්ද,

185 "ගිනි දෙවියා පිදීමෙන්ද දියෙහි කිමිදීමෙන්ද යන මෙයිනි. වැන්දඹු බව ලෝකයෙහි අයහපත්ය. උතුමාණනි, යන්නෙම්මය. උතුමාණනි, යන්නෙම්මය.

186 "වැන්දඹුවගේ ඉඳුල් කෑමට අප්‍රියය. යමෙක් ඈ අතින් නොකැමැත්තෙන් අදියි. වැන්දඹුව ලෝකයෙහි කටුකය. උතුමාණනි, යන්නෙම්මය.

187 "කොන්ඩෙන් එසවීමෙන්ද, බිම පෙරලීමෙන්ද, අප්‍රමාණ නොයෙක් දුක් දීද බැහැර නොයයි. මහරජාණෙනි, වැන්දඹුකම මහත් දුකෙකි. යන්නේමය."

188 "වාසනාවන් යයි සිතන්නෝ ස්වල්පයක් දී ඇඟ තවරණ සුණුවලින් තවරණ ලද සම් ඇති, වැන්දඹු ස්ත්‍රීන් කපුටන් බකමූහුණන් මෙන් නොකැමැති පරිද්දෙන් අදිත්. මහරජාණෙනි, ලෝකයෙහි වැන්දඹුකම කටුකය. යන්නෙම්මය.

189 "රන් අලංකාරයෙන් බබළන පොහොසත් නෑ කුලයක වසන්නේ නමුදු සහෝදරයන් විසින්ද යහළු ස්ත්‍රීන් විසින්ද

කියන ගර්හා වචන ලබන්නේමය. මහරජාණෙනි, ලෝකයෙහි වැන්දඹුකම කටුකය. යන්නෙම්මය.”

190 “දිය නැති ගඟ නිර්වස්ත්‍රය, රජු නැති රට නිර්වස්ත්‍රය, වැන්දඹු ස්ත්‍රියද සහෝදරයන් දස දෙනෙක් සිටියත් නිර්වස්ත්‍රය. මහරජ වැන්දඹුකම ලෝකයෙහි කටුකය. වනයට යන්නෙම්මය.

191 “කොඩිය රථයේ පෙනීමයි. දුම ගින්නේ පෙනීමයි. රටෙහි පෙනීම රජයි. ස්ත්‍රියගේ පෙනීම ස්වාමිපුරුෂයායි. වැන්දඹු බව ලෝකයෙහි කටුකය. වනයට යන්නෙම්මය.

192 “දිළිඳු ස්වාමියා බලා කීර්තිමත් ස්ත්‍රීද දිළින්දියක් වෙයි. දියුණු ස්වාමිපුරුෂයා බලා ඈද සුඛිත මුදිත වෙයි.

193 “ඈ දුකසේ කළයුතු දෙයක් කරණ බැවින් ඈට දෙවියෝද ප්‍රශංසා කරත්.

194 “හැමකල්හි කසට වස්ත්‍ර හැඳ ස්වාමියා අනුව යන්නෙමි. වෙස්සන්තර රජු හැර නොසෙල්වෙන නොබිඳෙන පෘථිවියද නොකැමැත්තෙමි. මහරජාණෙනි, ලෝකයෙහි වැන්දඹු බව කටුකය.

195 “වෙස්සන්තර රජු හැර නොයෙක් රත්නයන්ගෙන් පිරුණු බොහෝ වස්තුව දරණ පෘථිවිය සාගරය තෙක් ලැබුණත් නොකැමතිවෙමි

196 “යම් ස්ත්‍රියක් ස්වාමියා දුකට පත්කළ තමහට සැප කැමැත්තීද, ඔවුන්ගේ පපුව කෙසේ වන්නේද, ස්ත්‍රී හු ඒකාන්තයෙන් අතිශයින් කෲරය.

197 “සිවි රට වඩන මහරජ නික්මෙන කල්හි මම ඔහු අනුව යන්නෙමි. මට සියලු දේ දෙන්නේ ඔහුය.”

198 මහරජතෙමේ සියලු අවයවයෙන් ලක්ෂණවූ මද්‍රී දේවියට “ජාලිය කෘෂ්ණජිනා යන ඔබගේ මේ ලකුණින් යුත් ළදරුවන් දෙදෙනා නවත්වා යව. අපි ඔවුන් පොෂ්‍යකරන්නෙමුයි” කීයේය.

199 සියලු අවයවයෙන් යහපත්වූ මද්‍රී රාජ දුහිතෘව ‘දේවයන් වහන්ස, ජාලිය කෘෂ්ණජිනා යන මේ දරුවන් දෙදෙනා මට

ප්‍රියය. අපි අප නැත කියා ශෝක නොවන ඔවුන් වනයෙහි සතුටු කරවන්නෙමු.”

**200** සිවීන්ගේ රට වඩන මහරජතෙමේ “පිරිසිදු මස් සහිත ඇල් සාලේ බත් අනුභව කොට පුරුදු දරුවෝ කෙසේ ගස්වල ගෙඩි අනුභව කරත්දැයි” කීයේය.

**201** “සියක් වරක් ශුද්ධකළ රනින් කළ සියක් ඉරි ඇති රන් තැටියක අනුභව කොට දරුවෝ කොළවල කෙසේ අනුභව කරත්ද,

**202** “කොමුපිලී හා කොදුම්බර පිළිවලින් කළ කසීසළු දැරූ දරුවෝ වැහැරි දරන්නාහු කෙසේ කරත්ද,

**203** “සිවි ගෙයින්ද, කරත්තයෙන් ද, ඔසවාගෙන යාමෙන්ද ඇවිදි දරුවෝ පයින් ඇවිදීම කෙසේ කරත්ද,

**204** “අගුළු ලනලද මාලිගාවෙහි කුළුගෙයි නිදා ගස් මුල නිදන්නාවූ දරුවෝ එය කෙසේ කරත්ද,

**205** “විසිතුරු කොට අතුරණලද දික් ලොම් ඇති පලස් ඇති අසුන්වල සයනය කරණ දරුවෝ තණකොළ උඩ කෙසේ සයනය කෙරෙත්ද,

**206** “අගිල් හා සඳුන්ද යන සුවඳින් ආලෝපකොට සිටි දරුවෝ ධූලි තට්ටු දරන්නාහු කෙසේ සිටිත්ද,

**207** “සෙමෙර වල්ගයෙන් හා මොණර පිල් ගත් අත්වලින් පවන් සලනලද අවයව ඇති දරුවෝ ඩැහැලේ බොන මැස්සන් හා මදුරුවන් විසින් දෂ්ටකරණ ලද්දාහු කෙසේ සිටිත්ද?”

**208** “සියලු අවයවයෙන් යහපත්වූ මද්‍රි නම් දේවිය මෙසේ කීවාය “දෙවයන් වහන්ස, නොවැලපෙනු මැනව. ඔබ සිත වෙනස්කර නොගනුව. අපි යම්සේ වන්නෙමු නම්, දරුවෝත් එසේ වෙත්.”

**209** සියලු අවයවයෙන් යහපත්වූ ලකුණින් යුත් මද්‍රිදේවි තොමෝ මෙසේ කියා දරුවන් ගෙන සිවිරජ නික්මුණු පැත්තෙන්ම බැස රියට නැංගාය.

210 ඉක්බිති වෙස්සන්තර ක්ෂත්‍රිය රජතෙමේ බොහෝ දන්දී මවට හා පියාට වැඳ ඔවුන් වටේ කැරකී,

211 සතරදෙනෙකු විසින් අදින අශ්ව රථයට වහා නැග අඹු දරුවන් රැගෙන වංක පර්වතයට ගියේය.

212 ඉක්බිති වෙස්සන්තර රජතෙම "යම් තැන බොහෝ ජනයාවීද ඔවුන් විචාරා අපි යමු. ඤාතීහු නිරොග වෙත්වා."

213 නුවරින් නික්ම නැවතී බැලූකල්හි සිනෙරු පර්වතය හා වනය මුදුන් මල් කොට ඇති පෘථිවිය කම්පා වූවාය.

214 "මද්‍රිය දැන් බලන්න. සිවිරට ශ්‍රෙෂ්ඨ රජුගේ වාසස්ථානයවූ මාගේ පියාගේ ගෘහය පෙනේ"

215 බමුණෝ ඔහු අනුව ගියෝය. ඔව්හු ඔහුගෙන් අශ්වයන් ඉල්ලූහ. සතරදෙන අශ්වයන් සතරදෙන ඉල්වූයේ දුන්නේය.

216 "මද්‍රීදෙවිය, දැන් කල්පනා කරව. යහපත් හැඩක් මෙන් පෙනේ. රතුපාට ඇති මෘගයෝ හික්මුණු අශ්වයන් මෙන් මා උසුලත්.

217 ඉක්බිති එහි පස්වැන්නෙක් ආවේය. හෙතෙම ඒ රථය ඉල්ලුවේය. ඉල්වන ලද ඔහුට දුන්නේය. ඔහුගේ සිත නොහැකුළුනේය.

218 ඉක්බිති වෙස්සන්තර රජතෙම ස්වකීය ජනයා බස්වා ධනය බලාපොරොත්තු බමුණාට අශ්ව රථය පවරා දුන්නේය.

219 "මද්‍රිදේවිනි, ඔබ කෘෂ්ණජිනාව ගනුව. බාල මෝ තොමෝ සැහැල්ලුය. මම ජාලිය ගන්නෙමි. ඔහු වැඩිමල් නිසා බරය.

220 රජතෙමේ කුමාරයා ගෙන දේවිය කුමරිය ගෙන ඔවුනොවුන් ප්‍රියවචන කථා කරමින් සතුටින් ගියාහුය.

(දාන කොටස නිමි)

221 "ඉදින් යම් මනුෂ්‍ය කෙනෙක් ඉදිරියට එන්නේද ඔවුන්ගෙන් මාර්ගය විචාරන්නෙමි. වංක පර්වතය කොහිද"

222 "ඔව්හු එහිදී අප දැක කරුණාව ඉපදවූවාහුය. වංක වනය ඇතයයි දුකසේ ඔව්හු දන්වත්.

223 ඉදින් දරුවෝ වනයෙහි පලගත් ගස් දක්නෙහිද දරුවෝ ඒ ගෙඩි ඉල්ලා අඬත්.

224 අඬන දරුවන් දැක කණගාටුවට පත්වූ මහත් ගස් තෙමේම නැමී දරුවන් සමීපයට එත්.

225 සියලු අවයවයෙන් යහපත්වූ මද්‍රිදෙවිය ලොම් කෙළින් සිටුවන්නාවූ පෙර නොවූ මේ පුදුමය දැක සාධුකාර දුන්නීය.

226 ලොකයෙහි ඒකාන්තයෙන් පෙර නොවූවිරූ ලොම් දැහැගන්වන්නාවූ පුදුමයකි වෙස්සන්තරගේ ආනුභාවයෙන් ගස් තුමූම නැමුනාහ.

227 දෙවතාවෝ දරුවන් කෙරෙහි අනුකම්පාවෙන් මාර්ගය කොට කළාහ. පිටත්වූ දවසේම චෙත රටට පැමිණියාහුය.

228 ඔව්හු දීර්ඝ මාර්ගය ගෙවා චෙත රටට පැමිණියාහුය. එය බොහෝ මාංශ සහිත ආහාර හා සුරා ඇති දියුණු පිරුණු ජනපදයකි.

229 ලක්ෂණ ඇති මද්‍රි දේවිය දැක චෙතිය රට වැස්සෝ රැස්වූවාහුය. ඒකාන්තයෙන් සිවුමැළි මේ ආයඨාව පයින් දුව ඇවිදින්නීය.

230 ක්ෂත්‍රියයෝ රන්සිවිගෙයින් එසවීමෙන් ඇවිද්ද මද්‍රි දේවී අද කැලේ පයින් ඇවිදිත්.

231 ඒ දැක චෙතරටේ රජවරු අඬමින් ලගට පැමිණියාහුය. "දෙවයන් වහන්ස, සැප සනීප කෙසේද, නිදුක් බව කෙසේද, කිමෙක්ද ඔබගේ පියා නිරෝගද, සිවිරටවාසීන්ගේ තොරතුරු හෝ කෙසේද,

232 "මහරජ ඔබගේ භව සමූහය කොහිද, ඔබගේ අලංකාර රථය කොහිද? අශ්වයන් නැතිව, වාහනයක් නැතිව බොහෝ දුරක් ආවෙහිය. කිනම් සතුරෙකු විසින් මඩනා ලද්දේ මේ පැත්තට ආවෙහිද?"

233 "යහළුවෙනි, මට සැපය, එසේම නුඹලාත් සුවපත් වෙත්වා. තවද මගේ පියතෙම නිරෝගිය. සිවිරට වැස්සෝද නිදුකින්ය.

234 "මම නගුල් සේ උඩට නැගුණු දළ ඇති සම්පූර්ණයෙන් සුදු ශ්‍රේෂ්ඨ ඇතෙකුවූ සියලු යුද්ධයන්හි ජය බිම් දන්නාවූ ඇතා දන් දුනිමි.

235 "රන් පලසකින් වැසුණු ඔද වැගිරෙන සතුරන් මඩින දළ ඇති සුදුවූ කෛලාස පර්වතය වැනි වල්විදුනා සහිත

236 "සේසත් සහිත, උපකරණ සහිත, වන වෙදුන් සහිත, රජුන් උසුලන අග්‍රයානය මම බමුණන්ට දුන්නෙමි.

237 "එහිදී මට සිවිහු කිපුනාහ. පියාගේද සිත වෙනස් විය. රජ මට දඬුවම් කරයි වංක පර්වතයට යන්නෙමි. වනයෙහි යම්තැනක වසම්ද එහි අවකාශ ස්ථානයක් දනිව්."

238 "රජතුමනි, ඔබගේ යහපත් පැමිණීමක් වේවා. නමුත් ඔබ පැමිණි නුදුරු කල් ඇත්තේ වේවා. ක්‍රමයෙන් පැමිණි අධිපතියෙකි. යමක් මෙහි ඇත්නම් කියව.

239 "රජතුමනි, පලාකොළද, නෙළුම් අලද, මීපැණිද මස්ද, පිරිසිදු ඇල්සාලේ බත්ද අනුභව කරව. ඔබ අපට ආගන්තුකයෙකි."

240 "යමක් දෙන ලද්දේද සියල්ල අගේකොට සලකන ලදී. රජතෙමේ මා රටින් පිටුවහල් කරයි. වංක පර්වතයට යන්නෙමි. වනයෙහි යම්තැනක වසම්ද ඊට අවකාශ ස්ථානයක් දනිව්"

241 "රජතුමනි, යම්තාක් සිවිරට වඩන මහරජුට ඔබගේ නිර්දොෂ භාවයෙන් සහනයක් ඉල්වන්නට රජු සමීපයට චේතිය රටවැස්සෝ යත්ද ඒතාක් මේ චේතරටම සිටීවා

242 "රජතුමනි, චේතරට වැස්සෝ සතුටට පත්වූවාහු ලබන ලද පිහිට ඇත්තාහු ඔබ පෙරටුකොට පිරිවරාගෙන යත්. එසේ දැනගනු මැනව."

243 "මට සහනයක් ඉල්වීමට රජු සමීපයට යාමට තොපට රුචි නොවේවා. එය සලකා බැලීමට රජු එහි අධිපතියා නොවේ

244 "සිවීන්ගේ බලය වැඩිය භට සමූහයාද නියම්ගම් වැස්සෝද මා නිසා රජු රාජ්‍යයෙන් පහකිරීමට කැමතිවෙත්.

245 "රට වඩන මහරජ තුමනි, රටෙහි මෙබඳු දෙයක් නම් චෙතරට වැස්සන් විසින් පිරිවරණ ලදුව මෙහි රජකරව

246 "මේ රට සමෘද්ධය, සම්පත්තියෙන් පිරුණේය. මහත්වූ සමෘද්ධ ජනපදයකි. දේවයන් වහන්ස, මේ රට අනුශාසනා කිරීමට අදහස් කරව."

247 "චෙතපුත්‍ර රජවරුනි, මගේ වචනය අසව්. රටින් පිටුවහල් කළ මට රාජ්‍යයක් කිරීමට කැමැත්තක්වත් අදහසක් වත් නැත.

248 "යම් බලකායක් ඇද්ද නියම්ගම් වැස්සෝ ඇද්ද රටින් පිටුවහල් කළ රජු චෙතරට වැස්සන් රාජ්‍යයෙහි රජකමට පත්කළහයි ඔව්හු නොසතුටු වෙත්.

249 "ඒකාන්තයෙන් මා නිසා තොපගේ අසමගියක් වන්නේය. සිවින්ගේ කලහය හා යුද්ධය මට රුචි නොවේ.

250 "නැවතද දරුණු කෝලාහලද නොයෙක් පහර දීම්ද කෙනෙක් නිසා බොහෝ ජනයාට හිංසා කරන්නහු නම් එය මට නොගැලපේ.

251 "යමක් දෙන ලද්දේද, එය පිළිගන්නා ලදී. සියල්ල අගේකොට සලකන ලදී. රජු මා හිර කරයි වංක පර්වතයට යන්නෙමි. වනයේ යම් තැනක වසම්ද, යහළුවෙනි මට අවකාශ ස්ථානයක් දනුව."

252 "ඉදින් ඔබට අපි කියමු. යම්සේ වැටහේනම් එසේ කරාවා. ගිනි දල්වා ගත් එකඟ සිත් ඇත්තාහු රජව පැවිදි වූහු යම් තැනෙක්හිද, එය අනු දත්තේය.

253 "රජතුමනි, පර්වතය වූ මෙයයි. ඔබ යම්තැනෙක්හි පුත්‍රයන් සහ භාර්‍ය්‍යාව සමග සිටින්නට කැමතිවන්නෙහිද, ඒ පර්වතය මේ ගන්ධමාදන පර්වතයයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**254** කඳුළු පිරුණු ඇස් ඇති ඇඬූ කඳුලින් යුත් චෙත රටවැස්සෝ ඔහුට මෙසේ නැවත නැවත කීවාහුය.

**255** "පින්වතාණෙනි, සිහිල් සෙවන ඇති සිත් සතුටු කරන්නාවූ නොයෙක් වෘක්ෂයන්ගෙන් ගැවසී ගත්තාවූ විපුල නම් පර්වතයක් දක්නෙහිය.

**256** "පින්වතාණෙනි, එය ඉක්මවා ගැඹුරුවූ පර්වත කුහර ඇති කෙතුමතී නම් නදිය දක්නෙහිය.

**257** "පුථුලොම නම් මත්ස්‍යයන්ගෙන් ගැවසී ගත්තාවූ යහපත් තොටුපලවල් ඇති මහත් දිය ඇති එහි නා බී පුත්‍රයන් සතුටු කරවා.

**258** "පින්වතාණෙනි, ඉක්බිති මිහිරි ගෙඩි ඇත්තාවූ යහපත් මුදුනෙක හටගත්තාවූ සිහිල් සෙවන ඇති යහපත්වූ නුග රුකක් දක්නෙහිය.

**259** "පින්වතාණෙනි, ඉක්බිති නොයෙක් පක්ෂි සමූහයාගෙන් යුක්තවූ කිම්පුරුෂයන්ගෙන් යුක්තවූ නාලික නම් ගල් පර්වතයක් දක්නෙහිය.

**260** "ඊම ඊශාන දිග සුදු නෙළුම් වලින් හා සුදුහෙල් මැලිවලින් යුක්තවූ මුචලින්දනම් ඒ විලය.

**261** "ඒ වනය වලාකුලක් වැනි නිතර කොළ පැහැ ඇත්තේය. නිල් තණකොළ ඇත්තේය. ගොදුරු බලාපොරොත්තු සිංහයෙකු මෙන් මල්ගස් වලින්ද ගෙඩි ඇති ගස්වලින්ද යන දෙවර්ගයෙන් යුක්තවූ වනයට වැද,

**262** "එහි ඍතු ගුණයෙන් පිපුනු වෘක්ෂයෙහි කොටස කළ ශබ්ද ඇති, මිහිරි නාද ඇති, නොයෙක් පාට ඇති බොහෝ පක්ෂීහු ශබ්ද කරන්නාහු අනුව ශබ්ද කරත්.

**263** "පර්වතයන්හි දුකසේ යා හැකි තැන්වලට ගොස් ගංගා හටගන්නා තැන්ද කරඳ කුඹුක් ගස්වලින් යුත් පොකුණුද දක්නෙහිය.

264 "පුථුලොම නම් මසුන්ගෙන් ගැවසීගත් සමවූද සතරැස්වූද යහපත්වූද පිළිකුල් ගඳ නැත්තාවූද, යහපත් තොටුපල් ඇති මහත් දිය ඇති,

265 "ඒ නදියගේ ඊශාන දිග පන්සලක් තනන්න. පන්සලක් තනා පිණ්ඩපාතයෙන් වාසය කරන්න."

වනයට ඇතුල්වූ ක්‍රමයයි

266 කලිඟුරට දුන් නිවිට්ඨ බ්‍රාහ්මණ ගම වසන්නාවූ ජූජක නම් බ්‍රාහ්මණයෙක් විය. ඔහුට අමිත්තතාපනා නම් තරුණ භාර්‍ය්‍යාවක් වූවාය.

267 ඒ ගම ස්ත්‍රීහු දියට ගඟට ගිය ඇ දැක රැස්වී බොහෝ ඔනෑකමින් මෙසේ කීවාහුය. අවනම්බුද කළාහුය.

268 "මෙසේ තරුණවූ ඔබ මහල්ලෙකුට පාවා දුන්නාහුද, ඒකාන්තයෙන් නුඹගේ ඒ මවු සැතිරියෙකි. ඒකාන්තයෙන් ඒ පියතෙම සතුරෙකි.

269 "(i) මෙසේ තරුණවූ ඔබ මහල්ලෙකුට පාවා දුන්නාහුද ඔබගේ ඥාතීහු රහසිගතව ඔබ ගැන (ii) අයහපතක් කථාකර තිබේ

270 (269 (i) යෙදිය යුතුයි.) නොකටහැක්කක්, කථා කර තිබේ.

271 (269 (i) යෙදිය යුතුයි.) නපුරක් කථාකර තිබේ.

272 (269 (i) යෙදිය යුතුයි.) අහිතවත් දෙයක් කථා කර තිබේ.

273 "මෙවැනි තරුණියක්ව නොකැමති විසීමක් වසන්නෙහිය. යම්බඳු තී මහල්ලෙකු කෙරෙහි වසයිද, ජීවත්වීමට වඩා මරණය යහපත්ය.

274 "කල්‍යාණිය, තොපගේ මවද පියාද යහපත්යයි කිව නොහැක. මෙසේ තරුණවූ ඔබ අනික් පුරුෂයෙකු නොලද්දාහුය. මෙවැනි ළාබාල ඔබ මහල්ලෙකුට දුන්නෝය.

275 "තී විසින් නවවෙනි යාගය නපුරුකොට පුදන ලද්දක්ය. ගිනිදෙවියා පිදීමක් නොකරණ ලදී. එනිසා මෙසේ තරුණවූ ඔබ මහල්ලෙකුට දුන්නාහුය.

276 "මෙසේ තරුණවූ ඔබ මහල්ලෙකු සමීපයෙහි වසාද ඒකාන්තයෙන් ලොකයෙහි බ්‍රහ්මචය්‍ය්‍යාව පිහිටකොට ඇති සිල්වත් උගත් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට ඔබ ශාප කෙළෙහිය.

277 "යමෙකුට මහළු ස්වාමියෙකු ලැබේද, සර්පයකු විසින් දෂ්ට කරණ ලද දුක දුකක් නොවේ. ආයුධයකින් ගසන ලද පහර දුකක් නොවේ. ඒ මහලු සැමියා ලැබීමෙන්වූ දුකම දුක් වන්නේය.

278 "මහළු ස්වාමියා සමග ප්‍රීතියක් නැත. ඇල්මක් නැත. ප්‍රිය කථාවක් නැත. සිනාසුනත් නොහොබනේය.

279 "යම් කලෙක්හි තරුණතෙමේ රහසිගතව තරුණිය සමග මන්ත්‍රණය කෙරේද සිතේ යම් ශොකයක් ඇද්ද ඒ ශොක සංසිඳේත්.

280 "ඔබ තරුණය, ලක්ෂණය, පුරුෂයන් විසින් බලාපොරොත්තුවන ලදී. ඥාති ගෙදරට යන්න මහල්ලා කිනම් ප්‍රීතියක් ගෙන දෙන්නේද?"

281 "බමුණ ගඟට ඔබට දිය ගෙනෙන්නට නොයන්නෙමි ඔබගේ මහළුකමින් ස්ත්‍රීහු මට අවනම්බු කරත්'

282 "ඔබ මගේ වැඩ නොකරව, මට දිය නොගෙනවා මම දිය ගෙනෙන්නෙමි. කිපෙන්නට නොවුවමනාය.

283 "යම් බඳුවූ ස්වාමියන් ලවා දිය ගෙන්වන්නාවූ කුලයක මම නොඉපදුනෙමි. බමුණ, එසේ දනුව, මම ඔබගේ ගෙදර නොවසමි.

284 "බමුණ, ඉදින් මට දාසයකු හෝ දාසියක හෝ නොගෙණෙන්නෙහි නම්, මෙසේ බමුණ ඔබ සමීපයෙහි නොවසන බව දනුව"

285 "බැමිණිය, මට කර්මාන්ත කරණ තැනක් හෝ ධනයක් හෝ ධාන්‍යයක් හෝ නැත්තේය. මම පින්වතියට කොයින් දාසයකු හෝ දාසියක හෝ ගෙනෙන්නෙම්ද? මම පිනැත්තියට උපස්ථාන කරන්නෙමි. පින්වතිය නොකිපෙව"

286 "එව ඔබට මම කියන්නෙමි. මා කියන්නාසේම මේ වෙස්සන්තර රජතෙම වංකගිරි පර්වතයෙහි වසයි.

287 "බමුණ නුඹ එහි ගොස් දාසයකුත් දාසියකුත් ඉල්ලව, ඒ රජතෙමේ ඉල්ලන්නාවූ තොපට දාසයකුද දාසියකුද දෙන්නේය."

288 "මම මහළුවූයෙමි. දුර්වලයෙමි. පාර ඈතය, යාමටද අපහසුය. පින්වතිය, නොහඬව, ඔබ සිත් වෙනස් කර නොගනුව. පින්වතියට, උපස්ථාන කරන්නෙමි. පින්වතිය නොකිපෙව."

289 "යුද්ධයට නොගොස් යුද්ධයට නොබැසම පැරැදුණේ යම්සේද, බමුණ එසේම ඔබ නොගොස්ම පැරදුනේය.

290 "බමුණ ඉදින් මට දාසයකු හෝ දාසියක හෝ නොගෙන්නෙහිද, බමුණ දනුව ඔබගේ ගෙයි නොවසන්නෙමි. ඔබට නොසතුටක් කරන්නෙමි. එය ඔබට දුකක් වන්නේය.

291 "උත්සව දිනයන්හි ඍතු ගෙවෙන දවස්වල අලංකාරව හැඳ පැළඳගත් මා දක්නෙහිද අන්‍යයන් සමග ප්‍රීතිවන්නාවූ මා දැක ඔබට දුකක් ඇතිවන්නේය.

292 "බමුණ මගේ නොදැකීමෙන් මහළුව අඬන්නාවූ තොපගේ කුදද හිස පැසීමද බොහෝ වෙත්."

293 ඉක්බිති ඒ බමුණුතෙමේ බියවූයේ බැමිණියට වසඟවූයේ කාමාශාවෙන් පීඩාවූයේ බැමිණියට මෙසේ කීවේය.

294 "බැමිණියෙනි, ඔබ මට මාර්ගොපකරණ කරව, යහපත්වූ සකස් කළ හකුරු සහිත කැවුම්ද මී පිඬු ද ගුලි කළ අත්සුනුද ගුලි නොකළ අත්සුනුද සකස් කරව.

295 "ජාතිගොත්‍ර කුලප්‍රදෙශයන්ගෙන් සමානවූ දාස දරුවන් දෙදෙනද ගෙනෙන්නෙමි. ඔව්හු රෑ දාවල් දෙක්හි කම්මැලි නැතිව තොපට උපස්ථානයට පැමිණ සිටින්නෝය."

**296** බ්‍රාහ්මණය, මෙසේ කියා සෙරෙප්පු දෙක දමා ගත්තේය. ඉක්බිති හෙතෙමේ කථාකොට භායර්‍යාව ප්‍රදක්ෂිණාකොට

**297** ඒ බ්‍රාහ්මණතෙම ඇඬූ මුහුණින් යුක්තව සිල් සමාදන්වූයේ දාසයන් සෙවීමට යන්නේ සමෘද්ධවූ සිවින්ගේ රටට ගියේය.

**298** හෙතෙම එහි ගොස් එහි යමෙක් රැස්ව සිටියාහුද වෙස්සන්තර රජතෙම කොහිද කොහිදී ක්ෂත්‍රිය තෙමේ දකිම් දැයි ඇසුයේය.

**299** යම්කිසිකෙනෙක් එහි රැස්වූවාහුද ඒ ජනතෙමේ ඔහුට "බ්‍රාහ්මණය රජතෙම බොහෝකොට දන්දීමෙන් තොප විසින් පෙළන ලද්දේ ස්වකීය රටින් පිටවී වංක පර්වතයෙහි වසයි"

**300** බැමිණිය විසින් චොදනා කරණ ලද ඒ බ්‍රාහ්මණ තෙම කාමයෙන් ගිජුවූයේ කඟවේණුන් හා දිවියන් විසින් ගැවසීගත් වල්මෘගයන් ඇති වනයෙහි දුකක්ම වින්දේය.

**301** බෙලිලීයද ගිනිපුදන හැන්දද කෙණ්ඩියද ගෙන යම් තැනෙක්හි බලාපොරොත්තු ඉටුවන්නේදැයි ඇසූයේද ඒ මහවනයට වැදුනේය.

**302** මහවනයට වැදුන ඔහු ශුනකයෝ වට කරගත්හ. මංමුළාවූ ඔහු මහහඬින් කෑගැසුවේය. මාර්ගයෙන් ගියේය.

**303** වස්තු ලෝභී දුශ්ශීලවූ ඒ බ්‍රාහ්මණතෙම ගොස් වංක පර්වතයට යන මාර්ගයෙහි මංමුළාවූයේ මේ ගාථාවන් කීයේය.

**304** "බියෙහි පිහිට වන්නාවූ නොපරදින, මසුරු සිත දුරු කළ අතිශ්‍රෙෂ්ඨ රාජපුත්‍රයා කොහිද? මට වෙස්සන්තර කවරෙක් පෙන්වන්නෙහිද,

**305** "උපන් අයට පෘථිවිය මෙන් යමෙක් ඉල්වන්නන්ට පිහිට වේද, පොළොව හා සමාන (ii) වෙස්සන්තර මහ රජු කවරෙක් මට පෙන්වන්නෙහිද,

**306-312** (මේ ඡේද අගට 305 (ii) යෙදිය යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

306 "ගංගාවන්ට සාගරය මෙන් ඉල්වන්නන්ට යම් පිහිටක් වේද, මහා සාගරය වැනි,

307 "යහපත් තොටුපල් ඇති අතිශයින් පිරිසිදුවූ සිහිල් දිය ඇති යහපත්වූ මල් රේනුවෙන් යුත් පියුමින් ගැවසීගත්තාවූ විලක් වැනිවූ

308 (i) මාර්ගයෙහිවූ සිසිල් සෙවන ඇති යහපත්වූ සත්වයන් විශ්‍රාම ගන්නාවූ ක්ලාන්තවූවන්ට පිහිට වන්නාවූ (ii) ඇසතු ගසක් මෙන්වූ

309 (308 (i) යෙදිය යුතුයි) නුගගසක් මෙන්වූ,

310 (308 (i) යෙදිය යුතුයි) අඹගසක් මෙන්වූ,

311 (308 (i) යෙදිය යුතුයි) සල් ගසක් මෙන්වූ

312 (308 (i) යෙදිය යුතුයි) වෘක්ෂයක් මෙන්වූ

313 (i) මෙසේ මහවනයට වැද විලාප කියන්නාවූ මට 'මම දනිමියි' යමෙක් කියන්නේද (ii) හෙතෙම මට සතුටක් උපදවන්නේය.

314 (313 (i) යෙදිය යුතුයි) ඔහු විසින් එක වචනයෙන් බොහෝ පින් රැස් කරන්නේය."

315 ඔහුට වනයෙහි හැසිරෙන්නාවූ වැද්දෙකුවූ චෙතරට වැසියෙක් මෙසේ පිළිවදන් දුන්නේය. "බ්‍රාහ්මණයෙනි, තොප විසින් ක්ෂත්‍රියතෙම ඉතා දන්දීම නිසා උපද්‍රවයට පමුණුවන ලදී. සිය රටින් පිට මං කරන ලද්දේ වංක පර්වතයෙහි වෙසෙයි.

316 "බ්‍රාහ්මණය, රජතෙම බොහෝ දන්දීම නිසා තොප විසින් හිංසාවට පමුණුවන ලද්දාහ. අඹුදරුවන් රැගෙන විත් වංක පර්වතයෙහි වසයි.

317 "ජලයෙහි කොකෙකු මසකු මෙන් රාජපුත්‍රයා සොයමින් රටින් වනයට ආ තෝ නුසුදුසු දේ කරන මෝඩයෙකි.

318 "බමුණ, මෙහි තොපට ජීවත් වන්නට නොදෙමි. මා විසින් හරින ලද මේ ඊය තොපගේ ලෙය බොන්නේය.

319 "තොපගේ හිස සිඳ අතුනුබහන් සහිත හෘදය මාංශය රැගෙන තොපගේ ශරීර මාංශයෙන් මාර්ග දේවතාවන් පුදන්නෙමි

320 "බමුණ, තාගේ පපුමස් කපා තාගේ මසින්ද මෙද තෙලින්ද හිස්මුදුනෙන්ද යාග පූජා කරන්නෙමි.

321 "බමුණ මා විසින් තොපගේ මාශයෙන් එය යහපත් කොට පුදනලද්දේ යහපත් කොට හෝම කරන ලද්දේ තෝ රාජ පුත්‍රයාගේ භායර්‍යාව හෝ පුත්‍රයන් හෝ ගෙන නොයන්නෙහිය"

322 "චේත පුත්‍රයෙනි මා කියන්නක් අසව. බ්‍රාහ්මණ දූතතෙමේ වධයට නොසුදුසුය. එහෙයින් දූතයා නොනසත්. මේ ධර්මය පෙර සිට පැවත එන්නකි.

323 "සියලු සිවිරටේ මිනිස්සු මම මෙසේ හැඳින්වූහ. පියතෙමේ වෙස්සන්තර දකින්ට කැමැත්තෙන් සිටී. ඔහුගේ මව්තොමෝද දුර්වලය. ටික කාලයකින්ම ඇගේ ඇස් ඇඬීමෙන් දියවී යන්නේය.

324 "චේත පුත්‍රය, මට ඇහුම්කන් දෙව. මම ඔවුන් විසින් එවන ලද දූතයෙක්මි. රාජපුත්‍රයා ගෙන යන්නෙමි. ඉදින් දන්නෙහි නම් මට කියව.

325 "ඔබ මට ප්‍රියවූ වෙස්සන්තරගේ ප්‍රිය දූතයෙකි. ඔබට සතුටු පඬුරක් දෙමි. බමුණ මේ මී පැණි ලබ්බද මුව ගාතයද දෙමි. තොපට යම්තැනක කැමතිදේ ලැබේද, ඒ දෙශයද කියන්නෙමි"

326 "මහා බ්‍රාහ්මණය, යම්තැනෙක්හි දරුවන් සහ වෙස්සන්තර රජතෙම වසාද අර පෙනෙන්නේ ගන්ධ මාදන නම් ගල් පර්වතයයි"

327 "කෙක්කද, ගිනි පුදන හැන්දද, ජටාවද දරමින් සම් අඳිමින් බිම හොවියි. ගින්න නමස්කාර කරයි.

328 "මේ නිල්වූ නොයෙක් ගෙඩි දරණ වෘක්ෂයෝ දක්නා ලැබෙත්. අඳුන් පර්වතයන් හා නිල්වලාකුළු මෙන් උඩට නැංගාහ.

329 "එකවරක් පමණ බිව් මත්පැන් පානය කරන්නන් මෙන් ධවය අශ්වකර්ණය කිහිරිය යන ගස්ද, සල් ගස්ද, කොලොම්ගස්ද මාලුවා වැල්ද වාතයෙන් වෙවුලත්.

330 "වෘක්ෂ ශාඛාවන් මත්තෙහි සංගීතයක්ම ඇසෙනු ලැබේ. නෘත්‍යයට ප්‍රිය කොවුල් සමූහය වෘක්ෂයෙන් වෘක්ෂය පනිත්.

331 "සෙලවෙන අතු කොළ යන්නහු කැඳවන්නාක් මෙන් පැමිණීමට කැමති කරවන්නා මෙනි. යම්තැනෙක්හි වෙස්සන්තර රජතෙම පුත්‍රයන් සමග සිටීද එහි සිටින්නහු ප්‍රිය කරවයි.

332 (මේ ඡේදය 327 ඡේදය මෙනි)

333 "අඹද දිවුල්ද, කොස්ද, සල්ද, දඹද, බුළුද, අරළුද, නෙල්ලිද, බෝගස්ද, මසන්ද,

334 "යහපත් තිඹිරිගස්ද, නුගද, දිවුල් ද මෙහි ඇත්තාහ. මීමැස්සෝ මීපැණි වගුරුවත්. බාගෙට පැසුණු දිවුල්ද ඇත්තාහ.

335 "පරෙවියෝද වන්නාහ. මිදිද ඇත්තාහ. මී කැමැත්තෝ පිරිසිදුවී තෙමේම ගෙන බොත්.

336 "තවත් තැනක පිපුණු අඹය, තවත් ගෙඩි හටගන්නා අඹය. තවත් අමුවූද පැසුණාවූ ද මැඩි පිට පාට ඇති අඹවෙත්.

337 "නැවත මේ තන්හි යට සිටි පුරුෂයා වර්ණයෙන් හා සුවඳින් උතුම් අඹගෙඩි ගනියි.

338 "මට ඉතා පුදුමයි. මට නුදුන් වනය ඉඟිකිරීමක් මෙන් වැටහෙයි. දෙවියන්ගේ වාසස්ථානයක් මෙන් හොබියි.

339 "මහ වනයෙහි තල්ගස්ද පොල්ගස්ද ඉඳිගස්ද මල් මාලාවක් මෙන් වෙලී සිටිත්. කොඩි මුදුන් මෙන් පෙනෙත්. නොයෙක් පාට ඇති මල්වලින් තරුවලින් සරසන ලද අහස මෙනි.

340 "පිපුණාවූ කෙලිඳ ගස්ද කොට්ටම් ගස්ද තුවරලාද පලොල්ද පිපුනාවූ දොඹගස්ද මහදොඹ ගස්ද කොබෝලීලද කඳු කොබෝලීලද,

341 "බොහෝවූ ඇසළ ගස්ද, සෝම ගස්ද, අගිල්ද, බදුල්ල ගස්ද පුත්තජීවනම් ගස්ද කුඹුක් ගස් ද පියාගස් ද පිපුණාහ.

342 "කෙලින්ද ගස්ද හල් ගස්ද මිදෙල්ලද කොහොඹද රට දෙල් ද කිහිරිගස්ද එහි පිදුරු කලවිටක් සමාන සල් ගස්ද පිපුණාහ.

343 ඊට සමීප යහපත් භූමිභාගයෙහි දෙවියන්ගේ නඳුන් උයන බඳු පියුම් උපුල් වලින් යුත් පොකුණක් ඇත.

344 නැවත මල් පැනියෙන් මත්වූ යහපත්ව නාද කරණ කොවුලෝ ඍතු ගුණයෙන් පිපුණාවූ වෘක්ෂයන්හි වාතය ඒකනින්නාද කරවයි.

345 පියුම් පතක් පතක් පාසා නෙළුම්වලින් රේණු වැටී පොකුරුමී ඇතිවේ. ඉක්බිති මෙහි දකුණින් ද බටහිරින් ද වාතයෝ හමත්. පන්සල මල් කෙසරු රේණුන්ගෙන් ගැවසුණේ විය.

246 මෙහි සතර මංසන්ධි මහත්ය. කුඩාහැල්ද උරු හැල්ද ඇත. මස් කැස්බන් එක එකා පිටිපසින් යන්නාහ. මෙහි කකුළුවෝ බොහෝය. නෙළුම් අලවලින් මී වැගිරෙයි. නෙළුඹුදැලි වලින් ගිතෙල් හා කිරි වැගිරෙයි.

347 "ඒ වනයෙහි නොයෙක් සුවඳින් මිශ්‍රවූ සුවඳවත් වාතය හමයි. ඒ වනය සුවඳ ඇති මල් අතුවලින් දැඩිසේ සුවඳ කරයි. මී මැස්සෝ මල් සුවඳින් හාත්පස ශබ්ද පවත් වන්නාහ.

348 "නැවත එහි නානාප්‍රකාරවූ බොහෝ පක්ෂීහු ඇත්තාහ. ඔවුන් ඔවුනොවුන් පක්ෂිධෙනූන් සමග නාද කරමින් සතුටු වෙත්.

349 "පොකුණෙහි වසන පක්ෂීහු නන්දිකා, ජීවපුත්තා පියපුත්තා පියානන්දා යන නම් ඇත්තාහුය.

350 "(ඔව්හු) දක්ෂයන් විසින් නොයෙක් පාට ඇති මලින් ගොතන ලද සුවඳ කැවූ මල් මාලාවක් මෙන් සිටිත්. කොඩි මුදුන් මෙන් පෙනෙත්. එහි වෙස්සන්තර රජතෙම දරුවන් සමග වාසය කරයි.

351 (මේ ඡේදය 327 ඡේදය මෙනි.)

352 "මී පැණියෙන් මිශ්‍ර කරණ ලද මාගේ මේ අත්සුනු ආහාරයද යහපත්කොට කරණලද මී හා පොරිද යන මේ ආහාරය තොපට දෙමි."

353 මාර්ගොපකරණ තොපටම වේවා. මම මාර්ගොපකරණ බලාපොරොත්තු නොවෙමි. බ්‍රාහ්මණය මගෙන්ද රැගෙන සුවසේ යව.

354 "මේ අඩිපාරක් හමුවේ. එය කෙලින්ම ආශ්‍රමයටය. එහි මඩපාට දත් ඇති ධූලිවැකුණු ශරීර ඇති බමුණු වෙසක් දරණ අච්චිත නම් ඍෂිවරයෙක් ඇත්තේය. හෙතෙම අකුස්සක්ද ගිනි පුදන හැන්දක්ද ජටාවක්ද දරයි.

355 "සම් අඳින්නේ බිම හොවියි. ගින්නට නමස්කාර කරයි ඔබ ඔහු ළඟට ගොස් විචාරව, හෙතෙම ඔබට මග කියයි."

356 බමුණු තෙමේ මෙය අසා චේත පුත්‍රයා වට කැරකැවී වැඳ අච්චුත තාපසතෙමේ යම්තැනෙක්හිද සතුටු සිතින් ගියේය.

කුඩා වන වර්ණනාව

357 යන්නාවූ ඒ බ්‍රාහ්මණතෙමේ අච්චුත තාපසයා දුටුවේය. බ්‍රාහ්මණතෙම ඔහු දැක තාපසයා සමග සතුටුවිය.

358 "පින්වත සැප කෙසේද කිමෙක්ද, පින්වත්හට දුකක්නැද්ද, කිමෙක්ද, සිඟීමෙන් ජීවත්වන්නෙහිද? කිමෙක් මුල් ඵල බොහෝ ලැබේද?

359 "කිමෙක්ද, ඩැහැ ලේ බොන මැස්සෝද, මදුරුවෝද සර්පයෝද අඩුද? වල්මුවන් ඇති වනයෙහි හිංසාවක් නැත්තේද?"

360 "බ්‍රාහ්මණය, මට යහපති. බ්‍රාහ්මණය, නැවතද මට දුකක් නැත. නැවතද පිඩු සිඟීමෙන් යැපෙමි. නැවතද මුල් ඵල බොහෝයි.

361 "නැවත ඩැහැ ලේ බොන මැස්සෝද, මදුරුවෝද අඩුය. චණ්ඩ මෘගයන්ගෙන් ගැවසීගත් වනයෙහි මට හිංසාවක් නැත.

**362** "වර්ෂ බොහෝ ගණනක් ආශ්‍රමයෙහි වසන්නාවූ මට සිතට අප්‍රිය ලෙඩක් ඇතිවූ බවක් නොදනිමි.

**363** "මහණ බමුණ තොපට යහපත් පැමිණීමක් වේවා. නැවත ඔබට අදූරාගමනය වේවා. පින්වතානෙනි ඇතුළට එන්න. ඔබගේ පාදයන් සෝදාගන්න.

**364** "බ්‍රාහ්මණය උතුම් උතුම්වූ තිඹිරිද, කෝන්ද, මිහිරි කාසුමාරියද, යන කුඩා සුදුසු, හොඳ හොඳ ගෙඩි වර්ග අනුභව කරන්න

**365** 'මහාබ්‍රහ්මය, ඉදින් ඔබ කැමැත්තෙහි නම් පර්වත කුහරයෙන් ගෙන ආ සිහිල්වූ මේ පැන් පානය කරණු මැනව"

**366** "යමක් දෙනලද්දේද, එය පිළිගන්නාලදී. සියල්ල අගයකොට සලකමි. සඤ්ජයගේ ස්වකීය පුත්‍රයා සිවීන් විසින් රටින් පිටකරණලදී. මම ඔහු දැකීමට පැමිණියෙමි. ඉදින් දන්නෙහි නම් මට කියන්න."

**367** "පින්වතා සිවි රජු පින් පිණිස දැකීමට නොඑයි. රජුගේ පතිව්‍රතා භාර්‍ය්‍යාව පින්වතා පතන්නෙහියයි සිතමි."

**368** "කෘෂ්ණජිනාව දාසියකකොට බලාපොරොත්තු වෙමියි සිතමි. ජාලිය කුමාරයා දාසයෙකුකොට බලාපොරොත්තු වෙහිද, නොහොත් තුන් මව් පුතුන් කැලෙන් ගෙනයන්ට ආයෙහිද? බමුණ, ධන ධාන්‍ය භොගයක් ඔහුට විද්‍යමාන නොවේ."

**369** "මම කෝපයෙන් තොර ස්වභාව ඇත්තේ වෙමි. මම පින්වතාගෙන් ඉල්වන්නට නොපැමිණියෙමි. ආර්‍ය්‍යයන්ගේ දැකීම යහපත්ය. එකට වාසය හැමකල්හි සැපය.

**370** "සිවීන් විසින් පිටුවහල් කරණලද සිවිරජු නුදුටුයෙමි. මම ඔහු දක්නට ආමි. ඉදින් දනිහි නම් කියව.

371-377 (මේ ඡෙද 326-332 ඡෙද මෙනි)

**378** "යහපත් භූමි ප්‍රදේශයෙහි ලුනුවරණ මල් පැතිරී ඇත්තාහ. පොළොව අළු තණකොළ වලින් නිල්පාටය. එහි ධූලි නොනඟී.

379 "මොණර කරක් හා සමානවූ පුළුන්වලට සම ස්පර්ශ ඇති තණකොළ අඟල් සතරකට වඩා උසට නොවැඩෙත්.

380 "අඹ දඹ දිවුල් බාගෙට පැසුනු අට්ටික්කාද යන ප්‍රයෝජනයට ගන්නා වෘක්ෂයන්ගෙන් ඒ වනය ආසා වැඩි කරයි.

381 "වෙරළුමිණි මාණික්‍ය වැනි මත්ස්‍ය සමූහයා නිති හැසිරෙන පිරිසිදු සුවඳවත් ජලය ඇත. එහි දියද ගලායයි.

382 ඊට නුදුරුතැන යහපත් භූමිප්‍රදේශයක. දෙවියන්ගේ නඳුන් වනය මෙන් පියුම් උපුල්වලින් ගැවසීගත් පොකුණු වෙයි.

383 "බමුණ ඒ විලෙහි විසිතුරු නොයෙක් නිල් සුදු රතු ත්‍රිවිධ උපුල් මල්වලින් යුක්තය.

384 "එහි (කොමු) සුදුපාට ඇත්තාවූද, පියුම්වලින්ද සුදුපාට ඇති හෙල්මැලි වලින්ද, කලම්බක නම් මල්වලින්ද යුක්තවූ මුචලින්ද නම් විල දක්නාලැබේ.

385 "මෙහි පිපුනාවූ පියුම් සීමාවක් නැතිව තිබෙත්. ග්‍රීෂ්ම හා හිම වැටෙන කාලයන්හි පිපුනාවූ පියුම් දන පමණ වෙත්

386 "විචිත්‍රවූ මල් ඇතිරි වලින් සුවඳ හමත්. මල් ගඳින් මීමැස්සෝ හාත්පස නාදකරන්නාහ.

287 "බමුණ, නැවත මෙහි දිය කෙළවර පිපුණාවූ කොළොම් ගස්ද, පලොල්ගස්ද, කොවිළාර ගස්ද තිබෙත්.

388 "පිපුණාවූ රුක්අගුනද, කච්චිකාරද, පාරිජඤ්ඤද නා ගස්ද, මුචලින්ද විල අවට තිබෙත්.

389 "මහරිගස්ද, සෙතපාරීසද, පියුම්ද, යහපත්කොට හමයි. මෙහි පිපුනාවූ නික ගස්ද, කළුනිකද, පියාගස්ද වෙත්.

390 "පිපුනාවූ පංගුර ගස්ද, මූනමල්ද, සල්ද, මුරුංගාද, වැටකෙයියාද, කිණිහිරිද, කනවෙර ගස්ද ඇත්තාහ.

391 "පිපුනාවූ කුඹුක්ගස්ද, අජ්ජුන කණ්ණද, මහානාමද, පිපුනාවූ අග් ඇති කැලගස්ද, දිලිසෙත්මය.

392 "ශ්වෙත පර්ණිද, සප්තපර්ණිද, කෙසෙල්ද, කුසුම්භරද, ධනුතක්කාරීද, සිංසපාවරණ පුෂ්පයන්ගෙන්ද

393 "පිපුනාවූ අච්ජිව, සබල සල්ලකීගස්ද, සෙතගේරුද තුවරලාද මංසිගස්ද, කොට්ටම් ගස්ද, කුලාවරද

394 "තරුණ වෘක්ෂද, පරණ ගස්ද ඍජුව පිපුනාහ. ආශ්‍රමයට දෙපැත්තෙන් තිබෙත්. හාත්පස ගිනිහල්ගෙයය.

395 "නැවත මෙහි ජලය කෙළවර මුරුවා ගස්ද, බොහෝ ඇත. මුං ද මෑ ද වෙත්. බොහෝ සෙවෙල් හා සිංසක පඳුරුදවේ.

396 "බමුණ නැවත මෙහි ජලය කෙළවර වෘක්ෂයෝ ඇත්තාහ. එනම් පිපුණු කොලොම් ගස්ය. පලොල් ගස්ය. කොවිළාරය, යන මොහුයි.

397 "පිපුනාවූ රුක් අඟුනද, කච්චිකාරද, පාරිජඤ්ඤද නාගස්ද, මුචලින්ද විල දෙපාර්ශවයෙහි වෙත්.

398 "මහරීය, සෙතච්ඡ, පද්මකද යහපත්ව හමයි, මෙහි පිපුණාවූ නිකද කළුනිකද පියාගස්ද ඇත්තේය.

399 "පංගුර ගස්ද, මූනමල්ද, සල්ද පිපුනාවූ මුරුංගාද වැටකේද, කිණිහිරිද, කණේරුද තිබෙත්.

400 "පිපුනාවූ කුඹුක්ද, අජ්ජුකණ්ණද, මහානාමද තිබෙත්. කැලගස් පිපුනාවූ අක්ගිස් ඇතිව දැල්වෙමින් මෙන් තිබෙත්.

401 "ඇත්දෙමටද, රුක්අත්තනද, කෙසෙල්ද, කුසුම්බරද මල්වලින් ලක්ෂණවූ ඇට්ටේරිය ගස් මල් යුක්තය.

402 "අච්ජිව සබල වෘක්ෂයෝද පිපුනාවූ සල්ගස්ද සෙතගේරුද, තුවරලාද, මසි, කුට්ය, කුලාවර ගස්ද ඇත්තාහ.

103 "බමුණ, මෙහි පොඩිගස්ද මහලු ගස්ද ඍජුව පිපුණාහ. ආශ්‍රමයට දෙපාර්ශවයෙහි ගිනිහල් ගෙය ඇත.

404 "නැවත මෙහි දෙපාර්ශවයෙහි මුරුවා ගස් බොහෝ ඇත්තාහ. මුං ජාතිද මහ මෑද සෙවාල රත්සඳුන් ගස්ද ඇත.

405 "සීමා ඉක්මවූ වාතයෙන් කලබලවූ මී මැස්සෝ එහි හැසිරෙත්. පහත්වූ එල්ලෙන්නාවූ බොහෝ දෙළුම්ද වෙත්.

406 "බමුණ, එරම්බරක වැල් එතී ඇති ගස් තිබෙත්. එහි මල් සත් දවසක් දරා සිටියත් සුවඳ අඩු නොවේ.

407 "මුචලින්ද විල අවට යහපත් මල් තිබේ. නිලුපුල් මල්වලින් වැසුනු වනාන්තය බබළයි.

408 "අඩමසක් දරන්නාවූ ඔවුන්ගේ සුවඳ අඩුනොවේ නිල්මල් ඇත්තාවූ සෙතවාරි වැල්ද ගිනිහිරියාද පිපුණාහ. තුලසි ගස්වලින්ද කටරුක්වලින්ද වනය ගැවසී ගත්තේය.

409 "මල්අතුවල සුවඳින් ඒ වනය මැඩෙයි. මී මැස්සෝ මල් සුවඳින් හාත්පස ශබ්ද කරණ ලද්දාහ.

410 "බමුණ, ඒ විල සමීපයෙහි වැල්වල ගෙඩි කළ ප්‍රමාණද බෙර ප්‍රමාණද වෙත්.

411 "නැවත මෙහි අබ බොහෝය. ලුහුණු ජාති බොහෝය. අසිගස් තල්ගස් මෙන් තිබෙත්. බොහෝ නිලුපුල් අතින් කැඩිය යුතුකොට තිබෙත්.

412 "අප්ඵොට වැල්ද සූරිය වැල්ද මී සුවඳ ඇති කළු වැල්ද, අසොකද, කුඩා මල් ඇති මුදයන්තී සහ වල්ලිභවැල්ද

413 "පිපුණාවූ කොරණ්ඩකද අනොජාද නා වැල්ද එරබදු වැල්ද ගස් නැග සිටිත්.

414 "මී සුවඳ ඇති කණේරු බෝලිද්ද සුවඳ පතුරුවත් නිලිය සුමන භණ්ඩි පදුමුත්තර යන වැල් ඉතා ලක්ෂණය.

415 "පිපුණාවූ පලොල් සමුද්දකප්පාසී ඇත්තාහ. යහපත්වූ ගිනිසිළු වැනි රන් දැල් මෙන් කිණිහිරි බබළත්.

416 "ජලයෙහි හා ගොඩබිම පිපෙන යම් මල් කෙනෙක් ඇද්ද සියල්ල එහි පෙනෙත්. විල මෙසේ යහපත්ය.

417 "නැවතද ඒ පොකුණෙහි ජලය ඇසුරුකොට සිටින බොහෝ රොහිත නලපී සිංගු යන මත්ස්‍යයෝද කිඹුල්ලුද මෝරුද හුංගෝද ඇත්තාහ.

418 "මීද වැල්මීද තලීස්පතුරුද පුවඟුද උන්නකද භද්දමුත්ත සතපුප්පද ලොලුපද

419 සුවඳ වහනය වන ගස්ද දිග නැටි ඇති බොහෝ තුවරලාද පද්මකද නරදද කුළුදක්ඩාමකද හරේණුකද

420 "කහද මනොගිලාද ඉරිවෙරියද ගුගුල්ද විහෙදකද චොරක කුට්ඨද, කප්පුර කලිංගු ආදී සුවඳ ජාති ඇත්තාහ.

421 "නැවත මෙහි සිංහ, ව්‍යාඝ්‍ර, අශ්ව මුඛ ඇති යක්ෂිණීන්ද ඇත්තුද ඒනි පසද, මුවෝද රොහිච්ච සරභ යන මෘගයෝද,

422 "සිවල්ලු හා සුනඛයෝද, සුලොපී මුවෝද, බළල්ලුද, තල මල් පාට ඇති ගස් සුනඛයෝද, චමර, චලනී ලංඝී මෘගයෝද, ක්ඩාපිතයෝද වඳුරෝද පසු පසින් ගොදුරු ගන්නා සත්ව වර්ගයක්ද,

423 "කක්කට කතමාය නම් මුවෝද, වලස්සුද, වන ගෝනුන්ද කඟවේනුන්ද, ඌරෝද මුගටිද බොහෝ කළු මුවෝද

424 "මීහරක්ද ශුනකයෝද සිවල්ලුද හාත්පස උණ හපුළුවෝද තලගොයිද ඇත්කුඹු මුවෝද චිත්‍ර මුවෝද දිවි මුවෝද,

425 "සාවෝද, මස්කන පක්ෂීහුද, සිංහයෝද, මස්කන මුවෝද, සරභ මෘගයෝද, සුදු හංසයෝද, මොණරුද, කකුත්ථ පක්ෂීහුද,

426 "චංකොර පක්ෂිහුද කුකුළෝද නාගයෝද කොක්කුද, කනකොක්කුද, නජ්ජුහ පක්ෂීහුද, දින්දිසා කොඤ්චවාදික යන පක්ෂීහු ඔවුනොවුන් නාදකළාහුය.

427 උකුස්සෝය රතුපාට ඇති පක්ෂිහුද හුනකිලිල්ද, ජීවංජීවක යන පක්ෂීහුද, වටුවෝද, කුලාවපටිකුත්තක පක්ෂීහුද,

428 "මද්දාලක චෙතකෙදු භණ්ඩු තිත්තිර චෙලාබක පිංගුල ගොධක අංගහෙතුක, යන පක්ෂීහුද,

429 "කරවිය, කෑදති, බකමූණෝද, ඇටිකුකුළෝද යන නොයෙක් පක්ෂි සමූහයාගෙන් යුක්තය. ඔවුන්ගේ නොයෙක් ශබ්දයෙන් යුක්තය.

430 "නැවත මෙහි විසිතුරු ඉරි ඇති, යහපත් ශබ්ද ඇති පක්ෂිහු ඇත්ද, ඔවුනොවුන් ශබ්ද පවත්වමින් කිරිල්ලියන් සමග සතුටු වෙත්.

431 "නැවත මෙහි නිතර යහපත් ශබ්ද ඇති දෙපැත්තෙහි සුදු ඇස් ගුලිවලින් යුත් බිජුවටින් උපන්නාවූ යහපත් පෙනීම් ඇති පක්ෂිහු ඇත්තාහ

432 "නැවත මෙහි නිතර යහපත් ශබ්ද ඇති ඔවුනොවුන් නාද කරන්නාවූ නිල් බෙල්ලද ඇති මොණරු සිටිත්.

433 "කුකුත්ථක පක්ෂිහුද කුකුළෝද කොට්ටෝරුවෝද හංසයෝද කාලාමෙයද බලියක්ෂයෝද කලම්බයෝද ගිරව්ද සැළලිහිණිද ඇත්කඳලිහිණිද,

434 මෙහි "කහ-රතු-සුදු බොහෝ ඇත්කඳ ලිහිණිද ඇත. හිංගුරාජ, කදම්බ, ගිරා සැළලිහිණිද මෙහි ඇත.

435 "කළු සුදු කබරුස්සෝද, හංසයෝද ආටයෝද, පරිවදන්තිකයෝද පාක හංසයෝද, අතිබල නජ්ජුහ ජීව ජීවක පක්ෂිහුද,

436 "පරෙවියෝද රවිහංස චක්‍රවාක නදීමර යන කුරුළු සමූහයා ගැවසී ගත්, නොයෙක් ශබ්දවලින් නාදවූ

437 (i) "නැවත මෙහි නොයෙක් පාට ඇති බොහෝ පක්ෂිහු ඇත්තාහ. (ii) කිරිල්ලියන් සමග ඔවුනොවුන් නාද කරමින් සතුටුවෙත්.

438 ((i) ඡේදය යෙදිය යුතුයි) සියල්ලෝ මුචලින්ද විල අවට මිහිරි නාද කරත්.

439 (i) නැවතද මෙහි කෙවිල්ලන් නම් පක්ෂි වර්ගයක් ඇත්තාහ. (ii) (437 (ii) යෙදිය යුතුයි)

440 (මෙහි 439 (i) ද 438 (ii) යෙදිය යුතුයි)

441 "ඒනි මෘග පසද මෘගයන්ගෙන් ගැවසී ගත් ඇතුන් ගැවසීගත් වනය, නොයෙක් වැල්වලින්ද කදලි මෘගයන්ගෙන්ද ගැවසී ගත්තේය.

442 "නැවත මෙහි බොහෝ අඹ ඇත්තාහ. බොහෝ නීවාරවරක ධාන්‍ය ඇත්තාහ. දර ගිනිවලින් නොපැසූ හැල් ඇත්තාහ. එහි උක් බොහෝය.

**443** "මේ අඩිපාර පෙනෙයි. හරි කෙළින් ආශ්‍රමයට යයි. එහි පැමිණියේ බඩගින්න පිපාසය නොඇල්ම නොලබයි. එහි වෙස්සන්තර රජතෙම දරුවන් සමග ජීවත් වෙයි.

**444** "බ්‍රාහ්මණ වෙශය දරමින් කෙක්කද හැන්දද ජටාවද ඇතිව සම් ඇඳ බිම සයනය කරයි. ගිනිදෙවියා පුදයි"

**445** මෙය අසා බමුණුතෙම ඍෂිවරයා ප්‍රදක්ෂිණකොට වෙස්සන්තර රජු යම් තැනකද සතුටින් එහි ගියේය.

**446** "ජාලිය කුමරුවෙනි, නැගිටුව, පෙරමෙන් අදත් දන් දීමට තිබේ. බමුණෙකු මෙන් පෙනේ. මට ප්‍රීතිය ඉතිරේ"

**447** "යම් ඒ බ්‍රාහ්මණයෙක් මෙන් පෙනෙන්නා, පියාණෙනි මමත් දකිමි. යමක් කැමැත්තෙකු මෙන් එයි. අපගේ ආගන්තුකයෙක් වන්නේය.

**448-455** (මෙහි 355-362 ඡේද යෙදිය යුතුයි.)

**456** "නැවත ඔබ කිනම් කරුණකට කුමක් හේතුකොට ගෙන මහ වනයට පැමිණියෙහිද, විචාළ මට එය කියව."

**457** "පිරුණු මහ ගඟක් හැමකල්හි අඩු නොවේද එසේ ඔබගෙන් ඉල්වීමට පැමිණියෙමි. ඉල්වූ මට දරුවන් දෙනු මැනව."

**458** "දෙමි, වෙනස් නොකරමි. බමුණ මගේ දරුවන්ට ස්වාමියාවූයේ ගෙනයව. උදේ ගිය රජ බිසව සවස ඵලවැලින් යුක්තව එයි.

**459** "බමුණ එක් රැයක් නැවතී උදෑසනම යව. ඈ දරුවන් නැවූ කල්හි මල් පැළඳවූ කල්හි, හිස සිඹි කල්හි,

**460** "බමුණ එක් රැයක් වැස උදෑසනම යව. බමුණ නොයෙක් වස්ත්‍ර ඇන්දවූ නොයෙක් සුවඳ ගල්වන ලද නොයෙක් මුල් ඵලද ගත් දරුවන් රැගෙන යන්න."

**461** "මහරජ, සිටීමට කැමති නොවෙමි. මම යාම කැමතිවෙමි. මට අන්තරායක් වන්ට බැරි නැත. මහොත්තමය, යන්නෙම් මය.

462 "මහරජ, මේ ස්ත්‍රීහු ඉල්ලීමට නුසුදුසුය. දීමටද ලැබීමටද අනතුරු කරත්. ස්ත්‍රීහු මන්ත්‍ර දනිත්. සියල්ල නුහුරට ගනිත්.

463 "මහරජ, ශ්‍රද්ධාවෙන් දන් දෙන්නාට මේ මවු නොපෙනේවා, ඕතොමෝ දීමට අන්තරාවක්ද කරන්නීය. යන්නෙම්මය.

464 "ඔබගේ දරුවන්ට කථා කරව. ඔවුන්ට මවු නොපෙන්වාවා. ශ්‍රද්ධාවෙන් දන් දෙන්නාට මෙසේ පින් වැඩෙයි.

465 "ඔබගේ දරුවන්ට කථා කරණු මැනව. ඔවුන්ට මවු නොපෙන්වව. මා වැන්නෙකුට දන් දී රජුනි දෙව්ලොව යන්න.

466 "ඉදින් ඔබ පතිව්‍රතාවූ මාගේ භාර්‍ය්‍යාව දක්නට නොකැමැත්තෙහි නම් දරුවන්ගේ මුත්තනුවන්ටද ජාලිය කෘෂ්ණජිනා දෙදෙන පෙන්වව.

467 "යහපත්වූ ප්‍රිය වචන කථා කරණ මේ කුමරුවන් දැක සතුටුවූ යහපත් සිත් ඇත්තේ ඔබට බොහෝ ධනය දෙන්නේය."

468 "රාජපුත්‍රය, මා කියන්නක් අසනු මැනව. දරුවන් පැහැර ගනිතැයි බිය ඇත්තෙමි. රජතෙම දඬුවමට මා අමාත්‍යයන්ට හෝ දෙන්නේය. විකුණන්නේය නසන්නේය. ධනයෙන් ද දාසයන්ගෙන් ද දිනූ මම නැවත බැමිණියගෙන්ද අපවාද ලබන්නේය."

469 "යහපත්වූ ප්‍රිය කථා කරන්නාවූ මේ කුමරුවන් දැක සිවීන්ගේ රට වඩන ධර්මයෙහි පිහිටි මහරජතෙම සතුටට සොම්නසට පැමිණ තොපට බොහෝ ධනය දෙන්නේය."

470 "ඔබ මට යමක් කියයිද මම එය නොකරමි. මම බැමිණියට සේවකයන්වූ දරුවන් පමණක් ගෙන යමි."

471 ඉක්බිති රෞද්‍ර තැනැත්තාගේ කියමන අසා බියපත්වූ ජාලිය කෘෂ්ණජිනා යන දරුවෝ ඒ ඒ තැනින් පලා ගියාහුය.

472 "දරුවෙනි, ප්‍රිය පුත්‍රයෙනි, එව්. මාගේ පාරමිතාව පුරව්. මගේ ළය සනසව්. මගේ වචනය කරව්.

473 "නොසෙල්වෙන භව සයුරෙහි මාගේ යාත්‍රා නැව වව්. උත්පත්තියෙහි කෙළවරට එතර වන්නෙමි. දෙවියන් සහිත ලොකයා එතර කරන්නෙමි.

474 "මැණියෙනි, කෘෂ්ණජිනාවෙනි එන්න. මගේ පාරමිතාව සම්පූර්ණ කරව්. මගේ ළය සනසන්න, මගේ වචනය කරන්න.

475 (මේ ඡෙදය 471 ඡෙදය මෙනි.)

476 සිවීන්ගේ රට වඩන රජතෙමේ ජාලිය කාෂ්ණජිනාද යන කුමරුවන් ගෙන බමුණාට දන් දුන්නේය.

477 ඉක්බිති සිවීන්ගේ රටේ නායකතෙමේ ජාලිය කෘෂ්ණජිනා යන දරුවන් දෙදෙන ගෙන සතුටුසිත් ඇත්තේ බ්‍රාහ්මණයාට උතුම් දානය දුන්නේය.

478 (i) එකල්හි යම් මේ භයානක දෙය වීය. එකල්හි මේ ලොමු දැහැගැනීමක් ඇතිවිය. (ii) කවර හෙයින්ද, දරුවන් දුන් කල්හි පොළොව කම්පාවිය.

479 (මෙහි 478 (i) යෙදිය යුතුයි.) විය. ඇඳිලි බැඳගත් සිවීන්ගේ රටට නායක රජතෙම සුවසේ වැඩූ දරුවන් බමුණාට දුන්නේය.

480 දරුණුවූ ඒ බ්‍රාහ්මණතෙමේ වැලක් දත්වලින් සිඳ වැලකින් අත්බැඳ වැලකින් අල්ලා ගත්තේය.

481 ඉක්බිති ඒ බමුණුතෙමේ වැලද අල්ලාගෙන සැරයටියද රැගෙන සිවිරජ බලා සිටියදී තළමින් ඒ දරුවන් රැගෙන යයි.

482 ඉක්බිති දරුවෝ බමුණාගෙන් මිදී ගියාහුය. කඳුළු පිරුණු ඇසින් කුමාරතෙම පියා බලයි.

483 වෙවුලන ඇසතු කොළ මෙන් පියාගේ පා වඳියි. පියාගේ පා වැඳ මේ වචනය කීයේය.

484 (i) "පියාණෙනි, මවුද මෙහි නැත. පියාණෙනි, ඔබ අප දන්නෙහිය. (ii) යම්තාක් අම්මා දකිමුද, එකල පියාණෙනි, අප දෙව්.

485 (484 (i) යෙදිය යුතුයි.) යම්තාක් අපගේ මවු එයිද පියාණන් ඒතාක් අප නොදෙව. ඊට පසු මේ බමුණා කැමති සේ විකුණාවා, මරාවා.

486 බකල පා ඇති, අඩ නිය ඇති, තවද යට ගිලිණු තට්ටම් ඇති දික් උඩුතොල ඇති, කෙළ වැගිරෙන, බිඳුණු නාසය ඇති, දත් බොල්ලැවූ,

487 කළගෙඩියක් වැනි බඩක් ඇති බිඳුණු පිටක් ඇති, විෂම ඇස් ඇත්තාවූ තඹවන් රැවුලක් ඇති, කළුවන් කෙස් ඇති රැලි වැටුණු සමක් ඇති, තල කැලලින් යුක්තවූ බළල් ඇස් ඇති, තුන් තැනකින් වක්වූ විකෘතවූ පා ඇති ඉතා උස්වූ කෲරවූ අඳුන් දිවිසමින් සැරසුණු භය උපදවන යක්ෂයෙක් වැනිවූ,

488 මස් හා ලේ අනුභව කරණ මනුෂ්‍යයෙක්වූ නොහොත් යක්ෂයෙක්වූ ගමින් වනයට පැමිණ පියාණෙනි, ඔබගෙන් ධනය ඉල්ලයි. පිසාචයකු විසින් ගෙනයනු ලබන කල්හි පියාණෙනි කුමක් බලා සිටින්නෙහිද,

489 "මේ නිසා ඔබගේ සිත යකඩින් කළ තද බැම්මකි, ධනය කැමති බමුණා විසින් අප බදින කල්හි යම් ඔබ නොදන්නාක් මෙන් සිටියි. අතිශයින් නපුරු මනුෂ්‍යයා විසින් අපට ගවයන්ට මෙන් තලයි.

490 "මෙහිම සිටින්නාවූ කෘෂ්ණජිනා තොමෝ කිසිවක් නොදනී. කිරෙන් යැපෙන මුව පැටවෙකු මෙන් පිරිසෙන් ඈත්වූයේ අඬයි.

491 (i) "පුරුෂයෙකු විසින් යම් මෙබඳු දුකක් නොලැබිය හැකිද මේ මට ලැබුනු එබඳුවූ දුකකි. (ii) යම්හෙයකින් මෑණියන් නොදකිම්ද එය මට මීටත් වඩා දුකකි.

492 (491 (i) යෙදිය යුතුයි.) යම්හෙයකින් පියාණන් නොදකිම්ද එය මට මීටත් වඩා දුකකි.

493 "ඒකාන්තයෙන් දුඃඛිතවූ මවුතොමෝ යහපත් දැකීම් ඇති කෘෂ්ණජිනා කුමාරිය නොදක්නී බොහෝ කලක් අඬන්නීය.

494 "ඒකාන්තයෙන් දුඃඛිතවූ පියතෙමේ යහපත් දැකීම් ඇති කෘෂ්ණජිනා කුමාරිය නොදක්නේ බොහෝ කලක් අඬන්නේය.

495 "ඒකාන්තයෙන් දුඃඛිතවූ මවුතොමෝ යහපත් දැකුම් ඇති කෘෂ්ණජිනා කුමරිය ආශ්‍රමයෙහි නොදක්නී බොහෝකලක් අඬන්නීය.

496 ඒකාන්තයෙන් දුඃඛිතවූ පියතෙමේ යහපත් දැකුම් ඇති කෘෂ්ණජිනා කුමරිය ආශ්‍රමයෙහි නොදක්නී බොහෝ කලක් අඬන්නේය.

497 ඒකාන්තයෙන් දුඃඛිතවූ මවුතොමෝ රෑ මැද්දක් වනතුරු හෝ මුළු රාත්‍රියෙහි හෝ බොහෝකලක් අඬන්නේය. ගඟක් මෙන් වියලෙන්නේය.

498 ඒකාන්තයෙන් දුඃඛිතවූ පියතෙමේ රෑ මැද්දක් හෝ මුළු රාත්‍රියෙහි හෝ බොහෝ කලක් අඬන්නේය. ගඟක් මෙන් වියලෙන්නේය.

499 "එල්ලෙන අතු ඇති මේ දඹ ගස්ද නික ගස්ද යන නොයෙක් වෘක්ෂ සමූහයෝ වෙත්ද, ඔවුන් අද අත් හරිමු.

500 "ඇසතුද කොස්ද, මේ නුගද දිවුල්ද යන නොයෙක් ගෙඩි වර්ග කෙනෙක් ඇද්ද ඔවුන් අද අත් හැර යමු.

501 "මේ එලාරාම වෙත්ද, මේ සිහිල් ජලය ඇති ගඟක් වේද, යම් තැනෙක්හි පෙර ක්‍රීඩා කෙළෙමුද ඒවා අද අත්හරිමු.

502 "මේ පර්වත මුදුනෙහි නොයෙක් ප්‍රකාර මල්මෙත්ද යම් මල් වර්ගයක් පෙර දැරුවමුද ඒවා අද නොපෙනෙත්.

503 "මේ පර්වත මුදුනෙහි නොයෙක් එල වර්ග වෙත්ද, යමක් පෙර අනුභව කෙළෙමුද ඒවා අද අත්හරිමු.

504 "මේ අපගේ ඇත්තුද අස්හුද මේ අපගේ හරක්ද වෙත්ද ඔවුන් සමග පෙර ක්‍රීඩා කරමුද ඔවුන් අද අත්හරිමු

505 ගෙනයනු ලබන්නාවූ ඒ කුමාරයෝ පියාට මෙසේ කීවාහුය "ඔහුට නිරෝගිබව කියන්නෙහිය, පියාණෙනි ඔබද සුවපත්වෙව.

506 "මේ අපගේ ඇත්තුය. අශ්වයෝය. මේ අපගේ හරක්ය මොවුන් අම්මාට දෙන්නෙහිය. ඔවුන්ගෙන් ශොකය දුරුකරගන්නේය.

507 "මේ අපගේ ඇත්තුය, අශ්වයෝය. මේ අපගේ හරක්ය. මොවුන් මැණියෝ බලත්. ඔවුන් මෙන් ශොකය හැරගන්නේය.

508 ඉක්බිති ක්ෂත්‍රිය වෙස්සන්තර රජතෙමේ දන්දී පන්සලට ඇතුළුවී කරුණාවෙන් විලාප කීයේය.

509 "කිමෙක්ද, අද බඩගිනි ඇති පිපාසිතවූ දරුවෝ හඬත්ද, සවස් වරුවෙහි කෑම කන වේලාවෙහි කවරෙක් ඔවුන්ට කෑම දෙයිද,

510 "සවස් වරුවෙහි කෑම කන වේලාවෙහි 'මැණියෙනි, බඩගිනි ඇත්තෙමු. අපට දෙවයි' කියත්. බඩගිනි ඇති පිපාසිතවූ

511 දරුවෝ කිමෙක්ද අද අඬත්ද,

512 "කිමෙක්ද, ඔවුහු වහන් සඟල් නැතිව පයින් මාර්ගයෙහි යෙත්ද, ඉදිමී ගිය පා ඇතිව වෙහෙසට පත්වූ ඔවුන් කවරෙක් අතින් අල්ලයිද,

513 "ඒකාන්තයෙන් බ්‍රාහ්මණතෙමේ ලජ්ජා නැත්තෙක. හෙතෙම අහිංසක දරුවන්ට මාගේ සමීපයෙහි ගසන්නේ කෙසේ නම් ලජ්ජා නොවන්නේද?

514 "යම්කිසි කෙනෙක් මාගේ දාසියක් වන්නේද, දාසයෙක් වන්නේද, අනික් පනිවුඩ කරුවෙක්වේද, මේ වෙස්සන්තරගේ දාසයන්ගේ දාසයෙක්වේද, ඔවුන්ට ලජ්ජා ඇති කවරෙක් ගසත්ද,

515 "කෙමන් කටෙහි අසුවූ මසකුසේ මා බලාසිටිද්දීම (දරුවන්ට දඬුවම් කෙළේ නම්) ප්‍රිය දරුවන්ට මා නැති තැන ආක්‍රොසද කරයි, ගසයි.

516 "දුන්න ගෙන වමෙහි කඩුව බැඳ මගේ දරුවන් ගෙනෙන්නෙමි. දරුවන්ට වධකිරීම දුකකි.

517 "කුමාරයෝ හිංසාවට පැමිණෙතියි යන මේ දුක්වීමට නොතැනය. සත්පුරුෂ ධර්මය දත් කවරෙක් යමක්දී පසුතැවිලිවේද,

518 "යම් හෙයකින් මේ ලෝකයෙහි සමහර මනුෂ්‍යයෝ යම්සේ යමෙකු ලඟ ස්වකීය මවු නැද්ද, ඔහුත් එසේම නැතැයි කීවාහුය. එය සත්‍යයි.

519 "කෘෂ්ණාවෙනි, එව මැරෙමු, අපට ජීවිතයෙන් වැඩක් නැත. යමෙක් අපට ගවයන්ට මෙන් තලයිද, වහා කිපෙන ක්‍රෑරයෙකුවූ ධනය බලාපොරොත්තු බමුණෙකුට රජු විසින් අප දෙනලදී.

520-525 (මේ ඡෙද 498-502 ඡෙද මෙන් වෙත්.) "අද" වෙනුවට "කෘෂ්ණාවෙනි" යෙදිය යුතුයි.)

526 ගෙන යන්නාවූ බ්‍රාහ්මණයාගෙන් මිදී ළදරු වූ ජාලිය කෘෂ්ණාජිනා යන දෙදෙනා ඒ ඒ තැන දිව්වාහුය.

527 ඉක්බිති ඒ බ්‍රාහ්මණතෙම රැහැන අල්ලාගෙන දණ්ඩක් රැගෙන සිව්රජු බලමින් සිටියදී තළමින් ඒ දරුවන් ගෙනයයි.

528 "පියාණෙනි, මේ බමුණුතෙම මට ගෙයි උපන් දාසියකට මෙන් සැරයටියෙන් තලායයි" කෘෂ්ණජිනා තොමෝ පියාට එය කීවාය.

529 "පියාණෙනි, මේ බමුණෙක් නොවේ බ්‍රාහ්මණයෝ ධාර්මිකයෝ වෙත්. පියාණෙනි, බ්‍රාහ්මණ වේශයෙන් යක්ෂයෙක් අප කෑමට ගෙනයයි. පිශාචකයෙකු විසින් ගෙන යන කල්හි පියාණෙනි, කුමක් හෙයින් බලා සිටින්නෙහිද?

530 "අපගේ මේ දෙපා රිදෙත්. මාර්ගය දික්ය. යා නොහැක. සූර්‍ය්‍යයා පහතට බැස සිටී. බමුණාද අප ගෙනයයි.

531 "භූතයන්ටද, පර්වතයන්ටද, වනයන්ටද, (අපගේ) පහත් තත්වය දන්වමු. යහපත් තොටුපල් ඇති ගඟේ දෙවියන්ටද විලෙහි දෙවියන්ටද වඳිමු.

532 "තණකොළද, වැල්ද, ඖෂධද, පර්වතද, වනද අප කියන්න අසාවා. මේ බ්‍රාහ්මණතෙම අපව ගෙනයයි. මෑණියන්ට තොරතුරු කියව්.

533 "අපගේ මව්තොමෝ මද්‍රී දෙවියයි. පින්වත්නි, මෑණියන්ට කියත්වා ඉදින් අපගේ අඩිපාරේ එන්ට කැමැත්තේ නම් වහා අප පස්සේ එන්නීය.

534 "මේ අඩිපාර කෙළින්ම ආශ්‍රමයට යයි. මේ මාර්ගය පසුපස්සෙහි එන්නෙහිය අප වහා දකින්නෙහිය.

535 "ඒකාන්තයෙන් බඳනාලද කෙශකලාපය ඇත්තීය. වන මුල් එල ගෙන එන්නීය. මේ ශූන්‍ය ආශ්‍රමය දැක තොපට දුක්වන්නේය.

536 බොහෝ වේලාවක් ඒකාන්තයෙන් මෑණියන් විසින් බොහෝ පලවැල එකතුකරණලදී.

537 "ධාන්‍ය බලාපොරොත්තු බ්‍රාහ්මණයා විසින් අප බඳනාලද බව යම් ඕතොමෝ නොදනී. ඉක්මන් ක්‍රියා ඇති පුරුෂයා විසින් අපට ගවයන්ට මෙන් තලයි

538 "මම සවස එලවැල සෙවිමෙන් ආ මෑණියන් අද දක්නෙම්ද, මෑණියෝ බ්‍රාහ්මණයාට මීපැණි සමග පලතුරු දෙන්නේය.

539 "එකල්හි මේතෙමේ කා සැනහුණේ තදින් අප ඉක්මන් නොකරන්නේය. ඒකාන්තයෙන් ඉදිමුනාවූ පා ඇති අප බමුණුතෙමේ ඉක්මනින් ගෙනයයි" මව කෙරෙහි ගිජුවූ දරුවෝ මෙසේ එහි වැලපුනාහ

540 ඔවුන්ගේ වැලපීම් හඬ අසා සිංහ ව්‍යාඝ්‍ර දිවි යන දරුණු වනමෘගයෝ මේ වචනය කීවාහුය.

541 "අපගේ රජබිසව සවස පලවැල එකතුකොටගෙන නොඒවා.

542 "අපගේ ප්‍රදෙශයෙ කිසි මෘගයෙක් කිසි මෘගයෙකු විසින් ඈ නොපෙළාවා

543 "ලක්ෂණයෙන් යුක්තවූ ඈ සිංහයා හෝ ව්‍යාඝ්‍රයා කොටියා හෝ වෙහෙසට පත්කරන්නේ නම් ජාලිය කුමාරයා නොවන්නේමය. කෘෂ්ණජිනාව කොයින් වන්නේද ලක්ෂණවත් වූ ස්වාමියාද, දූ දරුවන්ද යන දෙකොටසම ජීවත් කරව්.

544 "මාගේ කෙක්ක වැටෙයි. දකුණු ඇස සෙලවෙයි. ගෙඩි ඇති ගස් ගෙඩි නැතිවූහ. මට සියළු දිසා මුළාවෙත්.

545 "සවස් කාලයෙහි ඇගේ ආශ්‍රමයට එන මාර්ගයෙහි සූර්‍ය්‍යයා බැස යන කල්හි මාර්ගයෙහි මෘගයෝ ඉදිරිපත්වූහ.

546 "සූර්‍ය්‍යතෙම පහත්ව එල්ලෙයි. ආශ්‍රමයද ඈතය. ඔවුන්ට යමක් මෙයින් ගෙනයන්නේද ඒ භොජනය ඔවුහු අනුභව කරන්නාහුය.

547 "ඒ ක්ෂත්‍රියතෙම ඒකාන්තයෙන් මා නොඑන බව දැක බඩසාය ඇති දරුවන් සතුටු කරවමින් තනිව පන්සලෙහි සිටියි.

548 "ඒකාන්තයෙන් දුක්වූ අසරණවූ මගේ දරුවෝ සවස කවන පොවන වේලාවෙහි කිරි බීවාක් මෙන් සිටිත්.

549 "ඒකාන්තයෙන් දුක්වූ අසරණවූ මගේ දරුවෝ සවස කවන පොවන වේලාවෙහි වතුර බීවාක් මෙන් සිටිත්.

550 "ඒකාන්තයෙන් දුක්වූ අසරණවූ මගේ දරුවෝ පොඩි වසුපැටව් මව වෙත මෙන් පෙරගමන් කොට මා වෙත සිටිත්.

551 "ඒකාන්තයෙන් දුක්වූ අසරණවූ මගේ දරුවෝ මඩ මතුයෙහි හංසයන් මෙන් මා පෙරගමන් කොට සිටිත්.

552 "ඒකාන්තයෙන් දුක්වූ අසරණවූ මගේ දරුවෝ ආශ්‍රමයට ආසන්නයෙහි පෙරගමන් කොට මා වෙත සිටිත්.

553 "විල්ද දියවලවල්ද පෙනෙන්නාවූ එකම මාර්ගයයි. ආශ්‍රමයට යාමට අනික් මාර්ගයක් නොදක්නෙමි.

554 "වනයෙහි මහත් බලයෙන් යුත් මෘගරජුන්හට නමස්කාර වේවා. ධර්මයෙන් සහෝදරයන් වේවා. ඉල්වන්නාවූ මට මාර්ගය දෙව.

555 "මම ශ්‍රී ඇත්තාවූ රටින් පිටකළ රජුගේ භාර්‍ය්‍යාව වෙමි. ස්වාමිභක්තියෙන් යුත් සීතාව රාම මෙන් මම ඔහුද අත් නොහරින්නෙමි.

556 "තොපද සවස් වේලාවෙහි කෑම කෑමට පුත්‍රයන් බලව්. මමද ජාලිය කෘෂ්ණජිනා යන පුත්‍රයන් දෙදෙන බලන්නෙමි.

557 "කෑ යුතු මේ මුල් ඵල බොහෝය. එයින් කොටසක් දෙන්නෙමි. ඉල්වන ලද මට මාර්ගය ඉඩ දෙව.

558 "අපගේ මවු තොමෝ රජ බිසවකි. අපගේ පිය තෙමේ රජකෙනෙකි. ධර්මයෙන් සහෝදර වෙව. ඉල්වන ලද මට මාර්ගය ඉඩ දෙව්."

559 කරුණාවෙන් පිරී විලාප කියන්නාවූ ඇගේ මිහිරි බොහෝ වචන අසා වනමෘගයෝ මාර්ගයෙන් ඈත්වූවාහුය.

560 "පස් තැවරුණු පුත්‍රයෝ මේ ප්‍රදේශයෙහි පොඩි වසුපැටවන් මෙන් පෙරගමන් කොට මා වෙත සිටිත්.

561 "පස් තැවරුණ පුත්‍රයෝ මේ ප්‍රදෙශයෙහිදී දිය සිඳුණු මඩ මත්තෙහි හංසයන් මෙන් පෙරගමන් කොට මා වෙත සිටිත්.

562 "පස් තැවරුණ පුත්‍රයෝ මේ ප්‍රදෙශයෙහි ආශ්‍රමයට නුදුරු තැන පෙරගමන් කොට මා වෙත සිටිත්.

563 "වටපිට දුවන කන් ඔසවා ගත් මුවන් මෙන් අසතුටුවූ ප්‍රීතිවූ ඒ දරුවෝ වෙන්වෙමින් කම්පාවෙත්. ජාලිය කෘෂ්ණජිනා යන ඒ දරුවන් දෙදෙනා අද නොදකිමි.

564 "දරු ඇති එළුදෙනක් දරුවා මෙන් කුඩුවෙන් මිදුණු පක්ෂිණිය පැටවා මෙන් ගොදුරෙහි ගිජුවූ සිංහදෙනක් මෙන් දරුවන් අත්හැර නික්මුනෙමි. ජාලිය කෘෂ්ණජිනා යන දරුවන් අද නොදක්නෙමි.

565 "පර්වතයෙහි ඇතුන්ගේ පා සටහන් මෙන් මේ ඔවුන් ක්‍රීඩා කරණ තැනය. ආශ්‍රමයට නුදුරු තැන වැලි ගොඩවල් විසිරී තිබෙත්. ජාලිය කෘෂ්ණජිනා යන ඒ පුත්‍රයන් අද නොදක්නෙමි.

566 "පස් තවරා වැලි විසුරුවා ගත් දරුවෝ හාත්පස දුවත්. ඒ දරුවන් අද නොදකිමු.

567 "වනයෙන් දුර සිට එන මා වෙත පෙර යම් කෙනෙක් පෙර ගමන් කරත්ද, ජාලිය කෘෂ්ණජිනා යන ඒ දරුවන් දෙදෙන අද නොපෙනෙත්.

568 "වැදූ මුවදෙනක කරා පැටවුන් මෙන් අසපුවෙන් පෙර ගමන් කොට දුර සිටම මා බලත්ද ඒ දරුවන් නොදක්නෙමි.

569 "ඔවුන් සෙල්ලම් කරන පඬුපාට මේ බෙලිගෙඩිය වැටී තිබේ. ජාලිය කෘෂ්ණජිනා යන ඒ පුත්‍රයන් දෙදෙන අද නොදකිමි.

570 "මගේ තන පිරී තිබේද පපුව පැලෙයිද ජාලිය කෘෂ්ණජිනා යන පුත්‍රයන් දෙදෙනා අද නොදකිමි.

571 "මගේ උකුළ සොයත්ද, තනි තනිව එල්ලේද ඒ ජාලිය කෘෂ්ණජිනා යන දරුවන් දෙදෙන නොදක්නෙමි.

572 "පස් තැවරුනාවූ යම් පුත්‍ර කෙනෙක් වෙත්ද, සවස් කාලයෙහි මාගේ ඔඩොක්කුවෙහි ඇත මෑත පෙරලෙත්ද ඒ දරුවන් නොදක්නෙමි.

573 "පෙර මේ ආශ්‍රමය මට නෘත්‍ය මණ්ඩපයක්සේ වැටහෙයි. අද දරුවන් නොදකිනා මට ආශ්‍රමය කැරකෙන්නාක් මෙනි.

574 "මට ආශ්‍රමය නිශ්ශබ්ද තැනක් වශයෙන් වැටහෙන්නේ ඇයි? වන කපුටෝද ශබ්ද නොකරත්. ඒකාන්තයෙන් දරුවන් මැරුණා වෙන්නට ඇත.

575 "ආශ්‍රමය නිශ්ශබ්දව වැටහෙන්නේ ඇයි. පක්ෂීහුද නාද නොකරති. ඒකාන්තයෙන් දරුවන් මැරුණා වෙන්නට ඇත.

576 "කුමක් නිසා මේ නිශ්ශබ්ද වූයෙහිද, එසේම මගේ සිත රැයෙහි මෙනි. වන කපුටෝද නොහඬත්. මාගේ දරුවෝ ඒකාන්තයෙන් මළහයි සිතමි.

577 "කුමක් නිසා මේ නිශ්ශබ්ද වූයෙහිද? මගේ සිත රැයෙහි මෙනි. පක්ෂීහුද ශබ්ද නොකරත්. මාගේ දරුවෝ ඒකාන්තයෙන් මළහයි සිතමි.

578 "ආයර්‍ය්‍ය පුත්‍රය, කිමෙක්ද දරුවන් මෘගයෝ කෑවෝද? විවේකීවූ අහර අඩු මහ කැලෑවෙහි මාගේ දරුවෝ කවරකු විසින් ගෙනයන ලද්දෝද?"

579 "නොහොත් ඔබ විසින් දූත කාර්‍යයකට යවන ලද්දේද? නොහොත් ප්‍රිය කථා ඇති දරුවෝ නිදිද, නොහොත් පිටත ගියෝද ක්‍රීඩාවෙන් පසු වෙත්ද?

580 "ඔවුන්ගේ කළුපාට කෙස් නොදකිමි. රන්දැල් වැනි අත් පා නොපෙනෙත්. අහසින් පක්ෂීන්ගේ බැස අල්ලා ගැනීමක් වීද. මාගේ දරුවන් කවරෙක් ගෙන ගියෝද?

581 "ජාලිය, කෘෂ්ණජිනා යන දෙදෙන අද නොදැක්කෙම්ද හුලකින් විදින ලද වණයක් මෙනි, මෙය ඊටත් වඩා දුකකි.

582 "අද ඒ මාගේ පපුවට මේ දෙවෙනි හුල කම්පාකරයි. අද ඒ දරුවන් නොදක්නෙමි. ඔබද මා සමග කථා නොකරන්නෙහිය.

583 "රාජපුත්‍රය, අද මේ රාත්‍රියම මට සැක කරන්න උදෑසන ජීවිතයෙන් පහවූ මළ මා දක්නෙහියයි හඟිමි."

584 "ශ්‍රෙෂ්ඨ ශරීර සම්පත්තියක් ඇති යශස් ඇත්තාවූ රාජ දෙවිය පලවැල කැඩීමට රැයින් ගියෙහිය. කුමක් හෙයින් සවස් වී ආයෙහිද?

585 "යම් සත්වකෙනෙක් මේ විලට පැන් බීමට පැමිණියාහුද? ඝොෂා කරන සිංහයාගේද ව්‍යාඝ්‍රයන්ගේද ශබ්දය තොප නොඇසුයෙහිද?"

586 "දෙවයන් වහන්ස, මට පෙරනිමිති පහළ විය. මහා වනයෙහි හැසිරෙන්නාවූ මගේ කෙක්ක මගේ අතින් වැටුණේය. අංශයෙන් කරෙහි පැස එල්ලන කොක්කද වැටුනේය.

587 "එකල්හි මම පෙළුනෙම් බියවූයෙමි. මෙයින් යහපතක් වන්නේද බොහෝ වෙලා දොහොත් වැඳීම දැඩි කොට සියලු දිශාවන් වැන්දෙමි.

588 "රාජ පුත්‍රතෙම සිංහයෙකුගෙන් හෝ කොටියකුගෙන් හෝ නැසුණේ නොවේවා. දරුවෝ වග ගවර වලසුන් අල්ලා ගත්තේ නොවේවා.

589 "සිංහයෙක්ද ව්‍යාඝ්‍රයෙක්ද කොටියෙක්ද යන චණ්ඩවන මෘගයන් තුන්දෙනෙක් මට මාර්ගය වැලැක්කුවාහුය. එනිසා සවස් කාලයේ ආවෙමි.

**590** "'මම ස්වාමියාද දරුවන්ද තරුණයෙක් ගුරුවරයාට මෙන් බ්‍රහ්මචාරීව බැන්ද කෙශකලාප ඇතිව රෑ දාවල් දෙක්හි උපස්ථාන කරණ ලදී.

**591** "දරුවෙනි, තොපට ආදරයෙන්ම අඳුන් දිවිසම් හැඳගෙණ වනමුල් ඵලගෙන එමින් රෑ දාවල් දෙක්හි හැසිරෙමි.

**592** "දරුවෙනි, මේ රන්වන් කහ ගෙනෙන ලදී. පඬු පාට බෙලිගෙඩියක් ගෙනායෙමි. දරුවනි, මේවා තොපගේ කෙළි බඩුය.

**593** "මේ නෙළුම් අලද මානෙල් අලද රන්වන් දියද මහරජ මීපැණි හා මිශ්‍රකොට දරුවන් සමග අනුභව කරවයි" කියා අඬයි.

**594** "සිවිරාජපුත්‍රය, ජාලියට මානෙල් මල දෙන්න. කුමාරියට නෙළුම් මල් දෙන්න. නටන්නාවූ මල් පැළඳවූවන් බලනු මැනව. වහා දරුවන් ගෙන්වනු මැනව.

**595** "මහරජ, ඉක්බිති ආශ්‍රමය සමීපයෙහි කෘෂ්ණජිනාවගේ මිහිරි ලස්සණ වචනයන්ම ඇහුම්කන් දෙනු මැනව.

**596** "ස්වාමීනි, සිවි රජානෙනි, රටින් පිටුවහල් කළ නමුත් අපදෙදෙන ජාලිය කෘෂ්ණාජිනා යන දරුවන් දෙදෙන දක්නහුද සමාන සැපදුක් ඇත්තෝ වෙමු.

**597** "මම ඒකාන්තයෙන් බ්‍රහ්මචර්‍ය්‍යාව පිහිට කොට බොහෝ ඇසූ පිරූ තැන් ඇති ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට සාප කෙළෙමි. අද ජාලිය කෘෂ්ණජිනා යන දරුවන් නොදක්නෙමි.

**598-599** (මේ ඡේද 499-500 ඡේද මෙනි) "ඔහුන් අද අත්හරිමි" වෙනුවට 'අද ඒ දරුවෝ නොපෙනෙත්' යනු යෙදිය යුතුයි.)

**600** "මේ ගෙඩි ඇති උයන් වෙත්ද, මේ සිහිල් ජලය ඇති ගඟක් වෙත්ද, යම් තැනක පෙර ක්‍රීඩා කළාහුද ඒ දරුවෝ නොපෙනෙත්.

**601** "මේ පර්වත මුදුනෙහි නොයෙක් ප්‍රකාර මල්වෙත්ද යම්මල් වර්ගයක් පෙර දැරුවාහුද, ඒ දරුවෝ නොපෙනෙත්.

**602** "මේ පර්වත මුදුනෙහි නොයෙක් ඵල වර්ග වෙත්ද යමක් පෙර අනුභව කළාහුද ඒ දරුවෝ නොපෙණෙත්.

**603** "මේ තොපගේ ක්‍රීඩා ඇත්තුය. අශ්වයෝය මේ තොපගේ හරක්ය යමක් සමග පුත්‍රයෝ ක්‍රීඩා කළාහුද ඔව්හු ඒ දරුවෝ නොපෙනෙත්.

**604** "මේ රන්වන් මෘගයෝය හාවෝය බකමූණෝය මේ බොහෝවූ කේල්මුවෝය යන මොවුන් සමග දරුවෝ ක්‍රීඩා කළාහුද

**605** "මේ විසිතුරු දැකුම් ඇති හංසයෝද කොස්වාලිහිණියෝද මොණරුද යමක්හු සමග පෙර ක්‍රීඩා කළාහුද ඒ දරුවෝ නොපෙණෙත්.

**606** "හැමකල්හි පිපී සිටියාවූ යම් තැනෙක්හි පෙර දරුවෝ ක්‍රීඩා කළාහුද, මේ ඒ වන ලැහැබය. ඒ දරුවෝ නොපෙණෙත්.

**607** "සක්වා ලිහිණින් විසින් නාද කරණලද යම් තැනෙක්හි දරුවෝ පෙර ක්‍රීඩා කළාහුද ඒ මේ මානෙල් නෙළුම් මල් ඇති ජලය අඩු පොකුණු යහපත්ය. ඒ දරුවෝ නොපෙණෙත්.

**608** "ඔබ විසින් දර නොකඩන ලදී. ඔබ ජලය නොගෙනෙනලදී. ඔබ විසින් ගිනිද නොදල්වන ලදී. කුමක් හෙයින් දුර්වලව සිතන්නෙහිද,

**609** "මට ප්‍රියවූයේ ප්‍රියයා සමග එක්ව සමව සැනසෙයි. අද මට ඔබ දැකත් ඒ ජාලිය කෘෂ්ණජිනා යන දරුවන් දෙදෙනා අද නොදකිම්ද,

**610** "(i) දේවයන් වහන්ස, අපගේ දරුවන් නොදකිමි. යමෙකු විසින් ඔවුන් ගෙනයන ලද්දාහුද, මරනු ලද්දාහුද, (ii) වන කවුඩෝද නොහඬත්. ඒකාන්තයෙන් මාගේ දරුවෝ මළහයි සිතමි.

**611** (610 (i) යෙදිය යුතුයි.) වන පක්ෂීහුද නොහඬත්. ඒකාන්තයෙන් මාගේ දරුවෝ මළහයි සිතමි.

**612** ඕතොමෝ එහි පර්වතයන්හිද වනයන්හිද අඬා නැවත ස්වාමියාගේ ආශ්‍රමයට ගොස් ඔහු සමීපයෙහි ඇඬුවාය.

**613-614** (මේ ඡේද 610-611 මෙනි.)

**615** "දේවයන් වහන්ස, අපගේ දරුවන් නොදක්නෙමි. යමෙකු විසින් ඔවුන් ගෙනගියාහුද, මරන ලද්දාහුද, වෘක්ෂ මූලයන්හිද පර්වතයන්හිද ගුහාවන්හිද හැසිරෙන්නී. නොදක්නෙමි."

**616** මෙසේ උතුම් ශරීර ඇති යසස් ඇත්තාවූ මද්‍රී නම් රජ බිසව දෙඅත් හිස බැඳ අඬා එහිම බිම වැටුණීය.

**617** සිහි නැතිවූ ඒ රාජපුත්‍රියට දිය ඉස, සිහි ලැබූ ඇය දැක නැවත ඈට මේ වචන කීයේය.

**618** "මද්‍රී දේවිනි, මුලින්ම ඔබට දුකක් ගෙනදීමට නොකැමැත්තෙමි. දිළිඳුවූ මහළුවූ ඉල්ලාගෙන ජීවත් වන්නාවූ බමුණෙක් ගෙට ආවේය. මාවිසින් ඔහුට දරුවන් දෙන ලදී. මද්‍රීය බිය නොවව. සැනසෙව.

**619** "මද්‍රි දේවීනි, මා බලව, දරුවන් නොබලව. තදින් නොහඬව. ජීවත් වන්නාවූ අප නිරෝගිද වන්නාහු නම් පුත්‍රයන් ලබමු.

**620** "පුත්‍රයන්ද, තිරිසන් ගත සතුන්ද, ධනයද ගෙයි අනික් ධනයක් ඇත්තේද, ආවාවූ ඉල්වන්නන් දැක සත්පුරුෂයා දන් දෙන්නේය. මද්‍රිය මාවිසින් දරුවන් උතුම් දනට දීම අනුමෝදන් වෙව"

**621** "දේවයන් වහන්ස, ඔබවහන්සේ විසින් දරුවන් උතුම් දනට දීම අනුමෝදන් වෙමි. දී සිත පහදව. බොහෝ කොට දන් දෙන්නෙක් වෙව."

**622** "මහරජ, සිවීන්ගේ රට වඩන යම්බඳුවූ ඔබ මසුරු වූ මනුෂ්‍යයන් අතර බමුණාට දානයක් දුන්නේද,

**623** "තොපගේ දානයට පෘථිවිය නාද කරණ ලද්දාහ. ඒ දාන ශබ්දය දිව්‍ය ලෝකයටද ගියේය. පර්වතයන්හි දෝංකාර වැනි ශබ්ද හා අකාල විදුලි කෙටීම්ද විය.

**624** "නාරද පර්වත යන දිව්‍ය නිකාය දෙදෙනද මේ පින් අනුමෝදන් වෙත්වා. ප්‍රජාපතීද, සොමද යම වෛශ්‍රවන රජද

ශක්‍රයා සහිත තව්තිසා වැසි දෙවියෝද යන සියලු දෙවියෝ මේ පින් අනුමෝදන් වෙත්වා”

**625** මෙසේ ශ්‍රෙෂ්ඨ ශරීරයක් ඇත්තාවූ යසස් ඇත්තාවූ රජ බිසවුතොමෝ වෙස්සන්තරගේ පුත්‍රයන් සම්බන්ධ උතුම් දානය අනුමෝදන් විය.

**626** ඉක්බිති රාත්‍රිය අවසානයෙහි ඉර පායන කල්හි ශක්‍රතෙමේ උදෑසන බමුණු වේශයකින් ඔවුන්ට පෙනී සිටියේය.

**627-630** (මේ ඡෙද 357-358 ඡෙද මෙනි)

**631** “වනයෙහි සත් මසක් වාසය කරන්නාවූ ශොකයෙන් ජීවත්වන්නාවූ අපට බෙලි ලීයක් රැගත් අඳුන් දිවිසමක් දරන්නාවූ දෙවියන් විසින් වර්ණනා කළ බමුණෙකු දෙවෙනි වරද දකිමු.

**632-34** (මේ ඡෙද 359-361 ඡෙද මෙනි.)

**635** “නැවත ඔබ කිනම් කරුණක් නිසා කිනම් හේතුවක් උඩ මහවනයට පැමිණියෙහිද, විචාරණ ලද මට එය කියනු මැනව.”

**636** “යම්සේ පිරුණාවූ මහා සමුද්‍රය සියලු කාලයෙහි ක්ෂය නොවේද, එසේ ඔබගෙන් ඉල්වන්නට පැමිණියෙමි. ඉල්වන මට භාර්‍ය්‍යාව දෙව.”

**637** “දෙමි, වෙනස් නොකරමි. බ්‍රාහ්මණය යමක් මගෙන් ඉල්ලන්නෙහිද, ඇති දෙය නොසඟවමි. මාගේ සිත දීමෙහි ඇලෙයි.”

**638** සිවීන්ගේ රට වඩන රජතෙම මද්‍රීදෙවිය අතින් අල්ලා දිය පිරුණු කෙණ්ඩිය ගෙන බමුණාට දන් දුන්නේය.

**639** මද්‍රීදේවිය දෙද්දී පෘථිවිය කම්පාවූයේය. එකල්හි බිහිසුණු බවක්ද විය. එය ලොම් කෙලින් සිටින්නක් ද විය.

**640** මද්‍රිදෙවියගේ මුහුණ (කොපයෙන්) නොහැකුළුණේය. මුහුණ නොමැලවුණේය නොහඬයි. මේ රජතෙම යම් ලාභයක් දනීයයි ඕතොමෝ තුෂ්ණීම්භූතව ඔහුගේ මුහුණ බලාම සිටියාය.

**641** "ජාලියද කෘෂ්ණජිනා දුවණියද පතිව්‍රතාවූ මද්‍රිදෙවි බුද්ධත්වය පිණිසම දෙන්නේ අනෙකක් නොසිතුවෙමි.

**642** "දරුවන් දෙදෙන මට අප්‍රිය නොවෙති. මද්‍රි දේවියද අප්‍රිය නොවේ. සර්වඥ බව මට ප්‍රියය, එහෙයින් ප්‍රිය වස්තු දුන්නෙමි."

**643** "මම යම්බඳුවූ ඔබගේ තරුණ භාර්‍ය්‍යාව වෙම්ද, ඔබ මගේ ස්වාමියාය. යමෙකුට කැමැත්තෙහි නම් ඔහුට මා දෙන්නේය. විකුණන්නේය. මරන්නේය."

**644** ශක්‍රතෙමේ ඔවුන්ගේ අදහස් දැක දිව්‍යවූද, මනුෂ්‍යවූද ඔබගේ විරුද්ධකාරවූ යම් ක්ලෙශයක් ඇද්ද ඔවුහු ලදහයි" කීවේය.

**645-47** (මේ ඡෙද 624-625 ඡේදමෙනි) "ශක්‍රයා සහිත තවුතිසාවැසි දෙවියෝ" වෙනුවට "හෙතෙම නොකට හැකි දෙයක් කරයි" යෙදිය යුතුයි.)

**648** "නොදිය හැකි දෙයක් දෙන්නාවූ නොකළ හැකි දෙයක් කරන්නාවූ අසත් පුරුෂයෝ සත් පුරුෂයන්ට අනුව ක්‍රියා නොකරත්. සත් පුරුෂයන්ගේ ස්වභාවය සිතිය නොහැකියි.

**649** "එහෙයින් සත්පුරුෂයන්ගේද අසත්පුරුෂයන්ගේද මින් යාමද වෙනස්ය. අසත්පුරුෂයෝ නරකයට යත්. සත්පුරුෂයෝ දෙව්ලොවට යත්.

**650** "වනයෙහි වසමින් දරුවන් දුන්නේද, යම් මේ භාර්‍ය්‍යාවක් දුන්නේද, ශ්‍රෙෂ්ඨ පදවියට නොවරදවා තොපට දිව්‍යලොකයෙහි සැපවිඳීමට එය පවතීවා.

**651** "සියලු අවයවයෙන් යහපත්වූ මද්‍රිදේවිය භාර්‍ය්‍යා කොට ඔබට දෙමි. මද්‍රිදේවියම ඔබට සුදුසුය. මද්‍රියද ස්වාමියා සමග වූයේ බබළයි.

**652** "යම්සේ කිරිද සකද යන දෙක සමාන ස්වරූප ඇත්තේද එසේම ඔබද මද්‍රීයද එකසමාන සිත් ඇත්තාහ.

**653** "මේ වනයට රටින් පිටකරණ ලද ක්ෂත්‍රියවූ මවුපිය දෙපසින් යහපත්ව උපන් උසස් ජාති ඇති දෙදෙනම අනෙක්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

අනෙක් දේ දෙමින් යම්සේ පින් කරව්ද එසේ අසපුවෙහි වෙසෙත්වා.

**654** "මම දෙවියන්ට අධිපති ශක්‍රයා වෙමි. තොප සමීපයට ආමි. රාජ තාපසය, වරයක් ඉල්වව. තොපට වර අටක් දෙමි"

**655** "සියලු සත්වයන්ට අධිපති ශක්‍රය, මට ඉදින් වර දෙන්නේහි නම් මෙයින් මගේ ගෘහයට ගොස් මට අසුනක් පවරන්නේද එසේ මගේ පියා සතුටු කරවන්නේද ඒ පළමු වෙනි වරය ඉල්වමි.

**656** "රාජාපරාධ කරන්නාවූ පුරුෂයෙකුට වධ කිරීමක් නොකැමැත්තෙමි. වධයට පත්වූවෙකු වධයෙන් මුදවන්නෙමි යන දෙවෙනි වරය ඉල්වමි.

**657** "යම් මහල්ලෙක් වේද, යම් ළදරුවෙක් වේද, යම් මධ්‍යම පුරුෂයෙක් වේද, මානිසාම ජීවත් වන්නාහුද මේ තුන්වෙනි වරය ඉල්වමි.

**658** "අනුන්ගේ භාර්‍ය්‍යාවන් වෙත නොයන්නෙමි. ස්වකීය භාර්‍ය්‍යාවගෙන් සතුටුවන්නෙමි. ස්ත්‍රීන්ගේ වසඟයට නොයන්නෙමි යන මේ සතරවෙනි වරය ඉල්වමි.

**659** "ශක්‍රය, මට පුත්‍රයෙක් උපදින්නේ නම් හෙතෙමේ දීර්ඝායුෂ වේවා. ධර්මයෙන් පෘථිවිය දිනන්නෙමි යන මේ පස් වෙනි වරය ඉල්ලමි.

**660** "ඉක්බිති රාත්‍රිය, අවසානයෙහි හිර පායන වේලාවෙහි දිව්‍යමය ආහාර පහළවෙත්වා. යන සවෙනි වරය ඉල්වමි.

**661** "දෙන්නාවූ මට අඩු නොවේවා. දී පසුතැවිලි නොවන්නෙමි. දෙමින් සිත පහදවන්නෙමි. මේ සත්වෙනි වරය ඉල්ලමි.

**662** "මම මෙයින් චුතවන්නෙම් විශෙෂ ගමන් ඇත්තේ ස්වර්ගයට යන සුළුවූයෙමි. ඉන් මනුෂ්‍යලෝකයට විත් නැවත නූපදින්නෙක් වෙම්වා යන අටවෙනි වරය ඉල්ලමි."

**663** ශක්‍රතෙමේ ඔහුගේ ඒ වචනය අසා "දරුව, තොපගේ පියා නොබෝ කලකින් තා බැලීමට එන්නේයයි" මෙය කීවේය.

**664** සුජම්පති දිව්‍යපුත්‍රවූ ශක්‍රතෙමේ මෙය කියා වෙස්සන්තර රජුට වරදී දිව්‍යලෝකයට ඉවත්ව ගියේය.

**665** "ගින්නෙන් තවන ලද රත්රන් මෙන්ද කෝවෙහි මදිනලද රන් මසුරමක් මෙන්ද, බබළන මේ මුහුණ කාගේද,

**666** "දෙදෙනම සමාන අවයව ඇත්තාහ. දෙදෙන සමාන ලකුණු ඇත්තාහ. එකෙක් ජාලිය බඳුය. එකෙක් කෘෂ්ණජිනාව මෙනි.

**667** "දෙදෙනම දැන් ගුහාවෙන් නික්මුණු සිංහයන් හා එකසමානය. මේ දරුවෝ රන් මෙන්ම පෙනෙත්. බමුණ මේ දරුවෝ කොයින් ගෙනෙහිද?

**668** "සඤ්ජය, දේවයන්වහන්ස, මට ඒ දරුවෝ වස්තු කොට දෙන ලද්දාහ. යම් දවසක මට දරුවන් දෙනලද්දාහුද අදට මේ පසළොස්වන රාත්‍රියයි."

**669** "කිනම් ප්‍රිය වචනයකින් හරි නුවණින් අදහම්ද, කවරෙක් ඒ දරුවන් උතුම් දීමක්කොට තට දන්දුන්නේද?"

**670** "උපන් අයට පොළොව මෙන් යමෙක් යාචකයන්ට පිහිටක්වේද, වනයෙහි වසන්නාවූ ඒ වෙස්සන්තර රජතෙම දරුවන් දුන්නේය."

**671** "නදීන්ට සාගරය මෙන් යමෙක් යාචකයන්ට පිහිටවීද, වනයේ වසන ඒ වෙස්සන්තර රජතෙම දරුවන් දුන්නේය"

**672** "ශ්‍රද්ධාවෙන් ගිහිගෙයි වසන්නාවූ රජු විසින් ඒකාන්තයෙන් අමාරු වැඩක් කරණලදී. කැලේට පිටුවහල් කරණ ලද්දේ කෙසේ නම් දරුවන් දන්දෙන්නේද?

**673** "යම්තාක් මෙහි රැස්වූ පින්වත්හු වෙත්ද මෙය අසත්වා. වනයෙහි වසන්නාවූ වෙස්සන්තර රජතෙම කෙසේ දරුවන් දන්දුනිද, හෙතෙම දාසයෙක්ද, දාසියන්ද, අශ්වයන්ද, අශ්වතරීන් යෙදූ රියද දේවා, කුඤ්ජරයයි කියන ලද ඇතුන්ද දේවා, හෙතෙම කෙසේ නම් දරුවන් දෙන්නේද?

674 "යමෙකුගේ ගෘහයෙහි දාසයෙක් නැද්ද, අශ්වයෙක් හෝ අශ්වතරයන් යෙදූ කරත්ත නැද්ද, කුඤ්ජර නාග සංඛ්‍යාත ඇතෙක් නැද්ද, මුත්තණුවෙනි, හෙතෙම කුමක් දන් දෙන්නේද?"

675 "දරුවෙනි, ඔහුගේ දානයට ප්‍රශංසාකරමු. නින්දා නොකරමු. තොප හිඟන්නෙකුට දී කෙසේ පපුවක් වූයේද?

676 "කෘෂ්ණජිනාව කී වචනය අසා ඔහුගේ පපුව දුකට භාජනවිය. නැවත උණුසුම් ද විය. තඹවන් රෝහිණිය මෙන් තඹ ඇස් ඇති පියතෙම කඳුළු හෙළුවේය.

677 "පියාණෙනි, මේ බ්‍රාහ්මණතෙම මට ගෙයි උපන් දාසියකට මෙන් සැරයටියෙන් තළායයි" යමක් ඔහුට කෘෂ්ණජිනා තොමෝ කීවාය.

678 "පියාණෙනි, මේ බ්‍රාහ්මණයෙක් නොවේ. බමුණෝ ධාර්මික වෙත්. බමුණු වේශයෙන් යක්ෂයෙක් අප කන්නට ගෙනයයි. යකෙකු විසින් ගෙනයන කල්හි කුමක් හෙයින් බලා සිටින්නෙහිද?"

679 "තොපගේ මවුතොමෝ රාජපුත්‍රියකි. තොපගේ පියතෙම රාජ පුත්‍රයෙකි පෙර මාගේ ඇකයට නැග දැන් කුමක් හෙයින් ඈත්ව සිටින්නෙහිද?"

680 "අපගේ මවුතොමෝ රාජපුත්‍රියකි. අපගේ පියතෙම රාජපුත්‍රයෙකි. අපි බ්‍රහ්මණයෙකුගේ දාසයෝය. එහෙයින් ඈත්ව සිටිමු."

681 "ප්‍රිය දරුවෙනි, එසේ නොකියව. මගේ පපුව දයි. මගේ ශරීරය දරසෑයක් මෙනි. ආසනයෙහි සැපක් නැත.

682 "ප්‍රිය දරුවෙනි, එසේ නොකියව. මට බොහෝ කොට ශොක උපදවයි. දඩ දී ගන්නෙමි. තොප දාසයෝ නොවන්නාහුය.

683 "දරුවෙනි, ප්‍රියතෙමේ කෙතෙක් අගය කොට බමුණට දුන්නේද, තත්වූ පරිදි මට කියව බමුණාට දෙන්නෙමු.

684 "පියා මා දහසක් අගයකොට බමුණාට දුන්නේය. බාල කෘෂ්ණජිනා කන්‍යාව ඇතුන් සියයකට මිල කෙළේය.

685 "දූතයෙනි, ඉක්මණට නැගිටිනු මැනව. දාසියන් සියයක්ද දාසයන් සියයක්ද ගවයන් ඇතුන් වෘෂභයන් සියයක්ද රන්රිදී දහසක්ද බමුණාට දෙව. දරුවන්ට වන්දි දෙනු මැනව."

686 ඉක්බිති දූතතෙමේ ඉක්මන්ව දාසියන් සියයක්ද දාසයන් සියයක්ද ගවයන් ඇතුන් වෘෂභයන් සියය බැගින් රන් රිදීයෙන් දහසක්ද බමුණාට දුන්නේය. පුත්‍රයන්ට වන්දි පිණිස දුන්නේය.

687 දරුවන් මිලදී ගෙන නහවා වළඳවා ආභරණයෙන් අලංකාරකොට ඇකයෙහි හිඳුවාගත්හ.

688 රජතෙම හිසනැවූ පිරිසිදු වස්ත්‍ර ඇන්දවූ සියලු ආභරණයෙන් සැරසූ දරුවන් ඇකයෙහි තබා සිටිකල්හි මුත්තණුවෝ මෙසේ ඇසූහ.

689 කුණ්ඩලාභරණ පළඳවා මිහිරි නාද කරවන කල්හි මල් පළඳවා සියලු අලංකාරයෙන් බබළන කල්හි රජතෙමේ දරුවන් ඇකයෙහි කොට මේ වචනය කීයේය.

690 "ජාලිය කිමෙක්ද? ඔබගේ මව් පිය දෙදෙන නිරෝගද, කිමෙක්ද? පල මුල්වලින් ජීවත්වත්ද, කිමෙක්ද, මුල් ගෙඩි බොහෝද?

691 "කිමෙක්ද ඇටමැස්සෝද මදුරුවෝද සර්පයෝ අඩුද? වල් මෘගයන් ගැවසීගත් වනයෙහි කිමෙක්ද, හිංසාවක් නැද්ද?"

692 "දේවයන්වහන්ස, නැවතද කියමි. මගේ මවු පිය දෙදෙන නිරෝගිය. පලවැලින් ජීවත්වෙත්. මුල් ගෙඩි බොහෝය.

693 "නැවත ඇටමැස්සෝද මදුරුවෝද සර්පයෝද නැත. වල්මෘගයන්ගෙන් යුත් වනයෙහි ඔවුන්ට හිංසාවක් නැත.

694 "ආලුද, කලම්බද, බිලාලිද, තක්කලද සාරන්නී ඩෙබරද, බදුල්ලද බෙලිද ඕතොමෝ අපට ගෙන දී පොෂ්‍ය කරයි.

695 "වන මුල් ඵල ගෙන එන්නාවූ ඕ යමක් ගෙනාවේද අපි සැමදෙන එක්වී එය දවල් අනුභව කරමු. රාත්‍රියෙහි නැත.

**696** "කෙට්ටුවූ පඬුවන්වූ මැණියෝම අපට ගස්වල ගෙඩි වර්ග ගෙන එති. අව්වෙන් හා වාතයෙන් අතින් ගත් පියුමක් මෙන් සිවුමැළිය.

**697** "වල්මුවන්ගෙන් ගැවසීගත්තාවූ කඟවේනුන් ගෙන් හා දිවියන්ගෙන් යුත් වල් මෘගයන්ගෙන් ගැවසීගත් මහා වනයෙහි හැසිරෙන්නාවූ මැණියන්ගේ කේශයෝ තුනීවූහ"

**698** "කෙස්වලින් ජටාව බැඳ කිසිලිවල කුණු දැලි දැරුවාය. සමක් ඇඳගෙන බිම සයනය කරයි. ගින්නට නමස්කාර කරයි.

**699** "ලොකයෙහි මනුෂ්‍යයන්ට ප්‍රියවූ පුත්‍රයෝ උපදිත්. ඒකාන්තයෙන් අපගේ ආර්‍ය්‍යයන්ට පුත්‍රයන් කෙරෙහි ආලයක් නැත.

**700** "පුත්‍රය, මම සිවීන්ගේ වචනයෙන් අපරාධ නොකරන වෙස්සන්තර රටින් පිට කෙළෙමි. මා විසින් එය කරණ ලද්දේ වරදකි. දියුණු අවැඩෙකි."

**701** "මෙහි මට යම්කිසි ධනයක්ද ධාන්‍යයක්ද ඇත්නම් එය වෙස්සන්තරටය. වෙස්සන්තර තෙමේ පැමිණේවා. සිවිරට අනුශාසනා කරව"

**702** "සිවින්ගේ උතුම් රජතෙමේ දෙවයන් වහන්ස, මගේ වචනයෙන් නොඑන්නේය. රජතෙමේ තෙමේම ගොස් තම පුතා වස්තුවෙන් අභිෂෙක කෙරේවා"

**703** ඉක්බිති සඤ්ජය රජතෙමේ සෙනෙවියාට කථා කළේය. ඔහුට ඇතුන්ද අශ්වයන්ද රියද පාබල සෙනගද යන සේනා සූදානම් කරවයි කීයේය. "නියම්ගම් වැස්සෝද බ්‍රාහ්මණයෝද පුරෝහිතයෝද මා අනුව එත්වා."

**704** ඉක්බිති යහපත් දැකුම් ඇති සැටදාහක් අමාත්‍යයෝ නොයෙක් පාටින් සැරසී යුද්ධ ඇඳුමින් වහා එත්වා.

**705** "සමහරු නිල්පාටින්ද සමහරු රන්වන් පාටින්ද හැන්දාහු. අන්‍යයෝ රතුපාටින් යුත් නළල්පට ඇත්තෝ සමහරෙක් පිරිසුදු වස්ත්‍ර ඇන්දාහු නොයෙක් වස්ත්‍රයෙන් සැරසුණෝ සන්නාහ සන්නද්ධව වහා එත්වා.

706 "සුවඳ දරා සිටි හිමාලය මෙන් නොයෙක් වෘක්ෂයන්ගෙන් ගැවසීගත් මහා භූත සමූහයාට වාසස්ථානවූ ගන්ධ මාදන පර්වතය

707 "දිව්‍ය ඖෂධවලින්ද දිශාද බබුළුවයි. සුවඳද හමයි. එසේ සැරසී වහා එත්වා. දිශාවන් හොබවත්වා, හමවත්වා.

708 "රන් බඳ පටි ඇති, රන් ඇඳුම් ඇන්දූ ඇතුන් දහහතර දාහක් යොදවව්.

709 "අඩයටි අකුසු අතේ ඇති ගම් මුදලියන් විසින් ඇතු පිට අලංකාර කොට සැරසී වහා එත්වා.

710 "තවද උත්පත්තියෙන් ආජානීයවූ වහා ගෙන යන සෛන්ධව කුලයෙහි උපන් දහහතරදාහක් අශ්වයන් යොදත්වා.

711 "දුනු ඊ දරන්නාවූ ගම් මුදලියන් අලංකාරව යුද්ධ ඇඳුමින් සැරසී අශ්වයන් පිටින් වහා එත්වා.

712 "රනින් කළ රථ මධ්‍යය ඇති යහපත්ව සැරසූ යකඩ නිම්වලලු ඇති දහහතරදාහක් රථ යොදවාවා.

713 "එහි කොඩි ඔසවාවා. සමින් කළ ආරක්ෂා ඇඳුම්ද යොදත්වා. ශක්තිමත් දුනුද දුනුවායන්ද යොදත්වා. රිය පදවන්නන් රථයන්හි ඇඳුමින් සැරසී වහා එත්වා

714 "විළඳද, ඉසින මල්ද, මල්ගඳ සුවඳ වර්ගද, යම් මාර්ගයකින් වෙස්සන්තර පැමිණේද ඒ ඒ තන්හි මල් කණුද රන් කණුද සිටවාවා.

715 "යම් මාර්ගයකින් වෙස්සන්තර ඒද රසබීම පිරවූ කල සියය බැගින් ගමක් පාසා මග තබවාවා.

716 "මස්ද කැවුම්ද මසින් යුක්තවූ පිට්ටුද යම් මාර්ගයකින් එත්ද ඒ මාර්ගයෙහි තබත්වා.

717 "ගිතෙල්ද, තලතෙල්ද, මිදුනු කිරිද, තනහාල්ද වීද, බොහෝ සුරාද යම් මගකින් එද්ද මාර්ගයෙහි තබත්වා.

718 "පණිවිඩ ගෙනයන්නෝද කෑම පිසන්නෝද නෘත්‍ය කරුවෝද, ගායනා කරන්නෝද, අත්පොළසන් දෙන්නෝද

පුන්කලස්ද, හිස මුඩුකළ ගායකයෝද, සෝක නැති කරන්නෝද සිටිත්වා.

719 "සියළු වීණා බෙරද වයත්වා. මුහුදු සක්ද පිඹිත්වා. එකැස් බෙර වයත්වා.

720 "මිහිඟු බෙරද, පණා බෙරද, දවුල්ද, තම්මැටද ගසත්වා. සක්ද නාද කරණ තළද පිඹිත්වා."

721 සිවි රජු ගෙන ඒමට යන්නාවූ ඒ සේනාව මහත් වූවාය. ජාලිය මාර්ග නායකයා කොට වංක පර්වතයට ගියේය.

722 අවුරුදු හැටක් වයස ඇති මාතංග ඇත්තෙම කුඤ්චනාද කරයි. ඇත්තෙම රන් ඇතිරිලි බඳින කල්හි කුඤ්ච නාද කරයි.

723 ආජානෙය අශ්වයෝ හෙසාරව කළාහුය. නිම් වළලුවල ශබ්දය පහළවූයේය. සිවිරජු ගෙන ඒමට පිටත්ව යන කල්හි වලාකුල පොදවැස්සෙන් ධූලි වැසුයේය.

724 බර ඉසිලීමට සමර්ථවූ පිටත්වූ සේනාව මහත්වූහ. ජාලිය කී මග සලකුණුවලින් වංක පර්වතයට ගියේය.

725 ඔව්හු බොහෝ ශාඛා ඇත්තාවූ මහත් ජලය ඇත්තාවූ මල් ගස් වලින්ද ගෙඩි ඇති වෘක්ෂවලින්ද යුක්තවූ මහ වනයට ප්‍රවිෂ්ට වූවාහුය.

726 එහි ඍතුවෙහි පිපුන වෘක්ෂයන්හි ස්වල්ප ශබ්ද ඇත්තාවූ නොයෙක් පාට ඇති බොහෝ පක්ෂීහු නාද කරන්නන් අනුව නාද කරත්.

727 ඔවුන්ද රෑ දවාලක් ඇවෑමෙන් දීර්ඝ මාර්ගය ගෙවා ගොස් යම්තැනෙක වෙස්සන්තර වූයේද ඒ ප්‍රදෙශයට පැමිණියේය.

728 ඔවුන්ගේ ශබ්දය අසා වෙස්සන්තර රජතෙම බිය වූයේය. කන්දට නැගී, බියවූයේ සේනාව බලයි.

729 "මද්‍රී දේවිය, ඇහුම්කන් දෙව. වනයෙහි යම්බඳු ශබ්දයක්වේ. ආජානෙය අශ්වයෝ නාද කරත්. කොඩි මුදුන්ද පෙනේ.

730 "මේ ඒකාන්තයෙන් වනයෙහි මුව වැද්දෝ දැල් වලින් වටකර එකෙනෙහිම වලක දමා මුවන්ට මුවන් මරණ ආයුධ වලින් වරින්වර අනිත්.

731 "නිරපරාධවූ අපි වනයට පිටුවහල් කරණලද්දාහු විරුද්ධ කරුවන්ගේ අතට පැමිණියෙමු. අවාසනාවන්ත මරණයක හැටි බලන්න.

732 "තණ සුලකින් මහා සමුද්‍රයෙහි ජලය හුනු කරන්නට නොහැක්කාසේ අමිත්‍රයෝ අප මැඩ නොපවත්නහුය. එය සලකව. මින් අපට යහපතක් වන්නේය."

733 ඉක්බිති වෙස්සන්තර රජතෙම පර්වතයෙන් බැස සිත සනසාගෙන පන්සල් දොරකඩ සිටියේය.

734 රිය නවත්වා සේනාව විධානකොට තනිව පියතෙමේ වනයෙහි වසන පුතා වෙත පැමිණියේය.

735 ඇත් කඳින් බැස එකාංශ කොට පෙරවූ, ඇඳිලි බැඳගත් අමාත්‍යයන් විසින් පිරිවරණ ලද්දේ පුතා ඔටුණු පැළඳවීමට පැමිණියේය.

736 හෙතෙම යහපත් එකඟ කළ සන්සුන් සිත් ඇතිව සිතමින් කිසි බියක් නැතිව හුන් කුමාරයා දුටුයේය.

737 එන්නාවූ පුතා කෙරෙහි ගිජුවූ පියා දැක වෙස්සන්තර රජුද මද්‍රී දේවිද පෙර ගමන්කොට වැන්දාහ.

738 මද්‍රී දේවියද හිසින් මාමාගේ පා වැන්දාය. මද්‍රි තොමෝ "දේවයන් වහන්ස, මම ඔබගේ ශ්‍රෙෂ්ඨ පා දෙක වඳිමි" ඔවුන් අඬද්දී ආශ්‍රමයේ බිම වැටී පපුවට හාන්සි කරවා අතින් පිට අතගායි.

739 "දරුව නුඹලාට සැප කෙසේද? දරුව, හිරිහැර නැද්ද, කිමෙක්ද, පලවැල නෙලීමෙන් යැපෙව්ද, කිමෙක්ද මුල් ගෙඩි බොහෝද,

740 "කිමෙක්ද, ඩැහැලේ බොන මැස්සෝද දීර්ඝ ජාතීහුද නැද්ද, වල් මෘගයන්ගෙන් ගැවසුන වනයෙහි හිංසාවක් නැද්ද?"

741 "දේවයන් වහන්ස, අපගේ ජීවිකාව යම්තම් ගත විය. පලවැලින් ජීවත්වීම නම් දුක්ඛ ජීවිතයකි."

742 "මහරජ, දමනය කළයුතු නොදියුණු දමනය කරන්නෙකු වැනි අදහස් සමෘද්ධ නොවූ දිළිඳු පුරුෂයෙක් තෙම නොදියුණු අප පාලනය කරයි.

743 "එතකුදුවුවත් වනයෙහි සදාකාලික දුකට පත්වූ පිටුවහල් කළ අපගේ පියා හා මව නොදැක්මෙන් ශරීරයේ මස් ක්ෂයවිය.

744 "දීමෙන් නොසෑහුනු සිත් ඇති සිවිරටට ශ්‍රෙෂ්ඨවූ යම්බඳුවූ තොප බමුණාගේ වසඟයට යාමෙන් එවැනි යමෙක් ගවයන්ට මෙන් තලද්ද, එවැනි ඉක්මන්කාර වැද්දෙකුට අප දෙදෙන දුන්නේය.

745 "රාජපුත්‍රිය විසින් තොපගේ පුත්‍රයන් ගැන ඉදින් දන්නී නම්, සර්පයකු විසින් දෂ්ට කරණලද කුමාරයකු සුව කරන්නාක් මෙන් අපට කියන්නීය.

746 "බ්‍රාහ්මණයාට වස්තු දී ජාලිය කෘෂ්ණජිනා යන දරුවන් දෙදෙනා මිල දී ගෙන, දරුවෙනි, බිය නොවෙවයි" සතුටු වූයේය.

747 "පියාණෙනි, සැපසනීප කවරේද, පියාණෙනි, නිරොගිද, පියාණෙනි කිමෙක්ද මගේ මවගේ ඇස් නොපිරිහුනේද?"

748 "දරුව, මට සැපය, පුත්‍රය නැවතද නිරොගිය. දරුව, තවද තොපගේ මවගේ ඇස් නොපිරිහුනේය."

749 "කිමෙක්ද, වාහන අදනා සතුන් නිරෝගිද? කිමෙක්ද ඔබගේ වාහනය උසුලාද, කිමෙක්ද, රටතොට සමෘද්ධද කිමෙක්ද වැස්ස පවතීද?"

750 "තවද වාහනය නිරොගය. තවද මාගේ වාහනය උසුලයි. තවද මගේ දනවු සමෘද්ධය. තවද වර්ෂාවද පවතී"

751 මෙසේ කථා කරද්දී මවුතොමෝ ඔවුන්ට පෙනී සිටියාය. ගල්ගෙය දොරකඩ වහන් සඟලවත් නැතිව රාජ පුත්‍රිය පයින් පැමිණ සිටියාය.

752 දරුවන් කෙරෙහි ගිජුවූ එන්නාවූ මවු දැක වෙස්සන්තර රජතෙමේද මද්‍රී දේවියද පෙර ගමන්කොට වැන්දාහ.

753 මද්‍රී දේවියද "මම ආයයීාවෙනි ඔබගේ පා ගෞරවයෙන් වඳිමියි," මද්‍රී දේවියද නැන්දම්මාගේ පා වැන්දේය.

754 දුරින්ම සුවසේ පැමිණි දරුවෝ මද්‍රී දේවිය දුරින්ම දැක පොඩි වසු පැටවෙක් මවුවෙතට මෙන් අඬමින් දිව්වාහුය.

755 මද්‍රී දේවියද සුවසේ පැමිණි දරුවන් දුරින්ම දැක ආවේශවූවෙකු මෙන් වෙවුලා පයොධර වලින් කිරි ධාරා වැගිරවූයේය.

756 රැස්වූ ඤාතීන්ගේ මහා ශබ්දයක් පහළවිය. පර්වතයෝ එකට නාද කළාහුය. පොළෝ කම්පා විය. එකෙණෙහි වැසි ධාරා වගුරුවමින් වැස්සක් වැස්සේය.

757 ඉක්බිති වෙස්සන්තර රජතෙමේ ඤාතීන් හා එක් විය. මුණුබුරෝද, ලේලිද, පුතාද, රජුද දේවියද එකට එක්විය.

758 යම් වේලාවක එක්වූවාහුද එකල්හි ලොමු දැහැගැනීමක් විය. භයානක වනයෙහි අඬමින් ඇඳිලි බැඳ ඔහුගෙන් රාජ්‍යයට පැමිණෙන ලෙස ඉල්වත්.

759 වෙස්සන්තර රජුද, මද්‍රී දේවියද රැස්වූ සියළු රට වැස්සෝද "නුඹවහන්සේ අපගේ අධිපති රජය, ඔබ දෙදෙන රාජ්‍යය කරවයි" කීවෝය.

760 "රැස්වූ ඔබද ජනපද වැස්සෝද නියම්ගම් වැස්සෝද ධර්මයෙන් රජ කරණ මා රටින් පිටුවහල් කළෝය."

761 "දරුව යම්බඳුවූ මම නිවරද පුත්‍රයා සිවීන්ගේ වචනයෙන් රටින් පිට කළෙම්ද, මගේ පුත්‍රය, මා විසින් නොකළහැකි දෙයක් ඉක්මන් වීමෙන් කරණලදී.

762 "යම් ක්‍රමයකින් පියාගේද මවගේද නැගණියගේද දුක තමන්ගේ ප්‍රාණය පුදා වුවත් රැක්ක යුතුය."

763 ඉක්බිති වෙස්සන්තර රජතෙම අපිරිසිදු බව දුරු කළේය. පිරිසිදුවී රාජ වේශය ගත්තේය.

**764** හිස් සෝධා නා පිරිසිදු වස්ත්‍ර ඇඳ සියළු ආභරණයෙන් සැරසුනේ, පච්චය නම් ඇතු පිට නැග සතුරන් තවන කඩුව බැන්දේය.

**765** ඉක්බිති යහපත් දැකුම් ඇති එක්ව උපන් සැට දහසක් යෝධයෝ රජු සතුටු කරවමින් පිරිවරා ගත්හ.

**766** සිවි රජුගේ රාජස්ත්‍රීන් රැස්ව මද්‍රීදේවිය නැවුවාහුය. වෙස්සන්තරතෙමේ ඈද ජාලිය කෘෂ්ණජිනා යන දෙදෙනද රක්ෂා කෙරෙත්වා. තවද සඤ්ජය මහරජතෙමේ ඔහු රකිත්වා.

**767** මහණෙනි වෙස්සන්තර රජතෙමේද මද්‍රී දේවියද මේ පිහිට නොහොත් රජකම ලබා පෙර තමාගේ දුක සිහිකොට යහපත් වංකගිරි පව්වෙහි රජුගේ ආඥාවයයි ප්‍රීති වූවාහුය.

**768** මේ රජකමේ පිහිටීම ලැබ පෙර තමාගේ වනවාස කිලුට සිහිකොට දරුවන් හා එක්ව ලක්ෂණයෙන් යුත් මද්‍රී දේවි ප්‍රීතිමත් සිත් ඇතිවූවාය.

**769** මේ රජකමේ පිහිටීම ලැබ පෙරම මාගේ වනවාස කිලුට සිහිකොට පුත්‍රයන් සමග ලක්ෂණයෙන් යුත් දේවී තොමෝ ප්‍රීතිමත් විය.

770 "දරුවෙනි, තුඹලා නිසා පෙර එක බතින් යැපුනෙමි. නිතර පොළොවේ සයනය කෙළෙමි. මගේ මෙවැනි සිරිතක් විය.

771 "දරුවෙනි, තොප හමුවී අද ඒ මගේ අදහස ඉටුවිය. මවටත් පියාටත් අයිති සැපත පාලනය කරව.

772 "නැවතද සඤ්ජය මහරජතෙමේ තොප රකීවා. මගේත් තොපගේ පියාගේත් කරණලද යම් පිනක් ඇද්ද, ඒ සියළු පිණින් අජරාමර වේවා."

773 යම් වස්ත්‍රයකින් මද්‍රී දේවිය බැබලීද, කපුද, කොසෙයාද, පට්ටා පිලීද, ඔදුම්බර රටේ වස්ත්‍රද, නැන්දා ලේලිට යැව්වාය.

774 තවද රනින් කළ මාලයක්ද, වලලුද මැණික් ඉග පලඳනාවක්ද ලේලිට යැව්වාය. ඉන් මද්‍රී දේවිය බැබලුනි.

775 ඉක්බිති ඉඳි ඇට පමණ ඇට ඇති මාලයක්ද රත්රන් මාලයක්ද, නැන්දා ලේලිට යැව්වාය. එයින් මද්‍රී දේවිය බැබලුනි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

776 පපුව වසන පළඳනාවක්ද තිලක ආභරණයක්ද නොයෙක් වර්ණ මැණික්ද උග්ගත්ථන හිංගම දෙකද ඉඟටිය වසන ආභරණයක්ද පා පළඳනාද යමක් පැළඳ මිද්‍රිය බැබලීද, ඒ ආභරණ නැන්දා ලේලිට යැව්වාය.

777 මෙසේ කී නොකී ආභරණවලින් සැරසී සිටි රජ බිසව නඳුන් වනයෙහි දිව්‍ය කන්‍යාවක් මෙන් බැබලිනි.

778 හිස වතුර නා පිරිසිදු වස්ත්‍ර ඇතිව සියළු ආභරණයෙන් අලංකාරව තවුතිසා දෙව්ලොව දිව්‍යාංගනාවක් මෙන් බැබලී.

779 වාතය ස්පර්ශ කළ චිත්‍රලතා වනයෙහි පහළවූ කෙසෙල් ගසක් මෙන්ද, දත් වැස්මෙන්ද යුක්තවූ රජ බිසව බැබලුනේය.

780 මනුෂ්‍ය රූපයෙන් පහළවූ පක්ෂි ධෙනුව යහපත් පක්ෂ ඇතිව ඉගිල්ලෙන කිරිල්ලියක් මෙන් බබලයි. මෙසේ පැසුනු නුග ගෙඩි පාට තොල් ඇතුව බැබලුනීය.

781 මහළු නොවූ ඊ පහර ආයුධ පහර ඉවසන නගුලීස් පමණ දළ ඇති මහත්වූ ඇතෙකු ගෙනාවාහුය.

782 ඒ මද්‍රීතොමෝ අඩයටි සහ ඊපහර ඉවසන නගුලිස් පමණ දළ ඇති මහත්වූ තරුණ ඇතෙකු පිට මද්‍රී දෙවිය නැගුනාය.

783 (i) සියලු වනයෙහි මුවෝ වූවාහුද (ii) වෙස්සන්තර රජුගේ ආනුභාවයෙන් ඔවුනොවුන් හිංසා නොකළාහුය.

784 සියලු වනයෙහි යම්තාක් පක්ෂීහු වූවාහුද (783 (ii) යෙදිය යුතුයි)

85 සිවිරට වඩන වෙස්සන්තර රජතෙම ගිය කල්හි සියළු ආරණ්‍යයෙහි යම් පමණ මෘගයෝ වූවාහුද ඔව්හු එකට රැස්වූවාහුය.

786 (මේ ඡේදයට 785 ඡේදය 'මෘගයෝ' වෙනුවට 'පක්ෂීහු' යොදන්න)

787 සියලු වනයෙහි යම්තාක් මෘගයෝ වෙත්ද සිවිරට වඩන වෙස්සන්තර රජ ගියකල්හි යහපත් නාද නොකළාහුය.

788 (මේ ඡේදය 787 ඡේදයේ 'මෘගයෝ' යන්නට 'පක්ෂීහු' කියා වෙනස්කර යොදාගත යුතුයි)

789 වෙස්සන්තර විසූ ස්ථානයේ සිට ජේතුත්තර නුවර දක්වා රාජ මාර්ගය පිළියෙළ කෙළේය. විසිතුරු මල් ඉස්සේය.

790 සිවිරට වඩන වෙස්සන්තර රජ ගිය කල්හි යහපත් දැකුම් ඇත්තාවූ සැටදහසක් යෝධයෝ හාත්පස රැස් වූවාහුය.

791 සිවිරට වඩන වෙස්සන්තර රජතෙම ගියකල්හි අන්තඃපුරයද කුමාරයෝද වෛශ්‍යයෝද බ්‍රාහ්මණයෝද හාත්පස පිරිවැරූහ.

792 ඇතරුවෝද, සෙනාවෝද, රියැදුරෝද, පයින් යන්නෝද සිවිරට වඩන වෙස්සන්තර රජ ගියකල්හි හාත්පස පිරිවැරූහ.

793 සිවිරට වඩන වෙස්සන්තර රජ ගිය කල්හි දනවු වැස්සෝ රැස්වූහ. නියම්ගම් වැස්සෝද රැස්වූහ.

794 හිස්වෙළුම් දාගත්තාවූද, පලිහ ගත්තාවූද, සැට්ට පැළඳ ගත් යෝධයෝද සිවිරට වඩන මහරජ ගිය කල්හි ඉදිරියට ආවාහුය.

795 බොහෝ ප්‍රාකාර සහ තොරන් ඇති නෘත්‍යගීත දෙකින්ද ආහාර පානයන්ගෙන්ද යුක්තවූ යහපත් නුවරට ඔව්හු පැමිණියා වූවාහුය.

796 සිවිරට වඩන කුමාරතෙම පැමිණි කල්හි දනවු වැස්සෝ සතුටුවූවාහුය. නියම්ගම් වැස්සෝද රැස්වූවාහුය.

797 වස්තුදෙන මහරජු පැමිණි කල්හි පිලී හිස සිසෑරීම් පැවැත්තේය. වෙස්සන්තර රජුගේ අණයයි නුවර අණබෙර යැවී. බැම්මෙන් මිදුන මනුෂ්‍යයෝ ශබ්ද පැවැත්වූහ.

798 සිවිරට වඩන වෙස්සන්තර රජු නුවරට පිවිසි කල්හි රුවන් වර්ෂාවක් වැස්සේය.

799 ඉක්බිති වෙස්සන්තර රජතෙම දන්දී දිව්‍යලොකයෙහි උපන්නේය.

---

# 11. නිද්දෙස පාලි.

## 1. මහා නිද්දේශය.

නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

### කාම සූත්‍ර නිර්දෙශය.

1 "කාමය කැමතිවන්නාවූ ඔහට ඉදින් වස්තුකාමය ලැබෙයි" යන්නෙහි කාම යනු ප්‍රකට වශයෙන් කාමයෝ දෙකොටසක් වෙති. (ii) එනම් වස්තුකාමයෝද ක්ලෙශකාමයෝද වෙති. වස්තුකාමයෝ කවරහුද? ප්‍රියවඩන්නාවූ රූපයෝද, ප්‍රිය වඩන්නාවූ ශබ්දයෝද, ප්‍රියවඩන්නාවූ ගන්ධයෝද, ප්‍රියවඩන්නාවූ රසයෝද, ප්‍රිය වඩන්නාවූ ස්පර්ශයෝද, එමෙන්ම ඇතිරිලිද, පොරෝණා ද, දාසි දාස එළු බැටළු ඌරු කුකුල් ඇත් ගව අශ්ව වෙළඹාදීහුද, එසේම කෙත් වතු හිරණ්‍යස්වර්ණ ගම් නියම්ගම් රාජධානිද ධනාගාර හා කොටුගුල්ද යන යම්කිසි ඇලෙන වස්තූහු වස්තුකාමයෝ වෙති.

2 නැවතද කාමයෝ අතීතය අනාගතය වර්තමානය (පවත්නා කල ඇති) අධ්‍යාත්මිකය බාහ්‍යය අධ්‍යාත්මික බාහ්‍යය, හීනවූ මධ්‍යමවූ ප්‍රණීතවූ ආපායිකය (නිරයෙහි සතුන්ට අයත්) මානුසිකය දිව්‍යය වැටහෙන කාමයෝය, නිර්මිත කාමයෝය, පරනිර්මිත (අනුන් ඇතිකරණ ලද) අනිර්මිත (ඇති නොකරණ ලද) පරිගෘහිත (වටකරණ ලද අපරිගෘහිතය (වට නොකරණ ලද) මමායිතය (මමය මාගේ යයි හැඟීම ඇති) යන සියලු කාමාවචර (කාමලොකයට අයත්) ධර්මයෝද, සියලු රූපාවචර ධර්මයෝද, සියලු අරූපාවචර ධර්මයෝද, තෘෂ්ණා වස්තුකවූ තෘෂ්ණා රම්මණවූ ප්‍රියයයි යන හැඟීම ඇති අර්ථයෙන්ද, ඇලීම ඇත්තේය යන අර්ථයෙන්ද, මදයට හේතුවේය යන අර්ථයෙන්ද, කාමයෝ නම් වෙති. මොව්හු වස්තුකාමයෝ යයි කියත්.

3 ක්ලෙශ කාමයෝ කවරහුද? ඡන්දනම් කාමය, රාග නම් කාමය, ඡන්දරාග නම් කාමය, සංකල්ප නම් කාමය, රාග නම්

කාමය යන මේ කාමයෝද යමෙක් කාමයන්හි කැමැත්ත ඇත්තේද, කාමරාගය ඇත්තේද, කාමනන්දිය ඇත්තේද, කාම තෘෂ්ණාව ඇත්තේද, කාම ස්නේහය ඇත්තේද යන තන්හිද, කාමපරිඩාහය, කාම මූර්ඡාව කාමයට බැසගැණීම කාමඕඝය කාමයෝගය කාමුපාදානය, කාමච්ඡන්ද නීවරණය යන මේ තැන්හිද 'කාමය තගේ මුල දැක්කෙමි. සංකල්පයෙන් කාමය හටගන්නෙහිය. ඒ මුල සංකල්පනය නොකරන්නෙමි. මෙසේ කාමය (තෝ) නොවන්නෙහිය' යන මොහු ක්ලේශ කාමයෝයයි කියත්. (ii) "කාමය මානස්ස (කැමති වන්නහුට) යනු කැමතිවන්නාවූ, ආශාකරන්නාවූ, පිළිගන්නාවූ ප්‍රාර්ථනා කරන්නාවූ ඇලී සිටින්නාවූ ගැලී සිටින්නාවූ යනුයි. කාමය කැමතිවන්නාටයි.

4 "ඔහුට ඉදින් වස්තු කාමය ලැබෙයි" යන්නෙහි ඕහට ඉදින්යනු ඒ ක්ෂත්‍රියාට හෝ බ්‍රාහ්මණයාට හෝ වෛශ්‍යයාට හෝ ශුද්‍රයාට හෝ ගිහියාට හෝ පැවිද්දාට හෝ දෙවියාට හෝ මිනිසාට හෝ යනුයි. එය යන්නෙන් වස්තු කාමයෝ කියනු ලැබෙත්. ප්‍රිය වඩන රූපයෝද ශබ්දයෝද ගන්ධයෝද රසයෝද ස්පර්ශයෝද වෙති. සමිජ්ඣති යනු ඉටුවෙයි, සමෘද්ධවෙයි, ලබයි, විශෙෂයෙන් ලබයි. මනාකොට ලබයි, විඳියි යනුයි.

5 "ඒකාන්තයෙන් ප්‍රීති සිත් ඇත්තේ වෙයි" යන්නෙහි ඒකාන්තයෙන් යනු ඒකාන්ත කීමයි අන් අදහසක් ඇතැයි සැක නැතිබව කීමයි. නිසැක වචනයයි. දෙකක්ව නොබෙදුණු වචනයයි, දෙවැන්නක් නැති වචනයයි, නියොග වචනයයි නිදොස් වචනයයි, මෙය නියමය ඇති වචනයයි යනුයි.

6 "ප්‍රීති, යනු යම්බඳු ඒ පංචකාම ගුණ ප්‍රති සංයුක්ත ප්‍රීතියක් ඇද්ද සතුටක් ඇද්ද ප්‍රමොදයක් ඇද්ද සිනහවක් ප්‍රභාසයක් සතුට විඳීමක් තුෂ්ටියක් උදම් වීමක් සන්තොෂයක් චිත්තයාගේ මනා පැතිරීමෙක් ඇද්ද එයයි"

7 (i) "මන යනු යම් සිතක් මානස නම් වේද. හදය, පණ්ඩර මන මනායතන මනීන්ද්‍රිය විඥාන විඥානයෙන් ඇතිවන මනොවිඤ්ඤාණ ධාතු නම් වේද, මෙය මන (සිත) යයි කියනු

ලැබේ. මේ සිත මේ ප්‍රීතිය සමග එක්වූයේ වෙයි සමග උපන්නේ මිශ්‍රවූයේ එහි යෙදුනේ එකට උපන්නේ එකට නිරුද්ධවූයේ එක්වස්තුකවූයේ ඒකාරම්මණවූයේ යනුයි. (ප්‍රීති සිත් ඇත්තේවෙයි) යනු තුටු සිත් ඇත්තේ හර්ෂසිත් ඇත්තේ ප්‍රහර්ෂ සිත් ඇත්තේ සන්තොෂ සිත් ඇත්තේ උස්ව නැගි ප්‍රීතිය ඇති සිත් ඇත්තේ මොලොක් සිත් ඇත්තේ විශෙෂයෙන් මොලොක් සිත් ඇත්තේ වෙයි යනුයි. ලැබ මිනිසා යමෙක් කැමතිවේද, යන්නෙහි "ලැබ" යනු ලැබ ඊට පැමිණ විඳ, උපදවා ගෙන යන අදහසයි (ii) මිනිසා යනු නරයා මානවකයා පුරුෂයා, පුද්ගලයා, ජීවයා ප්‍රාණියා = සත්ත්වයා මනුජයා යනුයි.

8 "යමෙක් කැමතිවේද," යනු යමක් ආශ්වාදය කෙරේද, යමක් ප්‍රාර්ථනා කෙරේද, යමක් ආශා කෙරේද යම් රූපයක් හෝ ශබ්දයක් හෝ ගන්ධයක් හෝ රසයක් හෝ ස්පර්ශයක් හෝ බලාපොරොත්තුවෙන් කථාකෙරේද මනුෂ්‍යයා කැමති වන දෙය ලැබ යනුයි එහෙයින් භාග්‍යවතුන් වහන්සේ මෙය යනාදීන් වදාළ සේක."

## 1 - 2

1 "කාමය කැමතිවන ඔහුට ඉදින්" යන්නෙහි ඔහුට ඉදින් යනු ඒ ක්ෂත්‍රීයයාට හෝ බ්‍රාහ්මණයාට හෝ වෛශ්‍යයාට හෝ ශුද්‍රයාට හෝ ගිහියාට හෝ පැද්දාට හෝ දෙවියාට හෝ මිනිසාට හෝ යනුයි" කාමය කැමති වන්නාට" යනු කාමය ආශ්වාදය කරුණු ලබන්නාද ප්‍රාර්ථනා කරණු ලබන්නාට ආශා කරණු ලබන්නාට ඒ පිළිබඳ කථා කරණ තැනැත්තාට යනුයි. නොහොත් කාමතෘෂ්ණවෙන් යේද, පමුණුවාද දරාද එක්තැන් කෙරේද යම්සේ හස්තියානයෙන් හෝ ආශ්වයානයෙන් හෝ ගව යානයෙන් හෝ අජ (එළු) යානයෙන් හෝ බැටළුයානයෙන් හෝ ඔටු යානයෙන් හෝ කොටළුයානයෙන් හෝ යේද' එසේම කාම තෘෂ්ණාවෙන් යවාද පමුණුවාද පාකෙරේද හකුළුවාද යනුයි" කාමයෙන් ගමන් කරවන ඔහුට ඉදින් යනුයි. "කැමැත්ත උපන් සත්වයාට යන්නෙහි "කැමැත්ත" නම් කැමැතිදේවලට යම් ඒ කැමැත්තයි කාමරාගය' කාමනන්දිය (කාමයට බැඳීමය)

කාමතෘෂ්ණාව කාමස්නෙහය කාම පරිඩාහය කාම මූර්ච්ඡාව කාමයට බැසගැන්ම කාමඔඝය කාමයොගය කාමූපාදානය කාමච්ඡන්ද නීවරණයයි ඔහුට ඒ කාමච්ඡන්දය ඇතිවූයේවෙයි. විශෙෂයෙන් හටගත්තේවෙයි' නිපන්නේ වෙයි. විශෙෂයෙන් නිපන්නේ වෙයි පහළවූයේ වෙයි.

2 "සත්වයාට" යනු (මෙහි 1, 7 (ii) ඡේදය යෙදිය යුතුයි) " ඒ කාමයෝ පිරිහෙත්." යන්නෙහි ඒ කාමයෝ හෝ පිරිහෙත්. ඔහු හෝ ඒ කාමයන්ගෙන් පිරිහෙයි. කෙසේ ඒ කාමයෝ පිරිහෙත්ද? ඔහු සිටිත්දීම ඒ භෝගයන් රජවරු හෝ ගෙනයත්. සොරු හෝ පැහැර ගණිත්. ගින්න හෝ දවයි. ජලය හෝ පාකරයි. තමන්ට නොකැමති දූ දරුවන් හෝ ගෙනයත්. නිදන්කොට තබන ලද්ද හෝ ණයට දෙන ලද්ද නොලැබෙයි. අයහපත්ව යොදන ලද කර්මාන්තයෝ බිඳීයත්, කුලයෙහි හෝ (කහවණු අඟුරුවීම් ආදිය) ඇතිවෙත් මේ නැතිවීම් අට නිසා හෙතෙම ඒ භොගයන් විසුරුවයි නැසීම කෙරෙයි. වැනසීම කරයි. අටවැන්නාවූ අනිත්‍යතාවයි. මෙසේ ඒ කාමයෝ නැතිවෙත්. පරිහානියට යෙත්. එහිම සිඳෙත්. එහිම වැටෙත්. අතුරුදන් වෙත්. බිඳීයත් කෙසේ ඔහු කාමයන්ගෙන් පිරිහේද? ඒ භොගයන් තිබෙද්දීම හෙතෙම චුතවෙයි. මැරෙයි. අතුරුදහන් වෙයි. බිඳීයයි. මෙසේ හෙතෙම කාමයන්ගෙන් පිරිහෙයි, නැසෙයි, අනතුරට පත්වෙයි. අතුරුදහන් වෙයි. බිඳෙයි.

3 "රජ වරුද සොරුද පැහැර ගණිත්. ගින්න දවයි, නසියි, නැවත මරණයෙන් සියල්ල සමග ශරීරයද අතහරියි. නුවණැත්තේ මේ කරුණ දැන අනුභව කරන්නේය. දෙන්නේය ශක්ති පරිදි දී අනුභවකොට නින්දා නොලැබ ස්වර්ගයට පැමිණෙයි."

4 "ඒ කාමයෝ පිරිහෙත්, හුලකින් විද්දාක්මෙන් වෙනස් වේ. යන්නෙහි යම්සේ අයෝමය හුලකින් හෝ විදිනලද්දේ ඇටවලින් කරණ ලද හුලකින් හෝ ලී වලින් කරණ ලද හුලකින් හෝ විදින ලද්දේ දත්වලින් කරණ ලද හුලකින් හෝ අංවලින් කරණ ලද හුලකින් හෝ විදින ලද්දේ වෙනස් වේද, ගැටේද,

පෙළේද, දොම්නස් වූයේද වෙයි. එමෙන්ම වස්තුකාමයන්ගේ විපරිණාමයෙන් වෙනස්වීමෙන් අනික් ආකාරයකට පැමිණීමෙන් ශොක පරිදෙව දුක් දොම්නස් උපායාසයෝ උපදිත්. හෙතෙම කාම හුලෙන්ද ශොක හුලෙන්ද විදිනලද්දේ වෙනස්වේ. කිපෙයි, ගැටෙයි, පෙළෙයි. දොම්නස් වෙයි.

## 1 - 3

1 "යමෙක් කාමයන් දුරුකෙරේද? යන්නෙහි යමෙක් යනු යමෙක් යම්බඳුවූ, යම්බඳු යෙදුම් ඇති, යම්බඳු කටයුතුවල යෙදුනු, යම්බඳු ප්‍රකාර ඇති යම් තනතුරකට පත්වූ, යම් ධර්මයකින් යුක්තවූ, ක්ෂත්‍රියයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ වෛශ්‍යයෙක් හෝ ශූද්‍රයෙක් හෝ ගෘහස්ථයෙක් හෝ පැවිද්දෙක් හෝ මිනිසෙක් හෝ යනුයි.

2 (i) "කාමයන් දුරු කරයි" යන්නෙහි ප්‍රකට වශයෙන් කාමයෝ දෙකොටසක් වෙත්. (මෙහි 1-1 (ii) ඡේදයේ සිට 3 (i) අවසාන දක්වා යොදන්න.) "කාමයන් දුරු කරයි" යන්නෙහි යටපත් කිරීම් වශයෙන් හෝ නැතිකිරීම් වශයෙන් හෝ කාමය දුරුකරයි. කෙසේ යටපත් කිරීම් වශයෙන් කාමය දුරු කරයිද? කාමයෝ ඇටකටුවකට උපමා ඇත්තේ (ii) අල්පාශ්වාද වශයෙන් බලන්නේ යටපත් කිරීම් වශයෙන් කාමයන් දුරු කරයි. කාමයෝ මස් කැටියක් සමානයයි බහු සාධාරණාර්ථයෙන් බලන්නේ නැති කිරීම් වශයෙන් කාමය දුරු කරයි. කාමයෝ තණ සුලකට බඳු උපමා ඇත්තේ අනුව දවන අර්ථයෙන් බලන්නේ යටපත් කිරීම් වශයෙන් කාමයන් දුරු කරයි. කාමයෝ අඟුරු වලකට උපමා ඇත්තේ මහාපරිදාහාර්ථයෙන් බලන්නේ යටපත් කිරීම් වශයෙන් කාමයෝ දුරු කරයි. (iii) කාමයෝ සිහිනයක් බඳුයයි ස්වල්පයක් වැටහීම් අර්ථයෙන් යටපත් කිරීම් වශයෙන් කාමයන් දුරුකරයි. කාමයෝ ඉල්ලාගත් දෙයක් බඳුයයි තාවකාලිකාර්ථයෙන් බලන්නේ යටපත්කිරීම් වශයෙන් කාමයන් දුරුකරයි. කාමයෝ වෘක්ෂ ඵලයකට බඳු උපමා ඇත්තේයයි අතිශයෙන් බිඳෙයි, කැඩෙයි යන අර්ථයෙන් බලන්නහුට යටපත් කිරීම් වශයෙන් කාමයන් දුරුකරයි. කාමයන් මස්කපන පිහි

හා මස් ලොඹුවමෙනැයි උඩතබා කැපීම් අර්ථයෙන් බලන්නේ යටපත් කිරීම් වශයෙන් කාමයන් දුරු කරයි. කාමයෝ කඩු හා කුරු බඳු උපමා ඇත්තේ විනිවිද යන අර්ථයෙන් බලන්නේ යටපත් කිරීම් වශයෙන් කාමයන් දුරුකරයි.

(iv) කාමයෝ සර්ප හිසකට බඳු උපමා ඇත්තේයයි භය ගෙනදෙන අර්ථයෙන් බලන්නේ යටපත්කිරීම් වශයෙන් කාමයන් දුරුකරයි. කාමයෝ ගිනි කඳකට බඳු උපමා ඇත්තේ යයි උසස් සේ තවන අර්ථයෙන් බලන්නේ යටපත් කිරීම් වශයෙන් කාමයන් දුරුකරයි. බුද්ධානුස්මෘතිය වඩන්නේ යටපත් කිරීම වශයෙන් කාමයෝ දුරුකරයි. ධර්මානුස්මෘතිය වඩන්නේද සංඝානුස්මෘතිය වඩන්නේද, ශීලානුස්මෘතිය ත්‍යාගානු ස්මෘතිය වඩන්නේද, දෙවතානු ස්මෘතිය වඩන්නේද ආණාපාණ ස්මෘතිය වඩන්නේද මරණ සතිය වඩන්නේද කායගතා සතිය වඩන්නේද, උපසමානුස්සතිය වඩන්නේද යටපත් කිරීම් වශයෙන් කාමයන් දුරු කරයි. ප්‍රථම ධ්‍යාන වඩන්නේද යටපත් කිරීම් වශයෙන් කාමයන් දුරු කරයි. ද්විතීයධ්‍යානය වඩන්නේද, තෘතීයධ්‍යානය වඩන්නේද චතුර්ථධ්‍යානය වඩන්නේද ආකාසානඤ්චායතන සමාපත්තිය වඩන්නේද විඤ්ඤානඤ්චායතන සමාපත්තිය වඩන්නේද ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය වඩන්නේද නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තිය වඩන්නේද යටපත් කිරීම් වශයෙන් කාමයන් දුරු කරයි. (v මෙසේ යටපත් කිරීම් වශයෙන් කාමයන් දුරුකරයි. නැතිකිරීම් වශයෙන් කාමයන් කෙසේ දුරු කෙරේද? සෝවාන් මාර්ගය වඩන්නේද අපාය ගමනීයවූ කාමයන් නැතිකිරීම් වශයෙන් දුරුකරයි. සකෘදාගාමි මාර්ගය වඩන්නේද මහත් කාමයන් නැතිකිරීම් වශයෙන් දුරු කරයි. අනාගාමී මාර්ගය වඩන්නේද, සිත තුළවූ කාමයන් නැතිකිරීම් වශයෙන් දුරුකරයි. අරහත් මාර්ගය වඩන්නේද, සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් නිරවශෙෂයෙන් (ඉතිරි නොවන සේ) සියල්ල නසා නැතිකිරීම් වශයෙන් කාමයන් දුරුකරයි.

3 "යමෙක් පයින් සර්ප හිස මෙන් කාමයන් දුරු කෙරේද" යන්නෙහි සර්ප යන්නෙන් "නාගයා" කියනු ලැබේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

කවරාර්ථයෙන් සර්පද කියතොත්, බඩගා යේනුයි සර්ප නම් වේ. වක්ව යේනුයි භුජග නම් වේ. බඩ ගායේනුයි උරග නම්වේ. හිස පහත්කොට යේනුයි 'පන්නග' නම් වේ. හිසින් සයනය කෙරෙනුයි 'සිරිංසප' නම්වේ. බිලයෙහි සයනය කෙරේනුයි " බිලාසය" නම් වේ. ගුහාවෙහි සයනය කෙරේනුයි. 'ගුහාසය' නම්වේ. ඔහුට දළය ආවුධය බැවින් 'දාඨාවුධ' නම්වේ. ඔහුගේ විෂය ඝොර බැවින් ඝොර විෂ නම්වේ. ඔහුගේ දිව දෙකක් බැවින් ද්විජිව්හ නම්වේ. දිව දෙකින් රසය ආශ්වාදනය කෙරේනුයි 'විරසඤ්ඤු' නම්වේ. යම්සේ ජීවත්වීමට කැමති මරණයට අකමැති, සැප කැමති, දුක පිළිකුල් කරණ පුරුෂතෙම පයින් සර්ප හිස දුරුකරන්නේය, ඈත් කරන්නේය. විශෙෂයෙන් ඈත් කරන්නේය. බැහැර කරන්නේය, එමෙන්ම සුව කැමැත්තේ දුකට පිළිකුල් කරන්නේ කාමයන් දුරු කරන්නේය. (මෙහි 3-2 ඡෙදය යෙදිය යුතුයි.)

4 "හෙතෙම මේ විසත්තිකා නම් ලෝකය සිහි ඇතිව ඉක්මවයි." යන්නෙහි "හෙතෙම" යනු යමෙක් කාමය දුරු කෙරේද, හෙතෙමේයි. 'විසත්තිකා යනු තෘෂ්ණාවට නමෙකි. යම්, රාගයක් ඇද්ද, ඇලීමක් ඇද්ද, යම් ළංවීමක් ඇද්ද, යම් රැහැනක් ඇද්ද යම් නන්දි රාගයක් ඇද්ද, යම් බලවත් රාගයක් ඇද්ද යම් ආශාවක් ඇද්ද, බැසගැන්මක් ගිජුවීමක් මඬක් ඇද්ද, (සොලවන්නී) රවටන්නී ජවනිකා (උපදවන්නි) සංජනනී (හටගන්වන්නි) සිබ්බනි (මසන්නි) ජාලිනී (දැල) සවිතා (ගඟ) විසත්තිකා (ඇල්ම) සුත්තං (නූල) විසතා (පැතිරෙන්නී) ආයුගනි (රැස්කරන්නී) දෙවැනි උත්පත්තියක් දෙන්නී, පිහිටුවන්නී, භවයට යවන්නී, වනය වනථය, එක්වීම, ස්නේහය, අපෙක්ෂාව, බැම්ම, ආශාව බලාපොරොත්තුව, රූපාශාව, ශබ්ද, ගන්ධ රස ස්පර්ශාසාව, ධනාසාව පුත්‍රාසාව ජීවිතාශාව. ජප්පනා (දොඩවන්නී) ජප්පිතන්ත පුච්ඡඤ්ජිකත සාධුකම්‍යතා යන නම වලින් ප්‍රකට තෘෂ්ණාව, ලොලු (ලොල්බව) ලොලුප්පායන, ලොලුප්පායිතන්ත, අධර්ම රාගය, විෂම ලෝභය, නිකන්තිය, නිකාමනය, ප්‍රාර්ථනය ප්‍රිය කිරීම, දැඩි ප්‍රාර්ථනය, කාම තෘෂ්ණාව, භව තෘෂ්ණාව, රූප තෘෂ්ණාව, අරූප තෘෂ්ණාව,

නිරෝධ තෘෂ්ණාව, ශබ්ද තෘෂ්ණාව, ගන්ධ තෘෂ්ණාව, රස තෘෂ්ණාව, ස්පර්ශ තෘෂ්ණාව, ධම්මතෘෂ්ණාව, ඕඝය, යොගය, ගන්ථය, උපාදානයා ආවරණය, නීවරණය, වැසීම, බන්ධනය, කිලුට, ඉතිරිවූ ආසාව මැඩගෙන සිටීම්, බලවත් කැමැත්ත, දුකට මුල, දුකට නිදානය දුක්ඛ ප්‍රභවය, මාර පාශය, මාර බිලිය, මාර විෂය, තෘෂ්ණා ගංගාව, තෘෂ්ණා දැල, තෘෂ්ණා දම්වැල, තෘෂ්ණා සමුද්‍රය, විෂමලොභය, අකුශලමූලය

5 "විසත්තිකා" යනු කවරාර්ථයෙන් විසත්තිකා නම් වේද? පැතුරුණු අර්ථයෙන් විශාලාර්ථයෙන් විසිරීම් අර්ථයෙන් ගොදුර අල්ලාගන්නා අර්ථයෙන් විෂ ප්‍රකාශ කරණ අර්ථයෙන්, විෂමූලාර්ථයෙන්, විෂඵලාර්ථයෙන් විෂ පරිභොගාර්ථයෙන් විසත්තිකා නම් වේ. විශාලවූ ඒ තෘෂ්ණාව රූපයෙහිද, ශබ්දයෙහිද, ගන්ධයෙහිද, ස්පර්ශයෙහිද, කුලයා කෙරෙහිද ගණයා කෙරෙහිද, ආවාසයෙහිද, ලාභයෙහිද, යසසෙහිද ප්‍රශංසායෙහිද, සැපතෙහිද, චීවරයෙහිද, පිණ්ඩපාතයෙහිද, සෙනාසනයෙහිද, ගිලන්පස බෙහෙත් පිරිකරෙහිද, කාම ධාතුයෙහිද, රූප ධාතුයෙහිද කාමභවයෙහිද, රූප භවයෙහිද, අරූප භවයෙහිද, සංඥා භවයෙහිද, අසංඥා භවයෙහිද, නෙවසංඥානාසංඥා භවයෙහිද එකවොකාරභවයෙහි (අසඤ්ඤසත්ත) චතුවොකාර භවයෙහි (අරූප ලෝකවලද) පඤ්චවොකාර භවයෙහි (ස්කන්ධ පහ ඇති ලෝකවලද) අතීතවූද අනාගතවූද වර්තමානවූ ද දැක, ඇසූ, නාසය, දිව, සිරුර යන මෙයින් ස්පර්ශ කරණ ලද දතයුතු ධර්මයෙහි 'විස්තෘත' නුයි පැතිරේනුයි විසත්තිකා නමි.

"ලෝකයෙහි" යනු අපාය ලෝකයෙහි මනුෂ්‍යලෝකයෙහි දිව්‍ය ලෝකයෙහි ස්කන්ධලෝකයෙහි ධාතු ලෝකයෙහි, ආයතන ලෝකයෙහි යනුයි.

6 "සිහි ඇතිව" යනු කරුණු සතරකින් සිහි ඇත්තේය. යනුයි කායෙහි කය අනුව බැලීම, වේදනාවන්හි චිත්තයෙහි, ධර්මයන්හි ධර්මය අනුව බැලීමෙන් සිහිය පිහිටුවීම වඩන්නේ සිහි ඇත්තේ නම්, අනිකුදු කාරණයකින් සිහි ඇත්තේ සිහිනැති

බව දුරුකරණබැවින් සිහි ඇතිකරණ ධර්මයන් කරණලද බැවින් සිහියට විරුද්ධ ධර්මයන් දුරුකරණ ලද බැවින් සිහියට නිමිතිවූ ධර්මයන් සිහිකළ බැවින්ද, සිහි ඇත්තේ නම්. අනිකුදු සතර කාරණයකින් සිහි ඇත්තේ නම්. සිහියෙන් යුක්තවූ බැවින් සිහියෙන් විසූ බැවින් හෝ (ගතකළ) බැවින්, සිහියෙන් ප්‍රගුණකළ බැවින් සිහියෙන් හේතු වශයෙන් නොනැංවූ බැවින් යනුයි.

7 අනිකුදු සතර කාරණයකින් සිහි ඇත්තේ නම් ඇදුන බැවින් ශාන්ත බැවින් හික්මුණ බැවින්, ශාන්ත ධර්මයන්ගෙන් යුක්ත බැවින් බුද්ධානුස්මෘතියෙන් යුක්ත බැවින්, ධර්මානුස්මෘතියෙන් යුක්ත බැවින්, සංඝානුස්මෘතියෙන් යුක්ත බැවින්, ශීලානුස්මෘතියෙන් යුක්ත බැවින් ත්‍යාගානුස්මෘතියෙන් යුක්ත බැවින් දෙවතානුස්මෘතියෙන් යුක්ත බැවින්, ආණප්‍රාණානුස්මෘතියෙන් යුක්ත බැවින්, මරණානුස්මෘතියෙන් යුක්ත බැවින්, කායගතා සතියෙන් යුක්ත බැවින් උපශමානුස්මෘතියෙන් යුක්ත බැවින්, යම් සිහියක් සිහි කෙරේද අනුව සිහිකෙරේද සිහිය සිහිකිරීම් අර්ථයෙන් දැරීම් අර්ථයෙන් නොඉල්පීම් අර්ථයෙන් මුළා නොවන අර්ථයෙන්ද සිහිය සතින්ද්‍රියය සතිබලය සම්‍යක් ස්මෘතිය සතිසම්බොජ්ඣංගය එකායන මාර්ගය යන අර්ථයෙන් මෙය සතියයි කියනු ලැබේ. මේ සිහියෙන් යුක්තවූයේ වෙයි. සමන්තාගත වූයේ යුක්තවූයේ මනාකොට පැමිණියේ වෙයි. හටගත්තේ මනාකොට හටගත්තේ යුක්තවූයේ වේද, හෙතෙමේ සිහි ඇත්තේයයි කියනු ලැබේ.

8 "හෙතෙම මේ විසත්තිකා නම් ලොකය සිහි ඇත්තේ ඉක්මවයි" යන්නෙහි ලෝකයෙහි මේ විස්තතිකාව, ලෝකයෙහි මේ ඇල්ම ඇති කරණ ධර්මය එතරවෙයි, මනාකොට තරණය කරයි, පිහිනායයි, ඉක්මවයි, පහකරයි.

## 1 - 4

1 කෙත්වතු රන් හෝ යන තන්හි කෙත් නම් ඇල්කෙත, වීකෙත, මුංකෙත, මෑකෙත, යවකෙත, තිරිඟු කෙත, තලකෙත යන ආදී යම් ඒ කෙතක් යනුයි. ගෙවතු කොටුවතු පෙරවතු

පසුවතු ආරාමවතු විහාරවතු යන මේවා වෙනි. "හිරඤ්ඤ" යන්නෙහි හිරඤ්ඤයයි කහවණුවලට කියයි.

2 "ගව අශ්වදාස පුරුෂයෝ යන තන්හි "ගව" යන්නෙන් ගවයෝ කියත්. "අස්සා" යන්නෙන් අශ්වාදී සෙසු තිරිසනුන් කියත්. "දාසා" යනු දාසයෝ සතරදෙනෙක් වෙති. ඇතුළත උපන් දාසය ධනයෙන් (මිළදී ගන්නාලද දාසයා, තෙමේ හෝ දාසකමට පැමිණි දාසයා නොකැමැත්තෙන් හෝ දාසකමට පැමිණි දාසයාද යන මොහුයි.

3 "එකෙක් දාසිය ගෙන් (ඉපද) දාසයෝ වෙති. ධනයෙන් මිළදී ගන්නාලද දාසයෝද වෙති කෙනෙක් තෙමේද දාසකමට පැමිණෙත්. භයක් ඇතිවූවෝද දාසයෝ වෙත්. පුරුෂයෝ යනු පුරුෂයෝ තිදෙනෙක් වෙත්. බැළමෙහෙ කරන්නෝය. කම්කරුවෝය. සමග ජීවත් වන්නෝය යනුයි. (ii) ස්ත්‍රීහු නෑයෝ බොහෝ කාමයෙන් යන්නෙහි ස්ත්‍රීහු යන්නෙන් අයිති ස්ත්‍රිය කියයි. "බන්ධු යනු නෑයෝ සතර දෙනෙක් වෙති. ඥාති සම්බන්ධයෙන් බන්ධුහුය, ගෝත්‍ර සම්බන්ධයෙන් බන්ධුහුය. මන්ත්‍ර සම්බන්ධයෙන් බන්ධුහුය. ශිල්ප සම්බන්ධයෙන් බන්ධුය යන මොහු වෙති. බොහෝ කාමයන් යනු මොව්හු බොහෝ කාමයෝයි. එනම් ප්‍රිය වඩන රූපයෝය (මෙහි 1, 1 (ii) ඡෙදය සිට 3 (i) ඡෙදය අවසාන දක්වා යෙදිය යුතුයි) "යම් මිනිසෙක් එහි ගිජුවේද, යන්නෙහි යමෙක් යනු යම්බඳු එසේ යෙදුණු, යම් ප්‍රකාරයකට පත් යම් ස්ථානයකට පත් යම් ධර්මයකින් යුක්තවූ ක්ෂත්‍රියයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ වෛශ්‍යයෙක් හෝ ශූද්‍රයෙක් හෝ ගෘහස්ථයෙක් හෝ ප්‍රව්‍රජිතයෙක් හෝ දෙවියෙක් හෝ මිනිසෙක් හෝ යනුයි. මිනිසෙක් යනු (මෙහි 1, 7 (ii) ඡෙදය යොදා ගත යුතුයි. "අනුගිජ්ඣති" යනු ක්ලෙශකාමයන් නිසා වස්තුකාමයන්හි ගිජුවෙයි, එහි ගැලෙයි නැවත නැවතත් ගිජුවෙයි.

4 "දුර්වල ක්ලෙශයෝ ඔහු මඩිත්." යන්නෙහි "දුර්වල" යනු දුර්වල ක්ලෙශයෝයි. ස්වල්ප බලඇති ස්වල්ප ශක්ති ඇති හීනවූ, නිහීනවූ, පිරිහුණාවූ, පහත්වූ, ලාමකවූ, අල්පවූ ස්වල්පවූ

යනුයි. යමෙකුට ශ්‍රද්ධාබලය වීයර්‍ය බලය ස්මෘති බලය සමාධි බලය, ප්‍රඥා බලය, හිරි බලය, ඔත්තප්ප බලය නැද්ද යටකී ක්ලෙශයෝ ඒ පුද්ගලයා උසුලත්, විශෙෂයෙන් උසුලත්, යටත් කෙරෙත්, වටකෙරෙත්, මඩිත්. මෙසේද දුර්වල කෙලෙස් ඔහු යටකර ගණිත් (ii) උපද්‍රවයෝ ඔහු මඩිත් යන්නෙහි උවදුරු යනු උවදුරු දෙකක් වෙත්. ප්‍රකට උවදුරුද අප්‍රකට උවදුරුද යනුයි. ප්‍රකට උවදුරු කවරේද? සිංහයෝය, ව්‍යාඝ්‍රයෝය, දිවියෝය, වලස්සුය, කලුහිස් වලස්සුය, වෘකයෝය, (මහීෂ) මීමුය ඇත්තුය, සර්ප ජාතිහුය පැත්තෑයෝය යම් දෙයක් කරණ ලද හෝ නොකරණ ලද සොරු හෝ සාමාන්‍ය මිනිස්සු හෝ වෙති (ii) ඇස් රෝගය, කන්රෝගය, නාසයේ රෝගය, දිවේ රෝගය, කයේ රෝගය, ශීර්ෂ (හිසේ) රෝගය කන් රෝගය, මුඛ රෝගය, දත් රෝගය, කාය ක්ෂයය පීනසය, දැවිල්ලය, උණ රෝගය, කුසේ රෝගය, මුර්ච්ඡාව, අතීසාරය, කොළරාව, කුෂ්ට, ගඩු, සුදු කබර ස්වාශ මීමැස්මොර, දද, විතච්ජිකා නම් කුෂ්ට රෝගය, මධු මෙහය, පක්ෂාඝාතය, පිළිකා රෝගය, භගන්ධරා නම් රෝගය, පිතින් හටගත් රෝගයෝය. සෙමින් හටගත් රෝගයෝය, වාතයෙන් හටගත් රෝගයෝය, සන්නිපාත රෝගයෝය, ඍතු පරිවර්තනයෙන් ඇතිවන රෝගයෝය, විෂම පැවතුම් වලින් හටගත් රෝගයෝය, උපක්‍රමයෙන් හටගත් රෝගයෝය, කර්ම විපාකයෙන් හටගත් රෝගයෝය. ශීතලය, උෂ්ණය, බඩ ගින්නය, පිපාසය මල මුත්‍ර ගමනය ඩැහැලේ බොන මැස්සෝය මදුරුවෝය අව්සුලං බඩගානා සත්තු යන මොවුන්ගෙන් ඇතිවන රෝගයෝය යන මේවා ප්‍රකට උවදුරුවෙති.

5 අප්‍රකට උවදුරු කවරේද? කායදුශ්චරිත වචීදුශ්චරිත මනො දුශ්චරිත, කාමච්ඡන්ද නීවරණය ව්‍යාපාදනීවරණය ථිනමිද්ධනීවරණය උද්ධච්ච කුක්කුච්චනීවරණය විචිකිච්ඡා නීවරණය රාගය ද්වෙෂය මොහය ක්‍රොධය බද්ධ වෛරය අනුන්ගේ දොස්කීම, ඊර්ෂ්‍යාව, මසුරුකම, රැවටිල්ල, කෛරාටිකකම තදගතිය එකට එක කිරීම මාන්නය අතිමාන්නය මදය ප්‍රමාදය සියලු කෙළෙස් සියලු දුසිරිත් සියලු දාහයෝ

සියලු තැවීම් සියලු අකුශලාභි සංස්කාර (රැස්වන අකුශලයෝ) මේවා අප්‍රකට උවදුරු නම් වෙති. උවදුරු යන්නෙහි කවරාර්ථයෙන් උවදුරු නම් වෙත්ද? මැඩපවත්වන අර්ථයෙන් උවදුරු නම් වෙත්. පිරිහීමට පත්වේනුයි උවදුරු නම් වෙත්. වාසස්ථානවන අර්ථයෙන් උවදුරු නම් වෙත්. ඒ උවදුරු යටකී පුද්ගලයා යට කෙරෙත්. වට කෙරෙත් මැඩපවත්වත්.

**6** කෙසේ උවදුරු පිරිහීම පිණිස පවතිද්ද යත්. ඒ උවදුරු කුශලධර්මයන්ගේ අන්තරාය පිණිස පිරිහීම පිණිස පවතිත්. කවර කුශල ධර්මයන්ගේද සම්‍යක් ප්‍රතිපදාව පිණිස අනුලොම ප්‍රතිපදාව පිණිස' අපච්චනික (එකඟ) ප්‍රතිපදාව පිණිස අවිරුද්ධ ප්‍රතිපදාව පිණිස අත්වර්ථ ප්‍රතිපදාව පිණිස ධර්මානු ධර්ම ප්‍රතිපදාව පිණිස ශීලයන් සම්පූර්ණ කිරීම පිණිස ඉන්ද්‍රියයන්හි වසන ලද දොරවල් ඇතිවීම පිණිස භොජනයෙහි පමණ දැනීම පිණිස නිදිවර්ජිත කිරීම පිණිස සිහිනුවණ ඇතිවීම පිණිස සතර සතිපට්ඨානයන්ගේ භාවනානුයෝගය (පුරුදු කිරීම) පිණිස සතර ඍද්ධිපාදයන්ගේ භාවනානුයෝගය පිණිස පඤ්චෙන්ද්‍රියයන්ගේ භාවනානුයෝගය පිණිස පඤ්චබලයන්ගේ භාවනානුයෝගය පිණිස සප්තබොධ්‍යංගයන්ගේ භාවනානු යෝගය පිණිස ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයේ භාවනානු යෝගය පිණිස මේ කුශල ධර්මයන්ගේ අන්තරාය පිණිස පිරිහීම පිණිස පවතිත් මෙසේ උවදුරු පිරිහීම පිණිස පවතිත් යනුයි.

**7** කෙසේ ඒ උවදුරු එහි වාසස්ථාන වෙද්ද යත්. එහි ඒ ආත්මභාවය ආශ්‍රය කොට ඇති ලාමක අකුශල ධර්මයෝ උපදිද්ද, යම්සේ බිලයෙහි බිලය ආශ්‍රයකොට ඇති ප්‍රාණයෝ සයනය කෙරෙද්ද ජලයෙහි ජලය ආශ්‍රයකොට ඇති ප්‍රාණීහු සයනය කෙරෙද්ද වනයෙහි වනය ආශ්‍රය කොට ඇති ප්‍රාණීහු සයනය කෙරෙද්ද එපරිද්දෙන්ම එහි ඒ ආත්මභාවය ආශ්‍රයකොට ඇති ලාමක අකුශල ධර්මයෝ උපදිත්. මෙසේද උවදුරු එහි සයනය කෙරෙත් යනුයි. භාග්‍යවතුන්වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේමය. මහණෙනි, අන්තෙවාසිකයන් ඇති ගුරුන් ඇති භික්ෂුව දුකසේ අපහසුසේ වෙසෙයි. මහණෙනි, කෙසේ නම් අන්තෙ වාසිකයන් ඇති ගුරුන් ඇති භික්ෂුව දුකසේ අපහසුසේ

වෙසෙද්ද මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුවට ඇසින් රූපය දැක රාගයට හේතුවූ සංයෝජනීයවූ යම්බඳු ලාමක අකුශල ධර්මයෝ උපදිද්ද. ඒ අකුශල ධර්මයන් ඔහුගේ අභ්‍යන්තරයෙහි වෙසෙද්ද ඔහු අනුව වෙසෙත්ද්ද එහෙයින් සාන්තෙවාසිකයයි කියයි. ඒ අකුශල ධර්මයෝ ඔහු යට කෙරෙත්. ඒ ලාමකවූ අකුශල ධර්මයෝ ඔහු හෝ යට කෙරෙත්. එහෙයින් සාචරියකයයි කියනු ලැබේ. නැවතද මහණෙනි, භික්ෂුව කණින් ශබ්දය අසා නැහැයෙන් සුවඳ ආඝ්‍රානයකොට දිවෙන් රසය ආශ්වාදනය කොට කයින් ස්පර්ශය ස්පර්ශකොට සිතින් ධර්මය දැන යම්බඳුවූ ලාමකවූ රාගය ඇතිකරන්නාවූ සංයෝජනීයවූ අකුශල ධර්මයෝ උපදිද්ද ඒ අකුශල ධර්මයෝ ඔහුගේ අභ්‍යන්තරයෙහි වෙසෙත්. එහෙයින් සාන්තෙවාසිකයයි කියනු ලැබේ. (සාචරියක) යනුද පෙරසේමය.

8 මහණෙනි, මෙසේ වනාහි භික්ෂුව අත වැස්සන් සහිත වූයේ ඇදුරන් සහිත වූයේ දුකසේ අපහසුසේ වෙසෙයි. මෙසේද එහි සයනය කෙරේනුයි උවදුරු නම් වෙත්. භාග්‍යවතුන්වහන්සේ මේ වදාරණ ලදී මහණෙනි, මේ අතරෙහිවූ ක්ලෙශයෝ අතරෙහිවූ සතුරෝ අතරෙහිවූ විරුද්ධකාරයෝ අතරෙහිවූ වධකයෝ අතරෙහිවූ පස මිතුරෝ තුන්දෙනෙක් වෙති. ඒ කවර තුන්දෙනෙක්ද යත්. මහණෙනි, ලොභය අතරෙහිවූ ක්ලෙශයෙක. මහණෙනි, ද්වෙෂය අතරෙහිවූ ක්ලෙශයකි. මොහය අතරෙහිවූ ක්ලෙශයකි. මහණෙනි, මේ තුන අතරෙහිවූ සතුරෝ වෙති.

9 "ලොභය අනර්ථය ඇති කරන්නෙකි. ලොභය සිත ප්‍රකෝප කරවන්නෙකි ලොභය අතුරෙහි භය ඇති කරවන්නකි. ඇතිවී තිබෙන එය ජනතෙමේ අවබොධ නොකරයි" ලොභීවූ තැනැත්තේ හොඳ නොහොඳ නොදනියි. ලෝභීවූ තැනැත්තේ ධර්මය නොදනියි යම් ලොභයක් මිනිසා යටකර ගනීද එකල්හි (හෙතෙම) අන්ධවූයේ වෙයි. ද්වෙෂය අනර්ථය ඇතිකරවන්නකි. ද්වෙෂය සිතකෝප කරවන්නෙකි අතරෙහි ඇතිවූ බියකි. එය සත්වතෙම අවබොධ නොකරයි.

10 කිපියේ හොඳ නොහොඳ නොදනියි. කිපියේ ධර්මය නොදකියි. යම් කොටසකින් මිනිසා යට කෙරේද එකල්හි (හෙතෙම) අන්ධවූයේ වෙයි. මොහය අනර්ථය ඇති කරවන්නකි. මොහය සිත ප්‍රකොප කරවන්නකි. අතරෙහි ඇතිවූ බියකි. එය සත්වතෙම අවබොධ නොකරයි. මුලාවූ තැනැත්තේ හොඳ නොහොඳ නොදනියි. මුලාවූ තැනැත්තේ ධර්මය නොදකියි. යමෙක් මොහය දරාද එකල්හි අන්ධවූයේවේ.

11 (i) භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලදී. මහරජ, පුරුෂයාගේ (ii) අහිත පිණිස දුක් පිණිස අපහසු විහරණය පිණිස ධර්ම තුනක් අධ්‍යාත්මයෙහි උපදින්නාහු උපදිත්. ඒ කවර තුනක් ද යත්, මහරජ, පුරුෂයාගේ අහිත පිණිස දුක් පිණිස අපහසු විහරණය පිණිස (iii) ලොභය නමැති ධර්මය අධ්‍යාත්මයෙහි උපදින්නේ උපදී. මහරජ පුරුෂයාගේ (මෙහි මේ ඡෙදයේ (ii) යෙදිය යුතුයි) ද්වෙෂය නමැති ධර්මය අධ්‍යාත්මයෙහි උපදින්නේ උපදී. මහරජ පුරුෂයාගේ අහිත පිණිස දුක් පිණිස අපහසු විහරණය පිණිස මොහය නමැති ධර්මය අධ්‍යාත්මයෙහි උපදින්නේ උපදී. "තමා තුළ පහළවූ ලොභයද, ද්වෙෂයද, මොහයද, යන පාප චෙතනාවෝ එයට වසඟවූ පුරුෂයාට හිංසා කෙරෙත්. ඵලය හරය නසන්නාක් මෙනි." මෙසේද එහි සයනය ඇත්තෝ පරිශ්‍රය (උවදුරු) නම්. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණලදී.

12 (i) "රාගයද ද්වෙෂයද මෙය (ලොභය) නිදානකොට ඇත්තේය. අරතියද (කලකිරීම) රතියද (ඇල්ම) මෙයින්ම හටගත්තේය. මනෝ විතර්කයෝ මෙයින් හටගෙන බාලයන් කවුඩුවකු මෙන් එහාමෙහා අදිත්." මෙසේද එහි සයනය ඇත්තෝ පරිශ්‍රය (-උවදුරු) නම් (ii) ඒ උවදුරු ඔහු මඩිත්." යන්නෙහි ඒ උවදුරු ඒ පුද්ගලයා යට කෙරෙත්. වසඟයට ගණිත්. මැඩ පවත්වත්. වසාගෙන පැතිරෙත් හාත්පසින් ගණිත්. මඩිත්. එහෙයින් උවදුරු ඔහු මඩිත් "ඒ හේතුවෙන් ඔහු දුක අනුවයයි" යන්නෙහි ඒ උවදුරුවලින් ඒ පුද්ගලයා දුක ලුහුබඳියි. පසුපස්සේ යයි. අනුව යයි. (iii) ජාති දුක ලුහුබඳියි. පසුපස්සේ යයි අනුව යයි. ජරා දුක, ව්‍යාධි දුක, මරණ දුක, ශොක පරිදෙව,

දුක්ඛදොමනස්ස උපායාස දුක, නෙරයික දුක, තිරිසන් යොනියෙහි දුක, ප්‍රේත විෂයෙහි දුක, මානුෂික දුක, ගර්භයට පැමිණීමේ දුක, ගර්භයෙහි සිටීමේ දුක, ගර්භයෙන් නැගිටීමේ දුක, උපන්නහුට වධ බන්ධනාදියෙන් ඇතිවන දුක, උපන්නහුට අනුන්ගෙන් ඇතිවන දුක, තමාගේ උපක්‍රමවලින් ඇතිවන දුක, අනුන්ගේ උපක්‍රමවලින් ඇතිවන දුක, දුක්ඛ නම්වූ දුක, සංස්කාර දුක, විපරිණාම දුක ඇස් රෝග (මෙහි 4-4 (iii) ඡේදය යෙදිය යුතුයි) මවගේ මරණයෙන් ඇතිවන දුක පියාගේ මරණයෙන් ඇති වන දුක, සහෝදරයාගේ මරණයෙන් ඇතිවන දුක, සහෝදරියගේ මරණින් ඇතිවන දුක, පුත්‍රයාගේ මරණයෙන් ඇතිවන දුක, දුවගේ මරණයෙන් ඇතිවන දුක, ඥාති ව්‍යසනයෙන් ඇතිවන දුක, භොග විනාශයෙන් ඇතිවන දුක, රොග ඇතිවීමෙන් ඇතිවන දුක, සීල ව්‍යසනයෙන් ඇතිවන දුක-දෘෂ්ටි ව්‍යසනයෙන් ඇතිවන දුක, (මේ සෑම දුක යන තැන් අගට ලුහුබඳියි. පසුපස්සේ යයි අනුව යයි කියා යොදාගත යුතුයි.)

13 "බිඳුණ නැවට ජලය ඇතුළුවෙයි" යන්නෙහි, යම්සේ බිඳුණු නැවට ජලය ඇතුළු වන්නේද, ඒ හේතුවෙන් ජලය ලුහුබඳියි. පසුපස්සේ යයි. අනුව යයි. පෙර පසින්ද ජලය ලුහුබඳියි. පසුපසින්ද යට පසින්ද බලන්නේද ජලය ලුහුබඳියි. එමෙන්ම ඒ ඒ උවදුරුවලින් ඒ පුද්ගලයා දුක ලුහුබඳියි අනුව යයි. පසුපස්සේ යයි ජාති දුක මෙහි 12 (iii) යොදා ගත යුතුයි දෘෂ්ටි ව්‍යසන දුක ලුහුබඳියි. අනුව යයි. පසුපස්සේ යයි

## 1 - 5

14 එහෙයින් සත්වතෙමේ හැමකල්හි සිහි ඇත්තේ යන්නෙහි, එහෙයින් ඒ කාරණයෙන් ඒ හේතුවෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් කාමයන්හි මේ ආදීනවය බලන්නේ ජන්තු යනු සත්වයා (මෙහි 1, 7 (ii) යෙදිය යුතුයි.) සදා යනු සැමකල්හි සියලු දිනයන්හි, සියලු කාලයෙහි, නිත්‍ය කාලයෙහි ධ්‍රැව කාලයෙහි, අවිච්ඡෙකවම, ඊතලයෙන් ඊතලය සේම, දිය

රැල මෙන්වූ ස්පර්ශ කරණලද අතරක් නැති පරම්පරාව මෙන්වූ කාලයෙහි පෙර බත් කාලයෙහි පසු බත් කාලයෙහි පෙරයමෙහි පසුයමෙහි, ආලොකය ඇති කල්හි වර්ෂායෙහි, හිම කාලයෙහි ග්‍රීෂ්ම කාලයෙහි බාල කාලයෙහි මධ්‍යම කාලයෙහි වයස් කාලයෙහි පසු වයස් කාලයෙහි යනුයි.

15 "සිහි ඇත්තේ" යනු කාරණ සතරකින් සිහි ඇත්තේ, කයෙහි කය අනුව බලන සිහිය පිහිටුවීම බලන්නේ සිහි ඇත්තේ වේදනාවන්හි වේදනාව අනුව බලන සිතෙහි සිත අනුව බලන ධර්මයෙහි ධර්මය අනුව බලන සතිපට්ඨානය වඩන්නේද සිහි ඇත්තේ අනිකුදු සතර කාරණයකින් සිහි ඇත්තේ (මෙහි (1-3) 5 (ii) ඡේදය යෙදිය යුතුයි.) "කාමයන් දුරු කරන්නේය" යන්නෙහි කාමා යනු ප්‍රකට වශයෙන් කාම දෙකකි වස්තු කාම ක්ලෙශ කාම යන දෙකයි. මොවුහු වස්තු කාමයෝ වෙති. (මෙහි 1, 1 (ii) සහ 2 (i) ඡේද යෙදිය යුතුයි.) මොවුහු ක්ලෙශ කාමයෝ වෙති.

16. කාමයන් දුරුකරන්නේය. යන්නෙහි කරුණු දෙකකින් කාමයන් දුරු කරන්නේය යටපත් කිරීම් වශයෙන්ද නැතිකිරීම් වශයෙන්ද යනුයි. යටපත් කිරීම් වශයෙන් කෙසේ කාමයන් දුරු කෙරේද්ද, රස නැති හෙයින් කාමයෝ ඇටකටුවක් සමානය (මෙහි (1-3) 2 (ii) ඡේදය යෙදිය යුතුයි.) මෙසේ යටපත් කිරීම් වශයෙන් කාමයන් දුරු කරන්නේය. (මෙහි (1-3) 2 (iii) (iv) යෙදිය යුතුයි) මෙසේ නැතිකිරීම් වශයෙන් කාමයන් දුරුකරන්නේය.

17 (i) "ඒ කාමයන් දුරුකොට කාමයන් දුරුකරන්නේය" යන්නෙහි වස්තු කාමයන් විශෙෂයෙන් දැන ක්ලෙශ කාමයන් හැර දුරුකොට (ii) නසා, විනාශකොට නූපදනා තත්වයට පමුණුවා, කාමච්ඡන්ද නීවරණය, ව්‍යාපාද නීවරණය, ථීනමිද්ධ නීවරණය-, උද්ධච්ච කුක්කුච්ච නීවරණය (මෙහි (1-4) 5 (ii) යෙදිය යුතුයි) (iii) කාමොඝය, දිට්ඨොඝය, අවිජ්ජොඝය, එතර වන්නේය. තරණය කරන්නේය. පිහිනා යන්නේය ඉක්මවන්නේය.

18. "නැව සැහැල්ලුකොට පරතෙරට" යන්නෙහි යම්සේ බරවූ නැව දිය සිඳ ඉස හැර සැහැල්ලු නැවෙන් වහා ශීඝ්‍රයෙන් ඉක්මණින්ම පරතෙරට යන්නේය. එමෙන්ම වස්තු කාමයන් හැඳින ක්ලෙශ කාමයන් හැර දුරුකොට (මෙහි 17 (iii) ඡෙදය යෙදිය යුතුයි) මෙහි පරතෙරයයි කියන ලද අමෘතවූ නිර්වාණයට කියන්නේය.

යම්බඳු සියලු සංස්කාරයන් සංසිඳවීමක් වේද, සියලු ක්ලෙශයන් බහා තැබීමක් වේද, තෘෂ්ණාවගේ ගෙවීමක් වේද විරාගයක් වේද නිරොධයක් වේද ඒ නිර්වාණයයි. පරතෙරට යන්නේය යනු පරතෙරට ගමන් කරන්නේය පරතෙර ස්පර්ශ කරන්නේය. පරතෙර ප්‍රත්‍යක්ෂ කරන්නේය. පාරගු යනු යමෙක් වනාහි පරතෙරට යනු කැමැත්තේද හෙතෙමේද පාරගු නම් වේ. යමෙක් වනාහි පරතෙරට යේද හෙතෙම පාරගු නම්වේ. යමෙක් වනාහි පරතෙරට ගියේද හෙතෙම මේද පාරගු නම්වේ. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලදී.

19 "තරණය කළාවූ පාරගතවූ බ්‍රාහ්මණයා ගොඩසිටියි." බ්‍රාහ්මණ යනු මහණෙනි, රහතුන් වහන්සේට මේ නමකි. උන්වහන්සේ දැනගතයුතු දෙයෙහි එතරට ගියේ පිරිසිඳ දතයුතු දෙයෙහි එතරට ගියේ, ප්‍රහාණය කටයුතු දෙයෙහි එතරට ගියේ භාවනාවෙහි එතරට ගියේ ප්‍රත්‍යක්ෂ කටයුතු දෙයෙහි එතරට ගියේ සමාපත්තියෙහි එතරට ගියේ සියලු ධර්මයන් දැන එතරට ගියේ සියලු දුක් පිරිසිඳ දැන එතරට ගියේ සියලු කෙලෙස් ප්‍රහාණයකොට එතරට ගියේ සිවු ආර්‍ය්‍ය මාර්ග භාවනාවෙන් ප්‍රත්‍යක්ෂ කිරීමෙන් එතරට ගියේ නිරොධයාගේ එතරට ගියේ සියලු සමාපත්තීන් සමාපත්තියෙන් එතරට ගියේ උන්වහන්සේ ආර්‍ය්‍ය ශීලයෙහි වශීප්‍රාප්ත වූයේ පරතෙර ගියේ වෙයි. ආර්‍ය්‍ය සමාධියෙහි (i) වශීප්‍රාප්තවූයේ සමාධිප්‍රාප්තවූයේ වෙයි. ආර්‍ය්‍ය ප්‍රඥාවෙහි වශී ප්‍රාප්තවූයේ සමාධි ප්‍රාප්තවූයේ වෙයි. ආර්‍ය්‍ය විමුක්තියෙහි වශී ප්‍රාප්තවූයේ පාරමී ප්‍රාප්තවූයේ වෙයි. උන්වහන්සේ එතරට ගියේ පාරප්‍රාප්තවූයේ අන්තයට ගියේ කෙළවරට ගියේ කොටිප්‍රාප්තවූයේ පර්‍ය්‍යන්තයට ගියේ, පර්‍ය්‍යන්ත

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රාප්තවූයේ අවසනට ගියේ, අවසාන ප්‍රාප්තවූයේ රක්ෂාස්ථානයට ගියේ රක්ෂාස්ථාන ප්‍රාප්තවූයේ ආරක්ෂාවට ගියේ ආරක්ෂාප්‍රාප්තවූයේ සරණ ගතවූයේ සරණ ප්‍රාප්තවූයේ අභය ගතවූයේ අභයප්‍රාප්තවූයේ, අච්‍යුතගතවූයේ අච්‍යුත ප්‍රාප්තවූයේ අමෘතයට ගියේ අමෘතප්‍රාප්තවූයේ, නිර්වාණයට ගියේ නිර්වාණප්‍රාප්තවූයේ උන්වහන්සේ වැස නිමවූයේ හැසිරීම නිමවූයේ ගමන අවසන් කළේ සතුරන් අවසන් කළේ කෙළවරට ගියේ පාලනය කරණ ලද බඹසර ඇත්තේ උත්තම දෘෂ්ටිප්‍රාප්තවූයේ වඩන ලද මාර්ග ඇත්තේ ප්‍රහීණ ක්ලෙශයන් ඇත්තේ නොවෙනස් අවබොධය ඇත්තේ ප්‍රත්‍යක්ෂ කරණ ලද නිරොධය ඇත්තේ උන්වහන්සේ දුක අවබොධ කරගත්හ. සමුදය (තෘෂ්ණාව) ප්‍රහීණ කළසේක. මාර්ගය වැඩූහ. නිරොධය ප්‍රත්‍යක්ෂ කළහ. දතයුත්ත දැන ගන්නා ලදී. ප්‍රහාණය කළයුතුදේ ප්‍රහාණය කරණ ලදී. වැඩිය යුතුදේ වඩන ලදී. ප්‍රත්‍යක්ෂ කළයුතු දේ ප්‍රත්‍යක්ෂ කරණ ලදී.

**20** හෙතෙම එසවූ දොර පළු ඇත්තේ, වැසූ දිය අගල ඇත්තේ, උගුලන ලද එළිපත ඇත්තේ, අගුළු නැත්තේ, ආර්ය වූයේ, බහා තැබූ කොඩි ඇත්තේ, බහා තැබූ බර ඇත්තේ, බැම්මෙන් මිදුණේ, අංග පස ගෙවා දැමූයේ, අංග හයෙන් යුක්තවූයේ, තනි ආරක්ෂා ඇත්තේ, සතර ඇඳි ඇත්තේ, දුරුකළ විවිධ සත්‍ය ඇත්තේ, සමවිය සිටියවුන් සොයන්නේ, නොකැළඹුණු සිතිවිලි ඇත්තේ, සන්සිඳුණු කයේ ක්‍රියා ඇත්තේ, මනාව මිදුණ සිත් ඇත්තේ, මනාව මිදුණු නුවණ ඇත්තේ, අසහායවූයේ වැස නිමවූයේ උතුම් පැමිණීමට පැමිණියේ, පරම පුරුෂයා වූයේ උත්තම පුරුෂයා වූයේවේද, හෙතෙම රැස් කරන්නේ නොවේමය විනාශ කරන්නේනොවේ. විනාශකොට සිටියේය. දුරලන්නේ නොවේමය. ඇඩිව ගන්නේ නොවේ. දුරලා සිටියේ වේ. නොමසාම මසන්නේ නොවේ. මැස්මෙන් වෙන්වූයේවේ දුම ගසන්නේ නොවේමය. දුම් විහිදුවන්නේ නොවේ. දුම් විහිදුවා සිටියේය හික්මීමට නොවන සිල් කඳින් යුත් වීය. හික්මීමට නොවන සමාධි කඳින් යුත්වූයේය. හික්මීමට නොවන නුවණ කඳින් යුත්වූයේය. හික්මීමට නොවන නිදහස්

කඳින් යුක්තවූයේය. හික්මීමට නොවන නිදහස් නුවණ දැකීමේ කොටසින් යුක්තවූයේය. ඇත්ත දැන සිටියේය. තෘෂ්ණාව ඉක්මවා සිටියේය. කෙලෙස් ගිණි මැඩ සිටියේය. වටායාම පිණිස නොසිටියේය. කෙසේද, යන්න පිළිගෙන සිටියේය.

මිදීම ඇසුරු කිරීමෙන් සිටියේය. මෛත්‍රියෙන්වූ පිරිසුදුකමින් සිටියේය. කරුණා මුදිතා උපෙක්ෂාවන්ගෙන්වූ පිරිසිදු කමින් සිටියේය. අත්‍යන්ත පාරිශුද්ධියෙන් සිටියේය. යමකින් නොකළ පිරිසුදුකමින් සිටියේය. මිදුණු සිතින් සිටියේය සතුටු සිතින් සිටියේය. ශරීරයේ කෙළවර සිටියේය ගති කෙළවර සිටියේය. ඉපදීම කෙළවර සිටියේය. (ඇස් ආදී) ධාතූන්ගේ කෙළවර සිටියේය. (ඇස ආදී) තැන් කෙළවර සිටියේය. පිළිසිඳුම් කෙළවර සිටියේය. සසර කෙළවර සිටියේය. (සසර) වැට කෙළවර සිටියේය. අන්තිම භවයෙහි සිටියේය. අන්තිම ශරීරයෙහි සිටියේය. අන්තිම දෙහය දරන රහතුන් වහන්සේය. ඔහුගේ මේ පශ්චිමවූ අන්තිමවූ ශරීරයයි, ඉපදීමයි මරණයයි, හැසිරීමයි, ඔහුට නැවත ඉපදීමක් නැත "නැවත පිළියම් කොට පරතෙර යන්නේ" යනුයි.

## ගුහට්ඨක සූත්‍ර නිර්දෙශය

21 "සත්වයා ගුහාවෙහි බොහෝ සෙයින් වැසී සිටියේය. යන්නෙහි "සත්ව යන්න කියන ලද්දේමය, යළිදු "ගුහා" පළමුකොට කියයුතුය ගුහායයි ශරීරයට කියනු ලැබේ. ගුහා යනු හෝ දෙහ යනු හෝ සන්දෙහ, නාව, රථ, ධජ, වම්මික (තුඹස) නගර, නීඩ, (කූඩුව) කුටී, ගණ්ඩ, කුම්ම, නාග යනු හෝ ශරීරයට මේ විශේෂ වචනයෝයි." සත්වයා ගුහාවෙහි යනු ගුහාවෙහි ඇළුණේය විශෙෂයෙන් ඇළුණේ ලග්නවූයේ යනුයි. මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරණ ලදී. "රාධය රූපයෙහි (ii) වනාහි යම් ආශාවක් යම් රාගයක් යම් බැඳීමක් යම් තෘෂ්ණාවක් සිතින් උපාදානවශයෙන් තදින් බැසගැන්මක් ඇද්ද, එහි ඇළුනේනුයි එහි විශෙෂයෙන් ඇළුනේනුයි "සත්වයා'

යයි කියනු ලැබේ (iii) රාධය වේදනාවෙහි (21 (ii) යෙදිය යුතුයි) සංඥාවෙහි (21 (ii) යෙදිය යුතුයි) රාධය සංස්කාරයන්හි (21 (ii) යෙදිය යුතුයි) විඤ්ඤානයෙහි (21 (ii) යෙදිය යුතුයි)

**22** සත්ව යනු ඇලීමට විශෙෂ වචනයකි. "සත්වයා ගුහාවෙහි බොහෝ සෙයින් වැසී සිටියේ" යනු බොහෝ ක්ලෙශයන්ගෙන් වැසුනු, රාගයෙන් වැසුන ද්වෙෂයෙන් මොහයෙන් ක්‍රොධයෙන් බද්ධ වෛරයෙන් ගුණමකුකමින් එකට එක කිරීමෙන් ඊර්ෂ්‍යාවෙන් මසුරුකමින් රැවටිල්ලෙන් කෛරාටික කමින් තද කමින් එකට එක කිරීමෙන් මානයෙන් අතිමානයෙන් මදයෙන් ප්‍රමාදයෙන් සියලු ක්ලෙශයන්ගෙන් සියලු දුශ්චරිතයන්ගෙන් සියලු විඩාවන්ගෙන් සියලු පරිදාහයන්ගෙන් සියලු සන්තාපයන්ගෙන් සියලු අකුශල ක්‍රියාවන්ගෙන් වැසුනේ යටවූයේ ආවරණවූයේ යටි කුරුවූයේ යනුයි.

**23** මොහනයෙහි දැඩිව සිටින්නාවූ සත්වයා" යන්නෙහි සිටින්නාවූ මිනිසා" යනු සිටින්නාවූ මිනිසා ඇළුනේ රාග වශයෙන් සිටියි. ද්වෙෂයට පැමිණියේ ද්වෙෂවශයෙන් සිටියි. මුළාවූයේ මොහ වශයෙන් සිටියි. එකට බැඳුනේ මාන වශයෙන් සිටියි. පරාමර්ශනය කරණ ලද්දේ දෘෂ්ටි වශයෙන් සිටියි. සිත කැළඹීමට ගියේ උද්ධච්ච වශයෙන් සිටියි. නීවරණයකට නොපැමිණියේ සැක වශයෙන් සිටියි. උත්සාහවත්වූයේ අනුශය (සිතිවිලි) වශයෙන් සිටියි.

**24** භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලදී. මහණෙනි, ඇසින් (ii) හැඳිනගනු ලබන්නාවූ ඉෂ්ටවූ, කාන්තවූ, මනවඩන්නාවූ, ප්‍රිය රූපවූ, කාමයෙන් යුක්තවූ, ඇලෙන්නාවූ (iii) රූපයෝ ඇත්තාහ. (iv) ඉදින් භික්ෂුව එහි සතුටුවෙයි. එය ප්‍රකාශ කරයි. බලවත් ඇල්මෙන් සිටියි.

**25** මහණෙනි, කණින් (24 (ii) යෙදිය යුතුයි.) ශබ්දයෝ ඇත්තාහ. (24 (iv) යෙදිය යුතුයි)

**26** නාසයෙන් (24 (ii) යෙදිය යුතුයි.) ගන්ධයෝ ඇත්තාහ. (24 (iv) යෙදිය යුතුයි.)

**27** දිවින් (24 (ii) යෙදිය යුතුයි.) රසයෝ ඇත්තාහ. (24 (iv) යෙදිය යුතුයි.)

**28** කයින් (24 (ii) යෙදිය යුතුයි.) ස්පර්ශයෝ ඇත්තාහ. (24 (iv) යෙදිය යුතුයි.)

**29** සිතින් (24 (ii) යෙදිය යුතුයි.) ධර්මයෝ ඇත්තාහ. (24 (iv) යෙදිය යුතුයි.)

**30** භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරණ ලදී "මහණෙනි, රූපයෙන් (ii) ඇතිවන විඤ්ඤානය සිටිනු ලබන්නේ සිටියි. (iii) රූපාරම්මණය රූප ප්‍රතිෂ්ඨාව (iv) ප්‍රීතියෙන් සේවනය කිරීම අභිවෘද්ධියට වැඩීමට විශාලත්වයට පැමිණෙයි.

**31** වෙදනාවෙන් (30 (ii) යෙදිය යුතුයි.) වේදනාරම්මනය වේදනා ප්‍රතිෂ්ඨාව (30 (iv) යෙදිය යුතුයි)

**32** සංඥාවෙන් (30 (ii) යෙදිය යුතුයි) සංඥාරම්මනය සංඥා ප්‍රතිෂ්ඨාව (30 (iv) යෙදිය යුතුයි)

**32** සංස්කාරයෙන් (30 (ii) යෙදිය යුතුයි.) සංස්කාරම්මනය සංස්කාර ප්‍රතිෂ්ඨාව (30 (iv) යෙදිය යුතුයි.)

**33** විඤ්ඤානයෙන් (30 (ii) යෙදිය යුතුයි) විඤ්ඤානාරම්මනය විඤ්ඤාන ප්‍රතිෂ්ඨාව (30 (iv) යෙදිය යුතුයි)

**34** භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලදී. මහණෙනි, ඉදින් කබලීකාර (පිඩු වශයෙන් අනුභව කරණ) ආහාරයෙහි රාගයක් ඇද්ද, බැඳීමක් ඇද්ද, තෘෂ්ණාවක් ඇද්ද එහි පිහිටි විඤ්ඤානය වැඩීමට ගියේවෙයි. යම්තැනෙක්හි පිහිටියාවූ විඤ්ඤානය වැඩුනේද එහි නාම රූපයන්ගේ පැවැත්ම ඇතිවේ යම්තැනක නාම රූපයන්ගේ පැවැත්ම වේද එහි සංස්කාරයන්ගේ අභිවෘද්ධිය ඇතිවේ. යම්තැනෙක සංස්කාරයන්ගේ අභිවෘද්ධිය ඇතිවේද එහි මතු නැවත ඉපදීම ඇතිවේ. යම් තැනෙක ඉපදීම ඇතිවේද එහි මත්තෙහි ජාති, ජරා, මරණවේද යම්තැනෙක මත්තෙහි ජාති, ජරා, මරණ වේද, මහණෙනි, එය ශොක සහිත, කෙලෙස් සහිත, තැන්පත් ශොක (උපායාස) සහිත වේයයි කියමි. "මහණෙනි, ඉදින්

ඵස්සාහාරයෙහිද මනො සඤ්චෙතනාහාරයෙහිද, විඤ්ඤානාහාරයෙහිද ඇල්මක් ඇද්ද, බැඳීමක් ඇද්ද, තෘෂ්ණාවක් ඇද්ද, එහි විඤ්ඤානය පිහිටියේය. අභිවෘද්ධියට ගියේය. යම්තැනෙක ඒ විඤ්ඤානය පිහිටියේද වැඩීමට ගියේද එහි සිතේ කයේ බැසගැන්ම ඇතිවේ. යම්තැනක සිතේ කයේ බැසගැන්ම වේද එහි ක්‍රියාවන්ගේ වැඩීම සිදුවේ. යම්තැනෙක ක්‍රියාවන්ගේ අභිවෘද්ධිය වේද, එහි යලිදු පුනර්භවයෙහි ඉපදීම ඇතිවේ. යම්තැනක පුනර්භවයෙහි ඉපදීම ඇතිවේද, එහි යලිදු ජාති, ජරා, මරණ ඇතිවේ. යම්තැනක ජාති ජරා මරණ ඇතිවේද, මහණෙනි, එය ශොක සහිතවූ කෙලෙස් රජස් සහිතවූ උපායාස සහිතවූ තැනයයි කියමි.

35 "දැඩිව මොහනයෙහි" යන තන්හි "මොහනා" යයි පඤ්චකාම ගුණයන්ට කියයි. ඇසින් (24 (ii) යෙදිය යුතුයි) රූපයෝද ඇත්තාහ කණින් (24 (ii) යෙදිය යුතුයි.) ශබ්දයෝද ඇත්තාහ. නාසයෙන් (24 (ii) යෙදිය යුතුයි) ගන්ධයෝද ඇත්තාහ. දිවෙන් (24 (ii) යෙදිය යුතුයි) රසයෝද ඇත්තාහ කයින් (24 (ii) යෙදිය යුතුයි) ස්පර්ශයෝද ඇත්තාහ. පඤ්චකාම ගුණයෝ කවර කරුණකින් මොහනයයි කියද්ද, බොහෝසෙයින් දෙවියෝද මිනිස්සුද පඤ්චකාම ගුණයන්හි මුලාවෙන් විශෙෂයෙන් මුලාවෙත්. මුලාවූවෝ අවිද්‍යාවෙන් අන්ධ කරණලද්දෝ ආවරණය කරණලද්දෝ වසන ලද්දෝ වෙති ඒ කාරණයෙන් මොහනා (මුළා කරන්නී) යයි පඤ්චකාම ගුණයන් කියති "මොහනයෙහි දැඩිව" යනු මුලාවීමෙහි ඇළුණු පැටලුණු බැසගත් ගිලුණාවූ යනුයි.

36 "විවේකයෙන් දුරුවූ එබඳුවූ හෙතෙම" යන්නෙහි "විවෙක" යනු කාය විවේක චිත්ත විවේක උපධි විවේක යන තුනයි. කාය විවේකය කවරේද, මේ ශාසනයෙහි මහණතෙම අරණ්‍ය, වෘක්ෂමූල, පර්වත කඳු බෑවුම්, සොහොන්, කැලෑබද ස්ථාන, අභ්‍යවකාශ පිදුරු බිසි යන විවේක සෙනසුන් භජනය කරයි. කයින්ද විවේකව වසයි. හෙතෙම තනිව ගමන් කරයි. තනිව සිටියි. තනිව වැඩ හිඳියි. තනිව සයනය කරයි තනිව ගමට පිඩු පිණිස හැසිරෙයි. තනිව ආපසු එයි. තනිව රහසිගතව

වැඩහිඳියි. තනිව සක්මනට බසියි. තනිව හැසිරෙයි. වාසය කරයි. ඉරියව් පවත්වයි පාලනය කරයි. යැපෙයි මේ කාය විවේකයයි.

37 චිත්ත විවේකය කවරේද? ප්‍රථම ධ්‍යානයට සමවැදුනහුට නීවරණයන්ගෙන් සිත මිදුනේවෙයි. ද්විතීය ධ්‍යානයට සමවැදුනහුට විතර්ක විචාරයන්ගෙන් සිත විවේක වෙයි. තෘතීය ධ්‍යානයට සමවැදුනහුට ප්‍රීතියෙන් සිත විවේක වෙයි. චතුර්ථධ්‍යානයට සමවැදුනහුට සුඛ දුක්ඛයන්ගෙන් විවේකවූයේ වෙයි.

ආකාසානඤ්චායතනට සමවැදුනහුට රූප සඤ්ඤාවෙන් පටිඝ (ක්‍රොධ) සඤ්ඤාවෙන් නානත්ත සඤ්ඤාවෙන් සිත විවේක වූයේ වෙයි. විඤ්ඤානඤ්චායතනයට සමවැදුනහුට ආකාසානඤ්චායතනයෙන් සිත විවේක වූයේ වෙයි. ආකිඤ්චායතනයට සමවැදුනහුට විඤ්ඤානඤ්චායතන සංඥාවෙන් සිත විවේකවූයේ වෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවැදුනහුට ආකිඤ්ඤායතන සංඤ්ඤා වෙන් සිත විවේකවූයේ වෙයි සෝවාන්වූවහුට සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස දිට්ඨානුසය විචිකිච්ඡානුසය හා එයට හේතුවූ ක්ලෙශයන්ගෙන් සිත විවේකවූයේ වෙයි සකෘදාගාමි වූවහුට ඕලාරිකවූ කාමරාග සඤ්ඤොජනයෝද පටිඝ සඤ්ඤොජනයෝද ඕලාරික කාමරාගනුසයයෝද පටිඝානුසයයෝද එයට හේතුවූ කෙලෙස්වලින්ද සිත විවේකවෙයි. රහත්වූ ඔහුට රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා මානානුසය භවරාගානුසය අවිජ්ජානුසය යන මෙයින්ද එයට හේතුවූ කෙලෙස් වලින්ද පිටත සියලු නිමිතිවලින්ද සිත විවේක වූයේවෙයි. මේ චිත්ත විවේකයයි.

38 උපධි විවේකය කවරේද? ක්ලෙශයෝද ස්කන්ධයෝද, අභිසංස්කාරයෝද උපධියයි කියත්. අමෘතවූ නිර්වාණයට උපධි විවේකයයි කියයි. යමෙක් සියලු සංස්කාරයන් සංසිඳවූයේ සියලු කෙළෙස් නැතිකළේද තෘෂ්ණා ක්ෂයවූයේද නොඇලීම්

ඇතිවූයේද බැඳුම් නැතිවූයේද එය නිවණයි. මේ උපධි විවේකයයි නෛෂ්කාම්‍යයෙහි ඇළුනාවුන්ට ශරීරාශා ඇත්කළවුන්ට කාය විවේකයද පිරිසිදු සිත් ඇත්තන්ට අතිශය පිරිසිදු බවට පැමිණියවුන්ට චිත්ත විවේකයද සංස්කාරයන්ගෙන් මිදුන පුද්ගලයින්ට කෙලෙස් නැතියවුන්ට උපධි විවේකයදවේ.

39 "විවේකයෙන් දුරෙහිමය, යන්නෙහි මෙසේ ගුහාවෙහි ඇළුන මෙසේ බොහෝ කෙලෙස්වලින් වැසුන මෙසේ මුළාව දැඩිවගත් යම් ඒ කෙනෙක් වේද, හෙතෙම කාය විවේකයෙන්ද දුරය. උපධි විවේකයෙන්ද දුරය. ඈතය, ලඟනොවේ. සමීපයෙහි නොවේ. අසල නොවේ. අනාසන්නයෙහිය.

40 "එබඳුවූ" යනු එබඳුවූ එසේ සිටියාවූ එබඳු ප්‍රකාරවූ යම් ඒ කෙනෙක් කෙළෙස් දැඩිව ගත්තේද, හෙතෙම විවේකයෙන් දුරවේ.

41 "කාමයෝ ලොකයෙහි පහසුවෙන් දුරලිය නොහැකිමය, යන්නෙහි කාමයෝ නම් ප්‍රකට වශයෙන් කාමයෝ දෙකොටසකි. (මෙහි (1) 1 (ii) සහ 2 (i) ඡෙදය යෙදිය යුතුයි) "ලොකයෙහි යනු අපාය ලොකයෙහි මනුෂ්‍යලොකයෙහි දිව්‍ය ලොකයෙහි ස්කන්ධලොකයෙහි ධාතුලොකයෙහි ආයත ලොකයෙහි යනුයි

42 "කාමයෝ" නම් ලොව පහසුවෙන් හැරිය හැක්කෝ නොවෙත්මය. යනු ලොකයෙහි කාමයෝ දුකසේ දුරු කටයුතුය. දුකසේ අත්හැරිය යුතුය දුකසේ පරිත්‍යාග කටයුතුය. දුකසේ සංසිඳ විය යුතුය.

ගුහට්ඨක සූත්‍ර නිර්දෙශයඃ- 1566 පිටේ 21 ඡෙදය 2-1 විය යුතුයි.

## 2 - 2

1 "ආශාව නිදානකොට භව සැපයෙහි ඇළුනෝ" යන්නෙහි 'ආශාව', යනු තෘෂ්ණාවයි. යම් රාගයක් ඇද්ද ඇලීමක් ඇද්ද යම් ලංවීමක් ඇද්ද යම් රැහැනක් ඇද්ද යම් නන්දිරාගයක් ඇද්ද යම් බලවත් රාගයක් ඇද්ද යම් ආශාවක් ඇද්ද බැසගැන්මක් ගිජුවීමක් මඩක් ඇද්ද එජා මායා ජනිකා සංජනිකා

සංජනනී සිබ්බනි ජාලිනී සරිතා විසත්තිකා යන නම්වලින් හඳුන්වන තෘෂ්ණාවක් ඇද්ද මෙහි (1-3) 3 (ii) ඡේදය යෙදිය යුතුයි)

2 "ආශාව නිදානකොට" යනු ආශාව මුල හෙතුවෙන් ආශා හේතුවෙන් ආශාප්‍රත්‍යයෙන් ආශාකාරණයෙන් ආශාප්‍රභවයෙන්

3 "භවසැපයෙහි බැඳුනේ" යනු සුඛවෙදනාව එක් භව සැපයකි සුඛවේදනාවද ඉෂ්ට වස්තුවද භවසැප දෙකකි. තරුණභාවය, ආරොග්‍යය ජීවිතයද භවසැප තුනකි. ලාභය, කීර්තිය, ප්‍රශංසාව, සැපය භවසැප සතරකි මනවඩන රූපයෝ මනවඩන ශබ්දයෝ මනවඩන ගන්ධයෝ මනවඩන රසයෝ මනවඩන ස්පර්ශයෝ භවසැප පසකි චක්ෂු සම්පත්තිය (ii) ශ්‍රොත සම්පත්තිය ඝ්‍රාණ සම්පත්තිය ජිහ්වා සම්පත්තිය කාමසම්පත්තිය මනොසම්පත්තිය (iii) යන භවසැප සයකි.

4 "භවසැපයෙහි බැඳුනේ" යනු ඉෂ්ට වස්තුවෙහි සැප වේදනාවෙන් ඇළුනේ බැඳුනේ යනුයි. තරුණකමෙහි බැඳුනේ නිරෝගිකමෙහි බැඳුනේ ජීවිතයෙහි බැඳුනේ ලාභයෙහි බැඳුනේ කීර්තියෙහි බැඳුනේ ප්‍රශංසාවෙහි බැඳුනේ සැපයෙහි බැඳුනේ මනවඩන රූපයන්හි බැඳුනේ ශබ්දයෙහි ගන්ධයෙහි, රසයෙහි මනවඩන්නාවූ ස්පර්ශයෙහි (ii) චක්ෂු සම්පත්තියෙහි (යෙහි යන්න එකතුකර 3 (ii) ඡේදය යෙදිය යුතුයි.) ලැගුනේ, බැඳුනේ, ගැටුනේ' වෙළුනේ යනුයි ඔව්හු අමාරුවෙන් මිදිය යුතුය. අනික් මිදීමක් නැත යනු ඒ භවසාත වස්තු හෝ (iii) දුකසේ මිදිය යුතුය. මෙයින් සත්වයෝ හෝ (iii) දුකසේ මිදිය යුතුය. කෙසේ ඒ භවසාත වස්තු දුකසේ මිදිය යුතුද? සැප වේදනාවෝ දුකසේ මිදිය යුතුද (iv) ඉෂ්ට වස්තු, තරුණ භාවය, ආරොග්‍යය, ජීවිතය ලාභය, කීර්තිය, ප්‍රශංසාව, සැපත, මනවඩන රූපයෝ, ශබ්දයෝ, ගන්ධයෝ, රසයෝ, ස්පර්ශයෝ (v) (මෙහි 4 (ii) ඡේදය යෙදිය යුතුයි) දුකසේ මිදිය යුතුය. දුකසේ හැරදැමිය යුතුය. දුකසේ තරණය කටයුතුය. දුකසේ ඉක්මවිය යුතුය දුකසේ නැවැත්විය යුතුය. මෙසේ ඒ භවසාත වස්තුහු දුකසේ මිදිය යුතුය. කෙසේ

සත්වයෝ මෙයින් මිදිය යුතුද? සැප වේදනාවෙන් (මෙහි 4 (iv) ඡේදය යෙදිය යුතුයි) දුකසේ මිදිය යුතුය. දුකසේ උදුරා දැමිය යුතුය. දුකසේ උපුටා දැමිය යුතුය දුකසේ හැරදැමිය යුතුය. දුකසේ තරණය කටයුතුය. දුකසේ සංසිඳවිය යුතුය. දුකසේ නැවැත්විය යුතුය. මෙසේ සත්වයෝ මෙයින් දුකසේ මිදිය යුතු බැවින් "දුකසේ මිදිය යුත්තෝ" නම්වේ.

**5** "අනිකෙකු මිදීමක් නැත්තේමය." යනු ඔවුහු තුමූම මඩෙහි එරුණාහු අන්‍යයා ගොඩගන්නට නොහැකිවෙත්. භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේමය. "චුන්දය ඒකාන්තයෙන් හෙතෙම මඩෙහි එරුනේ මඩෙහි එරුන අන්‍යයා ගොඩගනියි, යන මේ කාරණය නොසිදුවෙයි. චුන්දය ඒකාන්තයෙන් හෙතෙම තමා නොදැමුනේ විනීත නොවූයේ නොනිවුනේ අන්‍යයා දමනය කරයිද හික්මවයිද නිවීමට පත්කරයිද යන මේ කාරණය නොසිදුවේ. මෙසේද අන්‍යයන් මිදීමට නොහැකිය.

මිදිය හැකි අන් කිසිවෙක් නැද්ද, ඔවුහු ඉදින් මුදවන්නාහුය. (ඒ කවරහුද) ස්වකීය උත්සාහයෙන් ස්වකීය බලයෙන් ස්වකීය වීර්‍ය්‍යයෙන් ස්වකීය පරාක්‍රමයෙන් ස්වකීය පුරුෂධෛර්‍ය්‍යයෙන් ස්වකීය පුරුෂ බලයෙන් තමා සම්‍යක් ප්‍රතිපදාවට අනුලෝම ප්‍රතිපදාවට, ධර්මානුධර්ම ප්‍රතිපදාවට පිළිපන්නාහු මුදන්නාහුය යනුයි" මෙසේද අනෙක් මුදන්නෝ නොවෙත්මය. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණලදී

"ධොතකය මම ලෝකයෙහි කිසිම සැකකරන්නකු මිදීම පිණිස තැත්නොකරමි. ශ්‍රේෂ්ඨවූ ධර්මය මනාකොට දැනගනු ලබන්නාවූ තෝ මේ ඕඝය මෙසේ තරණය කෙළෙහිය. මෙසේද අන්‍යයා මිදවීමට නොහැකියයි" භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී.

**6** "තමා කළ පාපය තමා කිලුටු කරයි. තමා නොකළ පාපය තමාම පිරිසිදු කරයි. ශුද්ධිය හා අශුද්ධිය වෙන වෙනම ඔවුනොවුන් පිරිසිදු කරන්නේය. අනිකෙක් අනිකකු පිරිසිදු කරන්නේ නොවේ. මෙසේද අන්‍යයා මිදවියහැකි නොවේ."

භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේමය. "බ්‍රාහ්මණය, මෙපරිදිම වනාහි නිර්වාණය පවතීමය. නිර්වාණගාමී මාර්ගය පවතියි. සමාදන් කරවන්නාවූ මම සිටිමි. එසේ නමුදු මා විසින් මෙසේ අවවාද කරණු ලබන, අනුශාසනා කරණු ලබන, මාගේ ඇතැම් ශ්‍රාවකයෝ ඒකාන්ත කෙළවරවූ නිර්වාණය බලාපොරොත්තු වෙත්. ඇතැම් කෙනෙක් බලාපොරොත්තු නොවෙත්. බ්‍රාහ්මණය, මෙහිලා මම කුමක් කෙරෙම්ද, බ්‍රාහ්මණය තථාගතතෙම මාර්ගය ප්‍රකාශ කරන්නායි. බුදුරජතෙම මාර්ගය කියයි. තමා පිළිපදින්නාහු මිදෙත්. මෙසේද අන්‍යයා මිදවීමට නොහැකිය.

"පෙර හෝ පසුව හෝ පතන්නේ" යන මෙහි පසුව යනු අනාගතයට කියයි. පෙර යයි අතීතයට කියයි. නැවතද අතීතය අනුව අනාගතයද වර්තමානයද "පසු" නම් අනාගතය අනුව අතීතයද වර්තමානයද "පෙර" නම් වේ. කෙසේ අනාගතය අපෙක්ෂා කෙරේද, අතීතයෙහි මෙබඳු රූපයක් වීමියි එහි (නන්දිය) ආශාව ඇති වෙයි. මෙබඳු වේදනාව වීමි. මෙබඳු සංඥාව වීමි. මෙබඳු සංඛාරය වීමි. මෙබඳු විඤ්ඤානය වීමි'යි එහි ආශාව ඇතිවෙයි. මෙසේද අතීතය අපෙක්ෂා කරයි. යලිදු හෝ මෙසේ අතීතයෙහි මාගේ චක්ෂුස විය. මෙසේ රූපයයි එහි විඤ්ඤානය ඡන්දරාග ප්‍රතිබද්ධවූයේ වෙයි. විඤ්ඤානයාගේ ඡන්දරාගයෙන් බැඳුන බැවින් එය බලාපොරොත්තු වෙයි. එය බලාපොරොත්තු වන්නේ මෙසේද අතීතය අපෙක්ෂා කරයි. යලිදු හෝ මෙසේ මාගේ ශ්‍රොතය (කණ) අතීතයෙහි විය මෙසේ ඝ්‍රාණය (නාසය) මෙසේ ජිව්හාව අතීතයෙහි විය මෙසේ රසය මෙසේ ස්පර්ශය අතීතයෙහි විය. මෙසේ මනස විය මෙසේ ධර්මයෝ අතීත කාලයෙහි විය. එහි විඤ්ඤානය ඡන්දරාග ප්‍රතිබද්ධවූයේ වෙයි. එය බලාපොරොත්තුවෙයි. මෙසේද බලාපොරොත්තු වන්නේ අතීතය අපෙක්ෂා කරයි. යලිදු පෙර ස්ත්‍රියක් සමග සිනහවූ කථාකළ ක්‍රීඩාකළ යම් දෙයක් ඇත්ද ඒවා ආශ්වාදය කරයි. එය බලාපොරොත්තු වෙයි. එයින්ද ප්‍රීතියට පැමිණෙයි. මෙසේද අතීතය බලාපොරොත්තු වෙයි. කෙසේ අනාගතය බලාපොරොත්තු වේද? අනාගත කාලයෙහි මෙබඳු

රූපයක් වන්නේයයි එහි ආශාව ඇතිවෙයි. මෙසේ වේදනාවක් මෙසේ සංඥාවක් මෙසේ සංස්කාරයන් මෙසේ විඥ්ඥානයන් අනාගතයෙහි වන්නේයයි එහි ආශාව ඇතිකරයි. මෙසේද අනාගතය බලාපොරොත්තු වෙයි. යලිදු හෝ මෙසේ මාගේ චක්ෂුස අනාගතයෙහි වන්නේය. මෙසේ රූපයෝයයි නොලැබූදේ ලැබීම පිණිස සිත පිහිටුවයි. සිත පිහිටවූ බැවින් එය සතුටු වෙයි. මෙසේද අනාගතය බලාපොරොත්තුවෙයි. යලිදු මාගේ ශ්‍රොතය අනාගතයෙහි වන්නේය. මෙසේ ශබ්දයෝ, මෙසේ ගන්ධයෝ, මෙසේ දිව, මෙසේ රසය, මෙසේ කය, මෙසේ ස්පර්ශය, මෙසේ සිත මෙසේ ධර්මයෝ අනාගතයෙහි වන්නේයයි නොලැබූ දෙය ලැබීම පිණිස සිත පිහිටුවයි. සිතින් ප්‍රාර්ථනා කළ බැවින් ඒ ගැන සතුටු වෙයි. එසේ සතුටු වන්නේ මෙසේද අනාගතය බලාපොරොත්තු වෙයි. යලිදු හෝ මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බඹසරින් හෝ දෙවියෙක් හෝ වන්නෙමි. දෙවියන්ගෙන් අන්කෙනෙකු හෝයි නොලැබූ දේ ලැබීම පිණිස සිත පිහිටුවයි. සිතින් බලාපොරොත්තුවූ බැවින් ඒ ගැන සතුටු වෙයි. ඒ ගැන සතුටුවන්නේ මෙසේද අනාගතය අපෙක්ෂා කෙරෙයි.

7 "මේ කාමයන් ගැන පෙරටුව කථාකරන්නාවූ" යනු මේ කාමයන් යනු පවත්නා කාලයෙහි පඤ්චකාම ගුණයන් කැමතිවන්නාවූ පිළිගන්නාවූ පවත්නාවූ ආශා කරන්නාවූ ඒ ගැන කථාකරන්නාවූ ඉල්වන්නාවූ යනුයි.

## 2 - 3

1 (i) "කාමයෙහි ගිජුවූ යෙදුනාවූ මුළාවූ" යනු ප්‍රකට වශයෙන් කාමයෝ දෙකොටසක් වෙති. වස්තු කාමයෝද ක්ලේශ කාමයෝද යනුයි. (මෙහි (1) 2 (ii) සහ 3 (i) ඡෙද යෙදිය යුතුයි) මොවුහු වස්තුකාම යයි කියත්. මොවුහු ක්ලේශ කාම යයි කියත්.

(ii) "ගිජුය" යනු තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇල්මක් (මෙහි (3) 3 ඡෙදයේ යම් ළංවීමක් යන තැන සිට අගට යෙදිය යුතුයි) අභිධ්‍යාවක් ලොභයක් අකුශල මූලයක් වේද, (එයයි)

ක්ලේශ කාමයෙන් වස්තුකාමයන්හි ඇළුනාවූ ගිජුවූ වෙළුනාවූ මුසපත්වූ බැසගත්තාවූ එල්බුනාවූ යනුයි.

"යෙදුනෝ" යනු යමෙක් තුමූ කාමයන් සොයත්ද, උත්සාහයෙන් සොයත්ද විමසා සොයත්ද, (ii) එය චරිත කොට ඇති එය බහුලකොට ඇති එය ගරුකොට ඇති එයට නැඹුරු වූ එයට බරවූ මහත්සේ බරවූ එහි ඇළුනාවූ එය අධිපතිකොට ඇත්තාවූ (යනුයි) ඔවුහුද කාමයෙහි ඇළුනෝවෙත්. (iv) යමෙක් තෘෂ්ණාවශයෙන් රූපයන් සොයද්ද, උත්සාහයෙන් සොයද්ද, විමසා සොයද්ද, ශබ්දයන් ගන්ධයන් රසයන් ස්පර්ශයන් සොයත්ද, එය චරිතකොට ඇත්තාවූ (මෙහි මේ ඡේදයේ (iii) යෙදියයුතුයි.) ඔවුහුද කාමයෙහි ඇළුනෝ වෙත්. යමෙක් තුමූ තෘෂ්ණා වශයෙන් රූපයන් ලබත්ද (මෙහි මේ ඡේදයේ (iv) "සොයද්ද" වෙනුවට "ලබද්ද" කියාද "ඇළුනෝ" වෙනුවට 'යෙදුනාහුද' කියා වෙනස්කර යෙදිය යුතුයි.) ස්පර්ශයන් ලබද්ද එය චරිතකොට ඇති එය අධිපතිකොට, ඇත්තාවූ ඔවුහුද කාමයෙහි යෙදුනාහු වෙත්. යම්සේ කෝලාහල කරන්නා කෝලාහලයෙහි යෙදුනේ වෙයි. වැඩ කරන්නා වැඩෙහි යෙදුනේ වෙයි ගොදුරු සොයන්නා ගොදුරු සෙවීමෙහි යෙදුනේ වෙයි. ධ්‍යානයට සමවැදෙන්නා ධ්‍යානයෙහි යෙදුනේ වෙයි. මෙසේම යමෙක් කාමයන් සොයද්ද, උත්සාහයෙන් සොයද්ද, විමසීම් වශයෙන් සොයද්ද එය චරිතකොට ඇත්තාවූ එය බහුලකොට ඇත්තාවූ එය ගරුකොට ඇත්තාවූ එයට නැඹුරුවූ එයට බරවූ එයට විශෙෂයෙන් බරවූ එහි ඇළුනාවූ එය අධිපති කොට ඇති (කෙනෙක් වෙද්ද) ඔවුහුද කාමයෙහි යෙදුනෝ වෙති. යමෙක් තෘෂ්ණා වශයෙන් රූපයන් ලබද්ද (මෙහි මේ ඡේදයෙහි "සොයද්ද" වෙනුවට "පරිභොග කරද්ද" කියා වෙනස්කර (iv) යෙදිය යුතුයි.) යමෙක් තෘෂ්ණා වශයෙන් රූපයන් පරිභොග කරද්ද ශබ්දයන්, ගන්ධයන්, රසයන්, ස්පර්ශයන් පරිභොග කරද්ද එය චරිතකොට ඇත්තාවූ එය බහුලකොට ඇත්තාවූ එය ගරුකොට ඇත්තාවූ එයට නැඹුරුවූ එයට බරවූ එයට විශෙෂයෙන් බරවූ එහි ඇළුනාවූ එය අධිපතිකොට ඇති ඔවුහුද කාමයෙහි යෙදුනාහුවෙති.

2 "ඉතා මුළාවූවෝ" යනු බොහෝ සෙයින් දිව්‍ය මනුෂ්‍යයෝ පඤ්චකාම ගුණයන්හි මුලාවෙත්. ප්‍රකර්ෂයෙන් මුලාවෙත්. බොහෝ සෙයින් මුලාවෙත්. අවිද්‍යාවෙන් අන්ධ කරණ ලද්දාහු ආවරණය කරණ ලද්දාහු වසනලද්දාහු ප්‍රතිච්ඡන්න කරණලද්දාහු වෙත්.

3 'විෂමාචාරයේ පිවිසි ඒ මසුරෝ (අවදානියයෝ) යන්නෙහි "මසුරෝ" (අවදානිය) යනු අපායට යේනුයි. අවදානිය නම්වේ. බුදුවරයන්ගේ බුද්ධ ශ්‍රාවකයන්ගේ වචනය මාර්ගය දෙශනය අනුශාසනය නොගනිත් නුයි "අවදානිය" නමි. එසේ අවදානිය වූවෝ අපායට කෙසේ යෙද්ද, නරකයට යති. තිරිසන් යොනියට යති. ප්‍රෙතවිෂයට යති. මෙසේ අපායට යේනුයි අවදානිය නම්වේ. කෙසේ මසුරාට අවදානිය යයි කියද්ද, මසුරුකම් පසක් වෙති ආවාස මච්ඡරිය, කුලමච්ඡරිය ලාභ මච්ඡරිය, වණ්ණ මච්ඡරිය, ධම්මමච්ඡරිය යනුයි යමෙකු මෙබඳු මසුරුකමක් මසුරුවීමක් මසුරුබවක් තද ලොභයක්, තදබන්ධනයක් සිතින් ගන්නාලද්දේ, මෙය මසුරුකමයයි කියනුලැබේ. නැවතද ස්කන්ධ මාත්සයර්‍යයද ධාතු මාත්සයර්‍යයද ආයතන මාත්සයර්‍යයද, ගනීද මෙයද මසුරුකම යයි කියනු ලැබේ. මේ මසුරුකමින් අපාය මාර්ගය ප්‍රකාශ කරවමින් යෙදුන ජනයෝ ප්‍රමාදවූවෝ වෙති. මෙසේ මසුරාට අවදානියයි කියනු ලැබේ. කෙසේ බුදුවරුන්ගේ බුද්ධශ්‍රාවකයන්ගේ වචන යහපත් මාර්ග දෙශනාව අනුශාසනය නොඅදහද්ද නොඅසද්ද කණ නොනමද්ද, ඒ පිළිබඳ සිත නොයොදද්ද වැරදි හැඟීමෙන් මුහුණ අන්මගක යොදවද්ද මෙසේ බුදුවරුන්ගේ බුද්ධශ්‍රාවකයන්ගේ යහපත් මාර්ගය දෙශනය අනුශාසනය නොගනිත් නුයි අවදානිය නම්වේ.

4 "විෂමාචාරයේ පිවිසි ඔවුහු" යන මෙහි විෂම යනු විෂමවූ කාය කර්මයෙහි ඇළුණු විෂමවූ වචී කර්මයෙහි ඇළුණු විෂමවූ මනඃකර්මයෙහි ඇළුණු විෂමවූ ප්‍රාණඝාතයෙහි විෂමවූ අදත්තාදානයෙහි විෂමවූ කාමමිත්ථ්‍යාචාරයෙහි විෂමවූ මුසාවාදයෙහි විෂමවූ පිසුණාවාචයෙහි ඇළුනු විෂමවූ ඵරුෂ වචනයෙහි විෂමවූ සම්ඵප්‍රලාපයෙහි ඇළුනු විෂමවූ අභිධ්‍යාවෙහි ඇළුනු විෂමවූ ව්‍යාපාදයෙහි විෂමවූ මිථ්‍යාදෘෂ්ටියෙහි විෂමවූ

සංස්කාරයන්හි විෂමවූ පංචකාම ගුණයන්හි විෂමවූ පංච නීවරණයන්හි ඇළුනු බැඳුනු පිහිටි එල්බගත් පැමිණි බැසගත්තේනුයි විෂම දෙයෙහි ඇළුනානම් වේ.

5 "දුකට පත්වූවාහු වැලපෙත්" යන්නෙහි "දුකට පත් වූවාහු" යනු දුකට පැමිණි දුකට සම්ප්‍රාප්තවූ මාර වසඟයට පැමිණි, මරණප්‍රාප්ත, මරණයට උපගතවූ (සත්වයෝ) යනුයි" " පරිදෙවයන්ති" යනු හඬ දෙත්. එක්ව හඬ දෙත්. ශොක වෙත් ක්ලාන්ත වෙත්. වැළපෙත්. පපුවට අත ගසා හඬත් මුලා බවට පැමිණෙත්. "මින් මළාහු කුමක් වන්නමෝද" යනු මෙයින් චුතව කවරකු වන්නෙමුද, නිරිසත්තු වන්නෙමුද, තිරිසන්නු වන්නෙමුද, ප්‍රෙතයෝ වන්නෙමුද මනුෂ්‍යයෝ වන්නෙමුද දෙවියෝ වන්නමුද රූපී (බ්‍රහ්මයෝ) වන්නෙමුද අරූපී (බ්‍රහ්මයෝ) වන්නෙමුද සඤ්ඤී (අරූපීහු) වන්නෙමුද අසඤ්ඤීහු (සිත නැති) වන්නෙමුද නෙවසඤ්ඤි නාසඤ්ඤි වන්නෙමුද, අපි අනාගත කාලයෙහි වන්නෙමුද අනාගත කාලයෙහි කවරකු හෝ වන්නෙමුද, අනාගත කාලයෙහි කෙසේ හෝ වන්නෙමුද අපි අනාගත කාලයෙහි කවරෙකුවී කෙසේ වන්නෙමුද සැකයට පැමිණියාහු විමතියට පැමිණියාහු විනිශ්චයට නොබැස කථා කරත්. සාකච්ඡා කරත්. ශොක කරත්. ක්ලාන්ත වෙත්. වැළපෙත් පපුවට දෙඅත් ගසා හඬත්. මුලා බවට පැමිණෙත්.

## 2 - 4

1 (i) "එහෙයින් සත්වතෙම මෙහිම හික්මෙන්නේ" යන්නෙහි "එහෙයින්" යනු එහෙයින් ඒ කාරණයෙන් ඒ හේතුවෙන් ඒ ප්‍රත්‍යයෙන් එය නිදාන කොට කාමයන්හි මේ ආදීනව දකිනු ලබන්නේ එහෙයින් හික්මෙව් යනුහි හික්මීම් තුනකි. අධිශීල ශික්ෂා අධිචිත්ත ශික්ෂා අධිපඤ්ඤා ශික්ෂා යනුයි. (ii) අධිශීල ශික්ෂාව කවරීද? මේ ශාසනයෙහි භික්ෂුව සිල් ඇත්තේ වේද ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවෘතවූයේ වෙසේද ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවූයේ ස්වල්ප වරදෙහි භය දක්නා සුළුව ශික්ෂාපදයන් සමාදන්ව හික්මේද, කුඩා ශීලස්කන්ධය මහත්වූ ශීලස්කන්ධය ශීල ප්‍රතිෂ්ඨාව ප්‍රථම

හික්මීම සංයමය, සංවරය, කුශල ධර්මයන්ගේ පැමිණීමෙන් මිදීම යනුයි. මේ අධිශීල ශික්ෂාවයි. අධිචිත්තශික්ෂාව කවරීද, මේ ශාසනයෙහි මහණතෙම (iii) කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් උපන් ප්‍රීති සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි. (iv) විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති චිත්තයාගේ එකඟත්වයෙන් හටගත් විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් උපන් ප්‍රීති සැපය ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කරයි. (v) ප්‍රීතියගේ වෙන්වීමෙන් උපෙක්ෂාවෙන් යුක්තව වාසය කරයි. සිහි ඇත්තේ මනා දැනීම් ඇත්තේ සැපයද කයින් විඳියි. ආර්‍ය්‍යයෝ යම් ඒ ධ්‍යානයකට උපෙක්ෂා ඇත්තේ සිහි ඇත්තේ සැප විහරණයෙන් යුක්තවූයේ යයි කියද්ද, ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. (vi) සුඛයාගේ ප්‍රහානයෙන්ද දුක්ඛයාගේ ප්‍රහාණයෙන්ද සොම්නස් දොම්නස් නැති කිරීමට පෙර දුක නොවූ සැප නොවූ, මැදහත්කම හා සිහියේ පිරිසිදුකමින් යුත් චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරයි. මේ අධි චිත්ත ශික්ෂා නම්.

2 අධිප්‍රඥා ශික්ෂාව කවරීද? මේ ශාසනයෙහි මහණතෙම උදයත්ථ ගාමිනී (ඇතිව නැතිවීම තේරුම් ගන්නා) ප්‍රඥාවෙන් යුක්තවූයේ දුක් කෙළවර කරන්නාවූ ආර්‍ය්‍යවූ ප්‍රඥාවෙන් යුක්තවූයේ ප්‍රඥාවත් වේද හෙතෙම මේ දුකයයි තත්වූ පරිද්දෙන් දනියි. මේ දුකට හේතුව යයි තත්වූ පරිද්දෙන් දනියි. මේ දුක්ඛ නිරොධයයි තත්වූ පරිද්දෙන් දනියි. මේ දුක්ඛ නිරොධ ගාමිනී ප්‍රතිපදාව යයි තත්වූ පරිද්දෙන් දනියි. මේ අධිපඤ්ඤා ශික්ෂාවයි, මේ තුන් ශික්ෂාවන් ආවර්ජනා කරන්නේ හික්මෙන්නේය. දැනගන්නේ හික්මෙන්නේය. දකින්නේ හික්මෙන්නේය. සිහි කරන්නේ හික්මෙන්නේය. සිත පිහිටු වන්නේ හික්මෙන්නේය. ශ්‍රද්ධාවෙන් ස්ථිර ලෙස ඇලෙන්නේ හික්මෙන්නේය. වීර්‍ය්‍යය දැඩිව ගන්නේ හික්මෙන්නේය. සිහිය පිහිටුවන්නේ හික්මෙන්නේය. සිත තැන්පත් කරන්නේ හික්මෙන්නේය. ප්‍රඥාවෙන් දැනගන්නේ හික්මෙන්නේය. විශිෂ්ට ඥානයෙන් දැනගතයුත්ත දැනගන්නේ හික්මෙන්නේය. සම්පූර්ණයෙන්

දැනගතයුත්ත දැනගන්නේ හික්මෙන්නේය දුරුකට යුත්ත දුරු කරන්නේ හික්මෙන්නේය. වැඩිය යුත්ත වඩන්නේ හික්මෙන්නේය. ප්‍රත්‍යක්ෂ කළයුත්ත ප්‍රත්‍යක්ෂ කරන්නේ හික්මෙන්නේය. හැසිරෙන්නේය. මනාකොට හැසිරෙන්නේය. සමාදන්ව වසන්නේය. "මෙහි" යනු මේ දෘෂ්ටියෙන් මේ ක්ෂාන්තියෙන් මේ රුචියෙන් මේ ග්‍රහණයෙන් මේ ධර්මයෙහි මේ විනයෙහි මේ ධර්ම විනයෙහි මේ උතුම් වචනයෙහි මේ බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි මේ ශාස්තෘ ශාසනයෙහි මේ ආත්ම භාවයෙහි මේ මනුෂ්‍ය ලොකයෙහි එහෙයින් මෙහි යයි කියයි. ජන්තු යනු සත්වයා මනුෂ්‍යයා (මෙහි (1) 7 (ii) ඡෙදය යෙදිය යුතුයි) එහෙයින් සත්වතෙමේ මෙහිම හික්මෙන්නේය.

3 "ලොව යම්කිසිවක් විෂමය කියා දන්නේ" යන්නෙහි සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සියල්ල ශෙෂ නොකොට අවශෙෂ නොකොට වටකොට ගත් යන මේ වචනයයි.

4 "විෂමය කියා දන්නේ" යන්නෙහි, විෂමවූ කාය කර්මය විෂමයයි දන්නේය. විෂමවූ වචී කර්මය විෂමයයි දන්නේය වෂමවූ මනඃ කර්මය විෂමයයි දන්නේය. විෂමවූ ප්‍රාණඝාතය විෂමයයි දන්නේය. විෂමවූ අදින්නාදානය විෂම යයි දන්නේය විෂමවූ කාම මිථ්‍යාචාරය විෂමයයි දන්නේය. විෂමවූ මුසාවාදය විෂමයයි දන්නේය විෂමවූ කේලම විෂම යයි දන්නේය. විෂමවූ ඵරුෂ වචනය විෂමයයි දන්නේය. විෂමවූ හිස් වචන කීම විෂමයයි දන්නේය. විෂමවූ අභිධ්‍යාව විෂමයයි දන්නේය. විෂමවූ ව්‍යාපාදය විෂමයයි දන්නේය. විෂමවූ මිථ්‍යාදෘෂ්ටිය විෂමයයි දන්නේය විෂමවූ සංස්කාරය විෂමයයි දන්නේය විෂමවූ පංච කාම ගුණයෝ විෂමයයි දන්නේය. විශෙෂයෙන් දන්නේය. උසස් ලෙස දන්නේය. අවබොධ කරන්නේය. 'ලොවේ' යනු අපාය ලොකයෙහි මනුෂ්‍ය ලොකයෙහි, දිව්‍ය ලොකයෙහි, ස්කන්ධ ලොකයෙහි, ධාතු ලොකයෙහි ආයතන ලොකයෙහි යනුයි ලොව යම් කිසිවක් විෂමය කියා දන්නේ" යන්නට විස්තරය නිමියේය.

5 "එහි හේතුවෙන් විෂමව නොහැසිරෙන්නේය." යනු විෂමවූ කාය කර්ම හේතුවෙන් විෂමව නොහැසිරෙන්නේය.

විෂමවූ වචී කර්ම හේතුවෙන් විෂමව නොහැසිරෙන්නේය. විෂමවූ චෙතනා හේතුවෙන් විෂමව නොහැසිරෙන්නේය. විෂමවූ ප්‍රාර්ථනා හේතුවෙන් විෂමව නොහැසිරෙන්නේය. සමාදන්ව නොසිටින්නේය "නුවණැත්තෝ වනාහි ජීවිතය අල්පයයි කීහු" යන්නෙහි ජීවිතය යනු ආයු පැවැත්මයි යැපීම, පැවතීම, ජීවිතය ජිවිතින්ද්‍රිය පාලනයයි, නැවතද කරුණු දෙකකින් ජීවිතය අල්පය ස්වල්ප කාලයක් පවත්නා බැවින් ජීවිතය ස්වල්පයි ස්වභාවයෙන් ටික කලක් පවත්නා බැවින් ජීවිතය ස්වල්පයි. ස්වල්ප කලක් පවත්නා බැවින් ජීවිතය ස්වල්පවූයේ කෙසේද, අතීත චිත්ත ක්ෂණයෙහි ජීවත්විය. ජීවත් නොවෙයි ජීවත් නොවන්නේය. අනාගත චිත්තක්ෂණයෙහි ජීවත් වන්නේය. ජීවත් නොවෙයි ජීවත් නොවූයේය පවත්නා කල චිත්තක්ෂණයෙහි ජීවත් වෙයි ජීවත් නොවූයේය ජීවත් නොවන්නේය.

**6** "ජීවිතයද ආත්මභාවයද හුදෙක් සැප දුක්ද එක චිත්තක්ෂණයකින් පමණක් යුක්තය කෙටි වශයෙන් කාලය පවත්නේය."

**7** "යම් දෙවි කෙනෙක් සුළු කල්ප අසූදහසක් සිටිත්. ඔවුහුද චිත්තක්ෂණ දෙකකින් යුතුව ජීවත් නොවෙත්."

"මේ ලොකයෙහි මරණයට පත්වන්නහුගේ යම් නිරුද්ධවූ පංචස්කන්ධයක් ඇද්ද, සිටින්නහුගේ හෝ පංචස්කන්ධයක් ඇද්ද, නූපන්නහුගේ ස්කන්ධයක් ඇද්ද, සියල්ලම සමාන බවට පැමිණියේය."

**8** "නූපන්නහු විසින් නූපදිනා ලද්දේවේ. පවත්නා කාලයෙහි ජීවත් නොවේ. ලොකයෙහි චිත්තභංගයෙන් මැරුණේවේ. පරමාර්ථ වශයෙන් මේ පැනවීමයි.

"යම්සේ ආශාවෙන් නැමුනාහු භවයට බරවූවෝ වෙති. සළායතන ප්‍රත්‍යයෙන් නොසිඳුණ චිත්ත ධාරාවෝ පවතිත්. භවයෙහි සිත තැත්පත් නොකළෝ චිත්තභංගත්වය ඇත්තෝ වෙති. (ඔවුන්ට ශරීර පුඤ්ජයක් (ගොඩක්) අනාගතයෙහි නැත. ඉදිකටු අග අබ ඇටය මෙන් උපන්නෝම සිටිත්.

"හේතු ප්‍රත්‍ය ධර්මයන්ගෙන් උපනුන්ගේද භංගත්වය ඔවුන්ගේ ඉදිරියෙහිමවේ. අතීතය හා මිශ්‍ර නොවූ විනාශවන සුළු ධර්මයෝ පවතිත්.

**9** ("ඒ චිත්ත පරම්පරාව) නොපෙණී මෙන්ම එත් භංගවූවෝ නොපෙණීමට යෙති. අහසෙහි විදුලියමෙන් උපදිත් විනාශවෙත්."

මෙසේ ස්වල්ප කාලයක් පවත්නා බැවින් ජීවිතය අල්පය, කෙසේ ස්වභාවයෙන් අල්ප බැවින් ජීවිතය ස්වල්පද ජීවිතය ආශ්වාසය හා සම්බන්ධයෙන් යුක්තවූයේය. ප්‍රශ්වාසය හා සම්බන්ධයෙන් යුක්තවූයේය. ආශ්වාස ප්‍රශ්වාස දෙක හා සම්බන්ධයෙන් යුක්තවූයේය. මහාභූතයන් හා සම්බන්ධයෙන් යුක්තවූයේය. කැබලිකොට කඩා කන ආහාරය හා සම්බන්ධයෙන් යුක්තවූයේය. උෂ්ණය හා සම්බන්ධයෙන් යුක්තවූයේය. විඥ්ඥානය හා සම්බන්ධයෙන් යුක්තවූයේය. මොවුන්ගේ මුලද දුර්වලය මොවුන්ගේ පූර්ව හේතුවද දුර්වලය. මොවුනට ඇතිවන භූමියද දුර්වලය. මොවුන්ගේ සම්ප්‍රයෝගයෝද දුර්වලය. මොවුන් හා එකට උපන්නෝද දුර්වලයෝය. යම් යොදවන්නියක් වේද එයද දුර්වලය. මොවුහු නිත්‍යයෙන් ඔවුනොවුන් දුර්වලය මොවුහු ඔවුනොවුන් අස්ථිරත්වයෙන් යුක්තවූවෝය. මොවුහු ඔවුනොවුන් හෙලත්, ඔවුනොවුන්ගේ වනාහි ආරක්ෂාවක් නැත. මොවුහු ඔවුනොවුන් නොතබත්. යමෙක් උපදවන්නේද හෙතෙම විද්‍යාමාන නොවේ.

**10** "කවරකු විසින් හෝ කිසිවෙක් හෝ නොපිරිහෙයි. මේ සියල්ලෝම අන්තැනක උපදින්නේය. යම් කෙනෙක් මුලින් උපන්නෝද ඔවුහු උත්පත්තිය පිහිටකොට ඇත්තාහු මුලින්ම මළෝය පෙරවූවෝද පසුවූවෝද කිසිකලකත් ඔවුනොවුන් නොමැඩූහ."

මෙසේ ස්වභාවයෙන් ස්වල්ප බැවින් ජීවිතය ස්වල්පය නැවතද චාතුර්මහාරාජික දෙවියන්ගේ ජීවිතය සමාන කළ කල්හි මිනිසුන්ගේ ජීවිතය අල්පය, කුඩාය ටිකය, ස්වල්පය මදය කලක් නොපවත්නේය, චිරස්ථායී නොවේ. තවුතිසා

දෙවියන්ගේ යාම දෙවියන්ගේ තුසිත දෙවියන්ගේ නිර්මාණ රතී දෙවියන්ගේ පරනිර්මිත වසවර්තී දෙවියන්ගේ බ්‍රහ්ම කායික දෙවියන්ගේ ජීවිතය සමාන කළ කල්හි මිනිසුන්ගේ ජීවිතය අල්පය, කුඩාය, ටිකය, ස්වල්පය, මදය, කලක් නොපවත්නේය. චිරස්ථායී නොවේ. භාග්‍යවතුන් වහන්සේ විසින්ද දෙශනා කරණ ලදදේය.

11 "මහණෙනි, මිනිසුන්ගේ මේ ජීවිතය ස්වල්පය. පරලොවට යන සුලුය මෙය දැන අවබොධ කට යුතුය. කුසල් කටයුතුය බඹසරහැසිරිය යුතුය. උපන්නහුට නො මැරීමක් නැත. මහණෙනි, යමෙක් බොහෝකල් ජීවත් වේද, අවුරුදු සියයකට අඩුය, ස්වල්පයක් වැඩිය හෝ වෙයි."

"මිනිසුන්ගේ ආයුෂ ස්වල්පය. යහපත් පුරුෂතෙම එය පිළිකුල් කරන්නේය. හිස ගිනිගත්තහු මෙන් හැසිරෙන්නේය. මරුවාගේ (මරණයේ) නොඊමක් නැත.

"රෑ දාවල් ඉක්මෙත්, ජීවිතය විනාශ කරණු ලැබේ. ගංගාවන්ගේ ජලය යටි ගඟට යන්නාක්මෙන් මිනිසුන්ගේ ආයුෂය ගෙවේ"

12 "නුවණැත්තේ මේ ජීවිතය අල්පයයි" කීහු යන්නෙහි ධෛර්‍ය්‍ය ඇත්තේනුයි ධීර නම්. උත්සාහ ඇත්තේනුයි ධීර නම් ප්‍රඥා ඇත්තේහුයි ධීර නම්. ප්‍රඥාවට ධීර යයි කියනු ලැබේ. යම් ප්‍රඥාවක් දැනීම පරීක්ෂණය (ii) විශෙෂ දැනීම ධර්මය පරීක්ෂාවෙන් දැනීම සලකා බැලීම වෙනස දැනීම වැටහීමෙන් දැනීම පාණ්ඩිත්‍යය දක්ෂකම නිපුණත්වය විභවත්වය චින්තාව මන්තාව සොයාබැලීම ප්‍රඥාව ඥානය මගපෙන්වීම විදර්ශනාව මනා දැනීම සිහි කරවීමේ ප්‍රඥාව ප්‍රඥෙන්ද්‍රිය ප්‍රඥාබලය ප්‍රඥා ආයුධය ප්‍රඥා ප්‍රාසාදය ප්‍රඥා ආලොකය ප්‍රඥා අවභාසය ප්‍රඥා පහන ප්‍රඥා රතනය (iii) නුමුළාව ධම්ම වීචය නම් සම්‍යග්දෘෂ්ටිය යන ඒ ප්‍රඥාවෙන් යුක්ත බැවින් ධිර යයි කියයි. නැවතද ස්කන්ධයෙහි නුවණැති, ධාතූන්හි නුවණැති, ආයතනයන්හි නුවණැති, ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි නුවණැති, සති පට්ඨානයෙහි නුවණැති, සම්‍යක් ප්‍රධානයෙහි නුවණැති, ඍද්ධි පාදයෙහි

නුවණැති ඉන්ද්‍රියයන්හි නුවණැති, බොධ්‍යංගයන්හි නුවණැති, මාර්ගයන්හි නුවණැති, ඵලයන්හි නුවණැති, නිර්වාණයෙහි නුවණැති ඒ නුවණැත්තෝ මෙසේ කීහ. මිනිසුන්ගේ ජීවිතය ස්වල්පය. ජීවිතය මදය. ටිකය. ටික කාලයෙකි. ඈත නොයන සුළුය. ජීවිතය චිරස්ථායි නොවේ. මෙසේ කීහ. මෙසේ කියත්. මෙසේ කථා කරත්. මෙසේ ප්‍රකාශ කරත් මෙසේ ව්‍යවහාර කරත්.

## 2 - 5

"ලොකයෙහි සැලෙනවුන් දකින්නෙමි." යන්නෙහි "දකින්නෙමි." යනු මසැසින්ද බලන්නෙමි දිවැසින්ද බලන්නෙමි. පැණැසින්ද බලන්නෙමි. බුදු ඇසින්ද බලන්නෙමි. සියල්ල දක්නා ඇසින්ද බලන්නෙමි. දකිමි බලමි මනාකොට පරීක්ෂා කරමි. 'ලොවේ' යනු අපාය ලොකයෙහි මනුෂ්‍ය ලොකයෙහි දිව්‍ය ලොකයෙහි ස්කන්ධ ලොකයෙහි ධාතුලොකයෙහි ආයතනලොකයෙහි යනුයි 'සැලෙන' යනු තෘෂ්ණා කම්පනයෙන් කම්පනය වන්නාවූ දෘෂ්ටි කම්පනයෙන් ක්ලෙශ කම්පනයෙන් ප්‍රයොග කම්පනයෙන් විපාක කම්පනයෙන් දුශ්චරිත කම්පනයෙන් රත්වූ රාගයෙන් දූෂ්‍යවූ ද්වෙෂයෙන් එකට බැඳුනාවූ මානයෙන් දෘෂ්ටි පරාමර්ශයෙන් උද්ධච්චයෙන් වික්ෂෙපගතව කම්පනය වන්නාවූ ක්ලෙශයන්ගෙන් උත්සාහවත්ව කම්පනය වන්නාවූ විචිකිච්ඡාවෙන් අවිනිශ්චිතව කම්පනය වන්නාවූ අනුසයන්ගෙන් උත්සාහවත්ව කම්පනය වන්නාවූ ලාභයෙන් කම්පනය වන්නාවූ අලාභයෙන් කීර්තියෙන් අපකීර්තියෙන් ප්‍රශංසාවෙන් කම්පනය වන්නාවූ නින්දාවෙන් සැපතින් ඉපදීමෙන් ජරාවෙන් ව්‍යාධියෙන් මරණයෙන් ශොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාසයන්ගෙන් නිරය දුකින් කම්පනය වන්නාවූ තිරිසන් යොනික දුකින් ප්‍රෙත විෂයික දුකින් මානුෂික දුකින් ගර්භයට ඇතුළුවීමේ දුකින් ගර්භයෙහි සිටීමේ දුකින් ගර්භයෙන් නැගිටීමේ දුකින් උපන්නහුට බැඳීම් ආදියෙන් ඇතිවන උපන්නහුට අනුන් ගෙන් සිදුවන දුකින් ආත්මොපක්‍රම දුක්ඛයෙන් පරොපක්‍රම දුක්ඛයෙන් දුක්ඛ දුක්ඛයෙන් සංස්කාර

දුකින් විපරිණාම දුකින් ඇස්රෝගයෙන් මෙහි (4) 4 (iii) ඡේදය යෙදිය යුතුයි) මවුගේ මරණයෙන් ඇතිවන දුකින් පියාගේ මරණයෙන් සහෝදරයාගේ මරණයෙන් සහෝදරියගේ මරණයෙන් පුත්‍රයාගේ මරණයෙන් දුවගේ මරණයෙන් ඥාති ව්‍යසන දුකින් භොගව්‍යසන දුකින් රොග ව්‍යසන දුකින් ශීල ව්‍යසන දුකින් දෘෂ්ටි ව්‍යසන දුකින් කම්පනය වන්නාවූ චලනය වන්නාවූ විශෙෂයෙන් කම්පනය වන්නාවූ වෙවුලන්නාවූ (සත්වයන්) දකිමි. බලමි පරීක්ෂාකොට නිරීක්ෂණය කරමි යනුයි. භවයන්හි තෘෂ්ණාවෙන් මැඩෙන මේ ප්‍රජාව යන්නෙහි පජායනු සත්වයන්ට නමෙකි. තෘෂ්ණා යනු රූප තෘෂ්ණා ශබ්ද තෘෂ්ණා ගන්ධ තෘෂ්ණා රස තෘෂ්ණා ස්පර්ශ තෘෂ්ණා ධර්ම තෘෂ්ණා භව තෘෂ්ණා විභව තෘෂ්ණා තෘෂ්ණාව අනුව ගියාවූ තාෂ්ණාවට බැසගත්තාවූ තෘෂ්ණාවට පැමිණියාවූ තෘෂ්ණාව මතුවෙහි වැටුනාවූ මැඩුනාවූ වටකොට ගත්තාවූ අල්පවූ ස්වල්පවූ (මනුෂ්‍යයෝ) යනුයි.

13 "මරුගේ කටෙහි හඬත්" යනු මාර මුඛයෙහි මරණ මුඛයෙහි මරණය පැමිණියේ මාරයා පැමිණියේ මරණ ප්‍රාපතවූයේ මරණය පැමිණියේ, කථාකරත්, එකතුව දොඩත්, ක්ලාන්තවෙත්, හඬා වැළපෙත්, පපුව මත අත තබා හඬත්, සිහිමුළා බවට පැමිණෙත්, (යනුයි)

14 "භවාභවයන්හි පහ නොකළ තෘෂ්ණා "ඇත්තෝ" යන්නෙහි "තෘෂ්ණා" යනු රූප තෘෂ්ණා ශබ්ද තෘෂ්ණා ගන්ධ තෘෂ්ණා රස තෘෂ්ණා ස්පර්ශ තෘෂ්ණා ධර්ම තෘෂ්ණා (යනුයි.) භවාභවයන්හි යනු කර්මභවයෙහි පුනර්භවයෙහි රූප භවයෙහි, කර්ම භවයෙහි රූපභවයෙහි පුනර්භවයෙහි අරූප භවයෙහි, කර්ම භවයෙහි අරූප භවයෙහි පුනර්භවයෙහි නැවත නැවත භවයෙහි නැවත, ගති නැවත නැවත උත්පත්තියෙහි නැවත නැවත ප්‍රතිසන්ධියෙහි නැවත නැවත ආත්මභවයෙහි යනුයි.

15 "භවා භවයන්හි" යනු කාමභවයෙහි රූපභවයෙහි අරූපභවයෙහි යනුයි. පහත් මනුෂ්‍යයෝ මරුගේ කටෙහි හඬත්" යනුවෙන්, හීනවූ මනුෂ්‍යයෝ නම් ලාමකවූ කාය කර්මයෙන්

යුක්තවූ ලාමකවූ වාග් කර්මයෙන් ලාමකවූ මනො කර්මයෙන් ලාමකවූ ප්‍රාණඝාතයෙන් අදත්තා දානයෙන් කාමමිථ්‍යාචාරයෙන් මුසාවාදයෙන් කේලාම් බසින් ඵරුෂ බසින් සම්ඵප්‍රලාපයෙන් හීනවූ අභිධ්‍යාවෙන් ව්‍යාපාදයෙන් මිථ්‍යාදෘෂ්ටියෙන් සංස්කාරයන්ගෙන් හීනවූ පංචකාම ගුණයන්ගෙන් හීනවූ පංචනීවරණයන්ගෙන් හීනවූ චෙතනාවෙන් හීනවූ ප්‍රාර්ථනාවෙන් හීනවූ සිත පිහිටුවා ගැන්මෙන් යුක්තවූයේනුයි හීනවූ නිහීනවූ ලාමකවූ ඇති වීමෙහි නොහළ තෘෂ්ණාව ඇති පහව නොගිය තෘෂ්ණා ඇති වමාරා නොදැමූ තෘෂ්ණාව ඇති නොමිදුන තෘෂ්ණාව ඇති ප්‍රහීන නොවූ තෘෂ්ණාව ඇති නොසන් සිඳුනාවූ තෘෂ්ණාව ඇති (යනුයි)

## 2 - 6

1 "බලව්, මමත්වය ඇති දෙයෙහි සැලෙනවුන්" යන්නෙහි මමත්ව දෙකකි. තෘෂ්ණා මමත්වයද, දෘෂ්ටි මමත්වයද යනුයි

(ii) තෘෂ්ණා මමත්වය කවරේද? යම්තාක් තෘෂ්ණාවෙන් සීමාකරණලද ඉලක්ක කරණලද වටකරණ ලද හාත්පසින් සීමාකරණලද මෙය මාගේය. මෙපමණ මාගේය. මෙපමණකින් මාගේය රූපයෝ, ශබ්දයෝ, ගන්ධයෝ, රසයෝ ස්පර්ශයෝ ඇතිරිලි පොරෝනය, දාසි දාසයෝ, එළු, බැටළුවෝ ඌරු කුකුල්ලු, ඇත්, ගව, අශ්ව, වෙළඹහු කෙත්වත් හිරණ්‍ය ස්වර්ණ ගම් නියම්ගම් රාජධානි රටවල් ජනපද කොටුගුල් ගබඩා මාගේය. හුදෙක් මහා පෘථිවියද, තෘෂ්ණා වශයෙන් මමායනය කරයි. යම්තාක් එක්සිය අටක් තෘෂ්ණාවට අයත්ද (ඒ සියල්ල) මේ තෘෂ්ණා මමත්වයයි (iii) දෘෂ්ටි මමත්වය කෙසේද? විංශති වස්තුකවූ සත්කාය දෘෂ්ටිය දශවස්තුක මිථ්‍යාදෘෂ්ටිය, දශ වස්තුක අන්තග්‍රාහික දෘෂ්ටිය යම් එබඳු දෘෂ්ටි ඇද්ද, දෘෂ්ටි වශයෙන් ගත් දෘෂ්ටි කාන්තාරය, දෘෂ්ටිකණ්ඨකය, දෘෂ්ටිකම්පනය දෘෂ්ටි සංයොජනය, ග්‍රහණය, ප්‍රතිග්‍රහණය, ඇතුළුවීම පරාමර්ශය, වැරදි මාර්ගය, මිථ්‍යා මාර්ගය, බොරුබව නිර්වායතනය, වැරදිගැන්ම, විපර්‍යාස ග්‍රහනය, මිථ්‍යා ග්‍රහනය, වැරදි දේ නිවැරදියයි ගැන්ම යම් පමණ දෙසැට දෘෂ්ටි ගත්තෝ වෙත්ද මේ දෘෂ්ටි මමත්වයයි.

2 "මගේයයි ගත්, කම්පාවන්නවුන් බලවූ" යන්නෙහි මමය මාගේයයි ගන්නා ලද වස්තුවෙහි නොබිඳේය යන හැඟීමෙන් කම්පාවෙත් බිඳෙද්දීද කම්පා වෙත්. බිඳුනකල්හිද මමය මාගේ යයි ගන්නාලද වස්තුව වෙනස්වූ කල්හිද කම්පා වෙත්. විශෙෂයෙන් කම්පාවෙත්. සැලෙත් වෙවුලත් මනා කොට වෙවුලත් මෙසේ කම්පාවන්නවුන් විශෙෂයෙන් කම්පාවන්නවුන් සැලෙනවුන් වෙවුලන්නවුන් බලව් දකිව්. සිතව් පරීක්ෂාකරව්.

3 "දිය නැති ගලායාම් නැති තැන මසකු මෙන්" යනු අල්පවූ දිය ඇති මඳක් දිය ඇති දියකෙළවර සිටින මත්සායයා කවුඩන් විසින් හෝ ගිජුලිහිනියන් විසින් හෝ කොකුන් විසින් හෝ අන් කිසි සතුන් විසින් හෝ කනු ලබන්නාහු පෙරලනු ලබන්නාහු ඩැහැගනු ලබන්නාහු කම්පා වෙත්. විශෙෂයෙන් කම්පා වෙත්. වෙවුලත්. සැලෙත්. එපරිද්දෙන්ම සත්වයෝ මමය මාගේයයි ගන්නාලද වස්තුව සිඳීයන කල්හි (බිඳී යන) කම්පාවෙත්. සිඳුනකල්හිද වෙවුලත්. මමය මාගේ යයි ගන්නාලද වස්තුව වෙනස්වේ යයි සැකයෙන්ද වෙනස්වන කල්හිද, වෙනස්වූ කල්හිද කම්පා වෙත. වෙවුලත්.

4 "මෙසේද දැක මගේ යැයි නොගෙන හැසිරෙන්නේ" යනු මේ ආදීනව දැක සමසේ සිතා තීරණයකොට පැහැදිලි කොට විස්තරකොට මමත්වය ඇති වස්තුන්හි, "මගේ යැයි නොගෙන හැසිරෙන්නේ" යන්නෙහි මගේ යැයි ගැනීමේ මමත්ව දෙකකි. තෘෂ්ණා මමත්වයද දෘෂ්ටිමමත්වයද යන දෙකයි. (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) මේ දෘෂ්ටි මමත්වයයි තෘෂ්ණා මමත්වය හැර දෘෂ්ටි මමත්වය බහා තබා ඇස් මමය මාගේයයි නොගන්නේ කණ මමය මාගේ යයි නොගන්නේ නාසය මමය මාගේයයි නොගන්නේ දිව මමය මාගේයයි නොගන්නේ ශරීරය මමය මාගේයයි නොගන්නේ මනස මමය මාගේයයි නොගන්නේ රූපයන් ශබ්දයන්, ගන්ධයන්, රසයන් ස්පර්ශයන් ධර්මයන් කුලය, ගණය, ආවාසය, ලාභය, කීර්තිය, ප්‍රශංසාව, සිවුරු, පිණ්ඩාහාර, සෙනසුන්, ගිලන්පස බෙහෙත් පිරිකර, කාම ධාතු, රූපධාතු අරූපධාතු, කාමභව, රූපභව, අරූපභව සංඥාභව, අසංඥාභව, නෙවසංඥානාසංඥාභව, එකවොකාරභව,

චතුවොකාරභව පඤ්චවොකාරභව, අතීත අනාගත වර්තමානයන්හි ඇසූ දුටු (නාසය දිව සිරුර යන මෙකී දෙයින් දැනගත් දෙය) යන දතයුතු ධර්මයන්හි මමත්වය හරනේ නොගන්නේ පරාමර්ශය නොකරන්නේ සදොරින් ඇතුල් නොකරන්නේ හැසිරෙන්නේය. වසන්නේය. පවත්නේය. පාලනය කරන්නේය. යැපෙන්නේය.

5 "භවයන්හි ඇල්ම නොකරන්නේ" යන්නෙහි භවයන්හි යනු කාම භවයෙහි, රූපභවයෙහි, අරූප භවයෙහි "ඇල්ම" යනු තෘෂ්ණාවට කියනු ලැබේ. යම් රාගයක් ඇල්මක් බලවත් ඇල්ම දැඩි ලෝභය, ලෝභය අකුශල මූලය, භවයන්හි ඇල්ම නොකරන්නේ යනු ආශාව, ප්‍රේමය, රාගය, ඉවසීම, නොකරන්නේ නූපදවන්නේ යනුයි.

## 2 - 7

1 "දෙකොණෙහි ඇල්ම දුරලන්නේ" යන්නෙහි "කොණ" යනු කොන් දෙකකි ස්පර්ශය එක් කොනෙකි. ස්පර්ශය ඇතිවීමේ හේතුව දෙවෙනි කොනය (අන්තය) යි. අතීතය එක් අන්තයකි. අනාගතය දෙවන අන්තයයි. සුඛ වෙදනාව එක් අන්තයකි. දුක්ඛ වෙදනාව දෙවන අන්තයයි. නාමය එක් අන්තයකි රූපය දෙවන අන්තයයි. සවැදෑරුම් අධ්‍යාත්මික ආයතනයෝ එක් අන්තයකි. සවැදෑරුම් බාහිර ආයතනයෝ දෙවන අන්තයයි. ආත්මදෘෂ්ටිය එක් අන්තයකි ආත්මදෘෂ්ටිය ඇතිවීමේ හේතුව දෙවන අන්තයයි. "ඡන්දය" යනු යමෙක් කාමයන්හි කාමාශාව (මෙහි 1, 3 ඡේදයේ "කාම රාගය ඇත්තේද" යන තැන් සිට යොදාගත යුතුයි.)

"දෙකොණෙහි ඇල්ම දුරලන්නේ" යනු අන්ත දෙකෙහි ආශාව දුරුකරන්නේය. අත්හරින්නේය නූපදනා බවට පමුණුවන්නේය.

2 "ස්පර්ශය පිරිසිඳ දැන ගිජුනොවූයේ" යන්නෙහි ස්පර්ශය යනු (ii) චක්ෂු ස්පර්ශය, ශ්‍රොත ස්පර්ශය, ඝ්‍රාණස්පර්ශය ජිව්හා ස්පර්ශය, කාය ස්පර්ශය, මනස්පර්ශය, අධිවචන ස්පර්ශය,

පටිසස්පර්ශය, සුඛවෙදනීය ස්පර්ශය, දුක්ඛ වෙදනීය ස්පර්ශය අදුඃඛමසුඛ වෙදනීය ස්පර්ශය, කුශලස්පර්ශය, අකුශල ස්පර්ශය අව්‍යාකෘත ස්පර්ශය, කාමාවචර ස්පර්ශය, රූපාවචර ස්පර්ශය, අරූපාවචර ස්පර්ශය, සූන්‍යතා ස්පර්ශය, අනිමිත්ත ස්පර්ශය, අප්පණිහිතස්පර්ශය, ලෞකික ස්පර්ශය ලොකොත්තර ස්පර්ශය, අතීතස්පර්ශය, අනාගත ස්පර්ශය, පවත්නා කාලයෙහි ස්පර්ශය, මෙබඳුවූ ස්පර්ශය ස්පර්ශකරණලද බැවින් මෙය ස්පර්ශයයි කියනුලැබේ.

3 "ස්පර්ශය පිරිසිඳ දැන" යනු දැනීම් තුනින් මනාකොට දැන ඥාත නම් දැනීමෙන් තීරණ නම් දැනීමෙන් පහාන නම් දැනීමෙන් දැන යනුයි. (iii) ඥාත නම් දැනීම කවරේද? මේ චක්ෂු ස්පර්ශය (මෙහි 2 (ii) ඡේදය යෙදිය යුතුයි.) මේ දැන් පවත්නා කාලයයි ස්පර්ශය දනීද, මේ ඥාත නම් දැනීමයි.

4 තීරණ පරිඥාව (දැනීම) කවරීද? මෙසේ දැනීමකොට දැනීම තීරණය කරයි. (ii) අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් රොග වශයෙන් ගණ්ඩ වශයෙන් හුලක් වශයෙන් උවදුරු වශයෙන් උපද්‍රව වශයෙන් භය වශයෙන් හිරිහැර වශයෙන් කම්පනය වශයෙන් වහා නැසීම් වශයෙන්, අස්ථිර වශයෙන් ආරක්ෂා රහිත වශයෙන් හිස් වශයෙන් ශූන්‍යවශයෙන් අනාත්ම වශයෙන් ආදීනව වශයෙන් ආසාර වශයෙන් උවදුරුවලට මුල් වශයෙන් විභව වශයෙන් ආශ්‍රව වශයෙන් මාරාමිෂ (මරුට ගොදුරු) වශයෙන් ජාති ධර්ම වශයෙන් ජරා ධර්ම වශයෙන් ව්‍යාධි ධර්ම වශයෙන්, මරණ ධර්ම වශයෙන් සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාශ වශයෙන් කිළුටු කරණ ධර්ම වශයෙන්, ආදීනව වශයෙන්, නිශ්ශරණ වශයෙන්, තීරණ කරයි. (ii) මේ තීරණය ප්‍රඥාවයි.

5 ප්‍රහාණ පරිඥාව කවරීද? මෙසේ තීරණයකොට ස්පර්ශයෙහි ඡන්දරාගය දුරු කරයි. සංසිඳවයි. නොපැමිණෙනබවට පමුණුවයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණලදී. "මහණෙනි, ස්පර්ශයන්හි යම් ඡන්දරාගයක් ඇද්ද එය දුරු කරව්. මෙසේ ඒ ස්පර්ශය දුරුවූයේ වෙයි. මුල

සිඳින ලද්දේ අග සිඳි තල්ගසක් මෙන් කරණලද්දේ නොඉපදීම බවට ගියේ නැවත නූපදින තත්වයට පමුණුවන ලද්දේ (යනුයි) මේ ප්‍රහාන පරිඥාවයි.

6 "ස්පර්ශය පිරිසිඳ දැන" යනු ස්පර්ශය මේ තුන් පරිඥාවෙන් දැනීමෙන් මනාකොට දැන "ගිජුකමක් නැත්තේ" යන්නෙහි ගිජු යයි තෘෂ්ණාවට කියනු ලැබේ යම් රාගයක් ඇද්ද, ඇලීමක් ඇද්ද, (මෙහි (1-3) 3 ඡේදයේ "යම් ලංවීමක් තැන් සිට ඡේදය අවසානය දක්වා යෙදිය යුතුයි.) තද ලොභයක් ඇද්ද ලෝභයක්, අකුශල මූලයක් ඇද්ද යමෙකුට මේ ගිජුකම ප්‍රහීනවූයේ මුලිනුපුටාදැමූයේ සංසිඳුනේ ඉපදීමට සුදුසු නොවූයේ ඥාන ගින්නෙන් දැවූයේ හෙතෙම ගිජු නොවූයේයයි කියනු ලැබේ. (ii) හෙතෙම රූපයෙහි ගිජු නොවූයේ ශබ්දයෙහි ගිජු නොවූයේ ගන්ධයෙහි ගිජු නොවූයේ රසයෙහි ගිජුනොවූයේ ස්පර්ශයෙහි ගිජු නොවූයේ කුලයෙහි ගණයෙහි ආවාසයෙහි ලාභයෙහි කීර්තියෙහි ප්‍රශංසායෙහි සුඛයෙහි චීවරයෙහි පිණ්ඩපාතයෙහි සේනාසනයෙහි ගිලන්පස බෙහෙත් පිරිකරෙහි කාම ධාතුයෙහි රූප ධාතුයෙහි අරූප ධාතුයෙහි කාමභාවයෙහි, රූප භවයෙහි අරූප භවයෙහි සංඥා භවයෙහි අසංඥා භවයෙහි නෙවසඤ්ඤා නාසඤ්ඤා භවයෙහි එකවොකාර භවයෙහි චතුවොකාර භවයෙහි පංචවොකාර භවයෙහි, අතීතයෙහි, අනාගතයෙහි පවත්නා කාලයෙහි (ii) 2 ඇසූ දුටු දැනගත්, දැනගතයුතු ධර්මයන්හි ගිජු නොවූයේ නොගැටුනේ නොමුලාවූයේ නොබැස ගත්තේ හළ ගිජුකම ඇත්තේ පහව ගිය ගිජුකම ඇත්තේ වමාරා දැමූ ගිජුකම ඇත්තේ, මිදුන ගිජුකම ඇත්තේ පහව ගිය රාග ඇත්තේ අත්හළ රාග ඇත්තේ වමාළ රාග ඇත්තේ මිදුන රාග ඇත්තේ ප්‍රහීන රාග ඇත්තේ පහකළ රාග ඇත්තේ නිශ්චයට පැමිණියේ නිවුනේ සිහිල්වූයේ සැප විඳින්නේ බ්‍රහ්මවූ ආත්මභාවයෙන් වාසය කරයි.

7 "යමකින් තමා ගරහන්නේද, එය නොකරන්නේ" යන්නෙහි "යම්" යනු යම් යන අර්ථයයි. තමාට නින්දාකරන්නේ යනු කරුණු දෙකකින් තමාට නින්දාකරයි. කරණලද බැවින්ද

නොකරණ ලද බැවින් ද යනුයි. කෙසේ කරණලද බැවින්ද නොකරණ ලද බැවින්ද තමාට නින්දා කෙරේද, මවිසින් කාය දුශ්චරිතය කරණලදී. මාවිසින් කාය සුචරිතය නොකරණ ලදීයයි තමාට නින්දා කරයි. මාවිසින් වාග් දුශ්චරිතය කරණ ලදී. මවිසින් වාග් සුචරිතය නොකරණ ලදීයයි තමාට නින්දා කරයි. මවිසින් ප්‍රාණඝාතය කරණලදී. මවිසින් ප්‍රාණඝාතය අත් නොහරින ලදීයයි තමාට නින්දා කරයි. මවිසින් අදත්තාදානය කරණලදී මාවිසින් අදත්තාදානය අත් නොහරින ලදීයයි තමාට නින්දා කරයි. මවිසින් කාම මිථ්‍යාචාරය කරණලදී. මවිසින් කාම මිථ්‍යාචාරය අත් නොහරින ලදීයයි තමාට නින්දා කරයි මවිසින් මුසාවාදය කරණලදී. මවිසින් මුසාවාදය නොකරණ ලදීයයි තමාට නින්දා කරයි. මවිසින් පිසුණු බස් කීම කරණලදී. මවිසින් පිසුණු බස් කීමෙන් වැලැක්ම නොකරණලදීයයි තමාට නින්දා කරයි. මවිසින් නපුරු වචන කීම කරණලදී. මවිසින් නපුරු වචන කීමෙන් වැලැක්ම නොකරණ ලදීයයි තමාට නින්දා කරයි. මවිසින් හිස් වචන කීම කරණලදී. මවිසින් හිස් වචන කීමෙන් වැලැක්ම නොකරණ ලදීයයි තමාට නින්දා කරයි. මවිසින් දැඩි ලොභය කරණලදී මවිසින් දැඩි ලොභයෙන් වැලැක්ම නොකරණ ලදීයයි තමාට නින්දා කරයි මවිසින් ව්‍යාපාදය කරණලදී. මවිසින් අව්‍යාපාදය නොකරණ ලදීයයි තමාට නින්දා කරයි. මවිසින් වැරදි ඇදහීම කරණලදී. මවිසින් නිවැරදි ඇදහීම නොකරණ ලදීයයි තමාට නින්දා කරයි. මෙසේ කරණලද බැවින්ද නොකරණලද බැවින්ද තමාට නින්දා කරයි. යලිදු හෝ ශීලයන් සම්පූර්ණ නොකෙළෙමියි, ඉන්ද්‍රියයන්හි නොවසන ලද දොරවල් ඇත්තේවීමියි, භොජනයෙහි ප්‍රමාණය නොදත්තේවීමියි. නිදි වර්ජිත කිරීමෙහි නොයෙදුනෙමියි. සිහි නුවණින් යුක්ත නොවීමියි මවිසින් සතර සතිපට්ඨාන භාවිතා නොකරණ ලදීයයි තමාට නින්දා කරයි. මවිසින් සතර සම්‍යක් ප්‍රධාන භාවිතා නොකරණ ලදීයයි තමාට නින්දා කරයි. මවිසින් සතර ඍද්ධි පාදයෝ නොවඩන ලදහයි තමාට නින්දා කරයි. මවිසින් පඤ්චෙන්ද්‍රියයෝ නොවඩනලදහයි තමාට නින්දා

කරයි. මවිසින් පංච බලයෝ නොවඩන ලදහයි තමාට නින්දා කරයි. මවිසින් සප්තබොධ්‍යංගයෝ නොවඩන ලදහයි තමාට නින්දා කරයි. මවිසින් ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය නොවඩන ලදහයි තමාට නින්දා කරයි. දුක මවිසින් නොදන්නා ලදැයි මාගේ දුක්ඛසමුදය ප්‍රහීන නොවූයේ යයි තමාට නින්දා කරයි. මාර්ගය මවිසින් නොවඩන ලදීයයි තමාට නින්දා කරයි. නිරොධය මවිසින් ප්‍රත්‍යක්ෂ නොකරණ ලද්දේ යයි තමාට නින්දා කරයි. මෙසේ කරණ ලද බැවින්ද නොකරණ ලද බැවින්ද තමාට නින්දා කරයි. මෙසේ තමාට නින්දා කටයුතු වැඩ නොකරනු ලබන්නේ නූපදවනු ලබන්නේ යමක් තමාට නින්දා වේනම් එය නොකරණු ලබන්නේ (වෙසෙයි) නුවණැත්තේ ඇසූ දුටුවෙහි නොඇලේ යන්නෙහි ඇලීම යනු ඇලිම් දෙකකි. තෘෂ්ණාවෙහි ඇලීමද දෘෂ්ටියෙහි ඇලීමද යනුයි. (මෙහි (2-6) 1 (ii) (iii) ඡෙදය යෙදිය යුතුයි.) නුවණැත්තේ යනු නුවණ ඇත්තේ පණ්ඩිතවූයේ ප්‍රඥා ඇත්තේ ඥාන ඇත්තේ ප්‍රඥා ඇත්තේ බුද්ධි ඇත්තේ යනුයි. නුවණැත්තේ තෘෂ්ණාවෙහි ඇලීම දුරුකොට දෘෂ්ටියෙහි ඇලීම සංසිඳුවා දුටු දෙයෙහි නොඇලෙයි. ඇසූ දෙයෙහි නොඇලෙයි. මුතයෙහි නොඇලෙයි. දතයුතු දෙයෙහි නොඇලෙයි. නොඇළුනේ විශෙෂයෙන් නොඇළුනේ නික්මුනේ මිදුනේ මුලා නොවූයේ සීමා නොකරණ ලද සිතින් වාසය කෙරෙයි යනුයි.

## 2 - 8

8 "හැඟීම පිරිසිඳ දැන වතුරු එතර කරන්නේ" යන්නෙහි "හැඟීම" නම් කාම සංඥා, ව්‍යාපාද සංඥා, විහිංසා සංඥා නෛෂ්ක්‍රම්‍ය සංඥා අව්‍යාපාද සංඥා, අවිහිංසා සංඥා, රූප සංඥා, ශබ්ද සංඥා, ගන්ධ සංඥා, රස සංඥා, ස්පර්ශ සංඥා, ධර්ම සංඥා, යම්බඳුවූ එවැනි සංඥාවලින් හැඳිනීම හඳුනන ලදබව, මේ සංඥායයි කියනු ලැබේ.

9 "හැඟීම පිරිසිඳ දැන" යනු සංඥාව දැනීම තුනින් දැන ඥාත පරිඥ්ඥා, තීරණ පරිඥ්ඥා, පහාන පරිඥ්ඥා, යන තුනෙනි, ඥාත පරිඥ්ඥාව කවරේද, මේ කාම සංඥාවය මේ

ව්‍යාපාද සංඥාවය, මේ විහිංසා සංඥාවය, මේ නෛෂ්ක්‍රම්‍ය සංඥාවය, මේ අව්‍යාපාද සංඥාවය, මේ අවිහිංසා සංඥාවය. මේ රූප සංඥාවය, මේ ශබ්ද සංඥාවය, මේ ගන්ධ සංඥාවය, මේ රස සංඥාවය මේ ස්පර්ශ සංඥාවය මේ ධර්ම සංඥාවයයි. සංඥාව දනීද දකීද මේ ඥාත පරිඥ්ඥා නමි. තීරණ පරිඥ්ඥාව කවරීද, මෙසේ දැනීමකොට (මෙහි (2-7) 4 (ii) ඡෙදය යෙදිය යුතුයි.) ඇතිවීම් වශයෙන් විනාශයට යාම් වශයෙන් ආශ්වාද වශයෙන් ආදීනව වශයෙන් නිශ්ශරණ වශයෙන් තීරණය කරයි. මේ තීරණ පරිඥ්ඥා නම්වේ. පහාන පරිඥ්ඥාව කවරීද, මෙසේ දැන මෙසේ තීරණයකොට දුරු කරයි. සංසිඳවයි. නූපදනා බවට පමුණුවයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය දේශනා කරණලදී. "මහණෙනි, සංඥාවෙහි යම් ඡන්ද රාගයක් ඇද්ද, එය දුරු කරව්. මෙසේ ඒ සංඥාව ප්‍රහීණවූයේ වන්නේය. සිඳින ලද මුල් ඇත්තේ මුලින් උපුටන ලද තල් ගසක් මෙන් වූවා, යලි ඇති නොවන බවට ගියා නැවත නූපදින බවට පැමිණියේය." (යනුයි.) මේ ප්‍රහාණ පරිඥ්ඥාවයි. "සංඥාව පිරිසිඳ දැන මේ පරිඥ්ඥා තුනින් මනාකොට දැන "වතුරු එතර කරන්නේ" යනු කාමොඝය, භවොඝය, දිට්ඨොඝය, අවිජ්ජොඝය, තරණය කරන්නේය, පිහිනන්නේය ඉක්මවන්නේය. ඇත් කරන්නේය (යනුයි.)

10 "මුනි තෙමේ අයිතිකම්වලින් ඇලී ගියේ නොවේ." යන්නෙහි පරිග්‍රහයෝ (අල්ලා ගන්නෝ) තෘෂ්ණා පරිග්‍රහයද දෘෂ්ටි පරිග්‍රහයද යන දෙකයි (2-6 1 (ii) (iii) ඡෙද යෙදිය යුතුයි) "මුනි" යනු "මොන" යයි ඥානයට කියනු ලැබේ. යම් ප්‍රඥාවක් දැනීම පරීක්ෂණ (මෙහි (2-4) 12 (ii) ඡෙද යෙදිය යුතුයි) නුමුලාවූයේ ධර්මය දැනීම් ඇත්තේ සම්‍යක්දෘෂ්ටි ඇත්තේද ඒ ඥානයෙන් යුක්තවූ "මුනි" හෙවත් ඥානයෙන් යුක්තයයි කියනු ලැබේ. මොනෙය්‍ය තුනකි. කාය මොනෙය්‍යය, වචී මොනෙය්‍යය මනො මොනෙය්‍යය යන තුනයි.

11 කාය මොනෙය්‍යය කවරේද? ත්‍රි විධවූ කාය දුශ්චරිතයන්ගේ ප්‍රහාණය කාය මොනෙය්‍ය නමි. ත්‍රිවිධවූ කාය සුචරිතය කාය මොනෙය්‍ය නමි. කායා රම්මණයෙහි ඥානය

කාය මොනෙය්‍ය නම්. කය පිරිසිඳ දැනුම කාය මොනෙය්‍ය නම්. පරිඤ්ඤා සහගතවූ මාර්ගය කාය මොනෙය්‍ය නම්. කායයෙහි ඡන්දරාගයාගේ ප්‍රහානය කාය මොනෙය්‍ය නම්. මේ කාය මොනෙය්‍යයයි.

12 වචී මොනෙය්‍යය කවරේද? චතුර්විධවූ වාග් දුශ්චරිතයන්ගේ ප්‍රහාණය "වචී" මොනෙය්‍ය නම්. මනො මොනෙය්‍ය කවරේද? ත්‍රිවිධවූ මනො දුශ්චරිතයන්ගේ ප්‍රහාණය මනො මොනෙය්‍ය නම් වේ. ත්‍රිවිධවූ මනො සුචරිතය මනො මොනෙය්‍ය නම්. චිත්තාරම්මණයෙහි ඥානය මනො මොනෙය්‍ය නම්. චිත්තපරිඤ්ඤාව මනො මොනෙය්‍ය නම්. පරිඤ්ඤාසහගතවූ මාර්ගය මනො මොනෙය්‍ය නම්. සිතෙහි ඡන්ද රාගයාගේ ප්‍රහාණය මනො මොනෙය්‍ය නම්. චිත්තසංස්කාර නිරොධය ඇති සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තිය මනො මොනෙය්‍ය නම්. මේ මනො මොනෙය්‍යයයි

13 "ආශ්‍රව රහිතවූ කාය මුනි නම්වූද වාචා මුනි නම් වූද මනොමුනි නම්වූද නුවණින් යුක්තවූ මුනිවරයා සියල්ල ප්‍රහාණය කරණ ලදයයි කීහ."

"ආශ්‍රව රහිතවූ කායමුනි නම්වූද වාචාමුනි නම්වූද නුවණින් යුක්තවූ මුනිවරයා පාපයෝ ප්‍රහාණය කරණ ලද්දේයයි කීහ"

මේ තුන් මොනෙය්‍ය ධර්මයන්ගෙන් යුක්තවූ මුනිවරු සයදෙනෙක් වෙති. අගාර මුනිහුය අනගාර මුනිහුය සෙඛ මුනිහුය අසෙඛ මුනිහුය ප්‍රත්‍යෙක මුනිහුය මුනි මුනිහුය යන සය නමවෙති. අගාර මුනීහු කවරහුද? නිවන දැක්කාවූ ශාසනය හැඳිනගත්තාවූ යම් ඒ අගාරික කෙනෙක් (ගිහි ගෙයි වසන්නෝ) වෙද්ද, ඔවුහු අගාර මුනිහු වෙති. අනගාරික මුනිහු කවරහුද? දක්නා ලද නිවන ඇති දන්නා ලද ශාසනය ඇති යම් ඒ පැවිද්දෝ වෙද්ද ඔව්හු අනගාරික මුනීහු වෙති. සප්ත ශෛක්ෂයෝ සෙඛමුනීහු වෙති. රහතුන් වහන්සේලා අශෛක්ෂමුනිහු වෙති. පසේබුදුවරු ප්‍රත්‍යෙක මුනීහු වෙති. තථාගතවූ අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේලා මුනි මුනියයි කියනු ලැබෙත්.

14 "ඥානය රහිතවූයේ මුලාවන ස්වභාව ඇති තැනැත්තේ නිශ්ශබ්දවීමෙන් මුනි නම් නොවේ යම් නුවණැත්තෙක් උතුම් දෙය තරාදිය මෙන් දැඩිව ගෙන පාපයන් දුරුකෙරේද එහෙයින් ඒ නුවණැත්තේ "මුනි" නම්වේ. යමෙක් දෙලොවම නුවණින් දකීද එහෙයින් මුනියයි කියනු ලැබේ.

යමෙක් සියලු ලොකයෙහි ආධ්‍යාත්මිකවූද බාහ්‍යවූද අයහපත්වූද යහපත්වූද ධර්මය දැන දෙවිමිනිසුන් විසින් පුදන ලද්දේ තෘෂ්ණා ජාලය ඉක්මවූයේ වේද, හෙතෙම "මුනි" නම් වේ.

15 "ඇලීම යන්නෙහි ඇලීම් දෙකකි. තෘෂ්ණාලෙපයද දෘෂ්ටිලෙපයද යන දෙකයි. මුනිතෙමේ තෘෂ්ණාලෙපය දුරුකොට දෘෂ්ටිලෙපය සංසිඳවා දැඩිව ගන්නා වස්තූන්හි නොඇලෙයි. නොඑරෙයි. තදින් නොඇලෙයි. නොඇළුනේ නොඑරුනේ තදින් නොඇළුනේ නික්මුනේ සීමානොකරණ ලද සිතින් වාසය කරයි.

16 "ඉදිරූ හුල් ඇත්තේ නොපමාව හැසිරෙන්නේ" යන්නෙහි "සල්ල" නම් සල්ලයෝ (හුල්) සතෙකි රාග සල්ලය, ද්වෙෂසල්ලය, මොහසල්ලය, මාන සල්ලය, දෘෂ්ටිසල්ලය ශෝක සල්ලය, දුශ්චරිත සල්ලය යනුයි. යමෙකුට සල්ලයෝ (හුල්) ප්‍රහීණවූයේද විනාශ කළේද සංසිඳුනේද ඉපදීමට අයොග්‍ය කළේද ඥානය නමැති ගින්නෙන් දැවූයේද හෙතෙම (උදුරා දැමූ හුල් ඇත්තේ යයි) කියනු ලැබේ. හෙතෙම මනාකොට උපුටන ලද හුල් ඇත්තේ අත්හරින ලද හුල් ඇත්තේ වමාරණ ලද හුල් ඇත්තේ මුදන ලද හුල් ඇත්තේ ප්‍රහීණ කරණ ලද හුල් ඇත්තේ නිවුනේ සිහිල්වූයේ බ්‍රහ්මභූතවූ කයකින් තෙමේ සුවවිඳිමින් වාසය කරයි යනුයි. 'හැසිරෙත්' යනු හැසිරෙන්නේ වාසය කරන්නේ පාලනය කරන්නේ යනුයි.

17 "නොපමාවූයේ යනු (ii) කුශල ධර්මයන්හි සකස් කොට කරණ ලද නිරන්තරයෙන් කරණ ලද හීනනොවූ ධෛර්‍ය්‍ය ඇති පිහිටි උත්සාහ ඇති බහා නොතබන ලද කැමැත්ත ඇති

බහා නොතබන ලද වීයර්‍ය ඇති කෙසේ මම නොපුරණ ලද ශීලස්කන්ධය පුරන්නෙම්ද, පුරණලද හෝ ශීලස්කන්ධය ඒ ඒ තන්හි නුවණින් අනුග්‍රහ කරන්නෙම් දැයි කුශල ධර්මයන්හි කැමැත්තද ව්‍යායාමද උත්සාහයද පසු නොබැසීමද සිහියද මනා ප්‍රඥාවද අධිෂ්ඨානයද අප්‍රමාදයෙහි යෙදීමද "නොපමා" නම්. (iii) කෙසේ මම නොපුරණ ලද සමාධිස්කන්ධය පුරන්නෙම්ද පුරණ ලද සමාධිස්කන්ධය ඒ ඒ තන්හි නුවණින් අනුග්‍රහ කරන්නෙම්ද (iv) කුශල ධර්මයන්හි (මෙහි (ii) යෙදිය යුතුයි) කෙසේ මම නොපුරණ ලද ප්‍රඥාස්කන්ධය නොපුරණ ලද විමුක්ති ස්කන්ධය නොපුරණ ලද විමුක්තිඥාන දර්ශනස්කන්ධය (මෙහි (iii) යෙදිය යුතුයි) ඒ ඒ තන්හිදී නුවණින් අනුග්‍රහ කරන්නෙම් දැයි යමෙක් එහි කැමැත්තද ව්‍යායාමයද උත්සාහයද පසු නොබැසීමද සිහියද මනා ප්‍රඥාවද අධිෂ්ඨානයද කුශලධර්මයන්හි අප්‍රමාදයෙහි යෙදීමද (යනුයි)

18 "මෙලොවක් පරලොවක් නොපතයි" යන්නෙහි ස්වකීය ආත්මභාවය මේ ලෝකයෙහි බලාපොරොත්තු නොවෙයි. අන්‍ය ආත්මභාවයක් පරලොව බලාපොරොත්තු නොවෙයි. ස්වකීය රූපවූ වෙදනා සංඥා සංස්කාර විඥානයන් බලාපොරොත්තු නොවෙයි. අන්‍යරූපවූ වෙදනා සඤ්ඤා සංස්කාරයන් පරලොව බලාපොරොත්තු නොවෙයි. ෂඩ්විධවූ ආධ්‍යාත්මික ආයතනයන් මෙලොව බලාපොරොත්තු නොවෙයි. ෂඩ්විධවූ බාහිර ආයතනයන් පරලොව බලාපොරොත්තු නොවෙයි. මෙලොව මනුෂ්‍යලොකය බලාපොරොත්තු නොවෙයි. පරලොව දිව්‍යලොකය බලාපොරොත්තු නොවෙයි. මෙලොව කාමධාතුවද බලාපොරොත්තු නොවෙයි. පරලොව රූප ධාතුවද අරූප ධාතුවද බලාපොරොත්තු නොවෙයි. මෙලොව කාම ධාතුවද රූප ධාතුවද බලාපොරොත්තු නොවෙයි පරලොව ද රූප ධාතුව බලාපොරොත්තු නොවෙයි. නැවත ගතිය හෝ උත්පත්තිය හෝ ප්‍රතිසන්ධිය හෝ භවය හෝ සංසාරය හෝ (වට්ටය) හෝ බලාපොරොත්තු නොවෙයි. කැමති නොවෙයි. නොඉවසයි ප්‍රාර්ථනා නොකරයි. බලාපොත්තු නොවෙයි.

# දුට්ඨට්ඨක සූත්‍ර නිර්දෙශය.

## 3 - 1

1 "එකාන්තයෙන් දුෂ්ට සිත් ඇති ඇතෙමෙක් කියත්" යන්නෙහි ඇතැම් දුෂ්ටවූ සිත් ඇති ප්‍රදූෂ්‍යවූ සිත් ඇති ප්‍රති විරුද්ධවූ සිත් ඇති බෙදයටපත් සිත් ඇති බොහෝ බෙදයට පත් සිත් ඇති වෛරවූ සිත් ඇති බොහෝ වෛරවූ සිත් ඇති තීර්ථකයෝ භාග්‍යවතුන් වහන්සේටද භික්ෂු සංඝයාටද බොරුවෙන් යම් යම් දේ කියත්. උපවාද කරත්.

2 "යළිත් සැබෑ සිත් ඇති ඔවුහු කියත්" යන්නෙහි ඒ තීර්ථකයන් අදහන්නාවූ විශ්වාස කරන්නාවූ ඒ වචනය ස්ථිරලෙස සිතා ගන්නාවූ ඒ වචනය සත්‍යයයි සිතන්නාවූ සත්‍යය යන සංඥා ඇත්තාවූ වූ දෙයක්යයි සිතන්නාවූ එබඳු සංඥා ඇත්තාවූ මෙහි වෙනසක් නැතැයි සිතන්නාවූ එබඳු සංඥා ඇත්තාවූ ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේටද සංඝයාටද බොරුවෙන් යම් යම් දේ කියත් උපවාද කරත්.

3 "මුනි තෙමේ උපන් චොදනාවට පත් නොවේ" යන්නෙහි ඒ වාදය ඇතිවූයේ වෙයි. පහළවූයේ භාග්‍යවතුන් වහන්සේටද භික්ෂු සංඝයාටද ආක්‍රොශය බොරුවෙන් උපවාදය ඇතිවූයේ වෙයි. මුනිතෙමේ නොපැමිණේ යන්නෙහි "මුනි" යන තන්හි "මොන" යයි ඥානයට කියනු ලැබේ. යම් ප්‍රඥාවක් මනා දැනීමක් ඇත්තේ අමොහයයිද ධර්මවිචය යයිද සම්‍යක්දෘෂ්ටියයිද කියනු ලැබේද, ඒ ඥානයෙන් යුක්තවූ තැනැත්තේ මුනිනම්. යමෙක් වාදයට පැමිණියේද හෙතෙම කරුණු දෙකකින් වාදයට පැමිණෙයි. කාරකයා කාරක බැවින් වාදයට පැමිණෙයි. යලිදු හෝ කියනු ලබන්නේ දොස් පවරනු ලබන්නේ කිපෙයි. ක්‍රොධයට පැමිණෙයි. නොකරන්නෙක් වෙමියි කෝපයද ද්වෙෂයද නොසතුටු බවද අඟවයි. මුනිතෙමේ කරුණු දෙකින්ම වාදයට නොපැමිණෙයි. මුනිතෙමේ නොකරන්නෙකි. නොකරන්නකු බැවින් වාදයට නොපැමිණෙයි. යලිදු හෝ කියනු ලබන්නේ දොස් පවරනු ලබන්නේ නොකිපෙයි. ක්‍රොධයට නොපැමිණෙයි.

නොකරන්නෙක් වෙමි"යි කොපයද ද්වෙෂයද නොසතුටු බවද නොඅඟවයි. මුනි තෙමේ මේ කරුණු දෙකින්ම වාදයට නොපැමිණෙයි. වාදය නොගනියි. වාදය පරාමර්ශය නොකරයි.

4 "එහෙයින් මුනිහට කොහි හෝ උලක් නැත." යන්නෙහි "එහෙයින්" යනු ඒ කාරණයෙන් ඒ හේතුවෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් යනුයි. මුනිවරු වඩනලද සිත් ඇති බැවින් " රාගාදී" හුල් නැත්තේ වෙයි. පඤ්චවිධ චෙතො ඛිලයන් නැත්තේය. රාග, දොෂ, මොහ, යන තෙවැදෑරුම් හුල් නැත්තේය. නූපදියි. ප්‍රහීන වූයේය. මුලින් උදුරා දැමීය. සංසිඳුනේය. ඉපදීමට නුසුදුසු විය. ඥානය නමැති ගින්නෙන් දැවූයේවෙයි. " කොහිවත්" යනු කොතැනක හෝ යනුයි. අධ්‍යාත්මයෙහි හෝ බාහිරව හෝ අධ්‍යාත්ම බාහිර දෙක්හි හෝ යනුයි.

## 3 - 2

1 "ස්වකීය දෘෂ්ටිය කෙසේ නම් ඉක්ම වන්නේද" යන්නෙහි යම් ඒ තීර්ථකයෝ සුන්දරී පරිව්‍රාජිකාව මරා ශාක්‍යපුත්‍රවූ ශ්‍රමණයන් වහන්සේලාගේ දොස් ප්‍රකාශ කොට මෙසේ ලාභයක් කීර්තියක් සත්කාරයක් වැඳුම් පිදුම් ආදියක් පසුව ලබා ගන්නෙමුයි" මෙසේ දෘෂ්ටි ඇත්තාහු මෙසේ ආශා ඇත්තාහු මෙසේ ලබ්ධි ඇත්තාහු මෙසේ බලාපොරොත්තු ඇත්තාහු ඔවුහු ස්වකීය දෘෂ්ටිය, ස්වකීය රුචිය, ස්වකීය ලබ්ධිය, ස්වකීය අදහස, ස්වකීය අභිප්‍රාය, ඉක්ම වන්නට නොහැකි වූහ. එසේනමුදු ඒ අයසම ඔවුන්ට ආපසු පැමිණියේය. මෙසේද ස්වකීය දෘෂ්ටිය කෙසේ ඉක්මවන්නේද, (ii) යලිදු හෝ ලොකය ශාස්වතය යන මෙයම සත්‍යය, අනික් දේ හිස්ය, යම් කෙනෙක් මෙසේ වාද ඇත්තේ ස්වකීය දෘෂ්ටිය, ස්වකීය රුචිය, ස්වකීය ලබ්ධිය, ස්වකීය අදහස ස්වකීය අධ්‍යාශය, ස්වකීය අභිප්‍රාය කෙසේ ඉක්මවන්නේද, එයට හේතු කවරේද, ඔහුගේ ඒ දෘෂ්ටිය එසේ සමාප්ත වූයේය. එසේ සමාදන් වූයේය. එසේ පරාමර්ශනය කළේය. එසේ බැස ගත්තේය. මෙසේද ස්වකීය දෘෂ්ටිය කෙසේ හරනේද, යලිදු හෝ (iii) ලොකය අශාස්වතය, ලොකය කෙළවරක් හෝ ඇත්තේය. කෙළවරක් හෝ නැත්තේය. එය

ජීවය, එය ශරීරය අනිකක් ජීවය, අනිකක් ශරීරය සත්වතෙම මරණින් මතු ඇත්තේද වෙයි. සත්වතෙම මරණින් මතු නැත්තේද වෙයි. සත්වතෙම මරණින් මතු ඇත්තේද නැත්තේද වෙයි (iv) මරණින් මතු සත්වයා නැත්තේ වෙයි. නැත්තේ නොම වෙයි යන මෙයම සත්‍යය, අනික් දේ හිස්ය, යම් ඒ කෙනෙක් මෙසේ වාද ඇත්තේ හෙතෙම ස්වකීය දෘෂ්ටිය ස්වකීය රුචිය, ස්වකීය ලබ්ධිය, ස්වකීය අදහස, ස්වකීය අභිප්‍රාය කෙසේ ඉක්මවන්නේද, එයට හේතු කවරේද? ඔහුගේ ඒ දෘෂ්ටිය එසේ නිමවූයේය. එසේ සමාදන්වූයේය ගත්තේය. පරාමර්ශවූයේය. බැස ගත්තේය, යනුයි

2 "ඡන්දයෙන් යවන ලද්දේ රුචියෙහි ඇතුළුවූයේ" යනු ස්වකීය දෘෂ්ටියෙන් ස්වකීය රුචියෙන් ස්වකීය ලබ්ධියෙන් යේද, ගෙනයාද, පාවේද, එකතුවේද යම්සේ ඇත් යානයකින් හෝ අස් යානයකින් හෝ රිය යානයකින් හෝ එළු යානයකින් හෝ බැටළු යානයකින් හෝ ඔටු යානයකින් හෝ බැටළු යානයකින් හෝ යේද පැමිණේද, පාවේද, එක් තැන්වේද, මෙසේම ස්වකීය දෘෂ්ටියෙන් ස්වකීය රුචියෙන් ස්වකීය ලබ්ධියෙන් යේද, පැමිණේද, පාවේද, යනුයි.

3 "රුචියෙහි ඇතුළු වූයේ" යනු ස්වකීය දෘෂ්ටියෙන් ස්වකීය රුචියෙන් ස්වකීය ලබ්ධියෙන් ඇළුනේ, පිහිටියේ පැමිණියේ බැස ගන්නේ යනුයි.

4 "තෙමේ සම්පූර්ණ වූවන් කරන්නේ" යන්නෙහි කෙසේ අවසන් බව කෙරේද, පිරිපුන් බව කෙරේද උතුම් බව කෙරේද, අග්‍ර බව කෙරේද, ප්‍රමුඛ බව කෙරේද, මේ ධර්මය ස්වාක්ඛාතය, මේ ගණයා සුප්‍රතිපන්නය මේ දෘෂ්ටිය යහපත්ය, මේ ප්‍රතිපදාව නොකොට පැනවූයේ විය. මේ මාර්ගය නෛර්‍ය්‍යාණිකයයි තෙමේ නිශ්චය බවට පැමිණේ අග්‍රයයි ශ්‍රේෂ්ඨයයි විශිෂ්ටයයි ප්‍රමුඛයයි උතුම්යයි ඉදිරිපත් කරයි. උපදවයි. යනුයි.

5 "යම්සේ දන්නේද එසේ කියන්නේයි." යනු යම්සේ දන්නේ නම් එසේ කියන්නේය. ප්‍රකාශ කරන්නේය. ව්‍යවහාර කරන්නේය. ලොකය ශාස්වතය මෙයම සත්‍යය, අනික් දේ

හිස්යයි යම්සේ දන්නේ නම් එසේ කියන්නේය. ප්‍රකාශ කරන්නේය. ව්‍යවහාර කරන්නේය. ලොකය අශාස්වතය (මෙහි 1 (iv) ඡේදය යෙදිය යුතුයි) සත්වයා මරණින් මතු නොම වෙයි. නොම නොවෙයි. යන මෙයම සත්‍යය අනික් දේ හිස්ය, යම්සේ දන්නේ නම් එසේ කියන්නේය.

## 3 - 3

1 "යම් පුද්ගලයෙක්තෙම තමාගේ ශීල ව්‍රතයන්" යන්නෙහි යමෙක් යනු යම්බඳුවූ එබඳුවූ යම් ප්‍රකාරවූ යම් ස්ථානයකට පත්වූ යම් ධර්මයකින් යුක්තවූ ක්ෂත්‍රියයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ ගෘහපතියෙක් හෝ ශූද්‍රයෙක් හෝ ගෘහස්ථයෙක් හෝ ප්‍රව්‍රජිතයෙක් හෝ දෙවියෙක් හෝ මිනිසෙක් හෝ යනුයි.

2 "සිල් හා වත්" යන්නෙහි ශීලයද ව්‍රතයද ඇත්තේය. ව්‍රතය ඇත්තේය. ශීලය නොවේ. සීලයද ව්‍රතයද කවරේද? මේ ශාසනයෙහි මහණතෙම සිල් ඇත්තේ වෙයි. ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවරවූයේ වාසය කරයි. ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවූයේ ස්වල්ප වරදෙහි භය දක්නාසුළු වූයේ ශික්ෂා පදයන් සමාදන්ව හික්මෙයි. යමෙක් එහි හික්මුණේ සංවරවූයේ නොඉක්මුණේ මේ ශීලය වෙයි, මේ සමාදානය වෙයි, සංවරාර්ථයෙන් ශීලය නමි. සමාදානාර්ථයෙන් ව්‍රතය නමි. මෙය ශීලයයිද ව්‍රතයයිද කියනු ලැබේ. ව්‍රතය කවරේද? ශීලය නොවේද, අෂ්ටධුතංගයෝ වෙති. "ආරඤ්ඤිකංග" "පිණ්ඩපාතිකංග" "පංසුකූලිකංග" "තෙචීවරිකංග" "සපදාන චාරිකංග" "ඛලු පච්ඡාභත්තිකංග" "නෙසජ්ජිකංග" "යථාසන්ථතිකංග" යන අංගයෝ ව්‍රතයයි, කියනු ලැබේ. ශීලය නොවේ. වීර්‍ය්‍ය සමාදානයද ව්‍රතයයි කියයි. ශීලය නොවේ. "ඒකාන්තයෙන් ශරීරයෙහි සමද නහරද ඇටද ඉතිරිවේවා මස්ලේ වියලේවා යම් ඒ පුරුෂ ශක්තියෙන් පුරුෂ බලයෙන් පුරුෂ වීර්‍ය්‍යයෙන් පුරුෂ පරාක්‍රමයෙන් පැමිණිය යුත්තක් ඇද්ද, එයට නොපැමිණ වීර්‍ය්‍යයාගේ වැළැක්වීම නොවන්නේයයි සිත දැඩිව ගනීද, මෙබඳුවූ වීර්‍ය්‍ය සමාදානය ව්‍රතයයි කියනුලැබේ. ශීලය නොවේ.

3 "තෘෂ්ණා නමැති හුල නො ඉදුරුනකල්හි විහාරයෙන් නොනික්මෙමි. බලාපොරොත්තු නොවන්නෙමි. පානය නොකරන්නෙමි. නොලබන්නෙමි. වැටෙන්නෙමි." යනුවෙන් සිත දැඩිව ගනියි. මෙබඳුවූද විරිය සමාදාන ව්‍රතයයි කියනු ලැබේ. ශීලය නොවේ. යම්තාක් මාගේ සිත ආශ්‍රවයන්ගෙන් දැඩිව නොගෙන මිදෙන්නේද ඒතාක් මේ ආසනයෙන් නොනැගිටින්නෙමි. සක්මනෙන් නොබසින්නෙමි. ගුරුළු පියාපත් වැනි සෙවෙනි ඇති ගෘහයෙන් නොනික්මෙන්නෙමි. ප්‍රාසාදයෙන් නොනික්මෙන්නෙමි. ප්‍රාසාද විශෙෂයක්වූ හම්මියෙන් නොනික්මෙන්නෙමි. ගුහාවෙන් නොනික්මෙන්නෙමි. ලෙණෙන් නොනික්මෙන්නෙමි. කුටියෙන් නොනික්මෙන්නෙමි. කුළුගෙයින් නොනික්මෙන්නෙමි. මැස්සෙන් නොනික්මෙන්නෙමි. මළුවෙන් නොනික්මෙන්නෙමි. උපස්ථාන ශාලාවෙන් නොනික්මෙන්නෙමි. මණ්ඩපයෙන් නොනික්මෙන්නෙමි. රුක් මුලින් නොනික්මෙන්නෙමි යන මෙබඳුවූ වීය්‍ර්‍ය සමාදානය ව්‍රතයයි කියනු ලැබේ. ශීලයනොවේ. මේ මධ්‍යාහ්න සමයෙහි සායාන්හ සමයෙහි පෙරවරුයෙහි පස්වරුවෙහි පෙරයමෙහි, මැදුම්යමෙහි පැසුළුයමෙහි, ආලොක කාලයෙහි, වර්ෂා කාලයෙහි, හිම කාලයෙහි, ග්‍රීෂ්මකාලයෙහි, පළමු වයස් කාලයෙහි මධ්‍යම වයස් කාලයෙහි පශ්චිම වයස්කාලයෙහි ආය්‍ර්‍යධර්මය පිළිගන්නෙමි. ස්පර්ශ කරන්නෙමි. ප්‍රත්‍යක්ෂ කරන්නෙමියි දැඩිව සිත ගනි පිහිටුවයි. මෙබඳු වීය්‍ර්‍ය සමාදානය ව්‍රතයයි කියනුලැබේ. ශීලය නොවේ. පුද්ගලයා යනු සත්වයා මිනිසා, මානවයා, පුරුෂයා, පුද්ගලයා, ජීවයා යන යම් තමා සිල්වත්වූ සත්වයා යනුයි.

4 "නොවිචාරනලද්දේ අනුන්ට ප්‍රකාශකරයි" යන්නෙහි අනුන්ට යනු අන්‍යවූ ක්ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය ශුද්‍ර යන මොවුන්ගෙන් හෝ ගෘහස්ථයන්ගෙන් ප්‍රව්‍රජිතයන්ගෙන් දෙවියන්ගෙන් මිනිසුන්ගෙන් යම්කෙනෙකු යනුයි. නොවිචාරණලද්දේ, නොඉල්වනලද්දේ, ආරාධනා නොකරණ ලද්දේ යනුයි.

5 (i) "ප්‍රකාශ කරන්නේ" යනු තමන්ගේ ශීලය හෝ ව්‍රතය හෝ ශීලව්‍රත දෙකම හෝ කියාද, මම ශීල සම්පන්නයෙක් වෙමි. ව්‍රත සම්පන්නයෙක් වෙමි. ශීලව්‍රත දෙකින්ම හෝ යුක්තවෙමියි ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලයෙන් හෝ ශරීර පැහැයෙන් හෝ ධනයෙන් හෝ (ii) ඉගෙණීමෙන් හෝ කර්මායතනයෙන් හෝ ශිල්පායතනයෙන් හෝ විද්‍යායතනයෙන් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ අනෙක් අනෙක් වස්තූන්ගෙන් හෝ උසස් කුලයකින් පැවිදි වූයේ යයි හෝ මහා කුලයකින් පැවිදිවූයේ යයි හෝ මහා භොග කුලයකින් පැවිදිවූයේයයි හෝ ඉතා උසස් භොග කුලයකින් පැවිදිවූයේයයි හෝ ප්‍රකටවූ කීර්ති ඇති දන්නා ගිහි පැවිද්දන් ඇත කියා හෝ සිවුරු පිණ්ඩාහාර සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ඇත්තේය කියා හෝ සූත්‍රාන්තිකයයි කියා හෝ විනයධරයයි කියා හෝ ධර්මධරය කියා හෝ ආරඤ්ඤිකයයි කියා හෝ රුක්ඛමූලිකයයි කියා හෝ පිණ්ඩපාතිකයයි කියා හෝ සපදානචාරිකයයි කියා හෝ ඛලුපච්ඡාභත්තිකයයි කියා හෝ නෙසජ්ජිකයයි කියා හෝ යථාසන්තතිකයයි හෝ ප්‍රථමධ්‍යානය ලැබුයේයයි කියා හෝ ද්විතීයධ්‍යානය ලැබුයේ යයි කියා හෝ තෘතීයධානය ලැබුයේයයි කියා හෝ චතුර්ථධ්‍යානය ලැබුයේයයි කියා හෝ ආකාශානඤ්චායතන සමාපත්තිය ලැබුයේ යයි කියා හෝ විඤ්ඤානඤ්චායතන සමාපත්තිය ලැබුයේ යයි කියා හෝ ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ලැබුයේ යයි කියා හෝ නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය ලැබුයේයයි කියා හෝ කියයි. ප්‍රකාශ කරයි. (iii) අනරිය ධම්මං කුසලා තමාහු යන්නෙහි කුසලා යනු ස්කන්ධයන් නිපුණවූ ධාතූන් නිපුණවූ ආයතනයන් නිපුණවූ ප්‍රතීත්‍ය සමුත්පාදය නිපුණවූ සතිපට්ඨානයන් නිපුණවූ සම්‍යක්ප්‍රධාන නිපුණවූ ඍද්ධිපාද නිපුණවූ ඉන්ද්‍රිය නිපුණවූ බල නිපුණවූ බොධ්‍යංග නිපුණවූ මාර්ග නිපුණවූ ඵල නිපුණවූ නිර්වාණය නිපුණවූ යන මේ නිපුණයෝ මෙසේ කීහ. මේ ධර්මය අනාර්‍ය්‍යයන්ගේය. මේ ධර්මය ආර්‍ය්‍යයන්ගේ නොවේ. මේ ධර්මය බාලයන්ගේය. මේ ධර්මය පණ්ඩිතයන්ගේ නොවේ. මේ ධර්මය

අසත්පුරුෂයන්ගේය. මේ ධර්මයසත් පුරුෂයන්ගේ නොවේයයි මෙසේ කීහ. මෙසේ කියත්. මෙසේ ප්‍රකාශ කරත්. මෙසේ ව්‍යවහාර කරත්.

6 "හෙතෙමේ තෙමේ තමා ගැනම කියයි." යන්නෙහි "තමාගැන" යනු තමාට කියනු ලැබේ යනු තෙමේම තමාට කියයි. මම ශීලසම්පන්න වෙමියි හෝ ව්‍රත සම්පන්න වෙමියි හෝ ශීල ව්‍රත සම්පන්න වෙමියි හෝ ජාතියෙන් හෝ ගෝත්‍රයෙන් හෝ කුලයෙන් හෝ රූපසම්පත්තියෙන් හෝ ධනයෙන් හෝ (මෙහි 5 (ii) යෙදිය යුතුයි කියයි.) ප්‍රකාශ කරයි.

## 3 - 4

1 "මනාව නිවන ලද සිත ඇති සන්සුන් භික්ෂුතෙම" යනු රාගය සංසිඳුන බැවින් ශාන්තය, ද්වෙෂය සංසිඳුන බැවින් ශාන්තය, මොහය සංසිඳුන බැවින් ශාන්තය, ක්‍රොධය, බද්ධ වෛරය, ගුණමකු කම, අනුන්ගේ දොස් කීම, ඊර්ෂ්‍යාව, මසුරු කම, රැවටිල්ල, කෛරාටික කම, තද ගතිය එකට එක කිරීම, මානය අභිමානය, මදය, ප්‍රමාදය යන මොවුන්ගේ සියලු ක්ලෙශයන්ගේ සියලු දුශ්චරිතයන්ගේ සියලු දාහයන්ගේ සියලු පරිදාහයන්ගේ සියලු සන්තාපයන්ගේ සියලු කුසලාභි සංස්කාරයන්ගේ ශාන්තත්වය ඇති බැවින් සංසිඳුන බැවින් නිවුන බැවින් පහවූ බැවින් ශාන්ත වූයේවේ. භික්ෂු යනු සප්ත ධර්මයකගේ බිඳීම ඇති බැවින් "භික්ෂු" නම්. සක්කාය දෘෂ්ටිය බිඳුනේ වෙයි. විචිකිච්ඡාව බිඳුනේ වෙයි. සීලබ්බතපරාමාස බිඳුනේ වෙයි. රාගය බිඳුනේ වෙයි. ද්වේෂය බිඳුනේ වෙයි, මොහය බිඳුනේ වෙයි. මානය බිඳුනේ වෙයි. ඔහුගේ ලාමකවූ ක්ලෙශයන් ඇති කරන්නාවූ නැවත භවයක් ඇති කරන්නාවූ දාහ සහිතවූ දුඃක්ඛ විපාකවූ නැවත ජරා මරණයක් දෙන්නාවූ ලාමක අකුශල ධර්මයෝ බිඳුනාහු වෙති. දුරු කරණලද සැක ඇත්තේ සම්පූර්ණ කරණලද කටයුතු ඇත්තේ ක්ෂය කරණලද පුනර්භවය ඇත්තේ විභවයද භවයද දුරුකොට පිරිනිවණට ගියේ වෙයි."

2. "මනාව නිවන ලද සිත් ඇත්තේ" යනු රාගය නිවූ බැවින් නිවුනේ, ද්වෙෂය නිවුන බැවින් නිවුනේ, මොහය නිවුන බැවින් නිවුනේ, ක්‍රොධය, උපනාහය, මක්ඛය, පලාසය, ඉස්සා, මච්ඡරීය, මායා, සාඨෙය්‍ය, ථම්භ, සාරම්භ, මද, පමාද යන ක්ලෙශයන් නිවූ බැවින් සියලු කෙලෙස් සියලු දුශ්චරිත සියලු දානයන් සියලු පරිදාහයන් සියලු තැවීම් සියලු අකුශලාභි සංස්කාරයන් නිවූ බැවින් යනුයි. "ඉතිහන්ති සීලෙසු අකත්ථමානො" යන්නෙහි ඉතිහ-න්ති යනු පදයන් එකතු කළ සන්ධියකි අකුරු සම කිරීම පිණිස කියවීමේ පහසුව පිණිස කළ පද පූරණයකි මේ ශාසනයෙහි ඇතැමෙක් පුරසාරම් දොඩයි. හෙතෙම 'මම ශීල සම්පන්නවූයේ වෙමි. ව්‍රත සම්පන්න වූයේ වෙමි'යි පුරසාරම් දොඩයි. ශීල ව්‍රත දෙකින් යුක්තයයි කියා හෝ පුරසාරම් දොඩයි. ජාතියෙන් හෝ ගෝත්‍රයෙන් හෝ කුලයෙන් හෝ රූ සපුවෙන් හෝ යුක්තයයි පුරසාරම් දොඩයි. (මෙහි (3-5) 5 (ii) ඡෙදය යෙදිය යුතුයි.) නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියෙන් යුක්තයයි පුරසාරම් දොඩයි. (ශාන්ත භික්ෂුතෙම) මෙසේ පුරසාරම් නොදොඩයි. පුරසාරම් දෙඩීමෙන් වෙන්වූයේ සීමා නොකළ සිතින් වාසය කරයි.

3 "දක්ෂයෝ එය ආර්ය ධර්මයයි කියත්" කුශලා යනු දක්ෂවූ හෝ නිපුණවූ යම් ඒ ස්කන්ධයන්හි (මෙහි (3-3) 5 (vi) ඡෙද යෙදිය යුතුයි)

4 "ලොව කොහි හෝ ක්ලෙශයක් යමකුට නැද්ද" යන්නෙහි "යමකුට" යනු අර්හත්වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේට යනුයි " ක්ලෙශ" යනු ක්ලෙශයෝයි. ඒ ක්ලෙශයෝ සතකි. (ii) රාග ක්ලෙශය, ද්වෙෂ, මොහ, මාන, දිට්ඨි කිලෙස කම්ම, යන මේ සතයි. රහතන් වහන්සේට මේ ක්ලෙශයෝ නැත. විද්‍යමාන නොවෙත්. නොලැබෙත් ප්‍රහීණ කළේය. මුලිනුපුටා දැමීය, සංසිඳවූයේය. ඉපදීමට අයොග්‍ය කළේය. ඥානය නමැති ගින්නෙන් දැවීය.

5 "කොහි හෝ යනු කොහිවත් අධ්‍යාත්මික හෝ බාහිර හෝ අධ්‍යාත්මික බාහිරව හෝ යනුයි.

6 "ලොව" යනු අපාය ලොකයෙහි මනුෂ්‍ය ලොකයෙහි දිව්‍යලොකයෙහි ස්කන්ධලොකයෙහි ධාතු ලොකයෙහි ආයතන ලොකයෙහි යනුයි.

## 3 - 5

1 "යමකුගේ කල්පනා කළ, සකස්වූ ධර්මයෝ" යන්නෙහි කල්පනා කළ යනු කල්පනා දෙකකි. තෘෂ්ණා කල්පනාවද දෘෂ්ටි කල්පනාවද යනුයි. (මෙහි (2-6) 1 (ii) (iii) ඡෙද යෙදිය යුතුයි. එහි මමත්වය වෙනුවට කල්පනා කියා වෙනස්කර ගන්න) මේ කල්පනාවෝ දෙක වෙති

2 "සකස්වූ" යනු හේතුවෙන් හටගන්නා ලද රැස් කරණ ලද පිහිටුවන ලද්දේනුයි හෝ සංඛත නමි. යලිදු හෝ සකස්වූ ධර්මයෝ අනිත්‍යයහ. හේතුවකින් උපන්නෝය. සකස්වූවෝ ක්ෂය ධර්මයෝය. ව්‍යය ධර්මයෝය, විරාග ධර්මයෝය, නිරොධ ධර්මයෝය. "යමකුගේ" යනු දෘෂ්ටිගතිකයාට යනුයි. ධර්මයයි දෙසැට දෘෂ්ටිගත කල්පනාවෝ සංඛතයෝ යනුයි.

3 "ප්‍රමුඛ කළ අපිරිසුදු දේ වෙත්" යන්නෙහි පෙරටු කිරීම් දෙකකි. තෘෂ්ණාව පෙරටු කිරීම දෘෂ්ටිය පෙරටුකිරීම (මමත්වය වෙනුවට පෙරටුකිරීම කියා වෙනස්කර (2-6) 1 (ii) (iii) ඡෙද යෙදිය යුතුයි) ඔහුට තෘෂ්ණාව පෙරටුකිරීම ප්‍රහීණ නොවූයේද දෘෂ්ටිය පෙරටු කිරීම නොසංසිඳුනේද ඔහුගේ තෘෂ්ණාව පෙරටු කිරීම ප්‍රහීණ නොවූ බැවින් දෘෂ්ටිය පෙරටු කිරීම නොසංසිඳුන බැවින් හෙතෙම තෘෂ්ණාව හෝ දෘෂ්ටිය හෝ පෙරටුකොට හැසිරෙයි. හෙතෙම තෘෂ්ණාව ධ්වජ කොට ඇත්තේ තෘෂ්ණාව කොඩියකොට ඇත්තේ තෘෂ්ණාව අධිපති කොට ඇත්තේ දෘෂ්ටිය ධ්වජ කොට ඇත්තේ තෘෂ්ණාව කොඩිය කොට ඇත්තේ දෘෂ්ටිය අධිපතිකොට ඇත්තේ තෘෂ්ණාවෙන් හෝ දෘෂ්ටියෙන් හෝ පිරිවරණ ලද්දේ හැසිරෙයි. පෙරටු කරණ ලදී "වෙත්" යනු විද්‍යමානවෙත්, ඇත්තේය, ලබත් යනුයි.

4 "අපිරිසිදු දේ" යනු අපිරිසිදුවූයේ කිළුටුවූයේ යනුයි.

5 "යම් ආනිශංසයක් තමාතුළ දකීද" යන්නෙහි "යම්" යනු තමා කෙරෙහි යමක් යනුයි. "තමා තුළ" යනු තෙමේයයි

දෘෂ්ටි ගතයාට කියනු ලැබේ. තමන්ගේ දෘෂ්ටියෙන් ආනිශංසය දෙකක් බලයි. මෙලොව ආනිශංසයද පරලොව ආනිශංසයද යනුයි. (ii) මෙලොව ආනිශංසය කවරේද? (iii) ශාස්තෘතෙම යම් දෘෂ්ටියක් ඇත්තේ වෙයිද ශ්‍රාවකයෝද ඒ දෘෂ්ටි ගතුවෝ වෙති. ඒ දෘෂ්ටිය ඇති ශාස්තෘවරයාට ශ්‍රාවකයෝ සත්කාර කෙරෙති. ගරුකාර කෙරෙති. වඳිති පුදති. සැළකිළි කරති ඒ හේතුකොට ගෙන සිවුරු පිණ්ඩාහාර සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබයි මේ දෘෂ්ටියෙන් මෙලොව ආනිශංසයයි (iv) දෘෂ්ටියෙන් පරලොව ආනිශංස කවරේද? (v) මේ දෘෂ්ටිය නාගත්වය පිණිස සුදුසුය. සුපර්ණත්වය පිණිස සුදුසුය ගන්ධර්වත්වය පිණිස සුදුසුය. මහාරාජත්වය පිණිස හෝ ශක්‍රත්වය පිණිස හෝ බ්‍රහ්මත්වය පිණිස හෝ දෙවත්වය පිණිස හෝ සුදුසුය. මේ දෘෂ්ටිය ශුද්ධිය පිණිස විශුද්ධිය පිණිස පාරිශුද්ධිය පිණිස විමුක්තිය පිණිස සුදුසුය. මේ දෘෂ්ටියෙන් මිදෙත් පිරිසිදුවෙත්, මේ දෘෂ්ටියෙන් පිරිසිදු වන්නෙමි. මිදෙන්නෙමියි මතුඵලය බලාපොරොත්තුවූයේ වෙයි. මේ දෘෂ්ටියෙන් පරලොව ආනිශංසයයි, (vi) තමන්ගේ දෘෂ්ටියෙන් මේ ආනිශංස දෙක බලාපොරොත්තු වෙයි.

**6** "ඒ අස්ථිරවූ සන්සිඳීම ඇසුරු කෙළේය" යන්නෙහි සංසිඳීම් තුනක් වෙති. අත්‍යන්ත (ඒකාන්ත) සංසිඳීම, තදංග සන්සිඳීම, සම්මුති සන්සිඳීම, යනුයි. අත්‍යන්ත ශාන්තිය කවරේද? (ii) අමෘතවූ නිර්වාණයට ඒකාන්තශාන්ති යයි කියනු ලැබේ. යමක් සියලු සංස්කාරයන් සමථයට පත් කළ සියලු කෙළෙස් සංසිඳවූ තෘෂ්ණා ක්ෂය කළ විරාග නම්වූ නිරොධ නම්වූ නිර්වාණයයි. මේ ඒකාන්ත ශාන්තියයි. (iii) තදංග ශාන්තිය කවරේද? (iv) ප්‍රථමධ්‍යානයට සමවැදුනහුට නීවරණයෝ සංසිඳුනාහු වෙති. ද්විතීයධ්‍යානයට සම වැදුනහුට විතර්ක විචාරයෝ සංසිඳුනාහු වෙති. තෘතීයධ්‍යානයට සමවැදුනහුට ප්‍රීතිය සන්සිඳුනේ වෙයි. චතුර්ථධ්‍යානයට සමවැදුනහුට සුවදුක් සංසිඳුනාහූ වෙති. ආකාශානඤ්චායතනයට සමවැදුනහුට රූප සංඥාව, පටිඝ සංඥාව නානත්ත සංඥාව සංසිඳුනාහු වෙති. විඤ්ඤානඤ්චායතනයට සමවැදුනහුට

ආකාසානඤ්චායතන සංඥාව සංසිඳුනේ වෙයි. ආකිඤ්චඤ්ඤායතනයට සමවැදුනහුට විඤ්ඤානඤ්ඤායතන සංඥාව සංසිඳුනේ වෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සම වැදුනහුට ආකිඤ්චඤ්ඤායතන සංඥාව සංසිඳුනේ වෙයි. මේ තදංග සංසිඳීමයි. සම්මුති සංසිඳීම කවරේද? දෙසැට මිථ්‍යාදෘෂ්ටීන් සංසිඳීම සම්මුති සංසිඳීමයයි කියනු ලැබේ. මේ දෘෂ්ටි සංසිඳීමයි. නැවතද සම්මුති ශාන්තිය මේ අර්ථයෙහි අධංගුවූ ශාන්තියයි.

7 "ඒ අස්ථිරවූ සන්සිඳීම ඇසුරු කෙළේ" යනු කලබලවූ ශාන්තිය සෙලවුනාවූ ශාන්තිය ගැටුන ශාන්තිය අනිත්‍යය සංඛතය හේතුවෙන් උපන්නේය. ක්ෂය ධර්මය ව්‍යය ධර්මය විරාග ධර්මය නිරොධ ධර්මය ශාන්තිය ආශ්‍රයකොට ඇත්තේ ඇලීගත්තේ පැමිණියේ බැසගත්තේ පැමිණියේ යනුයි.

## 3 - 6

1 "දෘෂ්ටි වැළඳ සිටීම පහසුවෙන් ඉක්මවනු නොහැක" යන්නෙහි "දෘෂ්ටි වැළඳ සිටීම්" යනු (ii) ලොකය ශාස්වතය මෙයමම සත්‍යය අනික් දේ හිස්යයි දෘෂ්ටියට බැසගැන්ම ඇලීම පරාමර්ශය කොට ඇත්තේය. ලොකය අශාස්වතය ලොකය කෙළවරක් ඇත්තේය, ලොකය කෙළවරක් නැත්තේය, ඒ ජීවයයි ඒ ශරීරයයි, අනිකක් ජීවයයි අනිකක් ශරීරයයි සත්වයා මරණින් මතු වෙයි, සත්වයා මරණින් මතු නොවෙයි, සත්වයා මරණින් මතු ඇත්තේද වෙයි නැත්තේද වෙයි, සත්වයා මරණින් මතු නොම වෙයි නොම නොවෙයි යන මෙයම සත්‍යයයි අනික් දේ හිස්යයි දෘෂ්ටි වැළඳ සිටීම ඇලීම පරාමර්ශය කොට ඇත්තේවේ. දෘෂ්ටියෙන් ඇතුළු වූවෝ පහසුවෙන් ඉක්ම විය. නොහැක. දුකසේ තරණය කටයුතුය.

2 "ධර්මයන්හි පිළිගන්නා ලද්ද නිශ්චය කරන්නේය" යන්නෙහි ධර්මයන්හි යනු දෙසැට දෘෂ්ටි ගතුවන් කෙරෙහි නිශ්චයකොට කල්පනාකොට සමකොට බලා තීරණය කොට ප්‍රකටකොට යනුයි. බැස ගැනීම්වල සීමාකොට ගත්තේ ගුහාව කොට ගත්තේ උතුම් කොට ගත්තේ කොටස් කොට ගත්තේ

කැටිකොට ගත්තේ මෙය සත්‍යය යථාස්වභාවයයි අවිපරීත ස්වභාවයයි ගත්තේ පරාමර්ශ කරණ ලද්දේ බැසගන්නා ලද්දේ යනුයි.

3 "එහෙයින් මනුෂ්‍යතෙම ඒ වැළඳ ගැනීම්වල" යන්නෙහි තස්මා යනු ඒ කාරණයෙන් ඒ හේතුවෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් මනුෂ්‍යතෙම යනු සත්වයා (මෙහි 7 (ii) ඡෙද යෙදිය යුතුයි.)

4 "ඒ වැළඳ ගැනීම්වල" යන්නෙහි ඒ දෘෂ්ටියට බැස ගැනීම්වල යනුයි. "ධර්මය දුරු කෙරේද, පිළිගනීද" යන්නෙහි කරුණු දෙකකින් ආලය රහිත වෙයි අන්‍යයන්ගේ අදහස් බිඳීම් වශයෙන් හෝ ආලය රහිත වෙයි. නුසුදුසු බැවින් හෝ ආලය නොවෙයි. කෙසේ අනුන්ගේ අදහස් බිඳීම් වශයෙන් ආලය නොවේද, ඒ ශාස්තෘවරයා සර්වඥ නොවේ. ධර්මය ස්වාක්ඛාත නොවේ. සංඝයා සුප්‍රතිපන්න නොවේ. දෘෂ්ටිය යහපත් නොවේ ප්‍රතිපදාව මනාව පනවන ලද එකක් නොවේ මාර්ගය නෛර්‍යාණික නොවේ මෙහි ශුද්ධියක් හෝ විශුද්ධියක් හෝ පාරිශුද්ධියක් හෝ මිදීමක් හෝ නැත. හීනය, නිහීනය ලාමකය. මෙසේ අන්‍ය අදහස් බිඳ දමයි. මෙසේ සිඳ දමනු ලබන්නේ ශාස්තෘවරයා කෙරෙහි නොඇලෙයි. ධර්මය කෙරෙහි නොඇලෙයි. සංඝයා කෙරෙහි නොඇලෙයි. ශීලය නුසුදුසු බැවින් ආලය නොවෙයි ව්‍රතය නුසුදුසු බැවින් ආලය නොවෙයි.

5 "ධර්මය පිළිගනී" යනු ශාස්තෘවරයා පිළිගනියි. ධර්ම දෙශනය පිළිගනියි. සංඝයා පිළිගනියි. දෘෂ්ටිය පිළිගනියි. ප්‍රතිපදාව පිළිගනියි. මාර්ගය පිළිගනියි. පරාමර්ශය කරයි. ඇතුළු වෙයි.

## 3 - 7

1 "ශුද්ධ පුරුෂයාට වනාහි භවාභවයන්හි කල්පනා කළ දෘෂ්ටියක් ලොව කොහි හෝ නැත" යන්නෙහි "ශුද්ධ පුරුෂ" යන මෙහි ශුද්ධ යනු ප්‍රඥාවට කියනු ලැබේ යම් ප්‍රඥාවක් මනාදැනීමක් ඇත්තේ අමොහ යයිද, ධර්ම විචයයයිද, දෘෂ්ටියයිද කියනුලැබේ. කවර කරුණකින් ප්‍රඥාවට ධොතයයි කියනු ලැබේද, (ii) ඒ ප්‍රඥාවෙන් කාය දුශ්චරිතය ඉවත්කරණ

ලද්දේද, සෝදා හරින ලද්දේද, වාග් දුශ්චරිතය ඉවත් කරණ ලද්දේද සෝදා හරින ලද්දේද මනස් දුශ්චරිතය ඉවත් කරණ ලද්දේද සෝදා හරින ලද්දේද, රාගය, ද්වේෂය, මොහය, ක්‍රොධය, බද්ධවෛරය, ගුණමකුකම, අනුන්ට දොස්කීම ඉවත් කරණ ලද්දේද සෝදා හරින ලද්දේද, එකට එක කිරීම, මානය අතිමානය, මදය, ප්‍රමාදය ඉවත් කරණ ලද්දේද සෝදා හරින ලද්දේද, සියලු කෙලෙස්, සියලු දුසිරිත්, සියලු දාහයෝ සියලු පරිදාහයෝ සියලු තැවිලි සියලු අකුසලාභි සංස්කාරයෝ ඉවත් කරණ ලද්දේද, සෝදා හරින ලද්දේද, ඒ කාරණයෙන් (iii) "ශුද්ධ" යයි ප්‍රඥාවට කියනුලැබේ. (iv) යලිදු හෝ සම්‍යක් දෘෂ්ටියෙන් මිථ්‍යාදෘෂ්ටිය, ඉවත් කරණ ලද්දේද සෝදා හරින ලද්දේද, සම්‍යක් සංකල්පයෙන් මිථ්‍යා සංකල්පය ඉවත් කරණ ලද්දේද සෝදා හරින ලද්දේද, සම්‍යක් වචනයෙන් මිථ්‍යා වචනය ඉවත් කරණ ලද්දේද, සෝදා හරින ලද්දේද, සම්‍යක් කර්මාන්තයෙන් මිථ්‍යා කර්මාන්තය ඉවත් කරණ ලද්දේද සෝදා හරින ලද්දේද සම්‍යක් ආජීවයෙන් මිථ්‍යා ආජීවය, සම්‍යක් ව්‍යායාමයෙන් මිථ්‍යා ව්‍යායාමය, සම්‍යක් සති (සිහි) යෙන් මිථ්‍යා (වැරදි) සතිය, සම්‍යක් සමාධියෙන් මිථ්‍යා සමාධිය, සම්‍යක් ඥානයෙන් මිථ්‍යා ඥානය ඉවත් කරණ ලද්දේද සෝදා හරින ලද්දේද, සම්‍යක් විමුක්තියෙන් මිථ්‍යා විමුක්තිය ඉවත් කරණ ලද්දේද, සෝදා හරින ලද්දේද, යලිදු හෝ ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගයෙන් සියලු කෙළෙස් සියලු දාහයෝ සියලු පරිදාහයෝ සියලු සන්තාපයෝ සියලු කුශලභි සංස්කාරයෝ ඉවත් කරණ ලද්දේද සෝදා හරින ලද්දේද රහතන් වහන්සේ මේ "ශුද්ධ" ධර්මයන්ගෙන් යුක්තවූයේ වෙයි. විශෙෂයෙන් යුක්තවූයේ වෙයි. (v) එබැවින් උන්වහන්සේට "ශුද්ධ" යයි කියනු ලැබේ. එබැවින් ඒ රහතන් වහන්සේ විසින් රාගය සෝදා හරින ලද්දේය පාපය සෝදා හරින ලද්දේය. ක්ලෙශයන් සෝදා හරින ලද්දේය සියලු පරිදාහයන් ඉවත්කරණ ලද්දේය. සෝදා හරිනලද්දේය එබැවින් "ශුද්ධ" නමි.

2 "ශුද්ධ පුරුෂතෙමේ මායාද මානයද හැර" යන්නෙහි රැවටිලි හැසිරීම මායාවයයි කියනු ලැබේ. (ii) මේ ලොකයෙහි

ඇතමෙක් කයින් දුසිරිතෙහි හැසිර වචනයෙන් දුසිරිතෙහි හැසිර එය වැසීමේ හේතුවෙන් ලාමක කල්පනාවට බැස ගනියි. මා අන්‍යයෝ නොදනිත්වා නොපෙණෙත්වායි බලාපොරොත්තු වෙයි. මා අන්‍යයෝ නොදනිත්වා නොපෙණෙත්වායි කල්පනා කරයි. මා අන්‍යයෝ නොදනිත්වා නොපෙණෙත්වායි කයින් ඉක්මවයි. මෙබඳුවූ යම් රැවටිල්ලක් රැවටිලි බවක් වරදක් කෛරාටික කමක් සැඟවීමක් වැසීමක් අප්‍රකට කිරීමක් පාප ක්‍රියාවක් ඇද්ද මෙය රැවටිල්ලයයි කියනු ලැබේ. "මාන" යනු (iii) යම් චිත්තයාගේ උන්නති භාවයක් ඇද්ද එක් ආකාරයකින් මාන්නයයි. තමා උසස් කොට සැලකීම අනුන්ට නින්දා කිරීම යනු දෙආකාරයකින් මාන්නයයි ශ්‍රෙෂ්ඨ වෙමියි සිතන මානය, සමාන වෙමියි සිතන මානය පහත් වෙමියි සිතන මානය යනු තුන් ආකාරයකින් මානයයි. (iv) ලාභයෙන් මානය උපදවයි. කීර්තියෙන් මානය උපදවයි. ප්‍රශංසාවෙන් මානය උපදවයි. සැපයෙන් මානය උපදවයි. යනු කරුණු සතරකින් මානය උපදවීමයි. මනවඩන්නාවූ රූපයන් ලැබුවේ වෙමියි මාන්නය උපදවයි මනවඩන්නාවූ ශබ්දයන් ලැබුවේ වෙමියි මාන්නය උපදවයි. මනවඩන්නාවූ ගන්ධයන් රශයෙන් ස්පර්ශයන් ලැබුවේ වෙමියි මානය උපදවයි යනු පස් ආකාරයකින් මාන්නය උපදවයි (v) ඇස් ලැබීම නිසා මානය උපදවයි. කන් ලැබීම නිසා මානය උපදවයි. නාසය ලැබීම නිසා මානය උපදවයි. දිව ලැබීම නිසා කායයන් ලැබීම නිසා මානය උපදවයි යනු සය ආකාරයකින් මාන්නය උපදවීමයි. මානය අතිමානය මානාතිමානය අවමානය අධිමානය අස්මි මානය මිථ්‍යා මානය යනු සත් ආකාරයකින් මාන්නය ඉපදවීමයි (vi) ලාභයෙන් මාන්නය උපදවයි. අලාභයෙන් අවමානය උපදවයි. කීර්තියෙන් මානය උපදවයි අපකීර්තියෙන් අවමානය උපදවයි. ප්‍රශංසාවෙන් මානය උපදවයි. නින්දාවෙන් අවමානය උපදවයි. සැපයෙන් මානය උපදවයි. දුකෙන් අවමානය උපදවයි නවවැදෑරුම් මානයෙන් එනම් ශ්‍රෙෂ්ඨයාට ශ්‍රෙෂ්ඨවෙමියි ඇතිවන මානය, ශ්‍රෙෂ්ඨයාට සමානවෙමියි ශ්‍රෙෂ්ඨයාට හීනවෙමියි. සමානයාට ශ්‍රෙෂ්ඨවෙමි. සමානයාට සමාන වෙමි. සමානයාට හින වෙමියි ඇතිවන

මානය යනු නවවැදෑරුම් මානයයි, දශවැදෑරුම් මානය නම්, (vii) මේ ලෝකයෙහි ඇතැමෙක් ජාතියෙන් හෝ ගෝත්‍රයෙන් හෝ කුලයෙන් හෝ පැහැසපුවෙන් හෝ ධනයෙන් හෝ ඉගෙණීමෙන් හෝ කර්මාන්තයෙන් හෝ ශිල්පායතනයෙන් හෝ විද්‍යායතනයෙන් හෝ බොහෝ දේ දැනීමෙන් හෝ වැටහීමෙන් හෝ වෙන යම් කරුණකින් හෝ යමෙක් මෙබඳු මානයක් සිතේ උසස් බවක් උසස්යයි හැඟීමක් කොඩියක්සේ ඉදිරිපත් කරගත් මානයක් වේනම් එයයි. මෙය මානයයි කියනු ලැබේ "ශුද්ධ පුරුෂයා මායාවද මානයද හැරදමා' යනු නුවණැත්තා රැවටිල්ලද මානයද හැර දුරුකොට පහකොට නූපදනා බවට පමුණුවා වාසය කරයි.

3 "රැස්කිරීමක් නැති තැනැත්තේ කවර මඟකින් යන්නේද යනු පැමිණීම් දෙකක් වෙති. තෘෂ්ණාව රැස්කිරීම දෘෂ්ටිය රැස්කිරීම යන දෙකයි. (ii) මෙහි (2-6) 1 (ii) (iii) ඡේදවල "මමත්වය" වෙනුවට "රැස්කිරීමයි" වෙනස්කොට යොදාගත යුතුයි) (iii) ඔහුගෙ තෘෂ්ණාව රැස්කිරීම ප්‍රහීණවූයේ වෙයි. දෘෂ්ටිය රැස්කිරීම දුරු කරණ ලද්දේ වේ. තෘෂ්ණාව රැස්කිරීම ප්‍රහීණවූ බැවින් දෘෂ්ටිය රැස්කිරීම දුරු කළ බැවින් රැස්කිරීම් රහිතවූ පුද්ගලතෙම කවර කරුණකින් (iv) රාගයට පැමිණෙන්නේද කවර කරුණකින් ද්වෙෂයට පැමිණෙන්නේද කවර කරුණකින් මෝහයට පැමිණෙන්නේද කවර දෘෂ්ටියකට පැමිණෙන්නේද කවර තැන්පත් ක්ලෙශයකින් (v) රාගය ඇත්තෙකැයි ද්වෙෂය ඇත්තෙකැයි මුලාවට පැමිණියෙකැයි හෝ එකට බැඳුනේයයි කියා හෝ පරාමර්ශය කළේයයි කියා හෝ අවුලට පත්වූයේයයි කියා හෝ නිමාවට නොපැමිණියේයයි කියා හෝ උත්සාහයට පැමිණියේයයි කියා හෝ කියද්ද, ඔව්හු රැස්කිරීම් ප්‍රහීණ කළහ රැස්කිරීම් ප්‍රහීණ කළ බැවින් ගතියකට කවරකින් යන්නේද, නිරිසතෙක කියා හෝ තිරිසන් සතෙක කියා හෝ ප්‍රෙතාත්මයට පැමිණියෙකැයි කියා හෝ මිනිසෙකැයි කියා හෝ දෙවියෙකැයි කියා හෝ රූපී බ්‍රහ්මයෙකැයි කියා හෝ අරූපී බ්‍රහ්මයෙකැයි කියා හෝ සඤ්ඤීයයි කියා හෝ අසඤ්ඤීයයි කියා හෝ

නෙවසඤ්ඤිනාසඤ්ඤියයි කියා හෝ කියන්නට හේතුවක් නැත. ප්‍රත්‍යයයක් නැත, කාරණයක් නැත.

4 "රැස්කිරීම් ඇත්තේම ධර්මයන්හි වාදයට එයි" යනු තෘෂ්ණාව රැස්කිරීමද දෘෂ්ටිය රැස්කිරීමද යන දෙකයි (මෙහි 3 (iii) ඡේදය යෙදිය යුතුයි) මේ තෘෂ්ණාව රැස්කිරීමයි මේ දෘෂ්ටිය රැස්කිරීමයි ඔහුගේ තෘෂ්ණාව රැස්කිරීම ප්‍රහීණ නොවූයේය. දෘෂ්ටිය රැස්කිරීම දුරුනොකරණ ලද්දේවේ. තෘෂ්ණාව රැස්කිරීම ප්‍රහීණ නොකළබැවින් දෘෂ්ටිය රැස්කිරීම දුරුනොකළ බැවින් රාගය ඇත්තේය කියා හෝ ද්වෙෂය ඇත්තේය කියා හෝ මෝහය ඇත්තේය කියා හෝ බැඳුනේය කියා හෝ පරාමර්ශය කළේයයි කියා හෝ අවුලට පත්වූයේයයි කියා හෝ අනිටු දෙයට ගියේයයි හෝ උත්සාහවත්වූයේය කියා හෝ ධර්මයන්හි වාදයට පැමිණෙයි. ඔව්හු රැස්කිරීම් ප්‍රහීණ නොකළෝය. රැ ස්කිරීම් ප්‍රහීණ නොකළ බැවින් උත්පත්තිය පිළිබඳ වාදයට පැමිණෙත්. නිරිසතෙක කියා හෝ තිරිසන් සතෙක කියා හෝ ප්‍රෙතගති ඇත්තෙකැයි කියා හෝ මිනිසෙක කියා හෝ දෙවියෙක කියා හෝ රූපී බ්‍රහ්මයෙක කියා හෝ අරූපී බ්‍රහ්මයෙක කියා හෝ සඤ්ඤීයයි කියා හෝ අසඤ්ඤියයි කියා හෝ නෙවසඤ්ඤිනාසඤ්ඤියයි කියා හෝ වාදයට පැමිණෙයි, එළඹෙයි, ගනියි.

5 "රැස් නොකරන්නේ කුමකින් කෙසේ කියන්නේද" යන්නෙහි පැමිණීම් දෙකකි. තෘෂ්ණාවට පැමිණීම දෘෂ්ටියට පැමිණීම යන දෙකයි 'තෘෂ්ණා මමත්වය" වෙනුවට "තෘෂ්ණාවට පැමිණීම" කියා වෙනස්කර (2-6) 1 (ii) (iii) ඡේද යෙදිය යුතුයි.) ඔහුගේ තෘෂ්ණාව ප්‍රහීණවූයේය. දෘෂ්ටිය දුරුවූයේය තෘෂ්ණාව ප්‍රහීණවූ බැවින් දෘෂ්ටිය දුරු කරණ ලද බැවින් රැස් නොකළ පුද්ගලයාට කවර රාගයෙන් කරුණු කියන්නේද, කවර ද්වෙෂයෙන් කරුණු කියන්නේද, කවර මොහයෙන් කරුණු කියන්නේද, කවර මානයෙන් කරුණු කියන්නේද, කවර දෘෂ්ටියෙන් කියන්නේද, කවර සිතේ නොසන්සුන්කමින් කරුණු කියන්නේද කවර විචිකිච්ඡාවෙන් කියන්නේද? කවර තැන්පත්වූ

රාගයන්ගෙන් කියන්නේද රාගය ඇත්තෙකැයි කියා හෝ (මෙහි 3 (v) ඡේදය යෙදිය යුතුයි.) එබඳු හේතුවක් නැත. එබඳු ප්‍රත්‍යයක් නැත, කාරණයක් නැත. යමකින් කරුණු කියන්නේද ප්‍රකාශ කරන්නේද (එයට හේතුවක් නැත)

6 "ඔහුට ආත්මය නිරාත්මයයි යමක් නැත" යන්නෙහි ආත්ම යන්නෙන් දක්වන දෘෂ්ටිය නැත. "නිරත්ත" යන්නෙන් දක්වන උච්ඡේද දෘෂ්ටිය නැත. ආත්මයයි ගන්නා ලද්දක් නැත. ආත්මය නොවේයයි මිදියයුත්තක් නැත. යමෙකුට ගැණීමක් ඇත්නම් මිදිය යුත්තකුත් ඇත. යමෙකුට මිදිය යුත්තක් ඇත්නම් ගැණීමකුත් ඇත ගැණීමද මිදීමද ඉක්මවූ රහතුන් වහන්සේ වැඩීමද පරිහානියද නැවැත්වූසේක. (ii) උන්වහන්සේ වැස නිමවනලද වාස ඇත්තේ පුරුදු කළ පැවැත්ම ඇත්තේ ඇත්කළ ජාති ජරා මරණ සංසාර ඇත්තේ උන්වහන්සේට නැවත උත්පත්තියක් නැත.

"හෙතෙම මෙහිම සියලු දෘෂ්ටිය නැසීය" යන්නෙහි ඔහුගේ දෙසැටක් වැරදි දෘෂ්ටීහු ප්‍රහීණවූහ. සිඳුනාහ. සංසිඳුනාහ. ඉපදීමට අයොග්‍යවූහ. ඥානය නමැති ගින්නෙන් දැවුනාහ. හෙතෙම ගන්නා ලද සියලු දෘෂ්ටීහු මෙහිදීම දුරු කළේය. නූපදින බවට පැමිණවිය

## සුද්ධට්ඨක සූත්‍ර නිර්දෙශයː-

## 4 - 1

1 "ශුද්ධවූ උතුම්වූ රොග නැත්තහු දකිමි" පිරිසිදුවූවහු දකිමි පිරිසිදුවූවහු බලමි. පිරිසිදුවූවහු මනාකොට බලන්නෙමි."

2 "උතුම් නිරොගී බව" යනු උතුම්වූ නිරොග බවට පැමිණි ආරක්ෂා බවට පැමිණි, පිහිට බවට පැමිණි, අභය බවට පැමිණි ච්‍යුත නොවන බවට පැමිණි අමෘත බවට පැමිණි නිර්වාණයට පැමිණියාහු බලමි.

3 "ඉදින් දෘෂ්ටිය කරණ කොට මනුෂ්‍යයාගේ ශුද්ධිය වේද" චක්ෂුර්විඥානයෙන් රූප ද දර්ශනයෙන් මිනිසාගේ ශුද්ධියද විශුද්ධියද පරිශුද්ධියද මුක්තියද විමුක්තියද පරිමුක්තියද වෙයි.

මිනිසා පිරිසිදුවේ මනාකොට පිරිසිදුවේ. මිදේ මනාකොට මිදේ මෙසේ මනාව දන්නේ උතුම්යයි දැන මෙසේ දන්නේ අවබොධ කරන්නේ මෙය පරමය, අග්‍රය, ශ්‍රෙෂ්ඨය, උතුම්යයි දැන තීරණයකොට, ප්‍රකටකොට, යනුයි.

4 "ශුද්ධි භාවය බලන්නේ නුවණට පැමිණේ" යනු හෙතෙම පිරිසිදුවූවහු දකියි. හෙතෙම පිරිසිදුවූවහු අනුව බලන්නේ නුවණට පැමිණේ" යනු චක්ඛු විඤ්ඤාණය රූප දර්ශනයෙන් ඥානයයි හඟියි, මාර්ගයයි හඟයි, පාරයයි හඟියි පැමිණීමයයි හඟියි.

## 4 - 2

1 "දැකීමෙන් ඉදින් මනුෂ්‍යයාට ශුද්ධිය වේද" යන්නෙහි චක්ෂුර් විඥානයෙන් රූප දර්ශනයෙන් ඉදින් සත්වයාගේ ශුද්ධිය විශුද්ධිය පාරිශුද්ධිය මුක්තිය විමුක්තිය උසස් විමුක්තිය වෙයි. සත්වයා පිරිසිදු වෙයි. මිදෙයි.

2 "හෙතෙම නුවණින් හෝ දුක යටත් කරයි" චක්ෂුර් විඥානයෙන් රූප දර්ශනයෙන් සත්වතෙම ජාතිදුක දුරු කරයි ජරාදුක දුරු කරයි. ව්‍යාධි දුක දුරු කරයි මරණ දුක දුරු කරයි. ශොක පරිදෙව (වැළපීම) දුක්ඛ (කායික දුක) දොමනස්ස, උපායාස දුක්ඛයෝ දුරු කරයි. පව් සහිතවූයේ හෙතෙම අනෙකකින් ශුද්ධවේ" යන්නෙහි අනික් අශුද්ධි මාර්ගයකින් මිථ්‍යා ප්‍රතිපදාවකින් අනෛර්‍යාණික මාර්ගයකින් එනම් සතර සතිපට්ඨානයන් හැර සතර සම්‍යක් ප්‍රධානයන් හැර සතර ඍද්ධිපාදයන් හැර ඉන්ද්‍රිය ධර්මයන් හැර බල ධර්මයන් හැර බොධ්‍යංග ධර්මයන් හැර ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය හැර පිරිසිදුවේයයි මිදේයයි, "පව් සහිතවූයේ යනු රාග සහිතයා ද්වෙෂ සහිතයා මොහ සහිතයා තෘෂ්ණාව සහිතයා දෘෂ්ටි සහිතයා ක්ලෙශ සහිතයා උපාදාන සහිතයා යනුයි.

දෘෂ්ටිහු එසේ කියන ඔහු ප්‍රකාශ කරති." යනු ඒ දෘෂ්ටිය ඒ පුද්ගලයා ප්‍රකාශ කරයි. මෙසේ මේ පුද්ගලතෙම මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ විපරීත දර්ශන ඇත්තේය යනුයි. "එසේ එසේ කියන" යනු එසේ කියන්නාවූ එසේ ප්‍රකාශ කරන්නාවූ "ලොකය ශාස්වතය මෙයම සත්‍යය අනික හිස්යයි" එසේ කියන්නාවූ

එසේ ප්‍රකාශ කරන්නාවූ ලොකය අශාස්වතය ලොකය කෙළවරක් ඇත්තේය. ලොකය කෙළවරක් නැත්තේය. එය ජීවයයි එය ශරීරයයි අනිකක් ජීවය අනිකක් ශරීරයයි සත්වයා මරණින් මතුවෙයි සත්වයා මරණින් මතුනොවෙයි සත්වයා මරණින් මතු ඇත්තේද නැත්තේද වෙයි. සත්වයා මරණින්මතු නොම ඇත්තේද නොම නැත්තේද වෙයි. මෙයම සත්‍යය අනිකක් හිස්යයි එසේ කියන්නාවූ එසේ ප්‍රකාශ කරන්නාවූ යනුයි.

## 4 - 3

1 "දුටුවෙහි ඇසූවෙහි සිල් හා වත්හි මූතයෙහි ශුද්ධිය බ්‍රාහ්මණතෙමේ වෙනස් කොට නොකියයි." යන්නෙහි "නො" යනු ප්‍රතික්ෂෙපයයි, බ්‍රාහ්මණ යනු ධර්ම සතක් මැඩ පැවැත්වූ බැවින් බ්‍රාහ්මණ නම්. එනම් සත්කාය දෘෂ්ටිය මැඩ පවත්වන ලද්දේ වෙයි. විචිකිච්ඡාව (-බුද්ධාදී අට තැන සැකය) මැඩපවත්වන ලද්දේ වෙයි. ශීලව්‍රත පරාමාශය මැඩපවත්වන ලද්දේ වෙයි. රාගය මැඩ පත්වන ලද්දේ වෙයි ද්වෙෂය මැඩ පවත්වන ලද්දේ වෙයි, මොහය මැඩපවත්වන ලද්දේ වෙයි මානය මැඩපවත්වන ලද්දේ වෙයි, දාහය ඇති කරන්නාවූ නපුරු විපාක ඇති අනික් භවයක් ඇති කරවන්නාවූ කෙලෙස් සහිතවූ ලාමකවූ නැවත ජරා මරණ ඇති කරවන්නාවූ අකුශල ධර්ම මැඩ පවත්වන ලද්දේ වෙයි.

2 "බ්‍රාහ්මණතෙමේ අන් පරිද්දකින් ශුද්ධිය නොකියයි" යන්නෙහි බ්‍රාහ්මණතෙම අන්‍යවූ මාර්ගයකින් මිථ්‍යා ප්‍රතිපදාවකින් නෛර්‍යාණික නොවූ මාර්ගයකින් එනම් සතර සතිපට්ඨානයන් හැර සතර සම්‍යක් ප්‍රධානයන් හැර ඉන්ද්‍රිය ධර්මයන් හැර බල ධර්මයන් හැර බොධ්‍යංග ධර්මයන් හැර යම් ඒ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය හැර ශුද්ධිය විශුද්ධිය පාරිශුද්ධිය මුක්තිය විමුක්තිය නොකියයි. ප්‍රකාශ නොකරයි ව්‍යවහාර නොකරයි.

3 "දුටුවෙහි ඇසූවෙහි සිල් හා වත්හි මුතයෙහි" යන්නෙහි සමහර සමහර මහණ බමුණෝ දෘෂ්ටියෙන් විශුද්ධිය බලාපොරොත්තු වන්නෝ ඇත්තාහ. ඔවුහු ඇතැම් රූපයන්ගේ

දර්ශනය මංගලයයි සිතයි. ඇතැම් රූපයන්ගේ දර්ශනය අවමංගලයයි සිතයි. කවර රූපයන්ගේ දර්ශනය මංගලයයි සිතත්ද? (ii) ඔවුහු උදයෙන්ම නැගිට මංගලයයි ඔවුන් සම්මත කළ රූපයන් බලත්. ගේ කුරුල්ලන් බලත්. ශුභයයි සම්මත තරුණ බෙලිගෙඩි බලත්. ගැබිනි ස්ත්‍රිය දකිත්. ළමයකු වඩාගෙන යන්නෙකු බලත්. පුන්කලස බලත්. ලූල් මත්ස්‍යයකු බලත්. ආජානීය සත්වයකු බලත්. ආජානීය සතුන් යෙදූ රථයක් බලත්. ගොනකු බලත්. නිල් රන්වන් පැහැති ගොනකු බලත්. මෙබඳු රූපයන්ගේ දැකීම මංගලයයි සිතත් (iii) කවර රූපයන්ගේ දැකීම අවමංගලයයි සිතත්ද? (iv) පිදුරු ගොඩක්, ගිතෙල් කලයක්, නැට්ටුවකු, නිර්වස්ත්‍ර ශ්‍රමණයකු, කොටලුවකු යෙදූ රථයක්, එක් කෙනෙකුගෙන් යුත් යානයක්, කණෙකු, අත් කොරවූ අයකු, අත්පා කොර වූවකු, පිලෙකු පක්ෂයක් අවසඟවූවකු, මහල්ලකු, ලෙඩවූවකු, මෘතශරීරයක්, මෙබඳු දේ දැකීම අමංගලයයි සිතත් (v) ඒ මේ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ දෘෂ්ටියෙන් විශුද්ධිය බලාපොරොත්තු වන්නෝ වෙති. ඇසූ දේ ශුද්ධිය කොට ඇති ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. ඔව්හු ඇතැම් ශබ්දයන්ගේ ශ්‍රවණය මංගලයයි සිතත්. කවර ශබ්දයන්ගේ ශ්‍රවණය මංගලයයි සිතත්ද? (vi) ඔවුහු උදයෙන්ම නැගිට අභිමංගලයයි සම්මත ශබ්දයන අසත් වැඩෙයි. වැඩෙනු ලබන්නේය. පිරෙයි යනු හෝ ශොක නැත්තේය යහපත් සිත් ඇත්තේය. යහපත් නැකතය, යහපත් මංගලය, ශ්‍රීය, ශ්‍රීය ඇතිකිරීම යන මේ ශබ්දයන්ගේ ඇසීම මංගලයක් වෙයි. (vii) කවර ශබ්දයන්ගේ ඇසීම අමංගලයක්යයි සිතත්ද? (viii) කණෙක, අත කොර වූවෙක, පය කොරවූවෙක, අත්පා කොරවූවෙක, පක්ෂයක් අවසඟ වූවෙක, මහලු වූවෙක, ලෙඩවූවෙක, මළේය, සිඳුනේය, බිඳුනේය, දැවුනේය, නැසුනේය, නැත, මෙබඳු ශබ්දයන්ගේ ශ්‍රවණය අමංගලයයි සිතත්. (ix) මෙසේ ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇසීමෙන් ශුද්ධිය විශුද්ධිය පාරිශුද්ධිය මුක්තිය විමුක්තිය වේයයි සිතත් ශීලය ශුද්ධිය කොටගත් ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. ඔවුහු ශීල මාත්‍රයෙන් හික්මීම් මාත්‍රයෙන් සංවර මාත්‍රයෙන් යමක් ඉක්මවූ

මාත්‍රයෙන් ශුද්ධිය විශුද්ධිය පාරිශුද්ධිය මුක්තිය, විමුක්තිය බලාපොරොත්තු වෙත්. මණ්ඩිකා පුත්‍ර ශ්‍රමණතෙම මෙසේ කීය.

4 "ථපතිය, මම ධර්ම සතරකින් යුක්ත පුද්ගලයා කුසල් ඇති උතුම් කුසල් ඇති උතුම් පැමිණීමට පැමිණි ශ්‍රමණයායයි යොදමි. කවර සතරකින්ද යත්, ථපතිය, (ii) මෙහි කයින් පව්කම් නොකෙරේද, පාපිවූ වචන නොකියාද, පාපිවූ වචන නොකියාද, පාපිවූ කල්පනාවන් කල්පනා නොකෙරේද ලාමකවූ දිවිපැවැත්ම නොකෙරේද, ථපතිය, මේ ධර්ම සතරින් යුක්තවූ පුද්ගලයා කුසල් ඇති උතුම් කුසල් ඇති උතුම් පැමිණීමට පැමිණි ශ්‍රමයාණයයි යොදමි (iii) එමෙන්ම ශීලය පිරිසිදුකොට ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. ඔවුහු ශීල මාත්‍රයෙන් හික්මීම් මාත්‍රයෙන් ඉක්මවීම් මාත්‍රයෙන් ශුද්ධිය පාරිශුද්ධිය මිදීම බලාපොරොත්තු වෙත්. ව්‍රතය පිරිසිදු කොට ඇති ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. ඔවුහු හස්තිව්‍රත ඇත්තෝ හෝ වෙත්. අශ්ව ව්‍රත ඇත්තෝ වෙත්. ගවව්‍රත ඇත්තෝ වෙත් ශුනඛ ව්‍රත ඇත්තෝ වෙත්, කාක ව්‍රත ඇත්තෝ හෝ වෙත්. වාසුදේව ව්‍රත ඇත්තෝ හෝ වෙත්. බලදේව ව්‍රත ඇත්තෝ හෝ වෙත්. පූර්ණභද්‍ර ව්‍රත ඇත්තෝ හෝ වෙත්. මණිභද්‍රව්‍රත ඇත්තෝ හෝ වෙත්. අග්නි ව්‍රත ඇත්තෝ හෝ වෙත්. නාගව්‍රත ඇත්තෝ හෝ වෙත්. සුපර්ණව්‍රත ඇත්තෝ හෝ වෙත්. යක්ෂව්‍රත ඇත්තෝ හෝ වෙත්. අසුර ව්‍රත ඇත්තෝ හෝ වෙත්. ගාන්ධර්වව්‍රත ඇත්තෝ හෝ වෙත්. මහාරාජව්‍රත ඇත්තෝ හෝ වෙත්. චන්ද්‍රව්‍රත ඇත්තෝ හෝ වෙත් සූර්යව්‍රත ඇත්තෝ හෝ වෙත්. ඉන්ද්‍රව්‍රත ඇත්තෝ හෝ වෙත්. බ්‍රහ්මව්‍රත, දෙවව්‍රත, දිශාව්‍රත, ඇත්තෝ හෝ වෙත්. ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මේ ව්‍රතයන් ශුද්ධිය කොට ඇත්තෝ වෙත්. සදොරින් ස්පර්ශය ශුද්ධිය කොට ඇති ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. ඔවුහු උදයෙන් නැගිට පොළොව ස්පර්ශ කරත්. පලාවන් දේ, ගොම, කැස්බෙකු, නගුල්තලය පාගත්. කරත්තයක් බලති, අතගාති, ස්පර්ශ කළ තල කති. ස්පර්ශ කළ තෙල් ගා ගණිත්. ස්පර්ශ කළ දැහැටි විකති. ස්පර්ශකළ මැටි ඇඟ ගා නාති. ස්පර්ශ කළ රෙදි අඳිති. ස්පර්ශකළ සළුවක් පොරවති. ස්පර්ශකළ හිස් වෙළුමක් වෙලාගනිති. මේ ශ්‍රමණ

බ්‍රාහ්මණයෝ සදොරින් ස්පර්ශය ශුද්ධිය කොට ඇත්තෝ වෙත්. ඔවුහු ව්‍රතයෙන් ශුද්ධිය විශුද්ධිය පාරිශුද්ධිය මුක්තිය විමුක්තිය බලාපොරොත්තු වෙත්.

5 "දුටුවෙහි ඇසූවෙහි සිල්හි හා වත්හි, මුතයෙහි ශුද්ධිය බ්‍රාහ්මණතෙමේ නොකියයි. යනු බ්‍රාහ්මණතෙම දැකීමේ ශුද්ධියෙන්ද ශුද්ධිය නොකීවේය. ඇසීමේ ශුද්ධියෙන්ද ශුද්ධිය නොකීවේය. ශීල ශුද්ධියෙන්ද ශුද්ධිය නොකීවේය. මුත ශුද්ධියෙන්ද, ව්‍රතශුද්ධියෙන්ද නොකීවේය. පඤ්චෙන්ද්‍රියෙන්ද ස්පර්ශයෙන් වන ශුද්ධියද නොකීවේය නොකියයි ප්‍රකාශ නොකරයි. ව්‍යවහාර නොකරයි.

6 "පිනෙහි ද පවෙහිද, නොඇලුණේ" යනුවෙන් යම් කිසි ත්‍රෛධාතුකවූ කුශලාභිසංස්කාරයක් ඇත්නම් එය පින යයි කියනු ලැබේ. සියලු අකුශල් අකුසලය යයි කියනු ලැබේ. යම් හෙයකින් පුණ්‍යාභි සංස්කාරයද, අපුණ්‍යාභිසංස්කාරයද අනෙඤ්ජාභි සංස්කාරයද ප්‍රහීණවූවාහු වෙද්ද, උදුරනලද කෙලෙස් මුල් ඇති අග හෝ මුල සිඳින ලද තල් ගසක් මෙන් ඇති නොවනබවට පැමිණෙව්වාහු වෙති. මෙපමණකින් පිනෙහිද, පවෙහිද, නොඇලෙයි. නොඇළුනේ නික්මුනේ වෙන්වූයේ සීමානොකරණ ලද සිතින් වාසය කරයි.

7 "ආත්මදෘෂ්ටිය හළෝ මෙහි නොකරන්නේ" යන්නෙහි "ආත්මදෘෂ්ටිය හළෝ" යනු ආත්මදෘෂ්ටිය දුරු කළේ අල්වාගැනීම දුරුකළේ, තෘෂ්ණා වශයෙන් දෘෂ්ටි වශයෙන් ගන්නාලද පරාමර්ශකළ බැසගන්නාලද, ඇතුලුවූ ඒ සියල්ල දුරුකළේ වමාරා දැමුයේ මිදුයේ ප්‍රහීනවූයේ වෙයි.

8 (i) "මෙහි නොකරන්නේ" යනු පුණ්‍යාභිසංස්කාරය හෝ අපුණ්‍යාභි සංස්කාරය හෝ අනෙඤ්ජාභි සංස්කාරය හෝ නොකරන්නේ නූපදවන්නේය යනුයි.

## 4 - 4

1 "පළමුවැන්නා හැර අනෙකා ඇසුරුකළාහු" යන්නෙහි පෙර ශාස්තෘවරයා හැර අනික් ශාස්තෘවරයකු ඇසුරු කළේ

පෙර කියාදුන් ධර්මය හැර අනික් ධර්මයක් ඇසුරු කළේ පෙර ඇසුරුකළ සමූහය අත්හැර අනික් සමූහය ඇසුරුකළේ පෙර දෘෂ්ටිය අත්හැර අනික් දෘෂ්ටියක් ඇසුරු කළේ පෙර ප්‍රතිපදාව අත්හැර අනික් ප්‍රතිපදාවක් ඇසුරුකළේ පෙර මාර්ගය අත්හැර අනික් මාර්ගයක් ඇසුරුකළේ ඇලුනේ එළඹියේ බැසගත්තේ යනුයි.

2 "තෘෂ්ණාව අනුව ගිය ඔවුහු ඇල්ම නොඉක්මවත්" යන්නෙහි ඇල්ම යනු තෘෂ්ණාවට කියනු ලැබේ. යම් රාගයක් ඇද්ද, ඇලීමක් ඇද්ද (ii) (1-3) 4 ඡෙදයේ "යම් ලංවීමෙක් ඇද්ද" යන තැන් සිට "තෘෂ්ණාව සමුද්‍රය" දක්වා යෙදිය යුතුයි) විෂම ලෝභයක් ඇද්ද, ලොභයක් ඇද්ද අකුශලයක් ඇද්ද එයයි.

3 "තෘෂ්ණාව අනුව ගියාහු" යනු තෘෂ්ණාව අනුව ගියාවූ තෘෂ්ණාවට පැමිණියාවූ තෘෂ්ණාවෙන් මඩිනාලද තෘෂ්ණාවෙන් හාත්පසින් ගන්නාලද ඔව්හු

4 "ඇල්ම නොඉක්මවත්" රාගය නමැති ඇලීම ද්වෙෂය නමැති ඇලීම, මොහය නමැති ඇලීම, මානය නමැති ඇලීම, දෘෂ්ටිය නමැති ඇලීම, ක්ලේශ නමැති ඇලීම, දුශ්චරිත නමැති ඇලීම තරණය නොකරත්, නොපිහිනත්, නොඉක්මවත්.

5 "ඔවුහු වැළඳගනිත්. හැරදමත්" යනුවෙන් ශාස්තෲවරයා ගනිත්. ඔහු හැර අනික් ශාස්තෲ කෙනෙකු ගනිත්. ධර්මය ගනිත්. එය හැර වෙනින් ධර්මයක් ගනිත්. ශ්‍රාවක සමූහයා ගනිත්. එය හැර අනික් ශ්‍රාවක සමූහයා ගනිත්. දෘෂ්ටිය ගනිත්. එය හැර අනික් දෘෂ්ටියක් ගනිත් ප්‍රතිපදාවක් ගනිත්. එය හැර අනික් ප්‍රතිපදාවක් ගනිත්. මාර්ගය ගනිත්. එය හැර අනික් මාර්ගයක් ගනිත්. ගන්නාහුද මුදන්නාහුද වෙත්.

6 "වඳුරා මෙන් ඉදිරි අත්ත අල්ලාගෙන යන්නෙහි යම්සේ වඳුරා මහ කැලෑවෙහි හැසිරෙන්නේ අත්තක් අල්ලයි. එය අතහැර වෙනින් අත්තක් අල්ලයි. එයද අතහැර වෙනින් අත්තක් අල්ලයි. එසේම බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ බොහෝ දෘෂ්ටීන් ගනිත්. එමෙන්ම මුදත්.

## 4 - 5

1 "සත්ත්ව තෙමේ ව්‍රතයන් සමාදන්ව" යන්නෙහි තෙමේ සමාදන්ව යනු තෙමේ සමාදන්ව යනුයි. වනාහි යන්නෙහි හස්තිව්‍රතය හෝ අශ්ව ව්‍රතය හෝ (4-4) 4 (ii) 'ඇත්තෝ වෙත්' වෙනුවට 'ගෙන සමාදන්ව' කියා වෙනස්කර යෙදිය යුතුයි.) දිශාව්‍රතය හෝ ගෙන සමාදන්ව දැඩිකොට ගෙන පරාමර්ශ කොට බැසගෙන සත්ව තෙමේ යනු සත්වයා මිනිසා (මෙහි (1-2) 7 (ii) ඡෙද යෙදිය යුතුයි) "හැඟීම්වල ඇලුණේ ලොකු කුඩාවුන් කරායත්" යන්නෙහි ශාතෲන් වහන්සේ කෙනෙකුගෙන් තවත් ශාස්තෲන් වහන්සේ කෙනෙකු ලඟටයයි. ධර්මයකින් තවත් ධර්මයක් කරා යයි. ශ්‍රාවක ගණයාගෙන් තවත් ශ්‍රාවක සමූහයකටයයි. දෘෂ්ටියකින් දෘෂ්ටියකටයයි ප්‍රතිපදාවකින් තවත් ප්‍රතිපදාවකට යයි. මාර්ගයකින් තවත් මාර්ගයකටයයි

2 "හැඟීම්වල ඇලුණේ" යනු කාම සංඥාවෙන් ව්‍යාපාද සංඥාවෙන් විහිංසා සංඥාවෙන් දෘෂ්ටි සංඥාවෙන් ඇළුනේ විශෙෂයෙන් ඇළුනේ ලග්නවූයේ කිළිටිවූයේ යම්සේ බිත්තියෙහි ඇති උලක හෝ කොක්කක හෝ භාණ්ඩයක් එල්වුනේ ඇලුනේ ලැගුනේ වේද, එමෙන්ම කාම සංඥාවෙන් ඇළුනේ ව්‍යාපාද සංඥාවෙන් විහිංසා සංඥාවෙන් දෘෂ්ටි සංඥාවෙන් සත්වයා ඇළුනේ ලැගුනේ කිළිටිවූයේ යනුයි.

3 "නුවණැත්තෝ සතර මඟපල කරණ කොට ධර්මයට පැමිණ" යනු උගත් තැනැත්තේ නුවණැත්තේ "සතර මඟ පලකරණකොට" යන්නෙහි වෙදයයි සතරමාර්ග ඥානයට කියනු ලැබේ (ii) ප්‍රඥාව, ප්‍රඥෙන්ද්‍රිය, ප්‍රඥාබලය, ධර්මවිචය සම්බොධ්‍යංගය, විමංසාව විදර්ශනාව සම්‍යක් දෘෂ්ටිය යනුයි. එබඳු වෙදයන්ගෙන් ජාතිජරා මරණයන්ගේ කෙළවරට ගියේ අන්තයට ගියේ ආරක්ෂාවට ගියේ පිහිටට ගියේ ච්‍යුත නොවන බවට ගියේ නිවණට ගියේ යනුයි වෙදයන්ගේ කෙළවරට ගියේනුයි හෝ වෙදයන්ගෙන් කෙළවරට ගියේනුයි. වෙදගු නම් වේ. ධර්ම සතක් දන්නා ලද බැවින් වෙදගු නම්වේ' (iii) ආත්ම දෘෂ්ටිය දන්නා ලද බැවින් සැකය දන්නා ලද බැවින්

අන්‍ය ශීලව්‍රතයන් ගැන්ම දන්නාලද බැවින් රාගය දන්නා ලද්දේ වෙයි. ද්වෙෂය දන්නා ලද්දේ වෙයි. මොහය දන්නා ලද්දේ වෙයි. මානය දන්නා ලද්දේ වෙයි. කිළුටු කරන්නාවූ ලාමකවූ නැවත භවයක් ඇති කරවන්නාවූ දාහය ඇති කරවන්නාවූ දුක්ඛ විපාකවූ නැවත ජාතිජරා මරණ ගෙණ දෙන්නාවූ අකුශල ධර්ම දන්නා ලද්දේ වෙයි" ඒ රහතන් වහන්සේ මේ ලොකයෙහි ශ්‍රමණයන්ගේද බ්‍රාහ්මණයන්ගේද සියලු වේදයන් දැන සියලු වේදයන්ගේ රාගය දුරු කළේ සියලු වේදයන් ඉක්මවා සිටියේ වෙයි.

4 "නුවණැත්තේද නුවණ සමග ධර්මයට පැමිණ" යන්නෙහි ධර්මය දැන සියලු සංස්කාරයෝ අනිත්‍යයයි මනාකොට දැන සියලු සංස්කාරයෝ දුක්යයි මනාකොට දැන සියලු සංස්කාරයෝ අනාත්මයයි මනාකොට දැන අවිද්‍යා හේතුවෙන් සංස්කාරයෝ වන්නාහුය මනාකොට ධර්මය දැන සංස්කාර හේතුවෙන් විඥ්ඥානයෝ ඇති වන්නාහුයයි මනාකොට ධර්මය දැක විඥ්ඥාන හේතුවෙන් නාම රූප ඇතිවන්නේයයි මනාකොට ධර්මය දැන නාම රූප හේතුවෙන් ෂඩායතනයන් ඇතිවන්නේයයි මනාකොට ධර්මය දැන ෂඩායතන හේතුවෙන් ස්පර්ශය ඇතිවන්නේයයි ස්පර්ශ හේතුවෙන් වෙදනාව ඇතිවන්නේයයි වෙදනා හේතුවෙන් තෘෂ්ණාව ඇතිවන්නේයයි තෘෂ්ණා හේතුවෙන් උපාදානයන් ඇතිවන්නේයයි උපාදාන හේතුවෙන් භවය ඇතිවන්නේයයි භව හේතුවෙන් ජාතිය (ඉපදීම) ඇතිවන්නේයයි ජාති හේතුවෙන් ජරා මරණ ඇතිවන්නේයයි ධර්මය මනාසේ දැන, අවිද්‍යා නිරොධයෙන් සංස්කාර නිරොධය ඇතිවන්නේයයි සංස්කාර නිරොධයෙන් විඥ්ඥාන නිරොධය ඇතිවන්නේයයි විඥ්ඥාන නිරොධයෙන් නාම රූප නිරොධ වන්නේයයි නාමරූප නිරොධයෙන් ෂඩායතන නිරොධය වන්නේයයි ෂඩායතන නිරොධයෙන් ස්පර්ශ නිරොධය වන්නේයයි ස්පර්ශ නිරොධයෙන් වෙදනා නිරොධය වන්නේයයි වෙදනා නිරොධයෙන් තණ්හා නිරොධය වන්නේයයි තණ්හා නිරොධයන් උපාදාන නිරොධය වන්නේයයි. උපාදාන

නිරොධයෙන් භව නිරොධය වන්නේයයි භව නිරොධයෙන් ජාති නිරොධය වන්නේයයි ජාති නිරොධයෙන් ජරා මරණ නිරොධය වන්නේයයි මනා කොට ධර්මය දැන මෙය දුකයයි මනාකොට ධර්මය දැන, මෙය දුක් හේතුවයයි මනාකොට ධර්මය දැන, මෙය දුක්ඛ නිරොධයයි මනාකොට ධර්මය දැන මෙය දුක්ඛ නිරොධය ඇතිකරගැණීමට ගමන් කිරීමේ මාර්ගයයි මනාකොට ධර්මය දැන, මෙය ආශ්‍රවයෝයයි මනාකොට ධර්මය දැන, මෙය ආශ්‍රවයන් ඇතිවීමේ හේතුවයයි මනාකොට ධර්මය දැන, මෙය ආශ්‍රව නිරොධයයි මනාකොට ධර්මය දැන මෙය ආශ්‍රව නිරොධය ඇතිකරගැණීමට ගමන් කිරීමේ මාර්ගයයි මනාකොට ධර්මය දැන, මේ ධර්මයෝ මනාකොට දැන ගතයුතුයයි මේ ධර්මයෝ උසස්ව දැනගතයුතු යයි මේ ධර්මයෝ බැහැර කටයුතුයයි මේ ධර්මයෝ වැඩිය යුතුයයි මේ ධර්මයෝ ප්‍රත්‍යක්ෂ කටයුතුයයි සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ඇතිවීමද නැතිවීමද ආශ්වාදයද ආදීනවයද නික්මීමද යන මනාකොට ධර්මය දැන පස් වැදෑරුම් උපාදාන ස්කන්ධයන්ගේ ඇතිවීමද නැතිවීමද ආශ්වාදයද ආදී නවයද නික්මීමද දැන මනාකොට ධර්මය දැන සතර මහා භූතයන්ගේ ඇතිවීමද නැතිවීමද ආශ්වාදයද ආදීනවයද නික්මීමද යන මනාකොට ධර්මය දැන යම්කිසි හේතුවකින් උපන් ධර්මයක් ඇද්ද, ඒ සියල්ල විනාශවන ස්වභාව ඇති ධර්මයෝයයි මනාකොට ධර්මය දැනගෙන යනුයි.”

**5** මහා නුවණ ඇත්තේ ලොකු කුඩා දෙයට නොයයි” යන්නෙහි නුවණැත්තේ ශාස්තෲවරයකුගෙන් ශාස්තෲවරයකු වෙත නොයයි. ධර්මයකින් ධර්මයක් වෙත නොයයි. දෘෂ්ටියෙන් දෘෂ්ටියක් වෙත නොයයි. ප්‍රතිපදාවෙන් ප්‍රතිපදාවක් වෙත නොයයි. මාර්ගයෙන් මාර්ගයක් වෙත නොයයි.

**6** “මහා නුවණ ඇත්තේ” යනු උසස් ප්‍රඥා ඇත්තේ මහා ප්‍රඥා ඇත්තේ පළල් ප්‍රඥා ඇත්තේ තීක්ෂණ ප්‍රඥා ඇත්තේ ඉතා උසස් ප්‍රඥා ඇත්තේ යනුයි. භූරියයි පොළොවට කියනු ලැබේ. පොළොව සමාන මහත් ප්‍රඥාවෙන් යුක්තවූයේ පුළුල් ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයි.

## 4 - 6

1 "හෙතෙම යම් කිසි දක්නා ලද හෝ අසන ලද හෝ සිතන ලද හෝ සියලු ධර්මයන්හි කෙලෙස් සේනා රහිත වූයේ" යන්නෙහි සේනායනු මාර සේනාවට කියනු ලැබේ. කාය දුශ්චරිතය මාර සේනාවකි. මනො දුශ්චරිතය මාර සේනාවකි රාගය මාරසේනාවකි. ද්වෙෂය මාරසේනාවකි මොහය මාරසේනාවකි. ක්‍රොධය බද්ධ වෛරය (මෙහි (4-4) 4 ඡේදය යෙදිය යුතුයි) "කාමය ඔබගේ පළමුසේනාවය. නොඇල්ම දෙවන සේනාවය, බඩගින්නද පිපාසයද තුන්වන සේනාවය, තෘෂ්ණාව සතරවන සේනාවයයි කියත්"

2 "කයේ හා සිතේ මැලිගතිය පස්වන සේනාවය. භයවීම සවැනි සේනාවය, සැකය සත්වන සේනාවය, ගුණමකුකම හා ආඩම්බරය අටවන සේනාවය."

"වැරදිසේ' ලැබුවාවූ ලාභය ප්‍රශංසාව කීර්තිය යන යමක් ඇද්ද යමෙක් තමන් උසස් තන්හිලා අනුන්ට නින්දා කෙරේද, මාරය, අකුසල් ඇති කරන්නාවූ මේ ඔබගේ සේනාවෝය. නිවටයා ඔහු නොදිනයි දිනන තැනැත්තේ සැපත ලබයි."

යම් හෙයකින් සතර ආයර්‍ය්‍යමාර්ගයන්ගෙන් සියලු මාර සේනාවද සියලු පිරිවර සේනාවූ කෙලෙස්ද දිනනලද්දේද, ඔවුන් පරදවන ලද්දේද, බිඳිනලද්දේද, පිටුපාන ලද්දේද, හෙතෙම නොඇළුන තැනැත්තේයයි කියනුලැබේ. හෙතෙම දැකි දෙයෙහි නොඇළුනේ ඇසූ දෙයෙහි නොඇළුනේ නාසාදී තුන්දොරටුවෙන් ආශ්වාද වශයෙන් ගන්නා දෙයෙහි නොඇළුනේ දත් දෙයෙහි නොඇළුනේ හෙතෙම සියලු දිට්ඨ සුතමුත ධර්මයන්හි නොඇළුනේ යනුයි.

3 "විවෘතව හැසිරෙන ඔහුම දිටිමි." යනු එයම පිරිසිදුව දක්නා ඉතා පිරිසිදුව දක්නා හෙවත් ශුද්ධ දර්ශනය විශුද්ධ දර්ශනය, පිරිසිදු දර්ශනය, ඉතා පිරිසිදු දර්ශනය, යනුයි.

4 "විවෘත" යනු තෘෂ්ණා වැසීම, දෘෂ්ටි වැසීම, ක්ලේශ වැසීම, දුශ්චරිත වැසීම, අවිද්‍යා වැසීම, යන මේ වැසීම් ඉවත්

කළේ වෙයි විධ්වංසනය කළේ වෙයි. මුලිනුපුටුයේ වෙයි. ප්‍රහීනවූයේ වෙයි. සින්දේ වෙයි. ඉපදීමට අයෝග්‍යකළේ වෙයි. ඥානය නමැති ගින්නෙන් දැවුයේ වෙයි.

5 "හැසිරෙන යනු හැසිරෙන්නේ ඉරියව් පවත්වන්නේ පාලනය කරන්නේ යැපෙන්නේ වෙයි.

6 "මේ ලොකයෙහි කුමකින් කල්පනා කරන්නේද" යන්නෙහි තෘෂ්ණා කල්පනාය. දෘෂ්ටි කල්පනාව, (ii) 2-6 (ii) (iii) ඡේදවල 'මමත්වය වෙනුවට' කල්පනාව යයි වෙනස්කර මෙහි යොදාගත යුතුයි. (iii) ඔහු තෘෂ්ණා කල්පනා ප්‍රහීන කළ බැවින් දෘෂ්ටි කල්පනා විනාශකළ බැවින් කවර රාගයකින් කල්පනා කෙරේද? කවර ද්වෙෂයකින් කල්පනා කෙරේද? කවර මෝහයකින් කල්පනා කෙරේද? කවර මානයකින් කල්පනා කෙරේද? කවර දෘෂ්ටියකින් කල්පනාකරේද? කවර සිතේ නොසන්සුන් කමකින් කල්පනා කෙරේද? කවර සැකයකින් කල්පනා කෙරේද? කවර අනුසයන්ගෙන් කල්පනා කෙරේද? රාගයෙන් යුක්තවූයේ යයි කියා හෝ ද්වෙෂයෙන් යුක්තවූයේ යයි කියා හෝ මෝහයෙන් යුක්තවූයේයයි කියා හෝ බැඳුනේ යයි කියා හෝ පරාමර්ශයකළේයයි කියා හෝ අවුලට පත්වූයේයයි කියා හෝ අප්‍රිය බවට පත්වූයේ යයි කියා හෝ උත්සාහබවට පත්වූයේය කියා හෝ කියයිද, ඔහුගේ අභිසංස්කාරයෝ ප්‍රහීනවූහ. අභිසංස්කාරයන් ප්‍රහීනකළ බැවින් කවරකු විසින් ඉපදීමට සුදුසු කරන්නේද, නිරිසතෙක කියා හෝ තිරිසන් සතෙක කියා හෝ ප්‍රේතයෙක කියා හෝ මනුෂ්‍යයෙක කියා හෝ දෙවියෙක කියා හෝ රූපී බ්‍රහ්මයෙක කියා හෝ අරූපී බ්‍රහ්මයෙක කියා හෝ සඤ්ඤීය කියා හෝ අසඤ්ඤිය කියා හෝ නෙවසඤ්ඤී නාසඤ්ඤීය කියා හෝ එබඳු හේතුවක් නැත. ප්‍රත්‍යයක් නැත. කාරණයක් නැත. කවරකින් කල්පනා කරන්නේද, "ලෝකයෙහි" යනු අපාය ලෝකයෙහි, (iv) මනුෂ්‍ය ලෝකයෙහි දිව්‍ය ලෝකයෙහි ස්කන්ධ ලෝකයෙහි ධාතු ලෝකයෙහි ආයතන ලෝකයෙහි (v) යනුයි.

## 4 - 7

1 "කල්පනා නොකෙරෙත්, පෙරටු නොකෙරෙත්" යන්නෙහි කල්පනා, දෙකකි. තෘෂ්ණා කල්පනා, දෘෂ්ටි කල්පනා යන දෙකයි. (මෙහි (4-6) 6 (ii) ඡේදය යෙදිය යුතුයි) තෘෂ්ණා කල්පනාව ප්‍රහීන විය. දෘෂ්ටි කල්පනාව සංසිඳුනේය. තෘෂ්ණා කල්පනාව ප්‍රහීන වූ බැවින් දෘෂ්ටි කල්පනාව සංසිඳුන බැවින් තෘෂ්ණා කල්පනා හෝ දෘෂ්ටි කල්පනා හෝ නොකෙරෙත් නූපදවත් ඇති නොකරවත්." පෙරටු නොකෙරෙත් යන්නෙහි "පෙරටුකිරීම් දෙකකි. තෘෂ්ණාව පෙරටු කිරීම දෘෂ්ටිය පෙරටුකිරීම යන දෙකයි. 'කල්පනා' වෙනුවට 'පෙරටුකිරීම' කියා වෙනස් කර (4-6) 6 (ii) ඡේදය යෙදිය යුතුයි.) ඔවුන්ගේ තෘෂ්ණාව පෙරටු කිරීම ප්‍රහීණ විය. දෘෂ්ටිය පෙරටුකිරීම සංසිඳුනේය. තෘෂ්ණාව පෙරටුකිරීම ප්‍රහීණවූ බැවින් දෘෂ්ටිය පෙරටුකිරීම සංසිඳුන බැවින් තෘෂ්ණාව හෝ දෘෂ්ටිය හෝ පෙරටුකොට නොහැසිරෙත්. තෘෂ්ණා ධ්වජය තෘෂ්ණා කොඩිය නැත්තේවේ. තෘෂ්ණාව අධිපතිකොට ඇතිබව නැත්තේ වේ. දෘෂ්ටි ධ්වජය දෘෂ්ටි කොඩිය නැත්තේවේ. දෘෂ්ටිය අධිපතිකොට ඇතිබව නැත්තේවේ. තෘෂ්ණාවගේ හෝ දෘෂ්ටිය හෝ පිරිවරා නොහැසිරෙත්.

2 "ඔව්හු සම්පූර්ණ ශුද්ධිය වේ යයි නොකියත්" යන්නෙහි ඒකාන්ත ශුද්ධිය සංසාර ශුද්ධිය අක්‍රියා දෘෂ්ටිය, ශාස්වතවාදය නොකියත්. ප්‍රකාශ නොකරත්. ව්‍යවහාර නොකරත්.

3 "ගැට ගැසුණු තද ගැනීම නැමැති ගැටය හැර" යන්නෙහි ග්‍රන්ථ (ගැට) සතරක් වෙති. දැඩි ලොභය නමැති කයේ ගැටය, නපුරු සිතිවිලි නමැති සිතේ ගැටය. අන්‍යශීල ව්‍රත සෙවීමේ කයේ ගැටය, මෙය සත්‍යයයි බැසගැන්මේ කයේ ගැටය, තම දෘෂ්ටියෙන් ඇලීමේ නපුරු සිතිවිලි ඇති කයේ ගැටය, හේතුවක් නැති පරවාදයන්හි නපුරු සිතිවිලි ඇති කයේ ගැටය, තමන්ගේ ශීලය හෝ ව්‍රතය හෝ ශීල ව්‍රත දෙකම හෝ ගනිත් යයි ශීලව්‍රත පරාමාශ නම් කයේ ගැටය, තමන්ගේ දෘෂ්ටියම මෙය සත්‍ය යයි බැසගැන්මේ ගැටය, අල්ලාගැනීමේ ගැටය යනුයි කවර කරුණකින් ගැටයයි කියනුලැබේද, ඒ ගැටරූපය අල්ලාගනිති.

වෙදනාව, සංඥාව, සංස්කාරය, විඥ්ඥානය, ගතිය, උත්පත්තිය ප්‍රතිසන්ධිය, භවය, සංසාර වට්ටය, ගනිත්. අල්ලාගැනීමේ ගැටයයි ඒ කාරණයෙන් කියනු ලැබේ. "හැර" යනු ගැට මුදා ලිහා යලිදු හෝ ගැටගැසූ බැඳුන, එල්බුන, බැඳුම් සොලවා ලිහා යනුයි. යම්සේ වාහනයක හෝ රථයක හෝ කරත්තයක හෝ බැඳුම් ලිහාද කඩාදමාද, එපරිද්දෙන්ම බැමි ලිහා යලිදු හෝ බැඳුන බැමි ගසාදමා මුදාහැර, යනුයි.

4 "ලොව කොහිවත් ආසා නොකෙරෙත්" යන්නෙහි "ආශාව" යයි තෘෂ්ණාවට කියනු ලැබේ. යම් රාගයක් ඇද්ද (1-3) 4 ඡෙදයේ 'ඇල්මක් ඇද්ද' යන තැන් සිට 'තෘෂ්ණා සමුදය' යන තැන් දක්වා යෙදිය යුතුයි.) දැඩිලෝභයක් ලොභයක් අකුශලමූලයක් ඇද්ද එයයි. "ආසා නොකෙරෙත්" යනු ආශා නොකෙරෙත්, නූපදවත්, ඇති නොකරත්. "කොහිවත්" යනු කොතනක හෝ කවරතැනක හෝ ඇතුළත හෝ පිටත හෝ ඇතුළත පිටත හෝ යනුයි

5. "ලොව" යනු අපාය ලොකයෙහි ආයතන (මෙහි (4-6) 6 (iv) ඡෙදය යෙදිය යුතුයි.) ලොකයෙහි හෝ කිසියම් ලෝකයක ආශා නොකෙරෙත්.

## 4 - 8

1 "බ්‍රාහ්මණතෙමේ සීමා ඉක්ම ගියේය, දැනද දැකද පිළිගත්තක් නැත." යන්නෙහි "සීමා" යනු සීමා සතරකි, ආත්මදෘෂ්ටිය, සැකය, අන්‍ය ශීලව්‍රතයන් පිළිගැනීම, දිට්ඨානුසය, විචිකිච්ඡානුසය, එයට එකතුවන තවත් කෙලෙස්, මේ පළමුවන සීමාවයි. ලාමක කාම රාග සංයෝජනය, පටිඝසංයෝජනය, ලාමක කාම රාගානුසය, පටිඝානුසය එයට එකතු වන තවත් කෙලෙස්, මේ දෙවන සීමාවයි. මුල් බැසගත් කාම රාග සංයෝජනය, ප්‍රතිඝ සංයෝජනය, මුල් බැසගත් කාම රාගානුසය, ප්‍රතිඝානුසය එයට එකතුවන තවත් කෙලෙස්, මේ තුන්වන සීමාවයි. රූප රාගය, අරූප රාගය, මානය උද්ධච්චය, අවිද්‍යාව, මානානුසය, භව රාගානුසය, එයට එකතු වන තවත් කෙලෙස්, මේ සතරවන සීමාවයි. යම්හෙයකින් ආර්‍ය්‍ය මාර්ග සතරින් මේ

සතර සීමාවෝ ඉක්මවන්නේ වේද, හෙතෙම සීමා ඉක්මවූ තැනැත්තේයයි කියනු ලැබේ. "බ්‍රාහ්මණ" යනු ධර්ම සතක් දුරු කිරීමෙන් බ්‍රාහ්මණ නම්. ආත්මදෘෂ්ටිය දුරුකළේ වෙයි. සැකය දුරුකළේ වෙයි. සීලබ්බත පරාමාසය දුරුකළේ වෙයි. ( (4-3) 1 (ii) ඡේදය යෙදිය යුතුයි.) ආශ්‍රය දුරුකළ, කෙලෙස් දුරුකළ හෙතෙමේ බ්‍රහ්මයයිකියනු ලැබේ.

2 "ඔහුට" යනු අර්හත්වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේට කියනු ලැබේ.

3 "දැන" යනු අනුන්ගේ සිත් දැනීමේ නුවණින් දැන පෙර විසූ භවයන් සිහි කිරීමේ නුවණින් දැන "දැක" යනු මසැසින් හෝ දැක දිවැසින් හෝ දැක, යනුයි.

4 "පිළිගත්තක් නැත." යනු ඔහුට මේ උතුම්ය, අග්‍රය, ශ්‍රේෂ්ඨය, ප්‍රමුඛයයි බැස ගැන්මක්, ගැනීමක් පරාමර්ශයක් නැත. එය සංසිඳුනේය. ඉපදවීමට නුසුදුසුය. ඥානය නමැති ගින්නෙන් දවන ලද්දේය.

5 "රාගයෙන් රත්වූයේ නොවේ. විරාගයෙන් රත් වූයේද නොවේ." යනු යම් කෙනෙක් පඤ්චකාම ගුණයන්හි ඇලුනේද ගිජුවේද ගැටුනේද මුලාවූයේද රාගයෙන් රත් වූයේයයි කියත්. යමෙක් රූපාවචර අරූපාවචර සමාපත්තීන්හි ඇලුනේ ගිජුවූයේ ගැටුනේ මුලාවූයේ විරාගයෙහි ඇළුනේයයි කියත්.

6 "රාගයෙන් රත්වූයේ නොවේ. විරාගයෙන් රත් වූයේද නොවේ" යනු යම්හෙයකින් කාම රාගය රූප රාගය අරූප රාගය ප්‍රහීනවූවාහු වෙත්ද මුලින් සිඳුනු මුල් ඇත්තේ මුල හෝ අග සිඳිනලද තල් ගසක් මෙන් කරණ ලද්දේ ඉපදීමට නුසුදුසු කරණලද්දේ නුයි. මෙපමණකින් රාගයෙහි නොඇළුනේයයිද විරාගයෙහි නො ඇළුනේයයිද කියත්.

7 "ඔහුට මෙහි පිළිගත්තක් නැත" යන්නෙහි ඔහුට යනු අර්හත්වූ ක්ෂීණාශ්‍රවවූ උන්වහන්සේට මෙය උතුම්ය, ශ්‍රේෂ්ඨයයි ගන්නාලද්දක්, පරාමර්ශ කරණලද්දක් බැසගන්නා ලද්දක් නැත. විද්‍යමාන නොවෙත්. ප්‍රහීණවූයේය. සංසිඳුනේය ඉපදීමට අයොග්‍ය විය. ඥානය නමැති ගින්නෙන් දැවුයේය.

## පරමට්ඨක සූත්‍ර නිර්දේශය.

## 5 - 1

1 "දෘෂ්ටීන් අතර යමක් පරමයයි පිළිගන්නාහු" යන්නෙහි දෘෂ්ටිගතිකවූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. ඔවුහු දෙසැට දෘෂ්ටිගතවූ එක් එක්තරා දෘෂ්ටියක් ගෙන මෙය උතුම්ය, ශ්‍රෙෂ්ඨය ප්‍රමුඛය උත්තමය ගෙන ඉගෙණ පරාමර්ශ කොට ස්වකීය දෘෂ්ටියෙන් වසත්. යම්සේ ගෘහ වාසය ඇත්තාහු ගෘහයන්හි වසත්. වැරදි ඇත්තාහු වැරදි ඇතිව වසත්. කෙලෙස් ඇත්තාහු කෙළෙස් ඇතිව වසත්. එපරිද්දෙන්ම දෘෂ්ටිගතිකවූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. ඔවුහු දෙසැට දෘෂ්ටීන් අතරෙන් එක් එක්තරා දෘෂ්ටියක් ගෙන මෙය උතුම්ය මෙය ශ්‍රෙෂ්ඨය මෙය ප්‍රමුඛයයි ගෙන ඉගෙන පරාමර්ශ කොට ස්වකීය ස්වකීය දෘෂ්ටියෙන් වසත්.

2 "ලොව සත්ත්වතෙමේ යම් උතුම් දෙයක් කෙරේද" යන්නෙහි යමක් උසස් තන්හි තබාද ආශ්‍රය, ශ්‍රෙෂ්ඨය, ප්‍රමුඛය. උත්තමයයි කෙරේද, මේ ධර්මය මනාකොට ප්‍රකාශ කරණ ලද්දේය. මේ ශ්‍රාවක ගණයා මනාකොට පිළිපන්නේය. මේ දෘෂ්ටිය උතුම්ය. මේ ප්‍රතිපදාව මනාකොට පණවන ලදී. මේ මාර්ගය නෛයර්‍යානිකයයි උසස් තන්හි තබාද අග්‍රය, ශ්‍රෙෂ්ඨය, ප්‍රමුඛය, උත්තමයයි කෙරේද (එබඳු අදහසක් උපදවාද,

3 "සත්ත්වයා" යනු සත්වයා (මෙහි (1) 7 (ii) ඡෙදය යෙදිය යුතුයි)

4 "ලොව" යනු අපාය ලොකයෙහි (මෙහි (1-5) 5 ඡෙදයේ අග කොටස යෙදිය යුතුයි.)

5 "එහෙයින් සෙස්සෝ හීනයයි සියල්ලන්ට කියයි." යනු තම ශාස්තෘවරයා, ධර්මය, ශ්‍රාවක ගණයා දෘෂ්ටිය ප්‍රතිපදාව, මාර්ගය හැර සියලු අන්‍යවාදයන් අත්හරියි (ii) ඒ ශාස්තෘ තෙම සර්වඥ නොවේ. ධර්මය ස්වාක්ඛාත නොවේ. ශ්‍රාවක ගණයා මනාව පිළිපන්නේ නොවේ. දෘෂ්ටිය යහපත් නොවේ. ප්‍රතිපදාව මනාකොට පණවන ලද්දේ නොවේ. මාර්ගය නෛයර්‍යානික

නොවේ. මෙහි ශුද්ධියක් හෝ පාරිශුද්ධියක් හෝ මිදීමක් හෝ නැත හීනය, ලාමකය, කුඩායයි මෙසේ කියයි. මෙසේ ප්‍රකාශ කරයි.

6 "එහෙයින් විවාදයන් නොඉක්මවූයේ" යන්නෙහි "එහෙයින්" යනු ඒ කාරණයෙන් ඒ හේතුවෙන් ඒ ප්‍රත්‍යයයෙන් ඒ නිදානයෙන් යනු.

7 "විවාදයන්" යනු දෘෂ්ටි කලහයෝ දෘෂ්ටිගණ්ඩනයෝ නොඉක්මවූයේය. සමථයට පත් නොවූයේය.

## 5 - 2

1 "යම් හෙයකින් දුටුවෙහි, ඇසූවෙහි සිල් හා වත්හි මුතයෙහිද තමා තුළ ආනිසංසය දකීනම් තමා තුළ යනු යමක් තමා කෙරෙහි තෙමේයයි දෘෂ්ටි ගත් තැනැත්තාට කියයි. තමන්ගේ දෘෂ්ටියෙහි ආනිශංස දෙකක් දකියි. මෙලොව ආනිශංසයද පරලොව ආනිශංසයද යනුයි. දෘෂ්ටියෙහි මෙලොව ආනිශංස කවරේද, ශාස්තෘවරයා යම් දෘෂ්ටිකයෙක්වේද ශ්‍රාවකයෝද ඒ දෘෂ්ටිය ඇත්තෝ වෙත්. (ii) ශ්‍රාවකයෝ එබඳු දෘෂ්ටිය ඇති ශාස්තෘවරයාට සත්කාර කරත්. ගරු කරත්. බහුමාන කරත්. වඳිත්. ඒ හේතුවෙන් සිවුරු පිණ්ඩාහාර සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබයි. මේ දෘෂ්ටියේ මෙලොව ආනිශංසයයි (iii) දෘෂ්ටියේ පරලොව ආනිශංස කවරේද? iv මේ දෘෂ්ටිය නාගබව පිණිස හෝ ගුරුළු බව පිණිස හෝ යක්ෂ බව පිණිස හෝ අසුර බව පිණිස හෝ ගාන්ධර්ව බව පිණිස හෝ මහා රාජ බව පිණිස හෝ ශක්‍ර බව පිණිස හෝ බ්‍රහ්ම බව පිණිස හෝ දෙව බව පිණිස හෝ සුදුසුය. මේ දෘෂ්ටිය ශුද්ධිය පිණිස ප්‍රමාණය. මිදීම පිණිස විමුක්තිය පිණිස සුදුසුය. මේ දෘෂ්ටියෙන් පිරිසිදු වෙත්. මේ දෘෂ්ටියෙන් පිරිසිදු වන්නෙමි. මිදෙන්නෙමියි මතු ඵලයක් බලාපොරොත්තු වන්නේ වෙයි. මේ දෘෂ්ටියේ පරලොව ආනිශංසයයි.

තමන්ගේ දෘෂ්ටියෙන් මේ ආනිශංස දෙක දකිත්. දර්ශන ශුද්ධියෙන්ද ආනිශංස දෙකක් දකියි. ශ්‍රවණ ශුද්ධියෙන්ද ආනිශංස දෙකක් දකියි. ශීල ශුද්ධියෙන්ද ආනිශංස දෙකක්

දකියි. ව්‍රත ශුද්ධියෙන්ද ආනිශංස දෙකක් දකියි මුත ශුද්ධියෙන්ද ආනිශංස දෙකක් දකියි. එනම් මෙලොව ආනිශංසයද පරලොව ආනිශංසයද යන දෙකයි. මුත ශුද්ධියෙන් ආනිශංස දෙකක් දකියි. එනම් මෙලොව ආනිශංසයද පරලොව ආනිශංසයද යනුයි. මුත ශුද්ධියෙන් මෙලොව ආනිශංස කවරේද? ශාස්තෘවරයා යම් දෘෂ්ටියක නම් ශ්‍රාවකයෝද ඒ දෘෂ්ටිගතුවෝ වෙති. (මෙහි 1 (ii) ඡෙදයයෙදිය යුතුයි) මේ මුත ශුද්ධියේ මෙලොව ආනිශංසයයි. මුත ශුද්ධියේ පරලොව ආනිශංස කවරේද මේ ශුද්ධිය නාග බව පිණිස ප්‍රමාණය (මෙහි 1 (iv) යෙදිය යුතුයි) මේ මුත ශුද්ධියේ පරලොව ආනිශංසයයි. මුත ශුද්ධියේද මේ ආනිශංස දෙකම දකිත්.

2 "හෙතෙමේ එහි ලා එයම පිළිගැනීමෙන්" යන්නෙහි එයම යනු ඒ දෘෂ්ටිය ගත් තැනැත්තා, එහි යනු ස්වකීය දෘෂ්ටියෙන් ස්වකීය කැමැත්තෙන් ස්වකීය රුචියෙන් ස්වකීය ලබ්ධියෙන්

3 "පිළිගැනීමෙන්" යනු මෙය උතුම්ය අග්‍රය ශ්‍රෙෂ්ඨයයි ගෙන ඉගෙන පරාමර්ශය කොට බැස, යනුයි.

4 "අන් සියල්ල පහත් කොට බලයි" යනු අනික් ශාස්තෘවරයකු ධර්මය ශ්‍රාවක ගණයා දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය හීන වශයෙන් නිහීණ වශයෙන් පහත් වශයෙන් දකියි. බලයි

## 5 - 3

1 "දක්ෂයෝ එයම ගැටයයි කියත්." යන්නෙහි යම් ඒ ස්කන්ධයන්හි දක්ෂයෝ ධාතුන්හි දක්ෂයෝ ආයතනයන්හි දක්ෂයෝ පටිච්චසමුප්පාදයෙහි දක්ෂයෝ සතිපට්ඨානයන්හි දක්ෂයෝ සම්‍යක් ප්‍රධානයන්හි දක්ෂයෝ ඍද්ධිපාදයන්හි දක්ෂයෝ ඉන්ද්‍රියයන්හි දක්ෂයෝ බලයන්හි දක්ෂයෝ බොජ්ඣංගයන්හි දක්ෂයෝ මාර්ගයෙහි දක්ෂයෝ ඵලයෙහි දක්ෂයෝ නිර්වාණයෙහි දක්ෂයෝ මෙසේ කියත්. මෙය බඳුමක්ය, මෙය ඇල්මක්ය, මෙය බන්ධනයක්ය, මෙය කිලුටක් යයි මෙසේ කියත්. මෙසේ ප්‍රකාශ කරත්. මෙසේ ව්‍යවහාර කරත්.

2 "යමක් ඇසුරු කෙළේ අන්‍යයා පහත්කොට සලකයි" යනු යම් ශාස්තෘවරයකු, ධර්මය, ශ්‍රාවකගණයා, දෘෂ්ටිය, ප්‍රතිපදාව, මාර්ගය ආශ්‍රය කළේ වෙතට එළඹියේ යනුයි. " අන්‍යයා පහත්යයි බලයි" යනු අනික් ශාස්තෘවරයකු ධර්මය ශ්‍රාවක සමූහයා දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය හීන වශයෙන් නිහීන වශයෙන් පහත් වශයෙන් බලයි, දකියි

3 "එයින් වනාහි දුටුවක් හෝ ඇසූවක් හෝ සිල් හා වත් හෝ භික්ෂුතෙමේ ඇසුරු නොකරන්නේය" යන්නෙහි එයින් යනු එහෙයින් ඒ කාරණයෙන් ඒ නිදානයෙන් දැකීම හෝ දැකීමේ ශුද්ධිය හෝ ඇසීම හෝ ඇසීමේ ශුද්ධිය හෝ මුතය හෝ මුත ශුද්ධිය හෝ ශීලය හෝ ශීල ශුද්ධිය හෝ ව්‍රතය හෝ ව්‍රත ශුද්ධිය හෝ ආශ්‍රය නොකරන්නේය, නොගන්නේය. පරාමර්ශ නොකරන්නේය. ඇතුල් නොවන්නේය.

## 5 - 4

1 "ඥානයෙන් හෝ සිල් හා ව්‍රතයෙන් හෝ ලොකයෙහි දෘෂ්ටියද කල්පනා නොකරන්නේය" යන්නෙහි අෂ්ට සමාපත්ති ඤාණයෙන් හෝ පඤ්චාභිඥා ඥානයෙන් හෝ මිථ්‍යා ඥානයෙන් හෝ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ ශීල ව්‍රත දෙකින්ම හෝ දෘෂ්ටියෙන් හෝ සුදුසු නොකරන්නේය. නූපදවන්නේය.

2 "ලොකයෙහි" යනු අපාය ලොකයෙහි (මෙහි (3 4) 6 ඡේදය යෙදිය යුතුයි)

3 "නුවණින් හෝ සිල් හා වතින් හෝ තමා සමයයි කියාද හීනයෙකැයි" හෝ විශෙෂ කෙනෙකැයි කියාද නොසිතන්නේය. සමානවෙමියි තමා නොපැමිණෙන්නේය. (ii) ජාතියෙන් හෝ ගෝත්‍රයෙන් හෝ කුලයෙන් හෝ රූ සපුවෙන් හෝ ධනයෙන් හෝ ඉගෙණීමෙන් හෝ කර්මායතනයෙන් ශිල්පායතනයෙන් හෝ විද්‍යායතනයෙන් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ අන්‍ය යම් යම් කරුණු වලින් හෝ යනුයි.

4 "හීනයෙකැයි හෝ විශෙෂ කෙනෙකැයි හෝ නො සිතන්නේය" හීනයෙක් වෙමියි තමාට නින්දා නොකරන්නේය.

ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ (මෙහි 2 (ii) යෙදිය යුතුයි) අනික් එක්තරා වස්තුවකින් හෝ හීනයෙක් යයි නොසිතන්නේය. උසස්යයි නොසිතන්නේය.

## 5 - 5

1 "ආත්ම දෘෂ්ටි හැර දැඩිසේ නොගන්නේ" යන්නෙහි "ආත්ම දෘෂ්ටිය හැර" යනු ආත්ම දෘෂ්ටිය දුරු කොට "ආත්ම දෘෂ්ටිය හැර" යනු තමායයි ගැන්ම බැහැර කොට "ආත්ම දෘෂ්ටිය හැර" යනු තමායයි ගැන්ම දුරුකොට ආත්ම දෘෂ්ටිය හැර යනු තෘෂ්ණා වශයෙන් දෘෂ්ටි වශයෙන් ගන්නාලද්ද පරාමර්ශ කරණ ලද්ද ඇලෙන ලද්ද බැස ගන්නාලද්ද දුරුකොට විනාශ කොට නූපදින බවට පමුණුවා යනුයි. අනුපාදියානො යනු උපාදාන සතරින් දැඩි කොට නොගන්නේ පරාමර්ශ නොකරන්නේ ඇතුල් නොවන්නේ යනුයි.

2 "හෙතෙම නුවණින් හෝ ඇසුරු කිරීමක් නොකරයි" යනු අෂ්ට සමාපත්ති ඥානයෙන් හෝ පඤ්චාභිඥා ඥානයෙන් හෝ තෘෂ්ණා ආශ්‍රය හෝ දෘෂ්ටි ආශ්‍රය හෝ නොකරයි නූපදවයි.

3 "හෙතෙම වනාහි වියතුන් අතර වර්ගව හැසිරෙන්නෙක් නොවේ" යන්නෙහි ඒකාන්තයෙන් හෙතෙම ව්‍යක්තයන් අතරෙහි භින්නවූවන් අතරෙහි අදහස් දෙකක් දරන්නවුන් අතරෙහි නොයෙක් දෘෂ්ටි ගතුවන් අතරෙහි නොයෙක් අදහස් දරන්නවුන් අතරෙහි නොයෙක් රුචිකයන් අතරෙහි නොයෙක් ලබ්ධිකයන් අතරෙහි නොයෙක් දෘෂ්ටි ආශ්‍රයෙන් ආශ්‍රයවූවන් අතරෙහි ඡන්දයෙන් අගතියට යන්නවුන් අතරෙහි ද්වෙෂයෙන් අගතියට යන්න වුන් අතරෙහි මොහයෙන් අගතියට යන්නවුන් අතරෙහි භයෙන් අගතියට යන්නවුන් අතරෙහි ඡන්දයෙන් අගතියට නොයයි ද්වෙෂයෙන් අගතියට නොයයි මෝහයෙන් අගතියට නොයයි. භයෙන් අගතියට නොයයි. රාග වශයෙන් නොයයි. ද්වෙෂ වශයෙන් නොයයි. දෘෂ්ටි වශයෙන් නොයයි. උද්ධච්ච වශයෙන් නොයයි. විචිකිච්ඡා වශයෙන් නොයයි. අනුසස් වශයෙන් නොයයි. භෙදවූ ධර්මයන්ගෙන් නොයයි. නොපැමිණෙයි.

4 "හෙතෙම කිසිම දෘෂ්ටියක් කරා නොපැමිණෙයි." ඔහුගේ දෙසැට දෘෂ්ටීහු ප්‍රහීනවූහ. මුලින් සිඳුනාහ. සන්සිඳුනාහ. උත්පත්තියට අයොග්‍යවූහ. ඥානය නමැති ගින්නෙන් දැවුනාහ, හෙතෙම කිසිම දෘෂ්ටියක් බලාපොරොත්තු නොවෙයි.

## 5 - 6

1 "යමෙකුට මෙහි හෝ එහි හෝ භවාභවයන්හි බලාපොරොත්තුවක් මෙතැන නැත" යන්නෙහි ඔහුට යනු අර්හත් ක්ෂීණාශ්‍රවයන් වහන්සේට යනුයි. "අන්තය" යන්නෙහි ස්පර්ශය එක් අන්තයකි. ස්පර්ශය ඇතිවීම දෙවෙනි අන්තයයි, අතීතය එක් අන්තයකි. අනාගතය දෙවෙනි අන්තයයි සුඛ වේදනාව එක් අන්තයකි. දුක් වේදනාව දෙවෙනි අන්තයයි. නාමය එක් අන්තයකි. රූපය දෙවෙනි අන්තයයි. සවැදෑරුම් ආධ්‍යාත්මික ආයතනයෝ එක් අන්තයකි. සවැදෑරුම් බාහිර ආයතනයෝ දෙවන අන්තයයි. ආත්ම දෘෂ්ටිය එක් අන්තයකි. ආත්ම දෘෂ්ටිය ඇතිවීම අනික් අන්තයයි. පණිධියයි තෘෂ්ණාවට කියනු ලැබේ. 'යම් රාගයක් ඇද්ද' (1-3) 4 'ඡේදයේ යම් ඇලීමක් ඇද්ද' යන තැන් යොදාගත යුතුයි) අභිධ්‍යාව, ලෝභය, අකුශල මූලය යනුයි. භවාභවාය යනු භවයෙන් භවය පිණිස කර්මභවය පිණිස පුනර්භවය පිණිස කාම භවය පිණිස කර්ම භවය පිණිස කාම භවය පිණිස රූපභවය පිණිස කර්මභවය පිණිස පුනර්භවය පිණිස කාමභවය පිණිස පුනර්භවය පිණිස රූප භවය පිණිස පුනර්භවය පිණිස අරූප භවය පිණිස කර්මභවය පිණිස අරූප භවය පිණිස නැවත නැවත භවය පිණිස නැවත නැවත ඉපදීම පිණිස නැවත නැවත ආත්මභාවයක් ඇති කිරීම පිණිස නැවත නැවත ඉපදීම පිණිස නැවත නැවත ප්‍රතිසන්ධිය පිණිස

2 "මෙහි යනු ස්වකීය ආත්ම භාවය "එහි" අන්‍ය ආත්ම භාවයයි. "මෙතැන" යනු ස්වකීය රූප වෙදනා සඤ්ඤා සංඛාර විඤ්ඤානයෙහි. "එහි" යනු අන්‍ය රූප වෙදනා සඤ්ඤා සංඛාර විඤ්ඤානයෝයි. "මෙහි" යනු සවැදෑරුම් ආධ්‍යාත්මික ආයතනයෝයි. "එහි" යනු සවැදෑරුම් බාහිර ආයතනයෝයි. "මෙහි" යනු මනුෂ්‍ය ලෝකයෙහිය. "එහි" යනු දිව්‍යලොකයෙහිය.

"මෙහි" යනු කාම ධාතුවයි. "එහි" යනු රූප ධාතු අරූප ධාතුයි. "මෙහි" යනු කාම ධාතු රූප ධාතුයි. "එහි" යනු අරූපධාතුවයි.

3 යමකුට මෙහි හෝ එහි හෝ භවා භවයන්හි දෙ අන්තයෙහි බලාපොරොත්තුවක් නැත්ද" යමෙකුට අන්ත දෙකෙහිම භවයෙන් භවය පිණිස මෙලොවද පරලොවද "ප්‍රණිධි නම් තෘෂ්ණාව'; බලාපොරොත්තු නැත්තේය. නූපදියි. ප්‍රහීණය. මුලින් සින්දේය සංසිඳුනේය ඉපදීමට අයොග්‍ය විය ඥානාග්නියෙන් දැවුනේය.

4 "ඔහුට කිසිම ඇතුළත් වීමක් නැත්ද" යන්නෙහි ඇතුළත්වීම (නිවෙශනා) යනු නිවේශනයෝ දෙකකි. තෘෂ්ණා නිවෙශනයද දෘෂ්ටි නිවෙශනයද යන දෙකයි මමත්වය වෙනුවට නිවේශනය කියා වෙනස්කර (2-6) 1, (ii) (iii) ඡේද යෙදිය යුතුයි.) "ඔහුට" යනු අර්හත්වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේට කිසියම් නිවෙශනයක් නැත. නූපදිත්, ප්‍රහීණවූයේය. සංසිඳුනේය. ඉපදීමට නුසුදුසුය. ඥානය නැමති ගින්නෙන් දැවුයේය.

5 "ධර්මයන්හි නිශ්චය කොට පිළිගන්නා ලද්දක්" යන්නෙහි 'ධර්මයන්හි යනු දෙසැට දෘෂ්ටීන්හි නිශ්චය කොට යනු නිශ්චය කොට විනිශ්චයකොට කල්පනාකොට සමකොට බලා තීරණය කොට විස්තරකොට "පිළිගන්න ලද්ද, යනු සීමාකොට ගෙන, කොටස් කොටගෙන, ඉඩ වශයෙන් ගෙන රැස්කිරීමකොටගෙන, කැටිකොටගෙන මෙය සත්‍යයි, සිදුවූ දෙය, මෙහි වෙනස්වීමක් නැතැයි ගන්නා ලද්දක් ස්පර්ශ කරණ ලද්දක් බැසගන්නා ලද්දක් ඇලෙන ලද්දක් නැත්තේය, නූපදියි, සංසිඳුනේය, ඉපදීමට අයොග්‍ය විය. ඥානය නමැති ගින්නෙන් දැවුයේය.

## 5 - 7

1 "ඔහුට මේ දුටුවෙහි හෝ ඇසුවෙහි හෝ මුතයෙහි හෝ කල්පනා කළ ස්වල්පයක් පමණ හෝ සංඥාවක් නැත, යන්නෙහි ඔහුට යනු අර්හත්වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේට දැකීමේ හෝ දැකීමේ ශුද්ධියෙහි හෝ ඇසීමේ හෝ ඇසීමේ ශුද්ධියෙහි හෝ මුතයෙහි හෝ මුත ශුද්ධියෙහි හෝ සංඥාව පෙරටුකොට ඇති සංඥාව කල්පනාව කොට ඇති සංඥාව විස්තරය කොට ඇති

සංඥාවෙන් උසස්ව තබන ලද සංඥාවෙන් පිළියෙළ කළ රැස් කරණ ලද තබන ලද දෘෂ්ටියක් නැත. නොලැබෙත්, සිඳුනේය. ඉපදීමට අයොග්‍ය විය. ඥානය නමැති ගින්නෙන් දැවුනේය.

2 "දෘෂ්ටිය නොඇදගන්නා ඒ බ්‍රාහ්මණයා" යන්නෙහි ධර්ම සතක් දුරු කිරීමෙන් බ්‍රාහ්මණ නම්. එනම් ආත්ම දෘෂ්ටිය දුරු කරණ ලද්දේවෙයි (මෙහි (4-3) 1 (ii) ඡෙදය යෙදිය යුතුයි.) ආශ්‍රය නැති කෙළෙස් දුරු කළ හෙතෙම බ්‍රාහ්මණයයි කියනු ලැබේ. දෘෂ්ටිය නොගන්නාවූ පරාමර්ශ නොකරන්නාවූ එයට ඇතුල් නොවන්නාවූ, ඒ බ්‍රාහ්මණයා යනුයි.

3 "මේ ලොකයෙහි කුමක් කරණකොට කල්පනා කරන්නේද" යන්නෙහි කල්පනා දෙකකි. තෘෂ්ණා කල්පනාව හා දෘෂ්ටි කල්පනාව යනුයි. (ii) ("මමත්වය වෙනුවට" කල්පනාව කියා වෙනස් කර (2-6) 1 (ii) (iii) ඡෙද යෙදිය යුතුයි) (iii) ඔහුගේ තෘෂ්ණා අදහස සිදුරුවිය. දෘෂ්ටි අදහස සංසිඳුනේය. තෘෂ්ණා අදහස දුරුවූ බැවින් දෘෂ්ටි අදහස සංසිඳුන බැවින් කවර රාගයකින් කල්පනා කරන්නේද. කවර ද්වෙෂයකින් කල්පනා කරන්නේද කවර මොහයකින් කල්පනා කරන්නේද කවර මානයකින් කල්පනා කරන්නේද කවර දෘෂ්ටියකින් කල්පනා කරන්නේද, කවර සිතේ නොසන්සුන් කමකින් කල්පනා කරන්නේද, කවර සැකයකින් කල්පනා කරන්නේද කවර කෙළෙස්වලින් කල්පනා කරන්නේද, රාගයෙන් යුක්තයයි කියා හෝ ද්වෙෂයෙන් යුක්තයයි කියා හෝ මොහයෙන් යුක්තයයි කියා හෝ එකට බැඳුනේය. කියා හෝ සිතින් දැඩිසේ ගත්තේය කියා හෝ අවුලට පත්වූයේය කියා හෝ ඇතිවූ බවට ගියේ යයි කියා හෝ උත්සාහවත් බවට ගියේයයි කියා හෝ වේද, ඒ අභිසංස්කාරයෝ (රැස් කිරීම්) ප්‍රහීණවූහ. අභිසංස්කාරයන් ප්‍රහීණවූ බැවින් ගතියට කවරකින් කල්පනා කරන්නේද, නිරිසතෙක කියා හෝ තිරිසනෙක කියා හෝ ප්‍රෙත යොනිකයෙකැයි කියා හෝ මිනිසෙකැයි කියා දෙවියෙකැයි කියා හෝ රූපියෙකැයි කියා හෝ අරූපියෙකැයි කියා හෝ සඤ්ඤීය කියා හෝ අසඤ්ඤීය කියා හෝ නෙවසඤ්ඤී

නාසඤ්ඤීය කියා හෝ කවරකින් කල්පනා කරවන්නේද, එබඳු හේතුවක් නැත. එබඳු ප්‍රත්‍යයක් නැත. එබඳු කාරණයක් නැත.

4 "මේ ලොකයෙහි කුමකින්" යනු අපාය ලොකයෙහි (මෙහි (4-6) අග ඡේදය යෙදිය යුතුයි.)

## 5 - 8

1 "කල්පනා නොකෙරෙත්, ප්‍රධාන කර නොගනිත්." කල්පනා යනු කල්පනා දෙකකි. තෘෂ්ණා කල්පනාවද දෘෂ්ටි කල්පනාවද යනුයි (මෙහි 3 (ii) ඡේදය යෙදිය යුතුයි.)

(iii) තෘෂ්ණා කල්පනාව කවරේද? යම්තාක් තෘෂ්ණාවෝ සීමා කරණ ලද වට කරණලද මමය මාගේයයි ගන්නාලද මේ දෙය මාගේයයි අර දෙය මාගේය, මෙපමණ මාගේය. මෙපමණකින් මාගේය. මාගේ රූප, ශබ්ද, ගන්ධ, රශ, ස්පර්ශ ඇතිරිලි, පොරෝනා, දාසි දාසයන්, එළු, බැටලු, ඌරු, කුකුල්, ඇත්, අස්, ගව, වෙළඹුන්, කෙත්, වතු, රන්රුවන්, ගම් නියම්ගම් රාජධානිය, රටය, ජනපදය, ගබඩාය, කොටුගුල්ය යන මේවාද හුදෙක් මහා පෘථිවියද මමය මාගේයයි ගනියි. යම්තාක් එක්සිය අටක් තෘෂ්ණාවෙන් ආශ්‍රිතවූ සියල්ලම මමය මාගේ යයි සිතයි (iv) දෘෂ්ටි කල්පනාව කෙසේද, (v) විසි වැදෑරුම් ආත්ම දෘෂ්ටිය දශ වස්තුක මිථ්‍යාදෘෂ්ටිය දශ වස්තුක අන්තග්‍රාහික දෘෂ්ටිය, එබඳු යම් දෘෂ්ටියක් ඇද්ද වැරදි අවබොධයක් ඇද්ද දෘෂ්ටි නමැති අවුලක් ඇද්ද දෘෂ්ටි නමැති කාන්තාරයක් ඇද්ද දෘෂ්ටි නමැති නපුරු කටුවක් ඇද්ද දෘෂ්ටිකම්පාවක් ඇද්ද, දෘෂ්ටි නමැති සංයෝජනයක් ඇද්ද ගැන්මක් ඇද්ද, පිළිගැන්මක් ඇද්ද, බැස ගැන්මක් ඇද්ද, වැරදි මාර්ග ඉදිරිපත් කිරීම් දෙකකි. තෘෂ්ණාව ඉදිරිපත් කිරීමද දෘෂ්ටිය ඉදිරිපත් කිරීමද යනුයි. ("මමත්වය" වෙනුවට "ඉදිරිපත් කිරීම" කියා වෙනස්කර (2-6) 1 (ii) (iii) ඡේද යෙදිය යුතුයි.) උන්වහන්සේලාගේ තෘෂ්ණාව ඉදිරිපත් කිරීම ප්‍රහීණ දෘෂ්ටිය ඉදිරිපත් කිරීම සංසිඳුනේය. තෘෂ්ණාව ඉදිරිපත් කිරීම ප්‍රහීණවූ බැවින් දෘෂ්ටිය ඉදිරිපත් කිරීම සංසිඳුන බැවින් තෘෂ්ණාව හෝ දෘෂ්ටිය හෝ පෙරටු කොට නොහැසිරෙත්. තෘෂ්ණා ධ්වජය තෘෂ්ණා කොඩිය නැත්තේවේ.

දෘෂ්ටිය අධිපති වීමක් නැත. තෘෂ්ණාව හෝ දෘෂ්ටිය හෝ පිරිවරා හැසිරීමක් නැත.

2 මාර්ගයක් ඇද්ද, බොරුවක් ඇද්ද, තීර්ථායතනයක් ඇද්ද, වැරදි ගැන්මක් ඇද්ද, විපයර්‍යාස ගැන්මක් ඇද්ද, වැරදි ගැන්මක් ඇද්ද, වැරදි දෙයක් නිවැරදි යයි ගැන්මක් වේද යම්තාක් දෙසැට දෘෂ්ටියක් ඇද්ද, මේ දෘෂ්ටි කල්පනාවයි. උන්වහන්සේලාගේ තෘෂ්ණා කල්පනාව ප්‍රහීණය. දෘෂ්ටි කල්පනාව සංසිඳුනේය. තෘෂ්ණා කල්පනාව ප්‍රහීණවූ බැවින් දෘෂ්ටි කල්පනාව සංසිඳුන බැවින් ඔවුහු තෘෂ්ණා කල්පනාව හෝ දෘෂ්ටි කල්පනාව හෝ ඇති නොකරත්. නූපදවත්. "පෙරටු නොකෙරෙත්." යනුයි

3 "ධර්මයද ඔවුන්ට නොපිළිගැනුණේය." යන්නෙහි ලොකය ශාස්වතය මෙය සත්‍යයයි අනික හිස්යයි පිළිගැන්මක් නැත. ලොකය අශාස්වතය, ලොකය කෙළවරක් ඇත්තේය. ඒ ජීවයයි ඒ ශරීරයයි අනිකක් ජීවය අනිකක් ශරීරය වෙයි. සත්වයා මරණින් මතු නොවෙයි සත්වයා මරණින් මතුවෙයි. මරණින් මතු සත්වයා නොමවෙයි. නොම නොවෙයි. මෙයම සත්‍යයයි අනික් දේ හිස්යයි පිළිගැන්මක් නැත.

4 බ්‍රාහ්මණතෙමේ ශීලයෙන් වත් පිළිවෙතින් හික්මවිය යුත්තෙක් නොවේ" යන්නෙහි "නො" යනු ප්‍රතික්ෂෙපයයි. බ්‍රාහ්මණ යනු ධර්ම සතක් ප්‍රතික්ෂෙප කළ බැවින් බ්‍රාහ්මණ නම්. එනම්, ආත්ම දෘෂ්ටිය බැහැර කරණ ලද්දේවෙයි. (මෙහි (4-3) 1 (ii) ඡෙදය යෙදිය යුතුයි) ආශ්‍රය නොවූ කෙළෙස් දුරුකළ හෙතෙමේ බ්‍රහ්ම නම්.

5 "බ්‍රාහ්මණතෙමේ ශීලයෙන් වත් පිළිවෙතින් හික්ම වියයුත්තේ නොවේ." යන්නෙහි බ්‍රාහ්මණතෙම ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ ශීල ව්‍රත දෙකින්ම හෝ නොයයි නූසුලයි.

6 "නොසෙල්වෙන්නා පරතෙරට ගියේ ආපසු නොඑයි." යන්නෙහි පරතෙර යනු අමෘතවූ නිර්වාණයයි. යම් ඒ කෙනෙක් සියලු සංස්කාරයන් සංසිඳවූයේ සියලු කෙලෙස් යටපත් කළේ තෘෂ්ණාව ක්ෂය කළේ විරාග නම්වූ නිරොධ නම්වූ නිර්වාණයයි කියද්ද එය එතරය. හෙතෙම පරතෙරට ගියේය. පරතෙරට

පැමිණියේය. කෙළවරට ගියේය. කෙළවරට පැමිණියේය. ඔහුට ජාති මරණ සංස්කාරයන් නැත. නැවත ඉපදීමක් නැත.

7 "පරතෙරට ගියේ ආපසු නොඑයි" සෝවාන් මාර්ගයෙන් යම් කෙලෙස් ප්‍රහීණවීද ඒ කෙලෙස් නැවත නොපැමිණෙයි. ආපසු නොඑයි. සකෘදාගාමි මාර්ගයෙන් යම් කෙලෙස් ප්‍රහීණවීද ඒ කෙලෙස් නැවත නොපැමිණෙයි. අනාගාමි මාර්ගයෙන් යම් කෙලෙස් ප්‍රහීණවීද ඒ කෙලෙස් නැවත නොපැමිණෙයි. අර්හත් මාර්ගයෙන් යම් කෙලෙස් ප්‍රහීණවීද ඒ කෙලෙස් නැවත නොපැමිණෙයි, ආපසු නොඑයි.

8 "නොසෙල්වෙන්නා" යනු රහතුන් වහන්සේයි. කරුණු පසකින් 'නොසෙල්වෙන්නා' නමි. ඉෂ්ටානිෂ්ටයන් දුරුකළ බැවින්, කෙලෙස් දුරුකළ බැවින්, සසර තරණය කළ බැවින්, මුදන ලද බැවින්, එය දක්වන ලද බැවින් කෙසේ රහතන් වහන්සේ ඉෂ්ටානිෂ්ට දෙක්හි තාදීවූසේක්ද, රහතන් වහන්සේ ලාභයෙහිද තාදීය, අලාභයෙහිද තාදීය, කීර්තියෙහිද තාදීය, ප්‍රශංසාවෙහිද තාදීය, අප්‍රශංසාවෙහිද තාදීය, නින්දාවෙහිද තාදීය, සැපතෙහිද තාදීය, දුකෙහිද තාදීය, ඉදින් එකකු ඇවිත් ඇඟෙහි සුවඳ විලවුන් උලන්නේද ඉදින් එකකු ඇවිත් වෑයකින් සසින්නේද එහි ඇලීමක් නැත. අනික් කරුණෙහි ක්‍රොධයක් නැත. අනුකූල බවද ක්‍රොධයද දුරුකළේ හැපීම හෝ නැසීම නැත්තේ ඇල්මක් හෝ විරොධයක් නැත්තේය, මෙසේ රහතන් වහන්සේ ඉෂ්ටානිෂ්ටයන්හි තාදී සේක. කෙසේ රහතන් වහන්සේ මුදන ලද බැවින් තාදීසේක්ද? රහතන් වහන්සේ රාගය දුරුකළේය. වමාරා දැමුයේය, මිදුයේය. ප්‍රහීණ කළේය, ද්වෙෂය දුරුකළේය, වමාරා දැමුයේය. මිදුයේය, ප්‍රහීණ කළේය මෝහය දුරුකළේය. වමාරා දැමුයේය. ප්‍රහීණ කළේය. සියලු කෙළෙස් සියලු දුසිරිත් සියලු දැවිලි සියලු තැවීම් සියලු අකුසලයන් රැස්කිරීම් දුරුකළේ මිදුයේ ප්‍රහීණවූයේ සංසිඳුයේ යනුයි. මෙසේ රහතන් වහන්සේ කෙළෙස් දුරු කෙළේනුයි තාදීනමි. කෙසේ නම් රහතන් වහන්සේ තරණය කළේනුයි තාදී නම් වේද?

රහතන් වහන්සේ කාමොඝය (කාමය නමැති සැඩ වතුර) තරණය කළේය. භවොඝය තරණය කළේය. දෘෂ්ටි ඔඝය

තරණය කළේය. අවිද්‍යා ඕඝය තරණය කළේය. සියලු සංස්කාර මාර්ගය තරණය කළේය. ඉක්මවූයේය උන්වහන්සේ වැස නිමවූයේය. පුරුදුකළ ගමන් ඇත්තේය උන්වහන්සේට ජාති මරණ සංසාරයත් නැත. නැවත ඉපදීමක් නැත. මෙසේ රහතන් වහන්සේ තරණය කළේනුයි "නොසෙල් වෙන්නා" නමි. කෙසේ රහතන් වහන්සේ මුදන ලද්දේනුයි "නොසෙල්වෙන්නේ" (තාදී) නම් වේද? රහතන්වහන්සේ ගේ රාගයෙන් සිත මිදුනේය. ද්වෙෂයෙන් සිත මිදුනේය, මොහයෙන් සිත මිදුනේය. (මෙහි (3-4 1 ඡේදයේ රාගයෙන් සිත මිදුන බැවීන් යන තැන් සිට 'ශාන්තවූයේ වේ.' දක්වා යොදන්න.) සියලු කෙලෙස්වලින් සිත මිදුනේය, සියලු දුශ්චරිතවලින් (මෙහි (5-6) අග ඡේදය යෙදිය යුතුයි.) මෙසේ රහතන් වහන්සේ මිදුන බැවින් තාදී නමි. කෙසේ රහතන් වහන්සේ දක්වන ලද්දේනුයි තාදී නම් වේද? රහතන් වහන්සේ සීලය ඇති කල්හි සීලය ඇත්තේයයි දැක්වූයේය. ශ්‍රද්ධාව ඇති කල්හි ශ්‍රද්ධාව ඇත්තේයයි දැක්වූයේය. වීර්‍ය්‍යය ඇති කල්හි වීර්‍ය්‍යය ඇත්තේයයි දැක්වූයේය, සිහිය ඇති කල්හි සිහිය ඇත්තේයයි දැක්වූයේය. සමාධිය ඇතිකල්හි සමාධිය ඇත්තේයයි දැක්වූයේය ප්‍රඥාව ඇති කල්හි ප්‍රඥා ඇත්තේයයි දැක්වූයේය, විද්‍යාව ඇති කල්හි ත්‍රිවිද්‍යා ඇත්තේයයි දැක්වූයේය. අභිඥාව ඇති කල්හි ෂට් අභිඥා ඇත්තේයයි දැක්වූයේය. එබැවින් තාදී නම් වන සේක. මෙසේ රහතන් වහන්සේ එය දක්වන ලද්දේනුයි "තාදී" නම් වේ.

## 6 - 1 ජරා සූත්‍රය

1 "මේ ජීවිතය ඒකාන්තයෙන් අල්පයි" යන්නෙහි ජීවිතය යනු ආයුෂය පැවැත්මයි, යැපීම, පැවතීම, පාලනය, ජීවිතය, ජීවිතින්ද්‍රිය යනුයි. නැවතද කරුණු දෙකකින් ජීවිතය ස්වල්පය, ටිකය, පැවැත්ම වශයෙන් ස්වල්ප බැවින් ජීවිතය ස්වල්පය, ස්වභාව වශයෙන් ස්වල්ප බැවින් ජීවිතය ස්වල්පය. පැවැත්ම වශයෙන් කෙසේ ජීවිතය ස්වල්ප වේද? ඉක්මගිය චිත්ත ක්ෂණයෙහි ජීවත්විය. ජීවත් නොවෙයි. ජීවත් නොවන්නේය. අනාගත චිත්තක්ෂණයෙහි ජීවත් නොවන්නේය. ජීවත්

නොවෙයි, ජීවත්නොවූයේය. පවත්නා කාල චිත්තක්ෂණයෙහි ජීවත් නොවෙයි ජීවත් නොවූයේය. ජීවත් නොවන්නේය. (මෙහි (2-4) (6-11) ඡෙද යෙදිය යුතුයි.)

2 "ඒකාන්තයෙන් මේ ජීවිතය අල්පය. අවුරුදු සියයකින් මෙපිට මැරෙයි" යන්නෙහි, කලල කාලයෙහිද ච්‍යුත වෙයි. මැරෙයි, අතුරුදහන් වෙයි, විනාශවෙයි, අර්බුද කාලයෙහිද, පෙසි කාලයෙහිද ඝන කාලයෙහිද පශාඛ කාලයෙහිද, චුත වෙයි, මැරෙයි, අතුරුදහන් වෙයි. විනාශ වෙයි උපන් විටම චුතවෙයි, මැරෙයි, අතුරුදහන් වෙයි. විනාශ වෙයි, සූතිකාගෘහයෙහිද චුත වෙයි, මැරෙයි, අතුරුදහන් වෙයි, අර්ධ මාසයක් වූයේද, මාසයක් වූයේද, දෙමසක් වූයේද තුන්මසක් වූයේද, සතර මසක්, පස්මසක්, සමසක් වූයේද සත්මසක් වූයේද, අටමසක් වූයේද, නව මසක් වූයේද, දස මසක් වූයේද, අවුරුද්දක් වූයේද, අවුරුදු දෙකක් වූයේද, අවුරුදු තුනක් වූයේද, අවුරුදු හතරක් වූයේද, අවුරුදු පහක් වූයේද, (iii) අවුරුදු හයක් වූයේද, අවුරුදු හතක් වූයේද අවුරුදු අටක් වූයේද, අවුරුදු නවයක් වූයේද, අවුරුදු දහයක් වූයේද, විසි අවුරුද්දක් වූයේද, තිස් අවුරුද්දක් වූයේද, සතලිස් අවුරුද්දක් වූයේද, පණස් අවුරුද්දක් වූයේද, හැට අවුරුද්දක් වූයේද, හැත්තෑ අවුරුද්දක් වූයේද අසූ අවුරුද්දක් වූයේද, අනූ අවුරුද්දක් වූයේද චුත වෙයි, මැරෙයි, අතුරුදන් වෙයි, විනාශවෙයි

3 "යමෙක් ඉනුත් එහාට ජීවත්වේද" යනු යමෙක් අවුරුදු සියයක් ඉක්මවා ජීවත්වේද, හෙතෙම එක අවුරුද්දක් ජීවත්වේද, අවුරුදු දෙකක් ජීවත්වේද, අවුරුදු තුනක් ජීවත්වේද, අවුරුදු හතරක් ජීවත්වේද, අවුරුදු පහක් (මෙහි 14 ඡෙදයේ (iii) යෙදියයුතුයි) 'මැරෙයි' යන්නට ජීවත් වේද කියා වෙනස් කරගන්න.) දසවසක්, විසිවසක්, තිස් වසක්, හතලිස් වසක් ජීවත්වේද,

4 යම් කලෙක ජරාවෙන් දිරුනේද, වැඩි වයසට පත්වූයේ මහලුවූයේ අර්ධයක් ගතවූයේ විනාශයට පැමිණියේ සැලුන දත් ඇත්තේ සුදු හිසකේ ඇත්තේ කපා දැමූ හිසකේ ඇති

දොසින් යුතු හිස ඇත්තේ තල කැළල් ඇති ශරීර ඇත්තේ වක්වූයේ මැදින් සැරයටියක් ආධාරකොට ඇත්තේ හෙතෙම ජරාවට පැමිණියේද චුතවෙයි, මැරෙයි, අතුරුදහන්වෙයි. විනාශවෙයි. මරණයෙන් මිදීමක් නැත.

5 "ඉදුන හෝ පැසුන ගෙඩි උදෑසන වැටෙන්නේයයි බියවන්නේ යම්සේද, එමෙන්ම උපන් සත්වයන්ට නිතර මරණයෙන් බිය පැමිණේ."

"යම්සේ කුඹල් කරුවා විසින් සාදන ලද මැටිභාජන සියල්ලම බිඳීම කෙළවර කොට ඇත්තේද, මිනිසුන්ගේ ජීවිතයද එසේමය."

"බාලයෝද වැඩුනෝද යම්කිසි මෝඩයෝ ඇද්ද යම් පණ්ඩිතයෝ ඇද්ද ඒ සියල්ලෝම මරුවා වසඟකොට ඇත්තාහ මරුවා පිහිටකොට ඇත්තාහ."

6 "මරුවාගෙන් පීඩා ලැබ පරලොව යන්නාවූ ඔවුන් ගෙන් පියතෙම පුත්‍රයා නොරකියි. නෑයෝ නෑයින් නොරකිත්. අනික් බොහෝ නෑයින්ගේ බොහෝ වැළපීම බලව. මැරීමට ගෙනයන ගවයාමෙන් (මරුවා) එකකු එකකුම ගෙනයයි" මෙසේ ලොකය මරණයෙන්ද ජරාවෙන්ද වැසී තිබේ."

## 6 - 2

1 "මාගේ යයි සැලකූ ජනයෝ ශෝක කරත්" යන්නෙහි ජනයෝ යනු ක්ෂත්‍රියයෝද, බ්‍රාහ්මණයෝද, වෛශ්‍යයෝද ශුද්‍රයෝද, ගෘහස්ථයෝද, ප්‍රව්‍රජිතයෝද, දෙවියෝද, මනුෂ්‍යයෝද යනුයි. "මගේයයි සැලකූ" යන්නෙහි මමත්වය දෙකකි. තෘෂ්ණා මමත්වයද, දෘෂ්ටි මමත්වයද යනුයි.

(මෙහි (2-6) 1 (ii) (iii) ඡේද යෙදිය යුතුයි. මමය මාගේ යයි සිතන වස්තුව සිඳේය යන සිතින්ද ශෝක කරත්. සිඳෙනකල්හිද ශෝක කරත්. සිඳුන කල්හිද ශෝකකරත්. මමාධිත වස්තුව වෙනස්වේය යන සිතින්ද ශෝකකරත්. ක්ලාන්තවෙත්. වැළපෙත්. ලෙහි අත ගසා හඬත්. සිහි මුලා බවට පැමිණෙත්.

2 "අයත්දේ නිතර නොවේ." යන්නෙහි දැඩිසේ අල්ලාගැනීම් (අයිති) දෙකකි. "මමත්වය වෙනුවට" "දැඩිසේ අල්ලාගැනීම" කියා වෙනස්කර මෙහි 19 (ii) ඡේදය යෙදිය යුතුයි)

තෘෂ්ණාව දැඩිසේ අල්ලාගැණීම අනිත්‍යය. සංස්කාරයන්ට අයත්ය. හේතුවකින් උපන්නේය. ගෙවීයන්නේය. විනාශවී යන්නේය. වෙන්වී යන්නේය. නිරුද්ධවී යන්නේය. වෙන් වී යන්නේය. මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනාකරණලදී. "මහණෙනි, යුෂ්මත්හු ඒ දැඩිව අල්ලා ගන්නා දෙය දැක්කහුද, යම් ඒ දැඩිව අල්ලාගන්නා දෙය නිත්‍යද වෙනස් නොවේද, සදාකාලිකද වෙනස් නොවී එසේම තිබේද, ස්වාමීනි, එය නොවෙයි. යහපති මහණෙනි, මමද යම් ඒ නිත්‍යවූ, නොවෙනස්වූ, සදාකාලිකවූ, වෙනස් නොවන්නා වූ එසේම පවත්නාවූ දැඩිව අල්ලාගැණීමක් නොදනිමි. නිත්‍යවූ වෙනස් නොවන්නාවූ සදාකාලිකවූ දැඩිව අල්ලාගන්නාදේ නැත්තාහ. නොලැබෙත්.

3 "මේ වෙන්වීම ඇත්තේමය" යනු වෙනස්වීම වෙන්වීම අනික් ආකාරයකට පත්වීම ඇතිකල්හි යනුයි. භාග්‍යවතුන් වහන්සේ විසින්ද මෙය වදාරණලදී. "ආනන්දය, ශොක නොකරව. නොහඬව, සියලු ප්‍රියවූ මනාපවූ දෙයින් වෙන්වීම අනික් ආකාරයකට පත්වීම කලින්ම මා විසින් කියනලද්දේ නොවේද? ආනන්දය, යම් ඒ ඇත්තාවූ රැස්වන්නාවූ බිඳෙන්නාවූ ධර්මයක් ඇද්ද, එය නොබිඳේය යන කාරණයක් කෙසේ ලබන්ටද, එබඳු කාරණයක් සිදුනොවේ. මුලින්වූ ස්කන්ධයන්ගේ ධාතුන්ගේ ආයතනයන්ගේ වෙනස් වීමෙන් අනික් ආකාරයකට පත්වීමෙන්, පසුව, පසුව ඇතිවන්නාවූ ස්කන්ධ ධාතු ආයතනයෝ පවතිත්.

4 "මෙසේ දැක ගිහිගෙයි නොවසන්නේය" යන්නෙහි මෙසේ යනු පදපූරණයට යෙදූ පදයකි. මමත්වය ඇතිවස්තුන් මෙසේ දැක සමකොට බලා තීරණයකොට ප්‍රකටසේ දැන යනුයි. "ගිහිගෙයි නොවසන්නේය." යනු සියලු ගෘහවාස

පලිබොධයයිද, අඹුදරු පලිබොධය සිඳ නෑ පලිබොධය දුරුකොට යහලු මිත්‍ර පළිබොධය කඩාදමා රැස් කිරීම් පළිබොධය නැති කොට හිසකේ රැවුල් කපා කසටවත් හැඳ ගිහිගෙයින් නික්ම අනගාරිය නම් ශාසනයෙහි පැවිදිව කෙලෙස් නැති බවට පැමිණ තනිව වාසය කරන්නේය.

## 6 - 3

1 "මරණයෙන් එය නැතිවෙයි." යන්නෙහි මරණය යනු ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්වනිකායයෙන් යම්බඳු ච්‍යුතවීමක් අතුරුදහන් වීමක් මරණයක් කාලක්‍රියාවක් ස්කන්ධයන්ගේ බිඳීමක් ශරීරයාගේ බහ තැබීමක් ජීවිතින්ද්‍රියයාගේ සිඳීමක් ඇද්ද එයයි. "එය" යනු රූපගතවූ, වෙදනාගතවූ, සංඥාගතවූ, සංස්කාරගතවූ විඥානගතවූ යනුයි. "නැතිවෙයි" යනු දුරුකරයි. අතුරුදහන් වෙයි. බිඳීයයි.

2 "භොගයන්ගෙන් තොරව මනුෂ්‍යයා බැහැර කරයි. එයට පෙරටුව මනුෂ්‍යයාද බැහැරකරයි. කාම සම්පත් විඳින්නාගේ භොගයන් එකසේ පවත්නේ නොවේ. එහෙයින් මම ශෝක කාලයෙහි ශෝක නොකරමි." "හිරු අස්තයට පැමිණ පලායයි චන්ද්‍රයා වැඩෙයි. පායයි සත්තුකය, ලෝක ධර්මයෝ මා විසින් දන්නාලදී. එහෙයින් ශොක කාලයෙහි මම ශෝක නොකරමි."

3 "පුරුෂතෙමේ යමක් මේ මගේ යයි සිතාද" යන්නෙහි "යමක්" යනු රූපගතවූ වෙදනාගතවූ, සංඥාගතවූ, සංස්කාරගතවූ විඤ්ඤාණගතවූ, යනුයි. පුරිසො යනු ගණයට ගන්නා පැනවීමයි ව්‍යවහාර නාමයයි. නිරුක්ති වචනයයි කථා ව්‍යවහාරයයි.

4 "මේ මගේයයි" තෘෂ්ණා හැඟීමෙන් හඟියි. දෘෂ්ටි හැඟීමෙන් හඟියි. මාන හැඟීමෙන් හඟියි. ක්ලේශ හැඟීමෙන් හඟියි. දුශ්චරිත හැඟීමෙන් හඟියි. යෙදීමේ හැඟීමෙන් හඟියි. විපාක හැඟීමෙන් හඟියි.

5 "පණ්ඩිත තෙමේ මෙය දැක" යනු මේ ආදීනවය දැන සමකොට බලා තීරණයකොට ප්‍රකටකොට මමායන වස්තූන්හි මේ කාරණය දැන පණ්ඩිතතෙමේ" යනු නුවණැත්තේ, බුද්ධි ඇත්තේ, ඥාන ඇත්තේ, ප්‍රඥා ඇත්තේ යනුයි.

6 "මගේයයි සලකන්නා මගේ යනබවට නොනැමෙන්නේය." යන්නෙහි මමත්ව (මගේ යන බව) දෙකකි තෘෂ්ණා මමත්වයද දුෂ්ටි මමත්වයද යනුයි (මෙහි (2-6) 1 (ii) (iii) ඡෙද යෙදිය යුතුයි)

"මගේ යයි සලකන්න" යනු බුදුන් ස්වකීයකොට ඇත්තා ධර්මය ස්වකීයකොට ඇත්තා සංඝයා ස්වකීයකොට ඇත්තා යනුයි. හෙතෙම ඒ භාග්‍යවතුන්වහන්සේට මමායනය කරයි. භාග්‍යවතුන් වහන්සේ ඒ පුද්ගලයා පිළිගනියි. "භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරණලදී. මහණෙනි, යම් ඒ භික්ෂූහු කුහකද, තදද, චාටු බස් ඇත්තෝද, උස්ව නැගි මාන්නය ඇත්තෝද, ඒ භික්ෂූහු මට මමත්වය ඇත්තෝ නොවෙත්. මහණෙනි, ඒ භික්ෂූහු මේ ධර්ම විනයයෙන් (ශාසනයෙන්) ඉවත්වූවෝ වෙති. ඔවුහු මේ ශාසනයෙහි වැඩීමට විශාලත්වයට උසස්බවට නොපැමිණෙත්. මහණෙනි; යම් ඒ භික්ෂූහු කුහක නැත්තෝද චාටුබස් නැත්තෝද ධෛර්‍ය්‍ය ඇත්තෝද, තද ගති නැත්තෝද, මනාකොට හික්මුනෝද ඒ භික්ෂූහු මට මමත්වය ඇත්තෝ වෙත්. මහණෙනි, ඒ භික්ෂූහු මේ ශාසනයෙන් ඉවත්නොවූවෝ වෙති. ඔවුහු මේ ශාසනයෙහි වැඩීමට විශාලත්වයට උසස්බවට පැමිණේ.

7 "කුහක තද, චාටු කථා ඇති උසස් මාන්නය ඇති නොහික්මුන භික්ෂූහු බුදුරජාණන් වහන්සේ විසින් දෙශනා කරණ ලද ශාසනයෙහි වැඩීමට නොපැමිණෙත්."

"කුහක නැති, තදනැති, චාටු කථා නැති. ධෛර්‍ය්‍යවත් හික්මුන භික්ෂූහු වෙත්ද ඔවුහු සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ විසින් දෙසිත ශාසනයෙහි උසස්වෙත්.

8 "මගේයයි සලකන්නා මගේය යන බවට නොනැමෙන්නේය" යනු පෙරකී මමත්වය ඇත්තා තෘෂ්ණා මමත්වය දුරුකොට දෘෂ්ටි මමත්වය සංසිඳවා මමත්වයට නොනැමෙන්නේය. ක්‍රමයෙන් නොනැමෙන්නේය. එයට බර නොවන්නේය. එහි නොඇලෙන්නේය. එය අධිපතිකොට නොගන්නේය.

## 6 - 4

1 "යම්සේ සිහිනෙන් පවා එක්වූ" යනු සිහිනෙන් පැමිණියාවූ රැස්වූ එකතුවූ යනුයි.

2 "එක්ව බැඳුණු පුරුෂයෙක් නොදක්නේද" යනු යම්සේ පුරුෂයා නින්දට ගියේ (සිහිනෙන්) සඳ දකියි. හිරු දකියි. මහා සමුද්‍රය දකියි. මහාමේරු පර්වතය දකියි. ඇතු දකියි. අසු දකියි. රිය දකියි. පාබල සෙනඟ දකියි. මහසෙනඟ දකියි, සිත් ඇදගන්නා උයන්වතු ආදිය දකියි සිත් අලවන වනයන් දකියි. සිත්කළු භූමි දකියි. රම්‍ය පොකුණු දකියි. ඇස හැරුනේ ඒ කිසිවක් නොදකියි. "මෙසේ ප්‍රෙම කළ ජනයා" යන්නෙහි මෙසේ යනු උපමා වාචක පදයකි

3 "ප්‍රෙම කළ ජනයා" යනු ප්‍රියවූ මමය මාගේ යයි ගත් ජනයා එනම්, මව හෝ පියා හෝ සහෝදරයා හෝ පුතා හෝ දුව හෝ මිත්‍රයා හෝ යහලුවා හෝ නෑ සහලේ නෑයා හෝ මෙසේ ප්‍රිය කරන්නාවූ ජනයා "මැරී ගියා" කලුරිය කළ කෙනෙකු නොදකියි. යනු "මැරීගිය" යනු මළ යන අදහසයිඃ කාලක්‍රියා කළ ඒ මළ තැනැත්තා නොදකියි. නොලබයි. නොවිඳියි.

## 6 - 5

1 "ඇසූ දුටු ඒ ජනයෝ" යන්නෙහි චක්ඛු විඤ්ඤාණයෙන් හටගත් යමක් ශ්‍රොත විඤ්ඤාණයෙන් හටගත් යමක් (යනුයි) තෙජනා යනු ක්ෂත්‍රියයෝද බ්‍රාහ්මණයෝද වෛශ්‍යයෝද ශුද්‍රයෝද ගෘහස්ථයෝද ප්‍රවුජිතයෝද දෙවියෝද මිනිස්සුද යනුයි.

2 "යම් කෙනෙකුන්ට මේ නම කියනු ලැබේද" යන්නෙහි යම් කෙනෙකුන්ගේ යනු ක්ෂත්‍රියන්ගේ බ්‍රාහ්මණයන්ගේ යනු වෛශ්‍යයන්ගේ ශුද්‍රයන්ගේ ගෘහස්ථයන්ගේ ප්‍රවුජිතයන්ගේ දෙවියන්ගේ මිනිසුන්ගේ යනුයි.

3 "නම" යනු ගණන් ගැණීම, සලකුණ, පැනවීම ව්‍යවහාරය, නමක් ඇතිබව තිරුක්තිය, කීම, වචනය, යනුයි. "කියනු ලැබේ." යනු කියනු ලැබේ. ප්‍රකාශ කරණු ලැබේ. ව්‍යවහාර කරණු ලැබේ, යනුයි.

4 "මිය ගිය සත්වයාගේ කියයුතුවූ නමම ඉතිරිවේ" රූපගතවූ වෙදනාගතවූ සඤ්ඤාගතවූ සංස්කාරගතවූ විඤ්ඤාණගතවූ දේ දුරුකරයි. අත්හරියි. අතුරුදහන් වෙයි විනාශ වෙයි. කිම පමණක් ව්‍යවහාර පමණක් ඉතිරිවෙයි.

5 "මිය ගිය සත්වයාගේ යනු පරලොව ගිය කාලක්‍රියා කළ "සත්වයාගේ" යනු සත්වයාගේ මිනිසාගේ මානවකයාගේ පුරුෂයාගේ පුද්ගලයාගේ යනුයි.

## 6 - 6

1 මගේයයි සැලකුවෝ ගිජුවූවෝ ශොකය, වැලපීම යනු මසුරුකම නොහරිත්' යනු ශොක යනු නෑයන්ගේ ව්‍යසනයෙන් හටගත් භොගයන්ගේ ව්‍යසනයෙන් හටගත් රොග ව්‍යසනයෙන් හටගත් ශීලව්‍යසනයෙන් හටගත් දෘෂ්ටි ව්‍යසනයෙන් හටගත් වෙනත් අන්‍යවූද ව්‍යසනයන්ගෙන් හෝ යුක්තවූ වෙනත් අන්‍යවූ දුක්ඛ ධර්මයන්ගෙන් යුක්ත වූවහුගේ ශොකයක් ඇද්ද ශොකකිරීමේ යෙදුන බවක් ඇද්ද ඇතුලත ශොකයක් ඇද්ද ඇතුලත මහා ශොකයක් ඇද්ද ඇතුලත දාහයක් ඇද්ද පරිදාහයක් ඇද්ද සිතේ දැවිල්ලක් දොම්නසක් ශොක හුලක් ඇද්ද පරිදෙව යනු ඥාති ව්‍යසනයෙන් හෝ (මෙහි (6-6) (i) හටගත් තැන සිට, වචන 5 ක් යොදාගත යුතුයි. ඡෙද යෙදිය යුතුයි.) දෘෂ්ටි ව්‍යසනයෙන් හෝ යුක්තවූවහුගේ වෙනින් අන්‍යවූද ව්‍යසනයෙන් යුක්තවූවහුගේ වෙනින් අන්‍යවූද දුක්ඛ ධර්මයකින් යුක්තවූහුගේ වැළපීමක් වේද වැළපීම් බවක් වේද ශොක වචනයක් වේද දෙඩිල්ලක් වේද යනුයි.

2 "මසුරුකම" යනු මසුරුකම් පසකි (ii) ආවාස මච්ඡරිය, කුල මච්ඡරිය, ලාභ මච්ඡරිය, වණ්ණ මච්ඡරිය, ධම්ම මච්ඡරිය යනුයි. මෙබඳු මසුරුකමක් මසුරුවීමක් ලොභී අදහසක් තද මසුරුකමක් ඇති ධනය වැඩීමක් ඇද්ද මෙය මසුරු කමයයි කියත්. නැවතද ස්කන්ධයන්ගේ මසුරු කමද, ධාතූන්ගේ මසුරුකමද, ආයතනයන්ගේ මසුරුකමද, දැඩිව ගැනීමද මසුරු කමයයි කියත්. (iii) "ගිජු" යයි තෘෂ්ණාවට කියනු ලැබේ යම් රාගයන් ඇද්ද ඇලීමක් ( (1-3 ඡෙදයේ 'ඇද්ද' යන තැන් සිට

'තෘෂ්ණා සමුදය' යන තැන් දක්වා යෙදිය යුතුයි) අභිධ්‍යා නම්වූ ලොභයක් ඇද්ද, අකුශලමූලයක් ඇද්ද, එයයි

3 (i) "මගේ යයි සැලකුවෝ" යනු මමත්ව දෙකකි. තෘෂ්ණා මමත්වයද දෘෂ්ටි මමත්වයද යනුයි. (2-6) (ii) (iii) ඡෙද යෙදිය යුතුයි. (ii) මමායනය කරණ වස්තුව නැතිවේය යන සැකයෙන්ද ශොක කරත්. නැතිවන කල්හිද ශෝක කරත්. නැතිවූ කල්හිද ශොක කරත්. මමායනය කරණ වස්තුව නැතිවේය යන සැකයෙන්ද වැළපෙත්. නැතිවන කල්හිද වැළපෙත්. නැතිවූකල්හිද වැළපෙත්. (iii) (මෙහි දෙවෙනි ඡෙදයෙ සොචන්ති වෙනුවට පරිදෙවන්ති කියා යොදාගත යුතුයි) මමායනය කරණ වස්තුව රකිත්. ආරක්ෂා කරත්. වට කරත්. මමය මාගේයයි සිතත්. මසුරු වෙත්. මාගේ යයි ගත් වස්තුවෙහි ශොකය දුරු නොකරත්. වැළපීම දුරු නොකරත්. මසුරුකම දුරු නොකරත්. ගිජුකම දුරු නොකරත්. නොසන්සිඳුවත්. නොඉපදීම් බවට නොපමුණුවත්.

4 "එහෙයින් මුනිවරු අයත්කම් හැර හැසුරුණාහුය" "නිර්භය භාවය දක්නාහු' යන්නෙහි එහෙයින් ඒ කාරණයෙන් ඒ හේතුවෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් මමායනය කරණ වස්තූන්හි මේ ආදීනවය බලන්නේ "මුනීහු' යනු මොනයයි ඥානයට කියනු ලැබේ. යම් ප්‍රඥාවක් දැනීමක් (2-4) 12 ඡෙදය යෙදිය යුතුයි) නුමුලාවක් ධර්මය විමසීමක් සම්‍යක් දෘෂ්ටියක් ඇද්ද, ඒ ඥානයෙන් යුක්තවූ තැන්පත් බවට පැමිණියාවූ මුනීහු තැන්පත් බැව් තුනකි කයේ තැන්පත්කම වචනයේ තැන්පත්කම සිතේ තැන්පත්කම යනුයි. (ii) යමෙක් සියළු ලෝකයෙහි අධ්‍යාත්මිකවූද බාහ්‍යවූද අයහපත්වූද යහපත්වූද ධර්මය දැන දෙවිමිනිසුන් විසින් පුදන ලද්දේ තෘෂ්ණා දැල ඉක්මවා සිටීද හෙතෙම මුනි නම් වේ. "අයත් බව" යන්නෙහි දැඩිව ගැනීම් දෙකකි. තෘෂ්ණාව දැඩිකොට ගැන්මද දෘෂ්ටිය දැඩිකොට ගැන්මද යනුයි. (2-6) 1 (ii) (iii) යෙදිය යුතුයි. මුනිහු තෘෂ්ණාව දැඩිකොට ගැන්ම දුරුකොට දෘෂ්ටිය දැඩිකොට ගැන්ම සංසිඳුවා අත් හැර දුරුකොට සංසිඳුවා නූපදනා බවට පමුණුවා හැසුරුනාහ. ඉරියව් පැවැත්වූහ. පාලනය කළහ. යැපුනාහ.

5 "නිර්භය භාවය දක්නාහු" යනු අමෘතවූ නිර්වාණයට ක්ෂෙමයයි කියනු ලැබේ. (ii) යම් ඒ සියලු සංස්කාරයන් සංසිඳවූයේ සියලු කෙළෙස් නැති කළේ තෘෂ්ණාව දුරු කළේ විරාග නම්වූ නිරොධ නම්වූ නිර්වාණයයි.

6 "නිර්භය භාවය දක්නාහු" යනු ආරක්ෂාව දක්නාහු පිහිට දක්නාහු අභය දක්නාහු ච්‍යුත නොවීම දක්නාහු අමෘතය දක්නාහු නිර්වාණය දක්නාහු එහෙයින් මුනීහු දැඩිකොට ගැනීම අත් හැර නිර්වාණය දක්නාහු විසූහ.

## 6 - 7

1 "මුනිතෙමේ සියලු තන්හි ඇසුරු කිරීම් නැත්තේ" යන්නෙහි ද්වාදශ ආයතනයෝ සියල්ල යයි කියති. ඇසද රූපයෝද කණද ශබ්දයෝද නහයද ගඳ සුවඳද දිවද රශයෝද කයද ස්පර්ශයෝද සිතද ධර්මයෝද (යනුයි.) මුනි යන්නෙහි මොනයයි ඥානයට ලැබේ. ((6-7) 4 (ii) ඡේදය යෙදිය යුතුයි.)

තෘෂ්ණාජාලය ඉක්මවා සිටියේද හෙතෙම මුනි නමි. අනිස්සිතො යන්නෙහි ආශ්‍රය දෙකක් වෙයි තෘෂ්ණා ආශ්‍රය දෘෂ්ටි ආශ්‍රයද යනුයි. ("මමත්වය" වෙනුවට "ආශ්‍රය" කියා වෙනස් කර (2-6) 1 (ii) (iii) යෙදිය යුතුයි) ආශ්‍රයයි. මුනි තෙමේ තෘෂ්ණා දුරුකොට (iv) දෘෂ්ටි ආශ්‍රය බැහැර කොට ඇසෙහි නොඇලුනේ කණෙහි නොඇළුනේ නාසයෙහි නොඇළුනේ දිවෙහි නොඇළුනේ කයෙහි නොඇළුනේ සිතෙහි නොඇළුනේ රූපයෙහි ශබ්දයෙහි ගන්ධයෙහි රශයෙහි ස්පර්ශයෙහි ධර්මයෙහි කුලයෙහි ගණයෙහි ආවාසයෙහි ලාභයෙහි කීර්තියෙහි ප්‍රශංසායෙහි සැපයෙහි සිවුරු පිණ්ඩාහාර සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරෙහි කාම ධාතුවෙහි රූප ධාතුවෙහි අරූප ධාතුවෙහි කාම භවයෙහි රූපභවයෙහි අරූප භවයෙහි සඤ්ඤා භවයෙහි අසඤ්ඤා භවයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤා භවයෙහි එකවොකාර භවයෙහි චතුවොකාර භවයෙහි පඤ්චවොකාර භවයෙහි අතීතයෙහි අනාගතයෙහි පවත්නා කාලයෙහි දැකි දෙයෙහි ඇසූදෙයෙහි මුතයෙහි දතයුත්තෙහි යන සියලු ධර්මයන්හි නොඇලුනේ සීමා රහිත සිතින් වාසය කරයි.

2 "ප්‍රිය භාවයක් නොකරයි. අප්‍රිය භාවයද නොකරයි." ප්‍රියවූ දේ දෙකොටසෙකි. සත්වයෝ හෝ සංස්කාරයෝ හෝ යනුයි. සත්වයින්ට ප්‍රියවීම කෙසේද, (ii) මේ ලොකයෙහි යමෙකුට වැඩ කැමති හිත කැමති පහසුව කැමති මිදීම කැමති මව හෝ පියා හෝ සහෝදරයෙකු හෝ සහෝදරියක හෝ පුතෙකු හෝ දුවක හෝ මිත්‍රයකු හෝ යහලුවෙකු හෝ නෑයෙකු හෝ සහලේ නෑයෙකු හෝ යන මොවුහු ප්‍රියවූ සත්වයෝ වෙත්. ප්‍රියවූ සංස්කාරයෝ කවරහුද? මන වඩන රූපයෝ මන වඩන ශබ්දයෝ මන වඩන ගන්ධයෝ මන වඩන රශයෝ මන වඩන ස්පර්ශයෝ යන මේ සංස්කාරයෝ ප්‍රියවූවෝ වෙත්. (iii) "ප්‍රිය නැත්තෝ' යන්නෙහි අප්‍රිය කරුණු දෙකක් වෙති. (iv) සත්වයෝ හෝ සංස්කාරයෝ හෝ යනුයි. අප්‍රිය සත්වයෝ කවරහුද? මේ ලොකයෙහි අවැඩ කැමති, අහිත කැමති, අපහසුව කැමති, මිදීම අකැමති ජීවිතය නැති කරණු කැමති මේ සත්වයෝ අප්‍රියවූවෝ වෙත්. අප්‍රිය සංස්කාරයෝ කවරහුද, ප්‍රිය නොවූ රූපයෝ ප්‍රිය නොවූ ශබ්දයෝ ප්‍රිය නොවූ ගන්ධයෝ ප්‍රිය නොවූ රශයෝ ප්‍රිය නොවූ ස්පර්ශයෝ මේ සංස්කාරයෝ අප්‍රිය වූවෝ වෙති.

3 "ප්‍රිය බවද නොකරයි. අප්‍රිය බවද නොකරයි." යනු මට මේ සත්වයා ප්‍රියය. මට මේ සංස්කාරයෝ මන වඩන්නෝ යයි රාග වශයෙන් ප්‍රිය නොකෙරෙයි මට මේ සත්වයා අප්‍රියය. මේ සංස්කාරයෝ සිත සතුටු නොකරන්නෝ යයි ක්‍රොධ වශයෙන් අප්‍රිය නොකෙරේද, නූපදවාද ඇති නොකෙරේද, යනුයි.

4 "ඔහු කෙරෙහි වැලපීමද මසුරුකමද කොළයෙහි ජලය මෙන් නොඇලෙයි." යන්නෙහි ඒ පුද්ගලයා කෙරෙහි එනම් අරහත්වූ ක්ෂීණාශ්‍රවයා කෙරෙහි යනුයි.

5 "වැළපීම" යනු ඥාති ව්‍යසන හේතුවෙන් හෝ භොග ව්‍යසන හේතුවෙන් හෝ රොග ව්‍යසන හේතුවෙන් හෝ සීල ව්‍යසන හේතුවෙන් හෝ දුෂ්ටි ව්‍යසන හේතුවෙන් හෝ වෙනින් අනික් ව්‍යසනයකින් හෝ යුක්තවූ වෙනින් අනික් දුක්ඛ ධර්මයකින් යුක්තවූ තැනැත්තාගේ හැඬීමක් වැළපීමක් හැඬීම් බවක් වැළපීම් බවක් දුක්මුසු කථාවක් ඇද්ද එයයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

6 "මසුරුකම" යනු මසුරුකම්පසකි (ii) ආවාස මච්ඡරිය කුල මච්ඡරිය, ලාභ මච්ඡරිය, වණ්ණ මච්ඡරිය, ධම්ම මච්ඡරිය යනුයි. (iii) යමකු මෙබඳු මසුරු කමක් තද මසුරු බවක් ඇලීමක් සිතින් ගත්තේද එයයි, නැවතද (iv) ස්කන්ධ මච්ඡරිය, ධාතු මච්ඡරිය, ආයතන මච්ඡරියද ගනීද එයද මසුරුකමයයි කියනු ලැබේ.

7 "කොළයෙහි ජලය මෙන් නොඇලෙයි." යන්නෙහි "කොළය" යනු නෙළුම් කොළයට කියනු ලැබේ. "දිය" යනු ජලයට කියයි. යම්සේ ජලය පියුම් කොළයෙහි නොඇලේද එපරිද්දෙන් ඒ පුද්ගලයාද ඒ ක්ලෙශයන්ගෙන් නොඇලුනේ නොතැවරේ නික්මුනේ විශෙෂයෙන් මිදුනේ සීමා නොකළ සිතින් වසයි

## 6 - 8

8 "දිය බින්දුව නෙළුම් කොළේ යම්සේද" දිය පොදයයි දිය බින්දුවට කියයි. නෙළුම් යයි පියුම් කොළයට කියයි. යම්සේ දිය බින්දුව පියුම් කොළයෙහි නොතැවරේද නොගෑවේද, පියුමයයි නෙළුම් මලට කියයි. වාරියයි ජලයට කියයි. යම්සේ ජලය නෙළුම් මලෙහි නොගැටේද, නොතැවරේද,

2 "මෙසේ මුනිතෙමේ යම් ඒ ඇසු දුටු සිතූ දෙයෙහි නොඇලෙයි" යන්නෙහි 'මෙසේ' යනු උපමා වාචක පදයෙකි 'මුනි' යනු මොනයයි ඥානයට කියයි (මෙහි (2-3) 12 (ii) ඡෙදය සහ (2-8) 10 ඡෙදයේ 'නුමුළාවූයේ' තැන් සිට 14 දක්වා යෙදිය යුතුයි.) තෘෂ්ණාව ඉක්මවා සිටියේද හෙතෙම මුනි නම්.

3 ඇලීම් දෙකකි. තෘෂ්ණාවේ ඇලීමද දෘෂ්ටියේ ඇලීමද යනුයි. (මෙහි (2-6) 1 (ii) (iii) ඡෙද යෙදිය යුතුයි) මේ තෘෂ්ණා (ඇලීම) ලෙපයයි මේ දෘෂ්ටි 'ලෙප' යයි. මුනිතෙමේ තෘෂ්ණා ඇලීම දුරුකොට දෘෂ්ටි ඇලීම බැහැරකොට "දුටු දෙයෙහි" නොඇලෙයි. 'ඇසූ දෙයෙහි' නොඇලෙයි. 'සිතුණු දෙයෙහි නොඇලෙයි.' දතයුත්තෙහි නොඇලෙයි. නොඇලුනේ නොගැටුනේ නික්මුනේ මිදුනේ සීමා නොකළ සිතින් වසයි.

## 6 - 10

1 "නුවණින් පිරිසුදුවූයේ යම් ඒ ඇසූ දුටු මුතයයි ගත් දෙයෙහි ඒ කරණකොට (ආශාවෙන්) නොසිතාමය" යන්නෙහි ධොනයයි ප්‍රඥාවට කියයි. යම් ප්‍රඥාවක් දැනීම (2-4) 12 (ii) ඡෙදය යෙදිය යුතුයි.)

අමොහය ධර්මය රැස්කිරීම සම්‍යක්දෘෂ්ටිය නම් වේද එයයි. කවර කරුණකින් ධොනයයි ප්‍රඥාවට කියත්ද? ඒ ප්‍රඥාවෙන් කාය දුශ්චරිතය ඉවත් කළේද සෝදන ලද්දේද වාක් දුශ්චරිතය ඉවත් කළේද සෝදන ලද්දේද මනස් දුශ්චරිතය ඉවත් කළේද සෝදන ලද්දේද රාගය ඉවත්වූයේද සේදුනේද වෙයි. ද්වෙෂය, මොහය, ක්‍රොධය, බද්ධවෛරය, ගුණමකුකම, අනුන් දොස්කීම, ඊෂ්‍ර්‍යාව, මසුරුකම, රැවටිල්ල, කෛරාටිකකම, තදගතිය, එකට එක කිරීම, මානය, අතිමානය, මදය, ප්‍රමාදය, සියලු කෙලෙස් සියලු දුසිරිත්, සියලු දාහගති, සියලු දැවිලි සියලු තැවීම්, සියලු අකුශල රැස්කිරීම් ඉවත්කළේද සෝදන ලද්දේද වෙයි. එහෙයින් ප්‍රඥාවට ධොනයයි කියයි. නොහොත් සම්‍යක් දෘෂ්ටියෙන් මිථ්‍යාදෘෂ්ටිය ඉවත්කරණ ලද්දේ සෝදන ලද්දේ සම්‍යක් සංකල්පයෙන් මිථ්‍යා සංකල්පය, සම්‍යක් වචනයෙන් මිථ්‍යාවචනය, සම්‍යක් කර්මාන්තයෙන් මිථ්‍යා කර්මාන්තය, සම්‍යක් ආජීවයෙන් මිථ්‍යා ආජීවය, සම්‍යක් සිහියෙන් මිථ්‍යා සිහිය, සම්‍යක් සමාධියෙන් මිථ්‍යා සමාධිය සම්‍යක් ඥානයෙන් මිථ්‍යා ඥානය සම්‍යක් විමුක්තියෙන් මිථ්‍යා විමුක්තිය බැහැරකරණ ලද්දේද සෝදන ලද්දේද වෙයි. නොහොත් ආය්‍ර්‍ය අෂ්ටාංගික මාර්ගයෙන් සියලු කෙලෙස් සියලු දුසිරිත් සියලු දාහගති සියලු දැවිලි සියලු තැවීම් සියලු අකුශල් රැස්කිරීම්, බැහැරකරණ ලද්දේද සෝදන ලද්දේද වෙයි. රහතන් වහන්සේ මේ ධොන ධර්මයන්ගෙන් යුක්තවූයේ වෙයි. උන්වහන්සේ රාගය බැහැර කළේ පාපය බැහැරකළේ කෙළෙස් බැහැරකළේ දාහයන් දුරුකළේ වෙයි.

2 "යම් මේ ඇසූ දුටු සිතූ දෙයෙහි ඒ කරණකොට නොසිතයි" රහතන් වහන්සේ දැකිදේ (තෘෂ්ණා දෘෂ්ටි මාන

වශයෙන්) නොසිතයි. දැකිදෙයෙහි නොසිතයි. දැකිදෙය වශයෙන් නොසිතයි. මා විසින් දක්නා ලද්දේයයි නොසිතයි. ඇසූ දේ නොසිතයි. ඇසූදෙයෙහි නොසිතයි. ඇසූ දෙය වශයෙන් නොසිතයි. මා විසින් අසනලද්දේයයි නොසිතයි. ඉඳුරන් තුනකින් ගන්නා ලද) මුතය නොසිතයි. මුතයෙහි නොසිතයි. මුතය වශයෙන් නොසිතයි. මවිසින් මුතයෙන් ගන්නාලද්දේයයි නොසිතයි. දන්නා ලද්ද නොසිතයි. දන්නා දෙයෙහි නොසිතයි. දන්නා ලද වශයෙන් නොසිතයි. මවිසින් දන්නා ලද්දේයයි නොසිතයි. මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මහණෙනි, මෙය වෙමියි හැඟීමකි. මේ මම වෙමියි යනුද හැඟීමකි. මෙය වන්නේයයි යනුද හැඟීමකි නොවන්නේය යනුද හැඟීමකි. රූපීහු වන්නාහුය යනුද මේ හැඟීමකි. අරූපීහු වන්නාහුය යනුද හැඟීමකි. සඤ්ඤීහු වන්නාහුය යනුද මේ හැඟීමකි. අසඤ්ඤීහු වන්නාහුය යනුද මේ හැඟීමකි. නෙවසඤ්ඤී නාසඤ්ඤීහු වන්නාහුය යනුද මේ හැඟීමකි. මහණෙනි, රාගය යනුද හැඟීමකි. ගණ්ඩය යනුද හැඟීම්කි. සල්ලය (හුල) යනුද හැඟීමකි. උපද්‍රවය යනුද හැඟීමකි. එබැවින් මහණෙනි, හැඟීම් රහිත සිතින් වාසය කරන්නෙමුයි මෙහිලා හික්මිය යුතුයි.

3 "අනෙකකින් පිරිසුදුකම නොපතයි" යනු ප්‍රඥා ඇත්තේ අන්‍යවූ අශුද්ධි මාර්ගයකින් මිථ්‍යා ප්‍රතිපදාවකින් නෛර්‍යාණික නොවූ ප්‍රතිපදාවකින් එනම්, සතිපට්ඨානයන් හැර සම්‍යක් ප්‍රධානයන් හැර ඍද්ධිපාදයන් හැර ඉන්ද්‍රියයන් හැර බලයන් හැර බොධ්‍යංගයන් හැර ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය හැර ශුද්ධිය, පාරිශුද්ධිය, මිදීම, විමුක්තිය, කැමති නොවේ. ප්‍රාර්ථනා නොකරයි. නොඉවසයි. ඒ පිළිබඳව කථා නොකරයි.

4 "හෙතෙම නොම ඇලෙයි, නොමකලකිරෙයි" යනු සියලු බාල පෘථග්ජනයෝ ඇලෙත්. කළ්‍යාණ පෘථග්ජනයාගේ පටන් සප්ත ශෛක්ෂයෝ නොඇලෙත්. රහතන් වහන්සේ නොඇලේමය. නොඇලුනාවූ උන්වහන්සේ රාගය ක්ෂයවීමෙන් වීත රාග බැවින් දොෂය ක්ෂයවීමෙන් වීත දෝස බැවින් මොහය ක්ෂයවීමෙන් වීත මොහ බැවින් උන්වහන්සේ නිමවූ වාස

ඇත්තේ පුරුදු කළ ගමන් ඇත්තේ (ඇත්කළ ජාති ජරා මරණ ඇත්තේ) උන්වහන්සේ නොඇලේමය.

## මෙත්තෙය්‍ය සූත්‍ර නිර්දෙශය

### 7-1

1 "මෛථුනයෙහි යෙදුනහුට යන්නෙහි මෛථුන ධර්මය නම් (i) යම් ඒ අසද්ධර්මයක් ග්‍රාමධර්මයක් වසල ධර්මයක් නරක ධර්මයක් රහස් දෙයක් දෙදෙනෙකුගේ එක්වීමක් ඇද්ද එයයි. කවර කරුණකින් මෛථුන ධර්මයයි කියද්ද (ii) යම්සේ කලහකාර දෙදෙනෙකුට 'මෛථුනක' යයි කියද්ද දබර කරගන්නා දෙදෙනෙකුට 'මෛථුනක' යයි කියද්ද බැණගන්නා දෙදෙනෙකුට 'මෛථුනක' යයි කියද්ද, විවාද කරගන්නා දෙදෙනෙකුට 'මෛථුනක' යයි කියද්ද නඩු කියා ගන්නා දෙදෙනෙකුට මෛථුනකයයි කියද්ද වාදයට බැසගන්නා දෙදෙනෙකුට 'මෛථුනකයයි කියද්ද, සල්ලාපයට බැසගත් දෙදෙනකුට 'මෛථුනක යයි කියද්ද එමෙන්ම රාගයෙන් රත්වූ එක්වූ වැළඳගත් දෙදෙනෙකුන්ගේ සමාන ධර්මයයි. ඒ කාරණයෙන් මෛථුන ධර්මයයි කියත්. (iii) "මෙථුන මනුයුත්තස්ස' යන්නෙහි මෛථුන ධර්මයෙහි යුක්තවූ යෙදුනාවූ එය චරිතකොට ඇත්තාවූ එය බහුලකොට ඇත්තාවූ එයට නැමුනාවූ එයට බරවූ එහි ඇළුනාවූ එය අධිපතිකොට ඇත්තාවූ යනුයි.

2 මෙසේ ආයුෂ්මත් තිස්ස මෙත්තෙය්‍යතෙමේ" යන්නෙහි ඉති යනු පද සන්ධියයි. පදපූරණයයි. "ආයුෂ්මත්" යනු ප්‍රිය වචනයයි ගරු වචනයයි. 'තිස්ස යනු ඒ තෙරුන්ගේ නාමයයි. පැනවීම්යි. ව්‍යවහාරයයි. නිරුක්ති වචනයයි. කථා ව්‍යවහාරයයි. "මෙත්තෙය්‍ය" යනු ඒ තෙරුන්ගේ ගෝත්‍රයයි. ප්‍රඥාප්තියයි ව්‍යවහාරයයි.

3 "නිදුකානන් වහන්ස, කරදරය කියනුමැනව" යන්නෙහි විඝාත නම් කරදරය, පීඩාව, ඝට්ටනය, උපද්‍රවය, යනුයි.

4 "ඔබගේ පනිවුඩය අසා" යනු ඔබගේ වචනය දෙශනය, අනුශාසනය අසා ඉගෙණ සලකා යනුයි.

5 "විවේකයෙහි හික්මෙන්නෙමු." යන්නෙහි විවේක යනු විවේක තුනකි. කාය විවේකය, චිත්ත විවේකය, උපධි විවේකය යනුයි. කාය විවේකය කවරේද? (ii) මේ ශාසනයෙහි මහණ අරණ්‍යය රුක්මුල, පර්වතය, කඳුබෑවුම් පර්වත ගුහාව, ඈත වනයෙහි සයනය, ඉඩපහසු ඇති තැන, පිදුරුගොඩ, සොහොන යන විවේක සේනාසන භජනය කෙරේද, හෙතෙම කයින් විවේකව හැසිරෙයි. වචනයෙන් විවේකව හැසිරෙයි. හෙතෙම තනිව යයි. තනිව සිටියි. තනිව වාඩිවෙයි. තනිව නිදයි. තනිව ගමට පිඩු පිණිස හැසිරෙයි. තනිව ආපසු එයි. මේ කාය විවේකයයි (iii) චිත්තවිවේකය කවරේද? (iv) ප්‍රථමධ්‍යානයට සමවැදුනහුට නීවරණයන්ගෙන් සිත විවේක වෙයි. ද්විතීය ධ්‍යානයට සමවැදුනහුට විතර්ක විචාරයන්ගෙන් සිත විවේක වූයේ වෙයි. තෘතිය ධ්‍යානයට සමවැදුනහුට ප්‍රීතියෙන් සිත විවේකවූයේ වෙයි. චතුර්ථධ්‍යානයට සමවැදුනහුට සැප හා දුක්වලින් සිත විවේකවූයේ වෙයි. ආකාශානඤ්චායතනයට සමවැදුනහුට රූපසංඥාවෙන් පටිඝසංඥාවෙන් නානත්ත සංඥාවෙන් සිත විවේකවූයේ වෙයි විඤ්ඤානඤ්චායතනයට සමවැදුනහුට ආකාශානඤ්චායතනයෙන් සිත වෙන්වූයේ වෙයි. ආකිඤ්ඤායතනයට සමවැදුනහුට විඤ්ඤානඤ්චායතනයෙන් සිත වෙන්වූයේ වෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවැදුනහුට ආකිඤ්චඤ්ඤායතනයෙන් සිත මිදුනේ වෙයි. සෝවාන්වූවහුට සත්කායදෘෂ්ටියෙන් විචිකිච්ඡාවෙන් (සැකයෙන්) 'සීලබ්බත පරාමාසයෙන් දෘෂ්ටානුසයෙන් විචිකිච්ඡානුසයෙන් තවත් එයට එකතුවූ ක්ලේශයන්ගෙන්ද සිත විවේකවූයේ වෙයි. රහතන් වහන්සේට රූප රාගයෙන්ද අරූප රාගයෙන්ද මානයෙන්ද, උද්ධච්චයෙන්ද අවිද්‍යාවෙන්ද මානානුශයෙන්ද, භවරාගානුශයෙන්ද අවිද්‍යානුශයෙන්ද එයට එකතුවූ තවත් කෙලෙස්වලින්ද පිටත සියලු නිමිතිවලින්ද සිත විවේකවූයේවෙයි. මේ චිත්ත විවේකයයි.

6 උපධි විවේකය කවරේද? ක්ලේශයෝද ස්කන්ධයෝද අභිසංස්කාරයෝද උපධියයි කියත්. අමෘතවූ නිර්වාණයට උපධි විවේකයයි කියත්. යම් ඒ කෙනෙක් සියලු සංස්කාරයන්

සංසිඳවූයේ සියලු කෙලෙස් බැහැරකළේ තෘෂ්ණාව ක්ෂය කළේ නොඇළුනේ බැඳුම් සින්දේ යම් අවස්ථාවකද ඒ නිර්වාණයයි මේ උපධි විවේකයයි.

7 නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුනවුන්ට විවේකය ඇත්තන්ට කාය විවේකයද, පිරිසිදු සිත් ඇත්තන්ට ඉතා පිරිසිදුබව ඇත්තන්ට චිත්ත විවේකයද සිත අරමුණු කිරීම් වශයෙන් නිවනට පැමිණියන්ට කෙලෙස් නැත්තන්ට උපධි විවේකයද වෙයි.

8 "විවේකයෙහි හික්මෙන්නමු." යනු ඒ තෙරුන් වහන්සේ ප්‍රකෘතියෙන් හික්මුනාවූ ශික්ෂා ඇත්තෙකි. ධර්ම දෙශනාව දැඩි සේ ගෙන ධර්මදෙශනාවට ආරාධනා කරන්නේ මෙසේ කීයේය. විවේකයෙහි හික්මෙන්නෙමුයි තිස්ස මෙත්තෙය්‍ය තෙරුන් වහන්සේ එහෙයින් කීහ.

## 7 - 2

1 මෛථුනයෙහි යෙදුනහුට යනු (7-1) 1 (iii) ඡේද යෙදිය යුතුයි. මෙත්තෙය්‍ය යනු භාග්‍යවතුන් වහන්සේ ඒ තෙරුන්ට ගොත්‍රයෙන් කථාකරයි. භාග්‍යවතුන් වහන්සේ යනු ගෞරව වචනයයි. නැවතද රාගය බිඳදැමූ බැවින්, "භාග්‍යවතුන් වහන්සේ නම්. ද්වෙෂය බිඳදැමූ බැවින්, මොහය බිඳ දැමූ බැවින්, මානය බිඳදැමූ බැවින් දෘෂ්ටිය බිඳ දැමූ බැවින් කෙලෙස් කටු බිඳදැමූ බැවින් සියලු කෙලෙස් බිඳ දැමූ බැවින් දහම් රුවන බෙදූ බැවින් භවයන්ගේ කෙළවරට ගිය බැවින් වඩනලද කය ඇති බැවින් වඩනලද ශීලය ඇති බැවින් වඩනලද සිත ඇතිබැවින් වඩනලද ප්‍රඥාව ඇතිබැවින් බෙදනලද බැවින් 'භාග්‍යවතුන් වහන්සේ' නම්. අල්පශබ්ද ඇති, අල්පඝොෂාව ඇති මිනිසුන්ගේ ශබ්දනැති මිනිසුන්ගේ රහස් කටයුතුවලට යොග්‍ය විවේකයට සුදුසු වනයෙහිවූ ඈත සෙනසුන් භජනය කරණබැවින් භාග්‍යවතුන් වහන්සේ භාග්‍යවත් නම්. සිවුරු පිණ්ඩාහාර සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබන බැවින් භාග්‍යවත් නම්. අර්ථ රශය විමුක්ති රසය, අධිශීලය අධිචිත්තය අධිප්‍රඥාව යන මෙයින් යුක්ත බැවින් 'භාග්‍යවත්' නම්. ධ්‍යාන සතර අප්‍රමාණය ධර්මසතර අරූප සමාපත්ති සතර බෙදූ බැවින්

භගවා නම්. අෂ්ටවිමොක්ෂ අෂ්ට අභිභායතන අනුපුබ්බ විහාර සමාපත්ති නවය බෙදූ බැවින් භගවා නම්. සංඥා භාවනා දශය. කසින සමාපත්ති දශය, අනාපානසතිය අශුභ සමාපත්තිය යන මොවුන්ගෙන් යුක්තබැවින් භගවා නම්. සතර සතිපට්ඨාන සතර සම්‍යක්ප්‍රධාන සතර ඍද්ධිපාද පඤ්චෙන්ද්‍රිය, පඤ්චබලය, සප්තබොධ්‍යංග, ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය යන මේ ධර්මයන් කොටස් කළ බැවින් භාග්‍යවත් නම්. දශ තථාගත බල සතර වෛශාරද්‍ය, ප්‍රති සම්භිදා සතර අභිඥාසය, බුද්ධ ධර්මසය, කොටස් කළ බැවින් භාග්‍යවත්' නම්. 'භාග්‍යවත්' යන මේ වචනය මව විසින් නොතබන ලදී. පියා විසින් නොතබනලදී. සහෝදරයා විසින් නොතබන ලදී. මිත්‍රයන් විසින් නොතබන ලදී. යහළුවන් විසින් නොතබනලදී. නෑ සහලේ නෑයන් විසින් නොතබනලදී. ශ්‍රමණ බ්‍රාහ්මණයන් විසින් නොතබනලදී. දෙවතාවන් විසින් නොතබනලදී. යම් ඒ භගවා යන වචනය විමොක්ෂය කෙළවර කොට ඇත්තකි. භාග්‍යවත්වූ බුදුවරයන් වහන්සේලාට බොධිමූලයෙහි සර්වඥතාඥානය ලැබීම සමගම පැනවීමකි.

2 "ධර්ම පණිවුඩය අමතක කරයි." යනු කරුණු දෙකකින් ශාසනය අමතක වෙයි. පර්‍ය්‍යාප්ති ශාසනයද අමතක වෙයි. ප්‍රතිපත්ති ශාසනයද අමතක වෙයි. පර්‍ය්‍යාප්ති ශාසනය කවරේද? (ii) සූත්‍රය, ගෙය්‍යය, වෙය්‍යාකරණය, ගාථාය, උදානය, ඉතිවුත්තකය, ජාතකය, අබ්භූත ධර්මය, වෙදල්ලය යන ප්‍රගුණ කළයුතු ධර්මය පර්‍ය්‍යාප්ති ශාසනය නම්. එයද අමතක වෙයි. වෙන්වූයේ වෙයි. මෙසේද ශාසනය අමතක වූයේ වෙයි. ප්‍රතිපත්ති ශාසනය කවරේද, සම්‍යක් ප්‍රතිපදාව, අනුලොම ප්‍රතිපදාව, උසස් ප්‍රතිපදාව, අන්වර්ථ ප්‍රතිපදාව, ධර්මානු ධර්ම ප්‍රතිපදාව සිල් පිරීම, ඉන්ද්‍රියයන්හි වැසුන දොර ඇති බව; භොජනයෙහි පමණ දැනීම, නිදි දුරුකිරීම, සිහි නුවණ ඇතිබව, සතර සතිපට්ඨාන, සතර සම්‍යක් ප්‍රධාන, සතර ඍද්ධිපාද, පඤ්චෙන්ද්‍රිය, පඤ්ච බල, සප්ත බොධ්‍යංග, ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය යන මේ ධර්මයෝ ප්‍රතිපත්ති ශාසනයයි. එය ද අමතක වෙයි. බැහැරවූයේ වෙයි. "මිච්ඡාව පටිපජ්ජති" යනු සතුන්ද මරයි. හොරකම් කරයි.

ගෘහයන්ද බිඳියි. කොල්ලකෑමද කරයි. එක් ගෙයක් බිඳීමද කරයි. අනුන්ට උවදුරු කරමින් සිටියි පරදාර කර්මයද කරයි. බොරුද කියයි. වැරදි මගට බසියි.

3 "ඔහු කෙරෙහිවූ මෙය අනාර්යයයි." යනු පුද්ගලයා කෙරෙහි මෙය අනාර්‍ය්‍ය ධර්මයකි. බාල ධර්මයකි. මුළා ධර්මයකි. අඥාන ධර්මයකි. අමරාවික්ඛෙප නම් මිථ්‍යා ධර්මයයි. යම් ඒ මිථ්‍යා ධර්මයක් ඇද්ද එයයි. එය ඔහු කෙරෙහි අනාර්‍ය්‍ය ධර්මයයි.

## 7 - 3

1 "එකෙක් පෙර හැසිර" යනු කරුණු දෙකකින් පෙර තනිව හැසිර පැවිදි වශයෙන් හෝ ගණයාගෙන් වෙන්වීම් වශයෙන් හෝ යනුයි පැවිදි වශයෙන් පෙර කෙසේ තනිව හැසිරද සියලු ගෘහවාස (ii) පළිබොධය සිඳ අඹුදරු පළිබොධය සිඳ ඥාති පළිබොධය සිඳ මිත්‍ර යහලු පළිබොධයන් සිඳ රැස් කිරීමේ පළිබොධයන් සිඳ දැලි රැවුල් කපා කසට වත් හැඳ ගිහිගෙයින් නික්ම අනගාරිය නම් ශාසනයෙහි මහණව පළිබොධ රහිත බවට පැමිණ තනිව හැසිරෙයි. ඉරියව් පවත්වයි. යැපෙයි. මෙසේ පැවිදි වශයෙන් තනිව පෙර හැසිර යනුයි. කෙසේ ගණයාගෙන් වෙන්වීම් වශයෙන් තනිව හැසිරේද? හෙතෙම මෙසේ පැවිදිවූයේ (iii) තනිවූයේ වනයෙහි ඈත අල්ප ශබ්ද ඇති අල්ප ඝොෂාව ඇති මිනිසුන්ගෙන් වෙන්වූ මිනිසුන්ගේ රහස් කටයුතුවලට යොග්‍ය විවේකයට සුදුසුවූ සේනාසනයන් සේවනය කෙරේද, හෙතෙම තනිව යයි. තනිව සිටියි. තනිව නිදයි. තනිව ගමට පිඬු පිණිස හැසිරෙයි. තනිව ආපසු එයි. තනිව රහසිගතව හිඳගනියි. තනිව සක්මනට බැස ගනියි. තනිව හැසිරෙයි. ඉරියව් පවත්වයි. මෙසේ ගණයාගෙන් වෙන්ව හැසිරෙයි.

2 "යමෙක් මෛථුනය ඇසුරු කරයිද" මෛථුන ධර්මය නම් යම් ඒ අයහපත් ධර්මය (7-1) 1 (i) (ii) ඡෙද යෙදිය යුතුයි) දෙදෙනෙකුගේ එක්වීම ඒ කාරණයෙන් මෛථුන ධර්මයයි කියත්. "යමෙක් මෛථුනය ඇසුරු කරයිද" යනු මෑත කාලයක

බුදුන්, දහම්, සඟුන්, ශික්ෂාව අත්හැර පහත්බවට පැමිණ. මෛථූන ධර්මය සේවනය කෙරේද, යනුයි.

3 "ලොකයෙහි ඔහු කැරකෙන යානයක් මෙන්" යන්නෙහි "යාන යනු හස්තියානය, අශ්වයානය, ගොයානය, එළුයානය, බැටලුයානය, ඔටුයානය, කොටලුයානය යනුයි "කැරකෙන" යනු නොදැමුන අකාරිතවූ අවිනීතවූ බිඳුන ඒ යානය වැරදි මාර්ගයක් ගනියි. විෂමවූ කනුවකට හෝ ගසකට හෝ නැග ගනියි. වාහයනද කඩයි. නැගෙන්නාටද තුවාල කරයි. ප්‍රපාතයෙහි හෝ වැටෙයි යම්සේ ඒ කැඩුන යානය නොදැමුන අකාරිතවූ අවිනීතවූ නපුරු මාර්ගයක් හෝ ගනීද එපරිද්දෙන්ම ඒ සිවුරුහළ පුද්ගලයා බිඳෙන යානයකට නැගුනාක් වැනි වැරදි මාර්ගයක් ගනියි. මිථ්‍යාදෘෂ්ටියක් ගනියි. මිථ්‍යාකල්පනාවක්, වචනයක් කර්මාන්තයක් දිවිපැවැත්මක් වෑයමක් සිහියත් මිථ්‍යා සමාධියක් ගනියි. ගම්සේ අදාන්තවූ අකාරිතවූ කැඩුන ඒ යානය විෂමවූ කනුවක හෝ ගලක හෝ නැග ගනීද එපරිද්දෙන්ම සිවුරුහළ පුද්ගලයා කැඩුන කැරකෙන යානයක් සමානව විෂමවූ කාය කර්මයට නැග ගනියි. විෂමවූ මනස්කර්මයට නැගගනියි. විෂමවූ ප්‍රාණ ඝාතයට නැග ගනියි. විෂමවූ අදින්නාදානයට නැග ගනියි. විෂමවූ කාම මිථ්‍යාචාරයට නැග ගනියි. විෂමවූ මුසාවාදයට නැග ගනියි. විෂමවූ පිසුණවාචාවට (කේලාම්කීමට) නැග ගනියි. විෂමවූ පරුෂ වචනයට නැග ගනියි. විෂමවූ සම්ඵප්‍රලාපයට නැග ගනියි. විෂමවූ දැඩිලොභයට නැග ගනියි. විෂමවූ ව්‍යාපාදයට නැග ගනියි. විෂමවූ මිථ්‍යා දෘෂ්ටියට නැග ගනියි. විෂමවූ සංස්කාරයන්ට නැග ගනියි. විෂමවූ පඤ්චකාම ගුණයන්ට නැග ගනියි. විෂමවූ පඤ්චනීවරණයට නැග ගනියි. මෙසේ නොදැමුන හොඳට වැඩ නොකරණ නොහික්මුන කැඩුන ඒ යානය යානයද බිඳියි. නැගෙන්නාටද තුවාල කරයි. එපරිද්දෙන්ම කැඩුන යානයක් බඳු සිවුරු හළ පුද්ගලයා නිරයෙහි තෙමේ බිඳෙයි. තිරිසන් යෝනියෙහි තෙමේ බිඳෙයි. ප්‍රෙත විෂයෙහි තෙමේ බිඳෙයි. මිනිස්ලොව තෙමේ බිඳෙයි. දෙව්ලොව තෙමේ බිඳෙයි. යම්සේ නොදැමුන හොඳට වැඩ නොකරණ

කැඩුන ඒ යානය ප්‍රපාතයහි හෝ වැටෙයි. එපරිද්දෙන්ම ඒ කැඩුන යානයක් බඳු සිවුරුහළ පුද්ගලයා ජාති ප්‍රපාතයටද වැටෙයි. ව්‍යාධි ප්‍රපාතයටද වැටෙයි. මරණ ප්‍රපාතයටද වැටෙයි, ශොක, පරිදෙව, දුක්ඛ, දොමනස්ස, උපායාස ප්‍රපාතයටද වැටෙයි, "ලොවෙහි" යනු අපාය ලොකයෙහි, මනුෂ්‍ය ලොකයෙහි යනුයි.

4 "පෘථග්ජනයා හීනයකැයි කියත්" යනු කවර අර්ථයකින් පෘථග්ජන නම් වේද, බොහෝ කෙලෙස් උපදවානුයි පෘථග්ජන නම් බොහෝ දුරු නොකළ ආත්ම දෘෂ්ටිය ඇති බැවින් පෘථග්ජන නමි. බොහෝ ශාස්තෘවරයන්ගේ මුහුණ බලන බැවින් පෘථග්ජන නමි. බොහෝ සියලු ගතිවලින් නොනැගිටි බැවින් පෘථග්ජනනමි. බොහෝ නානාභි සංස්කාරයන් රැස් කෙරේනුයි පෘථග්ජන නමි. බොහෝ නොයෙක් ඔඝයන්ගෙන් පාවේනුයි පෘථග්ජන නමි. බොහෝ නොයෙක් තැවීම් වලින් තැවේනුයි පෘථග්ජන නමි. බොහෝ නොයෙක් දැවිලි වලින් දැවේනුයි පෘථග්ජන නමි. බොහෝ නොයෙක් පඤ්චකාම ගුණයන් ගෙන් ඇලුනු ගිජුවූ එරීම ඇතිබැවින් පෘථග්ජන නමි. බොහෝ පඤ්චනීවරණයන්ගෙන් ඇවුරුන වැසුන බැවින් පෘථග්ජන නමි. හීනමාහු පුථුජ්ජනං යනු පෘථග්ජනයා හීනය නිහීනය ලාමකයයි මෙසේ කීහ. මෙසේ කියත්. ප්‍රකාශ කරත්.

## 7 - 4

1 "ඔහුට ඒ පෙරවූ යශස් කීර්තිද ගෙවීයයි" යන්නෙහි සම්පත කවරේද? මේ ලොව ඇතමෙක් පෙර ශ්‍රමණ භාවයෙහි (ii) සත්කාර කරණ ලද්දේවේද ගරුකාර කරණ ලද්දේවේද බහුමාන කරණ ලද්දේවේද සලකන ලද්දේවේද සිවුරු පිණ්ඩාහාර ගිලන්පස බෙහෙත් පිරිකර ලබන්නේවේද මේ සම්පතයි. (iii) කීර්තිය කවරේද? (iv) මේ ලොව ඇතමෙක් පණ්ඩිතද, ව්‍යක්තද නුවණැත්තේද බහුශ්‍රැතද විචිත්‍රකථිකද යහපත් වැටහීමක් තිබුනේද සූත්‍රාන්තිකයයි කියා හෝ විනය ධරයයි කියා හෝ ධර්ම කථිකයයි කියා හෝ "ආරඤ්ඤික" යයි කියා හෝ "පිණ්ඩපාතිකයයි" කියා හෝ "පංශුකූලික" යයි කියා හෝ

"තෙචීවරික" යයි කියා හෝ "සපදාන චාරික" යයි කියා හෝ "ඛලුපච්ඡාභත්තික" යයි කියා හෝ "නෙසජ්ජිකයයි" කියා හෝ "යථාසන්තතිකයයි" ප්‍රථමධ්‍යානය ලැබුයේයයි කියා හෝ ද්විතීයධ්‍යානය ලැබුයේ යයි කියා හෝ ආකාසානඤ්චායතන සමාපත්තිය ලැබුයේය කියා හෝ විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය ලැබුයේය කියා හෝ ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ලැබුයේය කියා හෝ නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය ලැබුයේය කියා හෝ යනුයි. මේ කීර්තියයි. "ඔහුට එය ගෙවීයයි." යනු බුදුන්, දහම්, සඟුන්, ශික්ෂාව අත්හැර ගිහිවූ ඔහුගේ ඒ සම්පතද ඒ කීර්තියද පිරිහෙයි දුරුවෙයි. ඇදවැටෙයි අතුරුදහන් වෙයි. බිඳීයයි.

2 "මෙයද දැක මෛථුනය නැතිකිරීමට හික්මෙන්නේය" යන්නෙහි, මෙයද යනු පෙර (ii) ශ්‍රමණ භාවයෙහි සම්පතද කීර්තියද මෑත භාගයෙහි බුදුන්, දහම්, සඟුන්, ශික්ෂාව දුරුකොට ගිහිවූවහුගේ අයසද අපකීර්තියද යන මේ සම්පතද විපතද "දැක යනු දැක සමකොට තීරණයකොට, ප්‍රකාශ කොට ප්‍රකටකොට බලා, හික්මෙන්නේයයි" යනු ශික්ෂා තුනකි. (iii) අධිශීල, අධිචිත්ත, අධිපඤ්ඤායනුයි." අධිශීල ශික්ෂාව කවරේද? මේ ශාසනයෙහි මහණ තෙම සිල් ඇත්තේ වේද, ප්‍රාතිමොක්ෂ සංවරයෙන් හික්මුනේ වේද, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවූයේ ස්වල්පවූ වරදෙහි පවා භය දකිමින් වාසය කරන්නේ ශික්ෂාපදයන් සමාදන්ව හික්මේද, කුඩා ශීලස්කන්ධය, මහත් ශීලස්කන්ධය සිල් පිහිටීම මුල් හැසිරීම, සංයමය කුශල ධර්මයන්ගේ ඇතිවීමෙන් ඇතිවන සංවරය යනුයි. මේ අධිශීල ශික්ෂාවයි (iv) අධිචිත්ත ශික්ෂාව කවරේද? (v) මේ ශාසනයෙහි මහණතෙම ( (2-4) 1 (iii) සිට ඡේදය යොදාගත යුතුයි) අධිපඤ්ඤා ශික්ෂාව කවරේද? (v) මේ ශාසනයෙහි මහණ වැඩීම් ඇතිකරවන ප්‍රඥාවෙන් යුක්ත වේද මනාකොට දුක් කෙළවර කරන්නාවූ උතුම් ප්‍රඥාවෙන් යුක්ත වේද, හෙතෙම මේ දුකයයි මනාසේ දනීද, මේ දුක් ඇති වීමේ හේතුවයයි මනාසේ දනීද, මේ දුක්ඛ නිරොධයයි මනාසේ දනීද, මේ දුක් නිරුද්ධ කිරීමේ

ප්‍රතිපදාවයයි මනාසේ දනීද මේ ආශ්‍රවයෝයයි මනාසේ දනීද, මේ ආශ්‍රව ඇතිවීමේ හේතුවයයි මනාසේ දනීද, මේ ආශ්‍රවනිරොධයයි මනාසේ දනීද මේ ආශ්‍රව නිරොධගාමිනී ප්‍රතිපදාවයයි මනාසේ දනීද, මේ අධිප්‍රඥා ශික්ෂාවයි. මෛථුන ධර්මය නම් යම් ඒ අයහපත් ධර්මයක් ග්‍රාම ධර්මයක් වසල ධර්මයක් නරක ධර්මයක් රහස් දෙයක් දෙදෙනෙකුගේ එකතුවීමක් ඇද්ද. ඒ කාරණයෙන් මෛථුන ධර්මයයි කියයි. මෙයද දැක මෛථුනය දුරුකිරීමෙහි යෙදෙව්. මෛථුන ධර්මය දුරුකිරීම පිණිස සංසිඳවීම පිණිස බැහැර කිරීම පිණිස අධිශීලයෙහිද හික්මෙන්නේය. අධි චිත්තයෙහිද හික්මෙන්නේය. අධිප්‍රඥාවෙහිද හික්මෙන්නේය. යම් හික්මීම් තුන ආවර්ජනා කරන්නේ හික්මෙන්නේය. සිත පිහිටුවන්නේ හික්මෙන්නේය. දැන ගන්නේ හික්මෙන්නේය බලන්නේ හික්මෙන්නේය. ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ හික්මෙන්නේය. ස්ථිරසේ පිහිටුවමින් හික්මෙන්නේය. වීර්‍ය්‍ය දැඩිසේ ගන්නේ හික්මෙන්නේය. සිහිය යොදන්නේ හික්මෙන්නේය. සිත එකඟ කරන්නේ හික්මෙන්නේය ශ්‍රද්ධාව යොදන්නේ හික්මෙන්නේය. වීර්‍ය්‍ය දැඩිකොට ගන්නේ හික්මෙන්නේය. නුවණින් දැන ගන්නේ හික්මෙන්නේය. දැනගත යුත්ත දැනගන්නේ හික්මෙන්නේය. විශෙෂයෙන් දැනගත යුත්ත දැන ගන්නේ හික්මෙන්නේය. බැහැර කටයුත්ත බැහැර කරන්නේ හික්මෙන්නේය. වැඩිය යුත්ත වඩන්නේ හික්මෙන්නේය. ප්‍රත්‍යක්ෂ කළ යුත්ත ප්‍රත්‍යක්ෂ කරන්නේ හික්මෙන්නේය. හැසිරෙන්නේය. මනාකොට හැසිරෙන්නේය. සමාදන්ව සිටින්නේය, යනුයි.

## 7 - 5

1 "සංකල්පනාවලින් යුක්තවූ හෙතෙම මුළාවූවකුමෙන් සිත සිතා සිටියි." යන්නෙහි (ii) කාම සංකල්පනාවෙන්, ව්‍යාපාද සංකල්පනාවෙන්, විහිංසා සංකල්පනාවෙන්, දෘෂ්ටි සංකල්පනාවෙන් ස්පර්ශ කරණලද්දේ යුක්තවූයේ වැසූයේ යනුයි. මෝඩයකු මෙන් මුලාවූවකු මෙන් දැවෙයි. කල්පනාකරයි. යම්සේ බකමුහුණා ගසේ අත්තක මීයකු සොයමින් කල්පනා

කරයිද දැවේද යම්සේ කොකා ගංතෙර මසෙකු සොයමින් කල්පනා කරයිද දැවේද යම්සේ බළලා මංසන්ධියක කුණු ගොඩක මීයකු සොයමින් කල්පනා කරයිද, දැවේද, යම්සේ කොටලුවා බර මුදා හැරියේ මංසන්ධියක කුණු ගොඩක ලැග කල්පනා කෙරේද දැවේද එපරිද්දෙන්ම ඒ සිවුරු හළ තැනැත්තේ කාම සංකල්පනාවෙන් ව්‍යාපාද සංකල්පනාවෙන් විහිංසා සංකල්පනාවෙන් දෘෂ්ටි සංකල්පනාවෙන් ස්පර්ශ කරණලද්දේ මෝඩයකු මෙන් මුලාවූවකු මෙන් කල්පනා කරයි. දැවෙයි.

2 "එබන්දා අනුන්ගේ චොදනා අසා දොම්නස් වූයේවේ. උපාධ්‍යායවරු හෝ ගුරුවරු හෝ සමාන උපාධ්‍යායවරු හෝ සමාන ආචාර්‍ය්‍යවරු හෝ මිත්‍රයෝ හෝ ආශ්‍රය කළ අය හෝ යහලුවෝ හෝ චෝදනා කරත්. ඇවැත්නි ඔබට අලාභයකි ඔබට නපුරු ලැබීමකි. යම් ඒ මෙබඳුවූ මහත්වූ ශාස්තෘවරයකු ලැබ මෙසේ මනාකොට ප්‍රකාශ කළ ශාසනයෙහි පැවිදිව මෙබඳු ආර්‍ය්‍ය ධනයක් ලැබ ඒ මෛථුන ධර්මය නිසා බුදුන් දහම් සඟුන් ශික්ෂාව අත්හැර සිවුරු හළෙහිද, කුශල ධර්මයන්හි ශ්‍රද්ධාවක් ඔබට නැතිවීද, ඔබට සිහිය නැති වීද, කුශල ධර්මයන්හි ලජ්ජාවක් ඔබට නැතිවීද කුශල ධර්මයන්හි භයක් ඔබට නැතිවීද, කුශල ධර්මයන්හි වීර්‍ය්‍යයක් ඔබට නැතිවීද කුශල ධර්මයන්හි සිහියක් ඔබට නැතිවීද කුශල ධර්මයන්හි ප්‍රඥාවක් ඔබට නැතිවීද යනුවෙනි. ඔවුන්ගේ වචනය දෙශනය අනුශාසනය අසා උගෙණ සිහි කොට සලකා බලා "දොම්නස් වේ" යනු පීඩාවට පැමිණියේ ගැටුනේ රෝග ඇත්තෙක්වූයේ දොම්නස්වූයේ නැසුනේ වෙයි. තථා විධො යනු එබඳුවූ එසේ සිටියාවූ එවැනි ප්‍රකාර ඇති යම් ඒ සිවුරු හළ කෙනෙක් යනුයි.

## 7 - 6

1 "අනුන් කතාවලින් මෙහෙයවන ලද්දේ වනාහි ආයුධ යොදයි." යන තැන්හි "වනාහි" යනු පද පූරණය පිණිස සුබොච්චාරණය පිණිස යෙදූවකි. "ආයුධ" යනු ආයුධ තුනක් වෙති. කාය ශස්ත්‍රය, වාග් ශස්ත්‍රය, මනස් ශස්ත්‍රය යනුයි. ත්‍රිවිධවූ කාය දුශ්චරිතය කාය ශස්ත්‍රය නමි. ත්‍රිවිධවූ වාග් දුශ්චරිතය

වාග් ශස්ත්‍රය නම්. ත්‍රිවිධවූ මනස් දුශ්චරිතය මනස් ශස්ත්‍රය නම්. "අනුන්ගේ කතාවලින් මෙහෙයවන ලද්දේ" යනු උපාධ්‍යායන් විසින් හෝ ආචාර්‍ය්‍යවරයන් විසින් හෝ සමාන උපාධ්‍යායන් විසින් හෝ ආශ්‍රය කළ අය විසින් හෝ යහලුවන් විසින් හෝ චෝදනා කරණලද්දේ දැන දැන බොරු කියයි. ස්වාමීනි, මම පැවිද්දට ඇළුනෙ වෙමි. මවිසින් මව පොෂණය කටයුතුය. එහෙයින් සිවුරු හළෙමියි කියයි. මවිසින් පියා පොෂණය කටයුතුය. එහෙයින් සිවුරු හළෙමි. මවිසින් සහෝදරයා පොෂණය කටයුතුය යයි කියයි. මවිසින් සහෝදරිය පොෂණය කටයුතු යයි කියයි. මවිසින් පුතා පොෂණය කටයුතුය. මවිසින් දුව පොෂණය කටයුතුය. මවිසින් මිත්‍රයෝ පොෂණය කටයුතුය. මවිසින් යහලුවෝ පොෂණය කටයුතුය. මවිසින් නෑයෝ පොෂණය කටයුතුය. මවිසින් සහලේ නෑයෝ පොෂණය කටයුතුය. එහෙයින් සිවුරු හළේවීමියි කියයි. වචන නමැති ආයුධය ඉදිරිපත් කරයි.

2 "ඔහුගේ මේ මහා ගිජුකම වනාහි" යනු ඔහුගේ මේ මහා ගිජුකම මහා වනය මහා ගැන්ම, මහා කාන්තාරය මහා විෂමය මහා ඇකිලීම, මහා මඩ, මහා එරීම, මහා පළිබොධය යම් ඒ දැන දැන බොරු කීම යනුයි.

3 "බොරු කීම දුරු කරයි." යන්නෙහි "බොරු කීම" යයි මුසාවාදයට කියයි. මේ ලොව ඇතැමෙක් (ii) සභාවක ගියේ හෝ පිරිසකට ගියේ හෝ නෑයන් මැදට ගියේ හෝ ගම් මැදට ගියේ හෝ රාජ කුලය මැදට ගියේ හෝ ඉදිරියට පැමිණ එම්බා පුරුෂය 'මෙහි එව' යමක් දන්නේ නම් එය කියවයි ශාක්ෂි අසනලද්දේ හෙතෙම නොදන්නා දෙය දනිමියි කියයි. නොදැකි දෙය දැකීමියි කියයි. දැකි දෙය නොදැකීමියි කියයි. මෙසේ තමා හේතුවෙන් හෝ අනුන් හේතුවෙන් හෝ ධන හේතුවෙන් හෝ ආමිෂ කිසිවක් නිසා හෝ දැන දැන බොරු කියයි. මෙය මුසාවාදයයි කියයි. නැවතද කරුණු තුනකින් මුසාවාදය වෙයි. පෙරම ඔහුට බොරු කියන්නෙමියි. අදහසක් වෙයි. කියන්නාවූ ඔහුට බොරු කියන්නෙමියි අදහස් වෙයි. කීකල්හි ඔහුට මවිසින් බොරු කියන ලද්දේයයි සිතෙයි. මේ තුන් ආකාරයෙන්

මුසාවාදය වෙයි. නැවතද සතරාකාරයකින් මුසාවාදය වෙයි. (ii) පෙරම ඔහුට බොරු කියන්නෙමියි අදහස් වෙයි. කියද්දී ඔහුට බොරු කියන්නෙමියි අදහස් වෙයි. කීකල්හි ඔහුට මවිසින් බොරු කියනලද්දේ යයි සිතෙයි. දෘෂ්ටිය වැරදිසේ ගෙන යනුයි. මේ සතරාකාරයෙන් මුසාවාදය වෙයි. නැවතද පස් ආකාරයකින් මුසාවාදය වෙයි සයාකාරයකින් සත් ආකාරයකින් අටාකාරයකින් මුසාවාදය වෙයි. (මෙහි (ii) යෙදිය යුතුයි) (iii) දෘෂ්ටිය වැරදිසේ ගෙන කැමැත්ත වැරදිසේ ගෙන රුචිය වැරදිසේ ගෙන සංඥාව වැරදිසේ ගෙන ස්වභාවය වැරදිසේ ගෙන, මේ අටාකාරයෙන් මුසාවාදය වෙයි මුසාවාදය ගනියි, මුසාවාදය දැඩිසේ ගනියි. මුසාවාදයට බැස ගනියි. ප්‍රවිෂ්ට වෙයි.

## 7 - 7

1 "පණ්ඩිතය කියා දන්නා ලද්දේ" යන්නෙහි මේ ලොව ඇතැම් කෙනෙක් පෙර ශ්‍රමණ භාවයෙහිදී (මෙහි (7-4) (ii) ඡේදය යෙදිය යුතුයි) එක හැසිරීමෙහි යෙදුණේ' යනු කරුණු දෙකකින් තනිව හැසිරීම අධිෂ්ඨාන කොට ඇත්තේ එනම් පැවිද්ද වශයෙන් හෝ ගණයාගෙන් වෙන්වීම් වශයෙන් හෝ යනුයි. කෙසේ පැවිද්ද වශයෙන් තනිව හැසිරීම ඉටාගත්තේද කළේද? සියලු ගෘහවාස පලිබොධය සිඳ (7-3) 1 (ii) ඡේදය යෙදිය යුතුයි) මෙසේ පැවිද්ද වශයෙන් තනිව හැසිරීම ඉටාගත්තේය. කෙසේ ගණයාගෙන් වෙන්වීම් වශයෙන් තනිව හැසිරීම ඉටාගත්තේද, මෙසේ හෙතෙම (iii) පැවිදිවූයේ තනිව ආරණ්‍යයෙහි මහාවනයෙහි (7-3) 1 (iii) ඡේදය යෙදිය යුතුය) මෙසේ' ගණයාගෙන් වෙන්ව තනිව හැසිරීම ඉටාගත්තේය.

2 "හෙතෙමේද මෛථුනයෙහි යෙදුණේ" යන්නෙහි මෛථුන ධර්මය නම් යම් ඒ අයහපත් ධර්මය ග්‍රාම ධර්මය නීච ධර්මය රහස්දෙය දෙදෙනෙකුගේ එක්වීම යන ඒ කාරණයෙන් මෛථුන ධර්මය යයි කියත්. හෙතෙම මෑත කාලයක බුදුන් දහම් සඟුන් ශික්ෂාව අත්හැර පහත් බවට පැමිණ මෛථුන ධර්මයෙහි යෙදුනේ යනුයි. "මෝඩයෙකු මෙන්

කෙලෙසෙයි.” යනු දිළින්දෙකුමෙන් මෝඩයෙකු මෙන් හීනබවට පැමිණේ. සතුන්ද මරයි, හොරකම්ද කරයි, ගෘහසන්ධිද බිඳියි, කොල්ලකෑමද කරයි. එක් ගෙයක් බිඳීමද කරයි, උවදුරෙහිද සිටියි. පරදාර කර්මයද කරයි, බොරුද කියයි, මෙසේ කිළිටි වෙයි. ඒ මොහු රජවරු අල්ලා නොයෙක් කම්කටුළු කරවත්. කසවලින් තලවත්. වේවැල් වලින් තලවත්. අඩක් පැලූ දණ්ඩකින් තලවත්. අත කපයි පය කපයි අත්පා දෙකම කපයි. කණ නාසය හා කන්නාසා දෙකම කපයි. බිලංගථාලික නම් කර්මය කරත්. හිස සකක්සේ සුදුවනතුරු රළු දෙයකින් ඉලීමේ කර්මයවූ සංඛමුණ්ඩික කර්මය කරත්. කටෙහි උළක් ගසා තබන රාහු මුඛ නම් කර්මය කරත්. ජොතිමාලික නම් කර්මය කරත්. හත්ථපජ්ජෝතික නම් කර්මය කරත්. එරකවත්තික නම් කර්මය කරත්. චීරකවාසික නම් කර්මය කරවත්. එණෙය්‍යකනම් කර්මය කරවත්. බලිසමංසික නම් කර්මය කරත්. කහාපණික නම් කර්මය කරත්. ඛාරාපතච්ඡික නම් කර්මය කරත්. පලිඝ පරිවත්තික නම් කර්මය කරත්. පිදුරුවලින් ඔතා පිලිස්සීම නමැති පලාලපිට්ඨික කර්මය කරත්. රත්වූ තෙල්වලින් ඉසිත්. බල්ලන් ලවා කවවත්. පණඇති කල්හිම උල හිඳුවත්. කඩුවෙන් හිස සිඳිත්. මෙසේද හීන බවට පැමිණේ. යලිදු කාම තෘෂ්ණාවෙන් මඩනාලද්දේ හාත්පසින් ගන්නාලද්දේ භොගයන් සොයන්නේ නැවෙන් මහසමුදුරට හෝ යයි. ශීතය හෝ පෙරටුකොට උෂ්ණය හෝ පෙරටුකොට ඩැහැලේ බොන මැස්සෝය, මදුරුවෝය. වා අව් හා සර්පාදීන්ගේ ස්පර්ශයෙන් පීඩිතවන්නේ බඩසයින් මැරෙනු ලබන්නේ තිගුම්බ නම් ප්‍රදෙශයට යයි, තක්කෝල නම් ප්‍රදෙශයට යයි, තක්සලා නම් ප්‍රදෙශයටයයි. කාලමුඛ නම් ප්‍රදෙශයටයයි, පරම්මුඛනම් ප්‍රදෙශයට යයි. වෙසුංග නම් ප්‍රදෙශයට යයි. වෙරාපථ, ජව, තාමලී, වංග, විලවන, සුවණ්ණකූට, සුවණ්ණභූමි, තම්බපණ්ණි, සුප්පාරක, භාරුකච්ඡ, සූරට්ඨ, සංගලොක, සකුණපථ, සංගන, පදපතංග, යොනපරම, යොන, නවක, මූලපද, මරුකන්තාර, ජණ්ණුපථ, අප්පථ, මෙණ්ඩපථ, සංකුපථ, ඡත්තපථ, වංශපථ, මූසිකපථ, දරීපථ, වෙත්තාචාර යන ප්‍රදෙශ වලටද යයි.

මෙසේද දුකට පැමිණේ. ධනය සොයන්නේ නොලැබෙයි, ලැබුනේද ආරක්ෂා කිරීම පිණිස දුකක් දොම්නසක් විඳියි. කෙසේද කෙසේනම් මාගේ භොගයෝ රජවරු නොගනිත්ද, සොරු නොගනිත්ද, ගින්නට හෝ අසු නොවෙත්ද, වතුරට ගසා නොයත්ද, ප්‍රිය නොවූ දූ දරු ආදීහු දායාද වශයෙන් ගනිත්ද මෙසේ ආරක්ෂා කරන්නාවූ රකින්නාවූ ඔහුගේ ඒ භොගයෝ විනාශ වෙත්ද. ඒ විනාශ හේතුවෙන් දුකක් දොම්නසක් විඳියි, මෙසේද දුකට පැමිණේ.

3 "මුනිතෙමේ පෙරත් පසුත් මෙහි මේ ආදීනවය දැන" යනු පෙර ශ්‍රමණ භාවයෙහි යශසද කීර්තියද මෑතකාලයෙහි බුදුන්, දහම්, සඟුන් ශික්ෂාව අත්හැර සිවුරුහළහුගේ අයශද අපකීර්තියද මේ සම්පත්තියද විපත්තියද දැන සමකොට බලා තීරණය කොට ප්‍රකට කොට යනුයි. මුනි යන්නෙහි මොනයයි ඥානයට කියයි. යම් ප්‍රඥාවක් දැනීමෙන් යුක්තද (මෙහි (2-4) 12 (ii) සිට 14 ඡේදය දක්වා යෙදිය යුතුයි) මෙහි යනු මේ දෘෂ්ටියෙහි මේ කැමැත්තෙහි මේ රුචියෙහි මේ ගැන්මෙහි මේ ධර්මයෙහි මේ විනයෙහි මේ පාවචනය නම් ධර්මයෙහි මේ ශාස්තෘ ශාසනයෙහි මේ බ්‍රහ්මචරියාවෙහි මේ ආත්මභාවයෙහි මේ මනුෂ්‍ය ලොකයෙහි යනුයි.

4 "තනිව හැසිරීම තදින් කරන්නේය" යනු කරුණු දෙකකින් තනිව හැසිරීම දැඩිකොට ගන්නේය. සියලු ගෘහවාස පලිබොධය සිඳ අඹුදරු පලිබොධය සිඳ ඥාති පලිබොධය සිඳ මිත්‍ර පලිබොධය සිඳ යහලු පලිබොධය සිඳ දැලි රැවුල් කපා හැර කසටවත් හැඳ ගිහිගෙයින් නික්ම අනගාරිය නම් ශාසනයෙහි පැවිදිව කිසිවක ආශාවක් නැති බවට පැමිණ තනිව හැසිරෙන්නේය. වසන්නේය. මෙසේ පැවිදි වශයෙන් තනිව හැසිරෙන්නේය. වසන්නේය, යැපෙන්නේය. කෙසේ ගණයාගෙන් වෙන්වීම දැඩිව ගෙන හැසිරෙන්නේද, හෙතෙම මෙසේ (මෙහි (7-1) 1 (iii) ඡේදය යෙදිය යුතුයි) "මෛථුනය සේවනය නොකරන්නේය" යන්නෙහි මෛථුන ධර්මය නම් යම් ඒ අයහපත් ධර්මය ග්‍රාම ධර්මය (මෙහි (7-1) 1 (ii) යෙදිය

යුතුයි) ඒ කාරණයෙන් මෛථුන ධර්මයයි කියනු ලැබේ. මෛථුන ධර්මය සේවනය නොකරන්නේය. මෛථුන ධර්මයෙහි නොහැසිරෙන්නේය.

## 7 - 9

1 "විවේකයෙහිම හික්මෙන්නේය" යනු විවේකය නම් තුන් විවේකයෝයි. කාය විවේකය, චිත්ත විවේකය, උපධි විවේකය යනුයි. කාය විවේකය කවරේද? (මෙහි (1-4) 36 ඡේද 'මේ ශාසනයෙහි යන තැන් සිට 38 ඡේදය අවසානය දක්වා යෙදිය යුතුයි) "ශික්ෂා" යනු හික්මීම් තුනකි අධිශීල ශික්ෂා, අධිචිත්ත ශික්ෂා, අධිපඤ්ඤා ශික්ෂා යනුයි. (මෙහි (2-4) 1 (ii) සිට 2 ඡේදය අවසානය දක්වා යෙදිය යුතුයි)

2 "මෙය ආර්යයන්ගේ උත්තම දෙයයි" යන්නෙහි බුදුවරයෝද බුද්ධ ශ්‍රාවකයෝද පසේ බුදුවරයෝද ආර්‍යයෝයයි කියත්. යම් ඒ විවේකව හැසිරීමක් ඇද්ද, එය ආර්‍යයන් වහන්සේලාට අග්‍රය, ශ්‍රෙෂ්ඨය, විශෙෂයෙන් ශ්‍රෙෂ්ඨය, ප්‍රමුඛය, උත්තමය යනුයි. "ශ්‍රෙෂ්ඨතෙමේ ඒ කරණකොට නොසිතන්නේය. යනු කාය විවේකයෙහි හැසිරීම ගැන උනන්දුවක් නොකරන්නේය. මානය නොකරන්නේය. උත්සාහ නොකරන්නේය, දැඩිබවක් නොකරන්නේය. එයින් මානයක් නූපදවන්නේය. එයින් තද බවක් නොගන්නේය, යනුයි. "හෙතෙම එකාන්තයෙන් නිවන් හමුවෙහි වේ" යනු හෙතෙම නිර්වාණයාගේ සමීපයෙහි ලඟ ආසන්නයෙහි නුදුරෙහිමවේ යනුයි.

## 7 - 10

1 "කිසිත් නැති හැසිරෙන මුනිවරයාට" යන්නෙහි කිසිවක් නැති යනු විවේකයෙන් යුක්තවූවහුට කාය දුශ්චරිතයෙන් විවේකවූවහුට වචී දුශ්චරිතයෙන් විවේකවූවහුට මනොදුශ්චරිතයෙන් වෙන්වූවහුට රාගයෙන් ද්වෙෂයෙන්, මොහයෙන්, ක්‍රොධයෙන්, උපනාහයෙන්, මකුකමින් පළාසයෙන් ඊර්ෂ්‍යාවෙන්, මසුරුකමින්, මායාවෙන්, කෛරාටිකකමින්, තදගතියෙන්, සාරම්භයෙන් මානයෙන් අතිමානයෙන් මදයෙන්

ප්‍රමාදයෙන්, සියලු කෙලෙස් වලින් සියලු දුශ්චරිතවලින්, සියලු විඩාවලින් සියලු දාහවලින්, සියලු තැවිලිවලින් සියලු අකුසල් රැස්කිරීමෙන් විවේකවූවහුට, "මුනිහුට" යන්නෙහි මොනයයි ඥානයට කියයි (2-4) 12 (ii) සිට 14 දක්වා යෙදිය යුතුයි) "හැසිරෙන්නාට" යනු හැසිරෙන්නේ වාසය කරන්නේ ඉරියව් පවත්වන්නේ වෙයි, යනුයි.

2 "කාමයන්හි බලාපොරොත්තු රහිත වූයේ" යන්නෙහි කාමයෝ නම් ප්‍රධාන වශයෙන් කාම දෙකකි වස්තුකාමද ක්ලෙශකාමද යනුයි. (1, 1 (ii) සිට 3 (ii) දක්වා යෙදිය යුතුයි.) වස්තුකාමයන් දැන ක්ලෙශකාමයන් හැර දුරු කොට නූපදනා බවට පමුණුවා කාමයෙහි අපෙක්ෂා නැත්තේ කාමය හළේ දුරුකළේ කාමය මිදුයේ ප්‍රහීණ කළේ සංසිඳවූ කාමය ඇත්තේ නිවුනේ. සිහිල්වූයේ සැප විඳින්නේ බ්‍රහ්මයා බඳු කයින් වාසය කරයි.

3 "කාමයන්හි ගෙතුණු ප්‍රජාව ඔඝය එතරවූවහුට ප්‍රිය කරත්" යන්නෙහි ප්‍රජාව යනු සත්වයින්ට නමකි. කාමයන්හි, ඇලුන, ගිජුවූ, ගැටුන, මූර්ච්ඡාවූ, ගැළුන සත්වයෝ (ii) කාමොඝයෙන් එතරවූ භවොඝයෙන් එතරවූ දෘෂ්ටි ඔඝයෙන් එතරවූ අවිද්‍යා ඔඝයෙන් එතරවූ සියලු සංසාර මාර්ගයෙන් එතරවූ ඉක්මවූ වෙන්වූ, කෙළවරට ගියාවූ අවසානයට ගියාවූ පිහිටට ගියාවූ බියනැති බවට ගියාවූ චුත නොවන බවට පැමිණියාවූ අමෘත බවට ගියාවූ නිවණට පැමිණියහුට ඔවුහු කැමතිවෙති. (iii) යම්සේ ණයගත්තෝ ණය නැති බව කැමති වෙත්ද, බලාපොරොත්තු වෙත්ද, ලෙඩ ඇත්තෝ ලෙඩ නැති බව බලාපොරොත්තු වෙත්ද, බැම්මෙන් බැඳුනෝ බැම්මෙන් මිදීම බලාපොරොත්තු වෙත්ද, දාසයෝ දාසකමින් මිදීම බලාපොරොත්තු වෙත්ද, දුරු කතරකට පැමිණියහු යහපත් බිමක් බලාපොරොත්තු වේද, එපරිද්දෙන්ම කාමයෙහි ගිජුවූ කාමයෙහි ඇළුන ගැටුන මූර්ච්ඡාවූ ගැලුන සත්වයෝ කාමොඝයෙන් එතරවූ භවොඝයෙන් එතරවූ (මෙහි (ii) යෙදිය යුතුයි) නිර්වාණයට පැමිණියාහු ප්‍රාර්ථනා කරත්. බලාපොරොත්තු වෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# පසුර සූත්‍ර නිර්දෙශය

## 8 - 1

1 "මෙහිම ශුද්ධියවේ යයි කියත්" යන්නෙහි මෙහිම ශුද්ධිය, විශුද්ධිය, පාරිශුද්ධිය, මුක්තිය, විමුක්තිය, කියත්. ප්‍රකාශ කරත්. ව්‍යවහාර කරත්. කෙසේද (ii) ලොකය, හැමදා පවත්නේය. ලෝකය හැමදා නොපවත්නේය. ලොකය කෙළවරක් ඇත. ලොකය කෙළවරක් නැත. ඒ ජීවය ඒ ශරීරයයි. අනිකක් ජීවය අනිකක් ශරීරයයි. සත්වයා මරණින් මතුවෙයි සත්වයා මරණින් මතු නොමවෙයි. නොමනොවෙයි. මෙයම සත්‍යය අනික හිස්යයි (iii) ශුද්ධිය විශුද්ධිය, පාරිශුද්ධිය, මුක්තිය, විමුක්තිය, පරිමුක්තිය කියත්. (iv) අනෙක් ධර්මයන්හි විශුද්ධිය නොකීහ" යන්නෙහි තමන්ගේ ශාස්තෘවරයා, ධර්මදෙශනාව, ශ්‍රාවක ගණයා දෘෂ්ටිය, ප්‍රතිපදාව, මාර්ගය, හැර සියලු අන්‍යවාදයෝ දුරු කරත්. හෙතෙම ශාස්තෘ නොවේ. සර්වඥ නොවේ. ධර්මය යහපත්ව දෙශනා කළේ නොවේ, ශ්‍රාවක ගණය මනාව පිළිපන්නේ නොවේ. දෘෂ්ටිය යහපත් නොවේ. ප්‍රතිපදාව මනාකොට පණවන ලද්දේ නොවේ. මාර්ගය යහපත් නොවේ. එහි ශුද්ධියක් හෝ විශුද්ධියක් හෝ පාරිශුද්ධියක් හෝ මිදීමක් හෝ නැත හීනය ලාමකය ස්වල්පයයි මෙසේ කියත් ප්‍රකාශ කරත්.

2 "යමක් අල්ලාසිටි උසස් වාද ඇති" යන්නෙහි "යමක් අල්ලා සිටි" යනු යම් ශාස්තෘවරයකු ධර්මයක් ශ්‍රාවක ගණයක් දෘෂ්ටියක් ප්‍රතිපදාවක් මාර්ගයක් ඇසුරු කළේද, එහි පිහිටියේද ඇළුනේද, එළඹුනේද, ගැළුනේද යනුයි. තත්වයනු ස්වකීය දෘෂ්ටියෙන් ස්වකීය කැමැත්තෙන් ස්වකීය රුචියෙන් ස්වකීය ලබ්ධියෙන් යනුයි

3 "වෙන් වෙන් සත්‍යයන්හි බෙහෙවින් ඇළුණෝ" යන්නෙහි බොහෝ ශ්‍රමණබ්‍රාහ්මණයෝ බොහෝ වෙනවෙනම ධර්මයන්හි යෙදුනාහු ඇළුනාහු එළඹුනාහු ගැළුනාහු ලොකය සදාකාලිකය, මෙයම සත්‍යය අනික හිස්යයි තීරණය කළාහු පිහිටියාහු ඇළුනාහු එළඹුනාහු ගැළුනාහු ලෝකය සදාකල්

නොපවත්නේය. (මෙහි 1 (ii) යෙදිය යුතුයි.) සත්වයා මරණින් මතු නොමවෙයි නොම නොවෙයි. මෙයම සත්‍යය අනික් දේ හිස්යයි තීරණය කළාහු පිහිටියාහු ඇලුනාහු පැමිණියාහු යෙදුනාහු යනුයි.

## 8 - 2

1 "ඔවුහු වාදකැමැත්තෝ පිරිසට වැද" යන්නෙහි 'වාද කැමති ඔහු' යනු ඒ වාදය කැමතිවන්නෝ බලාපොරොත්තු වන්නෝ වාදය පෙරටුකරන්නෝ වාදය සොයමින් හැසිරෙන්නෝ යනුයි. 'පිරිසට බැස' යනු ක්ෂත්‍රිය පිරිසට, බ්‍රාහ්මණ පිරිසට; ගෘහපති පිරිසට, ශ්‍රමණ පිරිසට බැසගෙන පිවිස යනුයි. 'දෙදෙනා උනුන් බාලයන් වශයෙන් දකිත්.' 'දෙදෙනා' යනු දෙදෙනෙක් කළහකරුවෝ දෙදෙනෙක් කථාකරගන්නෝ, දෙදෙනෙක් වාදකරගන්නෝ දෙදෙනෙක් නඩු කියාගන්නෝ, දෙදෙනෙක් වාදකාරයෝ, දෙදෙනෙක් සාකච්ඡා කරන්නෝ, දෙදෙනෙක් ඔවුහු ඔවුනොවුන් හීනවශයෙන් නිහීනවශයෙන් ලාමකවශයෙන් කුඩා වශයෙන් දකිද්ද, බලත්ද, යනුයි.

2 "ඔවුහු අනෙක් ශාස්තෘකෙනෙකු අසුරුකළාහු විරුද්ධ කථාවන් කරත්" යනු ඔවුහු අන්‍ය ශාස්තෘවරයෙකු ධර්මයක්, ශ්‍රාවක සමූහයක්, දෘෂ්ටියක් ප්‍රතිපදාවක් මාර්ගයක් යන මේවායේ යෙදුනාහු ඇලුනාහු පිහිටියාහු යනුයි. 'කථොජ්ජං' යනු කළහය ඩබරය, විග්‍රහයට කියයි. යලිදු "විරුද්ධ කථා" යනු හරයක් නැති කථාව යමක්ද එය විරුද්ධ කථා යයි කියත්. කළහයයි කියත් භණ්ඩනයයි කියත්. විග්‍රහයයි කියත්. විවාදයයි කියත්. ප්‍රකාශ කරත්

3. "ප්‍රශංසා කැමැත්තෝ උගත් කථා ඇත්තෝ" යන්නෙහි 'ප්‍රශංසා' කැමැත්තෝ යනු ප්‍රශංසා කැමැත්තාහු ප්‍රශංසාව බලාපොරොත්තුවන්නාහු ප්‍රශංසාව පෙරටුකොට ඇත්තාහු ප්‍රශංසාව සොයමින් ඇවිදින්නාහු "උගත් කථා ඇත්තෝ" යනු දක්ෂ වාදයෙන් පණ්ඩිත වාදයෙන් ස්ථිර වාදයෙන්, න්‍යාය වාදයෙන්, ලක්ෂණ වාදයෙන්, කාරණ වාදයෙන්

ස්ථානවාදයෙන් ස්වකීය ලබ්ධියෙන් ප්‍රශංසාව කැමැත්තෝ යනුයි.

## 8 - 3

1 "පිරිස් මැද කථාවෙහි යෙදුණේ" යනු ක්ෂත්‍රිය පිරිසෙහි හෝ බ්‍රාහ්මණ පිරිසෙහි හෝ ගෘහපති පිරිසෙහි හෝ ශ්‍රමණ පිරිසෙහි හෝ මැද තමන්ගේ කථාවෙහි යෙදුනේ කියන්ට යෙදුනේ

2 "ප්‍රශංසා කැමැත්තේ සැක ඇත්තේවේ." යන්නෙහි ප්‍රශංසාව ස්තුතිය, කීර්තිය, වර්ණනාව, කැමතිවන්නේ ඉවසන්නේ ප්‍රාර්ථනා කරන්නේ, යනුයි "සැක ඇත්තේවේ. යනු කථාවට මුලින්ම සැක ඇතිව යම් යම් දේ සිතන්නේ වෙයි. මට ජය අත්වන්නේද? මට පරාජය අත්වන්නේද? කෙසේ නිග්‍රහ කරන්නෙම්ද? කෙසේ ප්‍රතිකර්ම කරන්නෙම්ද? කෙසේ විශෙෂයක් කරන්නෙම්ද, කෙසේ වැඩි විශෙෂයක් කරන්නෙම්ද, කෙසේ අවුල්කිරීමක් කරන්නෙම්ද, කෙසේ අවුල් ලිහීමක් කරන්නෙම්ද, කෙසේ සිඳදැමීමක් කරන්නෙම්ද, කෙසේ වටකිරීමක් කරන්නෙම්දැයි කථාවට පෙරම සැක ඇත්තේ නොයෙක් දේ සිතයි.

3 "බැහැරකළ කල්හි වනාහි දොම්නස්වේ" යනු යම් ඒ ප්‍රශ්න විමසා බලන්නෝ පිරිසෙහි වූවෝ විදහන්නෝ බැහැරයත්. කෙසේද, අර්ථයෙන් තොරවූවක් කියනලද්දේ යයි අර්ථවශයෙන් පහවයත්. පදයෙන් තොරවූවක් කියන ලද්දේයයි පද වශයෙන් පහවයත්. ඔබ විසින් අර්ථය නපුරු කොට යොදනලදී. ඔබ විසින් පද නපුරුසේ යොදනලදී. අර්ථය හා පදය නපුරුසේ යොදනලදී. ඔබ විසින් නිග්‍රහයක් කරණලදී. ඔබ විසින් ප්‍රතිකර්මය නපුරුසේ කරණලදී. ඔබ විසින් විශෙෂයක් නොකරණ ලදී. ප්‍රතිවිශෙෂය ඔබ විසින් නපුරුසේ කරණලදී. අවුල් කිරීම නොකරණලදී. අවුල් ලිහීම නරකසේ කරණලදී. ඔබ විසින් සිඳීමක් නොකරණලදී. වටකිරීම නපුරුසේ කරණලදී. විෂම කථා නපුරුසේ කියනලදීයයි පහවයත්. පහවගියකල්හි දොම්නස් වූයේවෙයි.

4 "ඒ සිදුරු සොයන්නා නින්දාවෙන් කිපේ" යනු නින්දාවෙන් ගර්හාවෙන් අපකීර්තියෙන් දොස්කීමෙන් කිපෙයි. ව්‍යාපාදය ඇතිවෙයි. කොපයද, ද්වෙෂයද, නොසතුටද පහළකරයි. නින්දාවෙන් ෙහතෙම කිපෙයි. සිදුරු සොයන්නේ වෙයි. වැරදි සොයන්නේ වෙයි. දූෂිත ස්ථාන සොයන්නේ වෙයි. අඩුතැන් සොයන්නේ වෙයි. ගැටුනතැන් සොයන්නේ වෙයි. විවෘත තැන් සොයන්නේ වෙයි.

## 8 - 4

1 "ඔහුගේ ඒ වාදය අසම්පූර්ණ එකකැයි කීහ." යන්නෙහි ඔහුගේ යම් ඒ වාදය හීනය, නිහීනය, සම්පූර්ණ නොවේයයි මෙසේ කියත්. මෙසේ ප්‍රකාශ කරත්. ව්‍යවහාර කරත්. "ප්‍රශ්න විමසන්නෝ බැහැරකළ" යනු යම් ඒ ප්‍රශ්න පරීක්ෂාකරන්නෝ වෙද්ද, ඒ පිරිස පහවයත් යනුයි.

2 "ලාමක කථා ඇත්තෝ වැළපෙත්. ශොකකරත්" යන්නෙහි මවිසින් අනිකක් ආවර්ජනා කරණලදී. අනිකක් සිතනලදී. අනිකෙක හික්මෙනලදී. අනිකක් බලනලදී. ෙහතෙම මහා පක්ෂයක් ඇත්තේ මහා පිරිසක් ඇත්තේ මහා පිරිවර ඇත්තේ මේ පිරිස වෙන් වෙන්වූයේය. සමගි නැත. කථා සල්ලාපය පිරිසට සමගිවීමට හේතුයි. "නැවත තසන්නෙමි"යි මෙබඳුවූ යම් වචනයක් ප්‍රලාපයක් විකාර කථාවක් ඇතිව වළපියි. ශොක කරයි. යනු ඔහුට ජයවේයයි ශෝක කරයි. මට පරාජය වූයේයයි ශෝක කරයි. ඔහුට ලාභයක් වූයේ යයි ශෝක කරයි. මට අලාභවූයේයයි ශෝක කරයි. ඔහුට කීර්තිය ඇතිවූයේයයි ශෝක කරයි. ඔහුට ප්‍රශංසාවූයේයයි, ශෝක කරයි. මට නින්දාවූයේයයි ශෝකකරයි. ඔහුට සැප වූයේයයි ශෝක කරයි. මට දුක්වූයේයයි ශෝකකරයි. ෙහතෙම සත්කාර ඇත්තේ; ගරුකාර ඇත්තේ, බහුමාන ඇත්තේ පූජා ඇත්තේ, සත්කාර ඇත්තේ, සිවුරු පිණ්ඩාහාර සෙනසුන්, ගිලන්පස බෙහෙත් පිරිකර ලැබුයේයයි ශෝක කරයි. කල්පනාවෙයි. මම සත්කාර නැත්තෙම් ගරුකාර නැත්තෙම් බහුමාන නැත්තෙම්, පූජා නැත්තෙම්, සත්කාර නැත්තෙම් සිවුරු පිණ්ඩාහාර සෙනාසන ගිලන්පස

බෙහෙත් පිරිකර නොලැබීමියි ශෝක කරයි. කල්පනා වෙයි. ලයෙහි අත තබා හඬයි වළපියි. ශෝක කරයි. 'අසම්පූර්ණ කථා ඇත්තේ, යනු හීන වාද ඇත්තේ පරිහීන වාද ඇත්තේ මාගේ වාදය සම්පූර්ණ නොවේයයි හඬයි වළපියි.

3 "මා ජය ගත්තේයයි කියත්" යනු හේ මා වාදයෙන් වාදය ඉක්මවූයේය. මෙසේද මා ඉක්මවූයේයයි සිතයි. යලිදු හෝ මා වාදයෙන් වාදය මැඩපවත්වා යටකොට මැඩ හැසිරෙයි. වාසය කරයි. පාලනය කරයි. යැපෙයි. මෙසේද මා මැඩපැවැත්වූයේයයි සිතයි. 'කියයි' යනු වචනය කියයි. ප්‍රලාප විප්‍රලාප දෙඩිවිලි වචනයයි.

## 8 - 5

1 "ශ්‍රමණයන් අතර ඇතැම් විවාදයක් වීය" යන්නෙහි ශ්‍රමණයෝ නම් යම්කිසි මේ ශාසනයෙන් පිටත පරිබ්‍රාජක බවට පැමිණියෝයි. මොවුහු දෘෂ්ටි කලහ ඇත්තෝ වෙති. මේ ශ්‍රමණයන් කෙරෙහි දෘෂ්ටි භණ්ඩනය ඇත. දෘෂ්ටි විග්‍රහය දෘෂ්ටි විවාදය පහළව ඇත.

2 "මෙහිදී උසස් වෙයි. පහත් වෙයි." යනු ජය පරාජය වෙයි. ලාභාලාභවෙයි. යස අයස වෙයි. නින්දා ප්‍රශංසා වෙයි. සැපදුක් වෙයි. සොම්නස් දොම්නස් වෙයි. ඉටු අනිටු වෙයි. අනුකූල බව හා ක්‍රොධ බව වෙයි උසස්වීම හා පහත්වීම වෙයි. අනුරොධය හා විරොධය වෙයි. ජයෙන් සිත උසස් වෙයි. පරාජයෙන් සිත පහත්වෙයි. ලාභයෙන් සිත උසස් වෙයි. අලාභයෙන් සිත පහත් වෙයි. කීර්තියෙන් සිත උසස් වෙයි. අපකීර්තියෙන් සිත පහත් වෙයි. ප්‍රශංසාවෙන් සිත උසස් වෙයි. නින්දාවෙන් සිත පහත් වෙයි. සැපයෙන් සිත උසස් වෙයි. දුකින් සිත පහත් වෙයි. සොම්නසින් සිත උසස් වෙයි. දොම්නසින් සිත පහත් වෙයි. නැගීමෙන් සිත උසස් වෙයි. බැසීමෙන් සිත පහත් වෙයි.

3 "මෙයත් දැක විරුද්ධ කථාවෙහි නොඇලෙන්නේය. දෘෂ්ටි කලහයන්හි විවාදයන්හි භණ්ඩනයන්හි මෙයද මේ ආදීනවයද දැක සමකොට බලා තීරණය කොට ප්‍රකටකොට බලා "විරුද්ධ

කථාවෙහි නොඇලෙන්නේය” යන්නෙහි ‘විරුද්ධ කථාව’ යනු කළහය, ඩබරය, විග්‍රහය, විවාදය, යනුයි යලිදු හෝ හරය නැති ඒ කථාව ‘විරුද්ධ කථා, නමි. කොළාහල නොකරන්නේය. විවාදය නොකරන්නේය, අඩ දබර විවාද විග්‍රහ හැප්පීම් දුරු කරන්නේය, සංසිඳු වන්නේය. ඔහුගේ අඩදබර විවාදය විග්‍රහ මෙධගයන් දුරු විය. නොඉපදීම් බවට පැමුණුනෝය සීමානොකළ සිතින් වාසය, කරන්නේය.

4 “ප්‍රශංසා ලාභයෙන් අනෙක් අර්ථයක් නැත” යන්නෙහි ප්‍රශංසා ලාභයෙන් අන්‍යවූ වැඩක් නැත. ආත්මාර්ථයක් හෝ පරාර්ථයක් හෝ උභයාර්ථයක් හෝ මෙලොව අර්ථයක් හෝ පරලොව අර්ථයක් හෝ නොගැඹුරු අර්ථයක් හෝ ගැඹුරු අර්ථයක් හෝ ගුල්හාර්ථයක් හෝ වැසුන අර්ථයක් හෝ පැමිණිය යුතු අර්ථයක් හෝ පැමිණෙන ලද අර්ථයක් හෝ නිරවද්‍ය අර්ථයක් හෝ නික්ලේශ අර්ථයක් හෝ පිරිසිදු අර්ථයක් හෝ පරමාර්ථයක් හෝ නැත. විද්‍යමාන නොවෙත්. නොලැබෙත්.

## 8 - 6

1 “එහි ප්‍රශංසා කරන ලද්දේ හෝ වේද” යන්නෙහි එහි යනු ස්වකීය දෘෂ්ටියෙන් ස්වකීය කැමැත්තෙන්, ස්වකීය රුචියෙන් ස්වකිය ලබ්ධියෙන් ප්‍රශංසා කරණ ලද්දේ ස්තුති කරණ ලද්දේ කීර්තිය ඇත්තේ වර්ණනා කරණ ලද්දේ වෙයි.

2 “පිරිස් මැද වාද කථා කොට” යන්නෙහි ක්ෂත්‍රිය පිරිසෙහි හෝ බ්‍රාහ්මණ පිරිසෙහි හෝ ගෘහපති පිරිසෙහි හෝ ශ්‍රමණ පිරිසෙහි හෝ මධ්‍යයෙහි තමන්ගේ වාදය කියා අනුවාදය කියා දැඩිකොට ප්‍රකාශ කොට බබුළුවා ව්‍යවහාර කොට වටකොට යනුයි

3 “හෙතෙම එයින් ඒ ආඩම්බරය ඉක්මවා සිනාසෙයි යන්නෙහි හෙතෙම ඒ ජය ලැබීමෙන් සතුටුවූයේ වෙයි. ප්‍රහර්ෂවූයේ සම්පූර්ණවූ මනදොළ ඇත්තේ වෙයි. යලිදු හෝ හෙතෙම දත් විදහාගෙන සිනහ වෙයි. “එයින් ආඩම්බරය ඉක්මවා යනු හෙතෙම ඒ ජයෙන් උදම්වූයේ වෙයි ධජයක් මෙන් කොඩියක් මෙන් ඉදිරි සිත් ඇත්තේ වෙයි. “සිතවූ පරිද්දෙන් ඒ

අර්ථයට පැමිණෙන්නේය" යනු ඒ ජයට පැමිණ ජය ලැබ විඳ යනුයි. "සිතවූ පරිද්දෙන්" යනු සිත පරිදි විය. කල්පනාව පරිදි විය. විඤ්ඤානය පරිදි විය.

## 8 - 7

1 "යම් උන්නතියක් වේද, ඒ ඔහුට විනාශ කාරණයයි. " යම්" යනු යම් උඩගු බවක් ධජයක් මෙන් දැඩිව ඉදිරි ගැන්මක් වේද, එය ඔහුගේ විපත් භූමියයි පීඩා භූමියයි. ඝට්ටන භූමියයි. උපද්‍රව භූමියයි.

2 "මේ තෙමේ මානයද අතිමානයද ප්‍රකාශ කරයි." යන්නෙහි ඒ පුද්ගලතෙම මානයද කියයි. අතිමානයද කියයි. යනුයි. "මෙයද දැක විවාද නොකරන්නේය." යනු මේ ආදීනවය දැක බලා සමකොට බලා තීරණය කොට ප්‍රකට කොට දෘෂ්ටි කලහයන්හි දෘෂ්ටි ඝට්ටනයන්හි දෘෂ්ටි විග්‍රහයන්හි දෘෂ්ටි විවාදයන්හි "විවාද නොකරන්නේය." යනු කෝළාහල නොකරන්නේය. විග්‍රහ නොකරන්නේය. විවාද නොකරන්නේය කලහ ඩබර විග්‍රහ විවාද හැප්පීම් දුරු කරන්නේය. සංසිඳුවන්නේය. නූපදනා බවට පමුණුවන්නේය. ඔහුගේ කලහ ඩබර විග්‍රහ විවාද හැප්පීම් දුරු වූයේය. වෙන්වූයේය. නික්මුනේය. මිදුනේය. සීමා රහිත සිතින් වසන්නේය යනුයි.

3 "එයින් ශුද්ධියක් යනු නොවේයයි දක්ෂයෝ කියත්." යන්නෙහි දක්ෂයෝයනු යම් ඒ ස්කන්ධයන්හි දක්ෂයෝ ධාතු ධර්මයන්හි දක්ෂයෝ ආයතන ධර්මයන්හි දක්ෂයෝ ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මයන්හි දක්ෂයෝ සතිපට්ඨානයන්හි දක්ෂයෝ සම්‍යක් ප්‍රධානයන්හි දක්ෂයෝ ඍද්ධි පාදයන්හි දක්ෂයෝ ඉන්ද්‍රිය ධර්මයන්හි දක්ෂයෝ බල ධර්මයන්හි දක්ෂයෝ බොධ්‍යංග ධර්මයන්හි දක්ෂයෝ මාර්ග ධර්මයන්හි දක්ෂයෝ ඵල ධර්මයන්හි දක්ෂයෝ නිර්වාණ ධර්මයන්හි දක්ෂයෝ යනුයි. ඒ දක්ෂයෝ දෘෂ්ටි කලහයෙන් දෘෂ්ටි ඩබරයෙන් දෘෂ්ටි විග්‍රහයෙන් දෘෂ්ටි විවාදයෙන් දෘෂ්ටි හැප්පීමෙන් ශුද්ධිය විශුද්ධිය පාරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය නොකියත්, ප්‍රකාශ නොකරත්. ව්‍යවහාර නොකරත් යනුයි.

## 8 - 8

1 "ශූරයා යම්සේ රාජ භොජනයෙන් විචාළේ" යන්නෙහි ශූරයනු ශූරවූ වීරවූ වික්‍රම ඇති බිය නැති ලොමු ඩැහැ නොගන්නා ත්‍රාස නැති පලා නොයන ගති ඇති යනුයි " ගර්ජනය කරමින් ශූරයා කැමතිවේ." යන්නෙහි හෙතෙම ගර්ජනා කරන්නේ උසස්ව ගර්ජනා, විශෙෂයෙන් ගර්ජනා කරන්නේ විරුද්ධ ශූරයා වෙත පැමිණෙයි. විරුද්ධ පුරුෂයා වෙත පැමිණෙයි. විරුද්ධ සතුරා වෙත පැමිණෙයි. ඔහු බලාපොරොත්තු වන්නේ ගර්ජනා කරන්නේ වෙයි.

2 "ඒතෙම යමකින් පලායේද ශූරයා, එයින් පලායව" ඒ දෘෂ්ටි ගතිකයා යමකින් යුක්ත නම් එයින් යව එයින් ඉදිරියට යව. හෙතෙම ඔබගේ විරුද්ධ ශූරයා වෙයි. විරුද්ධ පුරුෂයා වෙයි. සතුරා වෙයි යනුයි "පෙර යම් මේ යුද්ධයක් පිණිස යමක් නැත." යන්නෙහි මුලින්ම බොධි මූලයෙහි දීම විරුද්ධවූ කෙලෙස් නොසමවූ කෙලෙස් ප්‍රතිපක්ෂවූ කෙලෙස් නැත. විද්‍යමාන නොවෙත්, නොලැබෙත්, ප්‍රහීණය, මුලින් සින්දේය. සංසිඳුනේය. ඉපදීමට අයොග්‍ය වූයේය. ඥානය නමැති ගින්නෙන් දැවුනේය යනුයි. "යම් මේ යුද්ධය පිණිස" යනු යම් ඒ යුද්ධය පිණිස කලහය පිණිස ඩබරය පිණිස විග්‍රහය පිණිස, විවාදය පිණිස හැප්පීම පිණිස යනුයි.

## 8 - 9

1 "යමෙක් දෘෂ්ටිය උගෙණ විවාද කරත්ද" යමෙක් දෙසැට දෘෂ්ටිගතවූ එක් එක්තරා දෘෂ්ටියක් ගෙන ඉගෙණ පරාමර්ශකොට බැසගෙන වාද කරත්. කෝලාහළ කරත්. භණ්ඩන කරත්. විග්‍රහ කරත්. විවාද කරත්. මෙධග කරත්. ඔබ මේ ධර්ම විනය නොදන්නෙහිය. මම මේ ධර්ම විනය දනිමි. කිමෙක්ද, ඔබ මේ ධර්ම විනය දන්නෙහිද, ඔබ වැරදි මගක් ගත්තෙහිය. මම යහපත් මග ගත්තෙමි. මා ධර්මයෙන් යුක්තය තා ධර්මයෙන් වෙන්ය. මුලින් කියයුත්ත පසුව නොකියව. පසුව කියයුත්ත මුලින් නොකියව. වැරදිසේ පෙරළීම ඔබට බොහෝ පුරුදුය.

ඔබ විසින් වාදය නගන ලදී. ඔබ නිග්‍රහ ලද්දේවෙහිය. වාදයෙන් මිදීම පිණිස හැසිරෙව. ඉදින් හැකිනම් ගැටළු ඉවත් කරව,

2 "මෙයම ඇත්ත යයිද වාද කරත්." යන්නෙහි, ලොකය ශාස්වතය. මෙයම සත්‍යය. අනික් ධර්ම හිස්ය. වාද කරත්. කථා කරත්. කියත්. ප්‍රකාශ කරත්. ව්‍යවහාර කරත්. "ඔබ ඔවුන් කියව, ඔබට මෙහි වාදයක් හටගත් කල විරුද්ධ පිරිස මෙහෙය වන්නෙක් නැත්මය." ඒ දෘෂ්ටි ගතිකයෝ ඔබට වාදයෙන් වාදය විග්‍රහයෙන් විග්‍රහය ප්‍රතිකර්මයෙන් ප්‍රතිකර්මය විශෙෂයෙන් විශෙෂය. ප්‍රතිවිශෙෂයෙන් ප්‍රතිවිශෙෂය වෙලීමෙන් වෙලීම ලිහීමෙන් ලිහීම සිඳීමෙන් සිඳීම කියත් නම් හෝ ඔවුහු ඔබට විරුද්ධ ශූරය, විරුද්ධ පුරුෂය, විරුද්ධ සතුරුය. ප්‍රතිමල්ලයයි කියත්.

3 "මෙහි ඔබට වාදයක් හටගත් කල්හි විරුද්ධ පිරිස මෙහෙයවන්නෙක් නොවේමය." වාදය උපන් කල්හි ඇතිවූ කල්හි පහළවූ කල්හි කළහ කරන්නේය. ඩබර කරන්නේය. විග්‍රහ කරන්නේය. විවාද කරන්නේය. තොපට එය නැත. විද්‍යමාන නොවෙත්. නොලැබෙත් ප්‍රහීණය සින්දේය. ඉපදීමට නුසුදුසුය. ඥානය නැමැති ගින්නෙන් දවනලදී. ඉපදීමට අයොග්‍ය කෙළේය.

## 8 - 10

1 "යමෙක් විරුද්ධ පිරිස් දුරුකොට හැසිරෙත්" යන්නෙහි සේනා යනු මාර සේනාවට කියයි. කාය දුශ්චරිතය මාර සේනාවකි. වචී දුශ්චරිතය මාර සේනාවකි. මනො දුශ්චරිතය මාර සේනාවකි. ලොභය, ද්වෙෂය; මොහය, ගුණමකුකම දොස්කීම, ඊර්ෂ්‍යාව, මසුරුකම, රැවටිල්ල, කෛරාටිකකම තද ගතිය, එකට එක කිරීම, මානය, අතිමානය, මදය ප්‍රමාදය සියලු කෙලෙස්, සියලු දුශ්චරිත, සියලු විවාද, සියලු දැවීම්, සියලු තැවීම්, සියලු අකුශල් රැස්කිරීම් මාර සේනාවෝය මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරණලදී. කාමයෝ ඔබගේ ප්‍රථම සේනාවෝය. කුශල ධර්මයන්හි නොඇල්ම දෙවන සේනාවය. 4-6 (1 අග කොටස හා එහි 2 ඡේදය යෙදිය යුතුයි.)

දිනා සැපත ලබයි. යම්හෙයකින් සතර ආර්‍ය්‍ය මාර්ගයෙන් සියලු මාරසේනාවෝ සියලු විරුද්ධ කෙලෙස් දිනන ලදී. බිඳිනලදී. පිටු දක්නාලදී. එහෙයින් විරුද්ධ සේනා දුරුකොට යයි කියයි. යම් කෙනෙක් යනු අර්හත් ක්ෂීණාශ්‍රවයෝ යනුයි.

2 “හැසිරෙත්” යනු හැසිරෙත්. වාසය කරත්, ඉරියව් පවත්වත්. පාලනය කරත්. යැපෙත් යනුයි. “දෘෂ්ටීන්ගෙන් දෘෂ්ටිය වරද්දා නොගත්තාහු” යනු යම් කෙනෙකුගේ දෙසැට දෘෂ්ටීහු ප්‍රහීණවූවාහුද බිඳුනාහු සංසිඳුනාහු ඉපදීමට අයොග්‍ය කළාහු ඥානය නමැති ගින්නෙන් දැවුවාහු වෙත්ද, ඔවුහු දෘෂ්ටීන්ගෙන් දෘෂ්ටිය විරුද්ධව නොගන්නාහු ප්‍රතිවිරුද්ධව නොගන්නාහු දෘෂ්ටියෙන් දෘෂ්ටිය නොඋපන්නාහු වෙත් යනුයි. පසුරය ඔබ, ඔවුන් අතර කිසිවක් ලබන්නේද යනු ඒ අර්හත්වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේලා කෙරෙහි විරුද්ධ ශූරයෙකු විරුද්ධ පුරුෂයකු විරුද්ධ සතුරකු ප්‍රතිමල්ලවයකු කිම ලැබේද?

3 “යමකුන්ට මෙහි උතුම්යයි ගන්නා ලද්දක් නැද්ද” යම් ඒ අර්හත්වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේලාට මෙය උතුම්ය, අග්‍රය, ශ්‍රෙෂ්ඨය ඉතා උතුම්ය. ප්‍රමුඛයයි පිළිගන්නා ලද්දක් පරාමර්ශවූවක් බැසගන්නා ලද්දක් ඇලීම ඇති දෙයක් නැත. විද්‍යමාන නොවෙත්. නොලැබෙත්. ප්‍රහීණවූයේය, සිඳුනේය, සංසිඳුනේය, ඉපදීමට අයොග්‍යවූයේය. ඥානය නමැති ගින්නෙන් දැවුනේය.

## 8 - 11

1 “ඉක්බිති ඔබ තද විතර්කයට පැමිණියෙහිය” යන්නෙහි ‘ඉක්බිති’ යනු පද සන්ධියකි. පද ගැලපීමකි පදපූරණයකි. සුබොච්චාරණය පිණිස යෙදූවකි. තද විතර්කයට පැමිණියෙහිය” යනු කල්පනා කරන්නේ විතර්ක කරන්නේ යනුයි. (කෙසේද) මට ජය අත්වන්නේද, මට පරාජය අත්වන්නේද, කෙසේ නිග්‍රහ කරන්නෙම්ද, කෙසේ ප්‍රතිකර්ම කරන්නෙම්ද, කෙසේ විශෙෂයක් කරන්නෙම්ද කෙසේ අවුල් කරන්නෙම්ද, කෙසේ නිරවුල් කරන්නෙම්ද, කෙසේ සිඳින්නෙම්ද, කෙසේ වටකරන්නෙම්දැයි මෙසේ තර්ක කරන්නේ විතර්ක කරන්නේ කල්පනා කරන්නේ

මා සමග ආාවෙහිය, එළෙඹියෙහිය, පැමිණියෙහිය යනුයි. "සිතින් දෘෂ්ටි විශෙෂයන් සිතන්නේ" යන්නෙහි යම් සිතක් 'මන' 'මනායතන' 'මනින්ද්‍රිය' 'විඤ්ඤාණ' 'විඤ්ඤාණක්ඛන්ධ' 'තජ්ජා' මනො විඤ්ඤාණ ධාතු යන නම් වේද ඒ සිතින් දෘෂ්ටිය සිතන්නේ කල්පනා කරන්නේ කෙසේද, ලොකය හැමදා පවත්නේය, හැමදා නොපවත්නේය. ඒ ජීවයයි, ඒ ශරීරයයි. අනිකෙක් ජීවයය අනිකක් ශරීරයයි. සත්වයා මරණින් මතු නොමවෙයි. නොම නොවෙයි යනුවෙනි.

2 "පිරිසිදු වූවහු හා තරගයට පැමිණෙව, ඔබ තරග කරන්නට අසමර්ථ වෙහිය" යන්නෙහි පිරිසිදුවූවහුයයි ප්‍රඥාවටකියයි. (ii) යම්ප්‍රඥාවක් පජානන මනා දැනීමක් ඇත්තේ අමොහය, ධම්මවිචය, සම්‍යක් දෘෂ්ටියයි කියත්ද එයයි. කවර කරුණකින් ප්‍රඥාවට ධොන (පිරිසුදුකම) කියත්ද, ඒ ප්‍රඥාවෙන් (iv) කාය දුශ්චරිතය දුරුකරණ ලද්දේද සෝදන ලද්දේද (v) වාග් දුශ්චරිතය (මෙහි (iv) යොදන්න) සියලු අකුශල් රැස් කිරීම් දුරුකරණ ලද්දේද සෝදන ලද්දේද යලිදු (vi) සම්‍යක් දෘෂ්ටියෙන් මිථ්‍යාදෘෂ්ටිය සම්‍යක් සංකල්පයෙන් මිථ්‍යා සංකල්ප (3-7) (1 සම්‍යක් සංකල්පයෙන් යනතැන සිට විමුක්තිය යන තැනට යොදාගත යුතුයි) සම්‍යක් විමුක්තියෙන් මිථ්‍යා විමුක්තිය දුරුකරණ ලද්දේද සෝදන ලද්දේද යලිදු ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයෙන් සියලු කෙලෙස් සියලු දුසිරිත් සියලු පීඩා සියලු දැවිලි, සියලු තැවිලි සියලු අකුශල රැස්කිරීම් දුරුකරණ ලද්දේද සෝදන ලද්දේද වෙයි. භාග්‍යවතුන් වහන්සේ මේ සියලු ධොන ධර්මයන්ගෙන් යුක්තවූසේක. එබැවින් භාග්‍යවතුන් වහන්සේ 'ධොන' නම් වන සේක. උන්වහන්සේ දුරුකළ රාග ඇත්තේ දුරුකළ පාප ඇත්තේ දුරුකළ ක්ලේශ ඇත්තේ දුරුකළ දොස ඇත්තේද වෙති එබැවින් ධොන නම්.

3 "පිරිසුදු වූවහු හා තරගයට එක්වෙව, ඔබ තරග කරන්නට අසමර්ථවෙහිය" යනු පසූර පරිබ්‍රාජකතෙම ධොනයෙන් යුත් බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ සමග දෙපිළක්ව තරගකිරීමට සාකච්ඡා කිරීමට සුදුසු නොවේ. එයට හේතු කවරේද? පසූර පරිබ්‍රාජකතෙම (ii) හීනය, නිහීනය, ලාමකය.

ඒ භාග්‍යවතුන් වහන්සේ අග්‍රවූයේද ශ්‍රේෂ්ඨ වූයේද ප්‍රමුඛවූයේද උත්තම වූයේද ප්‍රවර වූයේද වෙයි. යම්සේ හාවා මතැ'තකු සමග දෙපිළක්ව තරග කරන්නට ශක්ති ඇත්තේ නොවේ. යම්සේ හිවලා මෘගරාජවූ සිංහයා සමග දෙපිළක්ව තරග කරන්නට ශක්ති ඇත්තේ නොවේ. යම්සේ දෙන අනුව යන ළමා වස්සා ලොකු ගොනෙකු සමග දෙපිළක්ව තරග කරන්නට ශක්ති ඇත්තේ නොවේ. යම්සේ කවුඩා විනතාවගේ දරුවූ ගුරුළා සමග දෙපිළක්ව තරගකරන්නට ශක්ති ඇත්තේ නොවේ. යම්සේ චණ්ඩාලයා චක්‍රවර්ති රජු සමග දෙපිළක්ව තරග කරන්නට ශක්ති ඇත්තේ නොවේ. යම්සේ පාංශු පිසාචයා සක්දෙව් රජු සමග දෙපිළක්ව තරග කරන්නට ශක්ති ඇත්තේ නොවේ.

මෙපරිද්දෙන්ම පසුර පරිබ්‍රාජකයා ධොනයෙන් යුත් චතුරාර්‍ය්‍ය සත්‍යය අවබොධ කළ භාග්‍යවතුන් වහන්සේ සමග දෙපිළක්ව තරග කරන්නට සාකච්ඡා කරන්නට හිඳින්නට ශක්තියක් ඇත්තේ නොවේ. එයට හේතුකවරේද පසුර පරිබ්‍රාජකයා හීන ප්‍රඥා ඇත්තෙකි. නිහීන ප්‍රඥා ඇත්තෙකි. පහත් ප්‍රඥා ඇත්තෙකි. ලාමක ප්‍රඥා ඇත්තෙකි. ස්වල්ප ප්‍රඥා ඇත්තෙකි. ඒ භාග්‍යවතුන් වහන්සේ මහා ප්‍රඥා ඇත්තෙකි. බොහෝ ප්‍රඥා ඇත්තෙකි හාසු ප්‍රඥා ඇත්තෙකි. ජවන ප්‍රඥා ඇත්තෙකි. තීක්ෂණ ප්‍රඥා ඇත්තෙකි. නිබ්බෙධික ප්‍රඥා ඇත්තෙකි. ප්‍රඥා ප්‍රභෙදයන්හි දක්ෂයෙකි. ප්‍රභෙදගතවූ ඥාන ඇත්තෙකි. ලැබූ ප්‍රතිසම්භිදා ඇත්තෙකි. සතර විශාරද භාවයට පැමිණි උතුමෙකි. දශ වැදෑරුම් බල දරණ කෙනෙකි. ශ්‍රේෂ්ඨ පුරුෂයෙකි. පුරුෂ සිංහයෙකි. පුරුෂ නාගයෙකි. ආජානීය පුරුෂයෙකි. ප්‍රධානත්වය ඉසිලීමට සුදුසු පුරුෂයෙකි. අනන්තවූ ඥාන ඇත්තෙකි. අනන්තවූ තේජස් ඇත්තෙකි ආඪ්‍යවූ සප්තාර්‍ය්‍ය ධනය ඇති කෙනෙකි. නායකයෙකි. හික්මවන්නෙකි. අනුව හික්මවන්නෙකි. පනවන්නෙකි. වැටහීම් ඇති කරවන්නෙකි. බලවන්නෙකි. පහදවන්නෙකි. ඒ භාග්‍යවතුන් වහන්සේ නූපන් මග උපදවන්නෙකි. නොදන්නාවූ මාර්ගය හඳුන්වන්නෙකි නොකී මාර්ගය කියන්නෙකි මාර්ගය දත්සේක,

මාර්ගයෙහි දක්ෂසේක. උන්වහන්සේගේ මාර්ගය අනුව පශ්චාත් ශ්‍රමණවූ දැන් ශ්‍රාවකයෝ වාසය කරත්. ඒ භාග්‍යවතුන් වහන්සේ දතයුත්ත දන්නාසේක. දැකියයුත්ත දක්නාසේක. පසැස් ඇත්තේ ඥානයෙන් යුක්තවූයේ බ්‍රහ්මනාමයෙන් යුක්තවූයේ වක්තෘවූයේ අර්ථය දැක්වූයේ අමෘතය දෙන්නේ ධර්මයට ස්වාමිවූයේනුයි උන්වහන්සේ තථාගත නමි.

4 ඒ භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රඥාවෙන් නොදැනගත් දෙයක් නොහැකි දෙයක් ප්‍රත්‍යක්ෂ නොකළ දෙයක් ස්පර්ශ නොකළ දෙයක් නැත. අතීතය, අනාගතය වර්තමානය පටන් සියලු ධර්මයෝ සියලු ආකාරයෙන් චතුරාර්‍ය්‍ය සත්‍යය අවබොධ කරගත් භාග්‍යවතුන් වහන්සේගේ ඥානමුඛය හමුවට පැමිණෙත්. යම්කිසි දැනගතයුතු ධර්මයක් දැනගත යුතුව ඇද්ද අත්වැඩ පිණිස හෝ පරවැඩ පිණිස අත්වැඩ පරවැඩ දෙකම පිණිස හෝ මෙලොව අර්ථය පිණිස හෝ පරලොව අර්ථය පිණිස හෝ නොගැඹුරු අර්ථය පිණිස හෝ ගැඹුරු අර්ථය පිණිස හෝ සැඟවූ අර්ථය පිණිස හෝ වැසුන අර්ථය පිණිස හෝ පැමිණිය යුතු අර්ථය පිණිස හෝ පැමිණෙනලද අර්ථය පිණිස හෝ වැරදි නොවන අර්ථය පිණිස හෝ කෙලෙස් නැති අර්ථය පිණිස හෝ පිරිසිදු අර්ථය පිණිස හෝ පරමාර්ථය පිණිස හෝ වෙයි. ඒ සියල්ල බුද්ධ ඥානයෙහි ඇතුළත්වෙයි. බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේගේ සියලු කාය කර්මය ඥානයෙහි ඇතුළත්වෙයි. සියලු වාක්කර්මය ඥානයෙහි ඇතුළත් වෙයි සියලු මනස් කර්මය ඥානයෙහි ඇතුලත්වෙයි. බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේගේ අතීතයෙහි ඥානය නොමඩිනලදී. අනාගතයෙහි ඥානය නොමඩිනලදී. පවත්නා කාලයෙහි ඥානය නොමඩිනලදී. දතයුතු දෙය යම් පමණද ඥානයත් එපමණය ඥානය යම් පමණක්ද දතයුතු දෙයත් එපමණය. ඥානය දතයුතු දෙය කෙළවරකොට ඇත්තේය. දතයුතුදෙය ඥානය කෙළවර කොට ඇත්තේය. දතයුතු දෙය ඉක්මවා ඥානය නොපවතියි. ඥානය ඉක්මවා දතයුතු දෙයක් නැත. ඒ ධර්මයෝ ඔවුනොවුන් සමසේ කෙළවරෙහි සිටියෝ වෙත්. යම්සේ පෙට්ටියක මනාකොට එකට සිටි පියන් දෙක යටි පියන උඩු

පියන නොඉක්මවාද උඩුපියන යටිපියන නොඉක්මවාද ඔවුනොවුන් කෙළවරකොට ඇත්තේවේද, එපරිද්දෙන්ම බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේගේ දතයුතු දෙයද ඥානයද ඔවුනොවුන් සමසේ කෙළවර ඇත්තේවේ. දතයුතු දෙය යම් පමණද ඥානයද එපමණය. ඥානය යම්පමණද දතයුතු දෙයත් එපමණය. ඥානය දතයුතු දෙය කෙළවරකොට ඇත්තේය. දතයුතු දෙය ඥානය කෙළවරකොට ඇත්තේය. දතයුතු දෙය ඉක්මවා ඥානය නොපවතියි. ඥානය ඉක්මවා දතයුතු දෙය නොපවතියි. ඒ ධර්මයෝ ඔවුනොවුන් සමසේ කෙළවර ඇත්තෝ වෙත්.

**5** බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේගේ ඥානය සියලු ධර්මයන්හි පවතියි. සියලු ධර්මයෝ බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේගේ ආවර්ජනයට බැඳුනේ වෙයි. බලාපොරොත්තුවට බැඳුනේ වෙයි. සිහි කිරීමට බැඳුනේ වෙයි. චිත්තොත්පාදයට බැඳුනේ වෙයි. සියලු සත්වයන් කෙරෙහි බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේගේ ඥානය වෙයි බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ සියලු සත්වයන්ගේ වාසස්ථාන දනියි. අප්‍රකටව පවත්නා රාග ද්වෙෂාදිය දන්නාසේක. චරිත දනියි මිදීම දනියි. ස්වල්ප කෙලෙස් ඇති මහා කෙලෙස් ඇති තීක්ෂණවූ ඉන්ද්‍රිය ඇති, මෘදු ඉන්ද්‍රිය ඇති, යහපත් ආකාර ඇති නපුරු ආකාර ඇති මනාකොට හඳුන්වන සුදුසු නුසුදුසු සත්වයන් දන්නාසේක. දෙවියන් සහිත මරුන් සහිත, බඹුන් සහිත ලෝකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත ප්‍රජාව දෙව් මිනිස්සු බුද්ධ ඥානය ඇතුලත පරිවර්තනය වෙයි යම්සේ මහා සමුද්‍රය ඇතුළත තිමිංගලයන්ගේ පටන් යටත්පිරිසෙයින් මස් කැස්බෝ පවා පරිවර්තනය වෙත්ද, එපරිද්දෙන්ම දෙවියන් මරුන් බඹුන් සහිත ලෝකය, ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත ප්‍රජාව දෙව් මිනිස්සු බුද්ධ ඥානය ඇතුළත පරිවර්තනය වෙයි. යම්සේ ගුරුලාගේ පටන් යටත්පිරිසෙයින් කුඩාපක්ෂිහුපවා අහසේ පෙදෙසක පරිවර්තනය වෙත්ද එපරිද්දෙන්ම යම් බඳුවූ ශාරීපුත්‍රයන්වහන්සේ සමාන ඥානයෙන් යුක්තවූ ඔවුහුද ඒ බුද්ධ ඥානයාගේ ප්‍රදෙශයක පරිවර්තනය වෙයි. බුද්ධ ඥානය දෙව්මිනිසුන්ගේ නුවණ පැතිර මැඩසිටීමය. යම් ඒ නිපුණවූ කරණ ලද පරප්‍රවාද ඇති ඒ පරප්‍රවාදයන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

විදීමෙන් ඇස් ලොම් අග පැලීම සේ විදින සියුම් නුවණ ඇති යම් ඒ ක්ෂත්‍රිය පණ්ඩිතයෝ වෙද්ද, බ්‍රාහ්මණ පණ්ඩිතයෝ වෙත්ද, ගෘහපති පණ්ඩිතයෝ වෙද්ද, ඔවුහු සැඟවුනාවූද, වැසුනාවූද, ප්‍රශ්නයන් නිපදවාගෙන තථාගතයන් වහන්සේ වෙත පැමිණ විචාරත්. ඒ ප්‍රශ්නයෝ භාග්‍යවතුන් වහන්සේ විසින් දක්නාලද කරුණු වෙත්. කියනලද්දේ විචාරණ ලද්දේමය. ඒ අදහස් බහා තබා ඔවුහු භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණෙත්. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එහි යම් ඒ ප්‍රඥාවෙන් අතිශයින් බබළයි.

## මාගන්දිය සූත්‍ර නිර්දෙශය

### 9 - 1

1 "තෘෂ්ණා, අරතී, රගා, යන මුන් දැකද මෛථුනයෙහි ආශාමාත්‍රයකුදු නොවීද" යනු තණ්හා, අරතී, රගා යන මාර දූවරු දැක මෛථුන ධර්මයෙහි ආශාවක් හෝ රාගයක් හෝ ප්‍රේමයක් හෝ නොවීය" මළ මුත්‍රයෙන් පිරුණු මෙය කිමෙක්ද පයින්වත් ස්පර්ශ කරන්නට හෝ නොකැමැත්තෙමි." යන්නෙහි කිමෙක්ද, මේ ශරීරය මුත්‍රයෙන් පිරුණේය. අශුචියෙන් පිරුණේය. සෙම්වලින් පිරුණේය. ලෙයින් පිරුණේය. ඇටවලින් ගැලපුනේය. නහරවලින් සම්බන්ධ වූයේය. ලේ මසින් ආලොපිතය. සමින් වැසුනේය. සිදුරුවලින් යුක්තය, වැගිරෙණ පණු සමූහයාගෙන් ගැවසුනේය. නොයෙක් කසලවලින් පිරුණේය. පයින් ස්පර්ශ කරන්නට නොකැමැත්තෙමි යනුයි

### 9 - 2

1 "බොහෝ රජුන් විසින් පතනලද මෙබඳු ස්ත්‍රීරත්නය නොකැමැත්තෙහිද, ජීවිතය විශ්වාසයක් සහිතද, සිල්වත්ද, සසර උත්පත්තියද කොහොමදැයි කියන්න.

(මේ ගාථාවට නිර්දෙශයක් දක්වා නැත. මෙයට මුලින් ගාථා නිර්දෙශයේ අග කොටසෙහි පෙණෙන ඡේදයක් පමණක් මෙහි පෙණේ.)

2 "මිනිසා යම්දිව්‍යවූ කාමයක් ප්‍රාර්ථනා කරන්නේ මිනිසුන්ට අයත් කාමයන් නොකැමැති වන්නේ නම් එය පුදුමයක් නොවේ. ඔබ යම්බඳු ඒ දෙකම නොකැමැත්තෙහිය. ප්‍රාර්ථනා නොකරන්නෙහිය. කැමති නොවන්නෙහිය. ඔබගේ දර්ශනය කුමක්ද, කවර දෘෂ්ටියකින් යුක්ත වූයෙහිද?' යනුයි.

## 9 - 3

1 "මෙය කියම්යි ඔහුට සිතක් නැත" යන්නෙහි 'ඉදං වදාමි' යනු මෙය කියමි. මෙපමණ කියමි, මෙපමණකින් කියමි මේ දෘෂ්ටි ග්‍රහණය කියමි. ලොකය ශාස්වතයයි කියා හෝ (3-2) 1 (iii) ඡේදය යෙදිය යුතුයි) සත්වයා මරණින් මතු නොමවෙයි, නොම නොවෙයි. "ඔහුට නොවේ යනු මට නොවෙයි, ඔහුට නොවේයයි" මෙපමණකින් කියමි.

2 "මාගන්දියයි භාග්‍යවත්තෙමේ වදාළේය" යනු ඒ බ්‍රාහ්මණයාට නාමයෙන් ආමන්ත්‍රණය කරයි.

"භාග්‍යවත්" යනු ගෞරව වචනයයි. (මෙහි 7-2 (1) 'භාග්‍යවතුන් වහන්සේ' යන තැන සිට 'පැනවීමකි' යන තැනට යොදාගත යුතුයි.) "ධර්මයන්හි පිළිගන්නාලද්ද නිශ්චය කරන්නේය" යන්නෙහි "ධර්මයන්හි" යනු දෙසැට දෘෂ්ටිගත ධර්මයන්හි නිශ්චය කරන්නේය නිශ්චයට බැස විනිශ්චයට බැස සොයා විශෙෂයෙන් සොයා සමකොට බලා තීරණය කොට ප්‍රකට කොට සීමා කොටගෙන, කොටස් කොට ගෙන, රැස් කිරීම කොට, කැටිකොටගෙන මෙය සත්‍යය, සිදුවූ පරිදිය, වූදෙයය, නොවෙනස්යයි ගන්නා ලද්දක් පරාමර්ශ කරණ ලද්දක් බැසගන්නා ලද්දක් ඇලෙන ලද්දක් නැත. විද්‍යමාන නොවෙත්. නොලැබෙත්. ප්‍රහීණය, මුලින් සිඳුනේය, සංසිඳුනේය, ඉපදීමට අයොග්‍යය, ඥානය නමැති ගින්නෙන් දැවුනේය, යනුයි " දෘෂ්ටීන් නොගැනීම පිණිස බලන්නේ" යනු දෘෂ්ටීන්හි ආදීනවයන් දක්නේ දෘෂ්ටීහු නොගනිම්. පරාමර්ශ නොකරම්, එහි ඇතුළු නොවෙමි. යලිදු හෝ නොගත යුතුය. පරාමර්ශ නොකටයුතුය, ඇතුළු නොවිය යුතුයයි හෝ යලිදු ලොකය ශාශ්වතය මෙයම සත්‍යය, අනික් දේ හිස්ය, මේ දෘෂ්ටිගැන්ම

අවබොධය, දෘෂ්ටි කාන්තාරය, නපුරු කටුව, දෘෂ්ටි කම්පාව, දෘෂ්ටි බන්ධනය, දුක් සහිතය, කරදර සහිතය, දැවිලි සහිතය, කලකිරීම පිණිස නොවේ. විරාගය පිණිස නොවේ. විශෙෂ දැනීම පිණිස නොවේ. සංසිඳීම පිණිස නොවේ. අවබොධය පිණිස නොවේ, නිර්වාණය පිණිස නොපවතීයයි බලන්නේ දෘෂ්ටීන් නොගනිමි, පරාමර්ශ නොකරමි. යලිදු නොගත යුතුය. පරාමර්ශ නොකට යුතුය, ඇතුළු නොවිය යුතුය. යලිදු ලෝකය අශාස්වතය, ලෝකය කෙළවරක් ඇත්තක, ලොකය කෙළවරක් නැත්තක, ඒ ජීවයයි ඒ ශරීරයයි, අනිකක් ජීවය අනිකක් ශරීරයයි. සත්වයා මරණින් මතු වෙයි, සත්වයා මරණින් මතු නොවෙයි, සත්වයා මරණින් මතු නොමවෙයි, නොම නොවෙයි මෙයම සත්‍යය, අනික් දේ හිස්යයි මේ දෘෂ්ටිගැන්ම අවබොධය, දෘෂ්ටිකාන්තාරය, නපුරු කටුව, දෘෂ්ටිකම්පාව, දෘෂ්ටිබන්ධනය, දුක් සහිතය, කරදර සහිතය, දැවිලි සහිතය, කළකිරීම පිණිස නොවේ විරාගය පිණිස නොවේ. විශෙෂ දැනීම පිණිස නොවේ සංසිඳීම පිණිස නොවේ. අවබොධය පිණිස නොවේ නිර්වාණය පිණිස නොපවතීයයි දෘෂ්ටීන්හි ආදීනව දක්නේනම් දෘෂ්ටිය නොගනිමි, පරාමර්ශ නොකරමි, ඇතුළු නොවෙමි, යලිදු නොගත යුතුය. පරාමර්ශ නොකට යුතුය. ඇතුළු නොවිය යුතුයයි යනුයි.

යලිදු මේ දෘෂ්ටීහු නිරයට හේතුය, තිරිසන් යෝනියට හේතුය, ප්‍රෙත විෂයට හේතුයයි මෙසේ දෘෂ්ටීන්හි ආදීනවයන් දක්නෙ දෘෂ්ටීන් නොගනිමි, පරාමර්ශ නොකරමි, ඇතුළු නොවෙමි, යලිදු නොගත යුතුය, පරාමර්ශ නොකට යුතුය. ඇතුළු නොවිය යුතුය. යලිදු මේ දෘෂ්ටීහු අනිත්‍යය, සංඛතය, හේතුවකින් උපන්නේය, ක්ෂය ධර්මයෙක, ව්‍යය ධර්මයක, විරාග ධර්මයක, නිරොධ ධර්මයෙකැයි දෘෂ්ටීන්හි ආදීනව දක්නෙ දෘෂ්ටීන් නොගනිමි, පරාමර්ශ නොකරමි, ඇතුළු නොවෙමි. යලිදු නොගත යුතුය. පරාමර්ශ නොකට යුතුය, ඇතුල් නොවිය යුතුය යනුයි

3 "සිතේ සැනසීම සොයන්නේ නොදිටිමි" යන්නෙහි සිතේ සැනසීම යනු අධ්‍යාත්මයෙහිවූ රාගයාගේ ශන්තිය, ද්වෙෂයාගේ

ශාන්තිය, මොහයාගේ ශාන්තිය, ක්‍රොධයේ බද්ධ වෛරයේ, ගුණමකුකමේ, දොස්කීමේ, ඊර්‍ෂ්‍යාවේ, මසුරුකමේ රැවටිල්ලේ කෛරාටිකකමේ, තදකමේ, එකට එක කිරීමේ, මානයේ අති මානයේ, මදයේ ප්‍රමාදයේ සියලු කෙලෙස්වල, සියලු දුශ්චරිතවල, සියලු පීඩාවන්හි, සියලු දාහයන්හි. සියලු සන්තාපයන්හි සියලු අකුශල රැස්කිරීම්වල ශාන්තිය, ව්‍යපසමනය, මිදීම, සංසිඳීම යනුයි. "සොයත්" යනු සොයන්නේ සමකොට බලන්නේ, තීරණය කරන්නේ කිරන්නේ ප්‍රකට කරන්නේ යනුයි. "නොදිටිමි" යනු නොදැකීමි, නොබැලුවෙමි, ප්‍රතිවෙධ නොකළෙමි යනුයි.

## 9 - 4

1 "කල්පනා කළ යම් විනිශ්චයයෝ" යන්නෙහි දෙසැට දෘෂ්ටි ගැනීම විනිශ්චය යයි කියත්. "කල්පනා කළ" යනු කරණ ලද පිළියෙල කරණ ලද තබන ලද යනුයි යලිදු අනිත්‍යය, සංඛතය, හේතුවකින් උපන්නේය ක්ෂය ධර්මයක, ව්‍යය ධර්මයක, විරාග ධර්මයක, නිරොධ ධර්මයක, විපරිනාම ධර්මයෙකැයි යනුයි "යයි මාගන්දියතෙමේ" යන්නෙහියයි යනු පදසන්ධියයි. පද එකතුකිරීමයි. පද පූරණයයි, සුබොච්චාරණයට යෙදීමයි. "මාගන්දිය" යනු ඒ බ්‍රාහ්මණයාගේ නාමයයි, පැනවීමයි, ව්‍යවහාරයයි.

2 "සිත සැනසීමය යන මේ යහපතක් වේද ඒවා ඒකාන්තයෙන් මුනිතෙම කියන්නේය" යන්නෙහි 'ඒවා' 'ඒකාන්තයෙන්' යනු දෙසැට දෘෂ්ටි ගතුවෝයි 'මුනි' යන්නෙහි මොනයයි ඥානයට කියයි මෙහි (2-8) 10 'මුනි' යන තැන සිට 14 ඡෙදය අවසන් කොට යොදාගත යුතුයි.) තෘෂ්ණාජාලය ඉක්මවා සිටියේනුයි හෙතෙම මුනි නම්. "අනුග්‍රහය පිණිස" යන්නෙහි දෘෂ්ටීන්හි ආදීනව දක්නේ දෘෂ්ටීන් නොගනිමි. පරාමර්ශ නොකරමි, ඇතුල් නොවෙමියි කීයෙහිය, අධ්‍යාත්මයෙහි ශාන්තිය ඇත්තේයයිද කීයෙහිය.

3 "යම් මේ අදහසක්" යනු යම් පරමාර්ථයක් යනුයි. කෙසේ නම් උගතුන් විසින් දන්නා ලද්දේද, 'කෙසේ නම්' යන පදය

සැකය විචාරීම, විමතිය විචාරීම, නොයෙක් විමති විචාරීමයි, මෙසේද මෙසේ නොවේද, කෙසේ වේද, කෙසේ නම් යනුයි. "උගතුන් විසින්" යනු ධීරයන් විසින්, පණ්ඩිතයන් විසින්, ප්‍රඥාවන්තයන් විසින් බුද්ධිමතුන් විසින් යනුයි. "දන්නා ලද්දේය" යනු දන්වන ලදී. කියන ලදී, දෙශනා කරණ ලදී. පණවන ලදී, පිහිටුවන ලදී. බෙදන ලදී, විස්තර කරණ ලදී, ප්‍රකාශ කරණ ලදී යනුයි.

4 දෘෂ්ටියෙන් නොව, ශ්‍රැතයෙන් නොව, ඥාණයෙන් නොව, යනු දෘෂ්ටියෙන් ශුද්ධිය විශුද්ධිය, පාරිශුද්ධිය, මුක්තිය, විමුක්තිය, නොකීවේය. ප්‍රකාශ නොකෙළේය ශ්‍රැතයෙන්ද, ශුද්ධිය, විශුද්ධිය, පාරිශුද්ධිය, මුක්තිය, විමුක්තිය නොකීවේය. දෘෂ්ටියෙන්ද, ශුද්ධිය, විශුද්ධිය, මුක්තිය, විමුක්තිය, නොකීවේය. ඥානයෙන්ද ශුද්ධිය විශුද්ධිය, පාරිශුද්ධිය මුක්තිය විමුක්තිය නොකීවේය යනුයි.

5 "භාග්‍යවතුන් වහන්සේ මාගන්දිය කියා" යනු ඒ බ්‍රාහ්මණයාට නාමයෙන් ආමන්ත්‍රණය කරයි. භගවා යනු ගෞරව වචනයයි. (මෙහි (7-2) 1 භාග්‍යවතුන් වහන්සේ යනතැනසිට 'පැනවීමකි' යනතැනට යොදාගත යුතුයි)

6 "ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ ශුද්ධිය නොකීය" යන්නෙහි ශීලයෙන්ද, ශුද්ධිය, විශුද්ධිය, පාරිශුද්ධිය, මුක්තිය, විමුක්තිය, පරිමුක්තිය, නොකීවේය. ව්‍යවහාර නොකෙළේය ව්‍රතයෙන්ද, ශුද්ධිය, විශුද්ධිය, පාරිශුද්ධිය, මුක්තිය, විමුක්තිය, පරිමුක්තිය, නොකීවේය ව්‍යවහාර නොකෙළේය. යනුයි.

7 "දැකීමෙන්, ඇසීමෙන්, නුවණින්, සීලයෙන් වත් පිළිවෙතින් යන එයින් තොරව නොවේමය" යන්නෙහි, දැකීම යනු දශ වස්තුක සම්‍යක්දෘෂ්ටිය කැමති විය යුතුයි. දුන් දෙයෙහි පල ඇත. පරිත්‍යාග කළ දෙයෙහි විපාක ඇත. පිදූ දෙයෙහි විපාක ඇත කරණලද හොඳ නොහොඳ කර්මයන්හි විපාක ඇත. මේ ලොව ඇත. පරලොව ඇත. මව ඇත. පියා ඇත. ඖපපාතික සත්වයෝ ඇත. යම් කෙනෙක් තුමූ මේ ලොවද,

පරලොවද, මනාකොට දැන ප්‍රත්‍යක්ෂ කරත්ද යහපත්වූ සම්‍යක්ප්‍රතිපදාව ගන්නාවූ යහපත්සේ පිළිපදින්නාවූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ලෝකයෙහි ඇත්තාහ. සූත්‍රය, ගෙය්‍යය, වෙය්‍යාකරණය, ගාථාය උදානය, ඉතිවුත්තකය, ජාතකය, අබ්භූත ධර්මය, වෙදල්ලය, ඇසීමද කැමතිවිය යුතුයි. කම්මස්සකතා ඥානය, සච්චානුලොමික ඥානය, අභිඥා ඥානය, සමාපත්ති ඥානය, යන ඥානයද, කැමතිවිය යුතුය. ශීලයද කැමතිවිය යුතුයි. එනම් ප්‍රාතිමොක්ෂ සංවර ශීලයයි. ව්‍රතයද, කැමතිවිය යුතුයි. එනම් අෂ්ටධුතාංගයෝයි. එනම්, ආරඤ්ඤිකාංගය, පිණ්ඩපාතිකාංගය, පංශුකූලිකාංගය, තෙචීවරිකාංගය, සපදාන චාරිකාංගය, ඛලුපච්ඡා භක්තිකාංගය, නෙසජ්ජිකාංගය, යථාසන්තතිකාංගය, යනුයි.

8 "දැකීමෙන්, ඇසීමෙන්, දැනීමෙන්, ශීලයෙන් වත් පිළිවෙතින් යන එයින් තොරව නොවේ" යන්නෙහි සම්‍යක් දෘෂ්ටි මාත්‍රයෙන් නොවේ. ඇසීම් මාත්‍රයෙන් නොවේ. ඥානමාත්‍රයෙන් නොවේ. ශීල මාත්‍රයෙන් නොවේ. ව්‍රත මාත්‍රයෙන් නොවේ. අධ්‍යාත්ම ශාන්තියට පැමිණියේ වෙයි. මේ ධර්මයන් හැර අධ්‍යාත්ම ශාන්තියට නොපැමිණෙයි. මේ ධර්මයෝ අධ්‍යාත්ම් ශාන්තියට පැමිණීමට උපකරණවෙත්.

9 "මොවුන්ද දුරුකොට තදින් නොගෙන" යන්නෙහි 'මොවුන්' යනු කෘෂ්ණ පාක්ෂික ධර්මයන්ගේ මුල් සිඳීමෙන් ප්‍රහාණය කැමති වියයුතුයි. ත්‍රෛධාතුක කුශල ධර්මයන්හි නොකිරීම කැමතිවිය යුතුයි. යම් හෙයකින් කෘෂ්ණපාක්ෂික ධර්මයෝ මුලින් සිඳ දැමූ තල් ගසක් මෙන් කොට අභාවයට පමුණුවා නැවත නූපදීම්බවට පමුණුවා සම්පූර්ණ සිඳදැමීම් වශයෙන් ප්‍රහීණවෙත්ද, ත්‍රෛධාතුක කුශල ධර්මයන්හි නොකිරීම වෙයි. මෙපමණකින්ද නොගණියි. පරාමර්ශ නොකරයි. ඇතුළු නොවෙයි. යලිදු හෝ නොගතයුතුය. පරාමර්ශ නොකටයුතුය. ඇතුළු නොවිය යුතුයි යම්හෙයකින් තෘෂ්ණා දෘෂ්ටි මානයෝ මුලින් සිඳදැමූ තල් ගසක් මෙන් කරණ ලද්දේද, අභාවයට පමුණුවන ලද්දේද, නැවත නූපදීම්බවට

පමුණුවන ලද්දේද, ප්‍රහීණ වෙත්ද, මෙපමණකින්ද නොගනියි පරාමර්ශ නොකරයි. ඇතුළු නොවෙයි. මෙසේද යනුයි. යම් හෙයකින් පුණ්‍යාභිසංස්කාරයද, අපුණ්‍යාභිසංස්කාරයද, ආනෙඤ්ජාභිසංස්කාරයද මුලින් සිඳදැමූ තල් ගසක් මෙන් කරණලද්දේද, අභාවයට පමුණුවන ලද්දේ නැවත නූපදින බවට පමුණුවන ලද්දේද, ප්‍රහීණ වෙත්ද, මෙපමණකින්ද නොගනියි. පරාමර්ශ නොකරයි. ඇතුළුනොවෙයි. යනුයි.

10 "සන්සිඳුණේ ඇසුරු නොකර භවයෙහි ඇලෙන්නේ නොවේ." යන්නෙහි "සන්සිඳුණේ" යනු රාගය සංසිඳවූ බැවින් 'සන්සිඳුණේ' නම්. ද්වෙෂය සංසිඳවූබැවින් සන්සිඳුණේ නම්. මොහය සංසිඳවූ බැවින් සන්සිඳුණේ නම්. (3-4) 1 ඡේදය ශාන්තවූයේ යන තැනට යෙදිය යුතුයි.

ශාන්තවූ බැවින් සංසිඳවූ බැවින් නිවාදැමූ බැවින් නිවුන බැවින් දුරුකළ බැවින් සන්සිඳුණේනම්. 'ඇසුරු නොකොට' යන්නෙහි නිශ්‍රයෝ දෙදෙනෙකි. තෘෂ්ණා නිශ්‍රයද දෘෂ්ටි නිශ්‍රයද යනුයි. "මමත්වය" වෙනුවට "නිශ්‍රය දුරුකොට" යයි වෙනස්කර (2-6) 1 (ii) (iii) ඡේදය යෙදිය යුතුයි. මේ දෘෂ්ටි නිශ්‍රයයි. තෘෂ්ණා නිශ්‍රය දුරුකොට දෘෂ්ටි නිශ්‍රය බැහැරකොට ඇස ආශ්‍රය නොකොට කණ ආශ්‍රයනොකොට නාසය ආශ්‍රය නොකොට දිව ආශ්‍රයනොකොට ශරීරය ආශ්‍රය, නොකොට සිත ආශ්‍රය නොකොට රූපය, ශබ්දය, ගන්ධය, රසය, ස්පර්ශය, ධර්මය, කුලය, ගණය, ආවාසය, ලාභය, යශස, ප්‍රශංසාව, සැපය, සිවුරු පිණ්ඩාහාර, සෙනසුන්, ගිලන්පස බෙහෙත් පිරිකර, කාම ධාතුව, රූප ධාතුව, අරූපධාතුව, සංඥාභවය, අසංඥාභවය, නෙවසඤ්ඤා නාසඤ්ඤාභවය, එකවොකාරභවය, චතුවොකාරභවය, පඤ්චවොකාර භවය අතීතවූ, අනාගතවූ, පවත්නා කාලයෙහිවූ දැකී, ඇසූ, ඉන්ද්‍රිය තුනකින් ගන්නාලද ධර්මයන් ආශ්‍රය නොකොට නොගෙන පරාමර්ශ නොකොට නොපැමිණ යනුයි කාම භවය ගැන තෘෂ්ණා නූපද වන්නේය. රූපභවය ගැන තෘෂ්ණා නූපදවන්නේය. අරූපභවය ගැන තෘෂ්ණා නූපද වන්නේය.

## 9 - 6

1 "දැකීමෙන් නොවේ, ඇසීමෙන් නොවේ, නුවණින් නොවේ" යනු දෘෂ්ටියෙන්ද ශුද්ධිය, විශුද්ධිය, පාරිශුද්ධිය, මුක්තිය, විමුක්තිය, පරිමුක්තිය, නොකීවේය, ප්‍රකාශ නොකළේය, ව්‍යවහාර නොකළේය, ශ්‍රැතයෙන්ද (ii) ශුද්ධිය විශුද්ධිය, පාරිශුද්ධිය, මුක්තිය, විමුක්තිය, පරිමුක්තිය නොකීවේය. (iii) දෘෂ්ටියෙන් හා ශ්‍රැතයෙන්ද (මෙහි (ii) යොදනු.) ඥානයෙන්ද (මෙහි (ii) යොදනු.) ඉති යනු පද සන්ධියයි. මාගන්දියා යනු ඒ බ්‍රාහ්මණයාගේ නාමයයි

2 "ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ ශුද්ධිය නොකියයි" යනු ශීලයෙන්ද (මෙහි (ii) යොදනු.) ව්‍රතයෙන්ද (මෙහි (ii) යොදනු.) ශීලයෙන් හා ව්‍රතයෙන්ද (මෙහි (ii) යොදනු.) යනුයි.

3 "දැකීමෙන් නොවේ, ඇසීමෙන් නොවේ, නුවණින් නොවේ, ශීලයෙන් නොවේ. ව්‍රතයෙන් යන එයින්ද නොවේ" යන්නෙහි දෘෂ්ටිය කැමති විය යුතුයයි මෙසේ කීයෙහිය, ශ්‍රවණයද කැමතිවිය යුතුයයි මෙසේ කීයෙහිය, ඥානයද කැමතිවිය යුතුයයි මෙසේ කීයෙහිය, සීලයද කැමතිවිය යුතු යයි මෙසේ කීයෙහිය, ව්‍රතයද කැමතිවිය යුතුයයි මෙසේ කීයෙහිය, ඒකාන්තයෙන් කැමැත්ත දෙන්ට (අනුදැනීමට) නොහැක්කෙහිය. ඒකාන්තයෙන් ප්‍රතික්ෂෙප කරන්ට නොහැක්කෙහිය යනුයි.

4 "මම ධර්මය ඉතා මුළාවක් කොට සිතමි" යනු මේ තොපගේ මොමූහ ධර්මයයි බාල ධර්මයයි, මුළා ධර්මයයි, අඥාන ධර්මයයි, අමරා වික්ෂෙප ධර්මයයි. මෙසේ හඟිමි, මෙසේ දනිමි, අවබොධ කර ගනිමි යනුයි

5 "ඇතැමෙක් දෘෂ්ටියෙන් ශුද්ධිය බලාපොරොත්තු වෙත්" යනු ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ශුද්ධිය විශුද්ධිය පාරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය බලාපොරොත්තු වෙත්. ලොකය ශාස්වතය, මෙයම සත්‍යය, අනික හිස්යයි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ දෘෂ්ටියෙන් ශුද්ධිය විශුද්ධිය පාරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය බලාපොරොත්තු වෙත්. ලොකය

අශාස්වතය (3-6) 1 (ii) ඡේදය යෙදිය යුතුයි) නොමවෙයි, නොම නොවෙයි මෙයම සත්‍යය අනික හිස් යයි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ දෘෂ්ටියෙන් ශුද්ධිය විශුද්ධිය පාරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය බලාපොරොත්තු වෙත් යනුයි.

## 9 - 7

1 "දෘෂ්ටීන් නිසා නැවත නැවත විචාරන්නේ" යනු මාගන්දිය බ්‍රාහ්මණතෙමේ දෘෂ්ටිය නිසා දෘෂ්ටිය විචාරයි, ඇලීසිටීම නිසා ඇලී සිටීම විචාරයි. බන්ධනය නිසා බන්ධනය විචාරයි. පළිබොධය නිසා පළිබොධය විචාරයි යනුයි. "නැවත නැවත විචාරන්නේ" යනු නැවත නැවත විචාරයි යනුයි. මාගන්දිය යනු භාග්‍යවතුන් වහන්සේ ඒ බ්‍රාහ්මණයාට නාමයෙන් ආමන්ත්‍රණය කරයි. භාග්‍යවතුන් වහන්සේ යනු ගෞරව වචනයයි. (මෙහි (7-2) 1 'භාග්‍යවතුන් වහන්සේ' යන තැන සිට 'පැණවීමකි' යන තැනට යොදාගත යුතුය)

2 "දැඩිවගත් දෘෂ්ටීන්හි අතිශයෙන් මුළාවට පැමිණියෙහිය" යනු යම් ඒ දෘෂ්ටියක් ඔබ විසින් ගන්නා ලදද, පරාමර්ශ කරණ ලදද ඇලෙන ලදද ගැලෙන ලදද ඔබ ඒ දෘෂ්ටියෙහිම මුළාවූවෙහිය. අඳුරෙහි පැකුලුනෙහිය යනුයි.

3 "මෙයින්ද අණුවක් පමණ සිහි සංඥාවක් නොදුටුවේය" යනු මෙයින් අධ්‍යාත්මික ඇතිවීමෙන් හෝ ප්‍රතිපදාවෙන් හෝ ධර්ම දෙශනාවෙන් හෝ යෙදුන සංඥාව හෝ පැමුණුන සංඥාව හෝ ලක්ෂණ සංඥාව හෝ කාරණ සංඥාව හෝ ඨාන සංඥාව හෝ නොලැබූයෙහිය, ඥානය කොයින්දැයි මෙසේද යනුයි. යලිදු අනිත්‍යය හෝ අනිත්‍ය සංඥාවට අනුලොම්ව හෝ දුක්ඛය හෝ දුක්ඛ සංඥාවට අනුලොම්ව හෝ අනාත්මය හෝ අනාත්ම සංඥාවට අනුලොම්ව හෝ සංඥා උත්පාද මාත්‍රය හෝ සංඥා නිමිත්ත හෝ නොලැබූ ඥානය කොයින්දැයි මෙසේද "මෙයින්ද ස්වල්පවූද සංඥාවක් නොදැක්කේය" යනුයි.

4 "එහෙයින් ඔබ ඉතා මුළා වශයෙන් බලන්නෙහිය" යන්නෙහි එහෙයින් යනු ඒ කාරණයෙන් ඒ හේතුවෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් මොමූහ ධර්මය වශයෙන් බාල

ධර්මය වශයෙන් අඥාන ධර්මය වශයෙන් අමරා වික්ෂෙප ධර්මය වශයෙන් පිළිගත්තෙහිය, බැලූයෙහිය. දැක්කෙහිය. යනුයි

## 9 - 8

1 "යමෙක් සමයයි හෝ විශෙෂයයි හෝ පහත්යයි සිතයිද හෙතෙම එයින් විවාද කරන්නේය" යනු සමාන වෙමියි කියා හෝ ශ්‍රෙෂ්ඨවෙමියි කියා හෝ හීන වෙමියි කියා හෝ යමෙක් සිතාද හෙතෙම ඒ මානයෙන් ඒ දෘෂ්ටියෙන් ඒ පුද්ගලයා සමග කලහ කරන්නේය. භණ්ඩනය කරන්නේය. විග්‍රහ කරන්නේය විවාද කරන්නේය මේගධ කරන්නේය. ඔබ මේ ධර්ම විනය නොදන්නෙහිය, (ii) ඔබ වැරදි මගක් ගත්තෙහිය. මම යහපත් මගට පිළිපන්නේ වෙමි. මම ධර්මයෙන් යුක්තයෙක්මි. ඔබ ධර්මයෙන් යුක්තනුවූයෙහිය. මුලින් කිවයුත්ත පසුව කීයෙහිය පසුව කිවයුත්ත මුලින් කීයෙහිය. ඔබගේ පුරුද්ද නොමගට පෙරලුනේය. ඔබ විසින් වාදය නැගුයෙහිය. නිග්‍රහ කළෙහිය. වාදය ඉදිරි පත්කිරීමට හැසිරෙව (iii) ඉදින් හැකිනම් අවුල හරුව යනුයි.

2 "තුන් මානයන්හි කම්පානොවන්නේ සමය, විශෙෂ යයි ඔහුට හැඟීමක් නොවේ" යනු යමෙකුට මේ මාන තුන ප්‍රහීණවූයේ නම් මුලින් සිඳුනේ නම් ශාන්තවූයේ නම් සංසිඳුනේ නම් ඉපදීමට අයොගෘවූයේ නම් ඥානාග්නියෙන් දැවුයේ නම් හෙතෙම මේ මාන තුනෙහි කම්පා නොවෙයි. කම්පා නොවන පුද්ගලයාට සමානවෙමියි කියා හෝ ශ්‍රෙෂ්ඨවෙමියි කියා හෝ හීනවෙමියි කියා හෝ "ඒ මට නොවේ" යනු මට නොවෙයි යනුයි.

## 9 - 9

1 "ඒ බ්‍රාහ්මණ තෙමේ කුමක් ඇත්තයයි කියන්නේද, යන්නෙහි බ්‍රාහ්මණ යනු ධර්ම සතක් බැහැර කරණ ලද බැවින් බ්‍රාහ්මණ නමි. (ii) (මෙහි (4-3) 1 ඡෙදය බ්‍රාහ්මණ යන තැන සිට යොදාගත යුතුයි.) ආශ්‍රිත නොවූ කෙළෙස් බැහැර කළ හෙතෙම බ්‍රහ්ම නමි."

2 "ඒ බ්‍රාහ්මණ තෙම ඇත්තයයි. කුමක් කියන්නේද යනු ලොකය ශාස්වතය, මෙයම, සත්‍යය, අනික හිස්යයි කිම කියන්නේද? කිම ප්‍රකාශ කරන්නේද? කිම ව්‍යවහාර කරන්නේද, ලොකය අශාස්වතය (3-6) 1 (ii) ඡෙදය යෙදිය යුතුයි) සත්වයා මරණින් මතු නොම වෙයි. නොම නොවෙයි. මෙයම සත්‍යය අනික හිස්යයි බ්‍රාහ්මණ තෙමේ කිම කියන්නේද? කිම ප්‍රකාශ කරන්නේද කිම ව්‍යවහාර කරන්නේද? යනුයි.

3 "හෙතෙම කවරකු සමග බොරුයයි විවාද කරයිද" යනු බ්‍රහ්මණතෙම මාගේම සත්‍යය ඔබගේ මුසාවයයි කවර මානයකින් කවර දෘෂ්ටියකින් කවර පුද්ගලයකු සමග කලහ කරන්නේද? ඩබර කරන්නේද, ආරාවුල් කරන්නේද, විවාද කරන්නේද, කලබල කරන්නේද, ඔබ මේ ධර්ම විනය නොදන්නෙහිය. (මෙහි (9-8) 1 "ඔබ මේ ධර්මවිනය" යනතැන සිට යොදාගත යුතුය.) ඉදින් හැකිනම් අවුලහරුව යනුයි.

4 "යමකු තුළ සමය, විෂමය කියා හෝ කිසිවක් නැද්ද" යන්නෙහි යමෙකු තුළ යනු යම් පුද්ගලයකු කෙරෙහි අර්හත්වූ ක්ෂීණාශ්‍රව කෙනෙකු කෙරෙහි සමාන වෙමියි මානයක් නැත ශ්‍රෙෂ්ඨ වෙමියි මානයක් නැත. හීන වෙමියි අවමානයක් නැත. විද්‍යමාන නොවෙත්. නොලැබෙත්, ප්‍රහීණය මුලින් සිඳුනේය, ශාන්තය සංසිඳුනේය, ඉපදීමට අයොග්‍යය, ඥානය නැමති ගින්නෙන් දැවුනේය.

5 "හෙතෙම කවරකු සමග වාදයෙහි යෙදෙන්නේද" යනු හෙතෙම කවර මානයකින් කවර දෘෂ්ටියකින් කවර පුද්ගලයෙකු සමග වාද කරන්නේද, හැසිරෙන්නේද, කලහ කරන්නේද, ඩබර කරන්නේද, විවාද කරන්නේද, ආරවුල් කරන්නේද, ඔබ මේ ධර්ම විනය නොදන්නෙහිය (මෙහි (9-8) 1 ඔබ මේ ධර්මවිනය යනතැන සිට යොදාගත යුතුයි. අවුලහරුව යනුයි.

## 9 - 10

1 ඉක්බිති හලිද්දකානී" නම් ගෘහපති තෙමේ ආයුෂ්මත් මහා කාත්‍යායනයන් වහන්සේ යම් තැනෙක්හිද එතන්හි පැමුණුනේය. පැමිණ ආයුෂ්මත් මහා කාත්‍යායනයන් වහන්සේ

වැඩ එකත් පසෙක හුන්නේය, එකත් පසෙක හුන්නාවූ හලිද්දකානී ගෘහපතිතෙමේ ආයුෂ්මත් මහා කාත්‍යායනයන් වහන්සේට මෙසේ කීවේය. ස්වාමීනි, මහා කාත්‍යායනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් අෂ්ටක වර්ගයෙහි මාගන්දිය ප්‍රශ්නයෙහි,

> "මුනිතෙමේ වාසස්ථානය අත්හැර (අනිකෙත සාරීව) ගෙදොරක් නැතිව හැසිරෙන්නේ ගමෙහි එක්වීම නොකරන්නේ ඉදිරිපත් නොකිරීම් වශයෙන් කාමයන්ගෙන් හිස්වූයේ වෙයි. කෙසේනම් ජනයා සමග කලහ කරන්නේද"

ස්වාමීනි, කාත්‍යානයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙපයෙන් දෙශනාකරණ ලද මේ භාෂිතයාගේ අර්ථය කෙසේ විස්තර වශයෙන් දැනගත යුතුද, ගෘහපතිය, රූප ධාතුව වනාහි විඤ්ඤානයට වාසස්ථානයයි, රූප ධාතු රාගයෙන් බැඳුන විඤ්ඤානය ඔකසාරීයයි කියයි. ගෘහපතිය, වෙදනා ධාතුව වනාහි ගෘහපතිය, සංඥා ධාතුව වනාහි, ගෘහපතිය, සංස්කාර ධාතුව වනාහි විඤ්ඤානයට වාසස්ථානයයි. සංස්කාර ධාතුරාගයෙන් බැඳුන විඤ්ඤානය වනාහි "ඔකසාරී" යයි කියයි, ගෘහපතිය, මෙසේ වනාහි ඔකසාරී වාසස්ථානයෙහි හැසිරෙන්නේ වෙයි.

2 ගෘහපතිය, කෙසේ වනාහි අනොකසාරී (වාසස්ථානයෙහි නොහැසිරෙන්නේ) වේද, ගෘහපතිය, රූප ධාතුවගේ වනාහි යම් ඡන්දයක් යම් රාගයක් යම් බැඳීමක් යම් තෘෂ්ණාවක් වේද, තෘෂ්ණා දෘෂ්ටිය කියනලද යම් උපායයෝ වෙත්ද, යම් උපාදාන කෙනෙක් වෙත්ද සිත පිළිබඳ යම් අභිනිවේසයෝ වෙත්ද, ඒ කෙලෙස් තථාගතයන් වහන්සේට ප්‍රහීණය, මුලින් සිඳුන තල්ගසක්මෙන් කරණ ලද්දේය. නැවත නූපදීම් වශයෙන් අභාවයට පමුණුවන ලද්දේය. එහෙයින් තථාගතයන් වහන්සේ අනොකසාරී (වාසස්ථානයෙහි නොහැසිරෙන්නේයයි) කියයි. ගෘහපතිය, වෙදනා ධාතුවෙහි වනාහි, ගෘහපතිය, සංඥා ධාතුවෙහි වනාහි, ගෘහපතිය, සංස්කාර ධාතුවෙහි වනාහි ගෘහපතිය, විඥාන ධාතුවෙහි වනාහි යම් ඡන්දයක් ඇත්ද, යම්

රාගයක් ඇත්ද යම් බැඳීමක් ඇද්ද, යම් තෘෂ්ණාවක් ඇද්ද, දැඩිව අල්වා ගැනීමේ සිතින් අධිෂ්ඨානයෙන් බැසගැන්මක් ඇති යම් කෙලෙස් වේද, ඒ කෙලෙස් තථාගතයන් වහන්සේගේ ප්‍රහීණය මුලින් සිඳුන තල්ගසක් මෙන් කරණ ලද්දේය. නැවත නූපදීම් වශයෙන් අභාවයට පමුණුවන ලද්දේය. එහෙයින් තථාගතතෙම අනොකසාරීයයි කියනු ලැබේ ගෘහපතිය, මෙසේ වනාහි අනොකශාරී වෙයි.

3 ගෘහපතිය, කෙසේ වනාහි නිකෙතසාරී (වාසස්ථානයක හැසිරෙන්නේ) වේද, ගෘහපතිය, රූප නිමිත්තෙහි වාසස්ථාන වශයෙන් දැඩිව බැඳීම් "නිකෙතසාරී" යයි කියයි. ශබ්ද නිමිත්තෙහි ගන්ධනිමිත්තෙහි රස නිමිත්තෙහි ස්පර්ශ නිමිත්තෙහි ධර්ම නිමිත්තෙහි වාසස්ථාන වශයෙන් දැඩිව බැඳීම "නිකෙතසාරී" යයි කියයි. ගෘහපතිය මෙසේ වනාහි නිකෙත ශාරීයයි කියයි.

4 ගෘහපතිය, කෙසේ වනාහි අනිකෙතසාරී වේද? රූප නිමිත්තෙහි වාසස්ථාන වශයෙන් දැඩිව බැඳීම තථාගතයන් වහන්සේට ප්‍රහීණය, මුලින් සිඳුන තල්ගසක්මෙන් නැවත නූපදීම් බවට අභාවයට පත් කරණ ලද්දේය. එහෙයින් තථාගතතෙම අනිකෙත සාරීයයි කියයි. ගෘහපතිය, මෙසේ වනාහි "අනිකෙත" සාරීවෙයි.

5 ගෘහපතිය කෙසේ වනාහි ගමෙහි ආශ්‍රය ඇත්තේ වේද, ගෘහපතිය මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක් ගිහින් හා බැඳුනේ වාසය කරයි. සමග සතුටු වන්නේ වෙයි සමග ශොක කරන්නේ වෙයි. සැප ඇතිවූ කල්හි සැපවත් වෙයි. දුක් ඇතිවූ කල්හි දුක් ඇත්තේ වෙයි. ඔවුන්ගේ වැඩක් ඇතිවූ කල්හි තමන් එහි යෙදීමට පැමිණෙයි. ගෘහපතිය, මෙසේ වනාහි ගමෙහි ආශ්‍රය ඇත්තේ වෙයි.

6 ගෘහපතිය, කෙසේනම් ගමෙහි ආශ්‍රය නොවූයේ වේද, ගෘහපතිය, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක් ගිහීන් හා නොබැඳුනේ වාසය කරයි. සමග සතුටු නොවන්නේ වෙයි. සමග ශොක නොකරන්නේ වෙයි. ඔවුන් සැපවත්වූ කල්හි

සැපවත් නොවූයේ වෙයි ඔවුන් දුක්වූ කල්හි දුක් නොවූයේ වෙයි. ඔවුන්ගේ වැඩක් ඇතිවූ කල්හි තමන් එහි යෙදීමට නොපැමිණෙයි. ගෘහපතිය, මෙසේ වනාහි ගමෙහි ආශ්‍රය නොවූයේ වෙයි.

7 ගෘහපතිය, කෙසේ නම් කාමයන්ගෙන් හිස් නුවූයේ වේද, ගෘහපතිය මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක් කාමයන්හි නොහළ රාග ඇත්තේ නොහළ ආශා ඇත්තේ නොහළ ප්‍රෙමය ඇත්තේ නොහළ පිපාසය ඇත්තේ වෙන් නොවූ පරිදාහ ඇත්තේ වෙන් නොවූ තෘෂ්ණා ඇත්තේ වේද, ගෘහපතිය, මෙසේ වනාහි කාමයන්ගෙන් හිස් නුවූයේ වෙයි

8 "ගෘහපතිය, කෙසේ නම් කාමයන්ගෙන් හිස්වූයේ වේද, ගෘහපතිය, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක් කාමයන්හි වෙන්වූ රාගය ඇත්තේවේද, වෙන්වූ ආශාව ඇත්තේවේද, වෙන්වූ ප්‍රේමය ඇත්තේවේද, වෙන්වූ පිපාසය ඇත්තේවේද, වෙන්වූ පරිදාහ ඇත්තේවේද, වෙන්වූ තෘෂ්ණාව ඇත්තේ වේද, ගෘහපතිය, මෙසේ වනාහි කාමයන්ගෙන් හිස්වූයේ වෙයි. ගෘහපතිය, කෙසේ වනාහි ඉදිරිපත් කිරීම් ඇත්තේ වේද, ගෘහපතිය, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවකට මෙබඳු අදහසක් වෙයි. අනාගත කාලයෙහි මෙබඳු රූපයක් ඇත්තෙක් වන්නේයයි එහි තෘෂ්ණාවෙන් යුක්තවේද, මෙබඳු වෙදනාවක් ඇත්තෙක් වන්නෙම්යයි මෙබඳු සංඥාවක් ඇත්තෙක් වන්නෙම්යයි මෙබඳු සංස්කාරයක් ඇත්තෙක් වන්නෙම්යයි අනාගත කාලයෙහි මෙබඳු විඤ්ඤානයක් ඇත්තෙක් වන්නෙම්යයි එහි තෘෂ්ණාවෙන් යුක්තවූයේ වෙයි. ගෘහපතිය, මෙසේ වනාහි ඉදිරිපත් කිරීම ඇත්තේ වෙයි.

9 ගෘහපතිය, කෙසේ වනාහි ඉදිරිපත් කිරීම් නැත්තේ වේද, ගෘහපතිය, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවකට මෙබඳු අදහසක් වෙයි. අනාගත කාලයෙහි මෙබඳු රූපයක් ඇති වන්නෙක් වන්නෙම්යයි එහි ආශාවෙන් යුක්ත නොවූයේ වෙයි. මෙබඳු වේදනාවක් ඇතිවන්නෙක් වන්නෙම් යයි එහි ආශාවෙන් යුක්ත නුවූයේ වෙයි. මෙබඳු සංඥාවක් ඇතිවන්නෙක් වන්නෙම්යයි

එහි ආශාවෙන් යුක්ත නොවූයේවෙයි. මෙබඳු සංස්කාරයක් ඇතිවන්නෙක් වන්නෙම්යයි, එහි ආශාවෙන් යුක්ත නොවූයේවෙයි මෙබඳු විඤ්ඤානයක් ඇති වන්නෙක් වන්නෙම්යයි එහි ආශාවෙන් යුක්ත නොවූයේ වෙයි. ගෘහපතිය, මෙසේ වනාහි ඉදිරිපත්කිරීම් නැත්තේ වෙයි.

10 ගෘහපතිය, කෙසේ නම් මිනිසා විසින් කලහ කථාවක් කරණලද්දේවේද, ගෘහපතිය, මෙහි ඇතැම් මිනිසෙක් මෙබඳු කථාවක් කරණලද්දේ වෙයි. ඔබ මේ ධර්ම විනය නොදන්නෙහිය. (9-8) 1 'ඔබ මේ ධර්ම විනය' යන තැන සිට යොදාගත යුතුයි.) ඉදින් හැකිනම් අවුල හරුවයි. මෙසේ වනාහි ගෘහපතිය, මිනිසා විසින් කලහ කථාවක් කරණ ලද්දේවෙයි.

11 ගෘහපතිය, කෙසේ වනාහි මිනිසා විසින් කලහ කථාවක් නොකරණ ලද්දේවේද, ගෘහපතිය, මෙහි ඇතැම් මිනිසෙක් මෙබඳුවූ, කථාවක් නොකරණ ලද්දේවෙයි. ඔබ මේ ධර්මවිනය නොදන්නෙහිය. මෙහි (9-8-1 'ඔබ මේ ධර්මවිනය' යන තැන සිට යොදාගත යුතුයි.) ඉදින් හැකිනම් අවුල හරුවයි යනුයි. ගෘහපතිය, මෙසේ වනාහි මිනිසා විසින් කලහ කථාවක් නොකරණ ලද්දේ වෙයි.

12 ගෘහපතිය, මෙසේ වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් අෂ්ටක වර්ගයෙහි මාගන්දිය ප්‍රශ්නයෙහි යමක් දෙශනා කරණලද්දේද ගෘහපතිය, භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙපයෙන් දෙශනා කරණලද මේ භාෂිතයාගේ මෙසේ විස්තර වශයෙන් අර්ථය දතයුතුයි.

## 9 - 11

1 "යමකින් වෙන්වූයේ ලොවහැසිරෙන්නේ" යන්නෙහි 'යමකින්' යනු යම් දෘෂ්ටි සමූහයෙන් 'වෙන්වූයේ' යනු කාය දුශ්චරිතයෙන් හිස්වූයේ විවේකවූයේ යනුයි. "හැසිරෙන්නේ" යනු හැසිරෙන්නේය. වාසය කරන්නේය, පාලනය කරන්නේය. යැපෙන්නේය. 'ලොව' යනු (1-2-5 (i) ඡේදය යෙදිය යුතුයි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2 "උත්තමතෙමේ ඒවා තදින් ගෙන නොකියන්නේය යන්නෙහි 'උත්තම' (නාග) යනු වරද නොකෙරේනුයි නාග නම්. නොයේනුයේ නාග නම්. නොපැමිණේනුයි නාග නම්. නාග තෙම කෙසේ වරද නොකෙරේද? කෙලෙස් ඇතිකරවන්නාවූ නැවත භවයක් දෙන්නාවූ පීඩාකරන්නාවූ, දුක් විපාක ඇත්තාවූ නැවත ජාති ජරා මරණ දෙන්නාවූ ලාමකවූ අකුශල ධර්මයෝ 'වැරදියයි කියත්. භාග්‍යවතුන් වහන්සේ සභියහට මෙසේ දෙසූහ. 'සියලු ක්ලේශ බන්ධනයන්ගෙන් මිදුන තැනැත්තේ සියලු සංයෝගයන්හි බන්ධනයන් මුදා හැර සියලු තන්හි නොඇලෙයි. කෙලෙස් දුරුකළ එබඳු ආත්මභාවයක් ඇති උන්වහන්සේට නාගයයි කියයි." යනුයි.

3 මෙසේ වැරදි නොකෙරේනුයි නාග නම්. කෙසේ නොයේනුයි නාග නම්වේද? ඡන්දයෙන් අගතියට නොයයි. ද්වෙෂයෙන් අගතියට නොයයි මොහයෙන් අගතියට නොයයි භයෙන් අගතියට නොයයි. රාග වශයෙන් නොයයි. ද්වෙෂ වශයෙන් නොයයි. මොහ වශයෙන් නොයයි. මාන වශයෙන් නොයයි. දෘෂ්ටි වශයෙන් නොයයි. උද්ධච්ච වශයෙන් නොයයි. විචිකිච්ඡා වශයෙන් නොයයි. වර්ගවූ ධර්මයන්ගෙන් නොයයි. මෙසේ නොයේනුයි නාග නම්.

4 කෙසේ නොපැමිණේනුයි නාග නම් වේද, සෝවාන් මාර්ගයෙන් යම් ක්ලේශයෝ ප්‍රහීණ වූවාහුද, ඒ ක්ලේශයන් නැවත නොපැමිණෙයි. ආපසු නොඑයි. සකෘදාගාමි මාර්ගයෙන්, අනාගාමි මාර්ගයෙන්, රහත් මගින් යම් ක්ලෙශයෝ ප්‍රහීණවූවාහුද ඒ ක්ලෙශයෝ නැවත නොපැමිණෙත්. ආපසු නොඑත්. මෙසේ නොපැමිණේනුයි නාග නම්

5 "උත්තම තෙමේ ඒවා තදින් ගෙන නොකියන්නේය" යන්නෙහි නාගතෙම ඒ දෘෂ්ටි ග්‍රහණයන් ගෙන ඉගෙණගෙන පරාමර්ශකොට නොකියන්නේය. ප්‍රකාශ නොකරන්නේය. ව්‍යවහාර නොකරන්නේය යනුයි.

6 "ජලයෙන් හෝ මඩින් නොතැවරෙන දියෙන් උපන් කටු ඇති නෙළුමක් මෙන්" යන්නෙහි 'එල' යයි ජලයට කියයි

අම්බුජයයි පියුමට කියයි. කණ්ටකයයි රළුවූ දණ්ඩට කියයි. වාරියයි ජලයට කියයි, වාරිජයයි ජලයෙන් උපන් පියුමට කියයි. 'ජල' යයි දියට කියයි. පංකයයි මඩට කියයි. යම්සේ ජලයෙන් උපන් පියුම ජලයෙහිද මඩෙහිද නොතැවරෙයි, නොගැටෙයි. නොඇලුනේය නොගැටුනේය යනුයි.

7 "මෙසේ ශාන්තිය පවසන මුනිතෙම ගිජුනොවූයේ කාමයෙහිද ලොකයෙහිද නොඇලුණේ" යන්නෙහි මෙසේ යනු උපමා වචනයයි. 'මුනි' යන්නෙහි මොනයයි ඥානයට කියයි ((2-8) 10 ඡේදයේ "යම් ප්‍රඥාවක්" යන තැන සිට 14 ඡේදය අවසානය දක්වා යෙදිය යුතුයි.) තෘෂ්ණා ජාලය ඉක්මවා සිටියේනුයි හෙතෙම මුනි නම්.

8 ශාන්තිය පවසන යනු මුනිතෙමේ ශාන්තිවාද ඇත්තේය. 'තෘණ' වාද ඇත්තේය, ලෙන වාද ඇත්තේය, සරණ වාද ඇත්තේය, අභය වාද ඇත්තේය, අච්චුත වාද ඇත්තේය, අමත වාද ඇත්තේය, නිබ්බාණ වාද ඇත්තේය. මෙසේ මුනි තෙම ශාන්තවාද ඇත්තේය.

**9** "ගිජු නොවූයේ" යන්නෙහි ගිජුයයි තෘෂ්ණාවට කියයි, යම් රාගයක් ඇලීමක් ((1-3) 4 ඡේදයේ "යම් ලංවීමක්" යන තැන සිට යොදාගත යුතුයි.) අකුශල මූලයක් ඇද්ද, යමෙකුගේ ඒ ගිජුකම ප්‍රහීණවූයේද සිඳ දැමූයේද සංසිඳුනේද ඉපදීමට අයොග්‍යවූයේද ඥානය නමැති ගින්නෙන් දැවුනේද හෙතෙම ගිජු නොවූයේයයි කියයි. හෙතෙම රූපයෙහි අගිද්ධය. ගිජු නොවූයේය ශබ්දයෙහි, ගන්ධයෙහි, රශයෙහි ස්පර්ශයෙහි කුලයෙහි ගණයෙහි අවාසයෙහි ලාභයෙහි යසසෙහි ප්‍රශංසාවෙහි සුඛයෙහි චීවරයෙහි පිණ්ඩපාතයෙහි සේනාසන ගිලන්පස බෙහෙත් පිරිකරෙහි කාම ධාතුයෙහි රූප ධාතුයෙහි අරූප ධාතුයෙහි කාම භවයෙහි රූප භවයෙහි අරූප භවයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤා භවයෙහි එකවොකාර භවයෙහි චතුවොකාර භවයෙහි පඤ්චවොකාර භවයෙහි අතීතයෙහි, අනාගතයෙහි, පවත්නා කාලයෙහි, දැකි, ඇසූ ඉන්ද්‍රිය තුනකින් ගන්නාලද දෙයෙහි, දැනගතයුතු ධර්මයන්හී ගිජුනොවූයේ

නොගැටුනේ මුර්ඡානොවූයේ නොගැලුනේ දුරුකළ ගිජුකම ඇත්තේ, පහව ගිය ගිජුකම ඇත්තේ, අත්හළ ගිජුකම ඇත්තේ, වමාරා දැමූ ගිජුකම ඇත්තේ, මිදූ ගිජුකම ඇත්තේ, සංසිඳුන ගිජුකම ඇත්තේ පහව ගිය රාගය ඇත්තේ අත්හල රාගය ඇත්තේ වමාරාදැමූ රාගය ඇත්තේ මිදූ රාගය ඇත්තේ ප්‍රහීණ රාග ඇත්තේ සංසිඳුන රාගය ඇත්තේ තෘෂ්ණා නැතිවූයේ නිවුනේ සිහිල් වූයේ සැපත විඳින්නේ බ්‍රහ්මයා බඳුව තෙමේ වාසය කරයි.

10 "කාමයෙහිද ලොකයෙහිද නොඇලුණේ" යන්නෙහි 'කාම' යනු ප්‍රධාන වශයෙන් කාම දෙකකි. එනම් (මෙහි 1, 1 (ii) සිට 3 (ii) දක්වා යෙදිය යුතුයි.)

11 "ලොකයෙහි යනු අපාය ලෝකයෙහි මනුෂ්‍ය ලොකයෙහි දිව්‍ය ලොකයෙහි ස්කන්ධ ලොකයෙහි ධාතු ලොකයෙහි, ආයතන ලොකයෙහි යනුයි.

12 "ඇලීම්" ලෙප යන්නෙහි ඇලීම් දෙකකි. තෘෂ්ණා ලෙපයද දෘෂ්ටි ලෙපයද යනුයි. 'මමත්වය' වෙනුවට 'ලෙපයයි' වෙනස්කර (2-6) 1 (ii) (iii) ඡෙද යෙදිය යුතුයි)

මුනිතෙමෙ තෘෂ්ණා ඇලීම දුරුකොට දෘෂ්ටිලෙපය සංසිඳුවා කාමයෙහිද ලොකයෙහිද නොඇලෙයි. නොඇලුනේ නික්මුනේ මිදුනේ වෙන්වූයේ සීමා නොකරණලද සිතින් වාසය කරයි යනුයි.

## 9 - 12

1 "ඥාණ ඇත්තේ දැකීමෙන් සිතීමෙන් සමාන බවට නොපැමිණේ" යන්නෙහි 'නො' යනු ප්‍රතික්ෂෙපයයි. ඥාණ ඇත්තේ යන්නෙහි සතර මාර්ගඥානයට වෙදයයි කියයි. ප්‍රඥාව, ප්‍රඥෙන්ද්‍රිය, ප්‍රඥා බලය, ධම්ම විචය සම්බොජ්ඣංගය, වීමංශාව, විපස්සනාව, සම්‍යක් දෘෂ්ටිය, යනුයි. ඒ වේදයන්ගෙන් ජාති ජරා මරණයාගේ කෙළවරට ගියේ කෙළවරට පැමිණියේ පයඞීන්තයට ගියේ පයඞීන්ත ප්‍රාප්තවූයේ අවසානයට ගියේ අවසාන ප්‍රාප්තවූයේ තාණ ගතවූයේ තාණ ප්‍රාප්තවූයේ ලෙන

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ගතවූයේ ලෙන ප්‍රාප්තවූයේ සරණ ගතවූයේ සරණ ප්‍රාප්තවූයේ අභය ගතවූයේ අභය ප්‍රාප්තවූයේ අච්චුත ගතවූයේ අච්චුත ප්‍රාප්තවූයේ අමත ගතවූයේ අමත ප්‍රාප්ත වූයේ නිර්වාණ ගතවූයේ නිර්වාණ ප්‍රාප්තවූයේ නුයි. වෙදයන්ගේ අන්තයට ගියේනුයි, වෙදගු නම්. වෙදයන්ගෙන් හෝ අන්තයට ගියේනුයි වෙදගූ නම්. ධර්ම සතක් දන්නා ලද බැවින් වෙදගු නම්. ආත්මදෘෂ්ටිය දන්නාලද්දේ වෙයි. සැකය දන්නා ලද්දේ වෙයි. සීලබ්බතපරාමාසය දන්නා ලද්දේ වෙයි. රාගය දන්නාලද්දේ වෙයි. ද්වෙෂය දන්නා ලද්දේ වෙයි. මොහය දන්නා ලද්දේ වෙයි. මානය දන්නා ලද්දේ වෙයි. කෙළෙස් ඇති කරන්නාවූ පුනර්භවය දෙන්නාවූ දාහය ඇති කරන්නාවූ දුක්විපාක ඇත්තාවූ නැවත ජාති ජරා මරණයන් දෙන්නාවූ ලාමක අකුශල ධර්මයෝ දැනගන්නා ලදහ.

භාග්‍යවතුන් වහන්සේ සභියහට (මෙසේ දෙසූහ) මේ ලොකයෙහි ශ්‍රමණයන්ගේද බ්‍රාහ්මණයන්ගේද සියලු වෙදයන් මනාකොට දැන, සියලු වේදනාවන්හි පහවූ රාග ඇත්තේ සියලු වෙදයන් ඉක්මවා සිටියේනුයි හෙතෙම වෙදගු නම්. යනුයි.

2 "දැකීමෙන් නොවේ" යන්නෙහි ඔහුගේ දෙසැට දෘෂ්ටි ගැනීම් දුරුවූහ. සිඳ දැමූහ. ශාන්තවූහ. සංසිඳුනාහ. ඉපදීමට අයොග්‍යවූහ. ඥානය නමැති ගින්නෙන් දැවුනාහ. හෙතෙම දෘෂ්ටියෙන් නොයයි. බැහැර නොයයි. පා නොවෙයි එක්තැන් නොකරයි. ඒ දෘෂ්ටිගැන්ම සාර වශයෙන් ඉදිරියට නොයයි. ආපසු නොඑයි යනුයි.

3 සිතීමෙන් නොවේ. යනු පඤ්චෙන්ද්‍රියයන්ගෙන් දැනගෙන හෝ අනුන්ගෙන් ඇසීමෙන් හෝ මහාජන සම්මුතියෙන් හෝ මානයට නොපැමිණෙයි, නොඑළඹෙයි, ඇතුළු නොවෙයි.

4 "හෙතෙම එයින් මැඩුණේ සමාන බවට නොපැමිණේමය" යනු තෘෂ්ණා වශයෙන් හෝ දෘෂ්ටි වශයෙන් නොගන්නේ වෙයි. එය උතුම් කොට ඇත්තේ එය සරණ කොට ඇත්තේ නොවෙයි. යම්හෙයකින් ඔහුගේ තෘෂ්ණාවද දෘෂ්ටියද

මානයද ප්‍රහීණවූයේ වේද, මුලින් සිඳ දැමූ තල් ගසක් මෙන් නැවත නූපදීම් වශයෙන් අභාවයට පමුණුවන ලද්දේද, මෙපමණකින් නොගන්නේ වෙයි. එය උතුම්කොට ඇත්තේ නොවෙයි එය පිහිටකොට ඇත්තේ නොවෙයි.

5 "කර්මයෙන් හෝ ඇසූ දෙයින් හෝ හික්මවිය යුත්තෙක් නොවේ" යන්නෙහි කර්මයෙන් නොවේ යනු පුණ්‍යාභිසංස්කාරයෙන් හෝ අපුණ්‍යාභි සංස්කාරයෙන් හෝ ආනෙඤ්ජාභි සංස්කාරයෙන් හෝ නොයයි, නොපමුණුවයි පානොවෙයි පැමිණවිය යුත්තේ රැස් නොකරයි.

6 "කර්මයෙන් හෝ ඇසීමෙන් හෝ හික්මවිය යුත්තෙක් නොවේ. යන්නෙහි පුණ්‍යාභිසංස්කාරයෙන් හෝ අපුණ්‍යාභිසංස්කාරයෙන් හෝ ආනෙඤ්ජාභි සංස්කාරයෙන් හෝ නොයයි. නොපැමිණෙයි, පානොවෙයි, රැස් නොකරයි යනුයි

7 "හෙතෙම ගැනීම් වලට නොපමුණුවන ලද්දේ" යන්නෙහි පැමිණීම යනු පැමිණීම් දෙකකි, තෘෂ්ණා පැමිණීම දෘෂ්ටි පැමිණීම යනුයි (2-6) 1 (ii) (iii) මමත්වය යන්න පැමිණීමයයි වෙනස්කොට යොදාගත යුතුයි. ඔහුගේ තෘෂ්ණාවට පැමිණීම ප්‍රහීණය දෘෂ්ටියට පැමිණීම සංසිඳුනේය. තෘෂ්ණාව රැස්කිරීම ප්‍රහීණවූ බැවින් හෙතෙම නිවෙසනයන්හි නොපැමිණියේ නොඇළුනේ නොගියේ නික්මුනේ, හරණ ලද්දේ, වෙන්වූයේ සීමානොවූ සිතින් වාසය කරයි යනුයි.

## 9 - 13

1 "හැඟීම්වල නොඇලුණහුට ගැටළු නැත" යනු යමෙක් සමථය මුල්කොට ඇති ආය්‍ය්‍යී මාර්ගය වඩාද ඔහුගේ මුල පටන්ම කෙලෙස් ගැට යටපත්වූයේ වෙයි. අර්හත්වයට පැමිණි කල්හි රහතුන් වහන්සේගේ කෙලෙස් ගැටද මොහයද නීවරණයන්ද කාමසඤ්ඤාවද ව්‍යාපාද සංඥාවද විහිංසා සංඥාවද දෘෂ්ටි සංඥාවද ප්‍රහීණ වූවාහු වෙත්. මුලින් සිඳ දැමූ තල්ගසක් මෙන් නැවත නූපදීම් වශයෙන් අභාවයට පමුණුවන ලද්දාහු වෙත්.

2 "නුවණින් මිදුණහුට මෝහයෝ නැත." යනු යමෙක් විදර්ශනා පූර්වාංගමවූ ආය්‍ය්‍යී මාර්ගය වඩාද ඔහුගේ මුලපටන්ම

මොහය යටපත්වූයේ වෙයි. අර්හත්වය පැමිණි කල්හි රහතුන් වහන්සේට මොහයෝද කෙලෙස් ගැටද නීවරණයෝද කාම සංඥාවෝද ව්‍යාපාද සංඥාවෝද විහිංසා සංඥාවෝද දෘෂ්ටි සංඥාවෝද ප්‍රහීණවූවාහු වෙත්. මුලින් සිඳි තල්ගසක් මෙන් නැවත නූපදීම් වශයෙන් අභාවයට පමුණුවන ලද්දාහු වෙත්.

3 "යමෙක් තුමූ සංඥාවද දෘෂ්ටියද දැඩිව ගත්තාහුද ඔවුහු ලොකයෙහි ගැටෙමින් හැසිරෙත්" යනු යමෙක් තුමූ කාම සංඥාවද ව්‍යාපාද සංඥාවද විහිංසා සංඥාවද යන සංඥාවෝ ගනිත්ද ඔවුහු සංඥා වශයෙන් ගැටෙත්. රජවරුද රජුන් හා විවාද කරත් ක්ෂත්‍රියයෝද ක්ෂත්‍රියයන් හා විවාද කරත්. බ්‍රාහ්මණයෝද බ්‍රාහ්මණයන් හා විවාද කරත්. ගෘහපතියෝද ගෘහපතියන් හා විවාද කරත්. මවද පුතා සමග විවාද කරයි. පුත්‍රයාද මව සමග විවාද කරයි. පියාද පුතා සමග විවාද කරයි. පුත්‍රයාද පියා සමග විවාද කරයි. සහෝදරයාද සහෝදරයා සමග විවාද කරයි. සහෝදරියද සහෝදරිය සමග විවාද කරයි. සහෝදරයාද සහෝදරිය සමග විවාද කරයි. සහෝදරියද සහෝදරයා සමග විවාද කරයි. යහලුවාද යහළුවා සමග විවාද කරයි. ඔවුහු එහි කලහයට විවාදයට විග්‍රහයට පැමිණියාහු ඔවුනොවුන් අත්වලින්ද ගහගැණීම කරති. ගල්කැට වලින්ද ගහගනිත් දඬු වලින්ද ගහගණිත්. ආයුධ වලින්ද ගහගණිත්. ඔවුහු එහි මරණයටද පැමිණෙත්. මරණය සමාන දුකට හෝ පැමිණෙත්. යමෙක් ලොකය ශාස්වවතයයි හෝ සත්වයා මරණින් මතු නොමවෙයි නොමනොවෙයි කියා හෝ ඔවුහු දෘෂ්ටි වශයෙන් ගැටෙත්. ශාස්තෘවරයාගෙන් ශාස්තෘවරයා ගැටේ ධර්මයෙන් ධර්මය ගැටේ. ශ්‍රාවක ගණයාගෙන් ශ්‍රාවක ගණයා ගැටෙත්, දෘෂ්ටියෙන් දෘෂ්ටිය ගැටෙයි ප්‍රතිපදාවෙන් ප්‍රතිපදාව ගැටෙයි. මාර්ගයෙන් මාර්ගය ගැටෙයි. යලිදු හෝ ඔවුහු විවාද කරත් කලහ කරත් රංඩු කරත් ඩබර කරත්. විවාදකරත්. ආරාවුල් කරත්. ඔබ මේ ධර්ම විනය නොදන්නෙහිය. මෙහි (9-8) 1 i) ඡෙදය යෙදිය යුතුයි) ඉදින් හැකිනම් අවුල හරුව යනුයි. ඔවුන්ගේ ක්ලෙශ රැස් කිරීම් ප්‍රහීණ නොවූහ. ක්ලෙශ රැස් කිරීම ප්‍රහීණ නුවූ බැවින් ගතියෙහි සට්ටනය වෙත්. ප්‍රෙත

විෂයෙහි සට්ටනය වෙත්. මනුෂ්‍ය ලොකයෙහි සට්ටනය වෙත්. දිව්‍යලොකයෙහි සට්ටනය වෙත්. ගතියෙන් ගතිය උත්පත්තියෙන් උත්පත්තිය ප්‍රතිසන්ධියෙන් ප්‍රතිසන්ධිය භවයෙන් භවය සංසාරයෙන් සංසාරය වට්ටයෙන් වට්ටය ගැටෙත්, කියත්, හැසිරෙත්, වාසය කරත්, පාලනය කරත්, යැපෙත්.

4 "ලොකයෙහි" (ii) යනු අපාය ලොකයෙහි මනුෂ්‍ය ලොකයෙහි. දිව්‍යලෝකයෙහි, ස්කන්ධ ලෝකයෙහි ධාතු ලෝකයෙහි ආයතන ලොකයෙහි යනුයි

## පුරාභෙද සූත්‍ර නිර්දෙශය.

## 10 - 1

1 "කෙසේ දකින්නා කෙබඳු ස්වභාවයක් ඇත්තා උපශාන්තයා යයි කියනු ලැබේද" කෙසේ දකින්නා යන්නෙහි කවර බඳු දර්ශනයකින් යුක්තවූයේ කවර පිහිටීමකින් කවර ප්‍රකාරයකින් කවර වැටහීමකින් යනුයි.

"කෙබඳු ස්වභාවයක් ඇත්තා" කවර ශීලයකින් යුක්තවූයේ කවර පිහිටීමකින් කවර ප්‍රකාරයකින් කවර වැටහීමකින් යනුයි.

2 "උපශාන්තයායයි කියනු ලැබේද යනු ශාන්තවූයේ උපශාන්තවූයේ තෘෂ්ණා නැත්තේ නිවුනේ සංසිඳුනේයයි කියයි. ප්‍රකාශ කරයි. කෙසේ දකින්නා යනු අධි ප්‍රඥාව විචාරයි.

3 "කෙබඳු ස්වභාව ඇත්තේ" යනු අධිශීලය කියයි. උපසාන්තයනු අධිචිත්තය විචාරයි. "ගෞතමයෙනි, එය මට කියනු" යන්නෙහි එය යනු යමක් විචාරමි. යමක් ඉල්ලමි යමක් බලාපොරොත්තු වෙමි. යමක් පහදවමි යනුයි. ගෞතම, යනු හෙතෙම නිර්මිත බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේට ගොත්‍රයෙන් ආමන්ත්‍රණය කරයි.

4 "කියනු" යනු කියනු මැනවි. ප්‍රකාශ කරණු මැනවි. පනවනු මැනවි. තබනු මැනවි. විවෘත කරණු මැනවි, බෙදනු මැනවි. ප්‍රකට කරණු මැනවි. ප්‍රකාශ කරණු මැනවි. යනුයි.

5 "උතුම් මනුෂ්‍යයා අතින් විචාරණ ලද්දේ ඉල්ලන ලද්දේ බලාපොරොත්තුවන ලද්දේ පහදින ලද්දේ යනුයි. "උතුම් මිනිසාගෙන්" යනු අග්‍රවූ ශ්‍රෙෂ්ඨවූ ප්‍රමුඛවූ උතුම්වූ මිනිසා යනුයි.

## 10 - 2

1 "මරණයෙන් පෙර තෘෂ්ණා රහිතවූයේ" යන්නෙහි කායයාගේ බිඳීමෙන් පෙර ආත්ම භාවයාගේ බිඳීමෙන් පෙර සිඳීමෙන් පෙර අත්හළ තෘෂ්ණා ඇත්තේ මිදූ රාගය ඇත්තේ ප්‍රහීණ රාග ඇත්තේ සංසිඳුන රාග ඇත්තේ තෘෂ්ණාවෙන් වෙන්වූයේ, නිවුනේ, සිහිල්වූයේ සැපවිඳින්නේ බ්‍රහ්මයා බඳු ආත්මභාවයෙන් වාසය කරයි.

2 "භාග්‍යවතුන් වහන්සේ යනු ගෞරව වචනයකි. (7-2) 1 ඡේදයේ භාග්‍යවතුන් වහන්සේ යනතැන සිට "අල්ප ශබ්ද ඇති" යන තැනට යොදාගත යුතුයි.

3 "පෙරවූ අන්තය ඇසුරු නොකෙළේ" යන්නෙහි 'පෙරවූ අන්තය' යයි ඈත අතීතකාලයට කියයි. ඈත අතීතය පටන්කොට තෘෂ්ණාව ප්‍රහීනවූයේ වෙයි. දෘෂ්ටිය සංසිඳුණේය. තෘෂ්ණාව දුරුකළ බැවින් දෘෂ්ටිය සංසිඳුන බැවින් මෙසේද පූර්වාන්තය ආශ්‍රය නොකෙළේ වෙයි. යලිදු හෝ අතීතකාලයෙහි මෙසේවීමි. එහි බැඳීමට නොපැමිණෙයි. මෙසේ වේදනාවෙන් යුක්තවීමි. මෙසේ සංඥාවෙන් යුක්තවීමි. මෙසේ සංස්කාරයෙන් යුක්තවීමි. අතීත කාලයෙහි මෙසේ විඤ්ඤානයෙන් යුක්තවීමි. එහි බැඳීමට නොපැමිණෙයි. යලිදු හෝ අතීත කාලයෙහි ඇස මෙසේ වීය. රූපයෝ මෙසේයයි එහි විඤ්ඤාණය ඡන්දරාගයෙන් බැඳුනේ නොවෙයි. එහි විඤ්ඤානය ඡන්ද රාගයෙන් නොබැඳුන බැවින් එහි සතුටු නොවන්නේ මෙසේද පූර්වාන්තය ආශ්‍රය නොකළේවෙයි. අතීත කාලයෙහි මෙසේ මාගේ කණ විය මෙසේ ශබ්දයෝ වූහ. අතීත කාලයෙහි මෙසේ මාගේ නාසය විය. මෙසේ ගන්ධයෝ වූහ. අතීත කාලයෙහි මෙසේ මාගේ දිව විය. මෙසේ රශයෝ වූහ. අතීත කාලයෙහි මාගේ ශරීරය මෙසේ විය. ස්පර්ශයෝ මෙසේ වූහ. අතීත කාලයෙහි මෙසේ මාගේ මනස විය, මෙසේ ධර්මයෝ වූහයි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

එය විඤ්ඤානය ඡන්දරාගයට බැඳුනේ නොවෙයි, විඤ්ඤානයාගේ ඡන්දරාගයට නොබැඳුන බැවින් එය සතුටු නොවෙයි, එය සතුටු නොවන්නේ මෙසේද පූර්වාන්තය ආශ්‍රය නොකළේ වෙයි, යලිදු හෝ පෙර යම් ස්ත්‍රියක් සමග සිනහවූ කථා කළ ක්‍රීඩාකළ සැටි සිතා එය ආශ්වාදයද (රසවිඳීම) නොකරයි. එය ආශා නොකරයි. එහි ප්‍රීතියට නොපැමිණෙයි. මෙසේද පූර්වාන්තය ආශ්‍රය නොකළේ වෙයි.

4 "වර්තමානයෙහිද කියයුතුබවට නොයන්නේය." වර්තමාන යන්නෙහි වර්තමානයයි පවත්නා කාලයට කියයි. පවත්නා කාලයේ පටන් තෘෂ්ණාව ප්‍රහීණවූයේ වෙයි. දෘෂ්ටිය සංසිඳුනේය. තෘෂ්ණාව ප්‍රහීණවූ බැවින් දෘෂ්ටිය සංසිඳුන බැවින් රාගයෙන් යුක්තයෙකැයි ගණනට නොයන්නේය. ද්වෙෂයෙන් යුක්තයෙකැයි ගණයට නොයන්නේය. බැඳුන තැනැත්තේයයි ගණනට නොයන්නේය. පරාමර්ශ කළ තැනැත්තේයයි ගණනට නොයන්නේය. මුලාවට ගිය තැනැත්තේ යයි ගණනට නොයන්නේය. අනිටු බවට ගියේ යයි ගණනට නොයන්නේය. ථාමගතයෙකැයි ගණනට නොයන්නේය. ඒ අභිසංස්කාරයෝ ප්‍රහීණයහ. අභිසංස්කාරයන් ප්‍රහීනවූ බැවින් නිරයට පැමිණියෙක කියා හෝ තිරිසන් යොනියට පැමිණියෙක කියා හෝ ප්‍රෙත විෂයට පැමිණියෙක කියා හෝ මිනිසෙක කියා හෝ දෙවියෙක කියා හෝ රූපියෙක කියා හෝ අරූපියෙක කියා හෝ සඤ්ඤියෙක කියා හෝ නෙවසඤ්ඤී නාසඤ්ඤීයෙක කියා හෝ ගතියෙහි ගණයට නොයන්නේය. එබඳු හේතුවක් නැත ප්‍රත්‍යයක් නැත. යමකින් ගණනට යන්නේයයි කාරණයක් නැත.

5 "ඔහුට පෙරටුවූවක් නැත" යන්නෙහි යනු අර්හත් ක්ෂීණාශ්‍රවයන් වහන්සේට යනුයි. "පෙරටු වූවක් යනු ඉදිරිපත් කිරීම් දෙකකි. තෘෂ්ණාව ඉදිරිපත් කිරීමද, දෘෂ්ටිය ඉදිරිපත්කිරීමද යනුයි. (2-6) 1 (ii) (iii) මමත්වය යන්න ඉදිරිපත් කිරීමයයි වෙනස්කොට යොදාගත යුතුයි.

ඔහුගේ තෘෂ්ණාව ඉදිරිපත්කිරීම ප්‍රහීණය, දෘෂ්ටිය ඉදිරිපත් කිරීම සංසිඳුනේය. තෘෂ්ණාව ඉදිරිපත්කිරීම ප්‍රහීණවූ බැවින්

තෘෂ්ණාව හෝ දෘෂ්ටිය හෝ පෙරටු කොට නොහැසිරෙයි, තෘෂ්ණාව ධජයක් කොට නොහැසිරෙන්නේ තෘෂ්ණාව කොඩියක් කොට නොහැසිරෙන්නේ තෘෂ්ණාව අධිපති නොවූයේ දෘෂ්ටිය ධ්වජයක් කොට නොහැසිරෙන්නේ දෘෂ්ටිය කොඩියක්කොට නොහැසිරෙන්නේ තෘෂ්ණාව හෝ දෘෂ්ටිය හෝ පිරිවරා නොහැසිරෙයි, මෙසේද ඔහුට ඉදිරිපත් කිරීමක් නැත. යලිදු හෝ අනාගත කාලයෙහි මෙසේ රූපයක් ඇත්තෙක් වන්නෙමියි එහි, ආශාවට නොපැමිණෙයි. මෙසේ වෙදනා ඇත්තෙක් වන්නෙමි. මෙසේ සඤ්ඤා ඇත්තෙක් වන්නෙමි අනාගත කාලයෙහි මෙසේ විඤ්ඤානයක් ඇත්තෙක් වන්නෙමියි එහි තෘෂ්ණාවෙන් බැඳීමට නොපැමිණෙයි, මෙසේද ඔහුට ඉදිරිපත් කිරීමක් නැත. මෙසේ අනාගත කාලයෙහි මාගේ කණ මෙසේ වන්නේය. ශබ්දයෝ මෙසේයයි අනාගත කාලයෙහි මාගේ නාසය මෙසේ වන්නේයයි ගන්ධයෝ මෙසේයයි අනාගත කාලයෙහි මාගේ දිව මෙසේ වන්නේයයි රශයෝ මෙසේ වන්නේයයි අනාගත කාලයෙහි මාගේ කය මෙසේ වන්නේයයි ස්පර්ශය මෙසේයයි අනාගත කාලයෙහි මාගේ මනස මෙසේ වන්නේයයි ධර්මයෝ මෙසේයයි නොලැබූ දෙයක් ලැබීම පිණිස සිත නොයොදවයි. සිත නොයෙදවූ බැවින් මෙහි සතුටු නොවෙයි එහි සතුටු නොවන්නේ මෙසේද එහි ඉදිරිපත් කිරීමක් නැත. යලිදු හෝ මම මේ ශීලයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්ම චරියාවෙන් හෝ දෙවියෙක් හෝ වන්නෙමි දෙවියන්ගෙන් එක්තරා කෙනෙක් හෝ වන්නෙමි'යි නොලැබූ දෙයක් ලැබීම පිණිස සිත නොයොදයි. සිත නොයෙදූ හේතුවෙන් එහි සතුටු නොවන්නේ මෙසේද ඔහුට ඉදිරිපත් කිරීමක් නැත

## 10 - 3

1 "ක්‍රොධ නොකරන්නේ, තැති නොගන්නේ" යන්නෙහි ක්‍රොධ නොකරන්නේ යනු කියන ලදී. යලිදු ක්‍රොධය පළමු කොට කිය යුතුයි. කරුණු දහයකින් ක්‍රොධය ඇතිවෙයි. මට අවැඩක් කළේයයි ක්‍රොධය උපදියි. මට අවැඩක් දැන් කරන්නේයයි ක්‍රොධය උපදියි. මට අනාගතයෙහි අවැඩක්

කරනවා ඇතැයි ක්‍රොධය උපදියි. මාගේ හිතවතාට අවැඩක් කළේයයි, මගේ හිතවතාට දැන් අවැඩක් කරන්නේයයි, මගේ හිතවතාට මතු අවැඩක් කරණවා ඇතැයි ක්‍රොධය උපදියි මාගේ අහිතවතාට වැඩක් කළේය. වැඩක් දැන් කරන්නේය. මතු ඔහුට වැඩක් කරණවා ඇතැයි ක්‍රොධය උපදියි. අස්ථානයෙහි හෝ ක්‍රොධය උපදියි මෙසේ සිතේ හැපීමක් නැවත නැවත හැපීමක් ක්‍රොධයක් ප්‍රතිවිරොධයක් කොපයක් ප්‍රකොපයක් සම්ප්‍රකෝපයක් තරහක් කිපීමක් කිපීම් බවක් ද්වෙෂයක් දූෂ්‍යවීමක් ව්‍යාපාදයක් විරොධයක් ප්‍රතිවිරොධයක් චණ්ඩ ගතියක් අමනාපයක් සිතේ නොසතුටු කමක් වේද මෙය, ක්‍රොධයයි කියයි. යලිදු ක්‍රොධයාගේ ඉතා ස්වල්ප බව දතයුතුයි. (ii) කිසි කලෙක ක්‍රොධය සිත අවුල් කිරීම පමණක් වෙයි. ඒතාක් මුඛය අවුල් කිරීම පමණක්වත් නොවෙයි. (i) සමහර කලෙක ක්‍රොධය මුඛය අවුල් කිරීම් මාත්‍රයක් පමණක් වෙයි. ඒතාක් කපොලයන් (කම්මුල්) වෙවුලීම් නොවෙයි සමහර කලෙක ක්‍රොධය කපොලයන් වෙව්ලීම් පමණක් කරයි. ඒතාක් නපුරු වචන පිට නොකිරීම වෙයි. සමහර කලෙක ක්‍රොධය නපුරු වචන පිටකිරීම පමණකට වෙයි ඒතාක් දිශා විදිශාවන් බැලීම පමණක් වෙයි. සමහර කලෙක ක්‍රොධය දිශාවන් බැලීමට පමණක් වෙයි. ඒතාක් දඬු ආයුධ අතගෑම නොවෙයි. සමහර කලෙක ක්‍රොධය දඬු හා ආයුධ අතගෑමට පමණක් වෙයි. ඒතාක් දඬු හා ආයුධ එසවීම නොවෙයි. සමහර කලෙක ක්‍රොධය දඬු හා ආයුධ එසවීමට පමණක් වෙයි. ඒතාක් දඬු ආයුධයන් ගෙන් ගැසීම නොවෙයි. සමහර කලෙක ක්‍රොධය දඬු ආයුධයන්ගෙන් ගැසීමට පමණක් වෙයි. ඒතාක් සුනු විසුනු කිරීම නොවෙයි. සමහර කලෙක ක්‍රොධය සුනු විසුනු කිරීම පමණක් වෙයි. ඒතාක් බිඳීම් පැලීම් නොවෙයි. සමහර කලෙක ක්‍රොධය බිඳීම් පැලීම් පමණක් වෙයි. ඒතාක් අංගප්‍රත්‍යංගයන් කැඩීම නොවෙයි. සමහර කලෙක ක්‍රොධය අංගප්‍රත්‍යංගයන් බිඳීම් කැඩීම් පමණකට වෙයි. ඒතාක් දිවි තොර නොකිරීම වෙයි. සමහර කලෙක ක්‍රොධය දිවි තොර කිරීම් පමණකට වෙයි. ඒතාක් සියලු දේ වීසී කිරීම් බවට නොපැමිණෙයි. යම් හෙයකින් ක්‍රොධය අන්‍යයා මරා

තමාද මරා ගනියි. මෙපමණකින් ක්‍රොධය ඉතා උසස් බවට පැමිණියේ මහත් බවට පැමිණියේ වෙයි, යමෙකුගේ ඒ ක්‍රොධය ප්‍රහීණවූයේද මුලින් සින්දේද ශාන්තවූයේද සංසිඳුනේද ඉපදීමට අයොග්‍යවූයේද ඥානය නමැති ගින්නෙන් දැවූයේද හෙතෙම ක්‍රොධ නොකරන්නායයි කියයි. ක්‍රොධය ප්‍රහීණවූ බැවින් ක්‍රොධ නොකරන්නා නම් ක්‍රොධ වස්තුන් දැනගත් බැවින් අක්කොධන නම් ක්‍රොධ හේතු සිඳ දැමූ බැවින් ක්‍රොධ නොකරන්නා නමි.

2 "තැති නොගන්නේ යනු මෙහි ඇතැම් පුද්ගලයෙක් තැති ගැන්ම ඇත්තේ වෙයි. හෙතෙම තැතිගනියි. බිය වෙයි. සන්ත්‍රාසයට පැමිණෙයි. කුලය හෝ නොලබමි ගණයා හෝ නොලබමි. ආවාසය හෝ නොලබමි. ලාභය හෝ නොලබමි. යසස හෝ නොලබමි. ප්‍රශංසාව හෝ නොලබමි. සැපය හෝ නොලබමි. සිවුරු හෝ නොලබමි. පිණ්ඩපාතය හෝ නොලබමි. සෙනසුන් හෝ නොලබමි. ගිලන්පස බෙහෙත් පිරිකර හෝ නොලබමි. ගිලානුපස්ථානය හෝ නොලබමි. ප්‍රකටනොවූයේ වෙමියි තැති ගනියි, බියවෙයි සන්ත්‍රාසයට පැමිණෙයි මේ ශාසනයෙහි මහණ තෙම තැති නොගත්තේ වේද, සන්ත්‍රාසයට නොපැමිණියේ වේද, හෙතෙම ත්‍රස්ත නොවෙයි බිය නොවෙයි. කුලය හෝ නොලබමි. ගණයා හෝ නොලබමි. ආවාසය හෝ නොලබමි. ලාභය හෝ නොලබමි. කීර්තිය හෝ නොලබමි. ප්‍රශංසාව හෝ නොලබමි. සැපත හෝ නොලබමි. සිවුරු හෝ නොලබමි. පිණ්ඩපාතය හෝ නොලබමි. සෙනසුන් හෝ නොලබමි. ගිලන්පස බෙහෙත් පිරිකර හෝ ගිලානුපස්ථායක කෙනෙකු හෝ නොලබමි. අප්‍රකට වෙමියි ත්‍රස්ත නොවෙයි බියනොවෙයි සන්ත්‍රාසයට නොපැමිණෙයි.

3 "තමන් වර්ණනා නොකරන්නේ පසුතැවිලි නොවන්නේ" යන්නෙහි මෙහි ඇතැම් පුද්ගලයෙක් පුරසාරම් දොඩන්නේ වෙයි. (මෙහි (3-3) 5 ඡේදයේ 'කියයි' යන්න 'පුරසාරම් දොඩයි' කියා වෙනස්කොට 'මම ශීලසම්පන්නයෙක් වෙමි' යන තැන සිට 'නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය' යන තැනට යොදාගත යුතුයි) යනුයි. මෙසේ පුරසාරම් දෙඩීමක් නැත.

පුරසාරම් දෙඩීමෙන් ඈත්ය, දුරය, වෙන්වුනේය, නික්මුනේය, වෙන්වුනේය, සීමා නොකරණ ලද සිතින් පුරසාරම් නොදොඩන තැනැත්තේ වාසය කරයි.

4 "පසු තැවෙන්නේ" යන්නෙහි (i) අත පිළිබඳ කුකුසද කුකුසය, පය පිළිබඳ කුකුසද කුකුසය, අත්පා දෙක පිළිබඳ කුකුසද කුකුසය, අකැප දෙයෙහි කැපය යන සංඥාව, කාලයෙහි කාලය යන සංඥාව විකාලයෙහි කාලය යන සංඥාව කාලයෙහි විකාලයයන සංඥාව නිවැරදිදෙයෙහි වැරදිය යන සංඥාව වැරදි දෙයෙහි නිවැරදිය යන සංඥාව මෙබඳුවූ යම් කුකුසක් කුකුස් කිරීමක් සිත පිළිබඳ පසුතැවීමක් ඇද්ද මෙය කුකුසයි නැවතද කරුණු දෙකකින් සිතේ පසුතැවීම් කුකුස ඇති වෙයි. කළ බැවින්ද නොකළ බැවින්ද යනුයි. (මෙහි (2-7) 7 "නින්දා කරයි" යන්න "කුකුස උපදවයි" කියා වෙනස් කොට "කෙසේ කරණලද බැවින්ද" යන තැන සිට "නිරොධය මවිසින්" යන තැනට යොදාගත යුතුයි.) යමෙකුට මේ කුකුස ප්‍රහීණද මුලින් සිඳුනේද ශාන්තද සංසිඳුනේද ඉපදීමට නුසුදුසුවූයේද ඥානය නමැති ගින්නෙන් දැවුනේද හෙතෙම කුකුස් නැති තැනැත්තේයයි කියනු ලැබේ

6 මන්ත්‍රයෙන් (නුවණින්) දොඩන්නේ උඩගු නැත්තේ යන්නෙහි "මන්ත්‍රයයි ප්‍රඥාවට කියයි යම් ප්‍රඥාවක් පජානන නම් වේද, (3-1 (iii) යම් ප්‍රඥාවක් යන තැන සිට යොදාගත යුතුයි) අමොහයයිද ධම්ම විචයයිද සම්මාදිට්ඨියයි නම්වේද, එබඳු නුවණින් පිරිවරා වටකොට වචන කියයි බොහෝසේ කියන්නේ බොහොසේ ප්‍රකාශ කරන්නේ බොහෝසේ ව්‍යවහාර කරන්නේ නපුරුසේ කියනලද නපුරුසේ කථා කරණ ලද වචන නොකියානුයි මන්තභාණී නම්. "උඩගු නොවූයේ" යන්නෙහි එහි උද්ධච්චය කවරේද සිතේ යම් විසුරුණ බවක් නොසන්සුන්කමක්, නොසන්සිඳීමක් චිත්තයාගේ වික්ෂෙපයක් භ්‍රාන්තගතියක් වේද එය උද්ධච්ච යයි කියයි. යමෙකුගේ මේ "උඩගුබව" ප්‍රහීණවූයේද මුලින් සිඳුනේද ශාන්තවූයේද සංසිඳුනේද ඉපදීමට අයොග්‍ය වූයේද ඥානය නැමැති ගින්නෙන් දැවුනේද හෙතෙම උද්ධච්චය නැති තැනැත්තේයයි කියයි"

7 "හෙතෙම ඒකාන්තයෙන් වචනයෙන් හික්මුණු බැවින් මුනි නම්වේ" යනුවෙන් මෙහි මහණතෙම මුසාවාදය අත්හැර මුසාවාදයෙන් වෙන්වූයේවෙයි. සැබෑ බස් කියන්නේ ඇදහිය හැකි වචන කියන්නේ සත්‍යවූ වචන කියන්නේ ලෝකයාට බොරු නොකියන්නේ වේද කේලාම් කීම අත්හැර කේලාම් කීමෙන් වෙන්වූයේ වෙයි. මොවුන්ගේ භෙදය පිණිස මේතනින් අසා අතන නොකියන්නේ වෙයි. අර අයගේ භෙදය පිණිස අතනින් හෝ අසා මොවුන්ට නොකියන්නේ වෙයි. මෙසේ බිඳුන අයගේ ගැලපීම පිණිස සමගිවූවන්ට අනුබලදීම පිණිස, සමගි බවෙහි යෙදුනේ, සමගි බවෙහි ඇළුනේ සමගි බවෙහි බැඳුනේ සමගි බව ඇති කරන්නාවූ වචන කියන ලද්දේවෙයි. නපුරු වචන අත්හැර නපුරු වචනයෙන් වෙන්වූයේ වෙයි. යම් ඒ වචනයක් කෙළතොලු නොවේද, කණට සැප ඇත්තේද ප්‍රේමණීයද හෘදයංගමද පුරවැසි වචනයෙන් යුක්තවූයේද බොහෝ දෙනාගේ සිත් අලවන, බොහෝ දෙනාට ප්‍රියමනාපවූ එබඳු වචන කියන ලද්දේ වෙයි. හිස් වචන කීමෙන් දුරුකොට හිස් වචන කීමෙන් වෙන්වූයේ වෙයි. සුදුසු කාලයෙහි කියන්නාවූ ඇතිදේ කියන්නාවූ අර්ථයෙන් යුත්දෙය කියන්නාවූ ධර්මවාදීවූ විනය වාදීවූ තැන්පත් වචන කියන ලද්දේ වෙයි. සුදුසු කාලයෙහිවූ කරුණු සහිත කෙළවරක් ඇති අර්ථයෙන් යුත් සතර වාග් සුචරිතයන්ගෙන් යුක්තවූ දොෂ සතරකින් වෙන්වූ වචන කියයි. දෙතිස් තිරිසන් කථාවෙන් වෙන්වූයේය. වෙන්වූයේ නික්මුනේ සීමා නොකරණ ලද සිතින් වාසය කරයි. දශ කථා වස්තූන් කියයි.

8 අල්පෙච්ඡ භාවය පිළිබඳ කථා කියයි. සන්තොෂය පිළිබඳ කථා කියයි. උතුම් විවේකය පිළිබඳ අසංසර්ගය පිළිබඳ වීර්‍ය්‍යාරම්භය පිළිබඳ ශීලය පිළිබඳ සමාධිය පිළිබඳ ප්‍රඥාව පිළිබඳ, විමුක්තිය පිළිබඳ විමුක්තිඥාන දර්ශනය පිළිබඳ කථා සතිපට්ඨාන කථා සම්‍යක් ප්‍රධාන කථා ඍද්ධි පාද කථා ඉන්ද්‍රිය කථා බල කථා බොජ්ඣංග කථා මාර්ග කථා ඵල කථා නිර්වාණ කථා කියයි. වචනයෙන් හික්මුණු ආරක්ෂාවූ ආරක්ෂා කරණලද ශාන්තභාවයෙන් යුක්තවූයේය. මුනි යනු මොනයයි ඥානයට

කියයි. යම් ප්‍රඥාවක් පජානන නම් වේද ( (3-4) (iii) යම් ප්‍රඥා යන තැන සිට යොදාගත යුතුයි) අමොහ නම් වේද ධම්මවිචය නම්වේද සම්මාදිට්ඨි නම් වේද තෘෂ්ණා ජාලය ඉක්මවා සිටියේනුයි හෙතෙම මුනි නමි.

## 10 - 4

1 "මත්තට ඇල්මක් නැත්තේ" යන්නෙහි "ඇල්ම" යයි තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද, ඇලීමක් ඇද්ද අභිධ්‍යාවක් ඇද්ද, ලොභයක් ඇද්ද, අකුසල මූලයක් ඇද්ද, එයයි. යමෙකුට මේ ඇලීම නම් තෘෂ්ණාව ප්‍රහීණවූයේද, මුලින් සිඳුනේද, සන්සිඳුනේද, ඉපදීමට අයොග්‍යවූයේද ඥානය නමැති ගින්නෙන් දැවුනේවේද, මෙසේද අනාගතයෙහි නොඇලුනේවේ. යලිදු හෝ අනාගතයෙහි මෙබඳු රූපයක් වන්නෙමි. (9-10) 9 ඡේදයේ මෙබඳු රූපයක් යන තැන සිට විඤ්ඤාණයක් යන තැනට යොදාගත යුතුයි) මෙසේද අනාගතයෙහි නොඇලුනේ වෙයි.

2 "පසුගිය දෙයට දුක් නොවේ," යනු වෙනසට පැමිණෙන වස්තුවෙහි හෝ ශෝක නොකරයි. ඒ වස්තුව වෙනස් වීමෙහි හෝ ශොක නොකරයි. මාගේ ඇස වෙනස් වූයේයයි ශොක නොකරයි. මාගේ කණ, මාගේ නාසය, මාගේ දිව, මාගේ ශරීරය, මාගේ රූපයෝ, මාගේ ශබ්දයෝ, මාගේ ගන්ධයෝ, මාගේ රසයෝ, මාගේ ස්පර්ශයෝ, මාගේ කුලය, මාගේ ගණය, මාගේ ආවාසය, මාගේ ලාභය, මාගේ කීර්තිය, මාගේ ප්‍රශංසාව, මාගේ සැපය, මාගේ සිවුර, මාගේ පිණ්ඩපාතය, මාගේ සේනාසනය, මාගේ ගිලන්පස බෙහෙත් පිරිකර, මාගේ මව, මාගේ පියා, මාගේ සහෝදරයා, මාගේ සහෝදරීය, මාගේ පුත්‍රයා, මාගේ දුව, මාගේ මිත්‍රයෝ, මාගේ යහළුවෝ, මාගේ නෑයෝ, මාගේ සහලේ නෑයෝ, වෙනස් වූයේ යයි ශෝක නොකරයි. ක්ලාන්ත නොවෙයි. නොවළපියි. ලෙහි අතගසා නොඅඬයි. සිහි මුලාබවට නොපැමිණෙයි. යනුයි.

3 "ස්පර්ශයන්හි විවේකය දක්නේ" යන්නෙහි ස්පර්ශය නම් ඇසේ ස්පර්ශය, කණේ ස්පර්ශය, නාසයේ ස්පර්ශය, දිවේ

ස්පර්ශය, කයේ ස්පර්ශය, සිතේ ස්පර්ශය, කාමයේ ස්පර්ශය, ක්‍රොධයේ ස්පර්ශය, සැප වේදනාවෙන් යුතු ස්පර්ශය, දුක්ඛ වේදනාවෙන් යුතු ස්පර්ශය, සැප හා දුකින් යුත් වේදනාවෙන් යුතු ස්පර්ශය, කුශලවූ ස්පර්ශය, අකුශලවූ ස්පර්ශය, අව්‍යාක්ත (කොටසකට අයත්) ස්පර්ශය, කාමාවචර ස්පර්ශය, රූපාවචර ස්පර්ශය, අරූපාවචර ස්පර්ශය, ලෞකික ස්පර්ශය, තමා විසින් හෝ තමා කෙරෙහි හෝ නිත්‍ය වශයෙන් හෝ ධ්‍රැව වශයෙන් හෝ ශාස්වත වශයෙන් හෝ වෙනස් නොවීම් වශයෙන් හෝ බලයි. යලිදු හෝ අතීතවූ ස්පර්ශය, අනාගත හා පවත්නා කල්හිවූ ස්පර්ශයන්ගෙන් වෙන්කොට බලයි. අනාශතවූ ස්පර්ශය අතීතවූද පවත්නා කල්හිවූද, ස්පර්ශයන්ගෙන් වෙන් කොට බලයි. පවත්නා කල්හිවූ ස්පර්ශය අතීතවූද පවත්නා කල්හිවූද ස්පර්ශයන්ගෙන් වෙන්කොට බලයි. යලිදු හෝ යම් ඒ ස්පර්ශයෝ ආයර්‍ෂද අනාශ්‍රවද, ලොකොත්තරද ශූන්‍යතාවෙන් යුක්තද ඒ ස්පර්ශයන් වෙන්ව බලයි රාගයෙන්, ද්වෙෂයෙන්, මොහයෙන්, ක්‍රොධයෙන් උපනාහයෙන්, මක්ඛයෙන්, පලාසයෙන් ඊර්ෂ්‍යාවෙන් මසුරුකමින්, මායාවෙන්, කෛරාටිකකමින්, තදගතියෙන් එකට එක කිරීමෙන්, මානයෙන්, අතිමානයෙන්, මදයෙන්, ප්‍රමාදයෙන් සියලු ක්ලේශයන්ගෙන්, සියලු ආශ්චයර්‍යයන්ගෙන්, සියලු පීඩාවලින්, සියලු දාහවලින්, සියලු තැවිලි වලින්, සියලු අකුශල රැස්කිරීම් වලින් වෙන්ව බලයි යනුයි.

4 "දෘෂ්ටීන්ටද, නො පමුණුවයි." යනු ඔහුගේ දෙසැට දෘෂ්ටි ගැනීම් ප්‍රහීණය, මුලින් සිඳුනේය. ශාන්තවීය. සංසිඳුනේය ඉපදීමට අයොග්‍යය. ඥානය නමැති ගින්නෙන් දැවුනේය. හෙතෙම දෘෂ්ටියෙන් නොයයි, බැහැර නොයයි, පා නොවෙයි, එක් තැන් නොකරයි. ඒ දෘෂ්ටි ගැන්ම සාර වශයෙන් ඉදිරිපත් නොකරයි. ආපසු නොයයි යනුයි.

## 10 - 5

1 "පතිලීනවූයේ, කුහක නොවූයේ" යන්නෙහි රාගය ප්‍රහීණවූ බැවින් පතිලීන නමි. ද්වෙෂය, මෝහය ප්‍රහීණවූ බැවින් පතිලීන නමි. ක්‍රොධය, උපනාහය, ගුණමකුකම, අනුන්ගේ දොස්කීම,

ඊර්ෂ්‍යාව, මසුරුකම, රැවටිල්ල, කෛරාටික කම, තදගතිය, එකට එක කිරීම, මානය, අතිමානය යන මොවුන් ප්‍රහීණවූ බැවින් පතිලීන නම්. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය දෙශනාකරණ ලද්දේමය. "මහණෙනි, භික්ෂුව කෙසේනම් පතිලීනවූයේවේද, මහණෙනි, මේ මහණහුගේ අස්මි මානය ප්‍රහීනවූයේවේද, මුලින් සිඳිනලද තල් ගසක් මෙන් කරණ ලද්දේ නැවත නූපදීම වශයෙන් අභාවයට පමුණුවනලද්දේද, මහණෙනි, මෙසේ වනාහි මහණ තෙම පතිලීන වූයේ වෙයි

2 "කුහක නොවූයේ" යන්නෙහි (ii) කුහක වස්තු තුනකි. ප්‍රත්‍යය සෙවීම නම්වූ කුහන වස්තුව, ඉරියාපථ නම්වූ කුහන වස්තුව, සාමන්ත ජප්පන (කෙලින් නොකියා කිට්ටු වචන වලින් කීමේ කුහන වස්තුව යනුයි. ප්‍රත්‍යය සෙවීම නම් වූ කුහන වස්තුව කවරේද? මෙහි ගෘහපතිකයෝ සිවුරු, පිණ්ඩපාත, සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරවලින් භික්ෂුවකට ආරාධනා කරත්. ලාමක ආශා ඇත්තේ ආශාවෙන් මඩනාලද්දේ සිවුරු පිණ්ඩපාත සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ඕනෑකම ඇත්තේ වැඩියෙන් ලැබීම පිණිස සිවුරු ප්‍රතික්ෂෙප කරයි. ගිලන්පස බෙහෙත් පිරිකර ප්‍රතික්ෂෙප කරයි. හෙතෙම මෙසේ කියයි. භික්ෂුවට 'බොහෝ සිවුරු කුමටද, භික්ෂුතෙම සොහොනින් හෝ කසලගොඩින් හෝ එකතුකරගත් රෙදි කැබලිවලින් සඟල සිවුරුකොට දරන්නේය, මෙය හොබනේය. භික්ෂුවට බොහෝ පිණ්ඩපාතයෙන් කවර ප්‍රයෝජනද? ආහාර ටික ටික එකතුකිරීමේ හැසිරීම වූ පිණ්ඩාහාරයෙන් හැසිරෙන්නේය. භික්ෂුවට වටිනා සෙනාසනවලින් කවර ප්‍රයෝජනද? ශ්‍රමණතෙම රුක්ඛමූලික හෝ වන්නේය. සොහොනෙහි හෝ වසන්නේය. එළිමහන් විවේක ස්ථානයක හෝ වසන්නේය. මෙය සුදුසුයි භික්ෂුවට වටිනා ගිලන්පස බෙහෙත් පිරිකරවලින් කවර ප්‍රයෝජනද, ශ්‍රමණතෙම ගෝමුත්‍රයෙහි බහාලනලද අරළුවලින් හෝ අරළු කැබලිවලින් හෝ බෙහෙත් කරන්නේය යනුයි. එතැන් පටන් රූක්ෂවූ සිවුරු දරයි. රූක්ෂවූ පිණ්ඩපාත පරිභොග කරයි. රූක්ෂවූ සේනාසන සේවනය කරයි. රූක්ෂවූ ගිලන්පස බෙහෙත් පිරිකර සේවනය

කරයි. ගෘහපතිකයෝ ඒ ඔහු ගැන මෙසේ සිතත්. මේ ශ්‍රමණතෙම අල්පවූ ආශා ඇත්තෙක. සන්තොෂයෙන් යුක්තයෙක. ගිහීන් හා සංසර්ග නොවන්නෙක. පටන්ගත් වීර්‍ය්‍යී ඇත්තෙක. ධුතාංග වාදියෙකැයි සිවුරු පිණ්ඩපාත ගිලන්පස බෙහෙත් පිරිකරවලින් වැඩිවැඩියෙන් ආරාධනා කරයි.' හෙතෙම මෙසේ කියයි. 'තුන්දෙනෙකුගේ හමුවීමෙන් ශ්‍රද්ධාවත් කුලපුත්‍රතෙම බොහෝ පින් රැස්කරයි. එනම් ශ්‍රද්ධාව ඉදිරිපත් වීමෙන් ශ්‍රද්ධාවත් කුලපුත්‍රතෙම බොහෝ පින් රැස්කරයි. දියයුතුදේ ලැබීමෙන් ශ්‍රද්ධාවත් කුලපුත්‍රතෙම බොහෝ පින් රැස්කරයි. දක්ෂිණාර්හයන් (දීමට සුදුස්සන්) හමුවීමෙන් ශ්‍රද්ධාවත් කුල පුත්‍රතෙම බොහෝ පින් රැස්කරයි. යුෂ්මතුන්ට ශ්‍රද්ධාවද ඇත දියයුතුදේද ඇත. මම ප්‍රතිග්‍රාහක (පිළිගන්නා) වෙමි. ඉදින් මම් නොපිළිගනිම් නම් මෙසේ යුෂ්මත්හු පිනෙන් වෙන්වූවෝ වන්නාහ. මට මෙයින් වැඩක් නැත එසේ නමුදු යුෂ්මතුන්ට අනුකම්පා පිණිස පිළිගන්නෙමි. එතැන් පටන් බොහෝ සිවුරු පිළිගනියි. බොහෝ පිණ්ඩපාතය පිළිගනියි. බොහෝ සේනාසන පිළිගනියි. බොහෝ ගිලන්පස බෙහෙත් පිරිකර පිළිගනියි. යම්බඳු මේ බැම හකුළුවන කුහක කමක් වේද, මෙය ප්‍රත්‍යය සෙවීම නම් වූ කුහන වස්තුවයි. ඉරියාපථ නම්වූ කුහන වස්තුව කවරේද? මෙහි ඇතැම් පුද්ගලයෙක් පාපීවූ ආශා ඇත්තේ ආශාවෙන් මඩනාලද්දේ ගරු සැලකිලි බලාපොරොත්තු වන්නේ මෙසේ මට ජනයා ගරුකරන්නේ යයි ගමන මනාසේ කරයි' වාඩි වීම මනාසේ කරයි. බලාපොරොත්තු ඇතුව යයි. බලාපොරොත්තු ඇතිව සිටියි. බලාපොරොත්තු ඇතිව හිඳගනියි. බලාපොරොත්තු ඇතුව සයනය කරයි. හික්මුන අයෙකු මෙන් යයි සිටියි' හිඳගනියි, නිදයි, ධ්‍යානයට පැමිණියකු මෙන් බලයි' කටයුතු කරයි. ඉදිරි ලැබීමක් ගැන සිතන්නේ වෙයි. මෙබඳු ඉරියව්වල යම් තැබීමක් ඇද්ද, බැම හැකිලීමක් ඇද්ද, කුහක කමක් ඇද්ද, මේ ඉරියාපථ නම්වූ කුහකවස්තුවයි. සාමන්ත ජප්පන නම්වූ (කෙලින් නොකියා සඟවා කීමේ) කුහන වස්තුව කවරේද? මෙහි ඇතැම් පුද්ගලයෙක් පාපීවූ ආශාඇත්තේ, ආශාවෙන් මඩනාලද්දේ ගරු සැලකිලි බලාපොරොත්තු වන්නේ මෙසේ ජනයා මට සලකන්නේයයි

ආර්‍ය්‍යධර්මයෙන් යුක්තවූ වචන කියයි යමෙක් මෙබඳු සිවුරු දරාද, හෙතෙම මහේශාක්‍ය ශ්‍රමණයෙකැයි කියයි. යමෙක් මෙබඳු පාත්‍රයක් දරාද, ලොහෝ තලියක් දරාද, ඩබරාවක් දරාද, පටියක් පෙරහනක් දරාද යතුරක් දරාද වහන් සඟලක් දරාද, පාත්‍ර පසුම්බියක් දරාද, හෙතෙම මහේශාක්‍ය ශ්‍රමණයා යයි කියයි. යමෙකුට මෙබඳු ආචාර්‍ය්‍යවරයෙක් වේද, මෙබඳු සමාන උපාධ්‍යායයෝ වෙත්ද, සමානාචාර්‍ය්‍යවරයෝ වෙද්ද, මෙබඳු මිත්‍රයෝ වෙද්ද, දැක හැඳිනගත් යහලුවෝ වෙත්ද, ඒ ශ්‍රමණතෙම මහේශාක්‍යයයි කියයි. යමෙක් මෙබඳු විහාරයෙහි වාසය කෙරේද, හෙතෙම මහේශාක්‍ය ශ්‍රමණයායයි කියයි. යමෙක් ගුරුළු පියාපත් වැනි වහලක් ඇති ගෙයක වෙසේද, ප්‍රාසාදයක වෙසේද, උසස් ප්‍රාසාදයක වෙසේද, ගුහාවක වෙසේද, ලෙනක වෙසේද, කුටියක වෙසේද, කූටාගාරයක වෙසේද, මැස්සක වෙසේද, රවුම් ගෙයක වෙසේද උද්දණ්ඩනම් තැනක වෙසේද, උපස්ථාන ශාලාවක වෙසේද, මණ්ඩපයෙහි වෙසේද, රුක්මූලක වෙසේද, ඒ ශ්‍රමණයා මහේශාක්‍යයයි කියයි. යලිදු හෝ රැවටිල්ලෙන් යුක්තවූ බැම හකුළුවන ගතියෙන් යුතු කුහක පැවතුම් ඇති, චාටු කථාවෙන් යුතු කටින් ගරුකම අඟවන්නාවූ මේ ශ්‍රමණතෙම මෙබඳු ශාන්තවූ විවේකවූ විහාර ලැබුයේ යයි එබඳුවූ ගැඹුරුවූ අර්ථය සඟවන්නාවූ නිපුණවූ වැසුනාවූ ලොකොත්තර තත්වයෙන් හිස්වූ කථා කියයි. ඒ බැම හකුලුවන්නාවූ කුහක බවක් ඇද්ද, මෙය සඟවා කථාකිරීමේ කුහන වස්තුව නමි. යමෙකුගේ මේ තුන් කුහන වස්තූන් ප්‍රහීණවූයේද, මුලින් සිඳුනේද, ශාන්තවූයේද, සන්සිඳුනේද ඉපදීමට අයොග්‍යවූයේද, ඥානය නමැති ගින්නෙන් දැවුනේද, හෙතෙම අකුහනයයි කියයි

3 "ආශා නැත්තේ මසුරු නොවූයේ යන්නෙහි, "ආශා" යයි තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇත්ද, ඇලීමක් ඇත්ද (මෙහි (1-3) 4 ඡේදයේ යම් ලංවීමක් යන තැන සිට යෙදිය යුතුයි) දැඩි ලොභයක් ඇත්ද, ලොභයක් ඇත්ද, අකුසල මූලයක් ඇත්ද එයයි. යමෙකුට මේ ආශාව තෘෂ්ණාව ප්‍රහීණද ශාන්තද සංසිඳුනේද, ඉපදීමට අයොග්‍යවූයේද ඥානය නමැති ගින්නෙන්

දැවුනේද, හෙතෙම අපිහාලු යයි කියයි. හෙතෙම රූපයෙහි ආශා නොකරයි. ශබ්දයෙහි, ගන්ධයෙහි රශයෙහි, ස්පර්ශයෙහි ආශා නොකරයි. කුලය, ගණය, ආවාසය, ලාභය, කීර්තිය, ප්‍රශංසාව, සැපය, චීවරය, පිණ්ඩපාතය, සෙනාසනය, ගිලන්පස, බෙහෙත් පිරිකර, කාමධාතුව, රූප ධාතුව, අරූප ධාතුව, කාමභවය, රූපභවය, අරූප භවය, සඤ්ඤා භවය, අසඤ්ඤාභවය, නෙවසඤ්ඤානාසඤ්ඤාභවය, එකවොකාර භවය, චතුවොකාර භවය, පඤ්චවොකාර භවය, අතීතය, අනාගතය, පවත්නා කලය, යනමෙහි දැකි ඇසූ ඉන්ද්‍රිය තුනකින් දැනගත් දෙයෙහි, දතයුතු ධර්මයන්හි ආශා නොකරයි. කැමති නොවෙයි. රසවිඳීම නොකරයි. ප්‍රාර්ථනා නොකරයි. බලාපොරොත්තු නොවෙයි. එබැවින් "අපිහාලු" නම්

4 "මසුරු නොවූයේ" යනු මසුරුකම් පසෙකි. ආවාස මච්ඡරිය, කුලමච්ඡරිය, වණ්ණමච්ඡරිය, ලාභ මච්ඡරිය, ධම්ම මච්ඡරිය, යනුයි. යමෙකුට මෙබඳුවූ මසුරු කමක් මසුරු කමට යාමක් මසුරු තත්වයක් බලවත් ආශාවක් තද මසුරුකමක් සිතේ බලවත් බන්ධනයක් ගැනීමක් ඇද්ද, මෙය මසුරු කමයයි කියත්. යලිදු ස්කන්ධයන්හි මසුරුකමද මසුරු කමකි. ධාතුන්හි මසුරු කමද මසුරු කමකි. ආයතනයන්හි මසුරු කමද මසුරු කමකි. ගැනීමකි, මෙයද මසුරු කමයයි කියත්. යමෙකු ගේ මේ මසුරුකම ප්‍රහීණවූයේද, සංසිඳුනේද ඉපදීමට අයොග්‍යවූයේද, ඥානය නමැති ගින්නෙන් දැවුනේද හෙතෙම අමච්ඡරී (මසුරු නැත්තේය කියයි.)

5 "ආඩම්බර නැත්තේ පිළිකුල් නොවන්නේ" යන්නෙහි ආඩම්බර යනු උඩගු හෝ නොනැමෙනගති තුනකි. එනම් කයේ උඩගුකම වචනයේ උඩගුකම, සිතේ උඩගුකම යනුයි. කයේ උඩගුකම කෙසේ දක්වයිද? මෙහි ඇතැම් පුද්ගලයෙක් සංඝයා මැදට ගියේ ගරු කිරීමක් නොකළේ ස්ථවිර භික්ෂූන් හා හැපෙමින්ද සිටියි. ගැටෙමින්ද හිඳගනියි. මුලින්ද සිටියි. පෙරටුවද හිඳගනියි. උස් ආසනයෙහිද හිඳගනියි. හිස පටන් වසා හිඳගනියි. සිටි වනම කථාකරයි. අත් වනමින්ද කථා කරයි.

මෙසේ සඟ මැදට ගියේ කායික උඩඟුකම අඟවයි. කෙසේ සමූහයා මැදට ගියේ කායික උඩඟුකම දක්වයිද, මෙහි ඇතැම් පුද්ගලයෙක් සමූහයා මැදට ගියේ ගරුකිරීමක් නැතිවූයේ සක්මන් කරණ වහන් නොපයලූ ස්ථවිර භික්ෂූන් සමග වහන් පයලා සක්මන් කරයි. ස්ථවිර භික්ෂූන් පහත් සක්මන්හි සක්මන් කරද්දී උස්වූ සක්මන්හි සක්මන් කරයි. ස්ථවිර භික්ෂූන් (සක්මන් මලුව නැති) බිම සක්මන් කරද්දී සක්මනෙහි සක්මන් කරයි. ගැටෙන්නේද සිටියි. පෙරටුවද හිඳියි. උස් අසුනෙහි හිඳියි. හිසපටන් පොරවාද හිඳියි. සිටිවනම කථාකරයි. අත්වනමින්ද කථාකරයි.  මෙසේ සමූහයා මැදට ගියේ කායික උඩඟුකම පෙන්වයි. භොජනශාලාවෙහි කායික උඩඟුකම කෙසේ දක්වයිද, මෙහි ඇතැම් පුද්ගලයෙක් භොජන ශාලාවෙහි ගරුත්වයක් නැත්තේ ස්ථවිර භික්ෂූන් හා හැපී හිඳ ගනියි. නවක භික්ෂූන් අසුනෙන් වළක්වයි. ගැටෙමින් සිටියි. ගැටෙමින් හිඳියි. පෙරටුවද සිටියි. පෙරටුවද හිඳියි උස් අසුනෙහිද හිඳියි. හිසපටන් පොරවාද හිඳියි. සිටි වනම කථා කරයි. අත වනමින්ද කථා කරයි. මෙසේ භොජන ශාලාවෙහි කායික උඩඟුකම පෙන්වයි. කෙසේ ගිනිහල්ගෙයි කායික උඩඟුකම පෙන්වයිද, මෙහි ඇතැම් පුද්ගලයෙක් ගිනිහල්ගෙයි ගරුත්වයක් නැත්තේ ස්ථවිර භික්ෂූන් හා ගැටෙමින් සිටියි. ගැටෙමින් හිඳියි. පෙරටුවද සිටියි. පෙරටුවද හිඳියි. උස් අසුනෙහිද හිඳියි. නොඅසා නොකියාම දර ඉවත් කරයි. දොරද වසයි. අත්වනමින්ද කථාකරයි. මෙසේ ගිනිහල්ගෙයි කායික උඩඟුකම පෙන්වයි. කෙසේ (නාන) තොටෙහි කායික උඩඟුකම පෙන්වයිද? මෙහි ඇතැම් පුද්ගලයෙක් නාන තොටෙහි ගරුත්වයක් නැත්තේ ස්ථවිර භික්ෂූන් හා ගැටෙමින් දියට බසියි. පෙරටුවද බසියි. ගැටෙන්නේද නායි, පෙරටුවද නායි, මත්තෙහිද නායි. ගැටෙන්නේද ගොඩනගියි. පෙරටුවද ගොඩ නගියි. මත්තෙන්ද ගොඩ නගියි. මෙසේ නාන තොටෙහි කායික උඩඟුකම පෙන්වයි. කෙසේ ඇතුළු ගමට පිවිසෙන්නේ කායික උඩඟුකම දක්වයිද? මෙහි ඇතැම් පුද්ගලයෙක් ඇතුළු ගමට පිවිසෙන්නේ 'ස්වාමීනි, ඇතුළු නොවන්නයයි' කියමින් ඇතුළුවෙයි. 'ස්වාමීනි,

නොසිටින්නයයි' කියමින් නැගිට සිටියි. ස්වාමීනි, හිඳ නොගන්නයයි කියමින් හිඳ ගනියි ඉඩ නැති කොටද සිටියි. ඉඩ නැතිකොටද හිඳ ගනියි. ඉඩනැති තැනද හිඳ ගනියි. යම් ඒ ගෙදරවල වැසුන රහසිගත කාමර වෙත්ද, යම් තැනක කුල ස්ත්‍රීවරු දූ වරු කුලකුමාරිකාවරු හිඳගනිත්ද එහි වේගයෙන් පිවිසෙයි. කුමරුවන්ගේද හිස අතගායි. මෙසේ ඇතුළු ගමට හෝ (ගෙට) පිවිසියහුගේ කායික උඩඟුකම පෙන්වයි.

6 "කෙසේ වචනයේ උඩඟුකම පෙන්වයිද" මෙහි ඇතැම් පුද්ගලයෙක් සංඝයා මැදට ගියේද වචනයේ උඩඟුකම පෙන්වයි. ගණයා මැදට ගියේද වචනයේ උඩඟුකම පෙන්වයි. ඇතුළු ගමට පිවිසියේද වචනයේ උඩඟුකම පෙන්වයි. මෙහි ඇතැම් පුද්ගලයෙක් සංඝයා මැදට ගියේ ස්ථවිර භික්ෂූන් නොවිචාරා හෝ ආරාධනා නොකොට හෝ බණ කියයි. ප්‍රශ්න විසඳයි. ප්‍රාතිමොක්ෂය දෙශනා කරයි. සිටිවනම කියයි. අත් වනමින් කථාකරයි. මෙසේ සඟ මැදට ගියේ වචනයේ උඩඟුකම පෙන්වයි.

7 ගණයා මැදට ගියේ කෙසේ වචනයේ උඩඟුකම පෙන්වයිද? මෙහි ඇතැම් පුද්ගලයෙක් ගණයා මැදට ගියේ ගරුත්වයක් නැත්තේ ස්ථවිර භික්ෂූන් නොවිචාරා හෝ ආරාධනා නොකොට හෝ ආරාමයට ගිය භික්ෂූන්ට බණ කියයි. ප්‍රශ්න විසඳයි සිටිවනම කියයි. අතවනමින්ද කථා කරයි. ආරාමගතවූ භික්ෂුණීන්ට උපාසකයන්ට උපාසිකාවන්ට බණ කියයි. ප්‍රශ්න විසඳයි, සිටිවනම කියයි. අතවනමින්ද කථාකරයි. මෙසේ ගණයා මැදට ගියේ වචනයේ උඩඟුකම පෙන්වයි.

8 කෙසේ ඇතුළු ගමට පිවිසියේ කායික උඩඟුකම වෙන්වෙයිද මෙහි ඇතැම් පුද්ගලයෙක් ඇතුළු ගමට පිවිසියේ ස්ත්‍රියකට හෝ කුමාරියකට හෝ මෙසේ කියයි. මෙබඳු නම් ඇත්තිය, මෙබඳු ගොත්‍ර ඇත්තිය, කුමක් තිබේද? කැඳ තිබේද, බත් තිබේද, කන දෙයක් තිබේද කවරක් බොමුද, කවරක් කමුද, කුමක් ඇත්තේද කවරක් මට පෙන්වන්නෙහිදැයි' නන්දොඩවයි. යම් මෙබඳුවූ වචනයක් හිස් කථාවක්,

නන්දෙඩීමක් නැලවිලි කථාවක් වේද, මෙසේ ඇතුළුගමට පිවිසියේ වචනයේ උඩඟුකම පෙන්වයි.

චෛතසික උඩඟුකම කෙසේද’ මෙහි ඇතැම් පුද්ගලයෙක් උසස් කුලයකින් පැවිදි නොවූයේ උසස් කුලයකින් පැවිදිවූවකු සමග තමා සමානව සිතින් පිළිගනියි. මහා කුලයකින් පැවිදිනුවූයේ මහා කුලයකින් පැවිදිවූවකු සමග තමා සමානව සිතින් පිළිගනියි. මහා භොග කුලයකින් පැවිදිනුවූයේ මහාභොග කුලයකින් පැවිදිවූවකු සමග සිතින් තමා පිළිගනියි. මහත්වූ භොග ඇති කුලයකින් පැවිදිනුවූයේ මහත්වූ භොග ඇති කුලයකින් පැවිදිවූවකු සමග සිතින් තමා පිළිගනියි. සූත්‍රාන්තිකයෙකු නොවූයේ සූත්‍රාන්තිකයක් සමග තමා සිතින් පිළිගනියි. විනය ධරයෙක් නොවූයේ ධර්ම කථිකයෙක් නොවූයේ. ආරඤ්ඤිකයෙක් නොවූයේ පිණ්ඩපාතිකයෙක් නොවූයේ, පාංශුකූලිකයෙක් නොවූයේ, තෙචීවරිකයෙක් නොවූයේ, සපදානචාරික නොවූයේ, ඛලුපච්ඡා භත්තිකනොවූයේ, නෙසජ්ජික නොවූයේ, යථාසන්තතික නොවූයේ, ප්‍රථමධ්‍යානය නොලැබූයේ ප්‍රථමධ්‍යානය ලැබූවකු සමග සිතින් තමා පිළිගනියි. නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්ති ලාභීනොවූයේ නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්ති ලාභියකු සමග තමා සිතින් පිළිගනියි. මේ චෛතසික උඩඟුකමයි. යමෙකුගේ මේ තුන් (උඩඟුකම) නොහික්මීම් ප්‍රහීණවූවාහුද මුලින් සිඳුනාහුද ශාන්තද, සංසිඳුනාහුද ඉපදීමට අයොග්‍යවූවාහුද ඥානය නමැති ගින්නෙන් දැවුනාහුද හෙතෙම උඩඟු නැති (හික්මුන) පුද්ගලයායයි කියයි.

**9** පිළිකුල් නොවන්නේ යනු පිළිකුල් කටයුතු පුද්ගලයෙක් ඇත. පිළිකුල් නොකටයුතු පුද්ගලයෙක් ඇත. පිළිකුල් කටයුතු පුද්ගලයා කවරේද? මෙහි ඇතැම් පුද්ගලයෙක් දුශ්ශීලද පාපධර්ම ඇත්තේද, කැතකුණු පිරුණු තැනක් බඳුවූයේ රහසෙහි කරණ වැඩ ඇත්තේ අශ්‍රමණව ශ්‍රමණයයි අඟවන්නේ අබ්‍රහ්මචාරීව බ්‍රහ්මචාරීයයි අඟවන්නේ, ඇතුළත කුණුව වැගිරෙණ කසල ඇත්තේද, මේ පුද්ගල තෙම පිළිකුල් කටයුතුයයි කියයි. යලිදු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

හෝ බලවත් සිත්තැවුල් ඇත්තේ ක්‍රොධ ඇත්තේ වේද, ටිකක් කථා කළේ, කිපේද, තරහ ඇතිකෙරේද, කොපයද ද්වෙෂයද නොසතුටද පහළ කරයි. මේ පිළිකුල් කටයුතු පුද්ගලයා වෙයි. යලිදු හෝ ක්‍රොධ ඇත්තේද, බද්ධ වෛර ඇත්තේද, ගුණමකු බව ඇත්තේද, අනුන් දොස් සොයන්නේද, ඊර්ෂ්‍යා ඇත්තේද, මසුරු ඇත්තේද, කපටිකම් ඇත්තේද, රැවටිල්ලෙන් යුක්තද, තද ගති ඇත්තේද, අතිමානයෙන් යුක්තද, පාපීවූ ආශා ඇත්තේද, මිථ්‍යාදෘෂ්ටි ඇත්තේද, මෙලොව බලාපොරොත්තු වන්නේද, අමාරුවෙන් බැහැර කටයුතු දැඩිව අල්වා ගැනීම් ඇත්තේද, මේ පිළිකුල් කටයුතු පුද්ගලයා වෙයි. පිළිකුල් නොකටයුතු පුද්ගලයා කවරේද? මෙහි භික්ෂුතෙම සිල් ඇත්තේ ප්‍රාතිමොක්ෂ සංවරයෙන් හික්මුනේ වාසය කෙරේද, ආචාරයෙන් ගෝචරයෙන් යුක්තවූයේ ස්වල්පවූ වරදෙහිද භය දකිමින් වාසය කරන්නේ ශික්ෂා පදයන් සමාදන්ව හික්මේද, මේ පිළිකුල් නොකටයුතු පුද්ගලයා යයි කියයි. යලිදු හෝ සිත් තැවීම් බහුලකොට නැත්තේ ක්‍රොධ නැත්තේවේද, බොහෝ දේ කීවේද නොකීවේද තරහ නොවේද, කෝපයද ද්වෙෂයද නොසතුටද ඇති නොකෙරේද, මේ පිළිකුල් නොකටයුතු පුද්ගලයායයි කියයි. යලිදු හෝ ක්‍රොධ නැත්තේවේද, බද්ධ වෛර නැත්තේ වේද, ගුණමකු නොවූයේවේද, අනුන් දොස් නොසොයන්නේ වේද, ඊර්ෂ්‍යා නැත්තේවේද මසුරු නැත්තේවේද, කෛරාටික නුවූයේවේද, රැවටිලි නැත්තේ වේද, තද ගති නැත්තේ වේද, අතිමානය නැත්තේවේද, පාපීවූ ආශා නැත්තේ වේද, මිථ්‍යාදෘෂ්ටි නොවේද, මෙලොව ආශාව බලවත් නොවේද, දැඩිව අල්වා නොගන්නේ පහසුවෙන් බැහැර කළ හැක්කේවේද මේ පිළිකුල් නොකටයුතු පුද්ගලයායයි කියයි. සියලු බාල පෘථග්ජනයෝ පිළිකුල් කටයුත්තෝය. කළ්‍යාණ පෘථග්ජනයාගේ පටන් අෂ්ටායී පුද්ගලයෝ පිළිකුල් නොකටයුත්තෝය යනුයි.

10 "කේලාම් කීමෙහිද නොයෙදුණේ" යන්නෙහි "කේලාම් කීමක්" යනු මෙහි ඇතැම් පුද්ගලයෙක් කේලාම් කියන්නේවේද, මොවුන්ගේ භෙදය පිණිස මෙතනින් අසා අසවල් තැන කියන්නේවේද, අර අයගේ භෙදය පිණිස එතන්හි අසා මොවුන්ට

කියන්නේද මෙසේ සමගිවූවන්ගේ භෙදය පිණිස බිඳුනවුන් තවත් බිඳීම පිණිස යෙදෙන්නේ භෙද කිරීමෙහි ඇලෙන්නේ භෙද කරණ වචන කියන්නේ වෙයි. මෙය "කේලම" යයි කියයි නැවතද, කරුණු දෙකකින් කේලම ඇතිකරයි. ප්‍රිය කරගැණීම පිණිස හෝ බිඳීමේ බලාපොරොත්තුවෙන් හෝ යනුයි. ප්‍රියකර ගැණීම පිණිස කෙසේ කේලම ඇතිකරයිද, මොහුට ප්‍රිය වන්නෙමි. මනාප වන්නෙමි. විශ්වාස වන්නෙමි. අභ්‍යන්තරික වන්නෙමි. යහලුවන්නෙමියි' මෙසේ ප්‍රියකර ගැණීමේ හේතුවෙන් කේලම ඇතිකරයි. බිඳීමේ අදහසින් කෙසේ කේලම ඇති කරයිද, මොවුහු කෙසේ නොයෙක් කොටස්වලට බෙදෙන්නාහුද, වෙන් වන්නාහුද, වර්ග වන්නාහුද, දෙකට බෙදෙන්නාහුද, දෙපක්ෂයක් වන්නාහුද, බිඳෙන්නාහුද, සමාගම නොවන්නාහුද, දුක්වූ අපහසු විහරණයක් කරන්නාහුදැයි මෙසේ බිඳීමේ අදහසින් කේලම ඇති කරයි. යමෙකුගේ මේ කේලම ප්‍රහීණවූයේද මුලින් සින්දේද සංසිඳුනේද, ඉපදීමට අයොග්‍ය වූයේද, ඥානය නමැති ගින්නෙන් දැවුනේද හෙතෙම කේලමින් යුක්ත නොවූයේය, නොයෙදුනේය යනුයි.

## 10 - 6

1 "ඇලුම් කටයුතු දේවල නොඇලෙන්නේ" යන්නෙහි "ඇලුම් කටයුතු" යනු පංචකාම ගුණයන්ට කියත්. බොහෝ සෙයින් දිව්‍ය මනුෂයෝ පංචකාම ගුණයන් කැමති වෙත්. රස විඳිත්. බලාපොරොත්තු වෙත්. ආශා කරත්. ඇලෙත්. ඒ කාරණයෙන් පංචකාම ගුණයෝ "ඇලුම් කටයුතු" යයි කියත්. යම් කෙනෙකුන්ගේ මේ "ඇලුම් කටයුතු" නම් තෘෂ්ණාව ප්‍රහීණ නුවූයේද, ඔවුන්ගේ ඇසින් රූප තෘෂ්ණාව වැගිරෙයි; ගලයි, පවතියි. කණින් ශබ්ද තෘෂ්ණාව, නාසයෙන් ගන්ධ තෘෂ්ණාව, දිවෙන් රශ තෘෂ්ණාව, කයින් ස්පර්ශ තෘෂ්ණාව, සිතින් ධර්ම තෘෂ්ණාව වැගිරෙයි, ගලයි, පවතියි, යම් කෙනෙකුන්ගේ මේ " සාතියා" නම් තෘෂ්ණාව ප්‍රහීණවූයේද, මුලින් සිඳුනේද, ශාන්තවූයේද, ඉපදීමට අයොග්‍ය වූයේද, ඥානය නමැති ගින්නෙන් දැවුනේද, ඔවුන්ගේ ඇසින් රූප තෘෂ්ණාව (iv)

නොවැගිරෙයි. නොගලයි. නොපවතියි. (v) කනින් ශබ්ද තෘෂ්ණාව (මෙහි (iv) යෙදිය යුතුයි.) නාසයෙන් ගන්ධ තෘෂ්ණාව (මෙහි (iv) යෙදිය යුතුයි.) දිවෙන් රස තෘෂ්ණාව (මෙහි (iv) යෙදිය යුතුයි.) කයින් ස්පර්ශ තෘෂ්ණාව (මෙහි (iv) යෙදිය යුතුයි.) සිතින් ධර්ම තෘෂ්ණාව නොවැගිරෙයි, නොගලයි, නොපවතියී.

2 "අතිමානයේද නොයෙදුණේ" යන්නෙහි අතිමානය කවරේද, මෙහි ඇතැම් පුද්ගලයෙක් (ii) ජාතියෙන් හෝ ගෝත්‍රයෙන් හෝ කුලයෙන් හෝ ශරීර පැහැයෙන් හෝ ධනයෙන් හෝ වෙනින් අනික් දෙයකින් හෝ අන්‍යයා පහත් කොට සිතයි (iii) යම්බඳු සිතේ මේ බඳුවූ මානයක් සිතීමක් උසස් කමක් උඩට ඔසවා ගත් ධජයක් සේ ගැන්මක් කොඩියක් සේ කිරීමක් ඇද්ද, මෙය අතිමාන යයි කියයි. යමෙකුගේ මේ අතිමානය, ප්‍රහීණද, මුලින් සිඳුනේද, ශාන්තද සංසිඳුනේද, ඉපදීමට අයොග්‍යද ඥානය නමැති ගින්නෙන් දැවුනේද හෙතෙම අතිමානයෙහි නොයෙදුනේය යනුයි.

3 "තීක්ෂණවූයේ, වැටහීම් ඇත්තේ" යන්නෙහි "තීක්ෂණ" යනු මෘදු යනුයි. මෘදුවූ වාග් කර්මයෙන් යුක්තනුයි සණ්හ නම්. මෘදුවූ මනො කර්මයෙන් යුක්තනුයි සණ්හ නම්. මෘදුවූ සිහිය පිහිටුවීමෙන් යුක්තනුයි සණ්හ නම්. මෘදුවූ සම්‍යක් ප්‍රධානයන්ගෙන් යුක්තනුයි "තීක්ෂණ" නම්. මෘදුවූ ඍද්ධි පාදයන්ගෙන් යුක්තනුයි. මෘදුවූ ඉන්ද්‍රිය යන්ගෙන් මෘදුවූ බලයන්ගෙන් මෘදුවූ බොධ්‍යංගයන්ගෙන් මෘදුවූ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයෙන් යුක්තනුයි තීක්ෂණ නම්. "වැටහීම් ඇත්තේ" යනු ප්‍රතිභානවත්හු තිදෙනෙකි. පරියත්ති ප්‍රතිභානය ඇත්තා, පරිපුච්ඡා ප්‍රතිභානය ඇත්තා, අධිගම ප්‍රතිභානය ඇත්තා යනුයි. පරියත්ති ප්‍රතිභානය ඇත්තා කවරේද, මෙහි ඇතැම් පුද්ගලයෙකුට (ii) සූත්‍රය, ගෙය්‍යය, වෙය්‍යාකරණ, ගාථාය, උදානය, ඉතිවුත්තකය, ජාතකය, අබ්භූත ධර්මය, වෙදල්ලය යන ධර්මයන්ගේ දැනීම ප්‍රකෘතියෙන්ම ඇත්තේ වෙයි. ඔහුට පර්යාප්ති ආශ්‍රයෙන් වැටහෙයි. මේ පර්යාප්ති වැටහීමයි. පරිපුච්ඡා ප්‍රතිභානය

කවරේද, මෙහි ඇතැම් පුද්ගලයෙක්, ආත්මාර්ථයෙහිද, ඥානාර්ථයෙහිද, ලක්ෂණයෙහිද, කාරණයෙහිද, ස්ථානස්ථානයෙහිද ප්‍රශ්න කිරීම වෙයි. ඔහුට ඒ විචාරීම ආශ්‍රයයෙන් ඇතිවෙයි. මේ පරිපුච්ඡා ප්‍රතිභානයයි. අධිගම ප්‍රතිභානය කවරේද, මෙහි ඇතැම් පුද්ගලයෙකුට සතර සතිපට්ඨාන, සතර සම්‍යක් ප්‍රධාන, සතර ඍද්ධිපාද, පඤ්චෙන්ද්‍රිය, පඤ්ච බල, සප්ත බොධ්‍යංග, ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය, සතර ආර්‍ය්‍ය මාර්ගයෝ සතර සාමඤ්ඤ ඵල, සතර ප්‍රතිසම්භිදාවෝ, ෂඩ් අභිඥාවෝ, දැන ගත්තාහු වෙත්. ඔහුට අර්ථය ප්‍රකටය, ධර්මය ප්‍රකටය, නිරුක්තිය ප්‍රකටය, අර්ථය ප්‍රකට කල්හි අර්ථය වැටහෙයි. ධර්මය ප්‍රකට කල්හි ධර්මය වැටහෙයි. නිරුක්තිය ප්‍රකට කල්හි නිරුක්තිය වැටහෙයි. මේ තුන් ඥානයන්හි ඥානය ඇතිවීම පටිභාන පටිසම්භිදා නමි. මේ ප්‍රතිභාන ප්‍රති සම්භිදාවෙන් යුක්තවූයේද, හෙතෙම ප්‍රතිභානයෙන් යුක්තයයි කියයි. යමෙකුට පර්‍ය්‍යාප්තිය නැද්ද, පරිපුච්ඡාව නැද්ද, අධිගමය නැද්ද, ඔහුට කුමක් වැටහෙන්නේද, යනුයි.

4 "අදහන්නේ නොවේ. කලකිරෙන්නේ නොවේ." (ඇදහීම නැත්තේ ඇලීමෙන් තොරනොවේ) යනු ස්වකීය ඥානයෙන් දන්නාලද (i) තමාට ප්‍රත්‍යක්ෂවූ ධර්මය අන්‍යවූ ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ප්‍රත්‍යක්ෂ නොවෙයි. (ii) සියලු සංස්කාරයෝ අනිත්‍යයයි තෙමේ ස්වකීය ඥානයෙන් දන්නා ලද 4 (i) ඡේදය යෙදිය යුතුයි.) සියලු සංස්කාරයෝ දුක්යයි 4 (i) ඡේදය යෙදිය යුතුයි) සියලු ධර්මයෝ අනාත්මයයි 4 (i) ඡේදය යෙදිය යුතුයි) අවිද්‍යා හේතුවෙන් සංස්කාරයෝ (රැස්කිරීම්) ඇතිවේයයි 4 (i) ඡේදය යෙදිය යුතුයි) ජාති හේතුවෙන් ජරා මරණ වේයයි ජාති නිරොධයෙන් ජරා මරණ නිරොධය වේයයි මෙය දුක්යයි (4 (i) ඡේදය යෙදිය යුතුයි) මේ දුක් නිරුද්ධ කිරීමේ ප්‍රතිපදාවයයි මේ කෙලෙස්යයි (4 (ii) ඡේදය යෙදිය යුතුයි) මේ කෙලෙස් නැතිකිරීමට ගමන් කිරීමේ ප්‍රතිපදාවයයි මේ ධර්මයෝ දැනගතයුතුයයි (4 (ii) ඡේදය යෙදිය යුතුයි.) ධර්මයෝ ප්‍රත්‍යක්ෂ කටයුතුයයි තෙමේ ස්වකීය ඥානයෙන් දන්නාලද (4 (i) ඡේදය

යෙදිය යුතුයි.) සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ (iii) ඇතිවීමද නැතිවීමද රශවිඳීමද නික්මයාමද පස්වැදෑරුම් උපාදානස්කන්ධයන්ගේ ඇතිවීමද (4 (iii) යොදාගන්න.) සතරමහා භූතයන්ගේ ඇතිවීමද නැතිවීමද රශවිඳීමද ආදීනවයද නික්මීමද 4 (i) ඡෙදය යෙදිය යුතුයි) තෙමේ ස්වකීය ඥානයෙන් දන්නාලදී යම්කිසි හේතුවකින් උපන් ධර්මයක් ඇද්ද ඒ සියල්ල නිරොධය පිණිස පවත්නේයයි තෙමේ ස්වකීය ඥානයෙන් දන්නාලදී. තමාට ප්‍රත්‍යක්ෂවූ ධර්මය අනික් ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණකුට හෝ දෙවියකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ කිසිවෙකුට ප්‍රත්‍යක්ෂ නොවේයයි මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. ශාරීපුත්‍රය, ශ්‍රද්ධා ඉන්ද්‍රිය වඩනලද්දේ බොහෝ වශයෙන් පුරුදු කරණ ලද්දේ නිවණට බැස ගත්තේ වෙයි. නිර්වාණය පිහිට කොට ඇත්තේ වෙයි. නිර්වාණය කෙළවර කොට ඇත්තේ වෙයි යනු ඔබ අදහන්නෙහිද වීරියින්ද්‍රිය සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය පුරුදු කරණ ලද්දේ බොහෝ වශයෙන් පුරුදු කරණ ලද්දේ නිවණට බැසගත්තේ වෙයි. නිවණ පිහිටකොට ඇත්තේ වෙයි. නිවණ අවසන්කොට ඇත්තේ වෙයි යනුයි. ස්වාමීනි මෙහි භාග්‍යවතුන් වහන්සේගේ ඇදහීමෙන් යම් එනම් ශ්‍රද්ධාඉන්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය වඩන ලද්දේ බහුල වශයෙන් පුරුදු කරණ ලද්දේ නිවණට බැසගත්තේ වෙයි. නිවණ පිහිටකොට ඇත්තේ වෙයි. යන මේ කරුණෙහිය. ස්වාමීනි, මෙය යමෙකුට සිත් නොගන්නා ලද්දේ නොදක්නා ලද්දේද ප්‍රත්‍යක්ෂ නොකරණ ලද්දේද ප්‍රඥාවෙන් ස්පර්ශ නොකරණ ලද්දේද එහි ඔවුහු අනුන්ගේ ඇදහීමෙන් යන්නාහුය. ශ්‍රද්ධා ඉන්ද්‍රිය වඩන ලද්දේද බහුල වශයෙන් පුරුදුකරණ ලද්දේද නිවණට බැස ගත්තේ වෙයි නිවණ පිහිටකොට ඇත්තේය. නිවණ කෙළවරකොට ඇත්තේය. විරියන්ද්‍රිය සතින්ද්‍රිය සමාධින්ද්‍රිය පඤ්ඤින්ද්‍රිය වඩන ලද්දේ බහුල වශයෙන් පුරුදු කරණ ලද්දේ නිවණට බැසගත්තේ වෙයි. නිවණ පිහිට කොට ඇත්තේ වෙයි. නිවණ කෙළවර කොට ඇත්තේ වෙයි. ස්වාමීනි,

යම් කෙනෙකුන් විසින් මෙය ප්‍රඥාවෙන් දන්නා ලදද දකින ලදද ප්‍රත්‍යක්ෂ කරණ ලදද, ස්පර්ශ කරණ ලදද, ඔවුහු එහි සැක නැත්තාහ. ශ්‍රද්ධා ඉන්ද්‍රිය වඩන ලද්දේ බහුල වශයෙන් පුරුදු කරණ ලද්දේ නිර්වාණයට බැසගත්තේ වෙයි නිර්වාණය පිහිටකොට ඇත්තේ වෙයි. නිර්වාණය කෙළවර කොට ඇත්තේ වෙයි. විරියින්ද්‍රිය සතින්ද්‍රිය සමාධින්ද්‍රිය පඤ්ඤින්ද්‍රිය වඩන ලද්දේ බහුල වශයෙන් පුරුදු කරණ ලද්දේ නිර්වාණයට බැස ගත්තේ වෙයි. නිර්වාණය පිහිට කොට ඇත්තේ වෙයි ස්වාමීනි, මවිසින්ද මේ ධර්මය නුවණින් දන්නා ලද්දේය. දකින ලද්දේය, ප්‍රත්‍යක්ෂ කරණ ලද්දේය ස්පර්ශ කරණ ලද්දේය.

මම එහි සැක නැත්තෙක් වෙමි (i) ශ්‍රද්ධා ඉන්ද්‍රිය විරියින්ද්‍රිය සතින්ද්‍රිය සමාධින්ද්‍රිය පඤ්ඤින්ද්‍රිය වඩන ලද්දේ බහුලවශයෙන් පුරුදු කරණ ලද්දේ වෙද, නිවණට බැස ගත්තේ වෙයි. නිවණ පිහිටකොට ඇත්තේ වෙයි. නිවණ කෙළවරකොට ඇත්තේ වෙයි. සාධු! සාධු!! ශාරීපුත්‍රය, යම් කෙනෙකුන් විසින් නුවණින් මෙය නොදන්නා ලදද නොදක්නා ලදද ප්‍රත්‍යක්ෂ නොකරණ ලදද ඔවුහු එහි අනුන්ගේ ඇදහීමෙන් යන්නාහුය. එනම්, ශ්‍රද්ධාඉන්ද්‍රිය (මෙහි (i) යොදාගන්න) පඤ්ඤින්ද්‍රිය වඩන ලද්දේ බහුල වශයෙන් පුරුදු කරණ ලද්දේ නිවණට බැස ගත්තේ වෙයි. නිවණ පිහිටකොට ඇත්තේ වෙයි. නිවණ කෙළවර කොට ඇත්තේ වෙයි. යනුවෙනි.

**5** "යම් මිනිසෙක් අශ්‍රද්ධාවද කළගුණ නොදන්නා බවද ගෘහසන්ධි බිඳීමද යන මෙයට ඇති ඉඩ නැතිකෙළේ ආශාව දුරු කළේ වේද, හෙතෙම උතුම් පුරුෂයා යයි කියයි" සියලු බාල පෘථග්ජනයෝ ඇලෙති. කල්‍යාණ පෘථග්ජනයා පටන් සප්තශෛක්ෂයෝ නො ඇලෙත් රහතුන් වහන්සේ නොම ඇලේමය. නොඇලුනාවූ හෙතෙම රාගය ක්ෂය කිරීමෙන් වීතරාගවූ බැවින් ද්වෙෂය ක්ෂය කිරීමෙන් වීත දොෂවූ බැවින් මොහය ක්ෂය කිරීමෙන් වීත මොහවූ බැවින් හෙතෙම වැස නිමවූයේ පුරුදු කළ හැසිරීම් ඇත්තේ ඔහුට ඉපදීම් මරණ ඇති සංසාරයක් නැත, නැවත ඉපදීමක් නැත.

## 10 - 7

1 "ලාභ කැමැත්තෙන් නොහික්මෙයි. අලාභයෙහිදීද නොකිපෙයි. ලාභය කැමැත්තෙන් නොහික්මෙයි. අලාභයෙහිද නොකිපෙයි" යන්නෙහි කෙසේ ලාභය කැමැත්තෙන් හික්මේද? "මහණෙනි, මෙහි මහණතෙම ලාභය ඇති, සිවුරු පිණ්ඩපාත සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබන භික්ෂුවක් දකියි. ඔහුට මේ අදහස වෙයි. මේ ආයුෂ්මත්තෙම කවර හේතුවකින් සිවුරු පිණ්ඩපාත සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබන්නෙක්වීද, යනුයි. ඔහුට මේ අදහස වෙයි.

(ii) මේ ආයුෂ්මත්තෙම සූත්‍ර පිටකය උගත් කෙනෙක. එබැවින් මේ ආයුෂ්මත්තෙම (iii) සිවුරු පිණ්ඩපාත සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබන්නෙක් වෙයි. හෙතෙම ලාභය හේතුවෙන් ලාභය ඉපදීමේ බලාපොරොත්තුවෙන් ලාභය දියුණුකරන්නේ සූත්‍ර පිටකය ඉගෙණගනියි. මෙසේද ලාභය කැමැත්තෙන් හික්මෙයි (iv) ඔහුට මේ අදහස වෙයි. මේ ආයුෂ්මත්තෙම විනය උගත් කෙනෙක මෙහි (ii) (iii) යෙදිය යුතුහි ධර්ම කථිකයෙක. අභිධර්මය උගත් කෙනෙක. මෙහි (ii) (iii) යෙදිය යුතුයි.

ඔහුට මේ අදහසවෙයි. මේ ආයුෂ්මත්තෙම් ආරඤ්ඤිකයෙක. පිණ්ඩපාතිකයෙක, පංශුකූලිකයෙක, තෙචීවරිකයෙක, සපදාන චාරිකයෙක බලුපච්ඡාභත්තිකයෙක, නෙසජ්ජිකයෙක යථාසන්තතිකයෙක, එබැවින් මේ ආයුෂ්මත් තෙම සිවුරු පිණ්ඩපාත සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබන්නේ වෙයි. (සිතා) හෙතෙම ලාභ හේතුවෙන් ලාභය ඉපදීම පිණිස ලාභය දියුණුකරන්නේ ආරඤ්ඤිකයෙක් වෙයි (7-4) 1 (v) ඡේදයේ "ප්‍රථමධ්‍යානය" යන තැන් දක්වා යෙදිය යුතුයි) මෙසේද ලාභය කැමැත්තෙන් හික්මෙයි. කෙසේ ලාභය නොකැමැත්තේ හික්මේද? මෙහි මහණතෙම ලාභාශාවෙන් තොරව ලාභය නූපදවන්නේ ලාභය දියුණු නොකරන්නේ යම්තාක් ආත්ම දමනය පිණිස ආත්මය තැන්පත්වීම පිණිස ආත්මය නිවීම පිණිස සූත්‍ර පිටකය ඉගෙණ ගනියි. විනය ඉගෙණ

ගනියි අභිධර්මය ඉගෙණ ගනියි මෙසේද ලාභය නොකැමැත්තෙන් හික්මෙයි.

2 "අලාභයෙහිද නොකිපෙයි" යනු මෙසේ අලාභයෙහි නොකිපේද? මෙහි ඇතැම් පුද්ගලයෙක් මම කුලය හෝ නොලබමි. ගණයා හෝ නොලබමි. ආවාස හෝ නොලබමි. (ii) ලාභය හෝ නොලබමි. කීර්තිය හෝ නොලබමි. ප්‍රශංසාව හෝ නොලබමි. සැපය හෝ නොලබමි. සිවුරු හෝ නොලබමි. පිණ්ඩපාතය හෝ නොලබමි. සෙනාසනය හෝ නොලබමි. ගිලන්පස බෙහෙත් පිරිකර හෝ නොලබමි. ගිලානුපස්ථානයකු හෝ නොලබමි. (iii) ප්‍රකට නොවීමියි කිපෙයි. කෝපයද තරහද නොසතුටද ඇතිකරයි. මෙසේ අලාභයෙහි කිපෙයි. කෙසේ අලාභයෙහි නොකිපේද? මෙහි මහණතෙම කුලය හෝ නොලබමි. ගණයා හෝ නොලබමි. මෙහි (ii) යෙදිය යුතුයි. ප්‍රකට නොවීමියි නොකිපෙයි. කෝපයද තරහද නොසතුටද ඇති නොකරයි. මෙසේ අලාභයෙහි නොකිපෙයි යනුයි.

3 "කෝපය නැත්තේ තෘෂ්ණාවෙහිද රශයෙහිද නො ඇලෙයි" යනු යම් සිතේ ක්‍රොධයක් ප්‍රතිවිරොධයක් කෝපයක් ප්‍රකෝපයක් සම්ප්‍රකෝපයක් අමනාපයක් කඳුලු හෙලීමක් නොසතුටුබවක් ඇද්ද, මේ විරොධයයි. යමෙකුගේ මේ විරොධය නම් තෘෂ්ණාව ප්‍රහීණද මුලින් සිඳුනේද ඉපදීමට අයොග්‍යවූයේද, ඥානය නමැති ගින්නෙන් දැවුනේද හෙතෙම අවිරුද්ධ හෙවත් කෝපය නැත්තෙකැයි කියයි. "තෘෂ්ණා" යනු රූප තෘෂ්ණා, ශබ්ද තෘෂ්ණා, ගන්ධ තෘෂ්ණා, රශ තෘෂ්ණා, ස්පර්ශ තෘෂ්ණා ධර්ම තෘෂ්ණා යනුයි.

4 "රශ" නම් මූල රශය, කඳේ රශය, පොත්තේ රශය, කොළ රශය, මල් රශය, ගෙඩි රශය, ඇඹුල් රශය, මිහිරි රශය, තික්ත රශය, කටුක රශය, ලුණු රශය, කසට මිහිරි, අමිහිරි ශීත උෂ්ණ යනුයි. රශයෙහි ගිජුවූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් ඇත. ඔවුහු දිව අගින් අග්‍ර රශයන් සොයන්නාහු ඇවිදිත්. ඔවුහු ඇඹුල් ලැබ ඇඹුල් නැති දේ සොයත්. ඇඹුල් නැති දේ ලැබ ඇඹුල් සොයත්. මිහිරිදේ ලැබ අමිහිරි දේ සොයත්. තික්ත දේ ලැබ තික්ත නැතිදේ සොයත්. තික්ත නැති දේ ලැබ තික්ත දේ

සොයත්. කටුක දේ ලැබ කටුක නැති දේ සොයත්. කටුක නැති දේ ලැබ කටුක දේ සොයත්. ලුණු ඇති දේ ලැබ ලුණු නැති දේ සොයත්. ලුණු නැති දේ ලැබ ලුණු ඇති දේ සොයත්. කර රශ දේ ලැබ කර රශ නැති දේ සොයත්. කර රශ නැති දේ ලැබ කර රශ ඇති දේ සොයත්. කසට රශ නැති දේ ලැබ කසට දේ සොයත්. කසට දේ ලැබ කසට නැති දේ සොයත්, මිහිරි දේ ලැබ අමිහිරි දේ සොයත්. අමිහිරි දේ ලැබ මිහිරිදේ සොයත් මිහිරි දේ ලැබ අමිහිරි දේ සොයත්. ශීතය ලැබ උෂ්ණය සොයත්. උෂ්ණය ලැබ ශීතය සොයත්. ඔවුහු යම් යම්දෙයක් ලැබ ඒ ඒ දෙයින් සන්තොෂ නොවෙත්. අනික් අනික් දේ සොයත්. මනවඩන රශයන්හි ඇලුනාවූ ගිජුවුනාවූ ගැටුනාවූ, මුලාවුනාවූ බැස ගත්තාවූ ලැගුනාවූ ගැලුනාවූ යනුයි. යමෙකුගේ මේ රශ තෘෂ්ණාව මුලින් සිඳුනේද, ශාන්තවූයේද සංසිඳුනේද ඉපදීමට අයොග්‍යවූයේද ඥානය නමැති ගින්නෙන් දැවුනේද, හෙතෙම නුවණින් මෙනෙහිකොට ආහාරය සොයයි. ක්‍රීඩාව පිණිස නොවේ. තරුණමදය පිණිස නොවේ. අලංකාර පිණිස නොවේ. සැරසීම පිණිස නොවේ. යම්තාක් මේ ශරීරයාගේ පැවැත්ම පිණිස යැපීම පිණිස බඩසාදුක හරණ පිණිස බඹසර රක්නා පිණිස වේ. මෙසේ පරණ දුක් වේදනාව නසන්නෙමි. අළුත් වේදනාව නූපදවන්නෙමි. මාගේ සතර ඉරියව්හි පැවැත්මද නිවරද බැව්ද යෙහෙන් විසීමද වන්නේය. යම්සේ ගස් සිටුවීම පිණිස කැළයක් ගිනි තබන්නේද යම්සේ බර තරණය කිරීම පිණිස රථ රෝද සම්බන්ධ කරණ අලවංගුව තෙල් ගා උලාද යම්සේ කාන්තාරය තරණය කිරීම පිණිස පුත්‍ර මාංශාහාරය ගන්නේද එපරිද්දෙන්ම භික්ෂුතෙම නුවණින් මෙනෙහි කොට ආහාරය වළඳයි රශ තෘෂ්ණාව දුරුකරයි. සන්සිඳුවයි. අභාවයට පමුණුවයි. (මෙහි (10-7) 4 ඡේදය යෙදිය යුතුයි) රශ තෘෂ්ණාවෙන් දුරුවූවෙක් වන්නේය. වෙන්වූවෙක් වන්නේය. නික්මුනෙක් වන්නේය. සීමා රහිත සිතින් වාසය කරයි යනුයි.

## 10 - 8

1 "උපෙක්ෂා ඇත්තේ හැමකල්හි සිහි ඇත්තේ වෙයි" යන්නෙහි උපෙක්ෂා ඇත්තේ යනු අංග සයකින් යුක්තවූ

උපෙක්ෂා ඇත්තේ යනුයි. (ii) ඇසින් රූපය දැක සතුටු නොවෙයි, නොසතුටු නොවෙයි. සිහි ඇත්තේ මනා නුවණැත්තේ මධ්‍යස්ථව වාසය කරයි. (iii) කණින් ශබ්දය අසා (මෙහි (ii) යෙදිය යුතුයි) නාසයෙන් ගඳසුවඳක් දැන (මෙහි (ii) යෙදිය යුතුයි) දිවෙන් රසයක් විඳ (මෙහි (ii) යෙදිය යුතුයි) කයින් ස්පර්ශයක් කොට (මෙහි (ii) යෙදිය යුතුයි) සිතින් ධර්මය දැන (මෙහි (ii) යෙදිය යුතුයි.) ඇසින් රූපයක් දැක මනාපව නොඇලෙයි. සිනහ නොවෙයි. රාගය නූපදවයි. ඔහුගේ කය තැන්පත් වූයේ වෙයි. සිත තැන්පත්වූයේ වෙයි, අධ්‍යාත්මය යහපත්ව පිහිටියේය. මනාව මිදුනේය, ඇසින් රූපය දැක අමනාපයක් හැකුළුණ බවක් ඇති නොකරයි. තැන්පත් සිත් ඇත්තේ වෙයි, නොඇලුන සිත් ඇත්තේ වෙයි, නොවෙනස් සිත්ඇත්තේ වෙයි, ඔහුගේ කය තැන්පත්වූ පරිදිම වෙයි. සිත තැන්පත්ය, අධ්‍යාත්මය මනාව පිහිටියේය, මනාව මිදුනේය, කණින් ශබ්දය අසා, නාසයෙන් ගඳ සුවඳ දැන, දිවෙන් රශ විඳ, කයින් ස්පර්ශ කොට, සිතින් ධර්මය දැන මනාපයෙහි නොඇලෙයි. සතුටු නොවෙයි, රාගය නූපදවයි ඔහුගේ කය තැන්පත් පරිදිම වෙයි, සිත තැන්පත්ය. අධ්‍යාත්මය මනාව පිහිටියේය. මනාකොට මිදුනේය. සිතින් වනාහි ධර්මය දැන අමනාපයක් හැකිලීමක් නොවේ. තැන්පත් නොවූ සිතැත්තෙක් නොවේ, නොහික්මුන සිතැත්තෙක් නොවේ. විසුරුණ සිතැත්තෙක් නොවේ. සිත හික්මුනේය, අධ්‍යාත්මය මනාව පිහිටියේය. මනාව මිදුනේය, ඇසින් රූපය දැක (vi) මනාප අමනාප රූපයන් කෙරෙහි ඔහුගේ කය තැන්පත් වූයේමවේ. සිත තැන්පත්ය, අධ්‍යාත්මය, මනාකොට පිහිටියේය, මනාකොට මිදුනේය. (v) කණින් ශබ්දය අසා, (මෙහි (iv) යෙදිය යුතුයි) නාසයෙන් ගඳ සුවඳක් විඳ (මෙහි (iv) යෙදිය යුතුයි) දිවෙන් රසයක් විඳ (මෙහි (iv) යෙදිය යුතුයි.) කයින් ස්පර්ශයක් කොට (මෙහි (iv) යෙදිය යුතුයි) සිතින් ධර්මය දැන මනාප අමනාප ධර්මයන්හි ඔහුගේ කය තැන්පත් වූයේම වෙයි. සිත තැන්පත්ය, අධ්‍යාත්මය, මනාකොට පිහිටියේය, මනාකොට මිදුනේය, ඇසින් රූපය දැක ඇලිය යුත්තෙහි නොඇලෙයි. තරහ කටයුත්තෙහි

තරහ නොවෙයි, මුලාවිය යුත්තෙහි මුලා නොවෙයි, කෝපවිය යුත්තෙහි කෝප නොවෙයි, කිලුටු විය යුත්තෙහි කිලුටු නොවෙයි, මත්විය යුත්තෙහි මත් නොවෙයි, දැකී දෙයෙහි දැකී පරිදිම වෙයි, ඇසීමෙහි ඇසූ පරිදිම වෙයි, ඉන්ද්‍රිය තුනකින් දැනගත් දෙයෙහි ඒ පරිදිම වෙයි, දැනගත් දෙයෙහි දැනගත් පරිදිම වෙයි.

2 දැකී දෙයෙහි නොඇලෙයි, ඇසූ දෙයෙහි නොඇලෙයි, ඉන්ද්‍රිය තුනකින් දැනගත් දෙයෙහි නොඇලෙයි, දැකී දෙයෙහි ආශානුවූයේ නොඇළුණේ වෙයි, නොබැඳුනේ වෙන්වූයේ සීමා රහිත සිතින් වාසය කරයි. ඇසූ දෙයෙහි ඉන්ද්‍රිය තුනකින් දැනගත් දෙයෙහි ඇලීම් නැත්තේ ආශානැත්තේ නොබැඳුනේ වෙන්වූයේ සීමා රහිත සිතින් වාසය කරයි, රහතුන් වහන්සේට ඇස විද්‍යමාන වෙයි රහතුන් වහන්සේ ඇසින් රූපය දකියි, රහතුන් වහන්සේට එහි කැමැත්ත වශයෙන් ඇතිවන රාගයක් නැත, රහතුන් වහන්සේ මනාහි මිදුන සිත් ඇතිසේක. රහතුන් වහන්සේට කන විද්‍යමාන වෙයි රහතුන් වහන්සේ කනින් ශබ්ද අසයි රහතුන් වහන්සේට එහි කැමැත්ත වශයෙන් රාගයක් නැත. රහතුන් වහන්සේ මනාව මිදුන සිත් ඇති සේක. රහතුන් වහන්සේට නාසය ඇත. රහතුන් වහන්සේ නාසයෙන් ගඳ සුවඳ දැන ගනියි. එහි කැමැත්ත වශයෙන් රාගයක් රහතුන් වහන්සේට නැත. රහතුන් වහන්සේ මනාව මිදුන සිත් ඇතිසේක.

3 රහතුන් වහන්සේට දිව විද්‍යාමාන වෙයි. රහතුන් වහන්සේ දිවෙන් රශ විඳ ගනිති. රහතුන් වහන්සේට එහි කැමැත්ත වශයෙන් ඇලීමක් නැත. රහතුන් වහන්සේට කය විද්‍යමාන වෙයි. රහතුන් වහන්සේ කය ස්පර්ශ කරති. රහතුන් වහන්සේට එහි කැමැත්ත වශයෙන් ඇලීමක් නැත. රහතුන් වහන්සේ මිදුන සිත් ඇති සේක.

4 රහතුන් වහ්නසේට සිතක් ඇත. රහතුන් වහන්සේ සිතින් ධර්මය දැන ගනිති. රහතුන් වහන්සේට එහි කැමැත්ත වශයෙන් ඇලීමක් නැත. රහතුන් වහන්සේ මිදුන සිත් ඇතිසේක. ඇස

රූපයෙහි ඇලෙයි. (ii) රූපයෙහි සතුටුවෙයි. රහතුන්වහන්සේ එහි දාන්තය සංවරය ආරක්ෂිතය, දැමුනේය, එහි සංවරය පිණිස ධර්මය දෙශනා කරයි. (iii) කණ ශබ්දයෙහි ඇලෙයි. (මෙහි (ii) යෙදිය යුතුයි) නාසය ගඳ සුවඳෙහි ඇලෙයි. (මෙහි (ii) ඡෙදය යෙදිය යුතුයි) දිව රශයෙහි ඇලෙයි. සතුටු වෙයි. එය රහතුන් වහන්සේට දාන්තය, ගුප්තය, ආරක්ෂිතය. දැමුනේය, එහිද සංවරය පිණිස ධර්මය දෙශනා කරයි. කය ස්පර්ශයෙහි ඇලෙයි. සතුටුවෙයි. එය රහතුන් වහන්සේට දාන්තය, ගුප්තය, ආරක්ෂිතය, දැමුනේය එහිද සංවරය පිණිස ධර්මය දෙශනා කරයි.

**5** "දැමුනහු සභාවට පමුණුවත්. දැමුනහු උඩ රජු නගියි. යමෙක් නපුරු වචනයන්ට ඉවසාද මිනිසුන් අතරෙහි ඒ දැමුන තැනැත්තා ශ්‍රෙෂ්ඨයි. ආජානීය ශ්‍රෙෂ්ඨ අශ්වයා දැමුනේ උතුම්. කුඤ්ජර නම්වූ මහ ඇතාද දැමුනේ උතුම්. එයටත් වඩා තමාගේ හික්මීම ඉතා උතුම්, මේ යානයන්ගෙන් නොගිය දිශාවට නොයන්නේය. යම්සේ දැමුන තැනැත්තේ මනාව හික්මුනාවූ දැමුනහු හා යයි දෙවන ආත්ම භාවයක් නැති මිදුන තැනැත්තේ මානයන්හි කම්පාවට නොයත්. ලොකයෙහි දිනීම ඇතිකරගත් ඔවුහු දැමුන භූමියට පැමිණියාහ."

**6** යමෙකුගේ සියලු ලොකයෙහි ආධ්‍යාත්මිකවූද බාහිරවූද ඉන්ද්‍රියයන් මනාකොට පුරුදු කරණ ලද්දේද වැඩූ සිත් ඇති දැමුන හෙතෙම මෙලොවද පරලොවද විනිවිද කාලය බලාපොරොත්තු වෙයි. "උපෙක්ෂා ඇත්තේ සැම කල්හි" යනු සැම කාලයෙහි නිරන්තරයෙන් අන්තිම වයස් කොටසෙහි යනුයි. සිහි ඇත්තේ යනු කරුණු සතරකින් සිහි ඇත්තේ එනම් කයෙහි කය (iii) අනුව බලන සිහිය පිහිටුවීම වඩන්නේනුයි සිහි ඇත්තේ නම්. (iv) වෙදනාවන්හි සිතෙහි සිත ධර්මයයන්හි ධර්මය අනුව බලන සිහිය පිහිටුවීම වඩන්නේ නුයි සිහි ඇත්තේ නම් හෙතෙම සිහිය ඇත්තේයි.

**7** "ලොකයෙහි සමානයාට සමාන වෙමියි නොසිතයි. යනු ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ වෙනින් අනික් කරුණකින්

හෝ සමානයෙක් වෙමියි මානය නූපදවයි. "විශෙෂ නොවෙයි. නිච නොවෙයි" යනු ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ (මෙහි (10-6) 2 (ii) ඡේදය යොදාගත යුතුයි) වෙනින් අනික් කරුණකින් හෝ අතිමානය නූපදවයි. ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ (මෙහි (3-3) 5 (ii) ඡේදය යොදාගත යුතුයි.) වෙනින් අනික් කරුණකින් හෝ හීනවෙමිය මානය නූපදවයි.

8 "ඔහුට උස්සද නම් කෙලෙස් නැත" යන්නෙහි "ඔහුට" යනු අර්හත්වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේට යනුයි. උස්සද යනු උස්සද නම් කෙලෙස් සතකි, රාග උස්සද, ද්වෙෂ උස්සද මොහ උසස්දය, මාන උස්සදය, දිට්ඨි උස්සදය, ක්ලෙශ උස්සදය, කම්ම උස්සදය යනුයි. උන්වහන්සේට උස්සදයෝ නැත්තාහ. විද්‍යමාන නොවෙත්, නොලැබෙත්, ප්‍රහීණය, මුල් සිඳුනේය. ශාන්තය, සන්සිඳුනේය, ඉපදීමට නුසුදුසුය, ඥානය නමැති ගින්නෙන් දැවුනේය.

## 10 - 9

1 "යමෙකුට නිශ්‍රයයන් නැත" යන්නෙහි යමෙකුට යනු අර්හත්වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේට යනුයි. නිශ්‍රය බව යන්නෙහි නිශ්‍රය දෙකකි. තෘෂ්ණා නිශ්‍රය දෘෂ්ටි නිශ්‍රය යනුය. 'මමත්වය' යනු නිශ්‍රය කියා වෙනස් කොට (2-6) 1 (ii) (iii) ඡේද යොදාගත යුතුයි) උන්වහන්සේගේ තෘෂ්ණ නිශ්‍රය ප්‍රහීණය දෘෂ්ටි නිශ්‍රය සංසිඳුනේය. තෘෂ්ණ නිශ්‍රය ප්‍රහීණවූ බැවින් දෘෂ්ටි නිශ්‍රය සංසිඳුන බැවින් නිශ්‍රය බවක් යමෙකුගේ නැත, විද්‍යමාන නොවෙයි. නොලැබෙයි. ප්‍රහීණය මුලින් සිඳුනේය සංසිඳුනේය ඉපදීමට අයොග්‍යය, ඥානය නමැති ගින්නෙන් දැවුනේය.

2 "නිශ්‍රය රහිත තැනැත්තේ ධර්මය දැන" යන්නෙහි "දැන" යනු (iii) දැනගෙන සමකොට බලා තීරණයකොට ප්‍රකටකොට යනුයි. කෙසේද, සියලු සංස්කාරයෝ අනිත්‍ය යයි සියලු සංස්කාරයෝ දුක්යයි සියලු ධර්මයෝ අනාත්ම යයි (මෙහි (ii) යොදාගත යුතුයි) යම්කිසි හේතුවකින් උපන් ධර්මයක් ඇද්ද ඒ සියල්ල නිරොධය පිණිස පවත්නේයයි දැන සම කොට තීරණය කොට ප්‍රකටකොට යනුයි.

3 "ආශ්‍රය නොවූයේ" යනු ආශ්‍රය දෙකකි තෘෂ්ණා ආශ්‍රයද දෘෂ්ටි ආශ්‍රයද යනුයි ('මමත්වය' යන ආශ්‍රය කියා වෙනස් කොට (2-6) 1 (ii) (iii) ඡෙද යොදා ගත යුතුයි) තෘෂ්ණා ආශ්‍රය දුරුකොට දෘෂ්ටි ආශ්‍රය සංසිඳුවා ඇස ආශ්‍රය නොවූයේ කණ ආශ්‍රය නොවූයේ නාසය ආශ්‍රය නොවූයේ දිව ආශ්‍රය නොවූයේ කය ආශ්‍රය නොවූයේ සිත ආශ්‍රය නොවූයේ රූපයෙහි, ශබ්දයෙහි, ගන්ධයෙහි රසයෙහි ස්පර්ශයෙහි කුලය ගණයා ආවාසය (මෙහි 9-1 9 අගිද්ධය යනු ආශ්‍රය කියා වෙනස්කොට රූපයෙහි යන තැන සිට යොදාගත යුතුයි) දැකී ඇසූ ඉන්ද්‍රිය තුනකින් දැනගත් දැනගතයුතු ධර්මයන්හි ආශ්‍රය නොවූයේ නොඇලුනේ නොපැමුණුනේ නික්මුණේ මිදුනේ සීමා රහිත සිතින් වාසය කරයි. යනුයි. "භවයෙහි හෝ විභවයෙහි යමෙකුට තෘෂ්ණාව විද්‍යමාන නොවෙයි." යන්නෙහි තෘෂ්ණා නම් රූප තෘෂ්ණා, ශබ්ද තෘෂ්ණා, ගන්ධ තෘෂ්ණා, රශ තෘෂ්ණා, ස්පර්ශ තෘෂ්ණා, ධර්ම තෘෂ්ණා, යනුයි අර්හත්වූ යමෙකුට යනු ක්ෂීණාශ්‍රවයන් වහන්සේට යනුයි.

4 "භවයෙහි" යනු භවදෘෂ්ටියෙහිය. විභවයෙහි යනු විභව දෘෂ්ටියෙහිය. "භවයෙහි" යනු ශාස්වත දෘෂ්ටියෙහි හෝ යනුයි. විභවයෙහි යනු උච්ඡේද දෘෂ්ටියෙහියි. භවයෙහි යනු නැවත නැවත භවයෙහි නැවත නැවත ගතියෙහි නැවත නැවත උත්පත්තියෙහි නැවත නැවත ප්‍රතිසන්ධියෙහි නැවත ආත්ම භාවයක් ඉපදීමෙහි තෘෂ්ණාව යම් ඒ රහතුන් වහන්සේට නැත. විද්‍යමාන නොවෙත්. නොලැබෙත්, ප්‍රහීණය, මුලින් සිඳුනේය. ශාන්තය, සංසිඳුනේය, ඉපදීමට අයොග්‍යය ඥානය නමැති ගින්නෙන් දැවුනේය යනුයි.

## 10 - 10

1 "උපශාන්තයයි ඔහුට කියමි" යනු නිවුන තැනැත්තේයයි සංසිඳුන තැනැත්තේයයි ඔහුට කියමි. ඔහුට ප්‍රකාශ කරමි ඔහුට ව්‍යවහාර කරමි යනුයි. කාමයන්හි අපෙක්ෂා නැත්තේ යන්නෙහි "කාමයෝ නම් ප්‍රකට වශයෙන් කාම දෙකකි. වස්තුකාමද ක්ලෙශ කාමද යනුයි (මෙහි 1, 1 (ii) සිට 3 (ii) දක්වා යෙදිය

යුතුයි) වස්තු කාමයන් සම්පූර්ණයෙන් දැනගෙන ක්ලේශ කාමයන් හැර දුරුකොට අභාවයට පමුණුවා යනුයි. දුරු කළ කාමය ඇත්තේ බැහැර කළ කාමය ඇත්තේ වෙන් කළ කාමය ඇත්තේ මිදුන කාමය ඇත්තේ සංසිඳුන කාමය ඇත්තේ කාමයන්හි බැහැර කළ රාගය ඇත්තේ වමාරා දැමූ කාමය ඇත්තේ මිදුන රාගය ඇත්තේ තෘෂ්ණා නැත්තේ නිවුනේ සිහිල්වූයේ බ්‍රහ්මයා බඳු කයින් වාසය කරයි යනුයි

2 "කෙලෙස් ගැට ඔහුට විද්‍යමාන නොවෙත්" යන්නෙහි ග්‍රන්ථ (ගැට) යනු ග්‍රන්ථ සතරකි. (ii) දැඩි ලොභය නමැති ගැටය, නපුරු සිතිවිල්ල නැමති ගැටය අන්‍ය ශීලයන් ව්‍රතයන් සෙවීමේ ගැටය, මෙයම සත්‍යයයි බැස ගැන්මේ ගැටය යනුයි. (iii) තමන්ගේ දෘෂ්ටියෙහි දැඩි ආශාව දැඩි ලොභය නමැති ගැටයයි. අන්‍යවාදයන්හි වෛරකිරීම ව්‍යාපාදය නමැති ගැටයයි. තමන්ගේ ශීලය හෝ ව්‍රතය හෝ ශීල ව්‍රත දෙකම හෝ පරාමර්ශ කිරීම ශීල ව්‍රත පරාමාශ ගැටයයි. තමන්ගේ දෘෂ්ටියෙහි මෙයම සත්‍යයයි බැස ගැන්ම "මෙයම සත්‍යයයි බැසගැන්මේ" ග්‍රන්ථයයි. "ඔහුට" යනු අර්හත් ක්ෂීණාශ්‍රවයන් වහන්සේට යනුයි ග්‍රන්ථයෝ කෙලෙස් ගැටළු ඔහුට විද්‍යමාන නොවෙත් යනු ඔහුට ග්‍රන්ථයෝ නැත. විද්‍යමාන නොවෙත්. මුලින් සිඳුනේය. ශාන්තය, සංසිඳුනේය, ඉපදීමට නුසුදුසුය, ඥානය නමැති ගින්නෙන් දැවුනේය යනුයි

3 "හෙතෙම විසත්තිකාව (තෘෂ්ණාව) තරණය කළේය" යන්නෙහි විසත්තිකා යනු තෘෂ්ණාවයි යම්රාගයක් ඇද්ද, ඇලීමක් ඇද්ද, (1-3) 4 ඡේදය යම් ළංවීමක් යන තැන සිට යෙදිය යුතුයි) ඇද්ද එයයි. විසත්තිකා යනු කවර අර්ථයකින් විසත්තික නම් වේද, විශෙෂයෙන් ඇලේනුයි "විසත්තිකා නමි. විශාලනුයි විසත්තිකා නමි. පැතිර පවතීනුයි විසත්තිකා නමි. විශෙෂයෙන් ගමන් කෙරේනුයි "විසත්තිකා" නමි. විශෙෂයෙන් රැස් කෙරේනුයි මුලා කෙරේනුයි විසත්තිකා නමි. විෂ මුල්කොට ඇති බැවින් විසත්තිකා නමි. විෂඵලය ඇති බැවින් විසත්තිකා නමි. විෂ පරිභොගය ඇති බැවින් විසත්තිකා නමි. විශාලවූ ඒ

තෘෂ්ණාව වනාහි රූපයෙහි ශබ්දයෙහි ගන්ධයෙහි, රශයෙහි ස්පර්ශයෙහි කුලයෙහි ගුණයෙහි, ආවාසයෙහි (9-1-9 ලාභයෙහි යන තැන සිට පවත්නා කාලයෙහි යන තැනට යෙදිය යුතුයි.) දැකි, ඇසූ, තුන්නේද්‍රිය යන්ගෙන් ස්පර්ශ කළ දැනගත යුතු ධර්මයන්හි විශෙෂයෙන් ඇලේනුයි පැතිර පවත්නේනුයි. විසත්තිකා නම්. හෙතෙම විසත්තිකාව තරණය කළේය යනු හෙතෙම මේ විසතිකා නම් තෘෂ්ණාව තරණය කළේය. එතරවූයේ ඉක්මවූයේ යනුයි එහෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරණ ලදී.

"කාමයන්හි අපෙක්ෂා රහිත ඔහුට උපශාන්තවූ තැනැත්තේයයි කියමි. ඔහුට ග්‍රන්ථයෝ නැත්තාහ. හෙතෙම විසත්තිකාව කරණය කළේය යනුයි"

4 "ඔහුට පුත්‍රයෝද සතුන්ද කුඹුරුද ගොඩනැගිලි ඉඩම්ද නැත" යන්නෙහි 'නැත' යනු ප්‍රතික්ෂෙපයයි. ඔහුට යනු අර්හත්වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේට යනුයී "පුත්‍රයෝ යනු සතරදෙනෙක් වෙති. තමාගේ පුත්‍ර, කෙතින් උපන් පුත්‍ර, හදාගත් පුත්‍ර, අතවැසි පුත්‍ර යනුයි. "සතුන්" යනු එළු බැටළු කුකුල් ඌරු ඇත් ගව අස් වෙළඹ යන මොවුහුයි 'කෙත' යනු ඇල්කෙත, වීකෙත, මුංකෙත, මෑකෙත, යව කෙත තිරිඟුකෙත, තලකෙත, යනුයි 'වස්තු නම්' ගෘහවස්තු, කොටුවස්තු, ඉදිරිවස්තු, පසුවස්තු, ආරාමවස්තු, විහාර වස්තු යනුයි. ඒ රහතුන්වහන්සේට පුත්‍ර කරදරය හෝ සත්ව කරදරය හෝ කුඹුරු කරදරය හෝ ගොඩනැගිලි ඉඩම් කරදරය හෝ නැත. විද්‍යාමාන නොවෙත්. ප්‍රහීණය, මුලින් සිඳුනේය. ශාන්තය, සන්සිඳුනේය.

5 "ආත්මයක් ඇතැයි හෝ ඔහු කෙරෙහි නොලැබෙයි." යන්නෙහි අත්තා යනු ශාස්වත දෘෂ්ටියයි එය නැත. ආත්මයක් නැත යනු උච්ඡෙද දෘෂ්ටියයි එය නැත. ආත්මය යයී ගැනීමක් නැත. ආත්මය නොවේ යයි මිදියයුත්තක් නැත යමෙකුට ගැනීමක් නැද්ද ඔහුට මිදීමක් නැත. යමෙකුට මිදියයුත්තක් නැද්ද, ඔහුට ගැනීමක් නැත. ගැනීම්, මිදීම් දෙක ඉක්මවන්නාවූ රහතන්වහන්සේ වැඩීම් හානි ඉක්මවන සේක. උන්වහන්සේ

වැසනිමවූයේ පුරුදුකළ ගමන් ඇත්තේ මෙහි 3-7-6 (ii) ඡේදය යෙදිය යුතුයි. ජාති මරණ සංසාරයන් නැත. ඔහුට නැවත ඉපදීමක්ද ආත්මය හෝ නිරාත්මය යන හැඟීමක් උන්වහන්සේ කෙරෙහි නොලැබෙයි.

## 10 - 11

1 "යමකින් ඔහුට පෘථග්ජනයෝ හෝ ශ්‍රමණබ්‍රාහ්මණයෝ කියන්නාහු නම් යන්නෙහි පෘථග්ජනයෝ යනු බොහෝ කෙලෙස් උපදවත්නුයි පාථග්ජනයෝ නම්. බොහෝ ඉවත් කරණලද ආත්ම දෘෂ්ටිය ඇති බැවින් පෘථග්ජනයෝ නම්. බොහෝ ශාස්තෘවරයන්ගේ මුහුණ බලන බැවින් පෘථග්ජනයෝ නමී. බොහෝ සියලු ගතිවලින් නොනැගිටියේනුයි පෘථග්ජන නම්. බොහෝ නොයෙක් රැස්කිරීම් රැස්කෙරේනුයි පෘථග්ජන නම්. බොහෝ නොයෙක් ඔඝයන්ගෙන් පාවේනුයි පෘථග්ජන නම්. බොහෝ නොයෙක් තැවීම්වලින් තැවේනුයි පෘථග්ජන නම්. බොහෝ පඤ්චකාම ගුණයන්හි ඇළුනේ ගිජුවූයේ ගැටුනේ මුර්ඡාවූයේ බැසගත්තේනුයි පෘථග්ජන නම්. "ශ්‍රමණයෝ" යනු යම්කිසි මේ ශාසනයෙන් පිටත්හිවූ පරිබ්‍රාජක බවට පැමිණියාවූ පරිබ්‍රාජක බවෙන් යුක්තවූ අය යනුයි. බ්‍රාහ්මණ යනු යම්කිසි අනුන්ට නින්දාකරන්නාවූ බමුණෝ යනුයි. පෘථග්ජනයෝ යම් රාගයකින් කියන්නාහු නම් යම් ද්වෙෂයකින් කියන්නාහුනම් යම් මෝහයකින් කියන්නාහුනම් යම් මානයකින් කියන්නාහු නම් යම් දෘෂ්ටියකින් කියන්නාහු නම් යම් සිතේ නොසන්සුන් කමකින් කියන්නාහු නම් යම් සැකයකින් කියන්නාහු නම් යම් අනුසයයන්ගෙන් කියන්නාහු නම් එනම, රාගිකයෙක, ද්වෙෂයට පැමිණියෙක. මුලාවට පැමිණියෙක, ඇලීම ඇතියෙක, පරාමර්ශ වූවෙක, වික්ෂෙපයට පැමිණියෙක, අනිටුබවට පැමිණියෙක, බලයට පැමිණියෙක යන මෙයිනි ඒ රැස්කිරීම් ප්‍රහීනයහ. රැස්කිරීම් ප්‍රහීනබැවින් ගතියෙන් යමකින් ඔහුට කියන්නාහු නම් එනම් තිරිසනෙක කියා හෝ තිරිසන් යොනියෙක කියා හෝ ප්‍රෙතාත්මයෙහි උපන් අයෙක කියා හෝ මිනිසෙක කියා හෝ දෙවියෙක කියා හෝ රූපියෙක කියා හෝ අරූපියෙක

කියා හෝ සඤ්ඤීයෙක කියා හෝ අසඤ්ඤීයෙක කියා හෝ නෙවසඤ්ඤී නාසඤ්ඤීයෙක කියා හෝ කීමට එබඳු හේතුවක් නැත. ප්‍රත්‍යයක් නැත යනුයි.

2 "එය ඔහුට ඉදිරිපත් නොවේ." යන්නෙහි "ඔහුට" යනු අර්හත්වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේට යනුයි. ඉදිරිපත් කිරීම නම් තෘෂ්ණාව ඉදිරිපත් කිරීමද දෘෂ්ටිය ඉදිරිපත් කිරීමද යනුයි (2-6) 1 (ii) (iii ඡෙද යෙදිය යුතුයි. ඔහුට තෘෂ්ණාව ඉදිරිපත් කිරීම ප්‍රහීණය. දෘෂ්ටිය ඉදිරිපත් කිරීම සන්සිඳුනේය. තෘෂ්ණාව ඉදිරිපත් කිරීම ප්‍රහීණවූ බැවින් දෘෂ්ටිය ඉදිරිපත් කිරීම සන්සිඳුන බැවින් තෘෂ්ණාව හෝ දෘෂ්ටිය හෝ ඉදිරිපත්කොට නොහැසිරෙයි. තෘෂ්ණාව ධජයක් කොට නැත්තේ තෘෂ්ණාව කොඩියක්කොට නැත්තේ තෘෂ්ණාව අධිපතිකොට නැත්තේ, දෘෂ්ටිය ධජයක්කොට නැත්තේ දෘෂ්ටිය කොඩියක්කොට නැත්තේ තෘෂ්ණාව අධිපතිකොට නැත්තේ දෘෂ්ටිය හෝ තෘෂ්ණාව හෝ පිරිවරා නොහැසිරෙයි යනුයි. "එහෙයින් වාදයන්හි කම්පා නොවෙයි යන්නෙහි එහෙයින් යනු ඒ කාරණයෙන් ඒ හේතුවෙන් ඒ ප්‍රත්‍යයෙන් යනුයි. වාදයන්හි උපවාදයන්හි නින්දාවෙහි ගර්හාවෙහි අපකීර්තියෙහි අගුණ කීමෙහි කම්පා නොවෙයි, නොසෙලවෙයි යනුයි.

## 10 - 12

1 "හළ ගිජුකම හා මසුරුකම ඇත්තේ, යන්නෙහි ගෙධයයි තෘෂ්ණාවට කීයයි, යම් රාගයක් ඇලීමක් ඇද්ද, (1-3) 3 ඡෙදයේ 'යම් ලංවීමක්' යන තැන් සිට යෙදිය යුතුයි, යමෙකුට මේ ගිජුකම ප්‍රහීණද, මුලින් සිඳුනේද, ශාන්තද, සන්සිඳුනේද, ඉපදීමට අයොග්‍යවූයේද, ඥානය නමැති ගින්නෙන් දැවුනේද හෙතෙම හළ ගිජුකම ඇත්තේයයි කියයි. හෙතෙම (ii) රූපයෙහි ගිජු නොවූයේ ශබ්දයෙහි, ගන්ධයෙහි රසයෙහි ස්පර්ශයෙහි. දැකි ඇසූ ඉන්ද්‍රිය තුනකින් දැනගත් දැනගතයුතු දෙයෙහි ගිජු නොවූයේ නොගැටුනේ මූර්ඡානොවූයේ නොපැමුණුනේ ගිජුකමෙන් තොරවූයේ පහවූ ගිජුකම ඇත්තේ වමාරා දැමූ ගිජුකම ඇත්තේ මිදුන ගිජුකම ඇත්තේ අත්හළ ගිජුකම ඇත්තේ

සංසිඳුන ගිජුකම ඇත්තේ තෘෂ්ණාව නැත්තේ බ්‍රහ්මයා බඳු ආත්ම භාවයෙන් වාසය කෙරේනුයි, පහවූ ගිජුකම ඇත්තේ නම්. (iii) මසුරු නැත්තේ යන තන්හි මසුරුකම් පසෙකි. ආවාස මසුරුකම, කුල මසුරුකම, ලාභ මසුරුකම, ගුණ මසුරුකම, ධර්ම මසුරුකම; යනුයි මෙබඳුවූ යම් මසුරුකමක් ගැන්මක් කියයිද, ඒ මසුරුකමයි. යමෙකුට මේ මසුරුකම ප්‍රහීණද, මුලින් සිඳුනේද, ශාන්තද සන්සිඳුනේද, ඉපදීමට අයොග්‍යද, ඥානය නමැති ගින්නෙන් දැවුනේද, හෙතෙම නොමසුරු තැනැත්තේයයි කියයි.

2 "මුනිතෙම උසස්යයි නොකියයි. සමයයි නොකියයි. පහත්යයි නොකියයි" යන්නෙහි "මුනි" යයි ඥානයට කියයි. ශ්‍රේෂ්ඨ වෙම්යි කියා හෝ සමාන වෙම්යි කියා හෝ හීනවෙම්යි කියා හෝ නොකියයි, ප්‍රකාශ නොකරයි, ව්‍යවහාර නොකරයි යනුයි,

3 "තෘෂ්ණාවට සුදුසු බවට නොපැමිණෙයි. අයොග්‍යය යන්නෙහි යොග්‍ය බැව් දෙකකි. තෘෂ්ණාවට යොග්‍ය බව හා දෘෂ්ටියට යොග්‍ය බව යනුයි (2-6) 1 (ii) (iii) ඡෙද යෙදිය යුතුයි ඔහුගේ තෘෂ්ණාවට යොග්‍ය බව ප්‍රහීණය, දෘෂ්ටියට සුදුසුකම සංසිඳුනේය. තෘෂ්ණාවට යොග්‍යකම සංසිඳුන බැවින් තෘෂ්ණාවට සුදුසුකමට හෝ දෘෂ්ටියට සුදුසුකමට නොපැමිණෙයි, නොගනියි, පරාමර්ශ නොකරයි, ඇතුළු නොවෙයි යනුයි.

4 "අයොග්‍ය වෙයි" යන තන්හි සුදුසුවීම යනු සුදුසුවීම් දෙකකි. තෘෂ්ණාවට සුදුසු වීමද දෘෂ්ටියට සුදුසුවීමද යනුයි. ((2-6) 1, (ii), (iii) ඡෙදය යෙදිය යුතුයි) ඔහුගේ තෘෂ්ණාවට සුදුසුකම ප්‍රහීණය. දෘෂ්ටියට සුදුසුකම සංසිඳුනේය ඔහුගේ තෘෂ්ණා යොග්‍යත්වය ප්‍රහීණවූ බැවින් දෘෂ්ටියට සුදුසුකම සංසිඳුන බැවින් තෘෂ්ණා සුදුසුකම හෝ දෘෂ්ටි සුදුසුකම හෝ නොවෙයි. නූපදවයි. ඇති නොකරයි, යනුයි.

5 "යමෙකුට ලොකයෙහි ස්වකීයත්වයක් නැත" යන්නෙහි යමෙකුට යනු අර්හත් ක්ෂීණාශ්‍රවයන් වහන්සේට යනුයි. ස්වකීයත්වයක් නැත යනු යමෙකුට මෙය මාගේය. කියා හෝ

මෙය අනුන්ගේය කියා හෝ කිසි රූප වශයෙන් ගන්නාලද හෝ වේදනා වශයෙන් ගන්නාලද සඤ්ඤා වශයෙන් ගන්නාලද හෝ සංඛාර වශයෙන් ගන්නාලද හෝ විඤ්ඤාන වශයෙන් ගන්නාලද්දක් පරාමර්ශ කිරීමක් ඇතුළුවීමක් ගැලීමක් නැත. (මෙහි 4-8-7 අග කොටස යෙදිය යුතුයි.) ඥානය නමැති ගින්නෙන් දැවුනේය, යනුයි. "නැති බැවින් ශොක නොකරයි" යනු වෙනස් වෙන වස්තුවෙහිද ශොක නොකරයි. වෙනස්වූ කල්හි ද ශොක නොකරයි. මාගේ ඇස කණ, නාසය, දිව, කය වෙනස් වූයේයයි ශොක නොකරයි. ක්ලාන්ත නොවෙයි නොහඬයි පපුවේ අත් ගසමින් නොහඬයි සිහි මුලාවට නොපැමිණෙයි. මෙසේද,

6 "නැති කල්හිද ශොක නොකරයි" යනුයි යලිදු හෝ දුක් වෙදනාව නැති බැවින් එයින් ස්පර්ශවීමක් යුක්තවීමක් නැත. ශොක නොකරයි. ක්ලාන්ත නොවෙයි නොහඬයි. පපුවේ අත්ගසා නොහඬයි. සිහිමුලා බවට නොපැමිණෙයි. කන් රෝගයෙන් නාසයේ රෝගයෙන් දිවේ රෝගයෙන් කාය රෝගයෙන් හිස් රෝගයෙන් මුඛ රෝගයෙන් දත් රෝගයෙන් කාශ රෝගයෙන් ක්ෂය රෝගයෙන් දැවිල්ලෙන් ජරාවෙන් කුසේ රෝගයෙන් මුර්ඡාවෙන් පක්ඛන්දිකා නම් රෝගයෙන් සුල නම් වාත රෝගයෙන් විසූචිකා නම් රෝගයෙන් කුෂ්ට රෝගයෙන් ගණ්ඩ රෝගයෙන් කිලාස නම් කුෂ්ට රෝගයෙන් ස්වාශයෙන් අපස්මාරයෙන් දදයෙන් කැසීමෙන් තිය රෝගයෙන් විතච්ඡිකා නම් කුෂ්ට රෝගයෙන් ලේ වලින්, පිතෙන්, මධු මෙහයෙන් පක්ෂාඝාතයෙන් පිළිකාවෙන් භගන්දරාවෙන් පිතෙන් උපන් ආබාධයෙන් සෙමින් උපන් ආබාධයෙන්, වාතයෙන් උපන් ආබාධයෙන්, සන්නිපාතික ආබාධයෙන් ඍතු වෙනස්වීමෙන් හටගන්නා රෝගයෙන් විෂම පැවැත්මෙන් හටගන්නා රෝගයෙන් උපක්‍රමයෙන් හටගන්නා ආබාධයෙන් කර්ම විපාකයෙන් හටගන්නා ආබාධයෙන් සීතයෙන් උෂ්ණයෙන් බඩගින්නෙන් පිපාසායෙන් ඩැහැලේ බොන මැස්සෝය මදුරුවෝය වාතය, අව්වය, දීර්ඝ ජාතීහුය යන මොවුන්ගේ පහසින් යුක්තවූයේ ශොක නොකරයි. ක්ලාන්ත නොවෙයි

නොවැළපෙයි. පපුවෙහි අත ගසා නොහඬයි. සිහිමුලා බවට නොපැමිණෙයි මෙසේද නැති බැවින් ශොක නොවෙයි යලිදු හෝ නැති කල්හි විද්‍යමාන නොවූ කල්හි නොලැබෙන කල්හි අනේ ඒකාන්තයෙන් එය මාගේය. ඒකාන්තයෙන් එය මට නැත. ඒකාන්තයෙන් එය මාගේ වන්නේය. මම ඒකාන්තයෙන් එය නොලබමි'යි ශොක නොකරයි. ක්ලාන්ත නොවෙයි. නොවැළපෙයි. පපුවෙහි අත ගසා නොහඬයි. සිහිමුලා බවට නොපැමිණෙයි. යනුයි.

7 "ධර්මයන්හිද නොයයි" යනු ඡන්දයෙන් අගතියට නොයයි. ද්වෙෂයෙන් අගතියට නොයයි. මොහයෙන් අගතියට නොයයි. භයෙන් අගතියට නොයයි. රාග වශයෙන් නොයයි. ද්වෙෂ වශයෙන් නොයයි. මොහ වශයෙන් නොයයි. මාන වශයෙන් නොයයි. දෘෂ්ටි වශයෙන් නොයයි. උද්ධච්ච වශයෙන් විචිකිච්ඡා වශයෙන් නොයයි. අනුසය වශයෙන් නොයයි. වර්ගවූ ධර්මයන්ගෙන් නොයයි. නොපමුණුවයි, යනුයි. "හෙතෙම ඒකාන්තයෙන් ශාන්තවූයේයයි කියයි." යනු හෙතෙම ශාන්තවූයේ උප ශාන්තවූයේ සංසිඳුනේ නිවුනේ සංසිඳුනේයයි කියයි. ව්‍යවහාර කරයි, යනුයි.

## (කලහ විවාද සූත්‍ර නිර්දේශය)

## 11 - 1

1 "කලහ විවාදයෝ කොතැනින් හටගන්නෝද" යන තැන්හි කලහ නම් එක් ආකාරයකින් කලහයයි. විවාද යනුද එයමය. කලහය යමක්ද විවාදයත් එයමය. විවාදය යමක්ද කලහයත් එයමය. යලිදු අනික් ආකාරයකින් විවාදය කියයි. කලහයේ මුල් කොටස විවාදය. රජවරුද රජුන් හා විවාද කරත්. ක්ෂත්‍රියයෝද ක්ෂත්‍රියයන් හා විවාද කරත්. බ්‍රාහ්මණයෝද බ්‍රාහ්මණයන් හා විවාද කරත්. ගෘහපතියෝද ගෘහපතීන් හා විවාද කරත්. මවද පුත්‍රයා සමග විවාද කරයි. පුත්‍රයාද මව සමග විවාද කරයි. පියාද පුත්‍රයා සමග විවාද කරයි. පුත්‍රයාද පියා සමග විවාද කරයි. සහෝදරයාද සහෝදරයා සමග විවාද කරයි.

සහෝදරයාද සහෝදරිය සමග විවාද කරයි. යහළුවාද යහළුවා සමග විවාද කරයි. මේ විවාදයයි.

2 කලහය කවරේද, ගිහියෝ දණ්ඩෙන් යුක්තව කයින් වචනයෙන් කලහ කරත්. පැවිද්දෝ ඇවැතට පැමිණෙන්නාහු කයින්ද වචනයෙන්ද කලහ කරත්. මේ කලහයයි. "කලහයෝද විවාදයෝද කොතැනින් උපන්නෝද" යනු කලහයෝද විවාදයෝද කොතනින් උපන්නෝද, කොතනින් ඇතිවූවෝද, කොතනින් හටගත්තෝද, කොතනින් පහළ වූවෝද, කුමක් නිදාන කොට ඇත්තෝද, කුමකින් ඇති වූවෝද, කුමක් ප්‍රභව කොට ඇත්තෝදැයි කලහයේද විවාදයේද මුල විචාරයි. හේතුව විචාරයි. නිදානය විචාරයි. ඇතිවීම විචාරයි. ප්‍රභවය විචාරයි. ඇතිවීම විචාරයි. ආහාරය විචාරයි අරමුණ විචාරයි. ප්‍රත්‍යය විචාරයි. ඇතිවීම විචාරයි. ඉල්ලයි. බලාපොරොත්තු වෙයි. පහදවයි යනුයි

3 "වැළපීමද ශොකයද මසුරුකමද" යන්නෙහි වැළපීම නම් ඥාතිව්‍යසනයෙන් හෝ පීඩිතවූවහුගේ භොගව්‍යසනයෙන් හෝ පීඩිතවූවහුගේ රෝග ව්‍යසනයෙන් හෝ පීඩිතවූවහුගේ ශීල ව්‍යසනයෙන් හෝ පීඩිතවූවහුගේ දෘෂ්ටි ව්‍යසනයෙන් හෝ පීඩිතවූවහුගේ අනික් අනික් ව්‍යසනයකින් හෝ යුක්තවූවහුගේ ඇඬීම, වැළපීම, ඇඬීම් බව වැළපීම් බව, වචනය, යනුයි.

4 "ශෝකය" යනු ඥාති ව්‍යසනයෙන් හෝ පීඩිතවූවහුගේ භොග, රෝග, සීල, දිට්ඨි ව්‍යසනයෙන් හෝ පීඩිත වූවහුගේ අනික් අනික් හෝ ව්‍යසනයන්ගෙන් පීඩිතවූවහුගේ අනික් අනික් හෝ දුක්ඛ ධර්මයෙන් පීඩිතවූවහුගේ ශෝකයක් ඇද්ද, ශෝක කිරීමක් ඇද්ද, ශෝක කිරීම් බවක් ඇද්ද, ඇතුළත ශෝකයක් ඇද්ද, ඇතුළත මහා ශෝකයක් ඇද්ද, ඇතුළත දාහයක් ඇද්ද ඇතුළත මහා දාහයක් ඇද්ද, සිතට ගෙන කල්පනා කිරීමේ දොම්නසක් ශෝක හුලක් ඇද්ද,

5 "මසුරු කම යනු මසුරුකම් පසකි. (ii) ආවාස මසුරු කම, කුල මසුරු කම, ලාභ මසුරුකම, කීර්ති මසුරුකම, ධර්ම මසුරු කම, යනුයි. (iii) යම් මෙබඳුවූ මසුරුවීමක් ඇද්ද,

මසුරුකමක් ඇද්ද, මසුරුවීම් බවක් ඇද්ද, තද මසුරු කමක් ඇද්ද, ඇමිනීමක් ඇද්ද, සිතින් ගැන්මක් ඇද්ද මෙය මසුරුකමයයි කියයි. නැවතද ස්කන්ධයන්ගේ මසුරුකමද මසුරුකමකි ආයතනයන්ගේ මසුරුකමද මසුරුකමකි. ධාතුන්ගේ මසුරුකමද මසුරුකමකි. දැඩිව ගැන්ම මසුරුකමයයි කියයි.

6 "මානයද අතිමානයද කේලාම් කීමද" යන්නෙහි මාන නම් මෙහි ඇතැම් පුද්ගලයෙක් (ii) ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලයෙන් හෝ පැහැ සපුවෙන් හෝ ධනයෙන් හෝ ඉගෙණීමෙන් හෝ කර්මායතනයෙන් හෝ ශිල්පායතනයෙන් හෝ විද්‍යාස්ථානයෙන් හෝ ඇසීමෙහි හෝ වැටහීමෙන් හෝ අනික් අනික් කරුණකින් හෝ (iii) මානය උපදවයි "අතිමානය" යනු මෙහි ඇතැම් පුද්ගලයෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ (මෙහි (ii) ඡෙදය යෙදිය යුතුයි) හෝ අන්‍යයා පහත්කොට සිතයි "කේලාම් කීම" යනු මෙහි ඇතැම් පුද්ගලයෙක් කේලාම් කියන්නේ වෙයි. (iv) මොවුන්ගේ භෙදය පිණිස මෙතනින් ආසා අතන කියන්නේ වෙයි. ඔවුන්ගේ භෙදය පිණිස අතන අසා මොවුන්ට කියන්නේ වෙයි. මෙසේ සමගිවූවන්ගේ බිඳීම පිණිස හෝ බිඳුනවුන්ට අනුබලදීම පිණිස හෝ වෙන්කිරීමෙහි යෙදුනේ වෙන් කිරීමෙහි ඇළුනේ වෙන්කරණ වචන කියන්නේ වෙයි, මේ කේලමයයි කියයි. කරුණු දෙකකින් කේලම් ඇති කරයි. ප්‍රියවීම කැමැත්තෙන් හෝ බිඳුවන අදහසින් හෝ යනුයි. ප්‍රියවීම කැමැත්තෙන් කෙසේ කේලම් ඇති කරයිද? මොහුට ප්‍රිය වන්නෙමි, මනාප වන්නෙමි, විශ්වාස වන්නෙමි. අබ්භ්‍යන්තරිකයෙක් වන්නෙමි, යහලුවෙක් වන්නෙමි'යි මෙසේ ප්‍රිය කම කැමැත්තෙන් කේලම ඇතිකරයි. (ii) බිඳුවීමේ අදහසින් කෙසේ කේලම ඇතිකරයිද, මොවුහු කෙසේ වෙන්වන්නහුද, ඇත් වන්නහුද වර්ගවන්නහුද බිඳෙන්නහුද දෙපක්ෂයක් වන්නහුද, එකතු නොවන්නාහුද මෙසේ බිඳුවන අදහසින් කේලම් ඇති කරයි.

7 "ඒ ක්ලෙශයෝ කොතනින් උපන්නෝද එය එසේ නම් කියව" කලහයද විවාදයද වැළපීමද ශොකයද මසුරුකමද

මානයද අතිමානයද කේලමද යන මේ අට කෙලෙස් කොතැනින් උපන්නෝද කොතැනින් හටගත්තෝද කොතනින් ඇතිවූවෝද කොතනින් පහළවූවෝද? මේ අට කෙලෙස් වල මුල විචාරයි. හේතුව විචාරයි. නිදානය විචාරයි. ඇතිවීම විචාරයි. ප්‍රභවය විචාරයි. පටන්ගැන්ම විචාරයි, ආහාරය විචාරයි, අරමුණ විචාරයි, ප්‍රත්‍යය විචාරයි, ඇතිවීම විචාරයි, හටගැන්ම විචාරයි, යනුයි "ඒවා කොතැනින් උපන්නාහුදැයි එසේනම් කියව" යනු එසේ නම් කියව, දෙශනා කරව, පණවව, තබව, විවෘත කරව, ප්‍රකට කරව ප්‍රකාශ කරව යනුයි.

## 11 - 2

1 "කලහයෝද විවාදයෝද වැළපීම්ද ශොකයෝද මසුරුකමද ප්‍රිය දෙයින් ඇතිවූවෝය." යනුනෙහි ප්‍රියයෝ දෙකොටසකි, සත්වයෝද සංස්කාරයෝද යනුයි (ii) ප්‍රියවූ සත්වයෝ කවරහුද, මෙහි යම්බඳු ඔහුගේ වැඩ කැමති, හිත කැමති, පහසුව කැමති මිදීම කැමති, මව හෝ පියා හෝ සහෝදරයා හෝ සහෝදරිය හෝ පුතා හෝ දුව හෝ මිත්‍රයා හෝ යහලුවා හෝ නෑයා හෝ සහලේ නෑයා හෝ ඔහුගේ ඔවුහු වෙද්ද මේ සත්වයෝ ප්‍රියයෝ වෙති ප්‍රියවූ (iii) සංස්කාරයෝ කවරහුද, මනවඩන රූපයෝ මනවඩන ශබ්දයෝ මන වඩන ගන්ධයෝ මනවඩන රශයෝ මනවඩන ස්පර්ශයෝ යනු මේ ප්‍රියවූ සංස්කාරයෝ (iv) ප්‍රියවූ වස්තුව සිඳෙයි යන සැකයෙන්ද කලහ කරත්. සිඳෙද්දීද සිඳුන කල්හිද කලහ කරත්. ප්‍රිය වස්තුව වෙනස් වේය යන සැකයෙන්ද කලහ කරත්, වෙනස් වෙද්දීද කලහ කරත්. වෙනස්වූ පසුද කලහ කරත්. ප්‍රියවූ වස්තුව සිඳේය යන සැකයෙන්ද විවාද කරත්. සිඳෙද්දීද සිඳුන කල්හිද විවාද කරත්. ප්‍රියවූ වස්තුව වෙනස්වේය යන සැකයෙන්ද විවාද කරත්. වෙනස් වෙද්දීද විවාද කරත්. වෙනස්වුන කල්හිද විවාද කරත්. ප්‍රියවූ වස්තුව වෙනස් වේය යන සැකයෙන්ද වැළපෙත්. වෙනස් වෙද්දිද වැළපෙත්, වෙනස්වූ කල්හිද වැළපෙත්, ප්‍රියවූ වස්තුව සිඳේය යන සැකයෙන්ද ශොක කරත්. ප්‍රියවූ වස්තුව සිඳෙන කල්හිද ශොක කරත්, ප්‍රියවූ වස්තුව සිඳුන පසුද ශොක කරත්

ප්‍රියවූ වස්තුව ආරක්ෂා කරත්. ඊක ගනිත්, මාගේයයි සිතත් මසුරු වෙත්.

2 "මානයද අතිමානයද කේලාම් කීමද" යනු ප්‍රියවූ වස්තුව නිසා මානය උපදවත්. ප්‍රියවූ වස්තුව නිසා අතිමානය උපදවත්. ප්‍රියවූ වස්තුව නිසා කෙසේ මානය උපදවත්ද, මන වඩන රූපයන්ගේ ශබ්දයන්ගේ ගන්ධයන්ගේ රශයන්ගේ ස්පර්ශයන්ගේ ලාභය ඇත්තෝ වෙමු. අනික් මොවුහු මන වඩන රූපයන්ගේ ශබ්දයන්ගේ ගන්ධයන්ගේ රශයන්ගේ ස්පර්ශයන්ගේ ලාභය නැත්තෝය මෙසේ ප්‍රිය වස්තුව නිසා මානය උපදවත්. ප්‍රිය වස්තුව නිසා අතිමානය කෙසේ ඇති වේද, අපි මන වඩන රූපයන්ගේ ශබ්දයන්ගේ ගන්ධයන්ගේ රශයන්ගේ ස්පර්ශයන්ගේ ලාභය ඇත්තෝ වෙමු. අනික් මොවුහු මන වඩන්නාවූ රූපයන්ගේ ශබ්දයන්ගේ ගන්ධයන්ගේ රශයන්ගේ ස්පර්ශයන්ගේ ලාභය නැත්තෝය. මෙසේ ප්‍රියවූ වස්තුව නිසා අතිමානය උපදවත්.

4 "කේලම" යනු මෙහි ඇතැම් කෙනෙක් කේලාම් කියන්නේ වෙයි. මොවුන්ගේ භෙදය පිණිස මෙයින් අසා අසවල් තැන කියන්නේ වෙයි. ( (11-1) 6 (iv) ඡෙද යෙදිය යුතුයි.) මෙසේ බිඳවීමේ බලාපොරොත්තුවෙන් කේලාම් කියයි.

5 "කලහ විවාදයෝ මසුරුකමින් යුක්ත වෙති" යනු කලහයද විවාදයද වැළපීමද ශෝකයද මානයද අතිමානයද කේලමද යන මේ කෙලෙස් සිත මසුරු කමෙහි යෙදුනේය.

6 "විවාදය ඇති කල්හි කේලම ඇති කරයි." යනු විවාදය ඇතිවූ කල්හි හටගත් කල්හි පහළවූ කල්හි කේලම ඇති කරත්. මොවුන්ගේ බිඳීම පිණිස මෙතනින් අසා අතන කියත්. අසවලුන්ගේ භෙදය පිණිස එතනින් අසා මෙතන කියන්නේ වෙයි. මෙසේ සමගිවූවන්ගේ බිඳීම පිණිස බිඳුනවුන්ට අනුබල දීම පිණිස වෙන්වීම බලාපොරොත්තු වන්නේ වෙන්වීමෙහි ඇලුනේ වෙන්වීමෙහි බැඳුනේ වෙන් කරන්නාවූ වචන කියන්නාහු වෙත් මෙය කේලමයයි කියත්. නැවතද කරුණු

දෙකකින් කේලම් ඇති කරත්. ( (11 1) 6 (iv) සිට ඡේදය යෙදිය යුතුයි.)

## 11 - 3

1 "ලොකයෙහි ප්‍රියවූ වස්තූන්ට නිදානය කවරේද" යනු ප්‍රියයෝ කුමක් මුල්කොට ඇත්තෝද, කොතැනින් උපන්නෝද, කොතනින් ඇතිවූවෝද, කොතනින් පහල වූවෝද නිදානය කෙසේද, ඇතිවීම කෙසේද, ඉපදීම කෙසේද, ප්‍රභවය කෙසේදැයි ප්‍රියයන්ගේ මුල විචාරයි ( (11-1) 7 ඡේදයේ හේතුව විචාරයි යන තැන සිට යෙදිය යුතුයි.) ඇතිවීම විචාරයි. ඉල්ලයි. බලාපොරොත්තු වෙයි යනුයි.

2 "යම් කෙනෙක් ලොකයෙහි ලොභයෙන් හැසිරෙද්ද, යන්නෙහි යම් කෙනෙක් යනු ක්ෂත්‍රියයෝද, බ්‍රාහ්මණයෝද වෛශ්‍යයෝද, ශුද්‍රයෝද, ගිහියෝද, පැවිද්දෝද, දෙවියෝද, මිනිස්සුද යනුයි. (ii) "ලොභය" යනු යම් ලොභයක්, ලොභී බවක් ඇලීමක් අභිධ්‍යාවක් අකුශල මූලයක් ඇද්ද එයයි. (iii) "හැසිරෙත්" යනු වාසය කරත්. ඉරියව් පවත්වත්, පවතිත්, පාලනය කරත්, යැපෙත් යනුයි.

3 "ආශාවද නිෂ්ඨාවද කොතනින් ඇතිවූවෝද" යන්නෙහි ආශාවද නිෂ්ඨාවද කොතනින් ඇතිවූවෝද, කොතනින් උපන්නෝද, කොතනින් හටගන්නෝද, කොතනින් පහළ වූවෝදැ'යි ආශාවේද නිෂ්ඨාවේද මුල විචාරයි. යනුයි. "යම් දේවල් මිනිසාට පිහිට පිණිස වෙත්" යනු යම් දේවල් මිනිසාගේ පිහිට පිණිස වෙද්ද, ආලොකය පිණිස වෙද්ද, ආරක්ෂාව පිණිස වෙද්ද, සරණය පිණිස වෙද්ද, නිෂ්ඨාව පරායනය පිණිස වෙද්ද යනුයි.

## 11 - 4

1 "ලොකයෙහි ප්‍රියවූ වස්තූන් ඡන්දය නිදානකොට ඇත්තෝය," යන්නෙහි ඡන්ද නම් කාමයන්හි යම් කාමාශාවක් ඇත්තේ කාම රාගයක් ඇත්තේ කාම බැඳීමක් ඇත්තේ, කාම තෘෂ්ණාවක් ඇත්තේ, කාම සෙනහස ඇත්තේ කාම දාහය

ඇත්තේ කාම මූර්ඡාව ඇත්තේ කාමයෙහි බැසගත්තේද කාම ඔඝය කාම යොගය කාම උපාදානය කාමච්ඡන්ද නීවරණයද යනුයි. නැවතද කැමතිවීම් පසෙකි. සෙවීමේ කැමැත්ත, ලැබීමේ කැමැත්ත, පරිභොග කිරීමේ කැමැත්ත රැස් කිරීමේ කැමැත්ත, වියදම් කිරීමේ කැමැත්ත යනුයි. සෙවීමේ කැමැත්ත කවරේද, මෙහි ඇතැම් පුද්ගලයෙක් ගැලුනේ ප්‍රයෝජන කැමැත්තේ ආශාව ඇත්තේ රූපයන් සොයයි. ශබ්දයන්, ගන්ධයන්, රශයන් ස්පර්ශයන් ලබයි. මේ සෙවීමේ කැමැත්තයි. ලැබීමේ කැමැත්ත කවරේද? මෙහි ඇතැම් පුද්ගලයෙක් ගැලුනේම ප්‍රයෝජන කැමැත්තේ ආශාව ඇත්තේ රූපයන් ලබයි. ශබ්දයන්, ගන්ධයන්, රශයන්, ස්පර්ශයන්, ලබයි මේ ලැබී මේ කැමැත්තයි. පරිභොග කිරීමේ කැමැත්ත කවරේද, මෙහි ඇතැම් පුද්ගලයෙක් ගැලුනේ ප්‍රයෝජන කැමැත්තේ ආශා ඇත්තේ රූපයන් පරිභොග කරයිද, ශබ්දයන් ගන්ධයන් රශයන් ස්පර්ශයන් පරිභොග කරයිද, මේ පරිභොග කැමැත්තයි. රැස්කිරීමේ කැමැත්ත කවරේද, මෙහි ඇතැම් පුද්ගලයෙක් ගැලුනේ ප්‍රයෝජන ඇත්තේ ආශා ඇත්තේ විපතකදී පිහිට වන්නේයයි ධනය රැස් කරයි. මේ රැස් කිරීමේ කැමැත්තයි. වියදම් කිරීමේ කැමැත්ත කවරේද, මෙහි ඇතැම් පුද්ගලයෙක් ගැලුනේ ප්‍රයෝජන ඇත්තේ ආශා ඇත්තේ ඇතරුවන්ටද අසරුවන්ටද රියැදුරන්ටද දුනු ගත්තවුන්ටද පාබල සෙනඟටද මොවුහු මා රකිත්. ආරක්ෂා කෙරෙත්. පිරිවරත් යයි ධනය වියදම් කරයි. මේ වියදම් කිරීමේ කැමැත්තයි. "ප්‍රියවූදේ" යනු ප්‍රිය කරුණු දෙකකි. සත්වයෝ හෝ සංස්කාරයෝ හෝ යනුයි. ( (11-2) 1, (ii) (iii) ඡෙද යෙදිය යුතුයි.) ලෝකයෙහි ප්‍රියවූ දේ කැමැත්ත නිදාන කොට ඇත්තේය යනු ප්‍රිය වස්තු කැමැත්ත නිදානකොට ඇත්තේය. කැමැත්තෙන් උපන්නේය. කැමැත්ත ජාති කොට ඇත්තේය. කැමැත්තෙන් ප්‍රභවය යනුයි

2 "ලෝකයෙහි යම් කෙනෙක් ලොභයෙන් හැසිරෙද්ද" යන්නෙහි යම් කෙනෙක් යනු ක්ෂත්‍රියයෝද බ්‍රාහ්මණයෝද වෛශ්‍යයෝද ශුද්‍රයෝද ගිහියෝද පැවිද්දෝද දෙවියෝද මිනිස්සුද යනුයි. ලොභයෙන් යනු යම් ලොභයක් වේද, ලෝභී බවක්

වේද, ඇලීමක් වේද, ඇලීම් බවක් වේද, දැඩි ලෝභයක් වේද, අකුශල මූලයක් ඇද්ද එයයි. "හැසිරෙත්" යනු හැසිරෙත්. වාසය කෙරෙත්. ඉරියව් පවත්වත්. පවතිත්. පාලනය කරත්. යැපෙත් යනුයි. ලෝකයෙහි යනු ( (3-4) 6 ඡේදය යෙදිය යුතුයි.)

3 "ආශාවද නිෂ්ඨාවද මෙයින් නිදානය" යනු යම් රාගයක් ඇද්ද යම් ඇලීමක් ඇද්ද, දැඩිලොභයක් ඇද්ද, අකුශලමූලයක් ඇද්ද එයයි. "නිෂ්ඨා" යනු මෙහි ඇතැම් පුද්ගලයෙක් රූපය සොයන්නේ රූපය ලබයි. රූපය කෙළවර කොට ඇත්තේ වෙයි. ශබ්ද-ගන්ධ-රශ ස්පර්ශයන් කුලය, ගණය, ආවාසය, ලාභය, කීර්තිය, ප්‍රශංසාව, සැපය; චීවරය, පිණ්ඩපාතය, සෙනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකර, සූත්‍රාන්තය, විනය, අභිධර්මය, ආරඤ්ඤිකාංගය, පිණ්ඩපාතිකාංගය, පාංශුකූලිකාංගය, තෙචීවරිකාංගය, සපදානචාරිකාංගය, ඛලුපච්ඡාභත්තිකාංගය, නෙසජ්ජිකාංගය, යථාසන්තතිකාංගය, ප්‍රථමධ්‍යානය, ද්විතීයධ්‍යානය, තෘතීයධ්‍යානය, චතුර්ථධ්‍යානය, ආකාශානඤ්චායතන සමාපත්තිය, විඤ්ඤානඤ්චායතන සමාපත්තිය ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය, නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය, සොයන්නේ නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය ලබයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියෙහි නිෂ්ඨාවට ගියේ වෙයි.

4 "ආශාවෙන් කෙත සීසායි. ආශාවෙන් බිජුවට වපුරයි. ධනය රැස් කරන්නාවූ වෙළෙන්දෝ ආශාවෙන් මුහුදෙහි යත්. යම් ආශාවකින් නිෂ්ඨාවට ගියේද මාගේ ඒ ආශාව සමෘද්ධ වෙයි." ආශාවේ සමෘද්ධියට නිෂ්ඨාවයයි කියනු ලැබේ. ආශාවද නිෂ්ඨාවද මෙයින් උපන්නේය යනු ආශාවද නිෂ්ඨාවද මෙයින් හටගත්තේය. කැමැත්ත නිදානකොට ඇත්තේය. කැමැත්තෙන් හටගත්තේය. කැමැත්ත ජාතිකොට ඇත්තේය කැමැත්ත ප්‍රභවකොට ඇත්තේය යනුයි "යම් දෙයක් මිනිසාගේ පිහිට පිණිස වෙද්ද යනු යමක් මිනිසාගේ පිහිට පිණිස වෙද්ද ආරක්ෂා ස්ථානයක් වෙද්ද, නිෂ්ඨාවක් වෙද්ද යනුයි.

## 11 - 5

1 "ලොකයෙහි කැමැත්ත කොහින් උපන්නේද" යනු කැමැත්ත කොහින් උපන්නේද, කොහින් හටගත්තේද, කොහින් පහළවූයේද, යනුවෙන් කැමැත්තේ මුල විචාරයි. (11-1) 7 ඡේදයේ හේතුව විචාරයි යන තැන සිට යෙදිය යුතුයි.) ඇතිවීම විචාරයි ඉල්වයි බැසගනියි, පහදවයි යනුයි.

2 "විනිශ්චයද කොහින් උපන්නේද" යනු විනිශ්චය කොහින් උපන්නේද, කොහින් ඇතිවූයේද, කොහින් පහළවූයේද, කුමක් ප්‍රභවකොට ඇත්තේද යනුවෙන් විනිශ්චයයන්ගේ මුල විචාරයි (11-1) 7 ඡේදයේ හේතුව විචාරයි යන තැන සිට යෙදිය යුතුයි) ඇතිවීම විචාරයි ඉල්වයී බැස ගනියි යනුයි

3 ක්‍රොධයද මුසාවාදයද කෙසේදැයි සැකයද" යන්නෙහි ක්‍රොධය නම් (10-3) 1 ඡේදය යෙදිය යුතුයි) මොස වජ්ජයයි මුසාවාදයට කියයි "කථං කථ" යනු සැකයට කියයි යනුයි. යම් ඒ ධර්මයෝ ශ්‍රමණයන් වහන්සේ විසින් දෙශනා කරණ ලදී, යනු යම් ඒ ධර්මයක් ක්‍රොධයෙන්ද මුසාවාදයෙන් ද එකට උපන්නාහුද මිශ්‍රවූවාහුද එකට නිරුද්ධ වූවාහුද එක වස්තුකවූවාහුද, එකම අරමුණක් වූවාහුද මොවුහු යම් ඒ ධර්මයෝයයි කියත්, ශ්‍රමණයන් වහන්සේ විසින් කියනලදී යනු සමිත පාපීවූ ශ්‍රමණයන් වහන්සේ විසින් බාහිත පාපීවූ බිඳුන කෙලෙස් මුල් ඇති සියලු අකුශල මූලයන් මිදුනාවූ බ්‍රාහ්මණ නම්වූ භික්ෂූන් වහන්සේ විසින් කියන ලදී. දෙශනා කරණ ලදී. පණවන ලදී. තබන ලදී. විවෘත කරණ ලදී. බෙදන ලදී. ප්‍රකට කරණ ලදී, ප්‍රකාශ කරණ ලදී, යනුයි.

## 11 - 6

1 "ලොකයෙහි සුඛ වෙදනාවද දුඃක්ඛ වෙදනාවද යමක්යයි කියද්ද" යන්නෙහි සුඛවෙදනාව නම් සැප වෙදනාව ඉෂ්ට වස්තුවයි. දුක්ඛ වෙදනා නම් දුක් වෙදනාව අනිෂ්ට වස්තුවයි ලොකයෙහි යමක්යයි කියද්ද" යනු යමක් කියද්ද, යමක් ප්‍රකාශ කරද්ද, යමක් ව්‍යවහාර කරද්ද යනුයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

2 "ඒ නිසා කැමැත්ත උපදියි" යනු සැප වේදනාව දුක් වේදනාව නිසා සුවදුක් නිසා සොම්නස් දොම්නස් නිසා ඉටු අනිටු නිසා අනුනය (මිත්‍රත්වය) ප්‍රතිඝ (කෝපය) නිසා කැමැත්ත ඇතිවෙයි. පහළවෙයි, හටගනී, යනුයි

3 "රූපයන්හි භවයද විභවයද දැක" යන්නෙහි රූපයන්හි යනු සතර මහාභූතයෝද සතර මහා භූතයන්ගේ උපාදාය රූපද යනුයි. රූපයන්ගේ ඇතිවීම කවරේද, යමක් රූපයන්ගේ ඇතිවීම වේද හටගැනීම වේද, නිපදීම වේද, පහළවිම වේද, මේ රූපයන්ගේ ඇතිවීමයි. රූපයන්ගේ විභවය (නැතිවීම) කවරේද, යමක් රූපයන්ගේ හීනවීම වේද, විනාශය වේද, බිඳීම වේද; අනිච්චතාව වේද, අතුරුදහන්වීමක් වේද, මේ රූපයන්ගේ විනාශයයි. "රූපයන්හි භවයද විභවයද දැක" යනු රූපයන්හි ඇතිවීමද නැතිවීමද දැක සමකොට බලා තීරණයකොට ප්‍රකටකොට යනුයි.

4 "සත්වතෙමේ ලොකයෙහි විනිශ්චය කරයි" යන්නෙහි විනිශ්චය යනු විනිශ්චය දෙකකි. තෘෂ්ණා විනිශ්චයද දෘෂ්ටි විනිශ්චයද යනුයි. තෘෂ්ණා විනිශ්චය කෙසේ කෙරේද? මෙහි ඇතැම් පුද්ගලයෙකුට නූපන් ලොභයෝ නූපදිත්ද, උපන් ලොභයෝ පිරිහීමට යෙද්ද; ඔහුට මේ අදහස වෙයි මට කවර උපායකින් නූපන් භොගයෝ නූපදිද්ද උපන් භොගයෝ පිරිහීමට යෙද්ද යනුයි. ඔහුට මේ අදහස වෙයි. ප්‍රමාදයට හේතුවූ මත් ද්‍රව්‍ය සේවනය කරන්නාවූ මට නූපන් භොගයෝ නූපදිත්, උපන් භොගයෝ පිරිහීමට යෙද්ද නොකල්හි විථිසංචාරය කිරීමෙහි යෙදුනාවූ මට නූපන් භොගයෝ නූපදිත්, උපන් භොගයෝ පිරිහීමටයෙත්, නෘත්‍යබැලීමට යාමෙහි යෙදුනාවූ දූ කෙළියෙහි යෙදුනාවූ පාපමිත්‍රයන් ඇසුරු කිරීමෙහි යෙදුනාවූ මට නූපන් භොගයෝ නූපදිද්ද, උපන් භොගයෝ පිරිහීමට යෙද්ද, අලසකමෙහි යෙදුනාවූ මාගේ නූපන් භොගයෝ නූපදිත්, උපන් භොගයෝ පිරිහීමට යෙත්යයි, මෙසේ නුවණ මෙහෙයා භොගයන්ගේ පිරිහිම් මුඛ සය සේවනය නොකරයි. මෙසේද තෘෂ්ණා විනිශ්චය කරයි. යලිදු හෝ සීසෑමෙන් හෝ වෙළඳාමෙන්

හෝ ගවයන් බැලීමෙන් හෝ දුනු ශිල්පාදියෙන් හෝ රජුට සේවය කිරීමෙන් හෝ වෙනින් අනික් ශිල්පයකින් හෝ කාලය ගෙවයි. මෙසේද තෘෂ්ණා විනිශ්චය කරයි. කෙසේ දෘෂ්ටි විනිශ්චය කෙරේද,

5 "ඇස ඇතිවූ කල්හි මාගේ ආත්මය උපන්නේයයි දනියි. ඇස අතුරුදන්වූ කල්හි මාගේ ආත්මය අතුරුදන් වූයේ මාගේ ආත්මය වෙන්වූයේයයි දනියි. මෙසේද දෘෂ්ටි විනිශ්චය කරයි. කණ, නාසය, දිව, කය, රූපය, ශබ්දය, ගන්ධය, රශය, ස්පර්ශය උපන් කල්හි මාගේ ආත්මය උපන්නේයයි දනියි. ස්පර්ශය අතුරුදහන්වූ කල්හි මාගේ ආත්මය අතුරුදහන්වූයේය. මාගේ ආත්මය වෙන්වූයේයයි දනියි මෙසේද දෘෂ්ටි විනිශ්චය කරයි, උපදවයි, ඇතිකරයි, පහළ කරයි. "සත්වයා" යනු සත්වයා නරයා, මානවයා (1-7) (ii) ඡේදය යෙදිය යුතුයි) මනුජයා යනුයි, "ලොකයෙහි" යනු අපාය ලොකයෙහි (මෙහි (3-4) 6 ඡේදය යොදාගත යුතුයි) ආයතන ලොකයෙහි යනුයි.

## 11 - 7

1 "ක්‍රොධයද, මුසාවාදයද කෙසේදැයි සැකයද, යනු මෙබඳුවූ සිතේ වෛරයක් ක්‍රොධයක් (මෙහි (10-7) 3 ක්‍රොධයක් යන තැන සිට යොදාගත යුතුයි.) එයයි "මොසවජ්ජ" යයි මුසාවාදයට කියයි. දැඩි සැකය යනු විචිකිච්ඡාවට කියයි. ඉෂ්ට වස්තුව නිසාද ක්‍රොධය ඇතිවෙයි. අනිෂ්ට වස්තුව නිසාද ක්‍රොධය ඇතිවෙයි. ඉෂ්ට වස්තුව නිසාද, මුසාවාදය ඇතිවෙයි. අනිෂ්ට වස්තුව නිසාද මුසාවාදය උපදියි. ඉෂ්ට වස්තුව නිසාද කෙසේදැයි සැකය උපදියි. අනිෂ්ට වස්තුව නිසාද කෙසේදැයි සැකය උපදියි. අනිෂ්ට වස්තුව නිසා කෙසේ ක්‍රොධය ඇතිවේද? ප්‍රකෘතියෙන්ම අනිෂ්ට වස්තුව නිසා ක්‍රොධය ඇතිවෙයි. මට අවැඩක් කළේයයි ක්‍රොධය ඇතිවෙයි. මට අවැඩ පිණිස හැසිරේයයි ක්‍රොධය ඇතිවෙයි. මට අවැඩ පිණිස හැසිරෙන්නේ යයි ක්‍රොධය ඇතිවෙයි. මාගේ හිතවතාට අවැඩක් කළේයයි මාගේ හිතවතාට අවැඩක් කෙරේයයි මාගේ හිතවතාට අවැඩක් කරන්නේයයි මා හා නොමනාප වූවහුට වැඩ පිණිස හැසුරුණේය.

හැසිරෙයි, හැසිරෙන්නේයයි ක්‍රොධය උපදියි. මෙසේ අනිෂ්ට වස්තුව නිසා ක්‍රොධය උපදියි. කෙසේ ඉෂ්ට වස්තුව නිසා ක්‍රොධය ඇතිවේද? ඉෂ්ට වස්තුව සිඳේය යන සැකයෙන්ද ක්‍රොධය උපදියි. සිඳෙද්දීද ක්‍රොධය උපදියි. සිඳුන කල්හිද ක්‍රොධය උපදියි. ඉෂ්ට වස්තුව වෙනස් වේය යන සැකයෙන්ද ක්‍රොධය උපදියි. වෙනස් වෙද්දීද ක්‍රොධය උපදියි. වෙනස්වූ කල්හිද ක්‍රොධය උපදියි. මෙසේ ඉෂ්ට වස්තුව නිසා ක්‍රොධය හටගනියි. අනිෂ්ට වස්තුවනිසා කෙසේ මුසාවාදය ඇතිවේද, මෙහි ඇතැම් පුද්ගලයෙක් හිරගේවල බැඳීමෙන් හෝ බන්ධනයෙන් මිදීම පිණිස දැන දැන බොරු කියයි. රැහැන් වලින් බැඳුනේ හෝ මාංචු ආදියෙන් බැඳීමෙන් හෝ වේවැලින් බැඳීමෙන් හෝ වැලෙන් බැඳීමෙන් හෝ ඇතුළුකොට බැඳීමෙන් හෝ වට කොට බැඳීමෙන් හෝ ගම් නියම්ගම්, නගර ජනපද රටවල් බැඳීමෙන් හෝ ජනපද බන්ධනයෙන් හෝ බැඳුනේ ඒ බන්ධනයෙන් මිදීම පිණිස දැන දැන බොරු කියයී. මෙසේ අනිෂ්ට වස්තුව නිසා බොරු කියයි. ඉෂ්ටවස්තුව නිසා කෙසේ මුසාවාදය උපදීද, මෙහි ඇතැම් පුද්ගලයෙක් මනවඩන රූපයන් නිසා දැන දැන බොරු කියයි. මනවඩන ශබ්ද නිසා මනවඩන සුවඳ නිසා මනවඩන රශයන් නිසා මනවඩන ස්පර්ශයන් නිසා සිවුරු නිසා, පිණ්ඩපාතය නිසා, සෙනාසනයන් නිසා, ගිලන්පස බෙහෙත් පිරිකර නිසා දැන දැන බොරු කියයි මෙසේ ඉෂ්ට වස්තුව නිසා දැන දැන බොරු කියයි. කෙසේ ඉෂ්ට වස්තුව නිසා කෙසේදැයි සැකය උපදීද, මෙහි ඇතැම් පුද්ගලයෙක් කෙසේ ඇස් රෝගයෙන් මිදෙන්නෙමියි කන් රෝගයෙන් මිදෙන්නෙමියි නාසා රෝගයෙන් මිදෙන්නෙමියි දිවේ රෝගයෙන් මිදෙන්නෙමියි, කාය රෝගයෙන් මිදෙන්නෙමියි හිසේ රෝගයෙන් මිදෙන්නෙමියි, මුඛ රෝගයෙන් මිදෙන්නෙමියි දත් රෝගයෙන් මිදෙන්නෙමියි මෙසේ අනිෂ්ට වස්තුව නිසා කෙසේ දැයි යන සැකය උපදියි. කෙසේ ඉෂ්ට වස්තුව නිසා කෙසේදැයි යන සැකය උපදීද. මන වඩන රූපයන් ලබන්නෙම්දෝ, නොලබන්නෙම්දෝයි මන වඩන ශබ්දයන් ලබන්නෙම්දෝ නොලබන්නෙම්දෝ, මනවඩන සුවඳ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ලබන්නෙම්දෝ, නොලබන්නෙම්දෝ, මන වඩන ස්පර්ශයන් ලබන්නෙම්දෝ නොලබන්නෙම්දෝ, කුලය, ගණය, ආවාසය, ලාභය, කීර්තිය, ප්‍රශංසාව, සුඛය, චීවරය, පිණ්ඩපාතය, සේනාසන ගිලන්පස බෙහෙත් පිරිකරදැයි, මෙසේ ඉෂ්ට වස්තුව නිසා කෙසේදැයි සැකය උපදියි යනුයි

2 "මේ ධර්මයෝ දෙක දෙක ඇති කල්හි" යනු ඉෂ්ටානිෂ්ටයන් ඇති කල්හි සුඛ දුක්ඛයන් ඇති කල්හි සොම්නස් දොම්නස් ඇතිකල්හි ඉෂ්ටානිෂ්ට ඇති කල්හි අනුකූල බව හා විරොධය ඇතිකල්හි විද්‍යමාන කල්හි යනුයි.

3 "කෙසේ දැයි සැක ඇති තැනැත්තේ ඥානපථයෙහි හික්මෙන්නේය." යන්නෙහි ඥානයද, ඥානපථයයි. ඥානයාගේ ආරම්මනයද ඥානපථයයි. ඥානය සමග එකට ඇතිවන්නාවූ ධර්මයෝද ඥානපථයයි. යම්සේ ආර්‍ය්‍ය මාර්ගය ආර්‍ය්‍ය පථය නම් වේද, දේව මාර්ගය දේවපථය නම් වේද, බ්‍රහ්ම මාර්ගය බ්‍රහ්ම පථය නම්වේද, මෙපරිද්දෙන්ම ඥානයද ඥානපථයයි. ඥානයා ගේ ආරම්මනයද ඥානපථයයි ඥානය සහ එකට උපදින්නා වූ ධර්මයෝද ඥානපථයයි.

4 "හික්මෙන්නේය. යනු ශික්ෂා තුනෙකි. අධිශීල ශික්ෂා අධිචිත්ත ශික්ෂා අධි පඤ්ඤා ශික්ෂා යනුයි. අධිශිලශික්ෂාව කවරේද? මෙහි මහණතෙමේ සිල් ඇත්තේවේද, ස්වල්ප වරදෙහි බිය දක්නාසුළුව ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවූයේ ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවරව වාසය කෙරේද, ශික්ෂා පදයන් සමාදන්ව හික්මේද, කුඩා ශීලස්කන්ධය, මහා සීලස්කන්ධය, සීලයෙහි පිහිටා පළමු හැසිරීම, සංයමය, සංවරය මුඛය ප්‍රමුඛය, අකුශල ධර්මයන්ගේ හික්මීම යනු මේ අධිසීල ශික්ෂාවය. අධිචිත්ත ශික්ෂාව කවරේද, මෙහි මහණ තෙම කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන්ගෙන් වෙන්ව ( (2-4) 1 (iii) ඡේදය යෙදිය යුතුයි.) ( (2-4) 2 ඡේදයේ "අධිපඤ්ඤා ශික්ෂාවයි" යන තැන සිට යෙදියයුතුයි.) මේ දුක් නිරුද්ධ කිරීමට ගමන් කරණ ප්‍රතිපදාවයයි තත්වූ පරිදි දනියි මේ ආශ්‍රවයෝයයි තත්වූ පරිදි දනියි. මේ ආශ්‍රව නිරොධයට ගමන් කරණ ප්‍රතිපදාව යයි තත්වූ පරිදි දනියි. මේ අධි පඤ්ඤා ශික්ෂාවයි.

5 "කෙසේදැයි සැක ඇති තැනැත්තේ ඥානකථාවෙහි හික්මෙන්නේය. යනු සැක ඇති පුද්ගලතෙමේ සැක සහිත වූයේ අදහස් දෙකක් ඇත්තේ විචිකිච්ඡා ඇත්තේ ඥානාධිගමය පිණිස ඥාන ස්පර්ශය පිණිස, ඥානය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස, අධිශීලයෙහිද හික්මෙන්නේය. අධිචිත්තයෙහිද හික්මෙන්නේය. අධිප්‍රඥාවෙහිද හික්මෙන්නේය. මේ ශික්ෂා තුන මෙනෙහි කරන්නේ හික්මෙන්නේය. දැනගන්නේ හික්මෙන්නේය. නුවණින් සිතාබලන්නේ හික්මෙන්නේය. සිත පිහිටුවන්නේ හික්මෙන්නේය නුවණින් දැනගන්නේ හික්මෙන්නේය.

6 දැනගතයුත්ත දැනගන්නේ හික්මෙන්නේය. විශෙෂයෙන් දැනගතයුත්ත දැනගන්නේ හික්මෙන්නේය. දුරුකළ යුත්ත දුරුකරන්නේ හික්මෙන්නේය. වැඩියයුත්ත වඩන්නේ හික්මෙන්නේය. ප්‍රත්‍යක්ෂකටයුත්ත ප්‍රත්‍යක්ෂ කරන්නේ හික්මෙන්නේය. හැසිරෙන්නේය. සමාදන්ව සිටින්නේය යනුයි.

7 "ශ්‍රමණයන් වහන්සේ විසින් පවත්වන ලද ධර්මය දැන" යනු දැන ජානනය කොට සමකොට බලා තීරණය කොට ප්‍රකටකොට පවත්වනලදී. ප්‍රකාශ කරණ ලදී. දෙශනා කරණලදී. "සියලු සංස්කාරයෝ අනිත්‍යයයි දැන සමකොට බලා ප්‍රකටකොට කියන ලදී. ප්‍රකාශ කරණ ලදී. දෙශනා කරණ ලදී. පණවන ලදී තබන ලදී. විවෘත කරණ ලදී බෙදන ලදී. ප්‍රකාශ කරණ ලදී. සියලු සංස්කාරයෝ දුක්යයි සියලු ධර්මයෝ අනාත්මයයි අවිද්‍යා හේතුවෙන් සංස්කාරයෝ ඇති වේයයි ( (4-5) 4 ඡේදයයෙදිය යුතුයි) විශෙෂයෙන් දැනගත යුතුයයි මේ ධර්මයෝ දුරු කටයුතු යයි මේ ධර්මයෝ ප්‍රත්‍යක්ෂ කටයුතුයයි සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ඇතිවීමද නැතිවීමද ආශ්වාදයද ආදීනවයද නික්මීමද පස්වැදෑරුම් උපාදානස්කන්ධයන්ගේ සතර වැදෑරුම් මහාභූතයන්ගේ, යම්කිසි හේතුවකින් උපන් ධර්මයක් ඇද්ද ඒ සියල්ල නැතිවීම් පිණිස පවත්නේයයි දැන සමකොට බලා තීරණය කොට ප්‍රකටකොට කියන ලදී. දෙශනා කරණ ලදී, පණවනලදී,

තබනලදී විවෘත කරණලදී බෙදන ලදී ප්‍රකාශ කරණලදී මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරණ ලදී "මහණෙනි, මම මනාකොට දැන ධර්මය දෙශනා කරමි. මනාකොට නොදැන නොවේ මම නිදාන සහිතව ධර්මය දෙශනා කරමි නිදාන රහිතව නොවේ. මම ප්‍රාතිහාර්‍ය්‍ය සහිතව ධර්ම දෙශනා කරමි. ප්‍රාතිහාර්‍ය්‍ය රහිතව නොවේ. නොදැන නොව මනාකොට දැන දෙශනා කරන්නාවූ මාවිසින් නිදාන රහිතව නොව නිදාන සහිතව දෙශනා කරන්නාවූ මාවිසින් ප්‍රාතිහාර්‍ය්‍ය රහිතව නොව ප්‍රාතිහාර්‍ය්‍ය සහිතව දෙශනා කරන්නාවූ මා විසින් අවවාද කටයුතුය අනුශාසනා කටයුතුය. තොපට ප්‍රීතියෙන් කම්නැත. ප්‍රමෝදයෙන් කම් නැත සොම්නසින් කම්නැත භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධය. ධර්මය මනාකොට දෙශනා කරණ ලදී. සංඝයා මනාකොට පිළිපන් සේක. මේ ධර්මය දෙශනා කරද්දී දශ දහසක් ලෝකධාතූහු කම්පිතවූහ. යනුයි.

## 11 - 8

1 "සැපයද නොසැපයද කොතැනින් ඇතිවූයේද" යනු සැපදුක් කොතනින් හටගත්තෝද කොතනින් උපන්නෝද කොතනින් ඇතිවූවෝද කොතනින් පහළවූවෝද කොතනින් ප්‍රභවවූවෝද හටගැනීම කෙසේද ඇතිවීම කෙසේදැයි සැප දුක් වල මුල විචාරයි. ( (11-1) 7 ඡෙදයේ හේතුව විචාරයි යන තැනසිට යෙදිය යුතුයි.) ඇතිවීම විචාරයි, ඉල්වයී, බලාපොරොත්තුවෙයි යනුයි.

2 "කුමක්වත් නැතිකල්හි මොවුහු නොවෙත්" යනු කුමක්වත් නැති කල්හි විද්‍යමාන නොවන කල්හි සැපදුක් නොවෙත්. නූපදිත්, හටනොගනිත් පහළ නොවෙත් යනුයි විභවයද භවයද යන මේ අර්ථයක් ඇද්ද, යනු සැපදුක්වල ඇතිවීම් කවරේද සැපදුක්වල යම් ඇතිවීමක් ඇද්ද හටගැනීමක් ඇද්ද. පහළවීමක් ඇද්ද මේ සැපදුක්වල ඇතිවීමයි සැප දුක්වල නැතිවීම කවරේද, සැප දුක්වල ක්ෂය යමක්ද විනාශය යමක්ද බිඳීම යමක්ද, අනිත්‍යතාව යමක්ද, අතුරුදහන්වීම යමක්ද, මේ සැපදුක්වල නැතිවීමයි.

3 "යමකින් ඇතිවන්නේ නම් එය මට කියනු මැනවි" යන්නෙහි එය යනු යමක් විචාරම්ද යමක් බලාපොරොත්තු වම්ද, යමකට පහදීම්ද, යනුයි කියනු මැනවි යනු කියනු මැනව, දෙශනා කරණු මැනව, පනවනු මැනව, තබනු මැනව, විවෘත කරණු මැනව, ප්‍රකාශ කරණු මැනව යනුයි යමකින් ඇතිවන්නේ නම් යනු යමක් නිදාන කොට ඇත්තේ නම් යමක් ඇතිවීමකොට ඇත්තේ නම්, යමක් ප්‍රභවකොට ඇත්තේ නම් යනුයි.

## 11 - 9

1 "සැප දුක් ස්පර්ශය නිදාන කොට ඇත්තේය." යනු සැප වේදනාව ඇති ස්පර්ශය නිසා සැප වේදනාව උපදියි. යම්බඳු ඒ සුඛ වේදනාව ඇති ස්පර්ශයාගේ නැතිවීමෙන්, එයින් උපන් සුඛ වේදනාව විඳින ස්පර්ශය නිසා උපන් සුඛ වේදනාවක් ඇද්ද එය නිරුද්ධ වෙයි. එය සංසිඳෙයි. දුක් වේදනාව ඇති ස්පර්ශය නිසා දුක් වේදනාව උපදියි. යම්බඳු ඒ දුක්ඛ වේදනාව ඇති ස්පර්ශයාගේ නැතිවීමෙන් එයින් උපන් දුක්ඛ වේදනාව විඳින ස්පර්ශය නිසා උපන් දුක්ඛ වේදනාවක් ඇද්ද එය නිරුද්ධ වෙයි. එය සංසිඳෙයි. සැප නොවූ දුක් නොවූ වේදනාව ඇති ස්පර්ශය නිසා සැප නොවූ දුක් නොවූ වේදනාව උපදියි. යම්බඳු ඒ සැප නොවූ දුක් නොවූ වේදනාව ඇති ස්පර්ශයාගේ නැතිවීමෙන් එයින් උපන් සැප නොවූ දුක් නොවූ වේදනාව නිසා විඳින ස්පර්ශය නිසා උපන් සැප නොවූ දුක් නොවූ වේදනාවක් ඇද්ද එය නිරුද්ධ වෙයි. එය සංසිඳෙයි. "සැප දුක් ස්පර්ශය නිදාන කොට ඇත්තේය" යනු සැප දුක් ස්පර්ශය නිදාන කොට ඇත්තේය. ස්පර්ශයෙන් ඇතිවන්නේය. ස්පර්ශය ජාති කොට ඇත්තේය. ස්පර්ශය ප්‍රභව කොට ඇත්තේය යනුයි.

2 "ස්පර්ශය නැති කල්හි මොවුහු නොවෙත්" යනු ස්පර්ශය නැති කල්හි විද්‍යමාන නොවන කල්හි නැත. නොලැබෙන කල්හි සැප දුක් නොවෙත්. හට නොගනිත්. ඇති නොවෙත්. නූපදිත්, පහළ නොවෙත් යනුයි. "විභවයද භවයද යන මේ අර්ථයක් ඇද්ද" යනු භව දෘෂ්ටියද ස්පර්ශය නිදාන කොට

ඇත්තේය. විභව දෘෂ්ටියද ස්පර්ශය නිදානකොට ඇත්තේය. "යන මේ අර්ථයක් ඇද්ද" යනු යම් උතුම් අර්ථයක් ඇද්ද එයයි.

3 "මෙය මෙයින් හටගත්තේයයි කියමි" යන්නෙහි මෙය යනු යමක් විචාරන්නෙහිද, යමක් ඉල්වන්නෙහිද යමක් බලාපොරොත්තු වන්නෙහිද යනුයි (එය) "කියමි" යනු කියමි. ප්‍රකාශ කරමි, දෙශනා කරමි, පනවමි, තබමි, විවෘත කරමි. බෙදමි, ප්‍රකට කරමි, ප්‍රකාශ කරමි, යනුයි. මෙයින් ඇති වූයේය යනු මේ ස්පර්ශය නිදාන කොට ඇත්තේය. ස්පර්ශය ඇතිවීම කොට ඇත්තේය. ස්පර්ශය ජාතිකොට ඇත්තේය. ස්පර්ශය ප්‍රභව කොට ඇත්තේය යනුයි.

## 11 - 10

1 "ලොකයෙහි ස්පර්ශය කොතැනින් හටගන්නේද" යනු ස්පර්ශය කුමක් නිදාන කොට ඇත්තේද, කොතනින් ඇතිවූයේද, කොතනින් හටගත්තේද, කොතනින් පහළ වූයේද, නිදානය කවරේද, ඇතිවීම කෙසේද, කුමක් ජාති කොට ඇත්තේදැයි ස්පර්ශයාගේ මුල විචාරයි ( (11-1) 7 ඡෙදයේ හේතුව විචාරයි. යනතැන සිට යෙදිය යුතුයි.) ඇතිවීම විචාරයි ඉල්වයි. ආරාධනා කරයි. පහදවයි. යනුයි.

2 "දැඩිව අල්වා ගැණීම කුමකින් ඇතිවූයේද" යනු දැඩිව අල්වා ගැණීම කොතනින් ඇතිවූයේද, පහළවූයේද, හටගත්තේද, කුමක් ජාතිකොට ඇත්තේද, කුමක් ප්‍රභව කොට ඇත්තේද යනුයි.

3 "කුමක් නැති කල්හි මමත්වය නැත්තේද" යන්නෙහි කුමක් නැති කල්හි කුමක් විද්‍යමාන නොවන කල්හි නැත්තේද, නොලැබෙන කල්හි මමත්වය නැත්තේද, නොලැබෙද්ද, ප්‍රහීණවූයේද මුලින් සිඳුනේද, සංසිඳුනේද, ඉපදීමට අයොග්‍ය වූයේද ඥානය නමැති ගින්නෙන් දැවුනේද, යනුයි.

4 "කුමක් ඉක්මවූ කල්හි ස්පර්ශයෝ ස්පර්ශ නොවෙද්ද" යනු කුමක් ප්‍රකට කල්හි කුමක් ඉක්මවූ කල්හි කුමක් වෙන්කළ කල්හි ස්පර්ශයෝ ස්පර්ශ නොවෙද්ද යනුයි.

## 11 - 11

1 "නාමයද රූපයද නිසා ස්පර්ශය වෙයි" යනු ඇස නිසා රූපයෙහි චක්ඛු විඥ්ඥානය උපදියි. මේ තුන් දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය වේ. ඇසද රූපයෝද රූපයෙහි වේ. චක්ෂු ස්පර්ශය හැර ඒ හා යෙදෙන ධර්මයෝ නාමයෙහි යෙදේ. මෙසේද නාමයද රූපයද නිසා ස්පර්ශය වේ. ඇස නිසා ශබ්දයෙහිද සොත විඥ්ඥානය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශයයි. කණද ශබ්දයෝද රූපයෙහි වේ. ශ්‍රොත ස්පර්ශය හැර ඒ හා යෙදුන ධර්මයෝ නාමයෙහි යෙදේ මෙසේද නාමයද රූපයද නිසා ස්පර්ශය උපදී. නාසය නිසා ගන්ධයෙහිද ඝාන විඥ්ඥානය උපදී. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශ යයි. ඝ්‍රානයද ගන්ධයෝද රූපයෙහි වේ. ඝ්‍රාන ස්පර්ශය හැර ඒ හා යෙදුන ධර්මයෝ නාමයෙහි වේ. මෙසේද නාමයද රූපයද නිසා ස්පර්ශය වේ. දිව නිසා රසයෙහිද ජිව්හා විඥ්ඥානය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශයයි. දිවද රසයෝද රූපයෙහි වේ. ජිව්හා ස්පර්ශය හැර ඒ හා යෙදුන ධර්මයෝ නාමයෙහි වේ. මෙසේද නාමයද රූපයද නිසා ස්පර්ශයයි. කය නිසා ස්පර්ශයෙහිද කාය විඥ්ඥානය උපදියි. තුන්දෙනාගේ එක්වීමෙන් ස්පර්ශයයි. කයද ස්පර්ශයෝද රූපයෙහි වේ. කාය ස්පර්ශය හැර ඒ හා යෙදුන ධර්මයෝ නාමයෙහිවේ. මෙසේද නාමයද රූපයද නිසා ස්පර්ශයයි. මනස නිසා ධර්මයෙහිද මනො විඥ්ඥානය උපදියි. තුන් දෙනාගේ එක්වීමෙන් ස්පර්ශයයි. රූපයෙහි වස්තු රූපයයි. රූපී ධර්මයෝ රූපයෙහිය. මනස්පර්ශය හැර ඒ හා යෙදුන ධර්මයෝ නාමයෙහි වේ. මෙසේද නාමයද රූපයද නිසා ස්පර්ශයයි.

2 "දැඩිව අල්වා ගැණීම ආශාව නිදානකොට ඇත්තේය" යන්නෙහි ආශාව නම් තෘෂ්ණාවට කියයි. (ii) යම් රාගයක් ඇද්ද ඇලීමක් ඇද්ද, (1-3) 4 ඡෙදයේ 'යම් ළංවීමක් ඇද්ද' යන තැන සිට යොදනු (iii) "දැඩිව අල්ලා ගැණීම" යන්නෙහි දැඩිව අල්ලා ගැණීම් දෙකකි. තෘෂ්ණාව දැඩිකොට අල්ලා ගැණීමද දෘෂ්ටිය දැඩිකොට අල්ලා ගැණීමද යනුයි. මමත්වය වෙනුවට

අල්ලා ගැනීම කියා වෙනස්කර (2-6) 1 (ii) (iii) ඡෙද යෙදිය යුතුයි) (v) දැඩිව අල්ලා ගැණීම් ආශාව නිදානකොට ඇත්තේය" යනු දැඩිව අල්ලා ගැණීම් ආශාව නිදානකොට ඇත්තේය ආශාව හේතුකොට ඇත්තේය. ආශාව කාරණය කොට ඇත්තේය. ආශාව ප්‍රත්‍යය කොට ඇත්තේය. ආශාවෙන් උපන්නේය යනුයි.

3 "ආශාව නැති කල්හි මමත්වයද නැත" යනු ආශාවයයි තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද, ඇලීමක් ඇද්ද, (මෙහි 2 (ii) ඡෙදය යෙදිය යුතුයි.)

4 "මමත්වය" යනු මමත්ව දෙකකි. තෘෂ්ණා මමත්වයද දෘෂ්ටි මමත්වයද යනුයි. (2-6) 1 (ii) (iii) ඡෙදය යෙදිය යුතුයි) "ආශාවනැති කල්හි මමත්වයද නැත" යනු ආශාව නැතිකල්හි විද්‍යමාන නොවන කල්හි නොලැබෙන කල්හි මමත්වයක් නැත විද්‍යමාන නොවෙත්. නොලැබෙත්, ප්‍රහීණය මුලින් සිඳුනේය. ඉපදීමට අයොග්‍යය, ඥානය නැමති ගින්නෙන් දැවුනේය යනුයි.

5 "රූපය ප්‍රකට කල්හි ස්පර්ශයෝ ස්පර්ශ නොකෙරෙත් යන්නෙහි රූපය නම් සතර මහා භූතයෝද සතර මහා භූතයන්ගේ උපාදාය රූපයෝද යනුයි. රූපය ප්‍රකට කල්හි යනු සතරා කාරයකින් රූපය ප්‍රකට වෙයි. දැනීමෙන් ප්‍රකට වීමෙන් තීරණයෙන් ප්‍රකට වීමෙන් ප්‍රහාණයෙන් ප්‍රකටවීමෙන් ඉක්ම වීමෙන් ප්‍රකටවීමෙන් යනුයි. කෙසේ දැනීමෙන් රූපය ප්‍රකට වේද, (iii) රූපය දනියි. කෙසේද යම්කිසි රූපයක් සියලු රූප, සතර මහාභූතයෝද සතර මහා භූතයන්ගේ උපාදාය රූපයෝ යයි දනියි, දකියි. මෙසේ ඥානය (දැනීම) ප්‍රකටවීමෙන් රූපය ප්‍රකට වෙයි. කෙසේ තීරණය ප්‍රකටවීමෙන් රූපය ප්‍රකට වේද, මෙසේ දැනීම ඇතිකොට රූපය තීරණය කරයි. කෙසේද, (iv) අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් රෝග වශයෙන්, ගඩක් වශයෙන්, හුලක් වශයෙන්, පීඩා වශයෙන්, ආබාධවශයෙන් අනුන්ගේ වශයෙන්, විනාශවීම් වශයෙන් උපද්‍රව වශයෙන්, භය වශයෙන්, කරදර වශයෙන් සෙලවීම් වශයෙන්, බිඳීම් වශයෙන් අස්ථිර වශයෙන් පිහිට නොවීම වශයෙන්, ආරක්ෂා නොවීම වශයෙන් හිස් වශයෙන් ශූන්‍ය වශයෙන්, අනාත්ම වශයෙන්, ආදීනව

වශයෙන්, විපරිණාම ධර්ම වශයෙන් අසාර වශයෙන් පීඩාවට මුල් වශයෙන් වධක වශයෙන් විනාශ වශයෙන් ආශ්‍රව වශයෙන් සංස්කාර වශයෙන් මාරාමිස වශයෙන් ජාති ධර්ම වශයෙන්, ජරා ධර්ම වශයෙන්, ව්‍යාධි ධර්ම වශයෙන්, මරණ ධර්ම වශයෙන් ශොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස ධර්ම වශයෙන්, කෙලෙස් සහිත ධර්මවශයෙන් ඇතිවීම් වශයෙන් අස්තයට යාම වශයෙන්, අසාර වශයෙන් ආදීනව වශයෙන් නික්මීම් වශයෙන්, තීරණය කරයි මෙසේ තීරණය ප්‍රකට වීමෙන් රූපය ප්‍රකට වෙයි. කෙසේ ප්‍රහාණය ප්‍රකටවීමෙන් රූපය ප්‍රකට වේද, මෙසේ තීරණය කොට රූපයෙහි ඡන්දරාගය දුරුකරයි, සංසිඳවයි, නූපදින බවට පමුණුවයි, භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලදී. "මහණෙනි, රූපයෙහි යම් ඡන්ද රාගයක් ඇද්ද, එය දුරු කරව්. මෙසේ ඒ රූපය ප්‍රහීණවූයේ වෙයි මුලින් සිඳ දැමූ තල්ගසක් මෙන් කරණ ලදී. නූපදින බවට පමුණුවන ලදී යනුයි. මෙසේ ප්‍රහාණය ප්‍රකට වීමෙන් රූපය ප්‍රකට වූයේ වෙයි, කෙසේ ඉක්මවීම ප්‍රකටවීමෙන් රූපය ප්‍රකටවූයේ වේද, සතර අරූප සමාපත්තීන් ලැබූවහුට රූපයෝ ප්‍රකට වෙත්. පුරුදුවූවාහු වෙත්. ඉක්මුනාහු වෙත්. වෙන්වූවාහුවෙත්. මෙසේ ඉක්මවීම ප්‍රකටවීමෙන් රූපය ප්‍රකට වෙත්. මේ සතර කාරණයන්ගෙන් රූපය ප්‍රකටවූයේ වෙයි. රූපය ප්‍රකට කල්හි ස්පර්ශයෝ ස්පර්ශ නොකරත්" යනු රූපය ප්‍රකට කල්හි පුරුදු කළ කල්හි ඉක්මුන කල්හි, වෙන්වූ කල්හි ස්පර්ශ පස ස්පර්ශ නොවෙත්. එනම් චක්ඛු සම්ඵස්සය, සොතසම්ඵස්සය, ඝාන සම්පස්සය, ජිව්හා සම්පස්සය, කාය සම්ඵස්සය යනුයි.

## 11 - 12

1 "කෙසේ පිළිපදිනහුට රූපය ඉක්මේද" යන්නෙහි කෙසේ පිළිපදිනහුට යනු කෙසේ පවතින්නහුට කෙසේ ඉරියව් පවත්වන්නහුට කෙසේ පාලනය වන්නහුට කෙසේ යැපෙන්නහුට රූපය ඉක්මේද, වෙන් වෙද විනාශ වේද යනුයි. "සුවදුක්ද කෙසේ නැතිවේද" යනු සැපයද දුකද කෙසේ විනාශවේද, ඉක්මේද වෙන්වේද යනුයි.

2 "යම්සේ වෙනස් වන්නේ නම් එය මට කියනු මැනව" යන්නෙහි එය යනු යමක් විචාරම්ද, යමක් ඉල්ලම්ද, යමක් ආරාධනා කරම්ද, යමක් පහදවම්ද එයයි "මට කියනු මැනවි." යනු මට කියනු මැනවි. ප්‍රකාශ කරණු මැනවි, දෙශනා කරණු මැනවි, යනුයි. යම්සේ වෙන්වේද, ඉක්මේද, යනුයි.

3 "එය දැනගන්නෙමියයි මට සිත විය" යනු එය දැන ගන්නෙමි. එය අවබොධ කරන්නෙමියි මට සිතක් විය. මට කල්පනාවක් විය. මට දැනීමක් විය යනුයි.

## 11 - 13

1 "ප්‍රකෘති සංඥාව ඇත්තෝද විකෘති සංඥාවඇත්තෝද" යන්නෙහි ප්‍රකෘති සංඥාව ඇත්තෝ යනු ප්‍රකෘති සංඥාවෙහි සිටියෝ යනුයි. හෙතෙම ප්‍රකෘති සංඥාවෙහි නොසිටියේ වේද, විසඤ්ඤා සඤ්ඤය උම්මත්තකයයි කියත්. වික්ෂිප්ත සිතක් යමෙකු කෙරෙහිද හෙතෙම උම්මත්තක නොවේ.

2 "අසඤ්ඤීහු විඥානසංඥා ඇත්තෝ නොවෙත්" යනු නිරොධයට සමවැදුනාහු අසඤ්ඤීහුයයි කීයත්. අසඤ්ඤ සත්වයෝ යමෙක්ද ඔවුහුයි. හෙතෙම නිරොධ සමාපන්න නොවේද අසඤ්ඤසත්වයාද නොවේ. යම්කෙනෙක් සතර අරූප සමාපත්ති ලාභීහුද විභූත සංඥා ඇත්තේයයි කියත්. හෙතෙම සතර අරූප සමාපත්ති ලාභී නොවේද අසඤ්ඤ සඤ්ඤීද විභූත සඤ්ඤීද නොවේ.

3 "මෙසේ යුක්තවූවහුගේ රූපය ඉක්මෙයි" මෙහි මහණතෙම සැපයාගේද ප්‍රහාණයෙන් (2-4) 1 (iv) ඡෙදය යෙදිය යුතුයි) සතර වන ධ්‍යානයට සමවැද වාසය කරයි. හෙතෙම මෙසේ සංසිඳුන සිත්ඇති කල්හි පිරිසිදුවූ කල්හි මනාව පිරිසිදුවූ කල්හි කෙලෙස් නැති කල්හි මෘදුවූ කල්හි වැඩට යොග්‍යව සිටි කල්හි ආකාශානඤ්චායතන සමාපත්තිය ලැබීමට සිත නැමෙයි. අරූප මාර්ගයට බැස ගත්තේ යනුයි. මෙසේ යුක්තවූවහුට යනු මෙසේ යෙදුනහුට මෙසේ ඉරියව් පවත්වන්නහුට මෙසේ පාලනය වන්නහුට මෙසේ යැපෙන්නහුට රූපය ඉක්මෙයි යනුයි.

## 11 - 14

1 "යම් ඒ යමක් විචාරීමු නම් අපට ප්‍රකාශකරණ ලදී" යනු යම් ඒ යමක් විචාරීමුද ඉල්ලමුද ආරාධනා කළෙමුද, පැහැදීමුද "එය ප්‍රකාශ කරණ ලදී" යනු කියන ලදී, දෙශනා කරණ ලදී, පණවන ලදී, තබන ලදී, විවෘත කරණ ලදී, බෙදන ලදී, ප්‍රකාශ කරණ ලදී යනුයි.

2 "අන් යමක් විචාරන්නෙමු එසේ නම් එයද ප්‍රකාශ කරුණු මැනවි" යනු අනික් දෙයක් විචාරමු. අනික් දෙයක් ප්‍රශ්න කරමු. අනික් දෙයක් ආරාධනා කරමු. අනික් දෙයක් පහදවමු. මත්තෙහිද විචාරමු. එසේනම් එය ප්‍රකාශ කරණු මැනවි. යනු එසේනම් කියනු මැනවි. දෙශනා කරණු මැනවි. පණවනු මැනවි, තබනු මැනවි, විවෘත කරණු මැනවි, බෙදනු මැනවි, ප්‍රකට කරණු මැනවි, යනුයි.

3 "ඇතැම් කෙනෙක් මේ අරූප සමාපත්තීහු ශ්‍රෙෂ්ඨ යයි කියත්. සත්වයාගේ ශුද්ධිය මෙහි පණ්ඩිත වාදයෝයි" යනු ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මේ අරූප සමාපත්තීහු අග්‍රය, ශ්‍රෙෂ්ඨය, ඉතා උසස්ය, ප්‍රමුඛය උතුම්ය. ඉතා උතුම් යයි කියත්. ව්‍යවහාර කරත්. 'යක්ෂයාට' යනු සත්වයාට මිනිසාට මානවකයාට පුරුෂයාට පුද්ගලයාට ජීවයාට යනුයි. 'ශුද්ධිය' යනු ශුද්ධිය, විශුද්ධිය, පරිශුද්ධිය, මුක්තිය, විමුක්තිය යනුයි. "මෙහි පණ්ඩිත වාදයෝයි" යනු මෙහි පණ්ඩිත වාදයෝ ස්ථිර වාදයෝ න්‍යාය වාදයෝ හේතු වාදයෝ ලක්ෂණ වාදයෝ කාරණ වාදයෝ වෙති. ස්වකීය ලබ්ධියෙන් යනුයි.

4 "නැතහොත් මෙතැනින් අනික් තැනකින් ශුද්ධිය වේයයි කියත්" යනු නැතහොත් ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මේ අරූප සමාපත්තීහු ඉක්මවා මේ අරූප සමාපත්තියෙන් අනිකක් මිනිසාගේ ශුද්ධිය විශුද්ධිය පාරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තියයි කියත්, ව්‍යවහාර කරත් යනුයි.

## 11 - 15

1 "ඇතැම් කෙනෙක් මේ අරූප සමාපත්තීහු ශ්‍රෙෂ්ඨ යයි කියත්. යක්ෂයාගේ ශුද්ධිය මෙහි පණ්ඩිත වාදයෝයි" යනු

ශාස්වත වාදය ඇති ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. ඔවුහු මේ අරූප සමාපත්තීහු අග්‍රය ශ්‍රෙෂ්ඨය. ඉතා උසස්ය, ප්‍රමුඛය, උත්තමයයි කියත්. ව්‍යවහාර කරත්. යක්ෂයාට යනු සත්වයාට මිනිසාට මානවකයාට පුරුෂයාට, පුද්ගලයාට ජීවයාට මිනිසාට යනුයි. ශුද්ධිය යනු ශුද්ධිය, විශුද්ධිය, පාරිශුද්ධිය, මුක්තිය, විමුක්තිය යනුයි. මෙහි පණ්ඩිත වාදයෝයි යනු මෙහි පණ්ඩිත වාදයෝ, "ස්ථිර වාදයෝ, න්‍යාය වාදයෝ හේතුවාදයෝ ලක්ෂණ වාදයෝ, කාරණ වාදයෝ යනුයි. ස්වකීය ලබ්ධියෙන් යනුයී.

2 "ඔවුන්ගෙන් සමහර කෙනෙක් අනුපාදිශෙෂයෙහි කුශල වාද ඇත්තෝ වෙත්" යනු ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන් ගෙන් ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ සියල්ල විනාශවේයයි වාද ඇත්තෝ භවයට තර්ජනය කරන්නෝ විභවයට සතුටු වෙත්. ඔවුහු සත්වයාගේ සමය, උපසමය, සන්සිඳීම, නිරොධය කියත්. කිමෙක්ද පින්වතුනි, මේ ආත්මය කායයාගේ බිඳීමෙන් විනාශවන්නේය, නොවෙයි. මරණින් මතු මෙපමණකින් අනුපාදිශෙෂය වෙයි. කුශලවාදයෝ යනු කුශල වාදයෝ, පණ්ඩිත වාදයෝ, ස්ථිර වාදයෝ, න්‍යාය වාදයෝ, හේතු වාදයෝ, ලක්ෂණ වාදයෝ, කාරණ වාදයෝ, ස්ථාන වාදයෝ ස්වකීය ලබ්ධියෙන් යනුයි.

## 11 - 16

1 "මොවුහුද ශාස්වත දෘෂ්ටියෙන් යුක්තයයි දැන" යනු මොවුහු යනු දෘෂ්ටිගතිකයන් යනුයි. යුක්තය යනු ශාස්වත දෘෂ්ටිය ආශ්‍රය කළේයයි දැන උච්ඡෙද දෘෂ්ටිය ආශ්‍රය කළේ යයි දැන ශාස්වත උච්ඡෙද දෘෂ්ටි දෙකින් යුක්තයයි දැන තීරණය කොට සමකොට බලා තීරණය කොට ප්‍රකට කොට යනුයි.

2 "ඒ විමසන නුවණින් මුනිතෙම දෘෂ්ටිගතුවන් දැන" යනු 'මොන' යයි ඥානයට කියයි. ( (2-8) 10 ඡෙදයේ "යම් ප්‍රඥාවක්" යන තැන සිට 14 ඡෙදය අවසානය දක්වා යෙදිය යුතුයි. මුනිතෙමේ ශාස්වත දෘෂ්ටිගතුවෝ යයි දැන ශාස්වත උච්ඡෙද දෘෂ්ටි දෙකින් යුක්තවූවෝයයි දැන සමකොට බලා

තීරණය කොට ප්‍රකාශ කොට ප්‍රකට කොට යනුයි. විමසන නුවණ ඇති හෙතෙම" යනු පණ්ඩිතවූ නුවණැති බුද්ධි ඇති, ඥානය ඇති ප්‍රඥාවත් තැනැත්තේ යනුයි.

3 "මිදුන තැනැත්තේ මනාකොට දැන විවාදයට නොපැමිණෙයි" යනු දැන සමකොට බලා තීරණය කොට ප්‍රකට කොට, මිදුන තැනැත්තේ යනු මිදුනේ මනාකොට මිදුන තැනැත්තේ ඒකාන්ත අනුපාදා පරිනිර්වාණයෙන් මිදුනහු විසින් "සියලු සංස්කාරයෝ අනිත්‍යයයි දැන සමකොට බලා තීරණය කොට ප්‍රකට කොට මිදුන තැනැත්තේ ඒකාන්ත අනුපාදා පරිනිර්වාණයෙන් මිදුනහු විසින් සියලු සංස්කාරයෝ දුක්යයි සියලු ධර්මයෝ අනාත්මයයි ( (4-5) 4 අවිද්‍යා හේතුවෙන් යන තැන සිට යෙදිය යුතුයි) යම්කිසි හේතුවකින් උපන් ධර්මයක් ඇද්ද, ඒ සියල්ල නිරොධය පිණිස පවත්නේයයි දැන සමකොට බලා තීරණය කොට ප්‍රකට කොට මිදුනේ ඒකාන්ත අනුපාදා පරිනිර්වාණ යෙන් යයි දැන මිදුනේ වෙයි. "විවාදයට නොපැමිණෙයි" යනු කලහ නොකරයි. ඩබර නොකරයි, ආරාවුල් නොකරයි, විවාද නොකරයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලදී. (එනම්) 'අග්ගිවෙස්සනය, මෙසේ මිදුන සිත් ඇති භික්ෂු තෙම කිසිවෙකු හා වාදයට නොබසියි. කිසිවෙකු හා විවාදයට නොබසියි. යමක් ලොකයෙහි කියන ලදද එයින් ව්‍යවහාර කරයි, පරාමර්ශ නොකරයි යනුයි.

4 "නුවණැතිතෙම භවයෙන් භවයට නොපැමිණෙයි" යනු කර්ම භවයෙන් නැවත භවයට, කාමභවයෙන් කර්ම භවයට, කාමභවයෙන් නැවත භවයට, රූප භවයෙන් කර්ම භවයට, රූප භවයෙන් නැවත භවයට, අරූප භවයෙන් කර්ම භවයට අරූප භවයෙන් නැවත භවයට, නැවත නැවත භවයට, නැවත නැවත ගතියට, නැවත නැවත උත්පත්තියට නැවත නැවත ගතියට නැවත නැවත ප්‍රතිසන්ධියට නැවත නැවත ආත්මභාවයට, නොපැමිණෙයි, නොගනියි, පරාමර්ශ නොකරයි. ඇතුළු නොවෙයි "නුවණැත්තේ' යනු ප්‍රඥා ඇත්තේ බුද්ධි ඇත්තේ, ඥාන ඇත්තේ යනුයි.

# චූල වියූහ සූත්‍ර නිර්දෙශය

## 12 - 1

1 "ස්වකීය ස්වකීය දෘෂ්ටිය ගෙන වසන්නේ යනු" දෘෂ්ටිය ගත්තාවූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. ඔවුහු දෙසැට දෘෂ්ටි ගැනීම් අතුරෙන් එක්තරා දෘෂ්ටියක් ගෙන පරාමර්ශකොට බැසගෙන ස්වකීය ස්වකීය දෘෂ්ටියෙන් වසත්. (ii) ගිහියෝ යම්සේ ගෙදරක වසත්ද, ඇවැත් ඇත්තෝ ඇවතෙහි වෙසෙත්ද, කෙලෙස් ඇත්තෝ කෙලෙස්හි වෙසෙත්ද, එපරිද්දෙන්ම දෘෂ්ටිය ගත්තාවූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. ඔවුහු (iii) දෙසැට දෘෂ්ටි ගැණීම් වලින් එක්තරා දෘෂ්ටියක් ගෙන ඉගෙණ පරාමර්ශකොට බැසගෙන ස්වකීය ස්වකීය දෘෂ්ටියෙන් වසත්.

2 "එසේ ගෙන නොයෙක් දක්ෂ වාදයෝ කියත්" යන්නෙහි එසේ ගෙන යනු ගෙන, ඉගෙණ පරාමර්ශකොට බැස ගෙන යනුයි. නොයෙක් දේ කියත් යනු විවිධදේ කියත්. එකිනෙක කියත්. බොහෝ කියත්. එකක් නොකියත්. දක්ෂ වාදයෝ යනු දක්ෂ (i) වාදයෝ පණ්ඩිත වාදයෝ ස්ථිර වාදයෝ න්‍යාය වාදයෝ හේතුවාදයෝ ලක්ෂණ වාදයෝ කාරණ වාදයෝ ස්ථාන වාදයෝ ස්වකීය ලබ්ධියෙන් යනුයි. මෙසේ දනීද හෙතෙම ධර්මය දනියි යනු යමෙක් මේ ධර්මය දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය දනීද, හෙතෙම ධර්මය දනියි. අවබොධ කරයි යනුයි.

3 "හෙතෙම අසමර්ථවූයේ මේ ධර්මයට ආපසු බණියි" යනු යමෙක් මේ ධර්මයට දෘෂ්ටියට ප්‍රතිපදාවට මාර්ගයට බණීද, 'අසමර්ථවූ හෙතෙම' යනු පරිපූර්ණ නොවූ හෙතෙම හීනවූ, නිහීනවූ, ලාමකවූ යනුයි.

## 12 - 2

1 "මෙසේ ගෙන විවාද කරත්" යනු මෙසේ ගෙන ඉගෙණ පරාමර්ශකොට බැසගෙන විවාද කරත්, කලහ කරත්, ඩබර කරත්, ඔබ මේ ධර්ම විනය නොදන්නෙහිය ( (9-8) 1 (ii) යෙදිය යුතුයි.) ඉදින් හැකිනම් අවුල හරුව යනුයි. "ඒකාන්තයෙන් බාලතෙම අදක්ෂය" යනු ඒකාන්තයෙන්

බාලතෙම හීනය, නිහීනය, ලාමකය, අදක්ෂය, අවිචාරය, අවිද්‍යාව ගත්තේය, අඥානය, අප්‍රකටය, මෝඩයයි මෙසේ කියත්. මෙසේ ප්‍රකාශ කරත්.

2 "මොවුන්ගේ සත්‍යවූ වාදය කවරේද" යනු මේ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ වාදය කවරක් සත්‍යද ඇති තත්වය ඇත්තේද, විපරීත නොවූයේද යනුයි. මේ සියල්ලෝම දක්ෂවාද ඇත්තෝයි" යනු මේ සියලුම ශ්‍රමණ බ්‍රාහ්මණයෝ දක්ෂ වාද ඇත්තෝයි පණ්ඩිත වාද ඇත්තෝයි, ස්ථිරවාද ඇත්තෝයි, න්‍යායවාද ඇත්තෝයි, හේතුවාද ඇත්තෝයි, ලක්ෂණවාද ඇත්තෝයි, කාරණවාද ඇත්තෝයි, ස්ථානවාද ඇත්තෝයි ස්වකීය ලබ්ධියෙන් යනුයි

## 12 - 3

1 "ඉදින් අනුන්ගේ ධර්මයට නොකැමැති වෙත්" යනු අනුන්ගේ ධර්මයට දෘෂ්ටියට ප්‍රතිපදාවට මාර්ගයට නොකැමැති වන්නේ එය නොබලන්නේ එය අනුමත නොකරන්නේ එය අනුමෝදන් නොවන්නේ යනුයි.

2 "නිහීන ප්‍රඥා ඇති බාලයා මෝඩවෙයි" යනු අතිශයින් මෝඩවෙයි. හීනවෙයි, නිහීන වෙයි, හීන ප්‍රඥා ඇත්තේ වෙයි. නිහීන ප්‍රඥා ඇත්තේ වෙයි. ලාමක ප්‍රඥා ඇත්තේ වෙයි යනුයි.

3 "සියලුම බාලයෝ ඉතා හීන නුවණ ඇත්තෝය" යනු සියලුම මේ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ බාලයෝය, හීනයෝය. නිහීනයෝය, ලාමකයෝය. සියල්ලෝම හීන ප්‍රඥා ඇත්තෝය, නිහීන ප්‍රඥා ඇත්තෝය, ලාමක ප්‍රඥා ඇත්තෝය, ස්වල්ප ප්‍රඥා ඇත්තෝය යනුයි.

4 "මේ සියල්ලෝම දෘෂ්ටිගතිකයෝයි" යනු මේ සියලු ශ්‍රමණ බ්‍රාහ්මණයෝ දෘෂ්ටිගතිකයෝයි, ඔවුහු දෙසැට දෘෂ්ටි ගැනීම් අතුරෙන් එක් එක්තරා දෘෂ්ටිගැනීමක් ගෙන ඉගෙණ පරාමර්ශකොට බැස ස්වකීය ස්වකීය දෘෂ්ටියෙන් වසත්. යම්සේ ගිහියෝ ගෙවල්වල වසත්ද, ඇවැත් ඇත්තෝ ඇවැත්හි වසත්ද, කෙලෙස් ඇත්තෝ ක්ලේශයන්හි වසත්ද, මෙසේම මේ සියලු

ශ්‍රමණ බ්‍රාහ්මණයෝ දෘෂ්ටි ගතිකයෝ වූවාහු ( (12-1) 1 (iii) ඡෙදය යෙදිය යුතුයි)

## 12 - 4

1 "ස්වකීය දෘෂ්ටියෙන්ද අපිරිසිදුවූවාහ" යනු ස්වකීය දෘෂ්ටියෙන්, ස්වකීය කැමැත්තෙන්, ස්වකීය රුචියෙන්, ස්වකීය ලබ්ධියෙන්, අපිරිසිදුවූවාහු, කිලුටුවූවාහු යනුයි. "පිරිසිදු නුවණැති දක්ෂවූ පණ්ඩිතයෝ" යනු පිරිසිදු නුවණැති බබලන නුවණැති යනුයි. යලිදු හෝ පිරිසිදු දැකීම් ඇති පිරිසිදු නුවණැත්තේ යනුයි. "සංසුද්ධි පඤ්ඤ" යයි පාලි භාෂාවෙන් කියත්. කුසල යනු පණ්ඩිතයෝ, ප්‍රඥාවන්තයෝ බුද්ධිවන්තයෝ ඥානය ඇත්තෝ නුවණැත්තෝනුයි සංසුද්ධ පඤ්ඤ කුසලයයි කියත්. "නුවණැත්තෝ" යනුද පණ්ඩිතයෝ ප්‍රඥාවන්තයෝ, බුද්ධිවන්තයෝ ඥානය ඇත්තෝ යනුයි. 'ඔවුන්ගෙන් කිසිවෙක් හීන ප්‍රඥා ඇත්තේ නොවේ. ලාමක ප්‍රඥා ඇත්තේ නොවේ කුඩා ප්‍රඥා ඇත්තේ නොවේ. සියල්ලන්ටම ශ්‍රෙෂ්ඨ ප්‍රඥාව ඇත. ප්‍රමුඛ ප්‍රඥාව ඇත යනුයි

2 "ඔවුන්ගේද දෘෂ්ටිය එසේ ගන්නාලදී" යනු ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ දෘෂ්ටිය එසේ ගන්නාලදී. එසේ අවසන්වන ලදී. සමාදන්වන ලදී. ගන්නාලදී. පරාමර්ශ කරණලදී. බැස ගන්නාලදී. එසේ ඇලෙන ලදී. යනුයි.

## 12 - 5

1 "මම මෙය සත්‍යයයි නොකියමි" යන්නෙහි "නොයනු ප්‍රතික්ෂෙපයයි. මෙය යනු දෙසැට දෘෂ්ටි ග්‍රහණයෝයි. මම එය ඇත්තයයි අවිපරීතයයි නොකියමි. දෙශනා නොකරමි. නොපනවමි. නොතබමි විවෘත නොකරමි. නොබෙදමි. ප්‍රකාශ නොකරමි, යනුයි.

2 "බාලයෝ දෙදෙනෙක් ඔවුනොවුන් යමක් කියත්ද," යන්නෙහි "අන්‍යොන්‍ය" යනු දෙදෙනෙක් යනුයි. කලහකරුවෝ දෙදෙනෙක් ඩබර කරුවෝ විවාද කරුවෝ දෙදෙනෙක් සාකච්ඡා කරන්නෝ දෙදෙනෙක් යනුයි. ඔවුහු බාල වශයෙන් හීන

වශයෙන් නිහීන වශයෙන් ස්වල්ප වශයෙන් මෙසේ කියත්. මෙසේ ව්‍යවහාර කරත්. යනුයී.

3 "ස්වකීය ස්වකීය දෘෂ්ටිය සත්‍යයයි කීහ" යනු ලොකය ශාස්වතය. මෙයම සත්‍යය අනික හිස්යයි ස්වකීය ස්වකීය දෘෂ්ටිය සත්‍යයයි ප්‍රකාශ කළහ. ලොකය අශාස්වතය, මෙයම සත්‍යය අනික හිස්යයි ( (3-6) 1 (ii) ඡෙදය යෙදිය යුතුයි.) සත්වයා මරණින් මතු නොමවෙයි. නොම නොවෙයි මෙයම සත්‍යය අනික හිස්යයි ස්වකීය ස්වකීය දෘෂ්ටිය සත්‍යයයි ප්‍රකාශ කළහ යනුයි.

4 "එහෙයින් බාලයයි අන්‍යයාට කියත්" යනු එහෙයින් ඒ කාරණයෙන් ඒ හේතුවෙන් ඒ ප්‍රත්‍යයෙන්, ඒ නිදානයෙන් අන්‍යයා බාල වශයෙන්, හීන වශයෙන්, නිහීන වශයෙන් ලාමක වශයෙන්, කුඩා වශයෙන් සිතත්.

## 12 - 6

1 "ඇතැම් කෙනෙක් සත්‍යයයි යමක් කියද්ද," යනු යම් ධර්මයක් දෘෂ්ටියක් ප්‍රතිපදාවක් මාර්ගයක් ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මෙය සත්‍යය, ඇත්තය, වූ පරිදිය, අවිපරීතයයි මෙසේ කියත්. මෙසේ ප්‍රකාශ කරත්. මෙසේ ව්‍යවහාර කරත්, යනුයී.

2 "අන්‍යයෝ එය මුසායයි කියත්" යනු ඒ ධර්මයම දෘෂ්ටියම ප්‍රතිපදාවම මාර්ගයම ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මෙය හිස්ය මෙය මුසාය, මෙය අභූතය, මෙය බොරුය, මෙය අන්පරිදියයි මෙසේ කියත්. මෙසේ ව්‍යවහාර කරත් යනුයි.

3 "මෙසේද ගෙන විවාද කරත්" යනු මෙසේ ගෙන ඉගෙණ පරාමර්ශකොට බැසගෙන විවාද කරත්. කළහ කරත් ඩබර කරත්, විග්‍රහ කරත්, විවාද කරත්, ඔබ මේ ධර්ම විනය නොදන්නෙහිය, ඉදින් හැකිනම් අවුල ( (12-1) 1 (iii) ඡෙදය යෙදිය යුතුයි) හරුව යනුයි. "කුමක් හෙයින් ශ්‍රමණයෝ එකක් නොකියද්ද" යනු එහෙයින් ඒ කාරණයෙන් ඒ හේතුවෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් එකක් නොකියත්ද, නොයෙක්

දේ කියත්ද එකින් එක කියද්ද, බොහෝ දේ කියද්ද ව්‍යවහාර කරද්ද, යනුයි.

## 12 - 7

1 "ඇත්ත එකක්මය දෙවැන්නක් නැත" යනු සත්‍යය එකක්යයි කියයි ඒ දුක්ඛ නිරොධවූ නිර්වාණයයි. යම් ඒ සියලු සංස්කාරයන් සංසිඳවූ සියලු කෙළෙස් දුරුකළ තෘෂ්ණාව ක්ෂය කළ නොඇලීම ඇති නිරොධ නම් නිර්වාණ යයි යලිදු හෝ එකම සත්‍යයයි මාර්ගසත්‍යයට කියයි. නෛය්‍යාණික සත්‍යයයි දුක්ඛ නිරොධ ගාමිනී ප්‍රතිපදාව නම් ආය්‍යී අෂ්ටාංගික මාර්ගයයි ඒ කෙසේද, (ii) සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යනුයි

2 "යමක් ප්‍රජාව දැන ගන්නේ විවාද නොකරත්ද" යනු යමක් යනු යම් කිසි සත්‍යයක් යනුයි. "ප්‍රජාව" යනු සත්වයන්ට නමකි. ප්‍රජාව යම් සත්‍යයක් දැන ගන්නාහු අවබොධ කරන්නාහු කලහ නොකරත්ද, විවාද නොකරද්ද ඩබර නොකරද්ද, කලහ, විග්‍රහ, විවාද ඩබරයන් දුරුකරන්නහුද සංසිඳවන්නාහුද, නොඉපදීම් බවට පමුණුවන්නහුද යනුයි.

3 "නොයෙක් නොයෙක් ඒ සත්‍යයෝ තෙමේ කියත් යනු නොයෙක් නොයෙක් ඒ සත්‍යයෝ තෙමේ කියත්. ව්‍යවහාර කරත්. ලොකය ශාස්වතය, මෙයම සත්‍යය අනික් දේ හිස්යයි තෙමේ කියත්, ප්‍රකාශ කරත්, ව්‍යවහාර කරත් යනුයි.

4 "එහෙයින් ශ්‍රමණයෝ එකක් නොකියත්" යනු එහෙයින් ඒකාරණයෙන් ඒ හේතුවෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් එකක් නොකියත්. නොයෙක් දේ කියත්, විවිධ දේ කියත්, අනිකක් අනිකක් කියත්, බොහෝ කියත් ව්‍යවහාර කරත්.

## 12 - 8

1 කුමක් හෙයින් නොයෙක් දේ සත්‍යයයි කියද්ද යනු කුමක් හෙයින් කවර කරුණකින් කවර නිදානයකින් බොහෝ සත්‍යයෝ කියද්ද, නොයෙක් ආකාරයෙන් කියත්ද, එකින් එක

කියත්ද යනුයි. කුශලවාදයෝ ප්‍රකාශ කරත් යනු විශෙෂයෙන් කියත් යනුද ප්‍රකාශ කරත් යනුයි. යලිදු හෝ තම තමාගේ දෘෂ්ටි ගැණීම් කියත් ප්‍රකාශ කරත් ව්‍යවහාර කරත්. ලොකය ශාස්වතය, මෙයම සත්‍යය, අනික් දේ හිස්යයි කියත්. ප්‍රකාශ කරත්, ලොකය ආශාස්වතය (මෙහි (3-6) 1 (ii) ඡෙදය යෙදිය යුතුයි) සත්වයා මරණින් මතුනොමවෙයි. නොම නොවෙයි, මෙයම සත්‍යය අනික් දේ හිස්යයි කියත්. ව්‍යවහාර කරත්. " දක්ෂවාදයෝ යනු කුසල වාදයෝ දක්ෂවාදයෝ පණ්ඩිත වාදයෝ ස්ථිර වාදයෝ න්‍යායවාදයෝ හේතුවාදයෝ ලක්ෂණ වාදයෝ කාරණ වාදයෝ ස්ථානවාදයෝ යනුයි.

2 "බොහෝ වෙනස් සත්‍යයෝ අසන ලද්දාහ යනු නන් වැදෑරුම් අනික් අනික් බොහෝ සත්‍යයෝ අසන ලද්දාහ යනුයි. "නැතහොත් ඔවුහු තර්කය සිහි කරත්" යනු නැතහොත් තර්කයෙන් විතර්කයෙන් සංකල්පයෙන් යත්. පමුණුවත්, පාවෙත්, යනුයි. මෙසේද නැතහොත් ඔවුහු තර්කය සිහි කරත්, යලිදු හෝ ඔවුහු තර්කය සිහි කරත්, යලිදු හෝ තර්කයට යොග්‍යවූ විමසීම අනුව යන තමහට වැටහුන දේ කියත්, ව්‍යවහාර කරත්, යනුයි.

## 12 - 9

1 "බොහෝ නොයෙක් සත්‍යයෝ නැත්තාහුමය" යනු බොහෝවූ නන්වැදෑරුම්වූ අනික් අනික්වූ බොහෝවූ සත්‍යයෝ නැත්තාහුමය. "සංඥාවෙන් හැර ලොකයෙහි නිත්‍යයයි (ගැන්මක් කියයි) යනු සඤ්ඤාවෙන් හැර නිතර ගැණීම් ඇති එකම සත්‍යයක් ලොකයෙහි කියයි. ප්‍රකාශ කරයි. ව්‍යවහාර කරයි. දුක්ඛ නිරොධයවූ නිර්වාණයයි යම් ඒ සියලු සංස්කාරයන් සංසිඳවූ සියලු කෙලෙස් බැහැර කළ තෘෂ්ණාක්ෂය කළ ඇලීම නැති නිරොධය නම්වූ නිර්වාණයයි යලිදු හෝ එකම සත්‍යයක් කියයි. මාර්ග සත්‍යයයි නෛයර්‍යානික සත්‍යයයි. දුක් නිරුද්ධ කිරීමේ ප්‍රතිපදාවයයි ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයයි ඒ කෙසේද, ( (12-7) 1 (ii) ඡෙදය යෙදිය යුතුයි)

2 "දෘෂ්ටීන්හි තර්කයද කල්පනාකොට සත්‍යයද මුසාවදැයි ධර්ම දෙකක් කියත්" යනු තර්කයද විතර්කයද සංකල්පයද තර්කකොට විතර්කකොට කල්පනාකොට දෘෂ්ටි ගැනීම් ඇති කරත්, උපදවත්, පහළ කරත්, දෘෂ්ටි ගැනීම් ඇති කොට උපදවා පහළකොට මාගේ සත්‍යය ඔබගේ මුසාවයයි මෙසේ කියත්. මෙසේ ව්‍යවහාර කරත් යනුයි.

## 12 - 10

1 දැකි, ඇසූ දෙයෙහිද ශීලව්‍රතයන්හිද මුතයෙහිද යන මොවුන් නිසා මනාව නොපමුණුවයි යනු දැකීම හෝ දැකීමෙන්, ශුද්ධිය හෝ ඇසීම හෝ ඇසීමෙන් ශුද්ධිය හෝ ශීලය හෝ ශීල ශුද්ධිය හෝ ව්‍රතය හෝ ව්‍රත ශුද්ධිය හෝ මුතය හෝ මුත ශුද්ධිය හෝ නිසා ගෙන පරාමර්ශකොට බැස ගෙන යනුයි.

2 "මොවුන් නිසා මනාව නොපමුණුවයි" යනු මනාකොට නොපමුණුවයි. යලිදු හෝ දොම්නස උපදවන බැවින් හෝ විමාන දස්සීනම්.

3 "විනිශ්චයෙහි සිට සතුටුවන්නේ යනු" විනිශ්චය නම් දෙසැට දෘෂ්ටි ගැනීමයි. දෘෂ්ටි විනිශ්චයෙහි විනිශ්චය දෘෂ්ටියෙන් සිට පිහිටාගෙන පරාමර්ශකොට බැසගෙන විනිශ්චයෙහි සිට යනුයි. "සතුටු සිත් ඇත්තේ යනු සතුටු වෙයි. ප්‍රීතිවෙයි, සම්පූර්ණ සිතේ කල්පනා ඇතිවෙයි. යලිදු හෝ දත් විදහා සිනහවෙන්නේ යනුයි.

4 "බාලතෙමේ ඒකාන්තයෙන් අදක්ෂයයි කියති. යනු බාලතෙම ඒකාන්තයෙන් හීනය, නිහීනය, ලාමකය, කුඩාය, අදක්ෂය, අවිද්‍යාවට පැමිණියේය. අඥානය, අප්‍රකටය, මද නුවණැත්තේයයි මෙසේ කියයි. මෙසේ ප්‍රකාශ කරයි. මෙසේ ව්‍යවහාර කරයි යනුයි.

## 12 - 11

1 "යම්හෙයකින්ම බාලතෙම අතිශයින් බලයි" යනු යම්කිසි හේතුවකින් යම්කිසි ප්‍රත්‍යයකින් යම්කිසි කාරණයකින් යම්කිසි

ඇතිවීමකින් අතිශයින් බාලවශයෙන්, හීන වශයෙන්, නිහීන වශයෙන්, ලාමක වශයෙන් දකියි, බලයි, කල්පනා කරයි යනුයි.

2 "එහෙයින් තමා දක්ෂයයිද කියයි. යන්නෙහි 'තෙමේ, යනු තමා යන අර්ථයයි. හෙතෙමේද ඒ හේතුවෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ කාරණයෙන් ඒ ප්‍රභවයෙන් තමන්ම මම දක්ෂවෙමි, පණ්ඩිත වෙමි. නුවණැතිවෙමියි යනුයි.

3 "හෙතෙම තෙමේ තමන්ම දක්ෂයයි කියන්නේ" යනු තෙමේම තමාට ස්වකීය දෘෂ්ටියෙහි දක්ෂ වාදය කියාගන්නේ පණ්ඩිත වාදය කියාගන්නේ ස්ථිරවාදය කියා ගන්නේ න්‍යාය වාදය කියාගන්නේ හේතුවාදය කියාගන්නේ ලක්ෂණ වාදය කියාගන්නේ කාරණ වාදය කියාගන්නේ විඥාන වාදය කියා ගන්නේ යනුයි

4 "අන්‍යයාට අවමන් කරයි. එයම කියයි" යනු බුහුමන් නොකරයි අන්‍යයාට අවමන් කරයි. යලිදු හෝ දොම්නස් උපදවයි. අන්‍යයාට අවමන් නොකරයි. එයම කියයි යනු එයම වේ ඒ දෘෂ්ටි ගැනීම කියයි. මේ පුද්ගලතෙම මිථ්‍යා දෘෂ්ටිකයෙකි. විපරීත දැකුම් ඇත්තෙකි යනුයි.

## 12 - 12

1 "හෙතෙම අතිසාර නම් දෘෂ්ටියෙන් සම්පූර්ණ වූවෙකු යනු අතිසාර දෘෂ්ටියයි දෙසැට දෘෂ්ටි ගැණීම් කියයි කවර කරුණකින් අතිසාර දෘෂ්ටිහුයයි දෙසැට දෘෂ්ටි ගැනීම්වලට කියද්ද, සියලු ඒ දෘෂ්ටීහු කාරණ ඉක්මවූවෝයි ලක්ෂණ ඉක්මවූවෝයි. ස්ථාන ඉක්මවූවෝයි එබැවින් දෙසැට දෘෂ්ටීන්ට අතිසාර දෘෂ්ටිහුයයි කියත්. සියලු දෘෂ්ටීහු අතිසාර දෘෂ්ටීහු වෙත්. කුමක් හෙයින් සියලු දෘෂ්ටීහු අතිසාර දෘෂ්ටීහුයයි කියත්ද? ඔවුහු එකින් එක ඉක්මවා ඇත්කොට දෘෂ්ටි ගැනීම් උපදවත්. ඇතිකරත්. එබැවින් සියලු දාෂ්ටීහු අතිසාර දෘෂ්ටිහු යයි කියත්. හෙතෙම අතිසාර දෘෂ්ටියෙන් සම්පූර්ණය යනු අතිසාර දෘෂ්ටියෙන් යුක්තය යනුයි.

2 "සම්පූර්ණ මානය ඇති තැනැත්තේ මානයෙන් මත් වූයේය යනු ස්වකීය දෘෂ්ටියෙහි දෘෂ්ටි මානයෙන් මත්වූයේ

ප්‍රමත්තවූයේ උන්මත්තවූයේ යනුයි. තෙමේම තමන් සිතින් අභිෂෙක කළේ යනු මම දක්ෂයෙක් වෙමි. පණ්ඩිතයෙක් වෙමි. නුවණැත්තෙක් වෙමි. බුද්ධි ඇත්තෙක් වෙමි ඥාන ඇත්තෙක් වෙමියි තෙමේ තමන් සිතින් අභිෂෙක කරයි යනුයි.

3 "ඔහුගේ ඒ දෘෂ්ටිය එසේ සමාප්තය" යනු ඔහුගේ ඒ දෘෂ්ටිය එසේ සමාප්තය සමාදන් වූයේය. ගත්තේය. පරාමර්ශය, බැසගත්තේය යනුයි

## 12 - 13

1 "ඉදින් අන්‍යයාට වචනයෙන් නිහීනය" යනු ඉදින් අන්‍යයාට නින්දිත කාරණයෙන් ගර්හිත කාරණයෙන් උපවාද කරණලද කාරණයෙන් අතිශයින් බාලවෙයි. හීන වෙයි. නිහීන වෙයි. ලාමක වෙයි යනුයි.

2 "තෙමේද ඒ සමගම නිහීන ප්‍රාඥයෙක් වෙයි" යනු හෙතෙමේද ඔහු හා සමගම හීන ප්‍රාඥයෙක් වෙයි. නිහීන ප්‍රාඥයෙක් වෙයි. ලාමක ප්‍රාඥයෙක් වෙයි. අල්ප ප්‍රාඥයෙක් වෙයි යනුයි.

3 "නුවණැත්තේ ඉදින් තෙමේ වෙදය දන්නේවේ." යනු ඉදින් ධීරවූ පණ්ඩිතවූ ප්‍රඥවත් බුද්ධිමත් ඥානය ඇති තැනැත්තේ තෙමේ වෙදගුවෙයි, "ශ්‍රමණයන් අතුරෙහි මෝඩවූ කිසිවෙක් නැත යනු ශ්‍රමණයන් අතුරෙහි බාලවූ හීනවූ නිහීනවූ ලාමකවූ අල්පවූ කිසිවෙක් නැත. සියල්ලෝම ශ්‍රේෂ්ඨ ප්‍රඥා ඇත්තෝය විශිෂ්ට ප්‍රඥා ඇත්තෝය. ප්‍රමුඛ ප්‍රඥා ඇත්තෝය, උත්තම ප්‍රඥා ඇත්තෝය යනුයි

## 12 - 14

1 "මෙයින් අන්‍යවූ ධර්මයක් කියත්ද, අසමර්ථ ඒ ධර්මය ශුද්ධිය වළක්වයි. යනු මෙයින් අන්‍යවූ ධර්මයක් දෘෂ්ටියක් ප්‍රතිපදාවක් මාර්ගයක් කෙනෙක් තුමූ කියත්ද, ඔවුහු ශුද්ධි මාර්ගය, විශුද්ධි මාර්ගය, පරිශුද්ධි මාර්ගය, ඉතා පිරිසිදු මාර්ගය වරද්දා ගත්තෝය. අසමර්ථවූ ඔවුහු යනු අසමර්ථවූ ඔවුහු අපරිපූර්ණවූ ඔවුහු හීනය නිහීනය ලාමකය යනුයි,

2 "මෙසේද දෘෂ්ටිගතිකයෝ බොහෝ වශයෙන් කියත්. යනු තීර්ථයයි දෘෂ්ටි ගැන්මට කියයි. දෘෂ්ටිගතිකයෝ තීර්ථකයෝ යයි කියත්. බොහෝ දෘෂ්ටිගතුවන් කියත්. "ස්වකීය දෘෂ්ටි රාගයෙන් ඔවුහු ඇලුනාහුවෙති" යනු ස්වකීය දෘෂ්ටියේ දෘෂ්ටි රාගයෙන් ඇලුනාහු වෙති යනුයි.

## 12 - 15

1 "මෙහිම ශුද්ධිය වේයයි මෙසේ කියත්" යනු මෙහි ශුද්ධිය, විශුද්ධිය, පාරිශුද්ධිය, මුක්තිය, විමුක්තිය, පරිමුක්තිය, කියත්, ව්‍යවහාර කරත්. ලොකය ශාස්වතය, මෙයම සත්‍යය, අනික හිස්යයි මෙහි ශුද්ධිය විශුද්ධිය, පාරිශුද්ධිය, මුක්තිය, විමුක්තිය පරිමුක්තිය කියත් යනුයි. ලොකය අශාස්වතය සත්වයා මරණින් මතු නොමවෙයි. නොම නොවෙයි. මෙයම සත්‍යය අනික් දේ හිස්යයි මෙහි ශුද්ධිය විශුද්ධිය පාරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය කියත්,

2 "අන්‍ය ධර්මයන්හි විශුද්ධිය, නොකියත්" යනු තමන්ගේ ශාස්තෘවරයා ධර්මය, ගණයා, දෘෂ්ටිය, ප්‍රතිපදාව මාර්ගය හැර සියලු අන්‍ය වාදයන් බැහැර කරත්. වෙන්කරත්. හෙතෙම ශාස්තෘනොවේ. සර්වඥ නොවේ. ධර්මය මනාව දෙශනා කරණ ලද්දේ නොවේ. ගණයා මනාකොට පිළිපන්නේ නොවේ. දෘෂ්ටිය යහපත් නොවේ. ප්‍රතිපදාව මනාව පණවනලද්දේ නොවේ. මාර්ගය නෛර්‍යාණික නොවේ මෙහි ශුද්ධියක් හෝ විශුද්ධියක් හෝ මුක්තියක් හෝ පරිමුක්තියක් හෝ නැත, හීනය, නිහීනය මිදීමක් හෝ ලාමකයයි මෙසේ කියත්. මෙසේ ව්‍යවහාර කරත් යනුයි.

3 "මෙසේද තීර්ථකයෝ බොහෝ සේ ඇළුනාහු වෙත්. යනු තීර්ථය යයි දෘෂ්ටි ගැන්මට කියයි. තීර්ථකයෝ යයි දෘෂ්ටි ගත්තන්ට කියත්. බොහෝ දෘෂ්ටි ගැනීම්වල යෙදුනාහු පිහිටියාහු ඇළුනාහු පැමිණියාහු ගැලුනාහු ඇලුනාහු වෙති.

## 12 - 16

1 "ස්වකීය මාර්ගයෙහි දැඩි වාද ඇත්තාහු යනු ධර්මය ස්වකීය මාර්ගයයි දෘෂ්ටිය ස්වකීය මාර්ගයයි, ප්‍රතිපදාව ස්වකීය

මාර්ගයයි, මාර්ගය ස්වකීය මාර්ගයයි. ස්වකීය මාර්ගයෙහි දැඩිවාද ඇත්තාහු ස්ථිරවාද ඇත්තාහු බලවත් වාද ඇත්තාහු සිටිවාද ඇත්තාහු යනුයි.

2 "ඒ දෘෂ්ටියෙහි අතිශයින් මෝඩ වශයෙන් කවරක් බලන්නේද යන්නෙහි එහි යනු ස්වකීය දෘෂ්ටියෙහි, ස්වකීය කැමැත්තෙහි, ස්වකීය ලබ්ධියෙහි, අතිශයින් මෝඩයයි හීන යයි නිහීන යයි ලාමකයයි, කුඩායයි, අපිරිසිදු ධර්මයයි මෙසේ කියන්නේ මෙසේ ව්‍යවහාර කරන්නේ තෙමේම කලහ ඩබර විග්‍රහ විවාද ඇති කරන්නේය, රැස් කරන්නේය, අදින්නේය, පමුණුවන්නේය. ගන්නේය, පරාමර්ශ කරන්නේය යනුයි.

## 12 - 17

1 "තෙමේම ප්‍රමාණකොට විනිශ්චයෙහි සිට" යනු විනිශ්චය යයි දෙසැට දෘෂ්ටි ගැනීම් වලට කියත්. විනිශ්චය දෘෂ්ටියෙහි සිට පිහිටාගෙන, පරාමර්ශකොට බැසගෙන යනුයි. තෙමේ ප්‍රමාණකොට යනු මේ ශාස්තෘවරයා සර්වඥයයි තෙමේ ප්‍රමාණකොට මේ ධර්මය මනාකොට ප්‍රකාශ කරණ ලද්දේයයි මේ ගණයා සුප්‍රතිපන්නයයි මේ දෘෂ්ටිය යහපත්යයි මේ ප්‍රතිපදාව මනාකොට පණවන ලද්දේයයි මේ මාර්ගය නෛර්‍යාණිකයයි තෙමේ ප්‍රමාණකොට යනුයි.

2 "ලොකයෙහි තමන්ගේ වාදය මත්තෙහි තබා විවාද කරයි" යන්නෙහි මත්ත යනු අනාගතයට කියයි. තමන්ගේ වාදය ඉදිරියෙහි තබා තෙමේම කලහ ඩබර විග්‍රහ විවාදයන්ට එයි, පැමිණෙයි, ගණියි, බැසගනියි, පරාමර්ශ කරයි. මෙසේද තමන්ගේ වාදය මත්තෙහි තබා විවාද කරයි. යලිදු හෝ අනිකෙකු උසස් කරණ ලද වාදය සමග කලහ කරයි. භණ්ඩණ කරයි, විග්‍රහ කරයි, විවාද කරයි, මෙගධ කරයි. ඔබ මේ ධර්ම විනය නොදන්නෙහිය, ( (9-8) 1 (ii) ඡේදය යෙදිය යුතුයි.) ඉදින් හැකිනම් අවුල හරුව යනුයි.

3 "සියලු විනිශ්චයන් හැර" යනු දෙසැට දෘෂ්ටිගැනීම් විනිශ්චය යයි කියත්. දෘෂ්ටි විනිශ්චයෙන් සියලු විනිශ්චයයන් හැර බැහැරකොට අත්හැර දුරුකොට අභාවයට පමුණුවා යනුයි.

"සත්වයා ලොකයෙහි කලහ නොකරයි" යනු කලහ නොකරයි, ඩබර නොකරයි, විග්‍රහ නොකරයි, විවාද නොකරයි යනුයි. මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී.

4 "අග්ගිවෙස්සනය, මෙසේ මිදුන භික්ෂුතෙම වනාහි කිසිවකු හා විවාද නොකරයි, ලොකයෙහි යමක් කියන ලදද ස්පර්ශනොකරමින් එය ව්‍යවහාර කරයි. 'සත්වයා' යනු සත්වයා නරයා මනවයා පුරුෂයා පුද්ගලයා ජීවයා යනුයි. "ලොකයෙහි" යනු අපාය ලොකයෙහි ( (3-4) 6 ඡෙදය යෙදිය යුතුයි.) ආයතන ලොකයෙහි යනුයි.

## මහා වියූහ සූත්‍ර නිර්දෙශය

## 13 - 1

1 "යම්කිසි මේ දෘෂ්ටි ගැනීම්" යන්නෙහි 'යම්කිසි' යනු සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සර්වප්‍රකාරය ඉතිරි නොකොට හාත්පසින් වටකොට ගන්නා වචනයයි. "දෘෂ්ටි ගැනීම්" යනු දෘෂ්ටිය ගැනීම ඇති ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. ඔවුහු දෙසැට දෘෂ්ටීන් අතුරෙන් එක් එක්තරා දෘෂ්ටියක් ගෙන ඉගෙණ පරාමර්ශ කොට බැසගෙන ස්වකීය ස්වකීය දෘෂ්ටියෙන් වසත්. යම්සේ ගිහියෝ ගේවල වසත්ද, ඇවැත් ඇත්තෝ ඇවතෙහි වසත්ද, කෙලෙස් ඇත්තෝ කෙලෙස්හි වසත්ද, මෙපරිද්දෙන්ම ඇතැම් ( (12-1) 1 (ii) ඡෙදය යෙදිය යුතුයි) වසත් යනුයි.

2 "මෙයම සත්‍යයයයිද වාද කරත්" යනු ලොකය ශාස්වතය මෙයම සත්‍යය, අනික් වාද හිස්යයි කියත්. ප්‍රකාශ කරත්, ව්‍යවහාර කරත්. ලොකය අශාස්වතය ( (3 5) 1 (ii) ඡෙදය යෙදිය යුතුයි) සත්වයා මරණින් මතු නොමවෙයි, නොම නොවෙයි. මෙයම සත්‍යය අනික් වාද හිස්යයි කියත්, ප්‍රකාශ කරත්, ව්‍යවහාර කරත් යනුයි.

3 "ඒ සියල්ලෝම නින්දාවට පැමිණෙත්" යනු සියලුම ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝම නින්දාවට පැමිණෙත්. ගර්හාවටම

පැමිණෙත් අපකීර්තියටම පැමිණෙත්. සියල්ලන්ට නින්දාවම වෙත්. ගර්හාවම වෙත්. අපකීර්තියම වෙත් යනුයි.

4 "(i) නැවත එහි ප්‍රශංසාවද ලබයි" යනු එහි ස්වකීය දෘෂ්ටියෙහි ස්වකීය කැමැත්තෙහි, ස්වකීය රුචියෙහි, ස්වකීය ලබ්ධියෙහි ප්‍රශංසාව, ස්තුතිය, කීර්තිය, වර්ණනාව ලබත් පැමිණෙත්, විඳිත් යනුයි.

## 13 - 2

1 "මෙය අල්පය සංසිඳීම පිණිස ප්‍රමාණවත් නොවේ" යන්නෙහි මෙය අල්පය යනු මෙය ස්වල්පය, මෙය ලාමකය. මෙය ටිකය. මෙය කුඩාය යනුයි සංසිඳීම පිණිස ප්‍රමාණවත් නොවේ (ii) යනු රාගයාගේ සංසිඳීමපිණිස ද්වෙෂයාගේ සංසිඳීම පිණිස ක්‍රොධයාගේ බද්ධවෛරයාගේ ගුණමකුකමේ එකට එක කිරීමේ ඊර්ෂ්‍යාවේ මසුරුකමේ රැවටිල්ලේ කෛරාටික කමේ තදගතියේ කළදේට වඩා කිරීමේ මානයේ අතිමානයේ මදයේ ප්‍රමාදයේ සියලු කෙලෙස්වල සියලු දුසිරිත්වල සියලු පීඩාවල සියලු දැවිලිවල සියලු තැවීම්වල සියලු අකුසල් රැස් කිරීම්වල සංසිඳීම පිණිස බැහැර කිරීම පිණිස නිර්වාණය පිණිස මෙය ප්‍රමාණ නොවේ යනුයි.

2 "විවාදයාගේ ඵල දෙකක් කියමි" යනු දෘෂ්ටි කලහයේ දෘෂ්ටි ඩබරයේ දෘෂ්ටි විග්‍රහයේ දෘෂ්ටි වාදයේ දෘෂ්ටි ආරාවුල් ඵල දෙකක් වෙත්. ජය පරාජය වෙයි. ලාභාලාභ වෙයි. කීර්ති අපකීර්ති වෙයි. නින්දා ප්‍රශංසා වෙයි. සුවදුක් වෙයි සොම්නස් දොම්නස් වෙයි. ඉෂ්ටානිෂ්ට වෙයි. අනුකූල බව හා කෝපය වෙයි. හැපීම් ගැටීම් වෙයි. අනුරොධය හා විරොධය වෙයි. යලිඳු හෝ ඒ කර්මය නරක දුකට හේතු වෙයි. තිරිසන් යෝනි දුකට හේතු වෙයි. ප්‍රේත දුකට හේතු වේයයි කියමි. දෙශනා කරමි පණවමි. විවෘත කරමි. බෙදමි. ප්‍රකට කරමි. ප්‍රකාශ කරමි යනුයි.

3 "මෙයද දැක විවාද නොකරව්" යන්නෙහි මෙයද දැක යනු මේ ආදීනවය දැක බලා සමකොට තීරණය කොට ප්‍රකට කොට දෘෂ්ටි කලහයන්හි දෘෂ්ටි විවාදයන්හි මෙයද දැක "විවාද

නොකරව්" යනු කලහ නොකරන්නේය. විවාද නොකරන්නේය. විග්‍රහ නොකරන්නේය සංසිඳ වන්නේය අභාවයට පමුණුවන්නේය. කලහයෙන් විග්‍රහයෙන් විවාදයෙන් ඩබරයෙන් දුරුවන්නේය. වෙන්වන්නේය දුරුවූනේය සීමා නොකරණ ලද සිතින් වාසය කරන්නේය යනුයි. අවිවාද භූමියවූ නිර්වාණය බලන්නේ යනු අවිවාද භූමිය යනු අමෘතවූ නිර්වාණයට කියයි. ඒ සියලු සංස්කාරයන් සංසිඳවූ සියලු කෙලෙස් බැහැරකළ තෘෂ්ණාව නැතිකළ රාගය නැතිකළ නිරොධ නම්වූ නිර්වාණයයි. මේ අවිවාද භූමිය ආරක්ෂා තැන වශයෙන් පිහිට ඇති තැන වශයෙන් භය නැති තැන වශයෙන් ච්‍යුත නොවන තැන වශයෙන් අමෘත තැන වශයෙන් නිර්වාණය වශයෙන් බලන්නේ දකින්නේ සිතන්නේ විශෙෂයෙන් බලන්නේ යනුයි.

## 13 - 3

1 "යම්කිසි මේ පෘථග්ජනයන්ගේ සම්මුතියක් හෙවත් දෘෂ්ටියක් ඇද්ද" යන්නෙහි යම්කිසි යනු සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සර්වප්‍රකාරය නිරවශෙෂ කොට වටකොට ගන්නා වචනයයි. "සම්මුතිහු" යනු දෙසැට දෘෂ්ටි ගැනීම සම්මුතීහුයි. පෘථග්ජනයන් විසින් ඇතිකරණ ලද යනු ඔවුන් විසින් උපදවන ලද සම්මුතීහු යනුයි. "බොහෝ නොයෙක් ජනයන් විසින් ඇතිකරණ ලද සම්මුතීහුයි යනුයි. "නුවණැත්තේ මේ සම්මුතීන්ට නොපැමිණෙයි." නොගනියි. පරාමර්ශ නොකරයි. ඇතුළු නොවෙයි. යනුයි

2 "පැමිණීම් නැති හෙතෙම කිම පැමිණෙන්නේද" යනු පැමිණීම් යනු පැමිණීම් දෙකකි. තෘෂ්ණාවට පැමිණීම්ද දෘෂ්ටියට පැමිණීම්ද යනුයි. ( (2-6) 1 (ii) (iii) "මමත්වය" වෙනුවට පැමිණීම කියා වෙනස්කර යොදාගත යුතුයි) ඔහුගේ තෘෂ්ණාවට පැමිණීම ප්‍රහීණය, දෘෂ්ටියට පැමිණීම සංසිඳුනේය. පැමිණීම් නැති පුද්ගලතෙම කිම රූපය වෙත (ii) පැමිණෙන්නේද ගන්නේද පරාමර්ශ කරන්නේද (iii) කිම වේදනාව වෙත කිම සඤ්ඤාව වෙත කිම සංස්කාරයන් වෙත කිම විඤ්ඤානය වෙත කිම ගතිය වෙත කිම උත්පත්තිය වෙත කිම ප්‍රතිසන්ධිය

වෙත කිම භවය වෙත කිම සංසාර වෙත කිම වට්ටය (-සසර වැට) වෙත පැමිණෙන්නේද, ගන්නේද, පරාමර්ශ කරන්නේද යනුයි.

3 "දුටු දෙයෙහිද ඇසූ දෙයෙහිද රුචිය නොකරන්නේ" යනු දැකීමෙහි හෝ දැකීමේ ශුද්ධියෙහි හෝ ඇසීමේ හෝ ඇසීමේ ශුද්ධියෙහි හෝ මුතයෙන් හෝ මුත ශුද්ධියෙහි හෝ රුචි නොකරන්නේ කැමැත්ත නොකරන්නේ ප්‍රෙමය නොකරන්නේ රාගය නොකරන්නේ නූපදවන්නේ ඇති නොකරන්නේ යනුයි.

## 13 - 4

1 "ශීලය උතුම් කොට ඇති සඤ්ඤමයෙන් ශුද්ධිය කියත්." යනු සීලය උතුම්කොට ඇති වැදගත් ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. ඔවුහු සීල මාත්‍රයෙන්, නොඉක්මවීම් මාත්‍රයෙන් ශුද්ධි මාත්‍රයෙන් විශුද්ධි වාදත්‍රයෙන් පාරිශුද්ධි මාත්‍රයෙන් මිදීම විමුක්තිය කියත්. ප්‍රකාශ කරත්. ව්‍යවහාර කරත් යනුයි. චණ්ඩිකා පුත්‍ර නම් ශ්‍රමණතෙම මෙසේ කියයි, ථපතිය, ධර්ම සතරකින් යුක්තවූ පුරිස පුද්ගලයා කුසලයෙන් යුත් උතුම් කුසල් ඇති උතුම් පැමිණීමට පැමිණි නොපැරදවිය හැකි ශ්‍රමණයායයි මම කියමි. කවර සතරකින්ද, ථපතිය, මෙහි කයින් පව්කම් නොකෙරේද, පවිටු වචන නොකියාද, පවිටු කල්පනා කල්පනා නොකරයිද, ලාමක දිවි පැවැත්ම නොකරයිද, ථපතිය, මේ ධර්ම සතරින් යුත් පුරිස පුද්ගලයා කුශලයෙන් යුත්, උතුම් කුසල් ඇති, උතුම් පැමිණීමට පැමිණි නොපැරදවිය හැකි පුද්ගලයායයි කියමි" මෙපරිද්දෙන්ම සීලය උතුම් කොට ගත් වාද ඇති ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. ඔවුහු ශීල මාත්‍රයෙන් හික්මීම් මාත්‍රයෙන් සංවර මාත්‍රයෙන් නොඉක්මවීම් මාත්‍රයෙන් ශුද්ධිය විශුද්ධිය පාරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය කියත්. ප්‍රකාශ කරත්. ව්‍යවහාර කරත් යනුයි.

2 "ව්‍රතය සමාදන්ව එයට පැමිණියාහු" යනු ව්‍රතය යනු හස්ති ව්‍රතය හෝ අශ්ව ව්‍රතය හෝ ගව ව්‍රතය හෝ ශුනක ව්‍රතය හෝ කාක ව්‍රතය හෝ වාසුදෙව ව්‍රතය හෝ බල දෙව ව්‍රතය හෝ

පූර්ණභද්‍ර ව්‍රතය හෝ මණිභද්‍ර ව්‍රතය හෝ අග්නිව්‍රතය හෝ නාග ව්‍රතය හෝ සුපර්ණව්‍රතය හෝ යක්ෂ ව්‍රතය හෝ අසුර ව්‍රතය හෝ ගාන්ධර්ව ව්‍රතය හෝ මහාරාජ ව්‍රතය හෝ චන්ද්‍ර ව්‍රතය හෝ ආයර්‍ය ව්‍රතය හෝ ඉන්ද්‍ර ව්‍රතය හෝ බ්‍රහ්ම ව්‍රතය හෝ දෙව ව්‍රතය හෝ දිශා ව්‍රතය හෝ ගෙන සමාදන්ව පරාමර්ශ කොට බැසගෙන සිටියාහු පිහිටියාහු ඇලුනාහු පැමිණියාහු ගැලුනාහු යනුයි.

3 "මෙහිම හික්මෙමු. ඉක්බිති ඔහුගේ ශුද්ධිය වේ" යන්නෙහි "මෙහි" යනු ස්වකීය දෘෂ්ටියෙහි ස්වකීය කැමැත්තෙහි, ස්වකීය රුචියෙහි, ස්වකීය ලබ්ධියෙහි, "හික්මෙමු" යනු හික්මෙමු හැසිරෙමු සමාදන්ව සිටිමු "ඉක්බිති ඔහුගේ ශුද්ධිය" යනු ශුද්ධිය විශුද්ධිය පාරිශුද්ධිය, මුක්තිය විමුක්තිය පරිමුක්තිය යනුයි.

4 "භවයට පැමිණියාහු කුසලවාද කියන්නෝ වෙත්" යන්නෙහි භවයට පැමිණියාහු යනු භවයට බැස ගත්තාහු පැමිණියාහු ඇලුනාහු යනුයි. කුසල වාදයෝ යනු ස්වකීය ලබ්ධියෙහි දක්ෂවාදයෝ පණ්ඩිත වාදයෝ ස්ථිරවාදයෝ න්‍යාය වාදයෝ, හේතුවාදයෝ, ලක්ෂණ වාදයෝ, කාරණ වාදයෝ ස්ථාන වාදයෝ යනුයි.

## 13 - 5

1 "ඉදින් ශීලයෙන් හා ව්‍රතයෙන්ච්‍යුතවූයේ වේද" යනු කරුණු දෙකකින් ශීලයෙන්ද ව්‍රතයෙන්ද ච්‍යුතවූයේ, වෙයි අන්‍යවාද සිඳීමට හෝ ච්‍යුතවෙයි. නොහැකි වන බැවින් හෝ ච්‍යුත වෙයි. කෙසේ පරවාද සිඳීම පිණිස ච්‍යුත වේද, අන්‍යවාද සිඳියි කෙසේද, ඒ ශාස්තෘන් වහන්සේ සර්වඥ නොවේ. ධර්මය ස්වාක්ඛාත නොවේ. ගණයා සුපිළිපන් නොවේ. දෘෂ්ටිය යහපත් නොවේ.

මෙහි ශුද්ධියක් හෝ විශුද්ධියක් හෝ පාරිශුද්ධියක් හෝ මුක්තියක් හෝ විමුක්තියක් හෝ පරිමුක්තියක් හෝ නැත. මෙහි ශුද්ධියක් හෝ විශෙෂ ශුද්ධියක් හෝ මිදීමක් හෝ නැත. හීනය නිහීනය ලාමකය මෙසේ අන්‍යවාද සිඳියි, මෙසේ සිඳින්නේ ශාස්තෘවරයාගෙන් වෙන්වෙයි. ධර්මයෙන් වෙන්වෙයි,

ගණයාගෙන් වෙන්වෙයි. දෘෂ්ටියෙන් වෙන් වෙයි. ප්‍රතිපදාවෙන් වෙන් වෙයි, මාර්ගයෙන් වෙන් වෙයි, මෙසේ අන්‍යවාද සිඳීම පිණිස වෙන්වෙයි, කෙසේ නොහැකිවන බැවින් වෙන්වේද, ශීලය රැකීමට නොහැකි බැවින් ශීලයෙන් වෙන්වෙයි, ව්‍රතය ගැනීමට නොහැකි බැවින් ව්‍රතයෙන් වෙන්වෙයි, ශීලව්‍රතදෙක රැකීමට නොහැකිවන බැවින් ශීලව්‍රතදෙකින් වෙන්වෙයි. මෙසේ නොහැකි බැවින් වෙන් වෙයි යනුයි.

2 "කර්මය වරදවා හෙතෙම කම්පාවෙයි" යන්නෙහි හෙතෙම කම්පා වෙයි යනු ශීලය හෝ ව්‍රතය හෝ ශීල ව්‍රත දෙකම හෝ මා විසින් වරද්දන ලදී. මා විසින් දූෂිත කරණ ලදී. මා විසින් ගිලිහීම කරණ ලදී. නොදැනීමෙන් මම වැරැද්දුවේ වෙමියි කම්පා වෙයි, වෙවුලයි, විශෙෂයෙන් කම්පා වෙයි යනුයි කර්මය වරදවා යනු පුණ්‍යාභි සංස්කාරය හෝ අපුණ්‍යාභි සංස්කාරය හෝ ආනෙඤ්ජාභි සංස්කාරය හෝ මාවිසින් වරද්දන ලදී. මාවිසින් ගිලිහීම කරන ලදී. මා විසින් දූෂිත කරණ ලදී. මම නොදැනීමෙන් වැරැද්දු වෙමියි කම්පාවෙයි යනුයි.

3 "හෙතෙම ශුද්ධිය ගැන කථාකරයි, බලාපොරොත්තු වෙයි" යනු හෙතෙම ශීලය ගැන කථාකරයි. ව්‍රතය ගැන කථා කරයි, ශීලව්‍රත දෙක ගැන කථා කරයි. "ශුද්ධිය ප්‍රාර්ථනා කරයි. යනු ශීල ශුද්ධිය හෝ ප්‍රාර්ථනා කරයි, ව්‍රත ශුද්ධිය හෝ ප්‍රාර්ථනා කරයි.

4 "ගෙයින් නික්මුනේ ශාස්තෘවරයා නැවතුනේය" යනු යම්සේ පුරුෂතෙම ගෙයින් නික්මුනේ ශාස්තෘවරයා සමග වසන්නේ ශාස්තෘවරයා නැවතුනේ වෙයි ඔහු හෝ ශාස්තෘවරයා ලුහු බඳියි සිය ගෙදරට හෝ ආපසු එයි, එපරිද්දෙන්ම දෘෂ්ටිය ගත්තේය කියා හෝ ශාස්තෘවරයා ගනියි. අන්‍ය ශාස්තෘවරයකු හෝ ගනියි. ඒ ධර්මය හෝ ගනියි. අන්‍ය ධර්මයක් හෝ ගනියි ඒ ගණයා හෝ ගනියි. වෙනින් ගණයක් හෝ ගනියි. ඒ දෘෂ්ටිය හෝ ගනියි. අනික් දෘෂ්ටියක් හෝ ගනියි. ඒ ප්‍රතිපදාව හෝ ගනියි. අන්‍ය ප්‍රතිපදාවක් හෝ ගනියි. අනික් මාර්ගයක් හෝ ගනියි. පරාමර්ශ කරයි. බැස ගනියි යනුයි.

## 13 - 6

1 "ශීලය හෝ ව්‍රතය හෝ සියල්ල දුරුකොට" යනු සියලු ශීල ශුද්ධින් දුරුකොට හැර, බැහැරකොට සංසිඳුවා නූපදනා බවට පමුණුවා සියලු ව්‍රත ශුද්ධින් හැර, දුරුකොට බැහැර කොට සංසිඳුවා නූපදනාබවට පමුණුවා සියලු ශීලව්‍රත ශුද්ධින් හැර දුරුකොට බැහැරකොට සංසිඳුවා නූපදනා බවට පමුණුවා යනුයි

2 "වැරදි නිවැරදි මේ කර්මයද" යනු වැරදි කර්මය තෘෂ්ණා වූ තෘෂ්ණ විපාකය ඇත්තේයයි කියයි. වැරදි නැති කර්මය සුදුවූ සුදු විපාක ඇත්තේයයි කියයි. වැරදි ඇති කර්මයද වැරදි නැති කර්මයද දුරුකොට බැහැරකොට, හැර, සංසිඳුවා නූපදනා බවට පමුණුවා යනුයි. ශුද්ධිය අශුද්ධිය ප්‍රාර්ථනා නොකරන්නේ යන්නෙහි අශුද්ධිය යනු අශුද්ධිය ප්‍රාර්ථනාකරත්. අකුශල ධර්මයන් ප්‍රාර්ථනා කරත්. ශුද්ධිය යනු ශුද්ධිය ප්‍රාර්ථනා කරත්. පඤ්චකාම ගුණයන් ප්‍රාර්ථනා කරත් ශුද්ධිය ප්‍රාර්ථනා කරත්. අකුශල ධර්මයන් ප්‍රාර්ථනා කරත්. පඤ්චකාම ගුණය ප්‍රාර්ථනා කරත්. ශුද්ධිය ප්‍රාර්ථනාකරත්. දෙසැට දෘෂ්ටි ගැනීම ප්‍රාර්ථනාකරත්. අශුද්ධිය ප්‍රාර්ථනාකරත්. ගැනීම් ප්‍රාර්ථනා කරත්. අකුශලයන් ප්‍රාර්ථනා කරත්. පඤ්චකාම ගුණයන් ප්‍රාර්ථනා කරත්. දෙසැට දෘෂ්ටි ගැනීම් ප්‍රාර්ථනාකරත් ත්‍රෛධාතුක අකුශල ධර්මයන් ප්‍රාර්ථනා කරත්, අකුශල ධර්මයන් ප්‍රාර්ථනා කරත්, පඤ්චකාම ගුණයන් ප්‍රාර්ථනාකරත්, දෙසැට දෘෂ්ටි ගැනීම් ප්‍රාර්ථනා කරත් ත්‍රෛධාතුක කුශල ධර්මයන් ප්‍රාර්ථනා කරත්. ශුද්ධිය ප්‍රාර්ථනා කරත්. පෘථග්ජන කල්‍යාණකයෝ ස්ථිර බැසගැන්ම ප්‍රාර්ථනා කරත්. ශෛක්ෂයෝ අග්‍ර ධර්මයවූ අර්හත්වය ප්‍රාර්ථනාකරත්. අර්හත්වය ලැබූ කල්හි රහතුන් වහන්සේ අකුශල ධර්මයන් ප්‍රාර්ථනා නොකරත්. පඤ්චකාම ගුණයන් ප්‍රාර්ථනා නොකරත්, දෙසැට දෘෂ්ටි ගැණීම් ප්‍රාර්ථනා නොකරත්. ත්‍රෛධාතුක කුශල ධර්මයන් ප්‍රාර්ථනා නොකරත්. ස්ථිරවූ බැසගැන්ම ප්‍රාර්ථනා නොකරත්. අග්‍රධර්යමවූ අර්හත්වය ප්‍රාර්ථනා නොකරත්. ප්‍රාර්ථනා ඉක්මවූ රහතුන් වහන්සේ වැඩීමද පිරිහීමද, නැවැත්වූයේ වෙයි. උන්වහන්සේ වැස නිමවූයේ

පුරුදුකළ චරණ ධර්ම (හැසිරීම්) ඇත්තේ තරණය කළ ජාති ජරා මරණ සංසාරයන් ඇත්තේ උන්වහන්සේගේ නැවත ඉපදීමක් නැත.

3 වෙන්වූයේ ශාන්තිය නොගෙන හැසිරෙන්නේය. යන්නෙහි වෙන්වූයේ යනු ශුද්ධියෙන්ද අශුද්ධියෙන්ද ඈත්වූයේය වෙන්වූයේය. නික්මුණේය මිදුණේය. සීමානොකරණ ලද සිතින් වාසයකරයි. හැසිරෙන්නේය යනු හැසිරෙන්නේය. වසන්නේය. ඉරියව් පවත්වන්නේය පාලනය කරන්නේය. යැපෙන්නේය වෙන්ව වසන්නේය යනුයි. ශාන්තිය නොගෙන යන්නෙහි ශාන්තියයි දෙසැට දෘෂ්ටීන්ට කියත්. දෘෂ්ටි ශාන්තීන් නොගන්නාහු පරාමර්ශ ඇතුල්නොවන්නාහු යනුයි

## 13 - 7

1 පිළිකුල්වූ එය ඇසුරුකොට යනු තපස පිළිකුල් කරණ වාදය ඇති ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. තපස පිළිකුල් කිරීම සාරකොටඇති, තපස පිළිකුල් කිරීමෙහි යෙදුණ ඇලුණ පැමිණි ගැලුණ යනුයි. "යලිදු දිට්ඨ සුතමුතයන් හෝ යනු ඇසූදෙය හෝ දුටු දෙයෙහි ශුද්ධිය හෝ ඇසූ දෙය හෝ ඇසූ දෙයෙහි ශුද්ධිය හෝ මුතය හෝ මුතශුද්ධිය හෝ නිසා පරාමර්ශකොටගෙන බැසගෙන ඇලි යනුයි.

2 "උද්ධංසර වාද ඇත්තෝ ශුද්ධිය කියත්" යනු උද්ධංසර නම් වාදය ඇති ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන් ගේ උද්ධංසර වාදය කවරේද? ඒකාන්ත ශුද්ධිය කියන සංසාර ශුද්ධිය කියන අකිරිය දෘෂ්ටිය කියන ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙති. මේ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ උද්ධංසර වාදය ඇත්තෝ වෙති ඔවුහු සංසාරයෙහි ශුද්ධිය විශුද්ධිය පාරිශුද්ධිය, මුක්තිය, විමුක්තිය, පරිමුක්තිය, කියත්. ප්‍රකාශකරත්. ව්‍යවහාර කරත් යනුයි.

3 "භවයෙන් භවයෙහි නොහරණලද තෘෂ්ණා ඇත්තේ යන්නෙහි තෘෂ්ණා නම් රූප තෘෂ්ණා ශබ්ද තෘෂ්ණා, ගන්ධ තෘෂ්ණා රශ තෘෂ්ණා, ස්පර්ශ තෘෂ්ණා ධර්ම තෘෂ්ණා යනුයි. භවයෙන් භවයෙහි යනු භවයෙන් භවයෙහි කර්ම භවයෙහි

පුනර්භවයෙහි කාම භවයෙහි පුනර්භවයෙහි රූපයෙහි කර්ම භවයෙහි රූපභවයෙහි නැවත නැවත භවයෙහි නැවත නැවත ගතියෙහි නැවත නැවත උත්පත්තියෙහි නැවත නැවත ප්‍රතිසන්ධියෙහි නැවත නැවත ආත්ම භාවයන් පහළවීමෙහි, නොහළ තෘෂ්ණාඇත්තේ දුරුනොකළ තෘෂ්ණා ඇත්තේ හැරනොදැමූ තෘෂ්ණා ඇත්තේ වමාරා නොදැමූ තෘෂ්ණා ඇත්තේ නොමිදූ තෘෂ්ණා ඇත්තේ බහා නොතැබූ තෘෂ්ණා ඇත්තේ යනුයි

## 13 - 8

1 බලාපොරොත්තු වන්නහුට තෘෂ්ණාව ඇතිවෙත්” යනු ප්‍රාර්ථනාවට තෘෂ්ණාව යයි කියයි. යම් රාගයක් ඇද්ද ඇලීමක් ඇද්ද ( (1-3) 4 ඡෙදයේ යම් ‘ලංවීමක් ඇද්ද’ යන තැන සිට යෙදිය යුතුයි) අභිධ්‍යාවක් ඇද්ද ලොභයක් ඇද්ද අකුශල මූලයක් ඇද්ද එයයි. “බලාපොරොත්තුවන්නහුට” යනු ප්‍රාර්ථනා කරන්නහුට කැමති වන්නහුට බාරගන්නහුට විශෙෂයෙන් ආශා ඇති කරන්නහුට යනුයි.

2 “කල්පනා කළ වස්තුවෙහි කම්පාවීම” යන්නෙහි කල්පනා යනු කල්පනා දෙකකි. එනම්, තෘෂ්ණා කල්පනාවද දෘෂ්ටි කල්පනාවද යනුයි ( (2-7) 1 (ii) “මමත්වය” වෙනුවට “කල්පනාව” කියා යෙදිය යුතුයි) කල්පනා කරන වස්තුවෙහි වෙව්ලීමද යන්නෙහි කම්පාවීමද යනු ඒ වස්තුව සිදේය යන සැකයෙන්ද කම්පා වෙයි. සිදෙද්දීද කම්පාවෙයි. සිඳුන කල්හිද කම්පාවෙයි. කල්පනා කළ වස්තුව වෙනස්වේය යන සැකයෙන්ද කම්පා වෙත්. වෙනස්වන කල්හිද කම්පා වෙත්. වෙනස්වූ කල්හිද කම්පා වෙත්. විශෙෂයෙන් කම්පාවෙත් යනුයි.

3 “මෙහි යම් රහත් කෙනෙකුට චුතියද උත්පත්තියද නැත්තේය” යනු යම් කෙනෙකුට යනු අර්හත් ක්ෂීණාශ්‍රවයන් වහන්සේට යනුයි. යමෙකුට ගමනද ආගමනයද ගමනාගමනයද කාලයද ගතියද භවයෙන් භවයද චුතියද උත්පත්තියද ඇතිවීමද බිඳීමද ජාතියද ජරාවද මරණයද නැද්ද විද්‍යමාන නොවේද ප්‍රහීණද සිඳුනේද, ශාන්තද ඉපදීමට අයොග්‍යද ඥානය නමැති ගින්නෙන් දැවුනේද යනුයි.

4 "හෙතෙම කුමකින් කම්පා වන්නේද? තෘෂ්ණාව ඇති කරන්නේද? යනු හෙතෙම කවර රාගයකින් කම්පා වන්නේද, කවර ද්වෙෂයකින් කම්පාවන්නේද, කවර මොහයකින් කම්පාවන්නේද, කවර මානයකින් කම්පාවන්නේද, කවර දෘෂ්ටියකින් කම්පාවන්නේද, කවර සිතේ නොසන්සුන් කමකින් කම්පාවන්නේද කවර විචිකිච්ඡාවකින් කම්පාවන්නේද කවර අනුශයන්ගෙන් කම්පාවන්නේද රාග ඇත්තේය කියා හෝ ද්වෙෂ ඇත්තේය කියා හෝ මෝහ ඇත්තේය කියා හෝ බැඳුනේය කියා හෝ පරාමර්ශ කළේය කියා හෝ වික්ෂෙපයට ගියේය කියා හෝ අනිටු බවට ගියේය කියා හෝ උත්සාහවත්බවට ගියේය කියා හෝ කුමකින් කම්පා වන්නේද ඒ රැස්කිරීම් ප්‍රහිණය රැස් කිරීම් ප්‍රහීණ බැවින් තිරිසන් යොනිකයෙකැයි කියා හෝ ප්‍රේතගතිකයෙකැයි කියා හෝ මිනිසෙකැයි කියා හෝ දෙවියෙකැයි කියා හෝ රූපීයෙකැයි කියා හෝ අරූපියෙකැයි කියා හෝ සඤ්ඤියෙකැයි කියා හෝ අසඤ්ඤියෙකැයි කියා හෝ නෙවසඤ්ඤි නාසඤ්ඤියෙකැයි කියා හෝ කීමට එබඳු හේතුවක් නැත, ප්‍රත්‍යයක් නැත. කාරණයක් නැත. යමකින් කම්පා වන්නේද වෙවුලන්නේද විශෙෂයෙන් කම්පාවන්නේද එබඳු හේතුවක් නැත. හෙතෙම කුමකින් කම්පා වන්නේද, "කොහි තෘෂ්ණාව ඇති කරන්නේද" යනු කොහි හෝ තෘෂ්ණාව ඇති කරන්නේද කුමක තෘෂ්ණාව ඇති කරන්නේද යනුයි.

## 13 - 9

1 "ඇතැම් කෙනෙක් යම් ධර්මයක් උත්තමයයි කියද්ද" යනු යම් ධර්මයක් දෘෂ්ටියක් ප්‍රතිපදාවක් ඇතැම් මාර්ගයක් ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මෙය උතුම්ය, අග්‍රය, ශ්‍රෙෂ්ඨය, ප්‍රමුඛයය මෙසේ කියත්. මෙසේ ව්‍යවහාර කරත්. ප්‍රකට කරත් යනුයි.

2 "අනිකෙක් මෙයම හීනයයි කියත්" යනු මේ ධර්මයම දෘෂ්ටියම ප්‍රතිපදාවම මාර්ගයම ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මෙය හීනය වෙයි. නිහීනය මෙය ලාමකය මෙය කුඩා යයි

කියත්. මෙසේ කියත්. මෙසේ ප්‍රකට කරත්. මෙසේ ව්‍යවහාර කරත් යනුයි.

3 "මොවුනතුරෙන් සත්‍යවූ වාදය කුමක්ද?" යනු මේ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ කවර වාදයක් සත්‍යද නොවැසුනේද, ස්වභාව පරිදිද විපරීත නොවූයේද යනුයි.

4 "මේ සියල්ලෝම දක්ෂ වාද ඇත්තෝයි" යනු මේ සියලුම ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ස්වකීය ලබ්ධියෙහි දක්ෂ වාද ඇත්තෝ වෙති. පණ්ඩිත වාද ඇත්තෝ වෙත්. ස්ථිරවාද ඇත්තෝ වෙත්. න්‍යාය වාද ඇත්තෝ වෙත් හේතුව ද ඇත්තෝ වෙත්. ලක්ෂණ වාද ඇත්තෝ වෙත්. කාරණවාද ඇත්තෝ වෙත් ස්ථානවාද ඇත්තෝ වෙත් යනුයි

## 13 - 10

1 "ස්වකීය ධර්මය පරිපූර්ණයයි කියත්" යනු ස්වකීය ධර්මය දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මෙය හීනය, මෙය නිහීනය, මෙය යහපත්ය, මෙය ලාමකය, මෙය කුඩායයි මෙසේ කියත්.

2 "මෙසේ ගෙන වාද කරත්" යනු මෙය ගෙන, උගෙන, පරාමර්ශකොට බැසගෙන වාද කරත් කලහ කරත්. ඩබර කරත්. විග්‍රහ කරත්. විවාද කරත්. කලබල කරත්. ඉදින් ඔබ මේ ධර්ම විනය නොදන්නෙහිය. ( (9-8) 1 (ii) ඡේදය යෙදිය යුතුයි.) ඉදින් හැකිනම් අවුල හරුව යනුයි.

3 "ස්වකීය ස්වකිය සම්මුතිය සත්‍යයයී කියත්" යනු ලොකය ශාස්වතය, මෙයම සත්‍යය අනික්වාද හිස්යයි ස්වකීය ස්වකීය සම්මුතිය සත්‍යයයි කියත්, ලොකය අශාස්වතය ( (3-6) 1 (ii) ඡේදය යෙදිය යුතුයි) සත්වයා මරණින් මතු නොම වෙයි. නොම නොවෙයි, මෙයම සත්‍යය අනික් වාද හිස්යයි ස්වකීය ස්වකිය සත්‍යයයි කියත්.

## 13 - 11

1 "අන්‍යයාට නින්දා කිරීමෙන් හීනයෙක් වෙයි" යනු ඉදින් අන්‍යයාට නින්දා කිරීමේ කාරණයෙන් අන්‍යයා පහත්කොට

කථාකිරීමේ කාරණයෙන් ගර්හා කිරීමේ කාරණයෙන් අන්‍යයාට උපවාද කිරීමේ කාරණයෙන් අතිශයින් අඥානයෙක් වෙයි හීනයෙක් වෙයි, නිහීනයෙක් වෙයි, පහත් පුද්ගලයෙක් වෙයි, ස්වල්ප පුද්ගලයෙක් වෙයි.

2 "ධර්මයන්හි කිසියම් විශෙෂයක් නොවන්නේය" යනු ධර්මයන්ගෙන් කිසිවක් අග්‍රනොවේ, ශ්‍රෙෂ්ඨ නොවේ, ප්‍රමුඛ නොවේ, උත්තම නොවේ, ඉතා උතුම් නොවේ, යනුයි.

3 "බොහෝ හීන වශයෙන් අන්‍යයාට ධර්මය කියත් යයි" හීන වශයෙන් නිහීන වශයෙන් පහත් වශයෙන් ලාමක වශයෙන් ස්වල්ප වශයෙන් බොහෝවූද බොහෝ දෙනාට ධර්මය කියත්, උපවාද කරත්, නින්දා කරත්, ගර්හා කරත්, හීන වශයෙන් නිහීන වශයෙන් පහත් වශයෙන් ලාමක වශයෙන් ස්වල්ප වශයෙන් එක් පුද්ගලයෙක්ද බොහෝ දෙනාට ධර්මය කියයි උපවාද කරයි. නින්දා කරයි, ගර්හා කරයි, හීන වශයෙන්ද නිහීන වශයෙන් පහත් වශයෙන් ලාමක වශයෙන් ස්වල්ප වශයෙන් එක් පුද්ගලයෙක් එක් පුද්ගලයෙකුට ධර්මය කියයි උපවාද කරයි නින්දා කරයි ගර්හා කරයි යනුයි.

4 "ස්වකීය දෘෂ්ටියෙහි දැඩිව ගෙන" යනු ධර්මය ස්වකීය මාර්ගයයි දෘෂ්ටිය ස්වකීය මඟයයි, ප්‍රතිපදාව ස්වකීය මඟය, මාර්ගය ස්වකීය පාරය ස්වකීය දෘෂ්ටියෙන් දැඩිවාද ඇතිව ස්ථිරවාද ඇති බලවත් වාද ඇති ස්ථිරවාද ඇති යනුයි,

## 13 - 12

1 "සද්ධර්ම පූජාවද වනාහි එසේමය" යනු සද්ධර්ම පූජාව කුමක්ද ස්වකීය ශාස්තෘවරයාට සත්කාර කරයි. ගරුකරයි. බහුමාන කරයි, පුදයි, මේ ශාස්තෘවරයාය, සර්වඥය යනුවෙනි, මේ සද්ධර්ම පූජාවයයි ස්වකීය ධර්මයට ස්වකීය ගණයාට ස්වකීය දෘෂ්ටියට ස්වකීය මාර්ගයට සත්කාර කරයි. ගරු කරයි බහුමාන කරයි. පුදයි. මේ මාර්ගය නෛර්‍යාණිකය යනුවෙනි, මේ සද්ධර්ම පූජාවයි, "සද්ධර්ම පූජාවද එසේම යනු සද්ධර්ම පූජාවද එසේම ඇත්තේය. වූපරිදිය. ඇති තත්වයේය. විපරීත නොවූයේය යනුයි.

2 "ස්වකීය දෘෂ්ටීන්ට යම්සේ ප්‍රශංසා කෙරෙද්ද" යනු ධර්මය ස්වකීය මාර්ගයයි දෘෂ්ටිය ස්වකීය මාර්ගයයි ප්‍රතිපදාව ස්වකීය මාර්ගය මාර්ගය ස්වකීය පාර කියා ස්වකීය දෘෂ්ටීන්ට ප්‍රශංසා කරත්, ස්තුති කරත්, ගුණ ඝොෂාව කරත්, වර්ණනා කරත්, යනුයි.

3 "සියලුම වාදයෝ සත්‍ය හෝ වන්නාහු නම්" යනු සියලුම වාදයෝ සත්‍යය වූවාහු නම් නොවැසුනාහු වූවාහු නම් අවිපරීතවූවාහු නම් යනුයි.

4 "ඔවුන්ගේ ශුද්ධියද ඔවුන් තුළමය" යනු ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ ශුද්ධිය විශුද්ධිය පාරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය ඔවුන් තුළ යනුයි.

## 13 - 13

1 "බ්‍රාහ්මණයාට අනුන් විසින් මග පෙන්වීමක් නැත" යන්නෙහි 'නැත' යනු ප්‍රතික්ෂෙපයයි. බ්‍රාහ්මණ යනු ධර්ම සතක් දුරු කිරීමෙන් බ්‍රාහ්මණ නම්. (3-4) 1 එනම් යන තැන සිට යෙදිය යුතුයි.) අසිතයයිද තාදීයයිද කියනු ලැබේ "බ්‍රාහ්මණයාට රහතුන් වහන්සේට අනුන් මග පෙන්වීමක් නැත" යනු බ්‍රාහ්මණයාට පරනෙය්‍යතාවයයි කියන කාගේවත් මගපෙන්වීමක් නැත (ii) බ්‍රාහ්මණ තෙමේ අනුන් පමුණුවන්නෙක් නොවේ. බ්‍රාහ්මණයා අනුන්ගේ පිහිට සොයන්නෙක් නොවේ අනුන්ට අයත් දේ ගන්නෙක් නොවේ. නොමුලා සිතින් මනා නුවණින් සිහිය පිහිටුවා දනියි බලයි සියලු සංස්කාරයෝ අනිත්‍යයයි (iii) බ්‍රාහ්මණයාට අනුන් දැක්වීමක් නැත (මෙහි (ii) යොදාගත යුතුයි.) සියලු සංස්කාරයෝ දුක්යයි බ්‍රාහ්මණයාට අනුන් දැන්වීමක් නැත. සියලු ධර්මයෝ අනාත්මයයි බ්‍රාහ්මණයාට අනුන් දැන්වීමක් නැත. හේතුවකින් උපන් යම්කිසි ධර්ම ඇත්නම් ඒ සියල්ල නැතිවීම පිණිස පවත්නේයයි බ්‍රාහ්මණයාට අනුන් දැන්වීමක් නැත. බ්‍රාහ්මණතෙමේ අනුන් පමුණුවන්නෙක් නොවේ. බ්‍රාහ්මණයා අනුන්ගේ පිහිට සොයන්නෙක් නොවේ. අනුන්ට අයත් දේ දන්නෙක් නොවේ. නුමුලා සිතින් මනානුවණින් සිහිය පිහිටුවා දනියි බලයි.

2 "දෙසැට දෘෂ්ටි ධර්මයන් විනිශ්චයකොට දැන ධර්මය මනාව ගන්නාලදී" යන්නෙහි ධර්මයන්හි යනු දෙසැට දෘෂ්ටි ගැනීම්වල විනිශ්චය දැන යනු නිශ්චයකොට විනිශ්චයකොට සොයා සමකොට බලා තීරණයකොට ප්‍රකටකොට සීමාකොට ගැනීමක් කොටස්කොට ගැනීමක් උතුම්කොට ගැනීමක් උසස්කොට ගැනීමක් කැටිකොට ගැනීමක් මෙය සත්‍යය වූපරිදිය අවිපරීතයයි ගන්නා ලද්දක් ස්පර්ශ කරණ ලද්දක් බැසගන්නා ලද්දක් ඇලෙන ලද්දක් නැත. විද්‍යමාන නොවෙයි නොලැබෙයි ප්‍රහීණය මුලින් සින්දේය ශාන්තය සන්සිඳුනේය ඉපදීමට අයොග්‍යය ඥානය නැමති ගින්නෙන් දැවුනේය යනුයි. එහෙයින් විවාදයෝ ඉක්මුනෝය යන්නෙහි එහෙයින් යනු ඒ කාරණයෙන් ඒ හේතුවෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් දෘෂ්ටි කලහයෝ දෘෂ්ටි විවාදයෝ දෘෂ්ටි කොලාහලයෝ ඉක්මවුනේය, වෙන් කෙරුණෝය යනුයි.

3 "අනික් ධර්මයක් ශ්‍රෙෂ්ඨ වශයෙන් නොදකියි" යනු අනික් ශස්තෘවරයකු ධර්මය ගණය දෘෂ්ටිය ප්‍රතිපදාවය මාර්ගයක් සතිපට්ඨානයන් හැර සම්‍යක් ප්‍රධානයන් හැර ඍද්ධි පාදයන් හැර ඉන්ද්‍රියයන් හැර බායන් හැර බොධ්‍යංගයන් හැර ආය්‍ර්‍යඅෂ්ටාංගික මාර්ගය හැර අග්‍රවූ ශ්‍රෙෂ්ඨවූ ප්‍රමුඛවූ උත්තමවූ ප්‍රවරවූ ධර්මයක් නොදකියි නොලබයි යනුයි.

## 13 - 14

1 "එසේම මෙය දනිමි දකිමි" යන්නෙහි දනිමි යනු අනුන්ගේ සිත් දැනීමේ නුවණින් දනිමි. පෙර විසූ කඳ පිළිවෙල දැනීමේ නුවණින් හෝ දනිමි, දකිමි යනු මසැසින් හෝ දකිමි. දිවැසින් හෝ දකිමි එසේම එය යනු එය ඇත්තය වූ පරිදිය, අවිපරීතය යනුයි.

2 "ඇතැම් කෙනෙක් දෘෂ්ටියෙන් ශුද්ධිය බලාපොරොත්තු වෙත්." යනු ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ දෘෂ්ටියෙන් ශුද්ධිය, විශුද්ධිය, පාරිශුද්ධිය, මුක්තිය, විමුක්තිය, පරිමුක්තිය, බලාපොරොත්තු වෙත්. ලොකය ශාස්වතය, සත්වයා මරණින් මතු නොමවෙයි. නොම නොවෙයි. මෙයම සත්‍යය අනික්

අදහස් හිස්යයි දෘෂ්ටියෙන් ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ශුද්ධිය, විශුද්ධිය, පාරිශුද්ධිය, මුක්තිය විමුක්තිය පරිමුක්තිය, බලාපොරොත්තුවෙත් යනුයි.

3 "ඔහුගේ ඒ දර්ශනයෙන් කුමක්ද," යනු ඔහුගේ ඒ දර්ශනයෙන් කුමක් කරණ ලද්දේද, දුක්ඛයාගේ දැනීම නැත්තේය. දුක්ඛ සමුදයාගේ ප්‍රහාණය නැත්තේය. මාර්ග භාවනාව නැත්තේය. ඵල ප්‍රත්‍යක්ෂ කිරීම නැත්තේය. රාගයාගේ සමුච්ඡෙද ප්‍රහාණය නැත්තේය. ද්වෙෂයාගේ සමුච්ඡෙද ප්‍රහාණය නැත්තේය. මොහයාගේ සමුච්ඡෙද ප්‍රහාණය නැත්තේය. ක්ලේශයන්ගේ සමුච්ඡෙද ප්‍රහාණය නැත්තේය. සංසාර වෘත්තයාගේ සිඳීම නැත්තේය, යනුයි.

4 "ශුද්ධිය ඉක්මවා අනිකක් කියත්" යනු තීර්ථකයෝ ශුද්ධි මාර්ගය, විශුද්ධි මාර්ගය, පිරිසිදු මාර්ගය ඉක්මවා සතිපට්ඨානයන්ගෙන් හැර සම්‍යක් ප්‍රධානයන්ගෙන් හැර ඍද්ධි පාදයන්ගෙන් හැර ඉන්ද්‍රියයන්ගෙන් හැර බලයන්ගෙන් හැර බොධ්‍යංගයන්ගෙන් හැර ආර්‍ය්‍යාෂ්ටාංගික මාර්ගයෙන් හැර ශුද්ධිය, විශුද්ධිය පාරිශුද්ධිය මුක්තිය, විමුක්තිය, පරිමුක්තිය කියත්.. ව්‍යවහාර කරත්. මෙසේද ඉක්මවා අනිකකින් ශුද්ධි කියත්, යනුයි යලිදු හෝ බුදුවරුද, බුද්ධ ශ්‍රාවකයෝද පසේ බුදුවරුද ඒ තීර්ථකයන්ගේ අශුද්ධි මාර්ගය, අපිරිසිදු මාර්ගය, ඉක්මවා සතර සතිපට්ඨානයන්ගෙන් සතර සම්‍යක් ප්‍රධානයන්ගෙන්, සතර ඍද්ධි පාදයන්ගෙන්, පඤ්චෙන්ද්‍රියයන්ගෙන් පඤ්ච බලයන්ගෙන් සප්ත බොධ්‍යංගයන්ගෙන් ආර්‍ය්‍යාෂ්ටාංගික මාර්ගයෙන් ශුද්ධිය විශුද්ධිය පාරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය කියත්. ප්‍රකාශ කරත්. ව්‍යවහාර කරත්, යනුයි.

## 13 - 15

1 "දකින්නාවූ මිනිසා නාම රූපය දකියි" යනු දකින්නාවූ මිනිසා අනුන්ගේ සිත් දැනීමේ නුවණින් හෝ දකින්නේ පෙර විසූ කඳ පිළිවෙල සිහි කිරීමේ නුවණින් හෝ දකින්නේ මසැසින් හෝ දකින්නේ දිවැසින් හෝ දකින්නේ නිත්‍ය වශයෙන් සුඛ

වශයෙන් ආත්ම වශයෙන් නාම රූපයම දකියි. ඒ ධර්මයන්ගේ ඇතිවීම හෝ අස්තංගමය හෝ ආශ්වාදය හෝ ආදීනවය හෝ නික්මීම හෝ නොදකියි.

2 "දැක ඒවාම දැනගනියි," යන්නෙහි අනුන්ගේ සිත් දැනීමේ නුවණින් දැක හෝ පෙරවිසූ කඳ පිළිවෙල දන්නා නුවණින් හෝ දැක මසැසින් හෝ දැක, දිවැසින් හෝ දැක, නාම රූපයම දැක නිත්‍ය වශයෙන් සුඛ වශයෙන් ආත්ම වශයෙන් දකියි. ඒ ධර්මයන්ගේ ඇතිවීම හෝ අස්තංගමය හෝ ආශ්වාදය හෝ ආදීනවය හෝ නික්මීම හෝ දනියි. "කාමය ස්වල්ප වශයෙන් හෝ බොහෝ වශයෙන් බලන්නේ" යනු කාමය බහුල වශයෙන් හෝ බලන්නේ ස්වල්පවූ නාම රූපය හෝ නිත්‍ය වශයෙන් සුඛ වශයෙන් ආත්ම වශයෙන් බලයි, යනුයි.

3 "එයින් ශුද්ධිය දක්ෂයෝ නොකියත්" යන්නෙහි දක්ෂයෝ යනු යම් ඒ ස්කන්ධ දක්ෂයෝ ධාතු දක්ෂයෝ ආයතන දක්ෂයෝ පටිච්ච සමුප්පාද දක්ෂයෝ සතිපට්ඨාන දක්ෂයෝ සම්‍යක් ප්‍රධාන දක්ෂයෝ ඍද්ධිපාද දක්ෂයෝ ඉන්ද්‍රිය දක්ෂයෝ බල දක්ෂයෝ බොධ්‍යංග දක්ෂයෝ මාර්ග දක්ෂයෝ ඵල දක්ෂයෝ නිර්වාණ දක්ෂයෝ යනුයි. ඒ දක්ෂයෝ අනුන්ගේ සිත් දැනීමේ නුවණින් හෝ පෙරවිසූ කඳ පිළිවෙල දැකීමේ නුවණින් හෝ මසැසින් හෝ දිවැසින් හෝ නාම රූප දැකීමෙන් ශුද්ධිය විශුද්ධිය පාරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය නොකියත්, ප්‍රකාශ නොකරත්, ව්‍යවහාර නොකරත්, යනුයි.

## 13 - 16

4 "මෙයම සත්‍යයයි" සිතූ වැරදි ධර්මය ගත් තැනැත්තේ පහසුවෙන් හික්මවීමට නොහැකිය. මේ ලොකය ශාස්වතය, මෙයම සත්‍යය අනික් ධර්ම හිස්යයි මෙයම සත්‍යයයි ධර්මය ගත් තැනැත්තේ කියයි. ලොකය අශාස්වතය ( (3-6) 1 (ii) ඡේදය යෙදිය යුතුයි.) සත්වයා මරණින් මතු නොමවෙයි. නොම නොවෙයි. මෙය සත්‍යය අනික් ධර්ම හිස්යයි මෙයම සත්‍යය යයි ධර්ම ගත් තැනැත්තේ කියයි. පහසුවෙන් හික්මවිය

නොහැකිය යනු මෙයම සත්‍යයයයි ධර්ම ගත් තැනැත්තේ හික්මවීමට දුෂ්කරය, පැනවීම දුෂ්කරය, බැලීම දුෂ්කරය, පැහැදවීම දුෂ්කරය, යනුයි.

**5** "තබනලද දෘෂ්ටිය ඉදිරිපත් කරමින්" යනු පිළියෙල කළ තැබූ දෘෂ්ටිය ඉදිරිපත් කරමින් හැසිරෙයි. දෘෂ්ටිය ද්වජයක් කොට දෘෂ්ටිය කොඩියක් මෙන් පෙරටුකොට දෘෂ්ටිය අධිපති කොට දෘෂ්ටියන් පිරිවරා හැසිරෙයි. යනුයි

**6** "යමක ඇළුනේ එහි යහපත කියන්නේ" යන්නෙහි යමක ඇළුනේ යනු යම් ශාස්තෘවරයකු ධර්මයක ගණයා කෙරෙහි ප්‍රතිපදාවක මාර්ගයක ඇළුනේ යනුයි. "එහි" යනු ස්වකීය දෘෂ්ටියෙහි, ස්වකීය කැමැත්තෙහි ස්වකීය රුචියෙහි, ස්වකීය ලබ්ධියෙහි, යහපත කියන්නේ යනු යහපත් වාද ඇති පිරිසිදු වාද ඇත්තේ, පණ්ඩිත වාද ඇත්තේ, ස්ථිර වාද ඇත්තේ, න්‍යාය වාද ඇත්තේ හේතු වාද ඇත්තේ ලක්ෂණ වාද ඇත්තේ කාරණ වාද ඇත්තේ ස්ථාන වාද ඇත්තේ යනුයි.

**7** "හෙතෙම එහි ශුද්ධිය වාද ඇත්තේ එසේ දක්නේ" යනු ශුද්ධ වාද ඇත්තේ විශුද්ධ වාද ඇත්තේ ඉතා පිරිසිදු වාද ඇත්තේ යනුයි. යලිදු හෝ ශුද්ධිය දක්නේ විශුද්ධිය දක්නේ පාරිශුද්ධිය දක්නේ ඉතා පිරිසිදු බව දක්නේනුයි ශුද්ධි වාද ඇත්තේ නම්. "එහි" යනු ස්වකීය දෘෂ්ටියෙහි ස්වකීය කැමැත්තෙහි, ස්වකීය රුචියෙහි, ස්වකීය ලබ්ධියෙහි සත්‍යයයි වූ පරිදියයි ඇති පරිදියයි අවිපරීතයයි දැක්කේය. බැලුවේය. අවබොධ කළේය. යනුයි.

## 13 - 17

1 "බ්‍රාහ්මණතෙම විමසීමෙන් (දැන) මිථ්‍යා කල්පනා වලට නොපැමිණෙයි" යන්නෙහි "නො" යනු ප්‍රතික්ෂෙප යයි 'බ්‍රාහ්මණ' යනු ධර්ම සතක් බැහැර කළ බැවින් බ්‍රාහ්මණ නම්. (3-4) 1 ඡෙදයේ එනම්:- යන තැන සිට යෙදිය යුතුයි) ඒ බ්‍රාහ්මණතෙමේ තෘෂ්ණා නැත්තේ කෙළෙස් දුරු කෙළේ යයි කියනු ලැබේ. "මිථ්‍යාකල්පනා" යන්නෙහි සුදුසුකම් දෙකකි. තෘෂ්ණාවට සුදුසුකමද දෘෂ්ටියට සුදුසුකමද යනුයි. (2-6) 1 (ii) (iii) ඡෙද මමත්වය වෙනුවට 'සුදුසුකමය'යි වෙනස් කර යෙදිය

යුතුයි.) විමසීම යනු ඥානයට කියයි. යම් ප්‍රඥාවක් දැනීම ඇති කරවයිද ( (2-4) 12 (ii) ඡේදය යෙදිය යුතුයි) අමොහය ධම්ම විචය සම්‍යක් දෘෂ්ටියයි කියයි.

2 "බ්‍රාහ්මණතෙම විමසීමෙන් (මිථ්‍යා) කල්පනා වලට නොපැමිණෙයි" යනු බ්‍රාහ්මණතෙම නුවණින් දැන සමකොට බලා තීරණයකොට ප්‍රකටකොට සියලු සංස්කාරයෝ අනිත්‍යයයි සියලු සංස්කාරයෝ දුක්යයි සියලු ධර්මයෝ අනාත්මයයි යම්කිසි හේතුවකින් හටගත් ධර්මයක් ඇද්ද ඒ සියල්ල නැතිවීම පිණිස පවත්නේයයි නුවණින් දැන සමකොට බලා තීරණයකොට ප්‍රකටකොට තෘෂ්ණ සුදුසු බවට හෝ දෘෂ්ටි සුදුසු බවට හෝ නොපැමිණෙයි. නොගනියි, පරාමර්ශ නොකරයි, ඇතුල් නොවෙයි යනුයි.

3 "දෘෂ්ටිය සාරවශයෙන් නොගන්නේ ඥානයෙන් බන්ධනය නොකරන්නේ වෙයි" යනු ඔහුගේ දෙසැට දෘෂ්ටි ගැනීම් දුරුවූයේය. මුලින් සින්දේය. සංසිඳුනේය. ඉපදීමට අයොග්‍ය විය. ඥානය නමැති ගින්නෙන් දැවුනේය යනුයි. හෙතෙම දෘෂ්ටියෙන් නොයයි නොපමුණුවයි පා නොවෙයි. රැස් නොකරයි. ඒ දෘෂ්ටිය ගැනීම සාර වශයෙන් නොගනියි. ආපසු නොගනියි එබැවින් දෘෂ්ටිය සාරවශයෙන් නොගන්නෙනමි."ඥානයෙන් බන්ධනය නොකරන්නේ වෙයි" යනු අෂ්ට සමාපත්ති ඥානයෙන් හෝ පඤ්චාභිඥා ඥානයෙන් හෝ මිථ්‍යා ඥානයෙන් හෝ තෘෂ්ණා බන්ධනය හෝ දෘෂ්ටි බන්ධනය හෝ නොකරයි නූපදවයි යනුයි.

4 "හෙතෙම පෘථග්ජනයන් විසින් ඇතිකරණ ලද සම්මුතීහු දැන" යන්නෙහි දැන යනු දැන සමකොට බලා තීරණයකොට ප්‍රකටකොට සියලු සංස්කාරයෝ අනිත්‍යයයි සියලු සංස්කාරයෝ දුක්ඛයයි, සියලු ධර්මයෝ අනාත්මයයි යම්කිසි හේතුවකින් උපන් ධර්මයක් ඇත්නම් ඒ සියල්ල නැතිවීමට පැමිණෙත්යයි දැන සමකොටබලා තීරණයකොට හෙතෙම දැන යනුයි. "සම්මුතිහු" යනු දෙසැට දෘෂ්ටි ගැනීම් ඇති සම්මුතිහුයි පෘථග්ජනයන් විසින් ඇතිකරණ ලද යනු පෘථග්ජනයන් විසින්

උපදවන ලද ඒ සම්මුතීහුයි බොහෝ ජනයන් විසින් උපදවන ලද ඒ සම්මුතිහුයි.

5 "අන්‍යයෝ ගනිත්, රහතුන්වහන්සේ මධ්‍යස්ථව බලයි" යනු අන්‍යයෝ තෘෂ්ණා වශයෙන් හෝ දෘෂ්ටි වශයෙන් හෝ ගනිත්, පරාමර්ශ කරත්, ඇතුළු වෙත්, රහතුන් වහන්සේ මධ්‍යස්ථව බලයි. නොගනියි පරාමර්ශ නොකරයි යනුයි.

## 13 - 18

1 "මේ ලොකයෙහි මුනිතෙම ගැටළු බැහැරකොට" යන්නෙහි ගැටළු නම් සතර ගැටළුයි "අභිධ්‍යා" කාය ග්‍රන්ථය "ව්‍යාපාද" කාය ග්‍රන්ථය, "සීලබ්බත පරාමාස" කාය ග්‍රන්ථය මෙයම සත්‍යයයයි බැස ගැන්මේ කාය ග්‍රන්ථය යනුයි. තමන්ගේ දෘෂ්ටියෙහි ඇලීම ඇති විෂම ලොභය නම් කාය ග්‍රන්ථය වේ. අන්‍ය වාදයන්හි වෛරයවූ නොසතුටුවූ ව්‍යාපාද නම් කාය ග්‍රන්ථය වේ. තමන්ගේ සීලය හෝ ව්‍රතය හෝ සීලව්‍රත දෙකම හෝ පරාමර්ශ කරයි. ඒ සීලබ්බත පරාමාශ කාය ග්‍රන්ථය වේ. තමන්ගේ දෘෂ්ටිය මෙයම සත්‍ය යයි දැඩිව බැස ගැනීම මෙය සත්‍යයයි බැස ගැන්මේ කාය ග්‍රන්ථයයි "බැහැරකොට" යනු ග්‍රන්ථයන් දුරුකොට අත්හැර යනුයි. යලිදු හෝ ගැටගසන ලද බඳින ලද එකට එකතු කරණ ලද බන්ධනයන් තලාහැර දුරුකොට යනුයි. යම්සේ මිනිසුන් උසුලායන වාහනයක් හෝ රථයක් හෝ කරත්තයක් හෝ අශ්වවාහනයක් හෝ කඩා බිඳ දමයිද එපරිද්දෙන්ම ග්‍රන්ථයන් දුරුකොට ලිහා හැර යනුයි. යලිදු හෝ ගැටගැසූ බැඳුන ඇළුන ලැගුන බන්ධනයන් තලාහැර ලිහා හැර යනුයි. "මුනි" යනු මොනයයි ඥානයට කියයි. ( (2-8) (10) මුනි යන තැන සිට 14 ඡේදය අවසානය දක්වා යොදාගත යුතුයි.) තෘෂ්ණා ජාලය ඉක්මවා සිටියේද හෙතෙම මුනිනමි. "මෙහි" යනු මේ දෘෂ්ටියෙහි මේ කැමැත්තෙහි මේ රුචියෙහි මේ මනුෂ්‍ය ලොකයෙහි යනුයි.

2 "විවාදය ඇතිවූ කල්හි කොටස්කොට හැසිරෙන්නේ නොවේ" යනු විවාදය ඇතිවූ කල්හි හටගත් කල්හි පහලවූ කල්හි ඡන්දයෙන් අගතියට යන්නවුන් අතරෙහි ද්වෙෂයෙන්

අගතියට යන්නවුන් අතරෙහි භයෙන් අගතියට යන්නවුන් අතරෙහි මොහයෙන් අගතියට යන්නවුන් අතරෙහි ඡන්දයෙන් අගතියට නොයයි. ද්වෙෂයෙන් අගතියට නොයයි. මොහයෙන් අගතියට නොයයි. මාන වශයෙන් නොයයි, දෘෂ්ටිවශයෙන් නොයයි සිතේ නොසන්සුන්කම වශයෙන් නොයයි. විචිකිච්ඡා වශයෙන් නොයයි. අනුසය වශයෙන් නොයයි. වර්ගවූ ධර්මයන්ගෙන් නොයයි, පා නොවෙයි. එක්තැන් නොකරයි. යනුයි.

3 "අශාන්තවූවන් අතරෙහි ශාන්තවූ හෙතෙම උපෙක්ෂා ඇත්තේවේ" යන්නෙහි "ශාන්තවූ" යනු රාගය සංසිඳුන බැවින් ශාන්තනමි. ද්වෙෂය සංසිඳුන බැවින් ශාන්ත නමි මොහය සන්සිඳුන බැවින් ශාන්ත නමි. ( (3-4) (i) ඡෙදය යොදාගත යුතුයි) සියලු අකුශල රැස් කිරීම් වලින් ශාන්තවූ බැවින් සන්සිඳුන බැවින්, නිවාදැමූ බැවින් පහවූ බැවින් ශාන්තවූයේ නිවුනේනුයි ශාන්ත නමි. "ශාන්ත නොවූවන් අතරෙහි යනු ශාන්ත නොවූවන් අතරෙහි උපශාන්ත නොවූවන් අතරෙහි නොනිවා දැමූවන් අතරෙහි නොසන් සිඳුනවුන් අතරෙහි යනුයි.

4 "හෙතෙම උපෙක්ෂා ඇත්තේවේ" යනු රහතුන් වහන්සේ අංග සයක් ඇති උපෙක්ෂාවෙන් යුක්ත සේක. ඇසින් රූපයක් දැක (ii) සන්තොෂ සිත් ඇත්තේ නොවෙයි. අසන්තොෂ සිත් ඇත්තේද නොවෙයි. සිහි ඇත්තේ මනා නුවණින් යුක්තවූයේ වාසය කරයි. (iii) කණින් ශබ්දයක් අසා (මෙහි (ii) යොදාගත යුතුයි) මනාව දැමුනේ සිත දියුණු කළේ කාලය බලාපොරොත්තු වෙයි.

5 "අන්‍යයෝ තෘෂ්ණා දෘෂ්ටිගනිත් උන්වහන්සේ නොගන්නාසේක" යනු අන්‍යයෝ තෘෂ්ණා වශයෙන් දෘෂ්ටි වශයෙන් ගනිද්දී පරාමර්ශ කරද්දී ඇතුළු වෙද්දී රහතුන් වහන්සේ මධ්‍යස්ථ වෙයි. නොගනියි. පරාමර්ශ නොකරයි. ඇතුල් නොවෙයි, යනුයි.

## 13 - 19

1 "පෙරවූ පව් දුරුකොට, දැන් නොකරන්නේ" යන්නෙහි අතීත රූප, වෙදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණයෝ පෙරවූ

පච් යයි කියත්, අතීත සංස්කාරයන් නිසා යම් කෙලෙස් උපදින්නාහුද ඒ කෙලෙස්හැර දුරුකොට පරිත්‍යාග කොට නූපදනා බවට පමුණුවා යනුයි දැන් පවත්නා කල රූප වෙදනා සංඥා, සංස්කාර විඥ්ඥානයෝ කියත්. පවත්නාකල සංස්කාරයන් නිසා කැමැත්ත නොකරන්නේ ප්‍රේමය නොකරන්නේ ඇලීම නොකරන්නේ නූපදවන්නේ ඇතිනොකරන්නේ යනුයි.

2 "ඡන්දයෙන් අගතියට නොයන්නේ බැසගත් මිථ්‍යා වාද ඇත්තේ නොවේ" යනු ඡන්දයෙන් අගතියට නොයයි, ද්වෙෂයෙන් අගතියට නොයයි, මොහයෙන් අගතියට නොයයි, භයෙන් අගතියට නොයයි, රාග වශයෙන් නොයයි. ද්වෙෂ වශයෙන් නොයයි. මොහ වශයෙන් නොයයි. මාන වශයෙන් නොයයි. දෘෂ්ටි වශයෙන් නොයයි. සිතේ නොසන්සුන් බව වශයෙන් නොයයි, විචිකිච්ඡා වශයෙන් නොයයි. අනුසය (අප්‍රකට කෙලෙස්) වශයෙන් නොයයි. වර්ගවූ ධර්මයන්ගෙන් නොයයි. නොපමුණුවයි, පා නොවෙයි, එකතු නොකරයි, යනුයි. "බැසගත් මිථ්‍යාවාද ඇත්තේ නොවේ" යනු ලොකය ශාස්වතය මෙයම සත්‍යය අනික් වාද හිස්යයි ශාස්වතවාදී නොවූයේ ( (3-6) (ii) ඡෙදය යෙදිය යුතුයි) සත්වයා මරණින් මතු නොමවෙයි, නොම නොවෙයි, මෙයම සත්‍යය අනික් වාද හිස්යයි බැසගත් වාද ඇත්තේ නොවූයේ යනුයි.

3 "ඒ පණ්ඩිත තෙම දෘෂ්ටිගැණීම් වලින් වෙන්වූයේ" යනු ඔහුගේ දෙසැට දෘෂ්ටි ගැණීම් ප්‍රහීන වූයේය, මුලින් සිඳුනේය, ශාන්තය, ඉපදීමට අයොග්‍යවූයේය, ඥානය නමැති ගින්නෙන් දැවුනේය, හෙතෙම දෘෂ්ටිගැණීම් වලින් වෙන් වූයේ සීමා නොකරණ ලද සිතින් වාසය කරයි "ඒ පණ්ඩිත තෙම" යනු නුවණැත්තේ බුද්ධි ඇත්තේ ඥාන ඇත්තේ යනුයි.

4 "තමාට නොගරහන්නේ ලොකයෙහි නොඇලෙයි' යන්නෙහි ලෙපයෝ (ඇලීම්) නම් ඇලීම් දෙකකි. තෘෂ්ණාවෙහි ඇලීම හා දෘෂ්ටියෙහි ඇලීමද යනුයි. ( (2-6) 1 (ii) (iii) ඡෙද "මමත්වය" වෙනුවට "ඇලීම" යයි, වෙනස්කර යොදාගත යුතුයි)

ඔහුගේ තෘෂ්ණා ඇලීම ප්‍රහීණය, දෘෂ්ටි ඇලීම සංසිඳුනේය තෘෂ්ණා ඇලීම ප්‍රහීණවූ බැවින් දෘෂ්ටි ඇලීම සංසිඳුන බැවින් නොඇලුනාවූ හෙතෙම අපාය ලොකයෙහි නොඇලෙයි. මනුෂ්‍ය ලොකයෙහි නොඇලෙයි. දිව්‍ය ලොකයෙහි නො ඇලෙයි ස්කන්ධ ලොකයෙහි නොඇලෙයි ධාතු ලොකයෙහි නොඇලෙයි. ආයතන ලොකයෙහි නොඇලෙයි. නොඇළුනේ නික්මුනේ, අත්හළේ වෙන්වූයේ සීමා නොකරණ ලද සිතින් වාසය කරයි.

6 "තමාට නොගරහන්නේ" යනු කරුණු දෙකකින් තමාට ගරහයි. කරණ ලද බැවින්ද නොකරණ ලද බැවින්ද යනුයි. ( (2-7) (7) යලිදු හෝ යන තැනට පමණක් යොදා ගත යුතුයි.) යලිදු හෝ ශීලයන් නොපිරුයේයයි තමාට ගරහයි. ඉන්ද්‍රියයන්හි නොවසන ලද දොරවල් ඇත්තේයයි භොජනයෙහි ප්‍රමාණය නොදන්නේයයි, නිදි දුරුකිරීමෙහි නොයෙදුනේයයි, සිහි නුවණින් යුක්ත නුවූයේයයි, මවිසින් සතර සතිපට්ඨාන නොවඩන ලද්දේයයි, මවිසින් සතර සම්‍යක් ප්‍රධාන නොවඩන ලද්දේයයි, මවිසින් සතර ඍද්ධිපාද නොවඩන ලද්දේයයි මවිසින් පඤ්චෙන්ද්‍රියයන් නොවඩන ලද්දේයයි, මවිසින් පඤ්චබලයන් නොවඩන ලද්දේයයි, මවිසින් සප්ත බොධ්‍යංගයන් නොවඩන ලද්දේයයි මවිසින් ආර්‍ය්‍යඅෂ්ටාංගික මාර්ගය නොවඩන ලද්දේයයි, මවිසින් දුක්ඛ සත්‍යය මනාව නොදන්නා ලද්දේයයි, මවිසින් දුක් ඇතිවීමේ හේතුව ප්‍රහීණ නොකළේයයි, මවිසින් මාර්ගය නොවඩන ලද්දේයයි නිර්වාණය මවිසින් ප්‍රත්‍යක්ෂ නොකරණ ලද්දේයයි තමාට නින්දා කරයි මෙසේ කරණ ලද බැවින්ද නොකරණ ලද බැවින්ද තමාට ගරහයි මෙසේ තමාට නින්දා කරන්නාවූ මේ කර්මයන් නොකරනු ලබන්නේ නූපදවනු ලබන්නේ ඇතිනොකරවනු ලබන්නේ නුයි තමාට නින්දා කරන්නේ නොවේ.

## 13 - 20

1 "හෙතෙම යම්කිසි ඇසූ දුටු සිතූ දෙය වශයෙන් ගත් සියලු ධර්මයන්හි කෙලෙස් සේනා බැහැර කළේ" යන්නෙහි

සේනායයි මාර සේනාවට කියයි, කාය දුශ්චරිතය මාරසේනාවකි, වාග් දුශ්චරිතය මාර සේනාවකි, මනො දුශ්චරිතය මාරසේනාවකි. රාගය, ද්වෙෂය, මොහය, ක්‍රොධය, බද්ධ වෛරය, ගුණමකුකම, උතුමන් හා සමව සිතීම, ඊර්ෂ්‍යාව, මසුරුකම, රැවටිල්ල, කෛරාටිකකම, තදගතිය, එකට එක කිරීම, මානය අතිමානය මදය ප්‍රමාදය සියලු කෙලෙස්, සියලු දුශ්චරිත සියලු දාහ සියලු පරිදාහ සියලු තැවීම් සියලු අකුසල් රැස්කිරීම් මාරසේනාවෝ වෙති.

2 "මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. කාමයෝ ඔබගේ පළමු සේනාවයි, දෙවෙනි සේනාව අරති (කුශල ධර්මයන්හි නොඇලීම) යයි කියයි. බඩගින්න හා පිපාසය තුන්වෙනි සේනාවයයි කියයි. තෘෂ්ණාව සතරවන සේනාවයයි කියයි. කයේ හා සිතේ මැලිකම පස්වන සේනාව යයි කියයි. භයවන සුළු ගතිය සවැනි සේනාවයයි කියයි. තාගේ සත්වන සේනාව විචිකිච්ඡාවයයි කියයි. ගුණමකුකම හා තද ගතිය තාගේ අටවන සේනාවයි. ලාභය ස්තුතිය, සත් කාරය, හා වැරදිසේ ලත් ප්‍රසිද්ධියක් ඇද්ද, යමෙක් තමා උසස් කොට අනුන්ට අවමන් කෙරේද, මාරය පාපයට පමුණුවන්නාවූ තාගේ මේ සේනාවෝ වෙති. නිවටයා (ඒ මාරයා) නොදිනයි. දිනුවේම සැපත ලබයි යනුයි.

යම් තැනක පටන් සතර ආර්‍ය්‍ය මාර්ගයන්ගෙන් සියලු මාර සේනාවෝද සියලු විරුද්ධ සේනාවවූ කෙලෙස්ද දිනන ලදී. පරදවන ලදී. බිඳින ලදී පිටුපාන ලදී. හෙතෙම කෙලෙස් සේනා දුරුකරණ ලද්දේයයි කියයි. හෙතෙම දුටු දෙයෙහි කෙලෙස් සේනාව දුරුකළේ, ඇසූ දෙයෙහි කෙලෙස් සේනාව දුරුකළේ වෙයි. ඇසූ දෙයෙහි, දුටු දෙයෙහි මුතයෙහි (ඉන්ද්‍රිය තුනකින් දැනගත් දෙයෙහි) කෙලෙස් සේනාව දුරුකළේය යනුයි.

3 "ඒ මුනිතෙම තැබූ බර ඇත්තේ, විශෙෂයෙන් මිදුනේ වෙයි." යන්නෙහි බර යනු, බර තුනකි එනම් ස්කනධ භාර, ක්ලේශභාර, අභිසංස්කාර භාර යනුයි. ස්කන්ධ භාරය කවරේද? ප්‍රතිසන්ධියෙහි රූපය, වෙදනාව, සංඥාව, සංස්කාරය,

විඤ්ඤාණය යනුයි, මේ ස්කන්ධ භාරයයි, ක්ලේශ භාරය කවරේද? රාගය, ද්වෙෂය, මොහය (6-10) 1 ඡේදයේ මොහය යන තැන සිට සියලු තැවීම් යන තැනට යොදාගත යුතුයි.)

සියලු අකුශල රැස්කිරීම් යනුයි. මේ ක්ලෙශ භාරයයි. අභිසංස්කාර භාරය කවරේද? පුණ්‍යාභිසංස්කාරය අපුණ්‍යාභි සංස්කාරය අනෙඤ්ජාභිසංස්කාරයයි. මේ අභිසංස්කාර භාරයයි. යම් තැනකින් ස්කන්ධ භාරයද, ක්ලේශ භාරයද, අභිසංස්කාර භාරයද ප්‍රහීණවූවාහුද, මුලින් සිඳිනලද තල් ගසක්මෙන් කරණලද්දේද, අමරණත්වයට පමුණුවන ලද්දේද, නැවත නූපදනාබවට පමුණුවන ලද්දේවේද, හෙතෙම තැබූ බර ඇත්තේයයි කියයි මනාව තැබූ බර ඇත්තේ සංසිඳුන බර ඇත්තේයයි කියයි.

4 "මුනි" යනු මොනයයි ඥානයට කියයි. යම් ප්‍රඥාවක් දැනීමෙන් යුක්තද විචය, පවිචය, සල්ලක්ඛන, උපලක්ඛන, පච්චුපලක්ඛන, පණ්ඩිච්ච, කොසල්ල, නෙපුඤ්ඤ, වෙදව්‍ය, චින්තා, උපපරික්ඛා, භූරි, මෙධා, පරිණායිකා, විපස්සනා, සම්පජඤ්ඤ, පතොද, පඤ්ඤා, පඤ්ඤින්ද්‍රිය, පඤ්ඤාබල, පඤ්ඤා සත්ථ, පඤ්ඤාපාසාද, පඤ්ඤා ආලොක පඤ්ඤාඔභාස, පඤ්ඤා පජ්ජොත, පඤ්ඤාරතන, අමොහ, ධම්මවිචය, සම්මා දිට්ඨියයි කියද්ද ඒ ඥානයෙන් යුක්තවූයේ මුනිනම්. (2-8) 10 "නොමුලාවූයේ" යන තැන සිට 14 ඡේදය අවසානයට යොදගත යුතුයි.)

5 "වෙන්වූයේ" යනු මුනිහුගේ රාගයෙන් සිත මිදුනේය. වෙන්වූයේය. ද්වෙෂයෙන් සිත මිදුනේය. වෙන්වූයේය. මොහයෙන් සිත මිඳුනේය. වෙන්වූයේය. (6-10) (1) සිත මිදුනේය යන්න යොදා මොහය යන තැන සිට සියලු තැවීම් යන තැනට යොදාගත යුතුයි.) සියලු අකුසල් රැස්කිරීම්වලින් සිත මිදුනේය. වෙන්වූයේය. යනුයි.

6 "ඇති නොකරයි. නොඇලෙයි. බලාපොරොත්තු නොවෙයි. (මෙසේ භාග්‍යවතුන් වහන්සේ වදාළහ. යන්නෙහි ඇති කිරීම් යනු ඇතිකිරීම් දෙකකි (මෙහි (2-6) 1 (ii) (iii)

මමත්වය යනු ඇතිකිරීම යයි වෙනස්කොට යොදාගත යුතුයි.) ඔහුගේ තෘෂ්ණාව ඇතිකිරීම ප්‍රහීණය. දෘෂ්ටිය ඇතිකිරීම සංසිඳුනේය. තෘෂ්ණාව ඇතිකිරීම ප්‍රහීණවූ බැවින් දෘෂ්ටිය ඇති කිරීම සංසිඳුන බැවින් තෘෂ්ණාව ඇති කිරීම හෝ දෘෂ්ටිය ඇති කිරීම නොකරයි. නූපදවයි. පහළ නොකරයි.

7 "නොඇලුනේ" යනු සියලු බාල පෘථග්ජනයෝ ඇලෙති. කල්‍යාණ පෘථග්ජනයා පටන් සියලු ශෛක්ෂ්‍යයෝ නොපැමිණි දේට පැමිණීම පිණිස නොලත් අධිගමයන් ලැබීම පිණිස ප්‍රත්‍යක්ෂ නොකළ දේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස ඇලෙත්. රහතුන් වහන්සේ දුරුවූයේ වෙන්වූයේ නොඇලුනේ නික්මුනේ සීමා නොකළ සිතින් වාසය කරති.

8 "ප්‍රාර්ථනා නොකරයි" යනු තෘෂ්ණාව ප්‍රාර්ථනාව යයි කියයි. යම් ඇලීමක් ඇද්ද, විශෙෂයෙන් ඇලීමක් ඇද්ද, අභිධ්‍යාවක් ඇද්ද, ලොභයක් ඇද්ද අකුශල මූලයක් ඇද්ද එයයි. යමෙකුගේ මේ ප්‍රාර්ථනාවවූ තෘෂ්ණාව ප්‍රහීණද මුලින් සිඳුනේද, සන්සිඳුනේද, ඉපදීමට අයොග්‍යවූයේද ඥානය නමැති ගින්නෙන් දැවුනේද, හෙතෙම ප්‍රාර්ථනා නැත්තෙකැයි කියයි.

9 "භාග්‍යවතුන් වහන්සේ," යනු ගෞරව වචනයකි. (මෙහි (7-2) 1 රාගය බිඳ දැමූ බැවින් යන තැන සිට යොදා ගතයුතුයි.)

## තුවටක සූත්‍ර නිර්දෙශය

## 14 - 1

1 "සූර්‍ය්‍ය බන්ධුවූ බුදුරජාණන් වහන්සේගෙන් මෙය විචාරමි" යන්නෙහි (i) ප්‍රශ්න කිරීම් තුනකි. නොදුටු දේ ප්‍රකට කරගැනීම පිණිස ප්‍රශ්න කිරීම දුටු දේ සමකර බැලීම පිණිස, ප්‍රශ්න කිරීම; විමතිය සිඳ දැමීමට ප්‍රශ්න කිරීම යනුයි.

3 නොදුටු දේ ප්‍රකට කරගැන්මේ ප්‍රශ්න කිරීම කවරේද? නොදුටු සමාන නොකළ තීරණය නොකළ ප්‍රකට නොවූ පුරුදු නොකළ ලක්ෂණ ප්‍රකෘතියෙන් නොදත් දේ වේද, එය දැනීම

පිණිස දැකීම පිණිස සමාන කිරීම පිණිස තීරණය කිරීම පිණිස, පුරුදු කිරීම පිණිස, ප්‍රශ්න විචාරයි. මේ නොදුටු දෙය ප්‍රකට කර ගැණීම පිණිස ප්‍රශ්න කිරීමයි

3 "දුටුදේ සමකර බැලීමට ප්‍රශ්න කිරීම කවරේද? දුටු සමාන කළ තීරණය කළ ප්‍රකටවූ පුරුදු කළ ප්‍රකෘතියෙන් දත් විශෙෂ විභාගයක් ඇත්තේ ද එය අන්‍ය පණ්ඩිතයන් හා සංසන්දනය කර බැලීම පිණිස ප්‍රශ්න විචාරයි. මෙය දුටුදෙය සංසන්දනය කර බැලීම පිණිස ප්‍රශ්න කිරීමයි.

4 "විමති සිඳ දැමීමට ප්‍රශ්න කිරීම කවරේද" මෙසේ වේද, මෙසේ නොවේද කුමක් වේද, කෙසේ හෝ වේදැයි ප්‍රකෘතියෙන් සැකයට පැමිණියේ විමතියට පැමිණියේ අදහස් දෙකක් ගත්තේ වේද. හෙතෙම විමතිය සිඳීම පිණිස ප්‍රශ්න විචාරයි. මේ විමතිය සිඳීම පිණිස ප්‍රශ්න විචාරීමයි. මේ තුන් විචාරීම්වෙති අනිකුදු ප්‍රශ්න විචාරීම් තුනකි.

5 "මිනිස් විචාරීම් නොමිනිස් විචාරීම් නිර්මාණය කළවුන්ගේ විචාරීම්" යනුවෙනි, මිනිස් විචාරීම් කවරේද? මනුෂ්‍යයෝ භාග්‍යවත් බුදුරදුන් වෙත පැමිණ ප්‍රශ්න විචාරත්. භික්ෂුහු විචාරත්, භික්ෂූණීහු විචාරත්, උපාසකයෝ විචාරත්, උපාසිකාවෝ විචාරත්, රජවරු විචාරත්, රාජ වංශිකයෝ විචාරත්, බ්‍රාහ්මණයෝ විචාරත්, වෙළඳ කුලිකයෝ විචාරත්, ශූද්‍රයෝ විචාරත්, ගිහියෝ විචාරත්, පැවිද්දෝ විචාරත්, මේ මිනිස් ප්‍රශ්න කිරීමයි. නොමිනිස් ප්‍රශ්න කිරීම කවරේද? අමනුෂ්‍යයෝ භාග්‍යවත් බුදුරදුන් වෙත එළඹ ප්‍රශ්න විචාරත්, නාගයෝ විචාරත්, සුපර්ණයෝ විචාරත්, යක්ෂයෝ විචාරත්, අසුරයෝ විචාරත්, ගන්ධයෝ විචාරත්, මහා රජවරු විචාරත්, ශක්‍රයෝ විචාරත්, බ්‍රහ්මයෝ විචාරත්, දේවතාවෝ විචාරත් මේ නොමිනිස් ප්‍රශ්න කිරීමයි.

6 නිර්මාණය කළවුන්ගේ ප්‍රශ්න විචාරීම කවරේද? සියලුම අංග ප්‍රත්‍යංග ඇති හීන නොවූ ඉන්ද්‍රිය ඇති මනොමයවූ යම් රූපයක් නිර්මාණය කරණ සේක්ද ඒ නිර්මාණය කළ රූපය

බුදුරදුන් වෙත පැමිණ ප්‍රශ්න විචාරයි. භාග්‍යවතුන් වහන්සේ විසඳන සේක. මේ නිර්මාණය කළ චුන්ගේ ප්‍රශ්න කිරීමයි අනිකුදු ප්‍රශ්න කිරීම් තුනෙකි. තමාගේ ප්‍රයෝජනය පිණිස ප්‍රශ්න කිරීම අනුන්ගේ ප්‍රයෝජනය පිණිස ප්‍රශ්න කිරීම, තමන්ගේ අනුන්ගේ යන දෙපක්ෂයේ ප්‍රයෝජනය පිණිස ප්‍රශ්න කිරීම යනුයි නැවතද ප්‍රශ්න කිරීම් තුනෙකි. මෙලොව ප්‍රයෝජනය පිණිස ප්‍රශ්න කිරීම පරලොව ප්‍රයෝජනය පිණිස ප්‍රශ්න කිරීම පරමාර්ථය පිණිස ප්‍රශ්න කිරීම යනුයි. තවත් ප්‍රශ්න කිරීම් තුනකි. අතීතය පිළිබඳ ප්‍රශ්න කිරීම අනාගතය පිළිබඳ ප්‍රශ්න කිරීම, වර්තමානය පිළිබඳ ප්‍රශ්න කිරීම යනුයි අනිකුදු ප්‍රශ්න කිරීම් තුනෙකි. ආධ්‍යාත්මික ප්‍රශ්න කිරීම් බාහ්‍ය ප්‍රශ්න කිරීම ආධ්‍යාත්මික බාහ්‍ය ප්‍රශ්න කිරීම නැවත ප්‍රශ්න විචාරීම තුනකි. කුශල ප්‍රශ්න කිරීම අකුශල ප්‍රශ්න කිරීම, අව්‍යාකෘත ප්‍රශ්න කිරීම යනුයි. තවත් ප්‍රශ්න තුනෙකි, ස්කන්ධ ප්‍රශ්න කිරීම ධාතු ප්‍රශ්න කිරීම ආයතන ප්‍රශ්න කිරීම යනුයි. අනිකුදු ප්‍රශ්න තුනෙකි. සතිපට්ඨාන ප්‍රශ්න කිරීම සම්මප්පධාන ප්‍රශ්න කිරීම ඉද්ධිපාද ප්‍රශ්න කිරීම යනුයි තවත් ප්‍රශ්න කිරීම් තුනෙකි. ඉන්ද්‍රිය ප්‍රශ්න කිරීම බල ප්‍රශ්න කිරීම බොධ්‍යංග ප්‍රශ්න කිරීම යනුයි. අනිකුදු ප්‍රශ්න කිරීම් තුනකි. සෝවාන් ආදි මාර්ග පිළිබඳව ප්‍රශ්න කිරීම ඵලයන පිළිබඳව ප්‍රශ්න කිරීම නිර්වාණය පිළිබඳව ප්‍රශ්න කිරීම යනුයි.

7 "ඔහුගෙන් විචාරමි යනු ඔහුගෙන් විචාරමි ඔහුගෙන් ඉල්ලමි. ඔහුට ආරාධනා කරමි. ඔහු පහදවමි. මට කියනු මැනව එය විචාරමි. යනුයි "ආදිච්චබන්ධු" යන්නෙහි ආදිච්ච යනු සූර්‍ය්‍යයාට කීයයි. (iii) සූර්‍ය්‍යයාද ගොත්‍රයෙන් ගෞතම වෙයි. භාග්‍යවතුන් වහන්සේද ගොත්‍රයෙන් ගෞතම වෙයි. භාග්‍යවතුන් වහන්සේ සූර්‍ය්‍යයාගේ ගොත්‍ර ඥාතිවරයෙකි. ගොත්‍ර බන්ධුවරයෙකි. එහෙයින් බුදුරජාණන් වහන්සේ ආදිච්ච බන්ධු නම්.

8 "භාග්‍යවතුන් වහන්සේගෙන් විවේකයද ශාන්ති පදයද යන්නෙහි විවේකය නම් විවේක තුනකි. (7-1) 5 (ii) සිට 7 ඡේදය අවසන් කොට යොදාගත යුතුයි.

9 "ශාන්තිය" යනු එක් ආකාරයකින් ශාන්තියද ශාන්ති පදයද වේ. එය අමෘතවූ නිර්වාණයයි. යම් ඒ ධර්මයක් සියලු සංස්කාරයන් සන්සිඳවූයේ සියලු කෙලෙස් බැහැර කළේ තෘෂ්ණාව ගෙවුයේ වේද, ඒ විරාග නම්වූ නිරොධනම්වූ නිර්වාණයයි. යලිදු හෝ යම් ධර්ම කෙනෙක් ශාන්තිය අධිගමය පිණිස ශාන්තිය ස්පර්ශ කිරීම් පිණිස, ශාන්තිය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතීද හේ කෙසේද, සතර සතිපට්ඨානයෝ සතර සම්‍යක් ප්‍රධානයෝ සතර ඍද්ධිපාදයෝ පඤ්චෙන්ද්‍රියයෝ පඤ්චබලයෝ සප්තබොධ්‍යංගයෝ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය යන මොවුහු ශාන්තිපදයයි, ආරක්ෂා පදයයි, පිහිට පදයයි. අභය පදයයි, චුත නොවන පදයයි, අමෘත පදයයි, නිර්වාණ පදයයි කියයි.

10 මහර්ෂී" යනු මහර්ෂීවූ භාග්‍යවතුන් වහන්සේ යනුයි. මහත්වූ ශීලස්කන්ධයක් සෙවූයේද එබැවින් "මහර්ෂී" නම්. මහත්වූ සමාධිස්කන්ධයක් මහත්වූ ප්‍රඥාස්කන්ධයක් මහත්වූ විමුක්තිස්කන්ධයක් මහත්වූ විමුක්ති ඥානස්කන්ධයක් මහත්වූ විමුක්තිඥාන දස්සනස්කන්ධයක් සෙවුයේය. එබැවින් මහර්ෂී නම්. මහත්වූ අවිද්‍යාන්ධ කාරය පලා දැමීම මහත්වූ දෘෂ්ටි ගැනීම බිඳලීම මහත්වූ දෘෂ්ටි බැඳීම ලිහා දැමීම මහත්වූ මාන ධජය පහත දැමීම මහත්වූ රැස්කිරීම් සංසිඳවීම මහත්වූ (කාමාදී) සැඩ වතුරෙන් එතර වීම මහත්වූ බර බිම තැබීම මහත්වූ සංසාර වෘත්තයාගේ සිඳීම මහත්වූ දාහය නිවීම මහත්වූ දැවීම සංසිඳීම මහත්වූ දහම් ධජය නැංවීම සෙවුයේය. එබැවින් මහර්ෂී නම්. මහත්වූ සතිපට්ඨානයන් මහත්වූ සම්‍යක් ප්‍රධානයන් මහත්වූ ඍද්ධි පාදයන් මහත්වූ බලයන් මහත්වූ බොධ්‍යංගයන් මහත්වූ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය මහත්වූ පරමාර්ථවූ අමෘතවූ නිර්වාණය සෙවුයේය. එබැවින් "මහර්ෂී" නම්. බුදුරදුන් කොහිද, භාග්‍යවතුන් වහන්සේ කොහිද දෙවියන්ට දෙවිවූ උතුමන් වහන්සේ කොහිද, මිනිස් ශ්‍රෙෂ්ඨයන් වහන්සේ කොහිදැයි මහෙශාක්‍ය සත්වයන් විසින් සොයන ලද්දේනුයි මහර්ෂී නම්.

10 "භික්ෂුතෙමේ කුමක් දැක නිවයිද" යනු කුමක් දැක කුමක් බලා කුමක් සමකොට බලා කුමක් තීරණයකොට කුමක්

ප්‍රකටකොට තමාගේ රාගය නිවයිද ද්වෙෂය නිවයිද මොහය නිවයිද, ක්‍රොධය, බද්ධවෛරය, ගුණමකුකම, උතුමන් තමන් හා සමකිරීම, ඊර්ෂ්‍යාව, මසුරුකම, රැවටිල්ල කෛරාටිකකම, තදගතිය, එකටඑක කිරීම, මානය, අතිමානය, මදය, ප්‍රමාදය, සියලු කෙලෙස්, සියලු දුශ්චරිත සියලු පීඩා සියලු දැවිලි සියලු තැවිලි සියලු අකුශල රැස්කිරීම් නිවයිද, සංසිඳුවයිද, යනුයි. භික්ෂුව යනු පෘථග්ජන කල්‍යාණික හෝ භික්ෂුවයි. ශෛක්ෂ හෝ භික්ෂුවයි

11 "ලොකයෙහි කිසිවක් දැඩි ගැනීම් වශයෙන් නොගන්නේ" යනු උපාදාන සතරින් දැඩිකොට නොගන්නේ පරාමර්ශ නොකරන්නේ ඇතුළු නොවන්නේ යනුයි. "ලොකයෙහි" යනු අපාය ලොකයෙහි මනුෂ්‍යලොකයෙහි, දිව්‍ය ලොකයෙහි ස්කන්ධ ලොකයෙහි ධාතුලොකයෙහි "කිසියම් යනු කිසියම් රූපගතවූ වෙදනාගතවූ සඤ්ඤාගතවූ සංඛාරගතවූ විඤ්ඤාණගතවූ යනුයි.

## 14 - 2

1 "ප්‍රපඤ්චයන්ගේ මුලද අස්මිමානයද දැන සියල්ල වලක්වන්නේය" මෙසේ භාග්‍යවතුන් වහන්සේ වදාළහ. යන්නෙහි ප්‍රපඤ්චයෝම ප්‍රපඤ්ච සංඛා නමි. තෘෂ්ණා ප්‍රපඤ්ච සංඛාව, දෘෂ්ටි ප්‍රපඤ්ච සංඛාව යනුයි. තෘෂ්ණා ප්‍රපඤ්චයාගේ මූලය කවරේද? අවිද්‍යා මූලය, නුවණින් මෙනෙහි කිරීමේ මූලය, අස්මිමාන මූලය, පවට ලජ්ජා නොවීම් මූලය, පවට බිය නොවීම් මූලය, සිතේ නොසන්සුන්කමේ මූලය, යනුයි දෘෂ්ටි ප්‍රපඤ්චයාගේ මූලය කවරේද, අවිද්‍යා මූලය නුවණින් මෙනෙහි කිරීම් මූලය, අස්මිමාන මූලය, පවට ලජ්ජා නොවීම් මූලය. පවට බිය නොවීම් මූලයි, සිතේ නොසන්සුන්කම් මූලය, මේ දෘෂ්ටි ප්‍රපඤ්චයාගේ මූලයයි. "භගවත්" යනු, ගෞරව වචනයයි මෙහි (7-2)-1 රාගය බිඳ දැමූ බැවින් යන තැන සිට යොදාගත යුතුයි.

2 "අස්මිමානයද දැන සියල්ල සන්සිඳුවන්නේය" යනු "දැනීම" යයි ප්‍රඥාවට කියයි යම් ප්‍රඥාවක් දැනීමෙන් යුක්තවේද, (2-4) 12 (ii) ඡෙදය යෙදිය යුතුයි) අමොහය, ධම්ම විචය, සම්මාදිට්ඨි යයි කියද්ද එයයි, අස්මි මානය යනු රූපයෙහි තමා පිළිබඳ මානය, රූපයෙහි තමා පිළිබඳ කැමැත්ත, රූපයෙහි තමාපිළිබඳ අනුසය වෙදනාවෙහි සඤ්ඤාවෙහි සංස්කාරයෙහි විඤ්ඤාණයෙහි තමා පිළිබඳ මානය, තමා පිළිබඳ කැමැත්ත, තමා පිළිබඳ අනුසය යනුයි. ප්‍රපඤ්චයන්ගේ මුලද භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

3 "අස්මි මානයද දැන සියල්ල වලක් වන්නේය" යනු ප්‍රපඤ්චයන්ගේ මුලද අස්මිමානයද දැන සියල්ල වළක් වන්නේය, නිරුද්ධ කරන්නේය, සන්සිඳුවන්නේය, අස්තයට පමුණුවන්නේය යනුයි.

4 "අධ්‍යාත්මයෙහි යම්කිසි තෘෂ්ණාවක්" යන්නෙහි යම්කිසි යනු සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සර්ව ප්‍රකාරය හාත්පසින් ගත් වචනයකි. තෘෂ්ණා යනු රූප තෘෂ්ණා, ශබ්ද තෘෂ්ණා ගන්ධ තෘෂ්ණා, රශ තෘෂ්ණා, ස්පර්ශ තෘෂ්ණා, ධර්මතෘෂ්ණා යනුයි "අධ්‍යාත්මයෙහි" යනු ඇතුළත උපදින ඒ තෘෂ්ණාව හෝ "අධ්‍යාත්ම" යනුවේ. යලිදු හෝ අධ්‍යාත්මයයි සිතට කියයි. යම්කිසි සිතක් මනසය මානසය, හදයය, පණ්ඩරය මනො මනායතනය. මනින්ද්‍රිය, විඤ්ඤාණය, විඤ්ඤාණස්කන්ධය එයින් හටගත් මනොවිඤ්ඤාණ ධාතුය සිත හා ඒ තෘෂ්ණාව එකට ගියේය, එකට ඇතිවූයේය, එකට මිශ්‍රවූයේය, එකට යෙදුනේය, එකට උපන්නේය, එකට නිරුද්ධ වූයේය, එක වස්තුකය එකාරම්මණය යනුයි.

5 "ඒ තෘෂ්ණාවගේ හික්මීම පිණිස හැමකල්හි සිහි ඇතිව හික්මෙන්නේය" යන්නෙහි "හැම කල්හි" යනු (i) හැමදා සියලු කල්හි නිත්‍ය කාලයෙහි හැම කාලයෙහි ඊතලයෙන් ඊතලය මෙන් දියරැල මෙන් අතර පැවැත්ම සහිතව ස්පර්ශ කරණ ලද, පෙරබත පසුබත, පෙරයම මැදුම්යම, පැසුළුයම කාලයෙහි

සඳඑළියෙහි වැසිකාලයෙහි හිම කාලයෙහි ග්‍රීෂ්මයෙහි, පූර්ව වයස් කොටසෙහි මධ්‍යම වයස් කොටසෙහි අන්තිම වයස් කොටසෙහි යනුයි. "සිහිඇත්තේ" යනු කාරණා සතරකින් සිහි ඇත්තේ කයෙහි කය අනුව බලන සිහිය පිහිටු වන්නේ සිහි ඇත්තේ නමි. වේදනාවන්හි වේදනාව අනුව බලන සිහිය පිහිටු වන්නේනුයි සිහි ඇත්තේ නමි. වේදනාවන්හි වේදනාව අනුව බලන සිහිය පිහිටු වන්නේනුයි සිහි ඇත්තේ නමි. සිතෙහි සිත අනුව බලන සිහිය පිහිටු වන්නේනුයි සිහි ඇත්තේනමි. ධර්මයන්හි ධර්මය අනුව බලන සිහිය පිහිටු වන්නේනුයි සිහි ඇත්තේ නමි. තවත් කාරණ සතරක් නිසා සිහි ඇත්තේ නමි. සිහි නැති බව දුරු කරණ බැවින් සිහි ඇත්තේ නමි. සිහිය ඇති කරණ ධර්මයන් කරණලද බැවින් සිහි ඇත්තේ නමි. සිහියට විරුද්ධ ධර්මයන් දුරු කරණ බැවින් සිහි ඇත්තේ නමි සිහියට නිමිතිවූ ධර්මයන් පිළිබඳ නුමුලාවන අර්ථයෙන් සිහි ඇත්තේ නමි. අනිකුත් කාරණා සතරකින් සිහි ඇත්තේ නමි. එනම් සිහියෙන් යුක්ත බැවින් සිහි ඇත්තේ නමි. සිහියෙන් වසඟවූ බැවින් සිහි ඇත්තේ නමි. සිහිය ප්‍රගුණ බැවින් සිහි ඇත්තේ නමි. සිහියෙන් නොබසින බැවින් සිහි ඇත්තේ නමි, තවත් කරුණු සතරකින් සිහි ඇත්තේ නමි. සිහියෙන් යුක්ත බැවින් සිහි ඇත්තේ නමි සංසිඳුවන බැවින් සිහි ඇත්තේ නමි ශාන්ත බැවින් ශාන්ත ධර්මයෙන් යුක්තවූ බැවින් බුද්ධානුස්මෘතියෙන් යුක්ත බැවින් ධර්මානු ස්මෘතියෙන් යුක්ත බැවින්, සංඝානුස්මෘතියෙන් යුක්ත බැවින්, ශීලානුස්මෘතියෙන් යුක්ත බැවින්, ත්‍යාගානුස්මෘතියෙන් යුක්ත බැවින්, දේවතානුස්මෘතියෙන් යුක්ත බැවින්, ආනාපානස්මෘතියෙන් යුක්ත බැවින්, මරණානුස්මෘතියෙන් යුක්ත බැවින්, කාය ගතා සතියෙන් යුක්ත බැවින්, උපමානු ස්මෘතියෙන් යුක්ත බැවින් සිහි ඇත්තේ නමි. යම් සිහියක් මනාව සිහි කෙරේද නැවත නැවත සිහි කෙරේද සිහි කරණ බැවින් යුක්තද පානොවෙන බැවින් යුක්තද මුලානොවන බැවින් යුක්තද සිහිය නමැති ඉන්ද්‍රිය සිහිය නමැති බලය මනා සිහිය සතිසම්බොජ්ඣංගය,

ඒකායන මාර්ගය යනුයි මෙය සිහියයි කියයි. මේ සිහියෙන් යුක්තවූයේ පැමිණියේනුයි හෙතෙම සිහි ඇත්තේයයි කියයි හික්මෙන්නේ යනු හික්මීම් තුනෙකි. (2-4) 1 (ii) 2 සමාදන්ව වසන්නේය යන තැනට යොදාගත යුතුයි.)

## 14 - 3

1 "අධ්‍යාත්මයෙහි යම්කිසි ධර්මයක් දැන" යනු යම්කිසි කුශල ධර්මයෙහි හෝ අව්‍යාකෘත ධර්මයෙහි හෝ තමන්ගේ යම්කිසි ගුණයක් දන්නේය. තමන්ගේ ගුණ කවරේද, උසස් කුලයකින් පැවිදිවීම් මහා භොග කුලයකින් පැවිදිවීම්. ඉතා උසස් භොග කුලයකින් පැවිදිවීම්. ගිහි පැවිද්දන් අතර ප්‍රකට වූයේ කීර්ති ඇත්තේ වීම්. චීවර, පිණ්ඩපාත සේනාසන ගිලන්පස බෙහෙත් පිරිකර ලබන්නෙක්වීම්. සූත්‍ර පිටකය දරන්නෙක්වීම්. විනය පිටකය දරන්නෙක් වීම් ධර්ම කථිකයෙක්වීම් වනවාසිකයෙක්විම්. පිණ්ඩපාතිකාංග ඇත්තේ වීම්. තෙචිවරිකාංග ඇත්තේවීම්. සපදානචාරිකාංග ඇත්තේවීම්. ඛලුපච්ඡාභත්තිකාංග ඇත්තේවීම්. නෙසජ්ජිකාංග ඇත්තේවීම්. යථාසන්ථතිකාංග ඇත්තෙක්වීම්. ප්‍රථම ධ්‍යානය ඇත්තෙක්වීම්. දෙවෙනි ධ්‍යානය ඇත්තෙක් වීම්. තුන්වෙනි ධ්‍යානය ඇත්තෙක්විම්. සතරවෙනි ධ්‍යානය ඇත්තෙක්වීම්. ආකාසානඤ්චායතන සමාපත්ති ලාභියෙක් වීම්. විඤ්ඤාණඤ්චායතන සමාපත්ති ලාභියෙක්වීම්. ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති ලාභියෙක්වීම්. නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්ති ලාභියෙක්වීම්. මේවා තමන්ගේ ගුණයයි කියත්. තමන්ගේ ගුණයක්, යම්කිසි ගුණයක් දැන ගන්නේය. විශෙෂයෙන් දැනගන්නේය, යනුයි.

2 "නැවත පිටත්හි ගුණ හෝ යනු අවවාද දෙන ගුරුවරයාගේ හෝ පැවිදි කළ ගුරුවරයාගේ හෝ ඒ ගුණයෝ වූහ"යි යනුයි. එයින් "උත්සාහ නොකරන්නේය" යනු තමන්ගේ ගුණයෙන් හෝ අනුන්ගේ ගුණයෙන් හෝ බලය නොකරන්නේය. තද ගතිය නොකරන්නේය. මානය

නොකරන්නේය උසස් ගතිය නොකරන්නේය. උඩඟු කමක් නොකරන්නේය. එයින් මානය නූපදවන්නේය, යනුයි. සත් පුරුෂයන් විසින් ඒ නිවීමයයි නොකියන ලදී. යනු ශාන්තවූවන් විසින් සත්පුරුෂයන් විසින් බුදුවරයන් විසින් බුද්ධ ශ්‍රාවකයන් විසින් පසේ බුදුවරයන් විසින් ඒ නිවීමයයි නොකියනලදී. ප්‍රකාශ නොකරණ ලදී. දෙශනා නොකරණ ලදී. නොපනවන ලදී. නොතබන ලදී. විවෘත නොකරණ ලදී. නොබෙදන ලදී. ප්‍රකට නොකරණ ලදී, යනුයි.

## 14 - 4

1 "එයින් ශ්‍රෙෂ්ඨයයි නොසිතන්නේය" යනු (ii) ජාතියෙන් හෝ ගෝත්‍රයෙන් හෝ කුලපුත්‍ර කමින් හෝ පැහැ සපුවෙන් හෝ ධනයෙන් හෝ අධ්‍යයනයෙන් හෝ කර්මාන්තයෙන් හෝ ශිල්පායතනයෙන් හෝ විද්‍යා ස්ථානයෙන් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ වෙනින් අනික් කරුණු වලින් හෝ යනුයි

2 "හීණයයි නොසිතන්නේය. යලිදු හෝ සමානයයි නොසිතන්නේය," යනු ජාතියෙන් හෝ (මෙහි 1- (ii) යොදා ගත යුතුයි.) හීනයයි අවමානය නූපදවන්නේය. ජාතියෙන් හෝ (මෙහි 1 (ii) යොදාගත යුතුයි) මානය නූපදවන්නේය, යනුයි.

3 "නොයෙක් ආකාරයෙන් විචාරණ ලද්දේ" යනු නොයෙක් ආකාරයෙන් ස්පර්ශ කරණලද්දේ යුක්තවූයේ යනුයි.

4 "තමා වෙනස්ව නොසිටින්නේය" යන්නෙහි තෙමේ යයි තමාට කියයි. තමා කල්පනා නොකරන්නේ වෙනසකට නොපැමිණෙන්නේ සිටින්නේය යනුයි

## 14 - 5

1 "ඇතුළත සංසිඳුවන්නේය," යනු ඇතුළත රාගය සන්සිඳුවන්නේය. ද්වෙෂය සන්සිඳුවන්නේය. මොහය සන්සිඳුවන්නේය. ක්‍රොධය, බද්ධ වෛරය, ගුණමකුකම, උතුමන්

තමා හා සම කිරීම, ඊර්ෂ්‍යාව, මසුරු කම, රැවටිල්ල, කෛරාටික කම, තද ගතිය, එකට එක කිරීම, මානය, අතිමානය, මදය, ප්‍රමාදය, සියලු ක්ලෙශයන් සියලු දුශ්චරිතයන්, සියලු පීඩා, සියලු දාහ, සියලු තැවිලි, සියලු අකුශල රැස්කිරීම්, සන්සිඳුවන්නේය, නිවන්නේය, දුරු කරන්නේය, යනුයි.

2 "භික්ෂුතෙමේ අන්‍ය මාර්ගයකින් ශාන්තිය නොසොයන්නේය." යනු අන්‍යවූ අශුද්ධි මාර්ගයකින් මිථ්‍යා ප්‍රතිපදාවකින් අනෛර්‍යාණික මාර්ගයකින් එනම්, සතිපට්ඨානයන් ගෙන් හැර, සම්‍යක් ප්‍රධානයන්ගෙන් හැර ඍද්ධිපාදයන් ගෙන් හැර, ඉන්ද්‍රියයන් ගෙන් හැර බලයන් ගෙන් හැර බොධ්‍යංගයන්ගෙන් හැර ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයෙන් හැර ශාන්තිය නිවීම දුරුකිරීම නොසොයන්නේය යනුයි. "ඇතුළත ශාන්තවූවහුට" යනු ඇතුළත රාගය ශාන්තවූවහුට, ද්වෙෂය ශාන්තවූවහුට, මොහය ශාන්තවූවහුට, ක්‍රොධය ශාන්තවූවහුට, බද්ධවෛරය, ගුණමකුකම, උතුමන් තමා හා සමකිරීම, ඊර්ෂ්‍යාව, මසුරුකම, රැවටිල්ල, කෛරාටික කම. තද ගතිය, එකට එක කිරීම, මානය, අතිමානය, මදය ප්‍රමාදය, සියලු කෙලෙස් සියලු දුශ්චරිත, සියලු පීඩා, සියලු දාහ සියලු තැවිලි සියලු අකුශල රැස්කිරීම්, ශාන්තවූවහුට, නිවුනහුට, යනුයි.

3 "ආත්මයක් හෝ ආත්ම නොවන දෙයක් හෝ නැත." යන්නෙහි "නැත" යනු ප්‍රතික්ෂෙපයයි ආත්මය යනු ආත්ම දෘෂ්ටියක් නැත. ආත්මය නොවන දෙයක් යනු උච්ඡෙද දෘෂ්ටියක් නැත. තමායයි ගැනීමක් නැත. ආත්මය නොවේ යයි බැහැරකළ යුත්තක් නැත. යමෙකුට ගැනීමක් ඇද්ද, ඔහුට මිදිය යුත්තක්ද වෙයි. රහතුන් වහන්සේ වැඩීම හා හානිය නැවැත්වූසේක. උන්වහන්සේට ගැනීමක් මිදීමක් නැත. උන්වහන්සේ වැස නිමවූයේ පුරුදු කළ ගමන් (චරණ ධර්ම) ඇත්තේ (10-2) (i) මිදු රාග ඇත්තේ යන තැන සිට යෙදිය යුතුයි.) ජාති මරණ සංසාරය නැත උන්වහන්සේට නැවත භවයක් නැත යනුයි.

## 14 - 6

1 "යම්සේ මුහුද මැද රැළ හටනොගනීද නිශ්චලවූයේ වේද," යන්නෙහි සමුද්‍රය ගැඹුරෙන් යොදුන් අසූහාරදහසෙක යට යොදුන් හතලිස් දාහක් මස් කැස්බන්ගෙන් කම්පාවෙයි. එයට මත්තෙහි යොදුන් සතලිස්දාහක දිය වාතයෙන් කම්පා වෙයි. මුහුද මැද යොදුන් හතලිස්දාහක දිය කම්පා නොවෙයි. නොකැළඹෙයි නොසෙලවෙයි. නොයෙදුනේ නොගැටුනේ චංචල නොවූයේ ශාන්තවූයේ වෙයි. එහි රැල හටනොගනියි. නිශ්චලවූයේ වෙයි. යලිදු හෝ සප්තකුල පර්වතයන් අතරෙහි සප්ත සීදන්ත මහා සමුද්‍රයෝ වෙති. එහි ජලය කම්පා නොවෙයි. නොකැළඹෙයි. නොසෙලවෙයි. නොසෙලුනේ නොගැටුනේ චංචල නොවූයේ ශාන්තවූයේ වෙයි. එහි රැල හටනොගනියි. නිශ්චලවූයේ වෙයි.

2 "එජාව (තෘෂ්ණාව) නැත්තහුද මෙසේ කම්පා නොවෙයි." යන්නෙහි මෙසේ යනු උපමා වචනයයි. සිටියේ වෙයි. යනු ලාභයෙහිද කම්පා නොවෙයි. අලාභයෙහිද කම්පා නොවෙයි. කීර්තියෙහිද කම්පා නොවෙයි. අපකීර්තියෙහිද කම්පා නොවෙයි. ප්‍රශංසාවෙහි කම්පා නොවෙයි. නින්දාවෙහිද කම්පා නොවෙයි. සැපයෙහිද කම්පා නොවෙයි. දුකෙහිද කම්පා නොවෙයි, නොකැළඹෙයි. නොසෙලවෙයි. මෙසේ සිටියේ වෙයි. "එජාව නැත්තහු යන්නෙහි" එජාව නැත්තහු යන්නෙහි" එජා යයි තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද, ඇලීමක් ඇද්ද දැඩි ලෝභයක් අකුශල මූලයක් ඇද්ද එයයි. යමෙකුගේ මේ තෘෂ්ණාව ප්‍රහීණවූයේ වේද, සිඳ දැමුයේද, මුලින් සන්සිඳේද සන්සිඳුනේද, ඉපදීමට අයොග්‍යවූයේද, ඥානය නමැති ගින්නෙන් දැවුනේද හෙතෙම අනේජයයි කියයි තෘෂ්ණාව ප්‍රහීණවූ බැවින් අනේජ නමි. හෙතෙම ලාභයෙහිද කම්පා නොවෙයි. අලාභයෙහිද කම්පානොවෙයි. කීර්තියෙහිද කම්පා නොවෙයි. අපකීර්තියෙහිද කම්පා නොවෙයි. ප්‍රශංසාවෙහිද කම්පා නොවෙයි. නින්දාවෙහිද කම්පා නොවෙයි. සැපයෙහිද කම්පා නොවෙයි. දුකෙහිද කම්පා නොවෙයි. නොසෙල්වෙයි යනුයි.

3 "භික්ෂුතෙම කොතැනකදීවත් රැස්කිරීමක් නොකරන්නේය" යන්නෙහි උස්සදයෝ (කෙලෙස්) සතෙකි. එනම් රාගුස්සදය, වෙසුස්සදය මොහුස්සදය, මානුස්සදය, දිට්ඨුස්සදය, කම්මුස්සදය යන මේවා නොකරන්නේය, නූපදවන්නේය. ඇති නොකරන්නේය, කොතැනකදීවත් යනු කොතැනක හෝ ඇතුළතදී හෝ පිටතදී යනු යනුයි.

## 14 - 7

1 "විවෘතවූ ඇස් ඇති (බුදුරජාණන් වහන්සේ) දෙශනා කළසේක" යන්නෙහි දෙශනා කළසේක යනු කියනලදී. ප්‍රකාශ කරණලදී. දෙශනා කරණලදී. පණවනලදී. තබන ලදී විවෘත කරණලදී බෙදනලදී යනුයි විවෘතවූ ඇස් ඇති යනු භාග්‍යවතුන් වහන්සේ පසැස්වලින් විවෘත ඇස් ඇති සේක. මසැසින්ද විවෘත ඇස් ඇතිසේක. දිවැසින්ද විවෘතවූ ඇස් ඇතිසේක. පැණැසින්ද විවෘතවූ ඇස් ඇතිසේක බුදු ඇසින්ද විවෘතවූ ඇස් ඇතිසේක. හාත්පස බලන ඇසින්ද විවෘතවූ ඇස් ඇතිසේක.

2 කෙසේ භාග්‍යවතුන් වහන්සේ මසැසින් විවෘතවූ ඇස් ඇතිසේක්ද, භාග්‍යවතුන් වහන්සේගේ මසැසෙහි (ප්‍රකෘති ඇසෙහි) වර්ණ පසක් විද්‍යමාන වෙත්. නීලවර්ණය, කහවර්ණය, රතුවර්ණය, කළුවර්ණය, සුදුවර්ණය, යනුයි යම් තැනක ඇසේ ලෝම පිහිටියේවේද එය නීලවර්ණ වෙයි. පහදවන දැකුම්කළු "උම්මා" නම් තිල්මල මෙන් වෙයි. එයට එහා කහපාට වෙයි. රන්වන්වූයේ මනා පහදවන්නේ කිණිහිරි මලසේ වෙයි. භාග්‍යවතුන් වහන්සේගේ ඇස් ගෝල දෙක රතුවෙත්. මනා රතුවෙත් පහදවන්නාහු වෙත්. දැකුම් කළුවෙත්. ඉන්ද්‍රගොපක නම් පණු වර්ගයේ පැහැය මෙන් වෙත්. මැද කළුපාට වෙයි. මනා කළු වර්ණවූයේ රූක්ෂ නොවූ සිනිඳුවූ අමු කොසඹකොළ පැහැ සමාන වෙයි. එයට එහා සුදුවූයේ වෙයි සුදුවූයේ පහද වන්නේ දැකුම්කළුවූයේ දවහත් (ඉරබටු) තරුවේ පැහැ සමාන වෙයි. භාග්‍යවතුන් වහන්සේ පෙර සුචරිතානු භාවයෙන් උපන් ආත්ම භාවයට අයත් ප්‍රකෘතිවූ මසැසින් දවල්ද රෑද හාත්පස

යොදුනක් දකියි. යම් කලෙක අංග සතරකින් යුක්තවූ අන්ධකාරය වේද එනම්, හිරු අවරට ගියේවේද, මාසේ පෝයවේද, දැඩි වන ලැහැබක්වේද, මහත්වූ කලට වසින වැසි වලාව වේද, මෙබඳුවූ අංග සතරකින් යුතු අන්ධකාරයෙහිද හාත්පස යොදුනක් දකියි. යම්තැනක බිත්තියක් හෝ කවුළුවක් හෝ ප්‍රාකාරයක් හෝ ගසක් හෝ වැලක් හෝ වේනම් රූපයන් දැකීමට එය ආවරණයකි. එක තල ඇටයක් නිසා තල කරත්තයක් බහාලන්නේ නම් ඒ තල ඇටයම සොයන්නේද මෙසේ භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රකෘති මසැස පිරිසිදු වෙයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ මසැසින්ද විවෘතවූ ඇස් ඇතිසේක

3 "කෙසේ භාග්‍යවතුන් වහන්සේ දිවැසින්ද විවෘතවූ ඇස් ඇතිසේක්ද, භාග්‍යවතුන් වහන්සේ මිනිස් ගතිය ඉක්මවූ පිරිසිදු (ii) දිවැසින් චුත වෙන්නාවූද උපදින්නාවූද, හීනවූද, ප්‍රණීතවූද, මනා වර්ණවූද දුර්වර්ණ වූද කර්මය අනුව සුගතියට යන්නාවූද දුගතියට යන්නාවූද සත්වයන් දකියි මේ පින්වත් සත්වයෝ ඒකාන්තයෙන් කාය දුශ්චරිතයෙන් යුක්තවූවෝ වාග් දුශ්චරිතයෙන් යුක්තවූවෝ මනස් දුශ්චරිතයෙන් යුක්තවූවෝ ආර්‍ය්‍යයන්ට උපවාද කළෝ, මිථ්‍යාදෘෂ්ටිවූවෝ මිථ්‍යා දෘෂ්ටි කර්මයෙන් යුක්තවූවෝ, ඔවුහු කායයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් තොර, නපුරු ගති ඇති නපුරුසේ වැටෙන නරකයෙහි උපන්නෝ වෙති (iii) මේ පින්වත්හු කාය සුචරිතයෙන් යුක්තවූවෝ වෙති. වචී සුචරිතයෙන් යුක්ත නුවූවෝ වෙති. මනස් දුශ්චරිතයෙන් යුක්තවූවෝ වෙති. ආර්‍ය්‍යයන්ට උපවාද නොකළෝ වෙති. සම්‍යක් දෘෂ්ටි ඇත්තෝ සම්‍යක් දෘෂ්ටි කර්ම සමාදන්වූවෝ වෙති. ඔවුහු කායයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපන්නාහු වෙති'යි (ii) මෙසේ මිනිස් ගතිය ඉක්මවූ පිරිසිදුවූ දිවැසින් චුත වන්නාවූද උපදින්නාවූද හීනවූද ප්‍රණීතවූද මනා වර්ණ ඇත්තාවූද දුර්වර්ණ ඇත්තාවූද කර්මය පරිදි සුගතියට යන්නාවූද දුගතියට යන්නාවූද සත්වයන් දනියි භාග්‍යවතුන් වහන්සේ කැමති වන්නේ නම් එකම ලොක ධාතුවක් දක්නාසේක. ලොක ධාතු දෙකක්,

ලොක ධාතු තුනක්, ලොක ධාතු සතරක් දක්නා සේක, ලොක ධාතු පසක් දක්නා සේක. ලෝක ධාතු දශයක් දක්නා සේක. ලෝක ධාතු විස්සක් දක්නා සේක. ලෝක ධාතු තිසක් දක්නාසේක. ලෝක ධාතු සතලිසක් දක්නා සේක. ලෝක ධාතු පණසක් දක්නාසේක ලෝක ධාතු සියයක් දක්නාසේක. දහසක් කුඩා ලෝක ධාතු දක්නාසේක. දෙදහසක් මධ්‍යම ලොක ධාතු දක්නාසේක. ත්‍රි සහශ්‍රී මහා සහශ්‍රී ලෝක ධාතුව දක්නාසේක. යම් පමණ බලාපොරොත්තු වන්නේ නම් එපමණම දක්නා සේක. භාග්‍යවතුන් වහන්සේගේ දිවැස මෙසේ පිරිසිදුය මෙසේ භාග්‍යවතුන් වහන්සේ දිවැසින්ද විවෘතවූ ඇස් ඇති සේක. කෙසේ භාග්‍යවතුන් වහන්සේ ප්‍රඥා චක්ෂුසින්ද විවෘත ඇස් ඇති සේක්ද, භාග්‍යවතුන් වහන්සේ මහා ප්‍රඥා ඇතිසේක පළල් ප්‍රඥා ඇතිසේක භාසු ප්‍රඥා ඇතිසේක. වෙගවත් ප්‍රඥා ඇතිසේක තියුණු ප්‍රඥා ඇති සේක. උතුම් ප්‍රඥා ඇතිසේක. ඒ ඒ ප්‍රඥාවන් දැනීමේ දක්ෂසේක. වෙන් වෙන් ප්‍රඥා ඇතිසේක. ලැබූ පටිසම්භිදා ඇතිසේක. සතර විශාරද භාවයෙන් යුක්තසේක. දශබලයන් දරණසේක. පුරුෂ ශ්‍රෙෂ්ඨ සේක. පුරුෂ සීහ (ඉතා උතුම්) සේක පුරුෂ නාගසේක. ආජානීය පුරුෂවූසේක. පුරුෂ නායකසේක. අනන්ත ඥාන ඇතිසේක. අනන්ත තෙද ඇති සේක. අනන්ත කීර්ති ඇතිසේක. ආඪ්‍ය සේක. මහත් ධන ඇති සේක ධනවත් සේක. නායකවන සේක. හික්මවන සේක. අනුව පමුණුවන සේක. පණවන සේක. මෙනෙහි කරවන සේක. බලවන සේක පහදවන සේක ඒ භාග්‍යවතුන් වහන්සේ නූපන් මග උපදවන සේක. නොහටගත් මග හටගන්වන සේක. ප්‍රකාශ නොකළ මාර්ගය ප්‍රකාශ කරණසේක. මාර්ගය දන්නා සේක. මාර්ගයෙහි නුවණැති සේක. මාර්ගයෙහි දක්ෂ සේක පසුව ඇතිවූ දැන් ශ්‍රාවකයෝ මාර්ගානුගතව වාසය කරත්. ඒ භාග්‍යවතුන් වහන්සේ දතයුත්ත දන්නා සේක දැක්ක යුත්ත දක්නා සේක. ඇස් ඇත්තේ ඥානවූයේ ධර්මය වූයේ බ්‍රහ්මයා වූයේ කියන සේක් පවත්වනසේක් අර්ථය තීරණය කරණසේක් ධර්ම ස්වාමි වූයේ තථාගත සේක. භාග්‍යවතුන් වහන්සේ විසින්

නොදන්නා දෙයක් නොදක්නා දෙයක් ප්‍රත්‍යක්ෂ නොකළ දෙයක් නුවණින් අවබොධ නොකළ දෙයක් නැත. අතීතය, අනාගතය, වර්තමානය පටන් සියලු ධර්මයෝ සියලු ආකාරයෙන් බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේගේ ඥාන මුඛයෙහි ඉදිරියට පැමිණෙත්. (8-11) 4 "භාග්‍යවතුන් වහන්සේගේ ඥාන මුඛය" යන තැන සිට ඡේදය අවසානයට යොදාගත යුතුයි.)

4 කෙසේ භාග්‍යවතුන් වහන්සේ බුදු ඇසින්ද විවෘත ඇස් ඇති සේක්ද, භාග්‍යවතුන් වහන්සේ බුදු ඇසින් ලොව බලනසේක් ස්වල්ප කෙලෙස් ඇති මහා කෙලෙස් ඇති තියුණු ඉන්ද්‍රිය ඇති මෘදු ඉන්ද්‍රිය ඇති යහපත් ආකාර ඇති අයහපත් ආකාර ඇති මනා අවබොධ ඇති මනා අවබොධය නැති පරලොව බිය දක්නා සුළුව වාසය කරණ ඇතැම් කෙනෙක් දුටු සේක යම්සේ වනාහි උපුල් විලක හෝ පියුම් විලක හෝ සුදු පියුම් විලක හෝ ඇතැම් උපුල් හෝ පියුම් හෝ සුදු පියුම් හෝ ජලයෙහි හටගන්නාහුද ජලයෙහි වැඩුනාහුද ජලය අනුව ගියාහුද ඒවා ජලය ඇතුළත පොෂණය වන්නාහුද වෙති. ඇතැම් උපුල් හෝ පියුම් හෝ සුදු පියුම හෝ ජලයෙහි හටගන්නාහුද ජලයෙහි වැඩුනාහුද ජලය හා සමව සිටියාහු වෙති. ඇතැම් උපුල් හෝ පියුම් හෝ සුදු පියුම් හෝ ජලයෙහි හටගන්නාහුද ජලයෙහි වැඩුනාහුද දිය හා නොගැටෙමින් ජලයෙන් උඩට නැගී සිටිත්ද, එපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේ බුදු ඇසින් ලොව බලන්නේ ස්වල්ප කෙලෙස් ඇත්තාවූද, මහා කෙලෙස් ඇත්තාවූද තියුණු ඉන්ද්‍රිය ඇත්තාවූද මෘදුවූ ඉන්ද්‍රිය ඇත්තාවූද, යහපත් ආකාර ඇත්තාවූද අයහපත් ආකාර ඇත්තාවූද මනාව අවබොධ කටහැකිවූද දුෂ්කරව අවබොධකට හැක්කාවූද පරලොව බිය දක්නාසුළුව වසන ඇතැම් අයද පරලොව බිය නොදක්නා සුළුව වසන ඇතැම් අයද යන සත්වයින් දුටු සේක. මේ පුද්ගලතෙම රාග චරිත ඇත්තේය මේ පුද්ගලතෙම ද්වෙෂ චරිත ඇත්තේය, මේ පුද්ගලතෙම මොහ චරිත ඇත්තේය, මේ තැනැත්තේ විතර්ක චරිතයෙක මේ තැනැත්තේ ශ්‍රද්ධා චරිතයෙක, මේ බුද්ධිචරිතයෙකැයි භාග්‍යවතුන් වහන්සේ

දන්නාසේක, භාග්‍යවතුන් වහන්සේ රාග චරිත ඇති පුද්ගලයාට අශුභ කථාව දෙශනා කරණ සේක. භාග්‍යවතුන් වහන්සේ ද්වෙෂ චරිත ඇත්තහුට මෛත්‍රී භාවනාව දේශනා කරණසේක, භාග්‍යවතුන් වහන්සේ මොහ චරිත පුද්ගලයා ඉගෙණීමෙහි ප්‍රශ්න කිරීමෙහි ගුරුවරුන් ආශ්‍රය කිරීමෙහි යොදවනසේක, භාග්‍යවතුන් වහන්සේ විතර්ක චරිත ඇති පුද්ගලයාට ආනාපාන සතිය දේශනාකරණ සේක, භාග්‍යවතුන් වහන්සේ ශ්‍රද්ධා චරිත ඇති පුද්ගලයාට බුදුන් කෙරෙහිවූ මනා බුද්ධත්වයද ධර්මය කෙරෙහි යහපත් ධර්මත්වයද සංඝයාගේ සුපිළිපන් බවද තමන්ගේ ශීලයන්ද දෙශනා කරණ සේක, භාග්‍යවතුන් වහන්සේ බුද්ධි චරිත ඇත්තාහට අනිත්‍යාකාරවූ දුක්ඛාකාරවූ අනාත්මාකාරවූ විදර්ශනා නිමිත්ත දෙශනා කරණ සේක.

**5** "යම්සේ පර්වතයක් මුදුනෙහි සිටියෙක් හත්පස ජනයාට පෙණෙන්නේද සුමෙධය, මේ සමතැස් ඇති පහවූ ශොක ඇති බුදුරදුන් වහන්සේ එවැනි උපමා ඇති ධර්මයට නැමැති ප්‍රාසාදයට නැගී ජාති ජරාවෙන් මඩනාලද ශොකයට බැසගත් ජනසමූහය දක්නා සේක."

මෙසේ භාග්‍යවතුන් වහන්සේ බුදු ඇසින්ද විවෘත ඇස් ඇති සේක, කෙසේ භාග්‍යවතුන් වහන්සේ සමතැසින් විවෘත ඇස් ඇති සේක්ද, "සමතැස" යයි සර්වඥතා ඥානයට කියයි භාග්‍යවතුන් වහන්සේ සර්වඥතාඥානයෙන් යුක්තවූ සේක

**6** "මේ ලොව උන්වහන්සේ නොදුටු කිසිවක් නැත. දතයුතුවූ නොදත් දෙයක් නැත. යම්කිසි දැනගතයුතු ධර්මයක් ඇද්ද සියල්ල දැන ගත්සේක. එහෙයින් තථාගතයන් වහන්සේ සමන්තචක්ඛු නම්" මෙසේ භාග්‍යවතුන් වහන්සේ සමතැසින්ද විවෘත ඇස් ඇති සේක, යනුයි.

**7** "උවදුරු නැති කරණ ප්‍රත්‍යක්ෂ ධර්මය" යන්නෙහි මෙය මෙසේමයයි ගත් ධර්මයක් නොවේ පරම්පරාවෙන් ගත් ධර්මයක් නොවේ. කොටස් කොටගත් ධර්මයක් නොවේ. තර්ක හේතුවෙන් ගත් ධර්මයක් නොවේ. න්‍යාය හේතුවෙන් ගත්

ධර්මයක් නොවේ. ආකාරයෙන් සිතාබලාගත් ධර්මයක් නොවේ. දෘෂ්ටියෙන් බලාගත් ධර්මයක් නොවේ තනිව තෙමේ මනාකොට දැන තමාට ප්‍රත්‍යක්ෂ ධර්මයක්නුයි ප්‍රත්‍යක්ෂ ධර්මය නමි.

8 "උවදුරු නැතිකරණ" යන්නෙහි උවදුරු දෙකක් වෙති. ප්‍රකට උවදුරුද වැසුන උවදුරුද යනුයි. ප්‍රකට උවදුරු කවරේද, සිංහයෝය, ව්‍යාඝ්‍රයෝය, දිවියෝය, වලස්සුය, කලුහිස් වලස්සුය, ව්‍යාඝ්‍රයෝය, මීම්මුය, සර්පයෝය, ගෝනුස්සෝය, පත්තෑයෝය, කරණ ලද හෝ නොකරණ ලද වැඩ ඇති සොරුන් හෝ මිනිස්සු වෙද්ද ඔවුහුයි. ඇස් රෝගය, කන්රෝගය, නාසේ රෝගය දිවේ රෝගය, කයේ රෝගය, හිසේ රෝගය, කණේ රෝගය, මුඛයේ රෝගය, දත්රෝගය, කාශය, ක්ෂය, පීනසය, දාහය උණය, කුසෙහි රෝගය, මූර්ඡාවය, රක්ත අතීසාරය, ඇඟ විදින්නාමෙන් ඇතිවන රෝගය, මහා අතීසාරය, කුෂ්ටය, ගඩුය, කිලාසය, ස්වාශ රෝගය, අපස්මාරය, දදය, කැසීමය, කුඩා බිබිලිය, නියෙන් කැසූ තැන වණවන රෝගය, මහ කැසීම්ය, රත්පිතය, මධුමෙහය, අංශභාග නම් රෝගය, පිළිකාය, භගන්දරාය, පිතින්වන රෝගය, සෙමින්වන රෝගය, වාතයෙන්වන රෝගය, තුන්දොසින්වන රෝගය ඍතු විපයඨාසයෙන් වන රෝගය, විෂම පැවැත්මෙන්වන රෝගය, උපක්‍රමයෙන් උපන් රෝගය, කර්ම විපාකයෙන් වන රෝගය ශීත, උෂ්ණ, බඩසාය, පිපාසය මලමුත්‍ර කෘත්‍ය දැයි යන මේ රෝගද ඩැහැලේ බොන මැස්සෝය මදුරුවෝය වාතය අව්වය දීර්ඝ ජාතීහුය යන මොවුන්ගේ ස්පර්ශයෙන් හෝ ඇතිවන උවදුරුද යන මෙය ප්‍රකට උවදුරුවෙත් වැසුන උවදුරු කවරහුද කාය දුශ්චරිතය වාග් දුශ්චරිතය, මනස් දුශ්චරිතය කාමච්ඡන්ද නීවරණය, ව්‍යාපාද නීවරණය ථීන මිද්ධ නීවරණය උද්ධච්ච කුක්කුච්ච නීවරණය විචිකිච්ඡා නීවරණය, රාගය ද්වෙෂය මොහය ක්‍රොධය බද්ධ වෛරය, ගුණමකුකම උතුමන් තමන් හා සම කිරීම ඊර්ෂ්‍යාව මසුරුකම රැවටිල්ල කෛරාටිකකම තදගතිය එකට එක කිරීම මානය ඇති මානය මදය ප්‍රමාදය සියලු කෙලෙස් සියලු පීඩා

සියලු දැවිලි සියලු තැවිලි සියුම් අකුශල රැස්කිරීම් මොවුහු වැසුන උවදුරු යයි කියත්. "උවදුරු" යනු කවරාර්ථයකින් උවදුරු නම්, වෙත්ද මැඩ පවත්වානුයි' උවදුරු නම් පරිහානියට පැමිණේනුයි උවදුරුනම්, එහි වාසය වෙනුයි උවදුරුනම්.

**9** කෙසේ මැඩපවත්වානුයි උවදුරු නම් වෙත්ද ඒ උවදුරු ඒ පුද්ගලයා මැඩපවත්වත් යටකරත් මඩිත් පරිහානිය පැමිණේනුයි කෙසේ උවදුරු නම් වෙද්ද, ඒ උවදුරු කුශල ධර්මයන්ගේ අන්තරාය පිණිස පිරිහීම පිණිස පවතිත් කවර කුශල ධර්මයන්ගේද සම්‍යක් ප්‍රතිපදාව පිණිස අනුලොම ප්‍රතිපදාව පිණිස නිවැරදි ප්‍රතිපදාව පිණිස අන්වර්ථ ප්‍රතිපදාව පිණිස ධර්මානු ධර්ම ප්‍රතිපදාව පිණිස ශීලයන් සම්පූර්ණ කිරීම පිණිස ඉන්ද්‍රියයන්හි වැසූ දොර ඇතිවීම පිණිස භොජනයන්හි පමණ දැනීම පිණිස නිදිදුරු කිරීම් පිණිස සිහිනුවණ පිණිස සතර සතිපට්ඨානයන් වැඩීම පිණිස සතර සම්‍යක් ප්‍රධානයන්ගේ සතර ඍද්ධිපාදයන්ගේ පඤ්චෙන්ද්‍රියයන්ගේ පඤ්ච බලයන්ගේ සප්ත බොධ්‍යංගයන්ගේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයේ වැඩීම පිණිසද යන මේ කුශල ධර්මයන්ගේ වැඩීම පිණිස යනුයි උවදුරු යනු (1-4) 4 (ii) උවදුරු යන තැන සිට යොදාගත යුතුයි.)

**10** "උවදුරු හික්මීම" යනු උවදුරු දුරු කිරීම, උවදුරු සංසිඳීම, උවදුරු ව්‍යපසමනය, උවදුරු බැහැර කිරීම, අමෘතවූ නිර්වාණය යනුයි. "ස්වාමීනි, ප්‍රතිපදාව කියනු මැනවි" යනු සම්‍යක් ප්‍රතිපදාව, නොවෙනස් ප්‍රතිපදාව, අන්වර්ථ ප්‍රතිපදාව, ධර්මානු ධර්ම ප්‍රතිපදාව, ශීලයන් සම්පූර්ණ කරණ බව ඉන්ද්‍රියයන්හි වැසූ දොර ඇති බව, භෝජනයෙහි පමණ දැනීම, නිදි දුරු කිරීම, සිහි නුවණ ඇතිබව, සතර සතිපට්ඨානයන්, සතර සම්‍යක් ප්‍රධානයන්, සතර ඍද්ධිපාදයන් පඤ්චෙන්ද්‍රියයන්, පඤ්ච බලයන්, සප්ත බොධ්‍යංගයන්, ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය, නිර්වාණයද, නිර්වාණගාමිනී ප්‍රතිපදාවද කියනු මැනවි. ප්‍රකාශ කරණු මැනවි. පනවනු මැනවි තබනු මැනවි. විවෘත කරණු

මැනවි. බෙදනු මැනවි. ප්‍රකට කරණු මැනවි, යනුයි. ස්වාමීනි, යනු ඒ නිර්මිත රූපය බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේට ආමන්ත්‍රණය කරයි. යලිදු හෝ ඔබවහන්සේ යම් ධර්මයක් දෙශනා කළසේක්ද, කීසේක්ද, පැනවූ සේක්ද, තැබූ සේක්ද, විවෘත කළසේක්ද, බෙදූ සේක්ද, ප්‍රකට කළ සේක්ද ඒ සියල්ල සුන්දරය, යහපත්ය, නිවැරදිය, සේවනය කටයුතුය යනුයි

11 "ප්‍රාතිමොක්ෂය යලිදු හෝ සමාධිය" යනු ප්‍රාතිමොක්ෂය නම් ශීලයයි. පිහිටයි. කුශල ධර්මයන්හි සමාපත්තියෙහි මුල් හැසිරීමයි. හික්මීමයි. සංවරයයි "යලිදු හෝ සමාධිය" යනු සිතේ යම් හික්මීමක් නැවැත්මක් නිශ්චල භාවයක්, කලබල නොවීමක්, නොකැළඹුන බවත් සිතේ සමථයක්, සමාධින්ද්‍රියක් සමාධි බලයක් සම්‍යක් සමාධියක් ඇද්ද එයයි.

## 14 - 8

1 "චක්ෂුර් ලොලත්වය දුරු කරන්නේය" යන්නෙහි කෙසේ චක්ෂුර් ලොලත්වය වේද, (i) මෙහි ඇතැම් පුද්ගලයෙක් චක්ෂුර් ලොලත්වයෙන් යුක්තවූයේ වෙයි. නොදුටු දේ දැකිය යුතුයි. දැකි දේ ඉක්මවිය යුතුයයි ආරාමයෙන් ආරාමයට උයනෙන් උයනට ගමින් ගමට නියම්ගමින් නියම් ගමට නුවරින් නුවරට, රටින් රටට ජනපදයෙන් ජනපදයට රූප දැක්ම පිණිස දීර්ඝ චාරිකාවෙහි පසුකොට යාමෙහි යෙදුනේ වාසය කරයි. මෙසේද චක්ෂුර් ලොලත්වය වෙයි යලිදු හෝ ඇතුළු ගමට හෝ ඇතුළු ගෙට පිවිසියේ විථියට පිවිසියේ අසංවරව යයි ඇතෙකු බලන්නේ, අශ්වයකු බලන්නේ රථයක් බලන්නේ, පාබල සෙනඟක් බලන්නේ ස්ත්‍රීන් බලන්නේ පුරුෂයන් බලන්නේ, කුමරුවන් බලන්නේ කුමරියන් බලන්නේ, කඩ සාප්පු බලන්නේ අනුන්ගේ මුහුණු බලන්නේ, උඩ බලන්නේ, යට බලන්නේ දිශා අනුදිශා බලන්නේ, යයි මෙසේද චක්ෂුර් ලොලත්වය ඇත්තේ වෙයි. (ii) යලිදු හෝ භික්ෂුතෙම ඇසින් රූපය දැක නිමිති ගන්නේ වෙයි. අනුබ්‍යඤ්ජන ගන්නේ වෙයි. යම් හේතුවකින් චක්ෂුරින්ද්‍රිය අසංවරව වාසය කරන්නාවූ ඔහුට දැඩි ලොභය

ආදී ලාමක අකුශල ධර්මයෝ ඔහු අනුව වැගිරෙද්ද එහි සංවරය පිණිස නොපිළිපදියි. චක්ෂුරින්ද්‍රිය නොරකියි. චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට නොපැමිණෙයි. මෙසේද චක්ෂුර් ලොලත්වය ඇතිවෙයි. යම්සේ හෝ ඇතැම් ශ්‍රමණ බ්‍ර හ්මණයෝ ශ්‍රද්ධාවෙන් දෙන භොජනයන් වළඳා ඔවුහු මෙබඳුවූ විසුළු දැකුම් බැලීමෙන් යුතුව වාසය කරත්. ඒ කෙසේද, නැටීම, ගීකීම, වැයීම, රඟ මඩුලු, ගොතා රසකර කියන ලද බොරු කථා බැලීම, ඇසීම, අත්තල ගැසීම, මළ මිනී නැංවීම නමැති විජ්ජා කිරීම, බෙර වැයුම, නෘත්‍යයේදී සිත් ඇළුම් කරණ ශරීර චඤ්චලය, සණ්ඩෙවුම් කෙළිය, උනගස් ඔසවා නැටුම, මිනී ඇට සෝදා තැබීමය, ඇත් පොරය, අශ්ව පොරය, මීවුන් පොරය, ගව පොරය, එළු පොරය, බැටළු පොරය, කුකුළු පොරය, වටුවන් පොරය, පොලු හරඹය, මිටින් මිට ගැසීමේ පොරය, මල්ලව පොරය, භට සේනාවන්ගේ සරඹ, කඳවුරු, සතරාකාර යුද්ධ හමුදාව, දැකීම යනාදියයි. මෙසේද චක්ෂූර් ලොලත්වය ඇතිවෙයි. කෙසේ චක්ෂූර් ලෝලත්වය නොවේද, ( (14-8) 11 (i) (ii) යුක්තවූයේ වෙයි. යන්න නොවෙයි කියා වෙනස්කොට යොදා ගතයුතුයි.) යලිදු හෝ භික්ෂුතෙම ඇසින් රූපය දැක නිමිති ගන්නේ වෙයි. ( (14-8) (ii) "පිළිපදියි" "පැමිණෙයි" කියා වෙනස් කොට යොදාගත යුතුයි)

2 "චක්ෂුර් ලොලත්වය නොකරන්නේය" යනු චක්ෂුර් ලොලත්වය දුරු කරන්නේය සන්සිඳුවන්නේය. නූපදනා බවට පමුණුවන්නේය. චක්ෂූර් ලොලත්වයෙන් දුරුවූවෙක් වන්නේය. නොඇළුනේ නික්මුනේ, වෙන්වූයේ සීමා රහිත සිතින් වාසය කරන්නේය.

3 "ග්‍රාම්‍ය කථාවෙන් කණ ආවරණය කරන්නේය" යනු දෙතිස් තිරිසන් කථාවලට ග්‍රාම්‍ය කථායයි කියයි. ඒ කෙසේද, (ii) රජුන් පිළිබඳ, සොරුන් පිළිබඳ, මහාමාත්‍යයන් පිළිබඳ, සේනාවන් පිළිබඳ, භය පිළිබඳ, යුද්ධ පිළිබඳ, ආහාර පිළිබඳ, පාන වර්ග පිළිබඳ, වස්ත්‍ර පිළිබඳ, යානයන් පිළිබඳ, සයන

පිළිබඳ, මාලා පිළිබඳ, සුවඳ පිළිබඳ, ඥාතීන් පිළිබඳ; ගම් පිළිබඳ, නියම්ගම් පිළිබඳ, නගරයන් පිළිබඳ, ජනපදයන් පිළිබඳ, ස්ත්‍රීන් පිළිබඳ, පුරුෂයන් පිළිබඳ, සූරයන් පිළිබඳ, වීථි පිළිබඳ, පැන් තොටවල් පිළිබඳ, මළවුන් පිළිබඳ, යන මේ කථාද ලොකය පිළිබඳ, මුහුදු පිළිබඳ මෙය මෙසේවූයේය යන කථාද යන මේවා වෙති

4 "කණ ග්‍රාම කථාවලින් ආවරණය කරන්නේය" යනු ග්‍රාම කථාවලින් කණ ආවරණය කරන්නේය වළක් වන්නේය. රකින්නේය ආරක්ෂා කරන්නේය යනුයි.

5 "රශයෙහිද ගිජු නොවන්නේය යන්නෙහි" රසය නම් (ii) මූල රසය, කඳේ රසය, පොත්තේ රසය, කොළ රසය, මල් රසය, ගෙඩි රසය, ඇඹුල් රසය, මිහිරි රසය, තික්ත රසය, කටුක රසය, ලුණු රසය, ක්ෂාර රසය, කසට රසය, අමිහිරි රසය, ශීතද, උෂ්ණද යනුයි. (iii) රශයෙහි ගිජුවූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. ඔවුහු දිව අගින් අග්‍ර රසයන් සොයමින් ඇවිදිත්. (10-7) (4) ඔවුහු දිව අගින් යන තැන සිට යෙදිය යුතුයි.)

6 "ලොකයෙහි කිසිවක් මමය මාගේයයි නොගන්නේය" යනු මමත්වය යනු මමත්ව දෙකකි. තෘෂ්ණා මමත්වයද දෘෂ්ටි මමත්වයද යනුයි. (2-6) 1 (ii) (iii) ඡෙදය යෙදිය යුතුයි) තෘෂ්ණා මමත්වය දුරු කොට දෘෂ්ටි මමත්වය බැහැරකොට ඇසේ මමත්වය නොකරන්නේය. නොගන්නේය. පරාමර්ශ නොකරන්නේය. ඇතුළු නොවන්නේය. කණෙහි නාසයෙහි දිවෙහි ශරීරයෙහි රූපයෙහි ශබ්දයෙහි ගන්ධයෙහි රශයෙහි ස්පර්ශයෙහි කුලයෙහි ගණයා කෙරෙහි ආවාසයෙහි ලාභයෙහි කීර්තියෙහි ප්‍රශංසාවෙහි සැපයෙහි චීවරයෙහි පිණ්ඩපාතයෙහි සේනාසනයෙහි ගිලන්පස බෙහෙත් පිරිකරෙහි කාමධාතුවෙහි රූප ධාතුවෙහි අරූප ධාතුවෙහි කාමභවයෙහි රූපභවයෙහි අරූප භවයෙහි සඤ්ඤාභවයෙහි අසඤ්ඤාභවයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤා භවයෙහි එකවොකාර භවයෙහි

චතුවොකාර භවයෙහි පඤ්චවොකාර භවයෙහි අතීතයෙහි අනාගතයෙහි වර්තමානයෙහි දුටු ඇසූ දේ ස්පර්ශ කළ දැනගත් ධර්මයෙහි මමායනය නොකරන්නේය. නොගන්නේය පරාමර්ශ නොකරන්නේය, ඇතුළු නොවන්නේය යනුයි. කිසියම් යනු කිසියම් රූපගතවූ වෙදනා ගතවූ සඤ්ඤා ගතවූ සංස්කාර ගතවූ විඤ්ඤාණ ගතවූ යනුයි. ලොකයෙහි යනු අපාය ලොකයෙහි (මෙය (3-4) 6 ඡේදය යොදාගත යුතුයි.)

## 14 - 9

1 "යම් කලෙක ස්පර්ශයෝ ස්පර්ශවූවහුට" යන්නෙහි විස්සනම් රොග ස්පර්ශයයි. රොග ස්පර්ශයෙන් ස්පර්ශ කරණ ලද්දේ මඩන ලද්දේ වන්නේය. ඇස් රෝගයෙන් (මෙහි (4-4) 4 (ii) යොදාගත යුතුයි) ඩැහැලේ බොන මැස්සෝය වාතය අව්වය දීර්ඝජාතීහුය යන මොවුන්ගේ ස්පර්ශයෙන් ස්පර්ශවූයේ මඩනා ලද්දේ යුක්තවූයේ වන්නේය. භික්ෂුතෙම කොතැනකදීවත් වැලපීමක් නොකරන්නේය යනු වැලපීමක් වැලපීම් බවක් වැලපීම් වචනයක් විප්‍රලාපයක් විලාපයක් විලාප වචනයක් නොකරන්නේය, ඇති නොකරන්නේය. නූපදවන්නේය යනුයි කොතැනකදීවත් යනු කොතැනදීවත් කොහිදීවත්, ඇතුලත පිටත හෝ ඇතුල හෝ පිටත දෙතන්හිම හෝ යනුයි.

2 "භවයෙහි ආශා තෘෂ්ණාව ඇති නොකරන්නේය" යනු කාම භවයෙහිද ආශා නොකරන්නේය. රූප භවයෙහිද ආශා නොකරන්නේය අරූප භවයෙහිද ආශා නොකරන්නේය යනුයි. 'භයජනක දෙයෙහිද තැති නොගන්නේය' යනු එක් ආකාරයකින් භයද භය ජනක දේද එයමය භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය දෙශනා කරණ ලදී.

3 "ඒකාන්තයෙන් මේ භයද භයජනකදේද පැමිණේය" යනු බහිද්ධාරම්මනය කියන ලදී. සිංහයෝය ව්‍යාඝ්‍රයෝය, දිවියෝය, වලස්සුය, කළුහිස් වලස්සුය වෘකයෝය මීම්මුය, අශ්වයෝය, ඇත්තුය, සර්පයෝය, ගෝනුස්සෝය පත්තෑයෝය

කරණ ලද කර්ම ඇති හෝ නොකරණ ලද කර්ම ඇති හොරු හෝ මිනිස්සුද යන මොහු වෙති. නැවත අනික් ආකාරයකින් භය කියයි. ආධ්‍යාත්මික සිතෙන් ඇතිවන භය භයානක දේ තැතිගැනීම ලෝමයන් නැගීසිටීම සිතේ තැතිගැන්ම ජාතිභය ජරා භය ව්‍යාධිභය මරණ භය රාජ භය චොර භය ගිනි භය ජල භය තමානිසා ඇති වන භය අනුන්නිසා ඇතිවන භය දණ්ඩ භය දුර්ගති භය රැල භය කිඹුල් භය සුලි භය ජලචර භයානක සතුන්ගේ භය ආජීවකයන්ගේ භය, අපකීර්ති භය පිරිසෙහි ඇලීමේ භය රාග භය දුර්ගති භය යන භය භයානකදේ තැති ගැනීම ලොමු ඩැහැගැනීම සිතේ තැති ගැන්ම යනුයි. භයජනක දෙයෙහි තැති නොගන්නේය යනු භය ජනකදේ දැක අසා තැති නොගන්නේය බිය නොවන්නේය භය නැත්තේ වන්නේය, තැති නොගන්නේ වන්නේය, පහවූ ලොමු ඩැහැ ගැනීම් ඇත්තෙක්ව වසන්නේය යනුයි.

## 14 - 10

1 "ආහාරද පානයන්ද කෑයුතු දේද වස්ත්‍රයන්ද" යන්නෙහි ආහාර නම් බත්, පිට්ටු, රොටි, මාලු, මස් යනුයි පානයෝ නම් (ii) අඹ මිරිකාගත් යුෂ දඹ මිරිකාගත් යුෂ, මස් කෙහෙල් මිරිකාගත් යුෂ, ඇට කෙහෙල් මිරිකාගත් යුෂ මධුපානය, මුද්‍රික පානය, ඕලු ඇට මැඩගත් යුෂ, උගුරැස්ස (කටුගෙඩි) මැඩගත් යුෂ යනුයි. නැවතද පානවර්ග අටක් වෙති. කොසඹ පානය, ඬෙබර පානය, මසන්ගෙඩි පානය, ගිතෙල් පානය, තෙල් පානය, කිරි පානය, කැඳපානය, රශපානය, යන මේවා වෙති. (කඩා) කෑයුතු කෑම නම් පිටි, කෑම, කැවුම් කෑම, මුල් කෑම, පොතු කෑම, කොළ කෑම මල් කෑම, ගෙඩි කෑම යනුයි වස්ත්‍ර නම් චීවර සයයි කොමු වස්ත්‍ර කපු වස්ත්‍ර කොසෙය්‍ය වස්ත්‍ර, කම්බල වස්ත්‍ර, හණ වස්ත්‍ර, භංගනම් වස්ත්‍ර යනුයි.

2 "ලැබ රැස් කිරීම නොකරන්නේය," යනු ලැබ, විඳ, කුහක බවට නොපැමිණ, චාටු බස් කීමකට නොපැමිණ, නිමිති

ශාස්ත්‍ර කීමකට නොපැමිණ, ගිහියන්ගේ පණිවුඩ ගෙන යාමකට නොපැමිණ, ලාභයෙන් ලාභය සෙවීමකට නොපැමිණ, ගිහීන්ට දර දීම හෝ නොකොට, උන ගස් දීම හෝ නොකොට, කොළ දීම හෝ නොකොට, මල් දීම හෝ නොකොට, නෑමට වුවමනා දේ දීම හෝ නොකොට, ඇඟ ගල්වන සුණු ආදිය දීම හෝ නොකොට, දැහැටි දීම හෝ නොකොට, මුහුණ සෝදන පැන් දීම හෝ නොකොට, චාටු කථාකීම හෝ නොකොට සැබෑ බොරු මිශ්‍රව කථා නොකොට වන්දිභට්ටයන්සේ ගිහීන්ගේ ගුණ වර්ණනා නොකොට, යන්නට හැර අගුණ කීම නොකොට, ගෙබිම් ශාස්ත්‍ර කීම නොකොට, තිරිසන් විද්‍යා නොකොට, අංග විද්‍යා නොකොට, නැකැත් විද්‍යා නොකොට, ගිහීන්ගේ දූත මෙහෙවර නොකොට, ගිහින්ගේ දේ අතනින් හෝ මෙතනට ගෙනයන ගමන් නොකොට ගිහීන්ගේ පණිවුඩ පනත් ගෙනයාම නොකොට, වෙදකම් නොකොට ගිහීන්ගේ නව කර්මාන්ත නොකොට දැහැමෙන් සෙමෙන් ලැබ, ආහාර එකතු කිරීම පානවර්ග එකතු කිරීම්, වස්ත්‍රයන් එකතු කිරීම, යානයන් එකතු කිරීම, සුවඳ එකතු කිරීම, ආමිෂයන් එකතු කිරීම නොකරන්නේය. නූපදවන්නේය. ඇති නොකරන්නේය, යනුයි.

3 "ඒවා නොලැබ නොතැවෙන්නේය" යනු ආහාර හෝ නොලබම් පාන වර්ග හෝ නොලබම්, වස්ත්‍ර හෝ නොලබම්. කුලයන් හෝ නොලබම්. ගණයා හෝ නොලබම්. ආවාසය හෝ නොලබම්. ලාභය හෝ නොලබම්. කීර්තිය හෝ නොලබම්. ප්‍රශංසාව හෝ නොලබම්. සැපය හෝ නොලබම් සිවුරු හෝ නොලබම්. පිණ්ඩපාතය හෝ නොලබම්. සෙනාසනය හෝ නොලබම්. ගිලන්පස බෙහෙත් පිරිකර හෝ නොලබම්. ගිලානුපස්ථායකයෙකු හෝ නොලබම්. ප්‍රකට නොවීම්යි නොතැවෙන්නේය. නොකියන්නේය තැවීමට පත් නොවන්නේය. බිය නුවූවෙක් වන්නේය. තැති නොගන්නේය. ත්‍රාස නොවන්නේය. ප්‍රහීණ කළ බිය හා බිය විය යුතු දේ ඇත්තේ පහකළ ලොමු ඩැහැ ගැණීම් ඇත්තෙක්ව වාසය කරන්නේය යනුයි.

## 14 - 11

1 "ධ්‍යාන කරණ සුළුවූයේ පාද (ගමනෙහි) ලොලත්වය නොකරන්නේය" යන්නෙහි ධ්‍යාන කරණ සුළුවූයේ යනු ප්‍රථම ධ්‍යානයෙන්ද ධ්‍යාන කරන්නේය. ද්විතීය ධ්‍යානයෙන්ද ධ්‍යාන කරන්නේය. තෘතීය ධ්‍යානයෙන්ද ධ්‍යාන කරන්නේය. චතුර්ථධ්‍යානයෙන්ද ධ්‍යාන කරන්නේය. විතර්ක සහිතව විචාර සහිත ධ්‍යානයෙන්ද ධ්‍යාන කරන්නේය. විතර්ක රහිතව විචාර මාත්‍රය ඇති ධ්‍යානයෙන්ද ධ්‍යාන කරන්නේය. විතර්ක රහිතව විචාර රහිතවූ ධ්‍යානයෙන්ද ධ්‍යාන කරන්නේය. ප්‍රීතිය සහිත ධ්‍යානයෙන්ද ධ්‍යාන කරන්නේය. සැපයෙන් යුක්ත ධ්‍යානයෙන්ද ධ්‍යාන කරන්නේය. සුඛ සහගත ධ්‍යානයෙන්ද ධ්‍යාන කරන්නේය. උපෙක්ෂා සහගත ධ්‍යානයෙන්ද ධ්‍යාන කරන්නේය. සුඤ්ඤත ධ්‍යානයෙන්ද ධ්‍යාන කරන්නේය. අනිමිත්ත ධ්‍යානයෙන්ද ධ්‍යාන කරන්නේය අප්පණිහිත ධ්‍යානයෙන්ද ධ්‍යාන කරන්නේය. ලෞකික ධ්‍යානයෙන්ද ධ්‍යාන කරන්නේය. ලොකොත්තර ධ්‍යානයෙන්ද ධ්‍යාන කරන්නේය හුදකලාව හිඳීමෙහි යෙදුනේ යහපත් අර්ථය ගරු කරන්නේයයි ධ්‍යාන කරන්නේ නමි.

2 "පාද ලොලත්වය නොකරන්නේය" යනු කෙසේ පාද ලොලත්වය ඇත්තෙක් වේද, මෙහි ඇතැම් පුද්ගලයෙක් පාද ලොලත්වයෙන් යුක්තවූයේ වෙයි. ආරාමයෙන් ආරාමයට උයනෙන් උයනට ගමින් ගමට නියම්ගමින් නියම් ගමට නුවරින් නුවරට රටින් රටට ජනපදයෙන් ජනපදයට දීර්ඝ චාරිකාවෙහි පසුකොට යාමෙහි යෙදුනේ වාසයකරයි. මෙසේද පාද ලොලත්වයෙන් යුක්ත වෙයි. යලිදු හෝ මහණතෙම සංඝාරාමය ඇතුළතද පාද ලොලත්වයෙන් යුක්ත වෙයි. වැඩක් නැතිව කාරණයක් නැතිව විසුරුණු සිත් ඇත්තේ ශාන්ත නොවූ සිත් ඇත්තේ පිරිවෙණෙන් පිරිවණට යයි. විහාරයෙන් විහාරයට යයි. අඩ්ඪ යොගයෙන්ව (ගුරුළු පියාපත් වැනි වහල ඇති ගෙය) අඩ්ඪ යොගයට යයි. ප්‍රාසාදයෙන් ප්‍රාසාදයටයයි

ගුහාවෙන් ගුහාවට යයි ලෙනෙන් ලෙනටයයි. කුටියෙන් කුටියට යයි. කූටාගාරයෙන් කූටාගාරයට යයි. මැස්සෙන් මැස්සට යයි. මාලයෙන් මාලයට යයි. උද්දණ්ඩ නම් තැනින් උද්දණ්ඩ නම් තැනට යයි. උද්දොසිත නම් තැනින් උද්දොසිත නම් තැනට යයි. උපස්ථාන ශාලාවෙන් උපස්ථාන ශාලාවට යයි. මණ්ඩල මාලයෙන් මණ්ඩල මාලයට යයි. රුක් මුලින් රුක් මුලට යයි. යම්තැනක හෝ භික්ෂූහු හිඳ ගනිද්ද එතනට යයි. එහි එක් අයෙකුට දෙවැන්නෙක් වෙයි. දෙදෙනෙකුට තුන් දෙනෙක් වෙයි තුන් දෙනෙකුට සතර දෙනෙක් වෙයි. එහි බොහෝ හිස් වචන කථා කරයි ඒ කෙසේද, රජුන් පිළිබඳ කථා (14-8) 3 (ii) යොදා ගතයුතුයි) මෙසේද පාද ලොලත්වය ඇත්තේ වෙයි. පාද ලොලත්වය නොවන්නේය යනු පාද ලොලත්වය දුරු කරන්නේය. බැහැර කරන්නේය නූපදනා බවට පමුණුවන්නේය. පාද ලොලත්වයෙන් දුරුවූයේ ඈත්වූයේ ඉවත්වූයේ නික්මුනු කෙනෙක් වූයේ සීමා රහිත සිතින් වාසය කරන්නේය. හැසිරෙන්නේය පාලනය කරන්නේය. යැපෙන්නේය. විවේකයෙන් යුක්තවූවෙක් වන්නේය. විවේකයෙහි ඇළුනෙක් වන්නේය. ඇතුළත සිත සංසිඳීමෙහි යෙදුනේ ධ්‍යානය නොපිරිහෙලුනේ විදර්ශනාවෙන් යුක්තවූවෙක් වන්නේය. ශූන්‍යාගාරයන්හි ගුණ කියන්නේ ධ්‍යාන කරණ සුළුවූයේ ධ්‍යානයෙහිද ඇලුනේ හුදකලාවූයේ යහපත් අර්ථය ගරු කරන්නේ වෙයි. "කුකුස දුරු කරන්නේය. ප්‍රමාද නොවන්නේය" යන්නෙහි අත පිළිබඳ කුකුසද කුකුසකි. පය පිළිබඳ කුකුසද කුකුසකි (මෙහි (10-3) 4 (i) යොදාගත යුතුයි.)

3 "කුකුස දුරු කරන්නේය" යනු කුකුස දුරු කරන්නේය. ඈත් කරන්නේය. කුකුස සන්සිඳු වන්නේය කුකුස දුරුවූවෙක් වන්නේය. වෙන්වූයේ, නික්මුනේ, සීමා නොකළ සිතින් වසන්නේය. කුකුසෙන් වෙන් වන්නේය. යනුයි. ප්‍රමාද නොවන්නේය යනු සැලකිලි ඇතිවන්නේය. නිතර ක්‍රියා කරන්නේය නොපසුබට වන්නේය. බහා නොතැබූ කැමැත්ත ඇතිවන්නේය. නොතැබූ වීර්‍ය්‍යය ඇතිවන්නේය කුශල

ධර්මයන්හි අප්‍රමාදව වසන්නේය. කවදා මම සම්පූර්ණ සිල් පුරන්නෙම්ද පුරණ ලද සිල් හෝ ඒ ඒ තැන නුවණින් අනුග්‍රහ කරන්නෙම් දැයි යමෙක් එහි කැමැත්තද උත්සාහයද ශක්තියද පසු නොබැසීමද සිහියද මනා නුවණද කටයුතු කිරීමද ධෛර්‍ය්‍යයද අධිෂ්ඨානයද යෙදීමද කුශල ධර්මයන්හි අප්‍රමාදයද කරන්නේද කවදා මම නොපුරණ ලද සමාධි ස්කන්ධය, ප්‍රඥා ස්කන්ධය, විමුක්ති ස්කන්ධය, විමුක්ති ඥාන දර්ශන ස්කන්ධය, ඇති කරන්නේද, කවදා මම නොදන්නාලද දුක්ඛ සත්‍යය දැනගන්නෙම්ද, ප්‍රහීණ නොවූ කෙලෙස් දුරු කරන්නෙම්ද, නොවඩන ලද මාර්ගය වඩන්නෙම්ද ප්‍රත්‍යක්ෂ නොකරණ ලද නිරොධය ප්‍රත්‍යක්ෂ නොකරන්නෙම් දැයි යමෙක් එහි කැමැත්තද ව්‍යායාමයද උත්සාහයද ශක්තියද නොපසුබස්නා බවද සිහියද මනා නුවණද යොදන්නෙම්දැයි කුශල ධර්මයන්හි අප්‍රමාදය වඩන්නේද යනුයි.

4 "ඉක්බිති ආසනයන්හිද නිශ්ශබ්ද තැන්වලද භික්ෂු තෙම වාසය කරන්නේය" යන්නෙහි 'ඉක්බිති' යනු පද ගැලපීමයි, පදපූරණයි. යම්තැනක වැඩහිඳීද, ඇඳ, පුටුව, බිස්ස, මැස්ස, පත්කඩ, සම්කඩ, තණ ඇතිරිය, කොළ ඇතිරිය, පිදුරු ඇතිරිය, යන මේවා ආසනයයි කියයි. තවද සෙනාසනය, විහාරය, ගුරුළු පියාපත් වැනි ගෙය, උසස් ප්‍රාසාදයද යනුයි.

5 "නිශ්ශබ්ද තැන්හි භික්ෂුතෙම වාසය කරන්නේය" යනු අල්පවූ ශබ්ද ඇති තැන්වල අල්පවූ ඝොෂා ඇති තැන්වල මිනිසුන්ගෙන් පීඩා නැති තැන්වල, මිනිසුන්ගේ රහස් කටයුතුවලට යොග්‍ය තැන්වල, චිත්ත විවේකයට සුදුසු සෙනාසනයන්හි හැසිරෙන්නේය. වාසය කරන්නේය. ඉරියවූ පවත්වන්නේය යැපෙන්නේය යනුයි.

## 14 - 12

1 "නිද්‍රාව බහුල නොකරන්නේය" යනු රෑ දාවල් දෙක කොටස් සයක් කොට පස්කොටසෙක පිළිපදනේය. එක් කොටසෙක වැද හෝනේය යනුයි

2 "කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ නිදිවර්ජිත කිරීම භජනය කරන්නේය" යනු මේ ශාසනයෙහි මහණතෙම දවල් කාලය සක්මනින් වැඩහිඳීමෙන් ආවරණ ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරන්නේය. රාත්‍රියෙහි ප්‍රථම යාමය සක්මනෙන් හා වැඩහිඳීමෙන් ආවරණ ධර්මයන්ගෙන් සිත හික්මවන්නේය. රාත්‍රියෙහි මධ්‍යම යාමය පයින් පය එකට තබා සිහි ඇත්තේ මනා නුවණැත්තේ නැගිටීමේ සංඥාව සිහිකොට දකුණැලයෙන් සීහ සෙයාාව කරන්නේය. රාත්‍රී පශ්චිම යාමයෙහි නැගිට සක්මනින් වැඩහිඳීමෙන් ආවරණ ධර්මයන් ගෙන් සිත පිරිසිදු කරන්නේය

3 "නිදිවර්ජිත කිරීම භජනය කරන්නේය" යනු නිදිවර්ජිත කිරීම භජනය කරන්නේය. සේවනය කරන්නේය යනුයි.

4 "කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ" යන්නෙහි ආතප්ප යයි වීර්‍ය්‍යයට කියයි. හෙතෙම චෛතසික වීර්‍ය්‍යාරම්භයෙන් යුක්තවූයේ ඉදිරිගමන් ඇති දැඩි උත්සාහයෙන් යුක්තවූයේ ලිහිල් නොකරණලද පරාක්‍රම ඇත්තේ, බහා නොතැබූ කැමැත්ත ඇත්තේ, බහානොතැබූ වීර්‍ය්‍ය ඇත්තේ, වීර්‍ය්‍යය දැඩිකොට ගත්තේ, වීර්‍ය්‍යය වීර්යෙන්ද්‍රිය, වීර්‍ය්‍ය බලය, සම්‍යක් ව්‍යායාමය, යන උත්සාහයන්ගෙන් යුක්තවූයේ පැමිණියේයයි කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ නම් යනුයි.

5 "මැලිකම රැවටිල්ල සිනාව ක්‍රීඩාව මෛථුනය සැරසීම දුරුකරන්නේය" යන්නෙහි යම් මැලිකමක් ඇද්ද, මැලි සිතක් ඇද්ද, අලසබවක් අලසවීමක් ඇද්ද මේ නන්දියයි කියයි, රැවටිල්ල යනු රැවටිලි හැසිරීමයි. මෙහි ඇතැම් පුද්ගලයෙක් කයින් දුසිරිතෙහි හැසිර, වචනයෙන් දුසිරිතෙහි හැසිර සිතින් දුසිරිතෙහි හැසිර එය වැසීමේ හේතුවෙන් ලාමක ආශාවකට බසියි. මා නොදනීවායි සිතයි මා නොදනීවායි කල්පනාකරයි. මා නොදනීවායි වචන කියයි. මා නොදනීවායි කයින් උත්සාහ කරයි. යම් එබඳු රැවටිල්ලක් මායාවක් කෛරාටික කමක් සැඟවීමක් වැසීමක් විවෘත නොකිරීමක් පාප ක්‍රියාවක් ඇද්ද

මේ රැවටිල්ල යයි කියයි. "සිනහව" යනු මෙහි ඇතැම් පුද්ගලයෙක්, අධික වේලාවක් දත් විදහමින් සිනාසෙයි භාග්‍යවතුන්වහන්සේ විසින් මෙය දෙශනාකරණ ලදී මහණෙනි, මේ ආර්‍ය්‍ය විනයෙහි බොහෝ වේලා දත් විදහා සිනාසීමක් ඇද්ද එය ළමයින්ට අයත් යයි කියයි.

6 "ක්‍රීඩා" නම් ක්‍රීඩා දෙකකි. කායික ක්‍රීඩාවද වාචසික ක්‍රීඩාවද යනුයි. කායික ක්‍රීඩාව කවරීද? ඇතුන් සමග ක්‍රීඩා කරයි. අසුන් සමග ක්‍රීඩා කරයි. රථවලින් ක්‍රීඩාකරයි. දුනු වලින් ක්‍රීඩාකරයි. පාද අටක් ඇති (දාන්ලෑලි ආදි යමකින් ක්‍රීඩාකරත්. පාද දහයක් ඇති යමකින් ක්‍රීඩාකරත්. අහසෙහි ක්‍රීඩාකරත්. බිම රවුන් තනා පැන පැන ක්‍රීඩාකරත්. දාදුකැට නොසොල්වා නියෙන් ගසා ක්‍රීඩා කරත්. කල්ලි ගසත්. දාදු කෙළිත්. මඩෙහි ඉරි අඳිමින් ඉරටුවලින් බිත්තිවල ඇත් අස් රූප තනා ක්‍රීඩා කරත් පන්දු කෙළිත්. නලා පිඹිත් ක්‍රීඩා නගුල්ගෙන සීසාත්. තල්පත් ආදියෙන් කන්නන් ගුරුව තනා ක්‍රීඩා කරත් කොළ නැලියෙන් වැලි මැන ක්‍රීඩාකරත්. කුඩා රථයෙන් ක්‍රීඩාකරත් කුඩා දුන්නෙන් ක්‍රීඩාකරත්. අහසෙහි හෝ පිටෙහි අකුරු ඇඳ ක්‍රීඩාකරත් සිතුදේ කියවීම් ආදියෙන් ක්‍රීඩා කරත් ඒ ඒ රූප දක්වා ක්‍රීඩා කරත්. මේ කායික ක්‍රීඩාවෝ වෙති. වාචසික ක්‍රීඩා කවරීද? මුඛය නමැති බෙරය, මුඛ නමැති එකාස් බෙරය, මුඛ වීනාව, මුඛ හෙරුලකය, මුඛ පනාබෙරය (යොදවා) රඟ දැක්වීම්, නැටීම ගීකීම ක්‍රීඩාකිරීම යන මේවා කිරීම වාචසික ක්‍රීඩාවයි. "මෛථුන ධර්මය නම් යම් ඒ අසද්ධර්මයක් ඇද්ද ග්‍රාම්‍ය ධර්මයක් ඇද්ද වසල ධර්මයක් ඇද්ද කාමුක වචන ඇති ලාමක රහසිගත දෙදෙනෙකුගේ එක්වීමක් ඇද්ද එයයි. කවර කරුණකින් මෛථුන ධර්මය යයි කියත්ද? කාමයෙන් මැඩුන රාගයෙන් රත්වූ රාගයෙන් මැඩගෙන යටකොට සිටි දෙදෙනෙකුට සමානවූ ධර්මයයි. ඒ කාරණයෙන් මෛථුන ධර්මයයි කියයි. කලහකරුවන් දෙදෙනෙකුට මෛථුනයයි යම්සේ කියත්ද කථා කරණ දෙදෙනෙකුට නඩු කියාගන්නා දෙදෙනෙකුට විවාද කරගන්නා දෙදෙනෙකුට වාදකරගන්නා

දෙදෙනෙකුට තොරතුරු කථාකරණ දෙදෙනෙකුට මෛථුන කියයි කියත්ද එපරිද්දෙන් රාගයෙන් රත්වූ රාගික අදහස් ඇති එයින් මැඩුන දෙදෙනෙකුට සමාන ධර්මයයි. ඒ කාරණයෙන් මෛථුන ධර්මය යයි කියත්. 'අලංකාර' නම් අලංකාර දෙකොටසකි ගිහියන්ට අයත් 'අලංකාර' දේ ඇත පැවිද්දන්ට අලංකාර දේද ඇත. ගිහියන්ට අලංකාර කවරේද? එනම්, රැවුල්ද, මාලාද, සුවඳද, විලවුන්ද, ආභරණද, පළඳනාද, වස්ත්‍රද, යහන්ද, ආසනද හිස්වෙළුම්ද, ඇඟ ඉලීම්, ඇඟමැදීම්, නැවීම්, ඇඟ මැඩීම්, කැඩපත්, අඳුන්, මාලා විලවුන්, මුඛ චූර්ණ, මුඛාලෙප, අත්වල බඳිනදේ, සිඛාවෙහි බඳිනදේ, සැරයටිය, කඩුව, කුඩය, විසිතුරු වහන්, නළල්පට, මැණික, වල්විදුනාව, සුදුවස්ත්‍ර, දුරදක්නය යන මේවා ගිහියාගේ පළඳනාවෝයි. පැවිද්දාගේ පළඳනාවෝ කවරහුද? චීවරා භරණය, පාත්‍රා භරණය, සේනාසනා භරණය, මේ කුණු කයෙන් බාහිර පිරි කරවල පැළඳීම, සැරසීම එහි ආශාව, ගිජුවීම, චපලකම, යන මේ පැවිද්දාගේ ආභරණයෝ වෙති. "මැලිකම, රැවටිල්ල, සිනාව ක්‍රීඩාව, මෛථුනය, සැරසීම දුරුකරන්නේය" යනු මැලිකම, රැවටිල්ල, සිනාව, ක්‍රීඩාව මෛථුන ධර්මයද සැරසීම සහිත බවද, පිරිවර සහිත බවද, භාණ්ඩ සහිත බවද, පිරිකර සහිත බවද දුරුකරන්නේය. බැහැර කරන්නේය. නූපදනාබවට පමුණුවන්නේය යනුයි.

## 14 - 13

1 "ආථර්වණයද ස්වප්න ශාස්ත්‍රයද ලකුණු කීමේ ශාස්ත්‍රයද නොකරන්නේය. එසේම නැකැත් කීමද නොකරන්නේය" යනු නගරය හෝ වටකළ කල්හි යුද්ධයක් හෝ පැමිණි කල්හි අන්‍ය සේනාවෙහි සතුරන් කෙරෙහි සූනියම් කරත්, භය උපදවත්, උපද්‍රව උපදවත්, සූලනම් රෝගය ඇතිකරවත්, අතීසාරය ඇති කරවත්, ලේ අතීසාරය ඇති කරවත්, මෙසේ මන්ත්‍රකරුවෝ මන්ත්‍ර කරත්. සිහින කියන්නෝ සිහින තෝරත්, යමෙක් පෙරවරු කාලයෙහි සිහිනයක් දකීද, මෙසේ විපාක ඇති වෙයි. යමෙක්

මධ්‍යාහ්න කාලයෙහි සිහිනයක් දකීද, මෙබඳු විපාකයක් වෙයි. යමෙක් සවස් කාලයෙහි සිහිනයක් දකීද, මෙබඳු විපාක ඇත්තේ වෙයි. යමෙක් පෙරයම සිහිනයක් දකීද මෙබඳු විපාක ඇත්තේවෙයි. මධ්‍යම යාමයෙහි සිහිනයක් දකීද, මෙබඳු විපාක ඇත්තේ වෙයි. පශ්චිම යාමයෙහි සිහිනයක් දකීද මෙබඳු විපාක ඇත්තේ වෙයි. යමෙක් දකුණු පසින් වැදහොත්තේ සිහිනයක් දකීද, මෙබඳු විපාක ඇත්තේ වෙයි. යමෙක් වම්පසින් වැදහොත්තේ සිහිනයක් දකීද මෙබඳු විපාක ඇත්තේ වෙයි යමෙක් උඩුපසට වැද හොත්තේ සිහිනයක් දකීද මෙබඳු විපාක ඇත්තේ වෙයි. යමෙක් යටිපසට වැදහොත්තේ මෙබඳු විපාක ඇත්තේ වෙයි යමෙක් සිහිනෙන් සඳ දකීද යමෙක් හිරු දකීද, යමෙක් මහ සමුදුර දකීද, යමෙක් මහාමෙරු පර්වත රාජයා දකීද, යමෙක් ඇතුන් දකීද, යමෙක් අශ්වයකු දකීද, යමෙක් රියක් දකීද යමෙක් පාබල සෙනඟක් දකීද යමෙක් මහාසේනාවක් දකීද යමෙක් රමණීයවූ ආරාමයක් දකීද, යමෙක් රමණීයවූ වනයක් දකීද යමෙක් රමණීයවූ භූමියක් දකීද, යමෙක් රමණීයවූ පොකුණක් දකීද මෙසේ විපාකවේයයි මෙසේ සිහින ලකුණු කියන්නෝ සිහින විස්තර කරත්.

2 "ලක්ෂණ ශාස්ත්‍රය කියන්නෝ ලක්ෂණ විස්තර කරත්" යනු මණි ලක්ෂණය, දණ්ඩ ලක්ෂණය, වස්ත්‍ර ලක්ෂණය, කඩුලක්ෂණය, ඊතල ලක්ෂණය, ආයුධලක්ෂණය, ස්ත්‍රී ලක්ෂණය, පුරුෂලක්ෂණය, කුමාරිකාලක්ෂණය කුමාරලක්ෂණය, දාස ලක්ෂණය, හස්ති ලක්ෂණය, අශ්ව ලක්ෂණය, මීමුන්ගේ ලක්ෂණය, නායක ගොනුන්ගේ ලක්ෂණය, සාමාන්‍ය ගොනුන්ගේ ලක්ෂණය, එළු ලක්ෂණය, බැටළු ලක්ෂණය, කුකුල් ලක්ෂණය, වටු ලක්ෂණය, ගොයි ලක්ෂණය, කර්ණිකා ලක්ෂණය, කැසුබු ලක්ෂණය, මුව ලක්ෂණය හෝ යනුයි

3 මෙසේ ලකුණු කියන්නෝ ලකුණු ප්‍රකාශ කරත්. නැකැත් කියන්නෝ නැකැත් ප්‍රකාශ කරත්. නැකැත් විසි අටෙකි. මේ නැකතින් ගෙවදීම කටයුතුයි. මේ නැකතින් හිසේ පළඳනා ආභරණ බැඳිය යුතුයි. මේ නැකතින් විවාහ යෝජනාව කටයුතුයි. මේ නැකතින් බීජ නිහාරය (අස්වැන්න කැපීම)

කටයුතුයි. මේ නැකතින් සංවාසය කටයුතුයි මෙසේ නැකැත් කියන්නෝ නැකැත් විස්තරකොට කියත්.

4 "අථර්වණයද, ස්වප්න ශාස්ත්‍රයද ලක්ෂණ ශාස්ත්‍රයද එසේම නැකැත් කීමද නොකරන්නේය" යනු මන්ත්‍ර ශාස්ත්‍රයද ස්වප්න ශාස්ත්‍රයද ලක්ෂණ ශාස්ත්‍රයද නැකැත් කීමද නොකරන්නේය නොහැසිරෙන්නේය එයගෙන නොහැසිරෙන්නේය යලිදු හෝ නොගන්නේය, නොදරන්නේය සලකා නොබලන්නේය නොයෙදෙන්නේය යනුයි

5 "තිරිසනුන්ගේ හඬ දැන කීමද ගැබ් කිරීමද වෙදකමද බුද්ධමාමකතෙම ඇසුරු නොකරන්නේය" යන්නෙහි විරුත යනු තිරිසනුන්ගේ වචනයි තිරිසනුන්ගේ වචන කියන්නෝ තිරිසනුන්ගේ වචන විස්තර කරත්. පක්ෂීන්ගේ හෝ තිරිසනුන්ගේ හෝ හැඬලීම ශබ්දය දනිත්, මෙසේ මෘගයන්ගේ වචන කියන්නෝ මෘග වාක්‍ය විස්තර කරත්. ගැබ් කරන්නෝ ගැබ් ඇති කරත්. කරුණු දෙකකින් ගර්භය ඇති නොවෙයි. පණුවන්ගෙන් හෝ වාතය කිපීමෙන් හෝ යනුයි. පණුවන් හෝ වාතය කිපීම හෝ දුරු කිරීම පිණිස ඖෂධ දෙත්, මෙසේ ගැබ් කරන්නෝ ගැබ් ඇති කරවත් "වෙදකම" යනු වෙදකම් පසෙකි. තඹ ආදී කුරුයොදා කරණ වෙදකම ආයුධ යොදවා කරණ සල්ලාචිකිත්සාව, කායචිකිත්සාව ධාතුමූලක රෝගයන්ට කරණ චිකිත්සාව කුමාරචිකිත්සාව (ළමයින්ට කරණ වෙදකම) යනුයි "මාමක තැනැත්තේ" යනු බුද්ධ මාමක, ධම්ම මාමක' සංඝමාමක යනුයි.

6 "හෙතෙමේ හෝ භාග්‍යවතුන් වහන්සේට මමායනය කරයි. භාග්‍යවතුන් වහන්සේ හෝ ඒ පුද්ගලයා පිළිගනියි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලදී "මහණෙනි යම් ඒ භික්ෂූහු කුහකද, තදගති ඇත්තාහුද චාටුබස් කියන්නාහුද, ඉදිරියෙහි ගමන් කරණ මානය ඇත්තෝද, එකග නොවූ සිත් ඇත්තෝද මහණෙනි, මේ භික්ෂූහු මාමකයෝ නොවෙත්, මහණෙනි, ඒ භික්ෂූහු මේ ශාසනයෙන් ඉවත්වූවෝ වෙත්. ඒ භික්ෂූහු මේ ශාසනයෙහි වැඩීමට උසස් බවට නොපැමිණෙත්.

මහණෙනි, යම් ඒ භික්ෂූහු කුහක නැත්තෝද තදගති නැත්තෝද චාටුබස් නොකියන්නෝද ඉදිරියෙහි ගමන් කරණ මානය නැත්තෝද එකඟවූ සිත් ඇත්තෝද මහණෙනි, ඒ භික්ෂූහු මාමකයෝ වෙත්. මහණෙනි, ඒ භික්ෂූහු මේ ධර්ම විනයෙන් පහනොවූවෝ වෙත්. මහණෙනි, ඒ භික්ෂූහු මේ ශාසනයෙහි වැඩීමට උසස් බවට පැමිණෙත්.

"කුහකවූ තදවූ ඉදිරියෙහි ගමන් කරණ මානය ඇති නොසන්සුන්වූ ඔවුහු බුදුරදුන් වහන්සේ විසින් දෙසිත ශාසනයෙහි වැඩීමට නොපැමිණෙත්, කුහක නැති තද නැති ඉදිරියෙහි ගමන් කරණ මානය නැති සන්සුන් ඔවුහූ බුදුරජානන් වහන්සේ විසින් දෙසිත ශාසනයෙහි වැඩීමට පැමිණෙත්.

"සතුන්ගේ හඬ කීමද ගැබ් කිරීමද වෙදකමද මාමකතෙම සේවනය නොකරන්නේය. නොහැසිරෙන්නේය යලිදු හෝ නොගන්නේය, නූගන්නේය, සලකා නොලබන්නේය යනුයි.

## 14 - 14

1 "නින්දාවෙන් කම්පා නොවන්නේය" යනු මෙහි ඇතැම් කෙනෙක් ජාතියෙන් හෝ ගෝත්‍රයෙන් හෝ කුලපුත්‍රකමින් හෝ පැහැසපුවෙන් හෝ ධනයෙන් හෝ ඉගෙණීමෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ වෙනින් අනික් කාරණයකින් හෝ භික්ෂුවට නින්දා කරත්. ගර්හා කරත්. උපවාද කරත්. නින්දා කරණ ලද්දේ ගර්හා කරණ ලද්දේ උපවාද කරණ ලද්දේ නින්දාවෙන් ගර්හාවෙන් උපවාදයෙන් අපකීර්තියෙන් අගුණ කීමෙන් කම්පා නොවන්නේය. නොසැලෙන්නේය. ත්‍රස්ත නොවන්නේය, නොකියන්නේය, බිය නොවූවෙක් වන්නේය, තැතිනොගත්තෙක් වන්නේය, පහ කළ භය භෛරව ඇත්තේ පහකළ ලොමුඩැහැගැනීම් ඇත්තේ වාසය කරන්නේය යනුයි.

2 "මහණතෙම ප්‍රශංසා කරණ ලද්දේ මානය නොකරන්නේය" යනු මෙහි ඇතැම් කෙනෙක් භික්ෂුවට ප්‍රශංසා

කරත්. ජාතියෙන් හෝ ගෝත්‍රයෙන් හෝ කුලපුත්‍රකමින් හෝ පැහැසපුවෙන් හෝ ධනයෙන් හෝ ඉගෙණීමෙන් හෝ කර්මායතනයෙන් හෝ ශිල්පායතනයෙන් හෝ විද්‍යායතනයෙන් හෝ ශ්‍රුතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ වෙනින් අනික් වස්තුවකින් හෝ ප්‍රශංසා කරත්. ස්තුති කරත්, ගුණ කියත්, ප්‍රශංසා කරණ ලද්දේ ස්තුති කරණ ලද්දේ, වර්ණනා කරණ ලද්දේ, ප්‍රශංසාවෙන් ස්තුතියෙන් වර්ණනාවෙන් උසස් ගතිය ඇති නොකරන්නේය, මානය නොකරන්නේය දැඩිගතිය ඇති නොකරන්නේය, එයින් මානය නූපදවන්නේය, එයින් දැඩි කෙනෙක් නොවන්නේය, මානයෙන් ඔසවා ගත් හිස ඇත්තෙක් නොවන්නේය යනුයි.

3 "මසුරුකම සමග ලොභයද ක්‍රොධයද කේලාම් කීමද දුරුකරන්නේය" යන්නෙහි ලොභය නම් යම් ලොභයක් ලෝභී බවක් ඇලීමක් ඇලීම් බවක් දැඩි ලොභයක් අකුශල මූලයක් ඇද්ද එයයි මසුරුකම යනු මසුරුකම් පසකි. ආවාසයෙහි මසුරුකම (මෙහි (6 6) 2 (ii) යොදාගත යුතුයි) ගැනීමක් ඇද්ද එය මසුරුකමයි.

ක්‍රොධය නම් යම් චිත්තයාගේ ලොභයක් ඇද්ද, හැපීමක් ඇද්ද, විරුද්ධතාවක් ඇද්ද, කෝපයක් විශෙෂ කෝපයක් නැගුනු කෝපයක් ඇද්ද ද්වෙෂයක් දූෂ්‍ය බවක් ඇද්ද ව්‍යාපාදයක් ව්‍යාපාද බවක් විරුද්ධ බවක්, චණ්ඩගතියක්, කඳුලු හෙලීමක් චිත්තයාගේ නොසතුටු බවක් ඇද්ද එයයි.

"කේලම" නම් මෙහි ඇතැම් පුද්ගලයෙක් කේලාම් කියන්නේ වෙයි. මෙයින් අසා මොවුන්ගේ බිඳීම පිණිස අසවල් තැන කියන්නේ වෙයි අසවල් තැන හෝ අසා ඒ තැනැත්තන්ගේ බිඳීම පිණිස මොවුන්ට කියන්නේ වෙයි. මෙසේ සමගිවූවන් බිඳවීම පිණිස, බිඳුන අයට අනුබලදීම පිණිස වෙන් කිරීමෙහි ඇලුනේ වෙන්කිරීමෙහි යෙදුනේ වෙන්කිරීමේ වචන කියන්නේ වෙයි. මෙය කේළමයයි කියයි. නැවතද කරුණු දෙකකින් කේළම ඇති කරයි. ප්‍රිය බැව් ඇතිකිරීමට හෝ බිඳුවන අදහසින් හෝ යනුයි, කෙසේ ප්‍රිය බැව් කැමැත්තෙන් කේළම ඇතිකරද්ද,

මොහුට ප්‍රියයෙක් වන්නෙමි. මනාපයෙක් වන්නෙමි, විශ්වාසිකයෙක් වන්නෙමි. අභ්‍යන්තරිකයෙක් වන්නෙමි. සුහෘදයෙක් වන්නෙමියි මෙසේ ප්‍රියබැව් කැමැත්තෙන් කේළම ඇතිකරයි. කෙසේ බිඳීමේ අදහසින් කේළම ඇතිකරයිද, කෙසේ මොවුහු වෙන්වන්නෝද වර්ගවන්නෝද දෙකොටසක් වන්නෝද බිඳෙන්නාහුද එක්නොවන්නාහුද දුකසේ නොපහසුව වාසය යෙදුනෝ වෙන්කිරීමෙහි සතුටුවූයේ වෙන්කරණ පිණිස කියන්නේ වෙයි. මෙය කේළමයයි කියයි නැවතද කරුණු දෙකකින් කේළම රැස්කරයි. ප්‍රියවීමේ කැමැත්තෙන් හෝ බිඳීමේ කැමැත්තෙන් හෝ යනුයි. ප්‍රියවීමේ කැමැත්තෙන් කෙසේ කේළම රැස් කෙරේද, මොහුට ප්‍රියයෙක් වන්නෙමි. මන වඩන්නෙක් වන්නෙමි. විශ්වාසයෙක් වන්නෙමි අභ්‍යන්තරිකයෙක් වන්නෙමි සුහෘදයෙක් වන්නෙමියි මෙසේ ප්‍රියබව කැමැත්තෙන් කේළම රැස්කරයි. බිඳවීමේ කැමැත්තෙන් කෙසේ කේළම රැස්කරයිද, කෙසේ මොවුහු වෙන්වන්නාහුද කොටස් වන්නාහුද බෙදෙන්නාහුද එකතු නොවෙන්නාහුද පහසුවිහරණය දුකසේ කරන්නාහුද යනුයි. මෙසේ බිඳීමේ අදහසින් කේළම රැස්කරයි "ලොභය සහ මසුරුකම සමග ක්‍රොධයද කේළමද දුරලන්නේය යනු ලොභයද මසුරුකමද ක්‍රොධයද කේළමද දුරලන්නේය. බැහැර කරන්නේය. ඇත්කරන්නේය. නොඉපදීමට පමුණුවන්නේය යනුයි.

## 14 - 15

1 "ගණුදෙනු කිරීමෙහි නොසිටින්නේය" යනු යම් ඒ ගණුදෙනුව විනයෙහි ප්‍රතික්ෂෙප කරණ ලදී. එය මේ අර්ථයෙහි බලාපොරොත්තු නොවෙන ලදී. කෙසේ ගණුදෙනු කිරීමේ යෙදේද, පඤ්ච සහ ධාර්මිකයන් සමග පාත්‍රය හෝ සිවුර හෝ අනික් කිසියම් පිරිකරක් හෝ රැවටිලි කරන්නේ වැඩීම ප්‍රාර්ථනා කරන්නේ ඔවුන්ගේ දෙය ගෙන තමාගේ දෙය දේද මෙසේ ගණුදෙනු කිරීමෙහි යෙදෙයි. කෙසේ ගණුදෙනු කිරීමෙහි නොයෙදෙන්නේද, යනු පඤ්ච සහ ධාර්මිකයන් සමග පාත්‍රය හෝ සිවුර හෝ වෙනින් අනික් පිරිකරක් හෝ රැවටිලි

නොකරන්නේ වැඩිවීමක් බලාපොරොත්තු නොවන්නේ තමන්ගේ දෙයදී අනුන්ගේ දෙය ගනීද මෙසේ ගණුදෙනු වෙහි නොයෙදෙයි. ගණුදෙනුවෙහි නොසිටින්නේය. නොයෙදෙන්නේය. ගණුදෙනුව දුරුකරන්නේය. සංසිඳුවන්නේය. දුරලන්නේය, නූපදනා බවට පමුණුවන්නේය. ගණුදෙනුවෙන් ඇත්වන්නේය. වෙන්වූවෙක් වන්නේය. වෙන්වූයේ නික්මුනේ මිදුනේ සීමා නොකළ සිතින් වසන්නේය යනුයි.

2 "භික්ෂුතෙම කොහිදීවත් උපවාදකර කෙලෙස් ඇති නොකරන්නේය" යන්නෙහි උපවාදකර කෙලෙස් කවරහුද? ඍද්ධිමත් දිවැස් ඇති අනුන්ගේ හිත් දන්නා ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ. ඔවුහු දුරින් දකිත් ආසන්නයෙහි නොදකිත්. සිතින්ද සිත දනිත්. ඍද්ධිමත් දිවැස් ඇති අනුන්ගේ සිත් දන්නා දේවතාවෝද ඇත්තාහ. ඔවුහු දුරින් දකිත්. ආසන්නයෙහි නොදකිත් සිතින්ද සිත දනිත් ඔවුහු ඖදාරික ක්ලෙශයන්ගෙන් හෝ මධ්‍යම ක්ලෙශයන්ගෙන් හෝ සියුම්වූ ක්ලෙශයන්ගෙන් හෝ උපවාද කරන්නාහුද, ඖදාරික ක්ලෙශයෝ කවරහුද? කාය දුශ්චරිතය, වාග් දුශ්චරිතය, මනස් දුශ්චරිතය යන මොවුහු ඖදාරික ක්ලෙශයෝ යයි කියත්. මධ්‍යම ක්ලෙශයෝ කවරහුද? කාම විතර්කය, ව්‍යාපාද විතර්කය, විහිංසා විතර්කය යන මොවුහු මධ්‍යම ක්ලෙශයෝ නම් වෙත් සියුම් කෙලෙස් කවරහුද? ඥාති විතර්කය, ජනපද විතර්කය, අමර විතර්කය, අනුන්ට දයාව ඉපදවීමේ විතර්කය, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවෙන් යුක්ත විතර්කය, නොකැමති බව පිළිබඳ විතර්කය යන මොවුහු සියුම් කෙලෙස්යයි කියත්. ඒ ඖදාරික ක්ලෙශයන් ගෙන් හෝ මධ්‍යම ක්ලෙශයන් ගෙන් හෝ සියුම් ක්ලෙශයන්ගෙන් හෝ උපවාද නොකරන්නේය, උපවාද කරවූ ක්ලෙශයන් ඇති නොකරන්නේය, නූපදවන්නේය. අභාවයට පමුණුවන්නේය. උපවාද කරවූ ක්ලෙශයන්ගෙන් දුරුවූවෙක් වන්නේය, වෙන්වූයේ නික්මුණේ සීමා නොකළ සිතින් වාසය කරන්නේය යනුයි. "කොහිවත්" යනු කොතැනදීමත් ඇතුළත හෝ පිටත හෝ ඇතුළත පිටත හෝ යනුයි.

3 "ගමෙහිද නොගැටෙන්නේය" යනු කෙසේ ගමෙහි ගැටේද? මෙහි භික්ෂුතෙම ගමෙහි ගිහීන් හා එකතුව එකට සතුටුවන්නේ එකට ශොකවන්නේ සුඛිතවූ කල්හි සුඛිත වන්නේ දුක්ඛිතවූ කල්හි දුක්වන්නේ වාසය කෙරේද, වැඩක් පැමිණි කල්හි තමන්ගේ උපකාරය දීමට පැමිණෙයි. මෙසේද ගමෙහි ඇලෙයි, මෙසේද ගමෙහි ගැටෙයි, යලිදු හෝ මහණ තෙම පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන ගමට හෝ නියම්ගමට හෝ පිඬු පිණිස හැසිරෙයි. නොරක්කාවූ කයින්ම නොරක්කාවූ වචනයෙන්ම නොරක්කාවූ සිතින්ම යොමුනොකළ සිහියෙන් අසංවර ඉන්ද්‍රියයන්ගෙන් හෙතෙම ඒ ඒ තැන ගැටෙයි, ඒ ඒ තැන ගනියි. ඒ ඒ තැන බැඳෙයි ඒ ඒ තන්හි විපත්තීන්ට පැමිණෙයි. මෙසේද ගමෙහි ඇලෙයි කෙසේ ගමෙහි නොඇලේද, මෙහි භික්ෂුව ගමෙහි ගිහීන් හා නොගැටුනේ වාසය කරයි. එකට සතුටු නොවන්නේ එකට ශොක නොකරන්නේ සැපවත්වූ කල්හි සැපවත් නොවන්නේ දුක්වූ කල්හි දුක් නොවන්නේ වෙයි. වැඩක් ඇතිවූ කල්හි තමන්ගේ උත්සාහය එහි නොයොදයි. මෙසේද ගමෙහි නොඇලෙයි. යලිදු හෝ භික්ෂුව පෙරවරුයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන ගමට හෝ නියම්ගමට හෝ පිවිසේද රැකුනාවූ කයින් රැකුනාවූ වචනයෙන් රැකුනාවූ සිතින් යොමුකළ සිහියෙන් සංවරවූ ඉන්ද්‍රියයන්ගෙන් හෙතෙම ඒ ඒ තැන නොගැටෙයි, ඒ ඒ තැන නොගනියි, ඒ ඒ තැන නොබැඳෙයි, ඒ ඒ තැන විපත්තීන්ට නොපැමිණෙයි. මෙසේද ගමෙහි නොඇලෙයි "ගමෙහිද නොඇලෙන්නේය" යනු ගමෙහි නොඇලෙන්නේය, නොගැටෙන්නේය. නොබැඳෙන්නේය, ගිජුවූවෙක් නොවන්නේය නොගැටුනේ මුලානොවූයේ නොගැලුනේ පහකළ ගිජුකම ඇතතේ වෙන්ව ගිය ගිජුකම ඇත්තේ බ්‍රහ්මයා බඳු ආත්මභාවයෙන් වාසය කරයි යනුයි.

4 "ලාභය කැමැත්තෙන් ජනයා සමග කථා නොකරන්නේය. යන්නෙහි ලපනය හෙවත් කථාකිරීම කවරේද? ලාභ සත්කාර කීර්තිවලින් යෙදුන පාපී ආශා ඇති ආශාවෙන් මඩනාලද

ආමිසයට ගිජුවූ ඇස් ඇති ලොකධර්ම ගරුකවූවහු ගේ යම්බඳු අනුන්ට ඇමතීමක් කථාකිරීමක් සාකච්ඡාවක් චාටු කථාවක් මුග්ගසූපය මෙන් සැබෑ බොරු මිශ්‍ර කථාවක් ඉදිරියේ ගුණ කියා පිටුපෑකල්හි නුගුණ කීමක් ඇද්ද එහි යම් තැනක මෘදු වචන ඇතිබව ලිහිල් වචන ඇති බව, නිරවුල් වචන ඇතිබව, නපුරුවචන නැතිබව වේද මෙය කල්පනාවයි නැවත කරුණු දෙකකින් ජනයා සමග කථාකරයි. තමන් හෝ පහත් ස්ථානයෙහි තබමින් අන්‍යයා උසස් ස්ථානයෙහි තබමින් අන්‍යයාට කථාකරයි. කෙසේ තමන් පහත් තැන තබා අනුන් උසස් තැන තබමින් කථාකෙරේද, "තෙපි මට බොහෝ උපකාරීහු වෙති. මෙම තොප නිසා චීවර, පිණ්ඩපාත සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබමි. යම් ඒ දෙයක් දෙන්ට හෝ කරන්ට හෝ සිතත්ද තොප නිසා තොප ස්පර්ශ කරමින්ය, යම්බඳු මාගේ පුරාණ මවු පියන්ගේ නම ඇත්තේය. එයද මට අමතකය. තොප නිසා මම අසවලාගේ කුලුපගයාය අසවලාගේ කුලුපගයායි දනිමි. මෙසේ තමන් නීච ස්ථානයේ තබා අන්‍යයා උසස් තැන තබමින් කථාකරයි. කෙසේ තමන් උසස් තැන තබා අන්‍යයා පහත්කොට කථා කෙරේද, මම තොපට බොහෝ උපකාර ඇත්තෙක්මි. තෙපි මා නිසා බුදුන් සරණ ගියාහු වෙති. දහම් සරණ ගියාහු වෙති සඟ සරණ ගියාහු වෙති. සතුන් මැරීමෙන්, සොරකමින්, කාමයෙහි වරදවා හැසිරීමෙන්, බොරුකීමෙන්, රහමෙර පානයෙන් වැළකුණාහු වෙති. මම තොපට කියාදීමත් කරමි. ප්‍රශ්න විසඳා දෙමි. පොහොය කියා දෙමි. නවකර්ම අධිෂ්ඨාන කරමි. එසේ නමුදු තෙපි මා හා කෝපව අනුන්ට සත්කාර කරව්ද, ගරු කරව්ද? බුහුමන් කරව්ද, මෙසේද තමා උසස් තැන තබා අනුන් පහත් තැන තබා ජනයාට කථාකරයි.

4 "ලාභය කැමැත්තෙන් ජනයාට කථා නොකරන්නේය." යනු ලාභ හේතුවෙන් ලාභය කරුණුකොට ලාභය ඉපදීමේ අදහසින් ලාභය සම්පූර්ණ කිරීමට ජනයාට කථා නොකරන්නේය. කථාකිරීම දුරලන්නේය. නූපදීමට පමුණු වන්නේය. (ඈවටිලි) කථාවෙන් දුරුවූවෙක් වන්නේය වෙන්වූයේ සීමා නොකළ සිතින් වසන්නේය යනුයි

## 14 - 16

1 "මහණතෙම පුරසාරම් කථා ඇත්තෙක් නොවන්නේය" යනු මෙහි ඇතැම් පුද්ගලයෙක් පුරසාරම් කථා කරන්නේය. මම "ශීලසම්පන්නයෙක්මි කියා හෝ ව්‍රත සම්පන්නයෙක්මි කියා හෝ ශීල ව්‍රතසම්පන්නයෙක්මි කියා හෝ ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලපුත්‍රකමින් හෝ පැහැසපුවෙන් හෝ ධනයෙන් හෝ ඉගෙණීමෙන් හෝ කර්මායතනයෙන් හෝ ශිල්පායතනයෙන් හෝ විද්‍යාස්ථානයෙන් හෝ ශ්‍රැතයෙන් හෝ වැටහීමෙන් හෝ අනික් කරුණකින් හෝ උසස් කුලයකින් පැවිදි වීමියි කියා හෝ මහා භොග කුලයකින් පැවිදිවීමියි කියා හෝ ඉතා මහත් භොග කුලයකින් පැවිදිවීමියි කියා හෝ සූත්‍ර පිටකය දන්නෙමියි කියා හෝ විනයධරයෙමි කියා හෝ ධර්මකථික වෙමියි කියා හෝ ආරඤ්ඤික වෙමියි කියා හෝ (3-3) 5 (ii) "රුක්ඛ මූලික" යන තැන සිට ආකිඤ්චඤ්ඤායතන යන තැනට යොදාගත යුතුයි) නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තිලාභියෙමි' කියා හෝ පුරසාරම් දොඩයි. මෙසේ පුරසාරම් නොදොඩන්නේය. පුරසාරම් දෙඩීම දුරලන්නේය. නූපදීමට පමුණුවන්නේය. පුරසාරම් දෙඩීමෙන් දුරුවූයේ වෙන්වූයේ නික්මුනේ සීමා නොකළ සිතින් වසන්නේය යනුයි.

2 'චීවරාදිය සම්බන්ධ වචන නොකියන්නේය." යන්නෙහි චීවරාදිය සම්බන්ධ වචන කවරේද? මෙහි ඇතැම් පුද්ගලයෙක් සිවුරු පිළිබඳ කථා කියයි. පිණ්ඩපාතය ගැන කථා කියයි. සේනාසන ගැන කථා කියයි. ගිලන්පස බෙහෙත් පිරිකර ගැන කථා කියයි මේ ප්‍රයුක්ත (චීවරාදිය පිළිබඳ) කථායයි කියති. යලිදු හෝ සිවුරු හේතුවෙන් පිණ්ඩපාත හේතුවෙන් සෙනාසන හේතුවෙන් ගිලන්පස බෙහෙත් පිරිකර හේතුවෙන් ඇත්තද කියයි. බොරුද කියයි. කේළාම්ද කියයි. කේළාම් නොවන වචනද කියයි. නපුරු වචනද කියයි. නපුරු නොවන වචනද කියයි. හිස්වචනද කියයි. හිස් නොවන වචනද කියයි. ප්‍රමාණවත් වචනද කියයි. මේද ප්‍රයුක්ත වචනයයි කියත්. යලිදු හෝ පැහැදුනා වූ සිතින් අනුන්ට බණ කියයි 'අනේ මාගේ ධර්මය

අසන්නාහු නම් අසා ධර්මයෙහි පැහැදෙන්නාහු නම් පැහැදුනාහු මට පැහැදුන අයුරක් කරන්නාහු නම් යෙහෙක' යනුයි. මේද ප්‍රයුක්ත වචනයයි කියත්. ප්‍රයුක්ත වචන නොකියන්නේය යනු යටත් පිරිසෙයින් ධර්මදෙශනා වචන පටන් ප්‍රයුක්ත වචන නොකියන්නේය. ව්‍යවහාර නොකරන්නේය. ප්‍රයුක්ත වචන දුරලන්නේය. නූපදනාබවට පමුණුවන්නේය ප්‍රයුක්ත වචනයෙන් දුරුවූවෙක් වන්නේය. වෙන්වූයේ නික්මුනේ සීමා නොකළ සිතින් වසන්නේය යනුයි. "නොදැමුණු ගතියෙහි නොහික්මෙන්නේය (නොයෙදෙන්නේය) යන්නෙහි නොදැමුණු ගති තුනෙකි. (මෙහි (10-5) 5 'එනම්' යන තැන සිට යොදාගත යුතුයි)

3 "නොදැමුනු බවෙහි නොහික්මෙන්නේය" යනු නොදැමුනු බවෙහි නොහික්මෙන්නේය. නොහැසිරෙන්නේය එය ගෙන නොසිටින්නේය. නූපදනාබවට පමුනුවන්නේය නොදැමුණු බවෙන් දුරුවූවෙක් වන්නේය. වෙන්වූයේ නික්මුනේ සීමා නොකළ සිතින් වසන්නේය යනුයි.

4 "කලහයට හේතුවන කථා නොකරන්නේය" යනු කලහයට හේතුවන කථා කවරේද? මෙහි ඇතැම් කෙනෙක් මෙබඳු කථා කරන්නේ වෙයි. ඔබ මේ ධර්ම විනය නොදන්නෙහිය (8-9) 1 'ඔබ මේ ධර්ම විනය නොදන්නෙහිය' යන තැන සිට යොදාගත යුතුයි.) ඉදින් හැකිනම් වාදයෙන් ගැලවෙව යනුයි. මෙය භාග්‍යවතුන්වහන්සේ විසින් දෙශනා කරණලදී. කලහයට හේතුවන කථා ඇතිකල්හි බහුල කථාව බලාපොරොත්තු විය යුතුයි. බහුල කථාව ඇති කල්හි නොසන්සුන්කමය. නොසන්සුන්වූවහුට අසංවරයවේ. සංවරනුවූවහුගේ සිත සමාධියෙන් දුරය කලහයට හේතුවන කථා නොකරන්නේය යනු කලහයට හේතුවන කථා ප්‍රකාශ නොකරන්නේය, ව්‍යවහාර නොකරන්නේය, දුරුකරන්නේය නූපදනා බවට පමුණුවන්නේය. කලහයට හේතුවන කථාවෙන් දුරුවූවෙක් වන්නේය, වෙන්වූවෙක් වන්නේය, වෙන්වූයේ නික්මුනේ සීමානොකළ සිතින් වසන්නේය යනුයි.

## 14 - 17

1 "මුසාවාදයෙහි නොයෙදෙන්නේය යනු (7-6) 3 ඡේදය යොදාගත යුතුයි) 'මුසාවාදයෙහි නොයෙදෙන්නේය' යනු මුසාවාදයෙහි නොයන්නේය, නොපැමිණෙන්නේය, පා නොවන්නේය, එකතු නොකරන්නේය, මුසාවාදය දුරු කරන්නේය නූපදනා බවට පමුණු වන්නේය, මුසාවාදයෙන් දුරුවූවෙක් වන්නේය වෙන්වූයේ නික්මුනේ සීමා නොකළ සිතින් වසන්නේය යනුයි.

2 "දැන දැන කෛරාටික කම නොකරන්නේය" යන්නෙහි කෛරාටික කම කවරේද? මෙහි ඇතැම් පුද්ගලයෙක් කෛරාටිකවූයේ වේද, එහි යම් සඨ බවක් කාරම් සහිත බවක් වේද මෙය කෛරාටික කමයි. "දැන දැන කෛරාටිකකම නොකරන්නේය" යනු දැනගෙන කෛරාටිකකම නොකරන්නේය නූපදවන්නේය ඇති නොකරන්නේය කෛරාටිකකම දුරලන්නේය නූපදනා බවට පමුණුවන්නේය කෛරාටික කමින් දුරුවූවෙක් වන්නේය වෙන්වූයේ නික්මුනේ සීමා නොකළ සිතින් වාසය කරන්නේ යනුයි

3 "යලිදු ජීවිකාවෙන් හෝ ප්‍රඥාවෙන් හෝ ශීලව්‍රතයෙන් හෝ අන්‍යයා පහත්කොට නොසිතන්නේය" යන්නෙහි නැවත යනු පදසන්ධියයි පද ගැලපීමකි. පද පූරණයකි. සුබොච්චාරණය පිණිස යෙදූවකි මෙහි ඇතැම් පුද්ගලයෙක් රූක්ෂ ජීවිකාවෙන් ජීවත් වන්නේ ප්‍රණීත ජීවිකාව කරණ අන්‍යයාට අවමන් කරයි. 'කිමෙක්ද? මේ බොහෝ දේ මොහු අනුභව කරයි. හේ කෙසේද මුල්බීජය කඳේ බීජය පුරුකෙන් හටගන්නා බීජය අගින් හටගන්නා බීජය බීජයෙන්ම හටගන්නා බීජයම පස්වැනියි මොහු හෙණ ගුලියක් මෙනි. දත් නමැති කුළුගෙඩිය ඇත්තෙකි. මොහු ශ්‍රමණ ප්‍රධානියෙකි. 'හෙතෙම ඒ රූක්ෂ ජීවිකාවේ සිට ප්‍රණීත ජීවිකා වෙන් ජීවත් වන අන්‍යයා හෙලාදකියි. මෙහි ඇතැම් පුද්ගලයෙක් ප්‍රණීත ජීවිකාවෙන් ජීවත් වන්නේ රූක්ෂව ජීවත්වන අන්‍යයා හෙලා දකියි. කිමෙක්ද? මේ මද පිනැත්තෙකි.

අල්පේ ශාක්‍යයෙකි චීවර පිණ්ඩපාත සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර නොලබන්නෙකි. හෙතෙම ඒ ප්‍රණීත ජීවිකාවේ සිට රූක්ෂව ජීවත්වන අන්‍යයාට නින්දා කරයි. මෙහි ඇතැම් පුද්ගලයෙක් නුවණැත්තෙක් වෙයි. හෙතෙම විචාරණ ලද්දේ ප්‍රශ්න විසඳයි. ඔහුට මේ අදහස වෙයි. මම නුවණැත්තේ වෙමි. මේ අන්‍යයෝ නුවණැත්තෝ නොවෙති. හෙතෙම ඒ ප්‍රඥා සම්පදාවෙන් අන්‍යයාට නින්දා කරයි. මෙහි ඇතැම් පුද්ගලයෙක් ශීල සම්පන්නවූයේ වෙයි. ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවරව වාසය කරයි. ආචාරයෙන් හා ගෞචරයෙන් යුක්ත වූයේ ස්වල්ප මාත්‍ර වරදෙහි පවා බිය දක්නා සුළුව ශික්ෂා පදයන් සමාදන්ව වාසය කරයි. ඔහුට මේ අදහස වෙයි. මම ශීල සම්පන්න වෙමි. මේ අනික් භික්ෂූහු දුශ්ශීලයෝයි පාප ධර්ම ඇත්තෝයයි හෙතෙම ඒ ශීල සම්පදාවෙන් අන්‍යයාට අවමන් කරයි. මෙහි ඇතැම් පුද්ගලයෙක් ව්‍රත සම්පන්න වූයේ වෙයි. ආරඤ්ඤිකවූයේ හෝ පිණ්ඩපාතික වූයේ හෝ පංශුකූලික වූයේ හෝ සපදානචාරිකවූයේ හෝ ඛලුපච්ඡාභත්තිකවූයේ හෝ නෙසජ්ජිකවූයේ හෝ යථා සන්නතිකවූයේ හෝ වෙයි. ඔහුට මේ අදහස වෙයි. 'මම ව්‍රත සම්පන්න වෙමි. මේ අන්‍යයෝ ව්‍රත සම්පන්නයෝ නොවෙති.' හෙතෙම ඒ ව්‍රත සම්පදා වෙන් අන්‍යයා හෙලා දකියි.

4 "නැවත ජීවිකාවෙන්ද ප්‍රඥාවෙන්ද ශීල ව්‍රතයෙන්ද අන්‍යයා හෙලා නොදක්නේය." යනු රූක්ෂ ජීවිකාවෙන් හෝ ප්‍රණීත ජීවිකාවෙන් හෝ ප්‍රඥා සම්පදාවෙන් හෝ ශීල සම්පදාවෙන් හෝ ව්‍රත සම්පදාවෙන් හෝ අන්‍යයා හෙලා නොදක්නේය. අවමන් නොකරන්නේය එයින් මාන්නය නූපදවන්නේ එයින් තද ගති ඇත්තෙක් නොවන්නේය මානයෙන් ඔසවාගත් හිස් ඇත්තෙක් නොවන්නේය යනුයි.

## 14 - 18

1 "බාහිරකයන්ගේ දූෂිත බොහෝ වචන හෝ වෙනත් බොහෝ වචනයන්ගෙන්" යනු දූෂිත වන ලද්දේ ගැටෙන ලද්දේ

නින්දා කරණ ලද්දේ උපවාද කරණ ලද්දේ යනුයි” “ශ්‍රමණයෝ” යනු මෙයින් පිටත් යම්කිසි පරිබ්‍රාජක බවට පැමිණි යනුයි. බොහෝ වචනයන්ගෙන් යනු ක්ෂත්‍රියයෝද බ්‍රාහ්මණයෝද ශුද්‍රයෝද ගෘහස්ථයෝද ප්‍රව්‍රජිතයෝද දෙවියෝද මිනිස්සුද යන ඔවුහු බොහෝ අනිෂ්ටවූ අකාන්තවූ අමනාපවූ බොහෝ වචන යන්ගෙන් ආක්‍රොශ කරන්නාහුය. කොප කරන්නාහුය, විරුද්ධ වන්නාහුය, හිංසා කරන්නාහුය, වෙහෙස කරන්නාහුය. ඔවුන්ගේ අනිෂ්ටවූ අකාන්තවූ අමනාපවූ බොහෝ වචන අසා ඉගෙන සිහිකොට සලකා බලා යනුයි.

2 “ඵරුස වචනයෙන් ආපසු ඔවුන්ට ආක්‍රොශ නො කරන්නේය” යන්නෙහි ඵරුෂ වචනයෙන් යනු නපුරුවූ කටුකවූ වචනයෙන් ආපසු ආක්‍රොශ නොකරන්නේය. ආපසු නොබණින්නේය. ආක්‍රොශ කරන්නහුට ආපසු ආක්‍රොශ නොකරන්නේය. කොප කරන්නහුට ආපසු කොප නොකරන්නේය. කලහ කරන්නහුට ආපසු කලහ නොකරන්නේය විග්‍රහ නොකරන්නේය. විවාද නොකරන්නේය කලහ ඩබර විග්‍රහ විවාද ආරාවුල් දුරුකරන්නේය, ඈත් කරන්නේය. කලහ භණ්ඩන විග්‍රහ විවාද මෙධගයන්ගෙන් ඈත්වූවෙක් වන්නේය. වෙන්වූයේ නික්මුනේ සීමා නොකළ සිතින් වාසය කරයි.

3 “ශාන්තවූ තැනැත්තේ විරුද්ධවාදී දේ නොකරන්නේය” යන්නෙහි “ශාන්ත නම් රාගය සන්සිඳුන බැවින් ශාන්ත නමි. ද්වෙෂය සන්සිඳුන බැවින් ශාන්ත නමි. මොහය සන්සිඳුන බැවින් ශාන්ත නමි. (3-4) 1 ඡෙදය යොදාගත යුතුයි.) සියලු අකුශල රැස්කිරීම් සන්සිඳුන බැවින් නිවුන බැවින් පහව ගිය බැවින් ශාන්ත නමි. “ශාන්තවූ තැනැත්තේ විරුද්ධවාදී දේ නොකරන්නේය” යනු ශාන්තවූ තැනැත්තේ විරුද්ධවාදී ක්‍රියා තරග කිරීම් ප්‍රතිපක්ෂ දේ නොකරත්, නූපදවත්, යනුයි

## 14 - 19

1 “මේ ධර්මයද දැන” යන්නෙහි “මෙය” යනු කියන ලද දෙශනා කරණ ලද ප්‍රකාශ කරණ ලද විවෘත කරණ ලද, බෙදන

ලද ප්‍රකට කරණ ලද ධර්මය "දැන" යනු දැනගෙන සමකොට බලා තීරණයකොට ප්‍රකටකොට මෙසේද මේ ධර්මය දැන නොහොත් සමදේද විෂමදේද මාර්ගයද අමාර්ගයද වරදද නිවරදද හීනයද ප්‍රණීතයද කලුදේද සුදුදේද නුවණැත්තන් ගරහන දේද නුවණැත්තන් පසස්නා දේද යන ධර්මය දැන සමකොට බලා තීරණයකොට ප්‍රකටකොට මෙසේද මේ ධර්මය දැන නොහොත් සම්‍යක් ප්‍රතිපදාව අනුලොම ප්‍රතිපදාව අවිරුද්ධ ප්‍රතිපදාව අන්වර්ථ ප්‍රතිපදාව ධර්මානු ධර්ම ප්‍රතිපදාව, ශීලයන් පුරණ බව ඉන්ද්‍රියයන්හි වසන ලද දොර ඇති බව, භෝජනයෙහි පමණ දැනීම ඇති බව. නිදි වර්ජිත කිරීම, සිහි නුවණ ඇති බව, සතර සතිපට්ඨානයන් සතර සම්‍යක් ප්‍රධානයන් සතර ඉර්ධි පාදයන් පඤ්චෙන්ද්‍රිය පඤ්චබල සප්ත බොධ්‍යංග, ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය, නිර්වාණයද නිර්වාණ ගාමිනී ප්‍රතිපදාවද යන ධර්මය දැන සමකොට බලා තීරණයකොට ප්‍රකටකොට යනුයි.

2 "භික්ෂුතෙම හැමකල්හි සිතා බලන්නේ සිහිඇත්තේ හික්මෙන්නේය" යන්නෙහි සිතා බලන්නේ යනු සිතන්නේ සමකොට බලන්නේ තීරණය කරන්නේ ප්‍රකට කරන්නේ සියලු සංස්කාරයෝ අනිත්‍යයයි (මෙහි (12-17) 4 සියලු යන තැන සිට යොදාගත යුතුයි) යම්කිසි හේතුවකින් උපන් ධර්මයක් ඇද්ද ඒ සියල්ල විනාශය පිණිස පවත්නේ යයි සිතන්නේ සමකොට බලන්නේ තීරණය කරන්නේ ප්‍රකට කරන්නේනුයි සිතා බලන භික්ෂු නම්. හැම කල්හි යනු හැමදා සියලු කාලයෙහි ( (14-2) 5 (i) ඡේදයේ තවත් කාරණා සතරක් යන තැන දක්වා යොදාගත යුතුයි.) "හික්මෙන්නේය" යනු හික්මීම් තුනකි. අධිශීල ශික්ෂා අධිචිත්ත ශික්ෂා අධි පඤ්ඤා ශික්ෂා යනුයි. මේ ශික්ෂා තුන සිහි කරන්නේ හික්මෙන්නේය. (2-4) 1 (ii) සිට 2 ඡේදය අවසානය දක්වා යොදාගත යුතුයි) හික්මෙන්නේය හැසිරෙන්නේය සමාදන්ව සිටින්නේය යනුයි.

3 "නිවිම ශාන්තිය යයි" දැන යනු රාගයාගේ නිවීම ශාන්තියයයි දැන ද්වෙෂයාගේ මොහයාගේ (3-9) 1 ඡේදය

යොදාගත යුතුයි.) සියලු අකුශල රැස්කිරීම්වල නිවීම ශාන්තිය යයි දැන සමකොට බලා තීරණයකොට ප්‍රකට කොට යනුයි

4 "ගෞතමයන් වහන්සේගේ ශාසනයෙහි ප්‍රමාද නොවන්නේය' යනු ගෞතමයන් වහන්සේගේ ශාසනයෙහි බුද්ධශාසනයෙහි ජින ශාසනයෙහි තථාගතයන් වහන්සේ ගේ ශාසනයෙහි දිව්‍ය ශාසනයෙහි අර්හත් ශාසනයෙහි යනුයි.

5 "ප්‍රමාද නොවන්නේය" යනු කුශල ධර්මයන්හි සකස්ව කටයුතු කිරීම් ඇත්තෙක් වන්නේය. (ii) නිතර කටයුතු කරන්නෙක් වන්නේය නොසිට කටයුතු කරන්නෙක් වන්නේය. නොමැලිව කටයුතු කරන්නෙක් වන්නේය බහා නොතැබූ ආශාව ඇත්තෙක් වන්නේය බහා නොතැබූ වීයර්‍ය ඇත්තෙක් වන්නේය. කවදා මම නොපුරණ ලද ශීල රාශිය පුරන්නෙම්ද කවදා මම නොපුරණ ලද සමාධි රාශිය පුරන්නෙම්ද, ප්‍රඥාස්කන්ධය විමුක්තිස්කන්ධය විමුක්ති ඥාන දර්ශන ස්කන්ධය පුරන්නෙම්ද කවදා මම නොදන්නා ලද දුක් දැන ගන්නෙම්ද ප්‍රහීණ නොවූ කෙලෙස් දුරු කරන්නෙම්ද, නොවඩන ලද මාර්ගය වඩන්නෙම්ද, ප්‍රත්‍යක්ෂ නොකරණ ලද නිරොධය ප්‍රත්‍යක්ෂ කරන්නෙම් දැයි යමෙක් එහි කැමැත්තද ව්‍යායාමයද උත්සාහයද මහත් උත්සාහයද නොපසු බස්නා බවද සිහියද නුවණද වීයර්‍යයද යෙදීමද කුශල ධර්මයන්හි අප්‍රමාදයද යනුයි.

## 14 - 20

1 "කෙලෙස් වලින් නොමැඩුනාවූ කෙලෙස් මැඩි හෙතෙම" යන්නෙහි "මැඩ පවත්වන්නා" යනු රූපය මඩින්නා, ශබ්දය මඩින්නා ගන්ධය මඩින්නා, රශය මඩින්නා, ස්පර්ශය මඩින්නා, ක්ලේශ ධර්මයන් මඩින්නා කිසියම් ක්ලේශයකින් නොමැඩුනේ යනුයි. හීනවූ ලාමකවූ කෙලෙස් ඇති කරන්නාවූ නැවත භවයක් ඇති කරන්නාවූ දාහ සහිතවූ දුක් විපාක ඇති නැවත ජරා මරණ ගෙන දෙන්නාවූ අකුශල ධර්මයන් මැඩ පවත්නේනුයි යනුයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2 "උපද්‍රව රහිත තමාට ප්‍රත්‍යක්ෂ ධර්මය දක්නේ" යන්නෙහි ප්‍රත්‍යක්ෂ ධර්මය නම්, මෙය මෙසේ නුවූයේය. මෙය පරම්පරාවෙන් නොපැමිණියේය. කොටස් කොට නොගත්තේය. තර්ක හේතු වශයෙන් නොවේ න්‍යාය හේතු වශයෙන් නොවේ. ආකාරය ගැන විතර්ක කිරීමෙන් නොවේ දෘෂ්ටිය අනුව නොවේ. තෙමේ තමාම දැනගත් තමාට ප්‍රත්‍යක්ෂ ධර්මය දැක්කේය.

3 "එහෙයින් ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි යන්නෙහි" එහෙයින් යනු එහෙයින් ඒ කාරණයෙන් ඒ හේතුවෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් යනුයි. ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි යනු ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි, ගෞතම ශාසනයෙහි, බුද්ධ ශාසනයෙහි ජින ශාසනයෙහි තථාගත ශාසනයෙහි දෙවියන්ට දෙවියන්ගේ ශාසනයෙහි අර්හත් ශාසනයෙහි යනුයි.

4 "අප්‍රමාදවූයේ හැමකල්හි නමස්කාර කරන්නේ ඒ අනුව හික්මෙන්නේය"යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. යන්නෙහි අප්‍රමාදවූයේ යනු කුශල ධර්මයන්හි සකස්ව කටයුතු කරන්නේ (මෙහි (14-19) 5 (ii) ඡේදය යෙදිය යුතුයි) යනුයි. හැමකල්හි යනු හැමදා සෑම කල්හි සියලු කාලයෙහි ((14-2) 5 (i) සිහි ඇත්තේ යන තැන දක්වා යෙදිය යුතුයි) අන්තිම වයස් කාලයෙහි යනුයි. නමස්කාර කරන්නේ යනු කයින් හෝ නමස්කාර කරනු ලබන්නේ වචනයෙන් හෝ නමස්කාර කරනු ලබන්නේ සිතින් හෝ නමස්කාර කරනු ලබන්නේ අර්ථයට එකඟවූ ප්‍රතිපත්තියෙන් හෝ නමස්කාර කරණු ලබන්නේ ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙන් හෝ නමස්කාර කරනු ලබන්නේ සත්කාර කරනු ලබන්නේ ගරුකාර කරනු ලබන්නේ බහුමාන කරනු ලබන්නේ සලකනු ලබන්නේ යනුයි "අනුව හික්මෙන්නේය" යන්නෙහි හික්මීම් තුනෙකි අධිශීල ශික්ෂා, අධිචිත්ත ශික්ෂා අධිප්‍රඥා ශික්ෂා යනුයි. ( (2-4) 1 (ii) සිට 2 ඡේදය අවසානයට යොදාගත යුතුයි.) මේ අධිප්‍රඥා ශික්ෂාවෙයි. මේ හික්මීම් තුන ගැන සිතා බලන්නේ හික්මෙන්නේය. ප්‍රත්‍යක්ෂ කරන්නේ හික්මෙන්නේය. හැසිරෙන්නේය. සමාදන්ව පවත්නේය යනුයි. "භාග්‍යවත්" යනු

ගෞරව වචනයයි ( (1-2) 1 භාග්‍යවතුන් වහන්සේ යනු යන තැන සිට යොදාගත යුතුයි.) යම් ඒ භගවා යනු ප්‍රත්‍යක්ෂ කළ පැනවීමයි යනුයි

## අත්තදණ්ඩ සූත්‍ර නිර්දෙශය

### 15 - 1

1 "ආත්ම දණ්ඩයෙන් භය පැමිණි" යන්නෙහි දඬුවම් තුනෙකි. කාය දණ්ඩ වචී දණ්ඩ මනො දණ්ඩ යනුයි. ත්‍රිවිධවූ කාය දුශ්චරිතය කාය දණ්ඩනයයි. සතර වැදෑරුම් වාග් දුශ්චරිතය වචී දණ්ඩනයයි ත්‍රිවිධවූ මනො දුශ්චරිතය මනො දණ්ඩන යයි. භය යනු භය දෙකකි. මෙලොව භයද පරලොව භයද යනුයි. මෙලොව භය කවරේද මෙහි ඇතැම් පුද්ගලයෙක් කයින් දුශ්චරිතයෙහි හැසිරෙයි. වචනයෙන් දුශ්චරිතයෙහි හැසිරෙයි. සිතින් දුශ්චරිතයෙහි හැසිරෙයි. සතුන්ද මරයි. සොරකම්ද කරයි. ගෘහ සන්ධි බිඳීම්ද කෙරෙයි කොල්ලකෑමද කරයි. උවදුරු කරමින්ද සිටියි. පරදාර සේවනයද කරයි. බොරුද කියයි. ඒ ඔහු අල්ලා රජුට දක්වත්. "ස්වාමීනි, මේ වැරදිසේ හැසිරෙන සොරෙක මොහුට යමක් කැමති නම් ඒ දඬුවම පනවනු මැනවි' යනුයි. රජ තෙමේ ඔහුට බැන වදියි. හෙතෙම ඒ බැන වැදීමෙන් බියට පැමිණෙයි. දුක් දොම්නස් ඇතිවෙයි. ඔහුට මේ බිය දුක් දොම්නස කොයින්ද? ආත්ම දණ්ඩන වශයෙන් පැමිණියේය. හට ගත්තේය. පහළ වූයේය. මෙපමණකින් රජතෙමේ සතුටු නොවෙයි. ඒ මොහු රජතෙමේ බඳවයි. යදම් ආදියෙන් බඳවයි. රැහැන් වලින් බැඳීමෙන් හෝ මාංචු වලින් බැඳීමෙන් හෝ වේවැල් වලින් බැඳීමෙන් හෝ වැල්වලින් බැඳීමෙන් හෝ කාමර ආදියට ඇතුළුකොට බැඳීමෙන් හෝ වටකොට බැඳීමෙන් හෝ ග්‍රාම බන්ධනයෙන් හෝ නියම්ගම් බන්ධනයෙන් හෝ නගර බන්ධනයෙන් හෝ රටවල්වල බන්ධනයෙන් හෝ ජනපද බන්ධනයෙන් හෝ

අන්තිම වශයෙන් හෙතෙම වචනයෙන්ද ‘මෙහි තොපට ඉඩ නැත. මේ නුවරින් බැහැර යවයි.’ පිටුවහල් කරයි. හෙතෙම බන්ධන හේතුවෙන්ද දුකක් දොම්නසක් ඇතිකර ගනියි මේ බිය දුක් දොම්නස් ඔහුට කොහින් ලැබුනේද? ආත්ම දණ්ඩ වශයෙන් හටගත්තේය. උපන්නේය. ඇතිවූයේය. පහළවූයේය. මෙපමණකින්ද රජතෙමේ සතුටු නොවෙයි. රජතෙමේ ඔහුගේ ධනය ගෙන්වා ගනියි. සියයක් හෝ දහසක් හෝ ලක්ෂයක් හෝ යනුයි. හෙතෙම ධන හානි හේතුවෙන්ද දුකට දොම්නසට පැමිණෙයි. මේ බිය දුක් දොම්නස් ඔහුට කොයින්ද, ආත්ම දණ්ඩන වශයෙන් ඇතිවූයේය. හටගත්තේය. පහළ වූයේය. මෙපමණකින්ද රජතෙමේ සතුටු නොවෙයි. රජ තෙමේ ඒ සොරාට නොයෙක් කම්කටුළු කරවත්. කසවලින්ද තළවයි. වේවැල්වලින්ද තළවයි. මුගුරු වලින්ද තළවයි. අතද කපයි. පයද කපයි. අත්පා දෙකම කපයි. කණද කපයි. නාසයද කපයි. කන් නාසා දෙකම කපයි. හිස්කබල උපුටා රත්වූ යගුලි හිස තුළ බහාලීම කරයි. හිස සක්ගෙඩියක් මෙන් මුඩු කිරීම කරයි. මුඛය විවෘත කොට ඇතුළෙහි පහන් දැල්වීම කරයි මුලු සිරුර තෙල් රෙදිවලින් වෙලා ගිනි දැල්වීම කරයි. අතෙහි තෙල් රෙදි වෙලා ඒ පහනක් මෙන් දැල්වීමද කරයි. බෙල්ල පටන් ගොප් ඇටය දක්වා හම උපුටා යොතින් බැඳ ඇවිද්දවීම කරයි. බෙල්ල පටන් කටිය දක්වාද කටිය පටන් ගොප්මය දක්වාද සම උගුළුවා රැක් පොතු වලින් කළ සිවුරක් සේ පැළඳවීමද කරයි දෙදණ දෙවැලමිටි වල යකඩ වළලු දමා යවුලෙන් බිම සිටුවා ගින්නෙන් පිරිවරාලීමද කරයි. දෙපස මුවැති බිලියෙන් ගසා සම් නහර උපුටා ලීමද කරයි. මුළු සිරුර කහවණු පමණට කැපීමද කරයි. සිරුර ආයුධයෙන් කපා ඒ ඒ තැන කාරම් ගෑමද කරයි. බිම තබා කන් සිදුරෙහි යවුල් ගසා කරකැවීමද කරයි. සිවි සම් නොසිඳෙනසේ දා යලිත් ඇට සුණුකොට ශරීරය පිදුරු වැටියක් මෙන් තලා දැමීමද කරයි. රත්වූ තෙලෙන්ද සිරුර ඉසියි. බල්ලන් ලවාද කවයි. ජීවත්ව සිටියදී හුළෙහි හිඳුවයි. කඩුවෙන්ද හිස සිඳියි.

2 හෙතෙම නානාවිධ කර්ම හේතුවෙන්ද දුකට දොම්නසට පැමිණෙයි. මේ භය දුක් දොම්නස් ඔහුට කොයින්ද? ආත්ම දණ්ඩන වශයෙන් පැමිණියේය. හටගත්තේය, පහළවූයේය. රජතෙම මේ දඬුවම් සතරට අධිපතිය. හෙතෙම ස්වකීය කර්මයෙන් කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති නපුරුසේ ඇදවැටෙන නරකයෙහි උපදියි. ඔහුට නිරයපාලයෝ පංචවිධ බන්ධන නම් වධයක් කෙරෙත්. රත්වූ යකඩ හුලක් අතෙහි ගසත්. රත්වූ යකඩ හුලක් දෙවෙනි අතෙහි ගසත්. රත්වූ යකඩ හුලක් පයෙහි ගසත්. රත්වූ යකඩ හුලක් දෙවැනි පයෙහි ගසත්. රත්වූ යකඩ හුලක් පපුවෙහි ගසත්. එහි හෙතෙම දුක්වූ තියුණුවූ කෘෘරවූ වෙදනාවන් විඳී. යම්තාක් ඒ පාප කර්මය විනාශ නොවේද ඒතාක් කළුරිය නොකරයි. නිරය පාලයෝ ඔහු බිම පෙරලා කෙටේරි වලින් ගසත්. නිරයපාලයෝ ඔහු රථයෙහි යොදා ගින්නෙන් දිලිසෙන්නාවූ වෙසෙසින් ඇවිල පවත්නාවූ ගිනි සහිත භූමියෙහි ඉස්සරහට යාමද කරවත්. පස්සට යාමද කරවත්. නිරයපාලයෝ ඔහු ගින්නෙන් දිලිසෙන්නාවූ වෙසෙසින් ඇවිල පවත්නාවූ ගිනි සහිතවූ මහා කුළුගෙයක් පමණවූ අඟුරු පර්වතයට නැංවීමද කරත්. බැස්සවීමද කරත්. නිරයපාලයෝ ඔහු පා උඩුකුරුකොට හිස යටිකුරුකොට කකියන්නාවූ ලොහෝ සැළියෙහි දමත්. හෙතෙම එහි පෙන නගමින් පැසී වරක් උඩට එයි, වරක් යටට යයි, වරක් සරසට යයි. හෙතෙම එහි දුක්වූ දරුණුවූ කටුකවූ වේදනාවන් විඳියි. යම්තාක් ඒ පාප කර්මය නොගෙවේද ඒතාක් කළුරිය නොකරයි, යමපල්ලෝ ඔහු මහා නරකයෙහි දමත්. ඒ මහා නරකය

> 3 "සිව් කොනක් ඇත්තේය. සිවුදොරටුවක් ඇත්තේය. කොටස් වශයෙන් බෙදන ලද්දේය. එසේම ප්‍රමාණ කරණ ලද්දේය. යකඩ ප්‍රාකාරයකින් වට කරණ ලද්දේය. යකඩ පියනකින් වසන ලද්දේය.
>
> "ඒ නිරයෙහි බිම යකඩයෙන්ම කරණ ලදී. දැල් වෙන ගින්නෙන් යුක්තය. හැමකල්හි හාත්පසින් සියක් යොදුනක් ගින්න පැතිරගෙන සිටී.

"ඉතාමත් තැවෙන්නාවූ ඝොරවූ ලංවීමට නොහැකි ගිනි සිළු ඇති දුක්වූ බිය උපදවන්නාවූ ලොමහර්ෂය කරවන්නාවූ

'(එහි) පෙරදිග බිත්තියෙහි ගිනිකඳ පැතිර සිටියේය. පාප කර්මයෙන් දැවෙන තැනැත්තේ අපරදිග බිත්තියෙහි හැපෙයි.

'බස්නාහිර බිත්තියෙහි ගිනිකඳ පැතිර සිටියේය. පාපකර්මයෙන් දැවෙන තැනැත්තේ පෙරදිග බිත්තියෙහි හැපෙයි.

"උතුරුදිග බිත්තියෙහි ගිනිකඳ පැතිර සිටියේය. පාප කර්මයෙන් දැවෙන තැනැත්තේ දකුණු දිග බිත්තියෙහි හැපෙයි.

"දකුණු දිග බිත්තියෙහි ගිනිකඳ පැතිර සිටියේය. පාප කර්මයෙන් දැවෙන තැනැත්තේ උතුරුදිග බිත්තියෙහි හැපෙයි.

"යට පටන් භයානකවූ ගිනිකඳ වෙයි. පාප කර්මයෙන් දැවෙන තැනැත්තේ පියන්පතෙහි හැපෙයි.

"පියන පටන් භයානකවූ ගිනිකඳ වෙයි. පාප කර්මයෙන් දැවෙන තැනැත්තේ (යට) බිම හැපෙයි.

"ගිනිගත් යකඩ කපාල ඇති දිලිසෙන්නාවූ ඒ අවීචි නිරය යට හා උඩ බලන්නේ තැතිගැනීම ඇති කරවන්නේය.

"බැගෑපත් හඬ ඇති දරුණු ක්‍රියා කරන්නාවූ එහි අතිශයින් පව්කම් ඇත්තෝ පැසෙත්. නොමැරෙත්.

"ඒ නිරය වාසීන්ගේ ශරීරය ගිනි හා සමානය. කර්මයක දැඩිකම බලව, එහි අළු හෝ දැලි නැත.

"පෙරදිගට දුවත්, ඉක්බිති අපරදිගට දුවත්, උතුරු දිගට දුවත්, ඉක්බිති දකුණු දිගට දුවත්.

"නික්මයාම ආශා ඇති මිදීම සොයන්නාවූ ඒ සත්වයෝ යම් යම් දිගකට දුවත්ද, ඒ ඒ දිග දොර වැසීයයි.

"ඔවුන්ගේ බොහෝකොට කරණ ලද විපාක නුදුන් ඒ පාපකර්මය නිසා කර්ම හේතුවෙන් ඔවුහු එයින් නික්මීමට නොහැකි වෙත්.

4 "ඔහුට මේ බිය දුක් දොම්නස් කොයින්ද? ආත්ම දණ්ඩන වශයෙන් හටගත්තේය, ඇතිවූයේය, පහළවූයේය යම් ඒ නරක දුක්ද යම් ඒ තිරිසන් යොනි දුක්ද යම් ප්‍රෙත විෂයක දුක්ද යම් ඒ මිනිසුන්ට අයත් දුක්ද කොයින් හට ගත්තෝද? කොයින් ඇතිවූවෝද, කොයින් පහළවූවෝද ආත්ම දණ්ඩන වශයෙන් ඇතිවූවෝය, පහළවූවෝය, හට ගත්තෝය. 'ආත්ම දණ්ඩන භය පැමිණි කලහ කරන්නාවූ ජනයා බලව්' යනු ක්ෂත්‍රියයෝද, බ්‍රාහ්මණයෝද වෛශ්‍යයෝද, ශුද්‍රයෝද, ගිහියෝද පැවිද්දෝද, දෙවියෝද මිනිස්සුද කලහ කරන්නාවූ ජනයා, විරුද්ධවූ ජනයා, ප්‍රතිවිරුද්ධ ජනයා, ගැටෙන ජනයා, බලව්, දකිව්, පරීක්ෂා කරව් යනුයි.

"සංවේගය කියන්නෙමි" යනු සංවේගය, කළකිරීම, තැතිගැන්ම, බිය, පෙළීම, ගැටීම්, උපද්‍රවය, උවදුර කියන්නෙමි. ප්‍රකාශ කරන්නෙමි, දෙශනා කරන්නෙමි, පනවන්නෙමි, තබන්නෙමි, විමාන කරන්නෙමි. බෙදන්නෙමි. ප්‍රකට කරන්නෙමි යනුයි.

5 "මවිසින් යම්සේ සංවේගයට පැමිණියේද" යනු යම්සේ මා විසින් තමා විසින්ම තමා ගැන සංවේගයට පැමිණෙන ලද්දේද කලකිරීමට පැමිණෙන ලද්දේද කළකිරෙන ලද්දේද යනුයි

## 15 - 2

1 "ස්වල්ප දියෙහි මසුන් මෙන් සැලෙන (කම්පාවන) සත්ව සමූහය දැක ඔවුනොවුන් විරුද්ධවූවන් දැක මට බිය පැමිණියේය."

2 "සැලෙන ප්‍රජාව දැක" යන්නෙහි 'ප්‍රජා' යනු සත්වයින්ට නමෙකි තෘෂ්ණා කම්පාවෙන් කම්පාවෙන දෘෂ්ටි කම්පාවෙන් කම්පාවන ක්ලේශ කම්පාවෙන් කම්පාවන දුශ්චරිත කම්පාවෙන්

කම්පාවන ප්‍රයෝග කම්පාවෙන් කම්පාවන විපාක කම්පාවෙන් කම්පාවන රාගයෙන් රත්ව කම්පා වන ද්වෙෂයෙන් දුෂ්ටව කම්පාවන මෝහයෙන් මුළාව කම්පාවන මානයෙන් බැඳී කම්පාවන උද්ධච්චයෙන් සිහි මුලාවට පැමිණ කම්පාවන නිමාවට නොපැමිණි විචිකිච්ඡාවෙන් කම්පාවන උත්සාහවත් බවට පත් අනුසය යන්ගෙන් කම්පාවන, ලාභයෙන් කම්පාවන, අලාභයෙන් කම්පාවන, කීර්තියෙන් කම්පාවන, අපකීර්තියෙන් කම්පාවන, ප්‍රශංසාවෙන් කම්පාවන නින්දාවෙන් කම්පාවන, සැපතින් කම්පාවන, දුකින් කම්පාවන, ඉපදීමෙන් කම්පාවන, ජරාවෙන් කම්පාවන වන, මරණයෙන් කම්පාවන, ශොක වැළපීම් කායක දුක් දොම්නස් උපායාසයන්ගෙන් කම්පාවන නරක දුකින් කම්පාවන, තිරිසන් යොනි දුකින් කම්පාවන, ප්‍රෙතවිෂයික දුකින් කම්පාවන, මානුසික දුකින් කම්පාවන මවුගැබට බැසගැන්ම මුල්කොට ඇති දුකින්, ගර්භයෙහි වාසය මුල්කොට ඇති දුකින් ගැබින් නික්මීමේ දුකින්, උපන්නහුට බන්ධනාදියෙන් ඇති වන දුකින් උපන්නහුට අනුන්ගෙන් ඇතිවන දුකින් තමාගේ උපක්‍රමයෙන් ඇතිවන දුකින් අනුන්ගේ උපක්‍රමයෙන් ඇතිවන දුකින් කායික දුක්ඛයෙන් සංසාර දුකින් විපරිනාම දුක ඇස්රෝග දුක කන්රෝග දුක නාසික රෝග දුක, දිවේ රෝග දුක, කාය රෝග දුක, හිසේ රෝග දුක, කණේ රෝග දුක, මුඛ රෝග දුක, දත් රෝග දුක, කැසි රෝග දුක, ක්ෂය රෝග දුක, පීනැස්රෝග දුක, දාහරෝග දුක, උණ රෝග දුක, කුසේ රෝග දුක, මූර්ඡා දුක, ලේ අතීසාර රෝග දුක, සුල රෝග දුක, අතීසාර රෝග දුක, කුෂ්ටරෝග දුක, ගඩරෝග දුක, කඩුවේගන් නම් කුෂ්ටරෝග දුක, ස්වාශ රෝග දුක, අපස්මාර රෝග දුක, දද රොග දුක, කැසීම් රෝග දුක, කුෂ්ට රෝග දුක, නියමුල වනවීමේ රෝග දුක, වීතච්ඡිකා නම් කුෂ්ට රෝග දුක, ලේ පිළිබඳ රෝග දුක, පිත් රෝග දුක මධුමෙහ දුක, අංසානම් රෝගදුක, පිළිකා නම් රෝග දුක, භගන්දලානම් රෝග දුක, පිතින් උපන් ආබාධ දුක, සෙමින් උපන් ආබාධ දුක, වාතයෙන් උපන් ආබාධ දුක, සන්නිපාතික ආබාධ දුක, ඍතු වෙනස්වීමේ රෝග දුක, විෂම පැවැත්මෙන් ඇතිවන රෝග දුක, උපක්‍රමයෙන්

ඇතිවන රෝග දුක, කර්ම විපාකයෙන් ඇතිවන රෝග දුක, ශීතයෙන් උෂ්ණයෙන්, බඩගින්නෙන්, පිපාසයෙන් ඇතිවන දුක, මලපහකිරීම පිළිබඳ දුක, මුත්‍ර පහකිරීම පිළිබඳ දුක, ඩැහැලේ බොන මැස්සෝය මදුරුවෝය වා අව් දීර්ඝ ජාතීහුය යන මොවුන්ගේ ස්පර්ශයෙන් හටගන්නා දුක, මවගේ මරණ දුක, පියාගේ මරණ දුක, සහෝදරයාගේ මරණ දුක, සහෝදරියගේ මරණ දුක, පුත්‍රයාගේ මරණ දුක, දුවගේ මරණ දුක, නෑයන්ගේ මරණ දුක, භොග විපත් දුක, රෝග විපත් දුක, ශීල විපත් දුක, දෘෂ්ටි විපත් දුක යන මේ දුක් වලින් කම්පාවන, විශෙෂයෙන් කම්පාවන වෙවුලන විශෙෂයෙන් වෙවුලන යනුයි. 'දැක' යනු දැක බලා සමකොට බලා තීරණයකොට ප්‍රකටකොට යනුයි.

3 "ස්වල්ප දියෙහි මසුන් මෙන්" යනු අවසන්වී යන දියෙහි ස්වල්ප දියෙහි මත්ස්‍යයෝ යම්සේ කපුටන් විසින් හෝ ගිජු ලිහිණියන් විසින් හෝ කොකුන් විසින් හෝ පෙරලනු ලබන්නාහු ඔසවනු ලබන්නාහු කනු ලබන්නාහු කම්පාවෙත්. වෙවුලත්, සැලෙත්. මෙසේම සත්වයෝ තෘෂ්ණා කම්පාවෙන් කම්පාවෙත්. වෙවුලත්, සැලෙත්, දෘෂ්ටිව්‍යසන දුකින් වෙවුලත්, සැලෙත් යනුයි.

4 "ඔවුනොවුන් විරුද්ධවූ" යනු සත්වයෝ ඔවුනොවුන් විරුද්ධවූවාහු ප්‍රතිවිරුද්ධ වූවාහු වෛරවූවාහු යනුයි (ii) රජවරුද රජුන් හා විවාද කරත්. ක්ෂත්‍රියයෝද ක්ෂත්‍රියයන් හා විවාද කරත්. බ්‍රාහ්මණයෝද බමුණන් හා විවාද කරත්, ගෘහපතියෝද ගෘහපතීන් හා විවාද කරත් මවද පුතා සමග විවාද කරයි, පුතාද මව සමග විවාද කරයි, පියාද පුතා සමග විවාද කරයි, පුතාද පියා සමග විවාද කරයි, සහෝදරයාද සහෝදරයා සමග විවාද කරයි, සහෝදරිය සහෝදරිය සමග විවාද කරයි, සහෝදරයාද සහෝදරිය සමග විවාද කරයි සහෝදරියද සහෝදරයා සමග විවාද කරයි, යහලුවාද යහලුවා සමග විවාද කරයි, ඔවුහු එහි කලහ විග්‍රහ විවාදයට පැමිණියාහු ඔවුනොවුන් පහර දෙත්. කැට කැබලිති වලින්ද පහර දෙත්. දඬුවලින්ද පහර දෙත්, ආවුධ වලින්ද පහර දෙත්. ඔවුහු එහි මරණයටද පැමිණෙත්. මරණය සමාන දුකටද පැමිණෙත් යනුයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

5 "දැක මට බිය පැමිණියේය" යනු දැක බලා සමකොට බලා තීරණය කොට ප්‍රකට කොට භය, පීඩාව, ඝට්ටනය, උපද්‍රවය පැමිණියේය යනුයි.

## 15 - 3

1 "ලොකය හාත්පසින් අසාරය" යන්නෙහි 'ලොකය' නම් නිරය ලොකය තිරිසන් යෝනි ලොකය, ප්‍රෙතවිෂයික ලෝකය, මිනිස් ලොකය, දිව්‍ය ලොකය, ස්කන්ධ ලොකය, ධාතු ලොකය, ආයතන ලොකය, මේ ලොකය, පරලොකය, බ්‍රහ්මලොකය, දිව්‍ය ලොකය, යන මෙය ලොකය යයි කියයි. නිරය ලොකය නිත්‍ය සාර සාරයෙන් හෝ සුඛසාර සාරයෙන් හෝ ආත්මසාර සාරයෙන් හෝ නිත්‍ය වශයෙන් හෝ ධ්‍රැව වශයෙන් හෝ ශාස්වත වශයෙන් හෝ නොවෙනස්වන ධර්මයෙන් හෝ අසාරය නිස්සාරය සාරයෙන් පහවූවක. තිරිසන් යෝනි ලොකය, ප්‍රෙතවිෂයික ලොකය, මනුෂ්‍ය ලොකය, දිව්‍ය ලොකය, ස්කන්ධලොකය, ධාතු ලොකය, ආයතන ලොකය, මේ ලොකය, පරලොකය, බ්‍රහ්ම ලොකය, දිව්‍ය ලොකය, නිත්‍යසාර සාරයෙන් හෝ සුඛ සාර සාරයෙන් හෝ ආත්මසාර සාරයෙන් හෝ නිත්‍ය වශයෙන් හෝ ධ්‍රැව වශයෙන් හෝ නොවෙනස්වන ධර්මයෙන් හෝ අසාරය නිස්සාරය සාරයෙන් පහවූවෙක. යම්සේ වනාහි බට ගස අසාරය නිස්සාරය ඉවත්වූ හරය ඇත්තේය. යම්සේ එරඬු ගස අසාරය නිස්සාරය හරයෙන් ඉවත්වූයේය. යම්සේ අට්ටික්කා ගස අසාරය නිස්සාරය හරයෙන් ඉවත්වූයේය. යම්සේ සෙත කච්ඡ නම් ගස අසාරය නිස්සාරය, ඉවත්වූ හරය ඇත්තේය. යම්සේ එරබදු නම් ගස අසාරය නිස්සාරය, හරයෙන් ඉවත්වූයේය. යම්සේ පෙනපිඩ අසාරය නිස්සාරය, හරයෙන් ඉවත්වූයේය. යම්සේ දිය බුබුල අසාරය නිස්සාරය හරයෙන් ඉවත්වූයේය. යම්සේ මිරිඟුව අසාරය නිස්සාරය හරයෙන් ඉවත්වූයේය. යම්සේ කෙහෙල් කඳ අසාරය, නිස්සාරය හරයෙන් ඉවත්වූයේය. යම්සේ මායාව අසාරය නිස්සාරය හරයෙන් ඉවත්ය. එපරිද්දෙන්ම නිරය ලෝකය නිත්‍යසාර සාරයෙන් හෝ

සුඛසාර සාරයෙන් හෝ ආත්මසාර සාරයෙන් හෝ නිත්‍යවශයෙන් හෝ ධ්‍රැව වශයෙන් හෝ ශාස්වත වශයෙන් හෝ වෙනස් නොවන ධර්මයෙන් හෝ අසාරය නිස්සාරය සාරයෙන් ඉවත්වූයේය. තිරිසන් යොනි ලොකය, ප්‍රෙතවිෂයික ලොකය, මනුෂ්‍යලොකය, දිව්‍යලොකය නිත්‍යසාර සාරයෙන් හෝ සුඛසාර සාරයෙන් හෝ ආත්මසාර සාරයෙන් හෝ නිත්‍යයෙන් හෝ ධ්‍රැවයෙන් හෝ ශාස්වත වශයෙන් හෝ වෙනස් නොවන ධර්මයෙන් හෝ අසාරය නිස්සාරය සාරයෙන් ඉවත්වූයේය. ස්කන්ධ ලෝකය, ධාතු ලෝකය, ආයතන ලෝකය, මේ ලෝකය, පරලෝකය, බ්‍රහ්ම ලොකය, දිව්‍යලොකය, නිත්‍යසාර සාරයෙන් හෝ සුඛසාර සාරයෙන් හෝ ආත්මසාර සාරයෙන් හෝ නිත්‍යයෙන් හෝ ධ්‍රැවයෙන් හෝ ශාස්වතයෙන් හෝ නොවෙනස් ධර්මවශයෙන් හෝ අසාරය නිශ්ශාරය සාරයෙන් ඉවත්වූයේය යනුයි.

2 "සියලු දිශාවෝ කම්පිතයහ" යනු පෙරදිග යම් සංස්කාරයෝ වෙත්ද ඒ වාද අන්‍යොන්‍යයන් කම්පිතයහ සැලෙන්නාහ ගැටුනාහ. ජාතිය අනුව ගියේය. ජරාවෙන් විසුරුවන ලද්දේය. ව්‍යාධියෙන් මඩනා ලද්දේය. මරණයෙන් මඩනා ලද්දේය. දුකෙහි පිහිටියේය. ආරක්ෂා ස්ථානයක් නැත. පිහිටක් නැත. පිහිටක් නැති බැවින් යුක්තය. යම් පෙරදිශාවෙහි සංස්කාරයෝ වෙද්ද, යම් අපර දිශාවෙහි සංස්කාරයෝ වෙද්ද, යම් උතුරු දිශාවෙහි සංස්කාරයෝ වෙද්ද, යම් දකුණු දිශාවෙහි සංස්කාරයෝ වෙද්ද, යම් පෙරදිග අනුදිග සංස්කාරයෝ වෙද්ද, යම් අවරදිග අනුදිග සංස්කාරයෝ වෙද්ද, යම් උතුරු අනුදිගෙහි සංස්කාරයෝ වෙද්ද, යම් දකුණු අනුදිග සංස්කාරයෝ වෙද්ද, යම් යට දිශාවෙහි සංස්කාරයෝ වෙද්ද, යම් උඩ දිශාවෙහි සංස්කාරයෝ වෙද්ද, යම් දශ දිශාවෙහි සංස්කාරයෝ වෙද්ද, ඒ සංස්කාරයෝද අනිත්‍යයෝ කම්පිතයහ. සැලෙන්නාහ. ගැටුනාහ. ජාතිය අනුව ගියේය. ජරාවෙන් විසුරු වන ලද්දේය. ව්‍යාධියෙන් මඩනා ලද්දේය. මරණයෙන් මඩනා ලද්දේය. දුකෙහි පිහිටියේය. ආරක්ෂා ස්ථානයක් නැත. පිහිටක් නැත. පිහිටක් නැති බැවින් යුක්තය මෙයද කියන ලද්දේය.

3 "හුදෙක් උතුරුදිශාවෙහි බබලන්නාවූ දිලිසෙන්නාවූ විමානයක් වෙයි. හැමකල්හි වෙවුලන්නාවූ රූපයෙහි යුද්ධය දැක එහෙයින් යහපත් නුවණැත්තේ රූපයෙහි නොඇලෙයි.

"ලෝකය මරුවා විසින් මැඩගන්නා ලදී. ජරාවෙන් පිරිවරණ ලද්දේය ආශා හුලින් බැසගත්තේය. ආශාවෙන් දුම් දමන ලද්දේ වෙයි."

"සියලු ලෝකය දැල්වුනේ වෙයි. සියලු ලෝකය දුමින් වැසුනේය. සියලු ලෝකය දිලිසෙන්නේය. සියලු ලෝකය කම්පාවන්නේය" යනුයි.

"තමාගේ ආරක්ෂාව කැමතිවන්නේ" යනු තමාගේ පිහිට ආරක්ෂාව, ගතිය, පරායනය, කැමතිවන්නේ බලාපොරොත්තු වන්නේ, ආශාකරන්නේ යනුයි

4 "ගිලන් නොවූවකු නොදකිමි" යනු ගිලන්නහුම දකිමි. නොගැලුනෙකු නොදකිමි. සියලු තරුණකම ජරාවෙන් වසාගන්නාලදී. සියලු නිරොගකම ලෙඩෙන් වසාගන්නාලදී. සියලු ජීවිතය මරණයෙන් වසාගන්නා ලදී. සියලු ලාභය අලාභයෙන් වසාගන්නා ලදී. සියලු කීර්තිය අපකීර්තියෙන් වසාගන්නාලදී, සියලු ප්‍රශංසාව නින්දාවෙන් වසාගන්නාලදී. සියලු සැපය දුකින් වසාගන්නා ලදී.

5 "ලාභයද, අලාභයද, කීර්තියද, අපකීර්තියද, නින්දාවද, ප්‍රශංසාවද, සැපයද, දුකද යන මනුෂ්‍යයන් පිළිබඳ ධර්මයෝ හැමදා නොපවත්නාහ. වෙනස්වන ධර්මයෝ වෙති" නොගිලුන කෙනෙකු නොදකිමි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

"සියලු ලොකය හාත්පසින් අසාරය. සියලු දිශාවෝ කම්පිතයහ. ජරාදියෙහි බැසනොගත් තමන්ගේ පිහිට බලාපොරොත්තු වන්නෙකු නොදකිමි" යනුයි

## 15 - 4

1 "අවසන්කොට විරුද්ධවූ සත්වයන් යන්නෙහි සියලු යෞවනත්වය ජරාවෙන් විනාශවෙයි. සියලු නිරොගිකම

ව්‍යාධියෙන් විනාශවෙයි. සියලු ජීවිතය මරණයෙන් විනාශවෙයි. සියලු ලාභය අලාභයෙන් විනාශවෙයි. සියලු කීර්තිය අපකීර්තියෙන් විනාශවෙයි. සියලු ප්‍රශංසාව නින්දාවෙන් විනාශවෙයි. සියලු සැපත දුකින් විනාශවෙයි 'විරුද්ධවූවන්' යනු යෞවනය කැමති සත්වයෝ ජරාවට විරුද්ධයහ, නිරෝගිකම කැමති සත්වයෝ ව්‍යාධියට විරුද්ධයහ. ජීවත්වනු කැමැත්තෝ මරණයට විරුද්ධයහ. ලාභය කැමැත්තෝ අලාභයට විරුද්ධයහ. කීර්තියට කැමැත්තෝ අපකීර්තියට විරුද්ධයහ. ප්‍රශංසාව කැමැත්තෝ නින්දාවට විරුද්ධයහ. සැප කැමැත්තෝ දුකට විරුද්ධයහ. ගැටුනේය. වෛරයෙන් යුක්තය යනුයි.

2. "දැක මාගේ කළකිරීම විය" යන්නෙහි දැක යනු බලා සමකොට තීරණයකොට ප්‍රකටකොට යනුයි. 'මාගේ නො ඇල්ම යනු යම් නොඇල්මක් ඇද්ද, ආශාරහිත බවක් ඇද්ද යම් කළකිරීමක් ඇද්ද එයයි යනුයි.

3 "ඉක්බිති මෙහි රාගාදී හුල් දැක්කෙමි" යන්නෙහි ඉක්බිති යනු පදසන්ධියයි. පද ගැලපීමයි. පද පූරණයකි. පහසුවෙන් කියවීම පිණිස යෙදුවකි. මේ පද පිළිවෙළයි. "මෙහි" යනු සත්වයන් කෙරෙහි යනුයි. "හුල්" යනු හුල් සතකි. රාග හුල ද්වෙෂ, මොහ, මාන, දෘෂ්ටි, ශෝක, සැකය යන හුල්වෙති. "දැකීම්" යනු දැක්කෙමි. දිටිමි අවබොධකර ගතිමි යනුයි

4 "හෘදයෙහි ඇති දර්ශනයට දුෂ්කර" යන්නෙහි දුෂ්කරසේ දක්නා යනු අවබොධයට දුෂ්කර යනුයි.

"හෘදයෙහි ඇති" යන්නෙහි සිතට හෘදයයයි කියයි. යම් සිතක් මන නම් වේද, මානස නම් වේද, හදය, පණ්ඩර මන මනායතන, මනින්ද්‍රිය, විඤ්ඤාණ, විඤ්ඤාණස්කන්ධ, තජ්ජා මනොවිඤ්ඤාණ ධාතු නම් වේද, හෘදය ආශ්‍රයකොට ඇති සිත ආශ්‍රයකොට ඇති සිත හා එක්වූ එකට උපන් එකට නිරුද්ධ වන්නාවූ එක වස්තුකවූ එකම අරමුණක් ඇති, යනුයි.

## 15 - 5

1 "යම් හුලකින් විදි තැනැත්තේ සියලු දිසාවන්හි දුවයි." යන්නෙහි හුල් යනු හුල් සතෙකි රාග හුල, ද්වෙෂහුල, මොහ, මාන, දෘෂ්ටි, ශොක, සැකය නමැති හුල යනුයි. රාග හුල කවරේද, යම් සිතේ ඇලීමක් ඇද්ද බැඳීමක් ඇද්ද, ( (2-2) 1 හා (1-3) ii ඡෙදය යෙදිය යුතුයි) අභිධ්‍යාව, ලොභය, අකුශල මූලය යනුයි. මේ රාග හුලයි.

2 ද්වෙෂය නමැති හුල කවරේද? මට අවැඩක් කළේයයි වෛරය හටගනියි. මට අවැඩ දැන් කෙරේයයි වෛරය හට ගනියි. මට මතු අනර්ථයක් කරන්නේයි. වෛරයහට ගනියයි. (10-3) 1 යෙදිය යුතුයි) චණ්ඩ ගතියක් කඳුළු හෙළීමක් සිතේ නොසතුටු බවක්වේද එයයි

3 මොහය නමැති හුල කවරේද? දුකෙහි නොදැනීම. දුක් ඇතිවීමේ හේතුව නොදැනීම, දුක්ඛ නිරොධය නොදැනීම, දුක් නිරුද්ධ කිරීමේ ප්‍රතිපදාව ගැන නොදැනීම, පූර්වාන්තය නොදැනීම, අපරාන්තය නොදැනීම, පූර්ව පරාන්තය නොදැනීම, හේතු ප්‍රත්‍ය ධර්මයවූ ප්‍රතීත්‍ය සමුත්පාදයන් ගැන නොදැනීම යනුයි. මෙබඳුවූ යම් නොදැනීමක් අනවබොධයක් ප්‍රතිවෙධ නොකිරීමක් නොගැනීමක් සිහි නොකිරීමක් මෝහයක් නොදැනීමක් අවිද්‍යාවක් අවිද්‍යාවක යෙදීමක් අවිද්‍යාවක බැසගැන්මක් අකුශල මූලයක් ඇද්ද, මේ මෝහය නමැති හුලයි.

4 මානය නමැති හුල කවරේද? ශ්‍රෙෂ්ඨවෙමියි මානය සමානවෙමියි මානය හීනවෙමියි මානය යම් එබඳුවූ මානයක් ඇද්ද හැඟීමක් ඇද්ද, උසස්යයි සිතීමක් ධජයක් මෙන් සිතේ උසස්කොට ගැන්මක් සිත කොඩියක් මෙන් උසස්කර ගැනීමක් ඇද්ද, මේ මාන නමැති හුල නම්.

5 දෘෂ්ටිය නමැති හුල කවරේද? විසිවැදෑරුම් ආත්ම දෘෂ්ටිය, දශවැදෑරුම් මිථ්‍යාදෘෂ්ටිය, දශවැදෑරුම් අන්තග්‍රාහික දෘෂ්ටිය, මෙබඳුවූ යම් දෘෂ්ටියක් ඇද්ද, දෘෂ්ටි ගැනීමක් ඇද්ද, දෘෂ්ටි කාන්තාරයක් ඇද්ද, දෘෂ්ටි කටුවක් ඇද්ද, දෘෂ්ටි දැඟලීමක්

ඇද්ද, දෘෂ්ටි බන්ධනයක් ඇද්ද, පිළිගැනීමක් ඇද්ද බැසගැන්මක් ඇද්ද, වැරදි මාර්ගයක් ඇද්ද, තීර්ථායතනයක් ඇද්ද, මේ දෘෂ්ටි හුලයි

**6** ශොකය නමැති හුල කවරේද? ඥාති ව්‍යසනයෙන් හෝ ස්පර්ශකළහුගේ භොග ව්‍යසනයෙන් හෝ ස්පර්ශවූවහුගේ ශීල ව්‍යසනයෙන් හෝ ස්පර්ශවූවහුගේ දෘෂ්ටි ව්‍යසනයෙන් හෝ ස්පර්ශවූවහුගේ වෙනින් අනික් ව්‍යසනයන්ගෙන් හෝ යුත්තවූවහුගේ ශොකයක් ඇද්ද, ශෝක කිරීමක් ඇද්ද ඇතුළත දාහයක් ඇද්ද, සිතේ දොම්නස් ගතියක් ඇද්ද, මේ ශෝකය නමැති හුලයි.

**7** සැකය නමැති හුල කවරේද? දුකෙහි සැකය, දුක ඇතිවීමේ හේතුවේ සැකය, දුක්ඛ නිරොධයේ සැකය, දුක්ඛ නිරොධ ගාමිනී ප්‍රතිපදාවේ සැකය, පෙර කාලය පිළිබඳ සැකය, පසුකාලය පිළිබඳ සැකය, පූර්වාපරාන්තය පිළිබඳ සැකය, ප්‍රතිත්‍යසමුත්පාදය පිළිබඳ සැකය, යම් එබඳුවූ සැකයක්, සැකකිරීම් බවක්, විමතියක් විචිකිච්ඡාවක් අදහස් දෙකක් ඇති බවක් සිතේ පෙරලියක්, ලොමුඩැහැගැන්මක් ඇද්ද මේ සැකය නමැති හුලයි,

**8** "යම් හුලකින් විදි තැනැත්තේ සියලු දිශාවන්හි දුවයි." යනු රාග හුලින් බැසගත් විදි ස්පර්ශවූ යුක්තවූ තැනැත්තේ කයින් දුසිරිත් කරයි. වචනයෙන් දුසිරිත් කරයි. සිතින් දුසිරිත් කරයි. සතුන්ද මරයි. හොරකම්ද කරයි. ගෙවල්ද බිඳියි. කොල්ල කෑමද කරයි. උවදුරෙහිද සිටියි. පරදාර කර්මය පිණිසද යයි. බොරුද කියයි මෙසේද රාගහුලින් බැසගත් විදි තැනැත්තේ ස්පර්ශවූ යුක්තවූ තැනැත්තේ දුවයි. හැසිරෙයි. යලිදු හෝ රාගය නමැති හුලින් බැසගත් විදි ස්පර්ශ කළ යුක්තවූ තැනැත්තේ භෝගයක් සොයමින් නැවෙන් මහ සමුදුරයට බැස ගනියි. ශීතය පෙරටුකොට උෂ්ණය පෙරටුකොට ඩැහැලේ බොන මැස්සෝය මදුරුවෝය වාව් දීර්ඝජාතිහුය යන මොවුන්ගේ ස්පර්ශය විඳිමින් පිපාසයෙන් හා බඩසයින් පෙළෙමින් කැලෑ

රොදටද යයි තක්කොල නම් පෙදෙසට යයි. තක්සලාවට යයි කාලමුඛ නම් ප්‍රදෙශයට යයි. මරණ පාර නම් පෙදෙසට යයි. වෙසුංග නම් පෙදෙසට යයි වෙරාපථ නම් පෙදෙසට යයි. ජව නම් පෙදෙසට යයි. තමසි නම් පෙදෙසට යයි වංග නම් පෙදෙසට යයි එළ බන්ධන නම් පෙදෙසට යයි. සුවණ්ණකූට නම් පෙදෙසට යයි. සුවර්ණභූමි නම් පෙදෙසට යයි. තාම්‍රපර්ණි නම් පෙදෙසට යයි. සුප්පාරක නම් පෙදෙසට යයි. භරුකච්ඡා නම් පෙදෙසට යයි. සූරට්ඨ නම් පෙදෙසට යයි. අංගලොක නම් පෙදෙසට යයි. ගංගන නම් පෙදෙසට යයි. පරම ගංගන නම් පෙදෙසට යයි. යොන් රටට යයි. පරමයොන් රටට යයි වීතක නම් පෙදෙසට යයි මූලපද නම් පෙදෙසට යයි. මරුකන්තාර නම් පෙදෙසට යයි. ජන්නුපථ නම් පෙදෙසට යයි අජපථ නම් පෙදෙසට යයි. මෙණ්ඩක නම් පෙදෙසට යයි සංකුපථ නම් පෙදෙසට යයි. ඡත්තපථ නම් පෙදෙසට යයි වංසපථ නම් පෙදෙසට යයි සකුණපථ නම් පෙදෙසට යයි. මූසික පථ නම් පෙදෙසට යයි. දරීපථ නම් පෙදෙසට යයි. වෙත්තාධාර නම් පෙදෙසට යයි. සොයන්නේ නොලැබෙයි නොලැබීම මුල්කොට දුකක් දොම්නසක් ඇති වෙයි සොයන්නේ ලැබෙයි. ලැබරැකීම මුල්කොට දුකක් දොම්නසක් ඇති වෙයි. කෙසේ නම් මාගේ භෝගයෝ රජවරු නොගන්නාහුද, සොරු නොගන්නාහුද, ජලයට ගසා නොයන්නාහුද, තමාට අප්‍රිය දූදරු ආදීහු නොගන්නාහු දැයි මෙසේ ආරක්ෂා කරන්නේ ඔහුගේ භොගයෝ බිඳීයත්, විනාශවීයත්, හෙතෙම වෙනස්වීම මුල්කොට දුකක් දොම්නසක් විඳියි. මෙසේද රාගය නැමැති හුලින් විදියේ ස්පර්ශවූයේ යුක්තවූයේ දුවයි. හැසිරෙයි යනුයි.

9 "ද්වෙෂය නැමැති හුලින් මොහය නමැති හුලින් මානය නමැති හුලින් බැසගත්තේ විදියේ ස්පර්ශවූයේ යුක්තවූයේ කයින් දුසිරිතෙහි හැසිරෙයි. වචනයෙන් දුසිරිතෙහි හැසිරෙයි සිතින් දුසිරිතෙහි හැසිරෙයි. සතුන්ද මරයි. භොරකම්ද කරයි. ගෙවල්ද බිඳියි. කොල්ල කෑම කරයි. එකම ගෙයක් වටකොට උවදුරු කරයි. උවදුරෙහිද සිටියි. පරදාර කර්මය පිණිසද යයි. බොරුද

කියයි. මෙසේ මාන සල්ලයෙන් බැසගත්තේ විදියේ ස්පර්ශකළේ යුක්තවූයේ දුවයි, හැසිරෙයි.

10 දෘෂ්ටි හුලින් බැසගත්තේ විදියේ ස්පර්ශ කළේ යුක්ත වූයේ නිර්වස්ත්‍ර නිසණ්ඨයෙක් වෙයි. පහකරණ ලද හොඳ සිරිත් ඇත්තේ වෙයි. කෑම කා අත ලෙවන්නේ වෙයි. කැඳවූ කල නොඑන්නේ වෙයි සිටින්නට කී කල නොසිටින්නේ වෙයි. කාලයට පළමු ගෙනා කෑම නොගනියි. තමන් උදෙසා තැනූ කෑම නොගනියි. ආරාධනාකොට දුන් කෑම නොගනියි. සැලියේ කටින් ගෙනත් දුන් කෑම නොගනියි. කුඩයේ කටින් ගෙනත් දෙන කෑම නොගනියි එළිපත අතරකොට දෙනදේ දණ්ඩක් අතර කොට දෙනදේ මෝලක් අතර කොට දෙන දේ නොගනියි කෑම කන දෙදෙනෙක් අතුරෙන් එක්කෙනෙක් නැගිට දෙන දේ නොගනියි. ගර්භණියගෙන්, කිරිපොවන්නියගෙන් පුරුෂයෙකු අතරට පැමිණි ස්ත්‍රියගෙන් නොගනියි. සම්මාදම්කොට පිසූකල එයින් නොගනියි. බල්ලෙකුට දීමට අදහස් කල කෑම නොගනියි මැස්සන් වැසූ කෑමද මස් මාංශ මත්පැන් නොගනියි. කාඩි බීම නොකරයි. ඔහු එක් ගෙයකම කෑම ලැබ නවතින්නේ හෝ එක් පිඩකින් හෝ ගෙවල් දෙකක හෝ පිඩු දෙකක් හෝ ලැබ නවතින්නේ වෙයි. ගෙවල් හතක කෑම ලැබ නවතින්නේ හෝ පිඩු හතකින් නවතින්නේ හෝ වෙයි. පිණ්ඩ පාත්‍ර හතකින්ද යැපෙයි. දත්ති නම් පාත්‍ර දෙකක බතින්ද යැපෙති. දවසක් හැර දවසක් කෑම කයි, දවස් දෙකක් හැර දවසක් කෑම කයි. දවස් හතක් හැර දවසක් කෑම කයි. මෙසේ මාස බාගයක් හැර දිනක් බත් කයි. මෙබඳු වූවන් බත් කෑමෙහි යෙදුනේ වාසය කරයි. මෙසේද දෘෂ්ටි නමැති හුලින් බැසගත්තේ විදියේ දුවයි හැසිරෙයි.

11 යලිදු හෝ දෘස්ටි හුලින් බැසගත්තේ විදියේ නොපිසූ පලා කන්නේ වෙයි. බඩහමු නම් තණ ධාන්‍ය කන්නේ වෙයි. ඉබේ හටගත් ධාන්‍ය කන්නේ හෝ වෙයි. සම් කැබලි කන්නේ හෝ වෙයි මැලියම් කන්නේ හෝ වෙයි කුඩු කන්නේ හෝ

වෙයි. දම්කුඩ කන්නේ හෝ වෙයි. පූනක්කු කන්නේ හෝ වෙයි. තණ කන්නේ හෝ වෙයි ගොමකන්නේ හෝ වෙයි. කැලෑ මුල් ගෙඩි කෑම ඇත්තේ ඉබේ වැටුන ගෙඩි කෑමෙන් හෝ යැපෙයි. හෙතෙම හණ රෙදිද දරයි. හන පතුරු මිශ්‍ර රෙදිද දරයි. එරුතණ ආදියෙන් කළ රෙදිද දරයි. බිම ලූ රෙදි මාලුද දරයි. ගස් පතුරුද දරයි. අඳුන්දිවිසම් දරයි. මැදපැලූ ඇඳුම් දිවිසම් දරයි. කුසවැහැරිද දරයි. තියඳ වැහැරිද දරයි. මැලි වැහැරිද දරයි. ඉස කෙසින් කළ කම්බිලිද දරයි. අස් ලොමින් කළ කම්බිලිද දරයි. බකමුහුණු පිහාටු වලින් කළ ශරීරයේ යටකොටස් ඇඳුම් අඳියි. ඉසකේ රැවුල් ඉදිරීමේ යෙදුනේ වෙයි. ආසන ඉවත්කොට නැගිට සිටින්නේ වෙයි. උක්කුටිකව හිඳීමේ වීයයීයෙහි යෙදුනේ වෙයි. කටු උඩ නිදාගන්නේ වෙයි. කටු උඩ හැසිරීම, කරන්නේ වෙයි. ලෑලි උඩ නිදාගන්නේ කුඩා තාප්පය උඩ නිදාගන්නේ වෙයි. එක පැත්තකට හැරී නිදාගන්නේ වෙයි. දූවිලි දැලි දරන්නේ වෙයි. එලියේ වසන්නේද වෙයි. පළමු එලූ ආකාරයටම වෙනස් නොකොට ආසනයක හිඳිනේ වෙයි, අසූචි අනුභවයෙහි යෙදුනේ වෙයි. ඇල්වතුර නොබොන්නේ ඇල්වතුර නොබීමෙහි යෙදුනේ වෙයි. උදය දවල් සහ සවස පවු පාකර හරින්නෙමැයි දියේ ගිලී වාසය කරයි. මෙසේද දෘෂ්ටි හුලින් බැසගත්තේ විදියේ ස්පර්ශ කළේ යුක්තවූයේ දුවයි හැසිරෙයි

12 "ශොකය නමැති හුලින් බැසගත්තේ විදිසේ ස්පර්ශ කළේ යුක්තවූයේ ශොකකරයි. ක්ලාන්තවෙයි, වැළපියි, පපුවේ අතගසා අඬයි. සිහිමුලාවට පැමිණෙයි, මෙය භාග්‍යවතුන්වහන්සේ විසින් වදාරණ ලදී. බ්‍රාහ්මණය පෙරකාලයෙහි මේ සැවැත්නුවර එක්තරා ස්ත්‍රියකගේ මව මළාය. ඇය ඇයගේ කාලක්‍රියාවෙන් උමතු සිත් ඇත්තී වික්ෂිප්ත සිත් ඇත්තී වීථියෙන් වීථියට මංසන්දියෙන් මංසන්දියට යමින් මෙසේ කීවාය. "මාගේ මව දැක්කහුද? මාගේ මව දැක්කහුද?" යනු වෙනි, බ්‍රාහ්මණය, පෙර මේ සැවැත් නුවරම එක්තරා ස්ත්‍රියකගේ පියා මළේය. සහෝදරයා මළේය, සහෝදරී මළාය. පුත්‍රයා මළේය, දුව මළාය, හිමියා මළේය. ඇය ඔහුගේ

කාලක්‍රියාවෙන් උමතු සිත් ඇත්තී වික්ෂිප්ත සිත් ඇත්තී වීථියෙන් වීථියට මංසන්දියෙන් මංසන්දියට පැමිණ මෙසේ කීවාය. "මාගේ ස්වාමියා දැක්කහුද? මාගේ ස්වාමියා දැක්කහුද?" යනුයි බ්‍රාහ්මණය, මේ සැවැත් නුවරම එක්තරා පුරුෂයෙකුගේ මව මළාය, හෙතෙම ඇයගේ මරණයෙන් උමතු සිත් ඇත්තී වික්ෂිප්ත සිත් ඇත්තී වීථියෙන් වීථියට මංසන්ධියෙන් මංසන්ධියට පැමිණ මෙසේ කිවේය. "මගේ මව දැක්කහුද? මගේ මව දැක්කහුද" යනුවෙනි. බ්‍රාහ්මණය, පෙර මේ සැවැත්නුවර එක්තරා පුරුෂයෙකුගේ පියා කළුරිය කළේය, සහෝදරයා කළුරිය කළේය. සහෝදරිය කළුරිය කළාය, පුත්‍රයා කළුරිය කළේය දුව කළුරිය කළාය, භාර්‍ය්‍යාව කළුරිය කළාය. හෙතෙම ඇයගේ කළුරිය කිරීමෙන් උමතු සිත් ඇත්තී වික්ෂිප්ත සිත් ඇත්තී වීථියෙන් වීථියට මංසන්ධියෙන් මංසන්ධියට ගොස් මෙසේ කීය. "මාගේ භාර්‍ය්‍යාව දැක්කහුද? මාගේ භාර්‍ය්‍යාව දැක්කහුද?" යනුවෙනි. බ්‍රාහ්මණය, පෙර මේ සැවැත්නුවරම එක්තරා ස්ත්‍රියක් ඥාති කුලයට ගියාය. ඇයගේ ඒ නෑයෝ ඇය ස්වාමියාගෙන් පැහැරගෙන අන්‍යයෙකුට දෙනු කැමැත්තෝ ඇයද එයට නොකැමැති වෙයි. ඉක්බිති ඒ ස්ත්‍රීය හිමියාට මෙසේ කීවාය. ආර්‍ය්‍යපුත්‍රය මේ නෑයෝ ඔබගෙන් මා පැහැර කරගෙන අනිකෙකුට දෙනු කැමැත්තෝය. "අපි දෙදෙනම මැරෙන්නෙමුයි" යනුවෙනි. ඉක්බිති පුරුෂතෙම ඒ ස්ත්‍රිය දෙපලුකොට තමා අතරෙහි හෙළයි. දෙදෙනාම පරලොව එකතුවන්නෙමු කියායි මෙසේ ශෝක නමැති හුලින් බැසගත්තේ විදියේ ස්පර්ශකළේ දුවයි, හැසිරෙයි.

13 "සැකය නමැති හුලින් විදියේ ස්පර්ශ කළේ යුක්ත වූයේ සැකයට පත්වූයේ වෙයි විමතියට පත්වූයේ අදහස් දෙකක් දරන්නේ වෙයි. "මම අතීත කාලයෙහිවීම්ද, මම අතීත කාලයෙහි නොවීම්ද? අතීත කාලයෙහි කවරකුවීම්ද, අතීත කාලයෙහි කෙසේ හෝ වන්නෙම්ද? අතීත කාලයෙහි කවරෙකුට කෙසේ හෝ වීම්ද, අනාගත කාලයෙහි මම වන්නෙම්ද අනාගත

කාලයෙහි මම නොවන්නෙම්ද? අනාගත කාලයෙහි මම කවරෙකු හෝ වන්නෙම්ද, අනාගත කාලයෙහි මම කවරෙකුවී කෙසේ වන්නෙම්ද, දැන් හෝ පවත්නා කාලය නිසා සැක ඇත්තේ වෙයි මම වීම්ද, මම නොවීම්ද, කවරෙකු වීම්ද, කෙසේ වීම්ද, මේ සත්වතෙම කොහින් පැමිණියේද, හෙතෙම කොහි යන්නේද? මෙසේ සැකය නමැති හුලින් විදියේ ස්පර්ශකළේ යුක්තවූයේ දුවයි, හැසිරෙයි, ඒ හුල් රැස් කරයි, ඒ හුල් රැස්කරන්නේ හුල් රැස් කිරීම් වශයෙන් පෙරදිගට දුවයි. අවරදිගට දුවයි, උතුරු දිගට දුවයි, දකුණු දිගට දුවයි, ඒ හුල් රැස්කිරීම ප්‍රහීණ නොවූයේය, හුල් රැස්කිරීම ප්‍රහීණ නොවූ බැවින් ඒ ඒ ගතිවල දුවයි, නිරයෙහි දුවයි. තිරිසන් යොනියෙහි දුවයි, පෙත්‍ර විෂයෙහි දුවයි, මිනිස්ලොව දුවයි, දෙව්ලොව දුවයි, ගතියෙන් ගතියට ඉපදිමෙන් ඉපදීමට ප්‍රතිසන්ධියෙන් ප්‍රතිසන්ධියට භවයෙන් භවයට සංසාරයෙන් සංසාරයට වට්ටයෙන් වට්ටයට දුවයි, හැසිරෙයි

14 "ඒ හුලම උදුරා නොදුවයි නොකිඳයි" යනු ඒ රාග නැමති හුලම ද්වෙෂ නමැති හුලම, මොහ නමැති හුලම මාන හුලම දෘෂ්ටි හුලම ශොක හුල සැකය නමැති හුල උගුලා දුරුකොට සන්සිඳුවා නූපදනා බවට පමුණුවා පෙරදිගට නුදුවයි අවරදිගට නුදුවයි, උතුරු දිගට නුදුවයි, දකුණු දිගට නුදුවයි, ඒ හුල් රැස්කිරීම ප්‍රහීණ විය. හුල් රැස් කිරීම ප්‍රහීණවූ බැවින් ගතියෙහි නුදුවයි, නිරයෙහි නුදුවයි, තිරිසන් යෝනියෙන් නුදුවයි, ප්‍රෙත විෂයෙහි නුදුවයි මිනිස් ලොව නුදුවයි, දෙව්ලොව නුදුවයි. ගතියෙන් ගතියට නුදුවයි. උත්පත්තියෙන් උත්පත්තියට නුදුවයි ප්‍රතිසන්ධියෙන් ප්‍රතිසන්ධියට නුදුවයි. භවයෙන් භවයට නුදුවයි, සංසාරයෙන් සංසාරයට නුදුවයි. වට්ටයෙන් වට්ටයට නුදුවයි. නොහැසිරෙයි යනුයි "නොදුවයි නොකිඳයි" යන්නෙහි කාමොඝයෙහි නොකිඳයි, භවොඝයෙහි නොකිඳයි, දිට්ඨොඝයෙහි නොකිඳයි, අවිජ්ජොඝයෙහි නොකිඳයි, නොයයි පහළට නොයයි යනුයි.

## 15 - 6

1 "ලොකයෙහි යම් පස්කම් ගුණ කෙනෙක් වෙද්ද ඒ අනුව ශික්ෂාවෝ කියනු ලැබෙත්" යන්නෙහි ශික්ෂා නම් හස්ති ශික්ෂාව අශ්ව ශික්ෂාව රථ ශික්ෂාව දුනු ශික්ෂාව තඹ කුරු ආදිය යොදා කරණ වෛද්‍ය ශික්ෂාව ආයුධ යොදා කරණ ශස්ත්‍ර වෛද්‍ය විද්‍යාව කාය චිකිත්සාව මූල ධාතූන්ට අයත් දේ යොදා කරණ චිකිත්සාව කුමාර චිකිත්සාව යනුයි. "කියනු ලැබෙත්" යනු පඤ්චකාම ගුණ ලාභය පිණිස කියනු ලැබෙත්, ප්‍රකාශ කරණු ලැබෙත් ව්‍යවහාර කරණු ලැබෙත්, යලිදු හෝ ගණු ලැබෙත්, ඉගෙණ ගනු ලැබෙත්, දරණු ලැබෙත්, යනුයි, ඉතා බැදුන දේයයි පඤ්චකාම ගුණයන්ට කියයි. ඇසට ගොදුරුවූ ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ කාමයන් ඇති කරන්නාවූ රූපයෝ වෙති. කුමක් හෙයින් ගධිතයයි පචඤ්කාම ගුණයන්ට කියත්ද? බොහෝසේ දිව්‍ය මනුෂ්‍යයෝ පංචකාම ගුණයන් කැමති වෙත්. ආශා කරත්, ප්‍රාර්ථනා කරත්, ඒ කාරණයෙන් "ඉතා බැඳුන දේයයි" පංචකාම ගුණයන්ට කියයි. ලොකයෙහි යනු (3-4) 6 ඡෙදය යොදාගත යුතුයි)

2 "ඒ කාමයන්හි හෝ ශික්ෂාවන්හි නොයෙදුනෙක් වන්නේද" යනු ඒ ශික්ෂාවන්හි හෝ ඒ පංචකාම ගුණයන්හි හෝ යෙදුනෙක් නොවන්නේද එයට බරවූවෙක් නොවන්නේද එයට නැමුනෙක් නොවන්නේද එයට ඇලුනෙක් නොවන්නේද එය අධිපතිකොට ඇත්තෙක් නොවන්නේද "ඒ කාමයන් සර්වප්‍රකාරයෙන් දුරුකොට" යන්නෙහි දුරු කොට යනු අවබොධකොට සියලු සංස්කාරයෝ අනිත්‍යයයි අවබොධකොට සියලු සංස්කාරයෝ දුක්යයි අවබොධකොට සියලු ධර්මයෝ අනාත්මයයි අවබොධ කොට යම්කිසි හේතුවකින් උපන් ධර්මයක් ඇද්ද ඒ සියල්ල නිරොධය පිණිස පවතීයයි දැන යනුයි. සර්වප්‍රකාරයෙන් යනු සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සර්වප්‍රකාරය නිරවශෙෂයටකොට ගන්නා වචනයකි. "කාමයෝ" යනු ප්‍රකට වශයෙන් කාමයෝ

දෙකොටසකි වස්තු කාමයෝද ක්ලේශ කාමයෝද වෙති (මෙහි 1 කාමසූත්‍ර නිර්දෙශයේ 1 (ii) 2, 3 ඡේද යොදාගත යුතුයි)

3 "තමන්ගේ නිවණ පිණිස හික්මෙන්නෙය" යන්නෙහි හික්මීම යනු හික්මීම් තුනෙකි. අධිශීල ශික්ෂා අධි චිත්ත ශික්ෂා, අධිප්‍රඥා ශික්ෂා යනුයි. (2-4) 1 (ii) 2 අවසානයට යොදාගත යුතුයි.) මේ අධි ප්‍රඥා ශික්ෂාවයි. "තමන්ගේ නිවණ යනු" තමන්ගේ රාගය නිවීම පිණිස ද්වෙෂය නිවීම පිණිස මොහය නිවීම පිණිස (3-4) 2 ක්‍රොධය යන තැන සිට පමාද යන තැනට යොදාගත යුතුයි) සියලු අකුසල් රැස් කිරීම පිණිස නිවීම පිණිස බැහැර කිරීම පිණිස අධිශීලයෙහි හික්මෙන්නේය, අධි ප්‍රඥාවෙහි හික්මෙන්නේය, අධි චිත්තයෙහි හික්මෙන්නේය, මේ ශික්ෂා තුන මෙනෙහි කරන්නේ හික්මෙන්නේ දැනගන්නේය, හික්මෙන්නේය ප්‍රත්‍යක්ෂ කටයුතුයි, (2-4) "දකින්නෙ හික්මෙන්නේය" යන තැන සිට වැඩිය යුත්ත යන තැනට යොදාගත යුතුයි.) ප්‍රත්‍යක්ෂ කරන්නේ හික්මෙන්නේය හැසිරෙන්නේය සමාදන්ව පවත්නේය යනුයි

## 15 - 7

1 "සත්‍යවාදියෙක් වන්නේය හික්මීම ඇත්තෙක් වන්නේය" යන්නෙහි, 'සත්‍යවාදියෙක් වන්නේය' යනු සම්‍යක් දෘෂ්ටියෙන් යුක්තයෙක් වන්නේය, ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයෙන් යුක්තයෙක් වන්නේය යනුයි. "හික්මීම ඇත්තෙක්" යනු නොහික්මීම් තුනෙකි කායික නොහික්මීම වාචසික නොහික්මීම චෛතසික නොහික්මීම් යනුයි. (10-5) 5 'උඩඟුකම' යනු 'නොහික්මීම' යයි වෙනස්කොට යොදාගත යුතුයි.) යමෙකුගේ මේ නොහික්මීම් තුන දුරුවූවාහුද මුලින් සිඳුනාහුද ශාන්තවූවාහුද ඉපදීමට අයොග්‍යවූවාහුද ඥානය නමැති ගින්නෙන් දැවුනාහුද, හෙතෙම හික්මුන තැනැත්තේයයි කියයි. "රැවටිලි නැත්තේ කේලාම් කීමෙන් තොරවූයේ" යන්නෙහි "මායා" යයි වඤ්චනික හැසිරීමට කියයි. මෙහි ඇතැම් පුද්ගලයෙක් කයින් දුසිරිත්

කොට වචනයෙන් දුසිරිත් කොට සිතින් දුසිරිත් කොට එය වැසීමේ හේතුවෙන් පාපී අදහස් ඇති කරයි. මා නොදනීවායි කැමති වෙයි. මා නොදනීවායි කල්පනා කරයි. මා නොදනීවායි වචනයෙන් කියයි. මා නොදනීවායි කයින් ඉක්මවයි. මෙබඳු මායාවක් රැවටිල්ලක් වැසීමක් හැංගීමක් අප්‍රකට කිරීමක් වේද එයයි. යමෙකුගේ මේ රැවටීම ප්‍රහීණවීද මුලින් සිඳුනේද ශාන්තද ඉපදීමට අයොග්‍යද ඥානය නමැති ගින්නෙන් දැවුනේද, හෙතෙම රැවටලි නැත්තේයයි කියයි

2 "කේලාම් කීමෙන් වෙන්වූයේ" යන්නෙහි "කේලාම" නම් මෙහි ඇතැම් පුද්ගලයෙක් කේලාම් කියන්නේ වෙයි. බිඳීමේ අදහසින් කේලම රැස් කරයි. යමෙකුගේ මේ කේලම ප්‍රහීණවූයේද සිඳුනේද ශාන්තද ඉපදීමට අයොග්‍යද ඥානය නමැති ගින්නෙන් දැවුනේද හෙතෙම කේලමින් වෙන්වූයේයයි කියයි.

3 "මුනිතෙම ක්‍රොධ නැත්තේ පාපීවූ ලොභයද මසුරුකම තරණය කළේය" යනු ක්‍රොධ නැත්තේ යනු කියන ලද්දේමය. නැවතද ක්‍රොධය පළමුව කිය යුතුයි දශ කාරයකින් ක්‍රොධය ඇති වෙයි. 'මට අනර්ථයත් කළේයයි' ක්‍රොධය හටගනියි (10-3) 1 ඡෙදය යොදාගත යුතුයි) යමෙකුගේ මේ ක්‍රොධය ප්‍රහීණද සමුච්ඡින්නද ශාන්තද සංසිඳුනේද ඉපදීමට අයොග්‍යද ඥානය නමැති ගින්නෙන් දැවුනේද, හෙතෙම ක්‍රොධය නැත්තේයයි කියයි. ලොභය යනු යම් ලොභයක් ලොභ බවක් අභිධ්‍යාවක් අකුශල මූලයක් ඇද්ද එයයි. මසුරුකම යනු පස් මසුරුකම්වලට කියයි. ආවාසමච්ඡරිය (6-6) 2 (iii) යොදාගත යුතුයි) යනුයි. මුනි යනු මොනයයි ඥානයට කියයි. තෘෂ්ණා ජාලය ඉක්මවා සිටියේද හෙතෙම මුනි නම්. "මුනිතෙම" ක්‍රොධ නැත්තේ පාපීවූ ලොභයද මසුරුකමද දුරුකළේ යනු මුනිතෙම පාපීවූ ලොභයද මසුරුකමද තරණය කළේය. ඉක්මවූයේය වෙන් කළේය යනුයි.

## 15 - 8

1 "නිදීමද කයේ අලසකමද සිතේ අලසකමද මැඩ පවත්නේ" යන්නේනහි "නිදීම නම්" කායයාගේ යම්

නුසුදුසුකමක් වැඩට නොයෙදෙන ගතියක් පසුබැස්මක් ඇතුළත ඇලීමක් නිදීමක් ඇද්ද එයයි. අලසකම යනු යම් සිතේ මැලිකමක් වැඩට නොයෙදෙන ගතියක් පසුබැසීමක් ඇද්ද එයයි "නිදීමද සිතේ අලසකමද කයේ අලසකමද මැඩ පවත්නේය යනු නිදීමද සිතේ අලසකමද කයේ අලසකමද දුරු කරන්නේය මැඩපවත්නේය යනුයි.

2 "ප්‍රමාදයෙන් නොවසන්නේය" යන්නෙහි ප්‍රමාදය කිය යුතුයි. කාය දුශ්චරිතයෙහි හෝ වාග් දුශ්චරිතයෙහි හෝ මනස් දුශ්චරිතයෙහි හෝ පඤ්චකාම ගුණයෙහි හෝ සිතේ යෙදීමක් හෝ කුශලධර්මයන්ගේ වැඩීම් පිණිස නොසකස්ව ක්‍රියා ඇතිව නිතර ක්‍රියා නොකිරීම බව නොනිමි ක්‍රියා ඇති බව හීන ධෛර්‍ය්‍ය ඇතිබව බහාතැබූ කැමැත්ත ඇති බව බහාතැබූ ධෛර්‍ය්‍ය ඇතිබව සේවනය නොකරණ බව එහි නොයෙදීම යනු ප්‍රමාදයයි. මෙබඳු යම් ප්‍රමාදයක් ප්‍රමාදවීම් බවක් වේද මෙය ප්‍රමාදයයි කියයි ප්‍රමාදයෙන් නොවසන්නේය යනු ප්‍රමාදයෙන් නොවන්නේය ප්‍රමාද දුරුකරන්නේය අභාවයට පමුණුවන්නේය ප්‍රමාදයෙන් දුරුවූවෙක් වන්නේය වෙන්වූයේ නික්මුයේ සීමානොකළ සිතින් වසන්නේය යනුයි.

3 "අතිමානයෙහි නොසිටින්නේය" යන්නෙහි අතිමානය නම් මෙහි ඇතැම් පුද්ගලයෙක් ජාතියෙන් හෝ ගෝත්‍රයෙන් හෝ (3-7) 2 (vii) යොදාගත යුතුයි) වෙනින් අනික් කරුණකින් හෝ අන්‍යයා පහත්කොට සිතන්නේය. යම් මෙබඳුවූ මානයක් සිතීමක් සිතේ උසස්කමක් ධ්වජයක් මෙය නැංවීමක් මනාකොට ගැන්මක් කොඩියක් මෙන් සිතේ නැංවීමක් වේද, මෙය අතිමානයයි කියයි. "අතිමානයෙහි නොසිටින්නේය" යනු අතිමානයෙහි නොසිටින්නේය. අතිමානය දුරලන්නේය. අභාවයට පමුණුවන්නේය අති මානයෙන් ඈත්වූවෙක් වන්නේය. වෙන්වූවෙක් වන්නේය. නික්මුනේ වෙන්වූයේ සීමා නොකළ සිතින් වසන්නේය යනුයි.

4 "නිර්වාණයට සිත යෙදූ මිනිස්තෙම" යනු මෙහි ඇතැම් පුද්ගලයෙක් දන් දෙන්නේ සිල් සමාදන් වන්නේ උපෝෂත

කර්මය කරන්නේ බොන පැන් හා පරිභොග ජලය ගෙන තබන්නේ පිරිවෙණ අමදින්නේ චෛත්‍යය වඳින්නේ චෛත්‍යයෙහි සුවඳ මල් තබන්නේ චෛත්‍යය ප්‍රදක්ෂිණා කරන්නේ යම්කිසි ත්‍රෛධාතුක කුශලයන් රැස්කරන්නේ ගති හේතුවකින් නොව උත්පත්ති හේතුවකින් නොව ප්‍රතිසන්ධි හේතුවකින් නොව භව හේතුවකින් නොව සංසාර හේතුවකින් නොව වට්ට හේතුවකින් නොව ඒ සියල්ල වෙන්කිරීමේ අදහසින් නිර්වාණයට නැඹුරුවූයේ නිර්වාණයට බරවූයේ කුසල් රැස්කරයි මෙසේද නිර්වාණයට සිත යෙදූ මිනිසා නම්. යලිදු හෝ සියලු සංස්කාර ධාතුවෙහි සිත පසුබස්වා අමෘත ධාතුව පිණිස සිත රැස්කරයි. (නංවයි) සියලු සංස්කාරයන් සන්සිඳවූ සියලු කෙලෙස් දුරුකළ තෘෂ්ණාව ගෙවා දැමූ විරාග නම්වූ නිරොධ නම්වූ නිර්වාණයක් ඇද්ද මෙය ශාන්තය, මෙය ප්‍රණීතය යනුවෙනි.

5 "නුවණැත්තෝ කාමසුඛ හේතුවෙන් නැවත භවයක් ඇතිවීම පිණිස දන් නොදෙත්. ඒකාන්තයෙන් ඔවුහු කෙලෙස් දුරුකිරීම පිණිස යලිත් භවයක් නොලැබීම පිණිස දන් දෙත්"

6 "නුවණැත්තෝ කාමසුඛ හේතුවෙන් නැවත භවයක් ඇතිවීම පිණිස ධ්‍යානයක් නොවඩත් ඒකාන්තයෙන් ඔවුහු කෙලෙස් දුරුකිරීම පිණිස යලිත්, භවයක් නොලැබීම පිණිස නැවත භවයක් ඇතිනොවීම පිණිස ධ්‍යාන වඩත්."

"ඔවුහු නිර්වාණය බලාපොරොත්තුවෙන් එයට නැමුන සිතැතිව එහි ඇලී දන් දෙත්. යම්සේ ගංගාව සාගර මධ්‍යයට පැමිණේද එමෙන් ඔවුහු නිර්වාණය පිහිටකොට ඇත්තේ වෙත්" යනුයි.

## 15 - 9

1 "මුසාවාදයෙහි නොයෙදෙන්නේය" යනු මුසාවාදය යයි බොරු කීමට කියයි. මෙහි ඇතැම් පුද්ගලයෙක් සභා මැදට ගියේ හෝ පිරිස් මැදට ගියේ හෝ නෑයින් මැදට ගියේ හෝ සමූහ මැදට ගියේ හෝ රාජකුල මධ්‍යයට ගියේ හෝ ඉදිරියට

පැමිණියේ ශාක්ෂි විචාරණලද්දේ ‘එම්බා පුරුෂය’ මෙහි එව, ‘යමක් දන්නෙහි නම් එය කියවයි’ කී කල්හි හෙතෙම තමා නොදත් දෙය හෝ දනිමියි දත් දෙය හෝ නොදනිමි’යි නොදුටු දෙය හෝ දකිමි’යි දුටු දෙය, නොදනිමියි තමා හේතුවෙන් හෝ අනුන් හේතුවෙන් හෝ ඉතා සුළු ආමිෂයක් ගැන හෝ දැන දැන බොරු කියයි මෙය මුසාවාදයයි කියයි. නැවතද තුන් ආකාරයකින්, සතරාකාරයකින්, පස් ආකාරයකින් සයාකාරයකින්, සත් ආකාරයකින්, අටාකාරයකින් මුසාවාදය වෙයි. “මුසාවාදයෙහි නොයෙදෙන්නේය” යනු මුසාවාදයෙහි නොයන්නේය. නොපැමිණෙන්නේය. පානොවෙන්නේය. රැස් නොකරන්නේය. මුසාවාදය දුරලන්නේය. සංසිඳුවන්නේය. අභාවයට පමුණුවන්නේය. මුසාවාදයෙන් දුරුවූවෙක් වන්නේය. නික්මුනේ, වෙන්වූයේ සීමානොකළ සිතින් වසන්නේය.

2 “රූපයෙහි ස්නේහය නොකරන්නේය” යන්නෙහි රූපය, නම් සතර මහා භූතයෝද සතර මහා භූතයන්ගේ උපාදාය රූපයෝද යනුයි “රූපයෙහි ස්නේහය නොකරන්නේය” යනු රූපයෙහි ස්නේහය නොකරන්නේය. ආශාව නොකරන්නේය. ප්‍රෙමය නොකරන්නේය. ඇලීම නොකරන්නේය. නූපදවන්නේය යනුයි.

3 “මානයද දැනගන්නේය” යන්නෙහි “මානය” යනු සිතේ යම් උසස් ගතියක් වේද, එක් ආකාරයකින් මානයයි. දෙයාකාරයකින් මානයයි එනම් තමා උසස් කොට සිතීමද අනුන් පහත්කොට සිතීමද යනුයි තුන් ආකාරයකින් මානයයි. එනම් ශ්‍රෙෂ්ඨවෙමියි මානය සමානවෙමියි මානය හීනවෙමියි මානය යනුයි සතරාකාරයකින් මානයයි එනම් ලාභයෙන් මානය උපදවයි කීර්තියෙන් මානය උපදවයි. ප්‍රසංශාවෙන් මානය උපදවයි සැපයෙන් මානය උපදවයි. පස් ආකාරයෙන් මානයයි එනම් මනවඩන රූපයන් ලබන්නේ වෙමියි මානය උපදවයි. ශබ්දයන්, ගන්ධයන් රශයන් ස්පර්ශයන් ලබන්නේ වෙමියි මානය උපදවයි. සයාකාරයෙන් මානයයි. එනම් ඇස් ලැබීමෙන් මානය උපදවයි කන ලැබීමෙන් නාසය ලැබීමෙන්,

දිව ලැබීමෙන් කය ලැබීමෙන්, සිත ලැබීමෙන්, මානය උපදවයි. සත් ආකාරයකින් මානයයි එනම්, අතිමානය, මානාති මානය, අවමානය, සදිස මානය, අධිමානය, අස්මි මානය, මිථ්‍යා මානය, යනුයි. අට ආකාරයකින් මානයයි. එනම්,

4 ලාභයෙන් මානය උපදවයි අලාභයෙන් අවමානය උපදවයි කීර්තියෙන් මානය උපදවයි අපකීර්තියෙන් අවමානය උපදවයි. ප්‍රශංසාවෙන් මානය උපදවයි. නින්දාවෙන් අවමානය උපදවයි. සැපයෙන් මානය උපදවයි. දුකින් අවමානය උපදවයි නව ආකාරයෙන් මානය උපදවයි. ශ්‍රේෂ්ඨයාට ශ්‍රේෂ්ඨවෙමියි මානය, ශ්‍රේෂ්ඨයාට සමානවෙමියි මානය, ශ්‍රේෂ්ඨයාට හීනවෙමියි මානය, සමානයාට ශ්‍රේෂ්ඨ වෙමියි මානය, සමානයාට සමානවෙමියි මානය, සමානයාට හීනවෙමියි මානය, හීනයාට ශ්‍රේෂ්ඨවෙමියි මානය, හීනයාට සමාන වෙමියි මානය, හීනයාට හීනවෙමියි මානය යනුයි. දශාකාරයකින් මානයයි, මෙහි ඇතැම් පුද්ගලයෙක් මානය උපදවයි ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලපුත්‍රකමින් හෝ (3-7) 2 (vii) 'වැටහීමෙන් හෝ යන තැනට යොදාගත යුතුයි. වෙනින් අනික් කරුණකින් හෝ යනුයි. යම් මෙබඳු මානයක් සිතීමක් සිතේ උසස්බවක් ධජයක් මෙන් නැංවීමක් කොඩියක් මෙන් ගැනීමක්වේද මෙය මානයයි කියයි. "මානය දන්නේ" යනු "මානය ඤාතපරිඤ්ඤා, තීරණ පරිඤ්ඤා, පහාණපරිඤ්ඤා යන දැනීම් තුනින් දන්නේය ඥානපරිඤ්ඤාව යම් සිතේ උසස් ගතියක්වේද මේ එක් අයුරකින් මානයයි. (15-9) 2 ඡෙදය යෙදිය යුතුයි) වෙනින් අනික් කරුණකින් හෝ දනියි. දකියි. මේ ඥානපරිඤ්ඤාවයි තීරණ පරිඤ්ඤාව කවරීද? මෙසේ දැන මානය තීරණය කරයි. අනිත්‍ය වශයෙන් දුක්වශයෙන් අනිස්සරණ වශයෙන් තීරණය කරයි. මේ තීරණ පරිඤ්ඤා නම් ප්‍රහාණ පරිඤ්ඤාව කවරීද? මෙසේ තීරණය කොට මානය දුරුකරයි සන්සිඳුවයි. අභාවයට පමුණුවයි. මේ ප්‍රහාණ පරිඤ්ඤාවයි. මානයද දන්නෙය යනු මානය මේ දැනීම් දැනගන්නේය යනුයි.

5 "සාහසික ක්‍රියාවලින් වෙන්වූවෙක් වන්නේය" යන්නෙහි සාහස චරියාව නම් කුමක්ද? රාගිකයාගේ රාග චරියාව සාහස

චරියාව නම් ද්වෙෂය ඇත්තහුගේ ද්වෙෂ චරියාව සාහස චරියා නම් මුලාවූවහුගේ මොහ චරියාව සාහස චරියා නම් එකට බැඳුනහුගේ මානචරියාව සාහස චරියා නමි. පරාමර්ශවූවහුගේ දෘෂ්ටි චරියාව සාහස චරියා නමි. වික්ෂෙපවූවහුගේ උද්ධච්ච චරියාව සාහස චරියා නමි. තීරණයක් නැත්තහුගේ විචිකිච්ඡා චරියාව සාහස චරියා නමි. ථාමගතයාගේ අනුසය චරියාව සාහස චරියා නමි. මේ සාහස චරියාවයි. "සැහැසි කමින් වෙන්ව හැසිරෙන්නේය" යනු සැහැසි චරියාවෙන් ඈත්වූවෙක් වන්නේය. වෙන්වූවෙක් වන්නේය. නික්මුණෙක් වන්නේය. මිදුණෙක් වන්නේය, සීමා නොකළ සිතින් වසන්නේය හැසිරෙන්නේය පවත්නේය පාලනය කරන්නේය යැපෙන්නේය යනුයි.

## 15 - 10

1 "පුරාණයට සතුටු නොවන්නේය" යන්නෙහි අතීතවූ රූප වෙදනා සඤ්ඤාසංඛාර විඤ්ඤාණයෝ පුරාණ යයි කියයි. අතීත සංස්කාරයෙහි තෘෂ්ණා වශයෙන් දෘෂ්ටි වශයෙන් සතුටු නොවන්නේය නොකියන්නේය නොගැලෙන්නේය කීම බැසීම ගැනීම දුරු කරන්නේය යනුයි.

2 "අළුත් රුචිය නොකරන්නේය" යන්නෙහි අළුත් යයි පවත්නා කාලයෙහි රූප වෙදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණයන්ට කියයි. පවත්නා කාලයෙහිවූ සංස්කාරයන් කෙරෙහි තෘෂ්ණ වශයෙන් හෝ දෘෂ්ටි වශයෙන් හෝ රුචිය නොකරන්නේය, කැමැත්ත නොකරන්නේය, ප්‍රෙම නොකරන්නේය. රාගය නොකරන්නේය. නූපදවන්නේය, ඇති නොකරන්නෙය යනුයි.

3 "පිරිහෙන කල්හි ශොක නොකරන්නේය" යනු විනාශයවන කල්හි පිරිහෙන කල්හි වෙන්වන් කල්හි අතුරුදන්වන කල්හි (ii) ශොක නොකරන්නේය, ක්ලාන්ත නොවන්නේය, පරාමර්ශ නොකරන්නේය, සිහි මුලා බවට නොපැමිණෙන්නේය. ඇස විනාශවන කල්හි (මෙහි (ii)

යොදාගත යුතුයි) කණ, නාසය, දිව, කය, රූපය, ශබ්දය, ගන්ධය, රසය, ස්පර්ශය, කුලය, ගණයා, ආවාසය, ලාභය, කීර්තිය, ප්‍රශංසාව, සැපය, චීවරය, පිණ්ඩපාතය-සෙනාසනය-ගිලන්පස බෙහෙත් පිරිකර-යන මේවා පිරිහෙන කල්හි-වෙනස්වන කල්හි-වෙන්වන කල්හි-අතුරුදහන් වන කල්හි-ශොක නොකරන්නේය ක්ලාන්ත නොවන්නේය පරාමර්ශ නොකරන්නේය නොවළපින්නේය පපුව මත අත තබා නොහඬන්නේය. සිහිමුලාවට නොපැමිණෙන්නේය යනුයි

4 "ආකාශ නිශ්‍රිත නොවන්නේය" යන්නෙහි ආකාශ යයි තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද-ඇලීමක් (1-3) 3 ඡේදයේ 'යම් ලංවීමක්' යන තැන සිට යොදාගත යුතුයි) අභිධ්‍යාවක් අකුශල මූලයක් ඇද්ද එය තෘෂ්ණාවයි. කුමක් හෙයින් ආකාශයයි තෘෂ්ණාවට කියනු ලැබේද? යම් තෘෂ්ණාවකින් තෘෂ්ණාව ඇද ගනීද මනාකොට ගනිද පරාමර්ශ කෙරේද, ඇතුළුවේද, වේදනාව සඤ්ඤාව, සංස්කාරයන් විඤ්ඤාණය ගතිය උත්පත්තිය ප්‍රතිසන්ධිය භවය සංසාරය වට්ටය ආකර්ශනය කෙරේද ගනීද, පරාමර්ශ කෙරේද, අතුළු වේද ඒකාරණයෙන් තෘෂ්ණාවට ආකාශයයි කියයි.

5 "ආකාශ නිශ්‍රිත නොවන්නේය" යනු තෘෂ්ණා නිශ්‍රිත නොවන්නේය, තෘෂ්ණාව දුරලන්නේය, සංසිඳුවන්නේය, අභාවයට පමුණු වන්නේය, තෘෂ්ණාවෙන් දුරුවූවෙක් වන්නේය, නික්මුනේ වෙන්වූයේ සීමා නොකළ සිතින් වසන්නේය, යනුයි.

## 15 - 11

1 "ගෙධයයි කියමි. මහොඝයයි කියමි" යන්නෙහි ගෙධයයි තෘෂ්ණාවට කියයි, යම් රාගයක් ඇද්ද ඇලීමක් ඇද්ද (1-3) 3 ඡේදයේ 'යම් ලංවීමක් ඇද්ද' යන තැන සිට යොදාගත යුතුයි.) අභිධ්‍යාව ලොභය අකුශල මූලය යනුයි. "මහොඝයයි තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද ඇල්මක් ඇද්ද (1-3) 3 ඡේදයේ 'යම් ලංවීමක්' ඇද්ද යන තැන සිට යොදාගත යුතුයි) අභිධ්‍යාව ලොභය අකුශල මූලය යනුයි. "ගෙධය මහොඝයයි කියමි."

යනු ගෙධයයි මහොඝයයි කියමි. දෙශනා කරමි. පණවමි තබමි විවෘත කරමි බෙදමි ප්‍රකට කරමි. ප්‍රකාශ කරමි" යනුයි.

2 "ආජවයයි කියමි ජප්පනයයි කියමි" යන්නෙහි ආජවයයි තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද (1-3) 3 ඡෙදයේ 'යම් ලංවීමක් ඇද්ද' යන තැන සිට යොදාගත යුතුයි) ආජවයද ජප්පනයද කියමි යනු ආජවයද ජප්පනයද කියමි. ප්‍රකාශ කරමි, දෙශනා කරමි, පනවමි තබමි විවෘත කරමි බෙදමි ප්‍රකට කරමි යනුයි.

3 "ආරම්මණයයිද පකම්පනයයිද කියමි" යනු ආරාම්මණයයිද තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද ආලයක් ඇද්ද (1-3) 3 ඡෙදයේ 'යම් ලංවීමක්' යන තැන සිට යොදා ගත යුතුයි) අකුශල මූලයයි පකම්පනයයිද තෘෂ්ණාවට කියයි යම් රාගයක් ඇද්ද (1-3) 3 ඡෙදයේ 'යම් ලංවීම' යන තැන සිට යොදාගත යුතුයි) කාමපංකය ඉක්මවීමට දුෂ්කරය යනු කාම මඩ කාමක්ලෙශය කාම පළිරොධය ඉක්මවීමට දුෂ්කරය තරණය කිරීම දුෂ්කරය සංසිඳුවීම දුෂ්කරය යනුයි.

## 15 - 12

1 "මුනිතෙම සත්‍යයෙන් නොඉක්මුනේය" යනු සත්‍ය වචනයෙන් නොඉක්මවූයේ සම්‍යක් දෘෂ්ටියෙන් නොඉක්මවූයේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයෙන් නොඉක්මවූයේ යනුයි. "මුනි" යනු මොනයයි ඥානයට කියයි. (2-4) 12 (ii) ඡෙදය යොදාගත යුතුයි) තෘෂ්ණා ජාලය ඉක්මවා සිටියේද හෙතෙම මුනි නම්,

2 "බ්‍රාහ්මණ තෙම ගොඩ සිටියි යනු ගොඩයයි අමෘතවූ නිර්වාණයට කියයි. යම් ඒ දෙයක් සියලු සංස්කාරයන් සංසිඳවූයේද සියලු උපධින් බැහැර කළේද තෘෂ්ණා ක්ෂය වූයේද විරාග නම්වූ නිරොධ නම්වූ ඒ නිර්වාණයයි. බ්‍රාහ්මණ යනු (මෙහි (4-3) 1 'බ්‍රාහ්මණ' යන තැන සිට යොදාගත යුතුයි) ආශ්‍රිත නොවූ කෙලෙස් දුරුකළ හෙතෙම බ්‍රාහ්මණයයි කියයි බ්‍රාහ්මණතෙම ගොඩ සිටියි යනු දිවයිනෙහි සිටියි. ආරක්ෂා

ස්ථානයෙහි සිටියි පිහිට ඇති ස්ථානයෙහි සිටියි අභයස්ථානයෙහි සිටියි. ච්‍යුත නොවන ස්ථානයෙහි සිටියි

3 "හෙතෙම සියල්ල දුරුකොට" යන්නෙහි සියල්ල යයි ද්වාදශ ආයතනයන්ට කියයි. යම් හෙයකින් අධ්‍යාත්මික බාහිර ආයතනයන්හි ඡන්ද රාගය ප්‍රහීණවූයේ වේද, මුලින් උදුරුණ ලද්දේ අග සිඳින ලද තල්ගසක් මෙන් කරණ ලද්දේද අභාවයට පමුණුවන ලද්දේද නැවත නූපදීම් බවට පමුණුවන ලද්දේද මෙපමණකින් සියල්ල දුරුවූයේ වෙයි. වමාරාදැමූයේ වෙයි. ප්‍රහීණවූයේ වෙයි. සංසිඳවූයේ වෙයි යනුයි ඒකාන්තයෙන් හෙතෙම ශාන්තවූ තැනැත්තේ යයි කියයි හෙතෙම යනු ශාන්තවූයේ සංසිඳුනේ නිවුනේයයි කියයි. ප්‍රකාශ කරයි ව්‍යවහාර කරයි යනුයි.

## 15 - 13

1 "ඒකාන්තයෙන් හෙතෙම නුවණැත්තේ නම්. වෙදගූ නම්. යන්නෙහි නුවණැත්තේ යනු විද්‍යාවට පැමිණි තැනැත්තේ නුවණැත්තේ ප්‍රඥා ඇත්තේ යනුයි. වෙදගූ යන්නෙහි වෙදයෝයයි සතර මාර්ගයන්හි ඥානයට ( (3-4) 3 "වෙදයයි" යක තැන සිට යොදාගත යුතුයි.) සියලු වේදනා වන්හි ඇල්ම දුරුකළේ සියලු වෙදනාවන් ඉක්මවා සිටියේ යයි හෙතෙම වෙදගූ නම් යනුයි.

2 "ධර්මය දැන නොඇළුනේ" යන්නෙහි දැන යනු දැන සමකොට බලා තීරණය කොට ප්‍රකට කොට යනුයි. සියලු සංස්කාරයෝ අනිත්‍යයයි (ii) දැන සමකොට බලා තීරණය කොට ප්‍රකට කොට (iii) සියලු සංස්කාරයෝ දුක්යයි (මෙහි (ii) යොදාගත යුතුයි. හේතුවකින් ඇතිවන යම් ධර්මයක් ඇද්ද ඒ සියල්ල විනාශය පිණිස පවත්නේයයි දැන සමකොට බලා තීරණයකොට ප්‍රකට කොට යනුයි. "නොඇළුනේ" යනු ඇලීම් දෙකකි. තෘෂ්ණා ඇලීමද දෘෂ්ටි ඇලීම්ද යනුයි දිවෙහි නොඇළුනේ කයෙහි නොඇළුනේ තෘෂ්ණා ඇලීම දුරුකොට දෘෂ්ටි ඇලීම බැහැර කොට ඇසෙහි නොඇළුනේ කණෙහි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නොඇළුනේ නාසයෙහි නොඇළුනේ දිවෙහි නොඇළුනේ කයෙහි නොඇළුනේ දුටු, ඇසූ තුන් ඉන්ද්‍රියයන්ගෙන් දැනගත් ධර්මයන්හි නොඇළුනේ බැස නොගත්තේ නික්මුනේ වෙන්වූයේ මිදුනේ සීමා නොකළ සිතින් වසයි, යනුයි.

3 "හෙතෙම මනාකොට ලෝකයෙහි පවතින්නේ" යනු යම්හෙයකින් ආධ්‍යාත්මික බාහිර ආයතනයන්හි ඡන්ද රාගය ප්‍රහීණවූයේ වේද මුලින් උදුරණ ලද්දේද අග සිඳි තල් ගසක් මෙන් කරණලද්දේද අභාවයට පමුණුවන ලද්දේද නැවත නූපදීමට පමුණුවන ලද්දේද මෙපමණකින් මනාකොට ලෝකයෙහි හැසිරෙයි. ඉරියව් පවත්වයි. පවතියි පාලනය කරයි. යැපෙයි. යම්හෙයකින් පුණ්‍යාභිසංස්කාරයද අපුණ්‍යාභිසංස්කාරයද අනෙංජාභි සංස්කාරයද ප්‍රහීණ වූයේවේද මුලින් උදුරා දැමුයේවේද අග සිඳි තල් ගසක් මෙන් කරණලද්දේ වේද අභාවයට පමුණුවන ලද්දේවේද නැවත නූපදීමට පමුණුවන ලද්දේවේද මෙපමණකින් මනාකොට ලෝකයෙහි හැසිරෙයි, පවතියී, ඉරියව් පවත්වයි, පාලනය කරයි. යැපෙයි. යනුයි.

4 "කිසිවෙකුට ආශා නොකරයි" යන්නෙහි ආශාවයයි තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද, ((1-3) 3 ඡෙදයේ යම් ලංවීමක් යන තැන සිට යෙදිය යුතුයි) අභිධ්‍යාව ලොභය අකුශල මූලය යනුයි. යමෙකුගේ මේ ආශාව තෘෂ්ණාව ප්‍රහීණවූයේද මුලින් සිඳුනේද සන්සිඳුනේද, ඉපදීමට අයොග්‍යද ඥානය නමැති ගින්නෙන් දැවුනේද, හෙතෙම ක්ෂත්‍රියයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ වෛශ්‍යයෙකුට හෝ ශුද්‍රයෙකුට හෝ ගෘහස්ථයෙකුට හෝ ප්‍රව්‍රජිතයෙකුට හෝ දෙවියෙකුට හෝ මිනිසෙකුට හෝ යනුයි

## 15 - 14

1 "ලෝකයෙහි යමෙක් කාමයන්ද ඉක්මවීමට දුෂ්කර සංගයන්ද ඉක්මීමද" යන්නෙහි යමෙක් යනු යම්බඳු යමෙක් යම් ප්‍රකාරවූ යම් සටහනකට පැමිණියාවූ යම් ධර්මයකින් යුක්තවූ

ක්ෂත්‍රියයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ වෛශ්‍යයෙක් හෝ ශුද්‍රයෙක් හෝ ගෘහස්ථයෙක් හෝ ප්‍රව්‍රජිතයෙක් හෝ දෙවියෙක් හෝ මිනිසෙක් හෝ යනුයි "කාමයෝ" යනු ප්‍රකට වශයෙන් කාමයෝ දෙකොටසෙකි වස්තු කාමද ක්ලේශකාමද යනුයි ((1-1) 1 (ii) සිට 3 ඡෙදය අවසානයට යොදාගත යුතුයි.) 'සංගයෝ (ඇලීම්) යනු සංගයෝ සතක් වෙති. රාග සංගය, ද්වෙෂ සංගය, මොහ සංගය, මාන සංගය දෘෂ්ටි සංගය, ක්ලේශ සංගය, දුශ්චරිත සංගය, යනුයි "ලෝකයෙහි" අපාය ලොකයෙහි මනුෂ්‍ය ලොකයෙහි, දිව්‍ය ලොකයෙහි, ස්කන්ධ ලොකයෙහි ධාතු ලොකයෙහි, ආයතන ලොකයෙහි යනුයි.

2 "ලොකයෙහි ඉක්මවීමට නොහැකි සංගයන්" යනු හෙතෙම ලොකයෙහි ඉක්මවීමට දුෂ්කර, ඈත් කිරීමට දුෂ්කර, එතර කිරීමට දුෂ්කර කාමයන්ද සංගයන්ද තරණය කළේය. ඉක්මවූයේය. එතරවූයේය. යනුයි. "ඒ රහත් තෙම ශොක නොකරන්නේය" පසුතැවිලි නොසිතන්නේය, යනු වෙනස්වූ වස්තුවෙහිද ශොක නොකරයි. වස්තුව වෙනස් වන කල්හිද ශොක නොකරයි. මාගේ ඇස වෙනස්වූයේ යයි ශොක නොකරයි. මාගේ කණ, මාගේ නාසය, මාගේ දිව, මාගේ කය, මාගේ රූපයෝ, මාගේ ශබ්දයෝ, මාගේ ගන්ධයෝ, මාගේ ස්පර්ශයෝ, මාගේ කුලය, මාගේ ගණයා, මාගේ ආවාසය, මාගේ ලාභය, මාගේ කීර්තිය, මාගේ ප්‍රශංසාව, මාගේ සැපය, මාගේ චීවරය, මාගේ පිණ්ඩපාතය, මාගේ සේනාසනය, මාගේ ගිලන්පස බෙහෙත් පිරිකර, මාගේ මව, මාගේ පියා, මාගේ සහෝදරයා, මාගේ සහෝදරිය, මාගේ පුතා, මාගේ දුව, මාගේ මිත්‍රයෝ, මාගේ යහළුවෝ, මගේ නෑයෝ, මාගේ සහලේ නෑයෝ, වෙනස්වූයේයයි ශෝක නොකරයි, ක්ලාන්ත නොවෙයි. නොවළපියි. පපුවෙහි අත ගසා නොහඬයි. සිහිමුලා බවට නොපැමිණෙයි. ශෝක නොකරයි. යනුයි. පසුතැවිලි නොකරන්නේය. යනු පසුතැවිලි නොවෙයි, එය අදහස් නොකරයි. එය කල්පනා නොකරයි, නැවතද හෝ නූපදියි. නොදිරයි, නොමැරෙයි, චුත නොවේයයි නොසිතයි, යනුයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3 "සිඳින ලද ශ්‍රොතය ඇති බන්ධනයන් ඇති" යන්නෙහි ශ්‍රොතය යයි තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද, ඇලීමක් ඇද්ද, ( (1-3) 3 ඡෙදය යොදාගත යුතුයි.) අභිධ්‍යාවක් ලොභයක් ඇද්ද, අකුශල මූලයක් ඇද්ද එයයි. යමෙකුගේ මේ ශ්‍රොත නම්වූ තෘෂ්ණාව ප්‍රහීණද, මුලින් සිඳුනේද, අභාවයට පමුණුවන ලද්දේද ඥානය නමැති ගින්නෙන් දැවුනේද, හෙතෙම සිඳිනලද තෘෂ්ණාව ඇත්තේයයි කියයි "බන්ධනයක් නැත්තේ" යනු රාග බන්ධනය, ද්වෙෂ බන්ධනය, මොහ බන්ධනය, මාන බන්ධනය, දෘෂ්ටි බන්ධනය, ක්ලේශ බන්ධනය, දුශ්චරිත බන්ධනය, යමෙකුගේ මේ බන්ධනයෝ ප්‍රහීණවූයේද, මුලින් සිඳුනේද, අභාවයට පමුණුවන ලද්දේද, ඥානය නමැති ගින්නෙන් දැවුනේද හෙතෙම බන්ධනයක් නැති තැනැත්තේයයි කියයි

## 15 - 15

1 "අතීතයෙහිවූ යම් කෙලෙස් වේද එය වියලව" යනු අතීත සංස්කාරයන් නිසා යම් කෙලෙස් උපදින්නාහුද ඒ කෙලෙස් වියලව, ඇතිනොවනබවට පමුණුව දුරුකරව, සන්සිඳුව යනුයි නැවතද නොමෙරූ විපාක ඇති යම් අතීත කර්ම රැස්කිරීම් වෙද්ද ඒ කර්ම රැස්කිරීම් වියලව, නූපදනාබවට පමුණුව, දුරු කරව, සන්සිඳුව යනුයි.

2 "අනාගතය නිසා උපදනා කිසි කිඤ්චනයක් (ක්ලේශයක්) තොපට නොවේවා" යන්නෙහි අනාගතය යනු මතුකාලයට කියයි. අනාගත සංස්කාරයන් නිසා යම් රාග කිඤ්චනයක්, ද්වෙෂ කිඤ්චනයක්, මෝහ කිඤ්චනයක්, මාන කිඤ්චනයක්, දෘෂ්ටි කිඤ්චනයක්, ක්ලේශ කිඤ්චනයක් දුශ්චරිත කිඤ්චනයක් උපදින්නාහු නම් මේ කිඤ්චනයෝ තොපට නොවේවා. පහළ නොකරව, නූපදව, ඇතිනොකරව, දුරුකරව, නූපදනාබවට පමුණුව.

3 "මධ්‍යයෙහි සංස්කාරයන් නිසා උපදනා කෙලෙස් නූපදවන්නේ නම් මැනවි." යන්නෙහි "මධ්‍යය" යයි පවත්නා

කාලයෙහි රූප වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණයන්ට කියයි. පවත්නා කාලයෙහි සංස්කාරයන් තෘෂ්ණා වශයෙන් හෝ දෘෂ්ටි වශයෙන් හෝ නොගනුව, නොඋගනුව, පරාමර්ශ නොකරව, සතුටු නොවව. බැසනොගනුව, සතුටුවීම, බැස ගැන්ම, ගැන්ම, පරාමර්ශය, ඇතුළුවීම, දුරුකරව සන්සිඳුව, නූපදනාබවට පමුණුව යනුයි.

4 "ශාන්තවූයේ හැසිරෙව" යනු රාගය ශාන්ත බැවින් සන්සිඳවූ බැවින් ද්වෙෂය ශාන්ත බැවින්, සංසිඳවූ බැවින් (34) 2 'ක්‍රොධය' යන තැන සිට සියලු 'තැවීම්' යන තැනට 'මොහය ශාන්තවූ බැවින්' සන්සිඳවූ බැවින් යන තැන දක්වා සන්සිඳුන බැවින් යොදාගත යුතුයි.) සියලු අකුශල රැස්කිරීම් ශාන්ත බැවින් වූයේ සන්සිඳුනේ නිවුන බැවින් පහව ගිය බැපින් ශාන්තවූ බැවින් නිවුනේ හැසිරෙන්නෙහි වසන්නෙහි ඉරියව් පවත්වන්නෙහි පාලනය කරන්නෙහි යැපෙන්නෙහි යනුයි

## 15 - 16

1 "යමෙකුට නාමරූප දෙක්හි මමත්වයක් සර්වප්‍රකාරයෙන් නැද්ද" යන්නෙහි සර්වප්‍රකාරයෙන් යනු සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සර්වප්‍රකාරය ඉතිරිනොකොට යට කොට ගන්නා වචනයකි. මේ සර්වප්‍රකාරයෙන් යනුයි. නාම නම් සතර අරූප ස්කන්ධයෝයි. රූප නම් සතරමහා භූතද සතර මහා භූතයන්ගේ උපාදාය රූපද යනුයි. "යමෙකුට" යනු අර්හත්වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේට යනුයි. "මමත්වයක් යන්නෙහි මමත්ව දෙකකි. තෘෂ්ණා මමත්වයද දෘෂ්ටි මමත්වයද යනුයි. මෙහි ( (2-6) 7 (ii) (iii) ඡේද යොදාගත යුතුයි)

2 "යමෙකුට නාම රූප දෙක්හි මමත්වයක් සර්වප්‍රකාරයෙන් නැද්ද" යනු සර්වප්‍රකාරයෙන් නාම රූප දෙක්හි මමත්වයක් යමෙකුට නැද්ද විද්‍යමාන නොවෙද්ද නොලැබෙද්ද ප්‍රහීණද මුලින් සිඳුනේද ශාන්තද ඉපදීමට අයොග්‍යද ඥානය නමැති ගින්නෙන් දැවුනේද යනුයි

3 "මමත්වයක් නැති බැවින්ම ශොක නොකරයි" යනු වෙන්වන වස්තුවෙහි ශොක නොකරයි. වස්තුව වෙන්වූ කල්හිද ශොක නොකරයි (10-4) 2 ඡෙදය යොදාගත යුතුයි) මෙසේද මමත්වය නැති බැවින් ශොක නොකරයි. නැවතද දුක් වේදනාව නැති බැවින් ස්පර්ශ කරණ ලද්දේ යුක්තවූයේ ශොක නොකරයි, ක්ලාන්ත නොවෙයි, නොවළපියි, පපුවෙහි අතගසා නොහඬයි සිහිමුලාවට නොපැමිණෙයි. මෙසේද මමත්වය නැති බැවින් ශොක නොකරයි යනුයි. යලිදු හෝ නැති බැවින් විද්‍යමාන නොවන බැවින් නොලැබෙන බැවින් ඒකාන්තයෙන් මට විය. ඒකාන්තයෙන් එය මට නැත. ඒකාන්තයෙන් මට වන්නේය, ඒකාන්තයෙන් මම එය නොලබමි' යි ශොක නොකරයි, ක්ලාන්ත නොවෙයි, නොවළපියි පපුවෙහි අතගසා නොහඬයි, සිහිමුලාවට නොපැමිණෙයි යනුයි.

4 "ඒකාන්තයෙන් හෙතෙම ලොකයෙහි පිරිහීමට නොයයි යනු" යමෙකුට මෙය මාගේය කියා හෝ මෙය අනුන්ගේය කියා හෝ කිසියම් රූපගතවූ හෝ වේදනාගතවූ හෝ සඤ්ඤාගතවූ හෝ සංඛාරගතවූ හෝ විඤ්ඤාණගතවූ හෝ ගන්නාලද්දක් පරාමර්ශ කරණ ලද්දක් බැසගන්නා ලද්දක් ඇලෙන ලද්දක් ඇද්ද ඔහුට ඉපදීම ඇත, මෙය කියන ලද්දේමය.

"මැණික්මයවූ කුණ්ඩලයන්ද රථයද අශ්වයන්ද විනාශවූ කල්හි පුත්‍රයන්ද අඹුවන්ද එසේම විනාශවූ කල්හි සියලු භොගයන් සේවනය නොකළ කල්හි ශොක කාලයෙහි කුමක් හෙයින් නොතැවෙන්නෙහිද"

"භොගයෝ කලින්ම මිනිසා දුරලත්. මිනිසාද ඒවා පළමුව හැරදමයි. කාම කාමීහු නිත්‍ය බැව් ඇත්තෝ නොවෙත්. එහෙයින් මම ශොක කාලයෙහි ශොක නොකරමි"

"සූර්‍ය්‍යයා අස්තයට පැමිණ පලායයි. චන්ද්‍රයා පායයි. පිරෙයි. මවිසින් අෂ්ටලොක ධර්මයෝ දන්නා ලදහ. එහෙයින් ශොක කාලයෙහි ශොක නොකරමි"

යමෙකුට මෙය හෝ මාගේය මෙය හෝ අනුන්ගේයයි කිසියම් රූපගතවූ වේදනාගතවූ සඤ්ඤාගතවූ සංඛාරගතවූ විඤ්ඤාණගතවූ ගන්නා ලද්දක් පරාමර්ශ කරණ ලද්දක් බැස ගන්නා ලද්දක් ගැලෙන ලද්දක් ඇලෙන ලද්දක් නැද්ද ඔහුට ඉපදීමක් නැත මෙයද කියන ලද්දේමය.

5 "ශ්‍රමණය සතුටු වන්නෙහිද, ඇවැත්නි කුමක් ලැබද? එසේවීනම් ශ්‍රමණය, ශොක කරන්නෙහිද, ඇවැත්නි, කුමක් විනාශවීද? එසේවීනම් ශ්‍රමණය, සතුටු නොවන්නෙහිද, ශොක නොකරන්නෙහිද, "එසේය ඇවැත්නි" යනුයි

"සතුටක් නැති දුකක් නැති ලොකයෙහි විසත්තිකා නම් තෘෂ්ණාව තරණය කළ ක්ලෙශපරිනිර්වාණයෙන් පිරිනිවුන බ්‍රාහ්මණ නම්වූ භික්ෂුව බොහෝ කලකින් දුටුවෙමු." ලොකයෙහි ඒකාන්තයෙන් හෙතෙම නොදිරන්නේය යනුයි.

## 15 - 17

1 "යමෙකුට මෙය මාගේයයි හෝ අනුන්ගේයයි හෝ කිසිවක් නැද්ද" යන්නෙහි යමෙකුට යනු අර්හත් ක්ෂීණාශ්‍රවයන් වහන්සේට යනුයි. යමෙකුට මෙය මාගේය කියා හෝ මෙය අනුන්ගේය කියා හෝ කිසියම් රූපගතවූ වේදනා ගතවූ සඤ්ඤාගතවූ සංඛාරගතවූ විඤ්ඤාණ ගතවූ ගන්නා ලද්දක් පරාමර්ශකරණ ලද්දක්, බැසගන්නා ලද්දක් ගැලෙන ලද්දක් ඇලෙන ලද්දක් නැද්ද, විද්‍යමාන නොවෙද්ද නොලැබෙද්ද, ප්‍රහීණද සමුච්ඡින්නද ශාන්තද ඉපදීමට අයොග්‍යද ඥානය නමැති ගින්නෙන් දැවුනේද යනුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලදී

2 "මහණෙනි, මේ ශරීරය යුෂ්මතුන්ගේ නොවේ. අන්‍යයන්ගේද නොවේ. මහණෙනි, මෙය රැස් කරණ ලද සිතන ලද විඳියයුතු පුරාණ කර්මයයි දතයුතුයි. මහණෙනි, එහි ශ්‍රැතවත්වූ ආර්‍ය්‍යශ්‍රාවකතෙම හේතුවක් ඇතිව ඉපදීම මනාකොට නුවණින් සිහි කරයි. "මෙය මෙසේ ඇති කල්හි මෙසේ වෙයි

මෙය ඉපදීමෙන් මෙය වෙයි. මෙය නැති කල්හි මෙය නොවෙයි. මෙය නැතිවීමෙන් මෙය නැතිවෙයි. යම් ඒ අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙත්. සංස්කාර ප්‍රත්‍යයෝ විඥානයෝ වෙත්. (මෙහි (4-5)-4 'විඤ්ඤාණ හේතුවෙන් නාම රූප වන්නාහුය' යන තැන සිට 'මනාකොට දැන' යන්න අස්කොට යොදාගත යුතුයි.) මෙසේ මේ සියලු දුක්ඛ රාශියගේ ඇතිවීම වෙයි යනුයි" මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී.

3 "මොඝරාජය, හැමකල්හි සිහි ඇත්තේ ශූන්‍ය වශයෙන් ලොකය බලව, ආත්මදෘෂ්ටිය ඉවතට උදුරා ඇද මරණය ඉක්මවන්නෙක් වන්නේය. මෘත්‍යුරාජයා මෙසේ ලොකය බලන්නහු නොදකියි" යනුයි මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මහණෙනි, යමක් යුෂ්මතුන්ගේ නොවේනම් එය දුරු කරව්. යුෂ්මතුන්ට එය දුරුකිරීම බොහෝ කලක් හිත සුව පිණිස පවත්නේය මහණෙනි, කිසිවකුදු යුෂ්මතුන්ගේ නොවේ එය දුරු කරව්. තොපට එය දුරුකිරීම බොහෝ කලක් හිත සුව පිණිස පවත්නේය. වේදනාව, සඤ්ඤාව, සංඛාරය, විඤ්ඤාණය, යුෂ්මතුන් ගේ නොවේ. එය දුරුකරව්. ඒ දුරුකිරීම යුෂ්මතුනට බොහෝ කලක් හිත සුව පිණිස පවත්නේය මහණෙනි, කුමකැයි සිතන්නහුද? මේ ජේතවනයෙහි තෘණ දරකැබලි අතු කොළ වෙද්ද එය ජනතෙම ගෙනයන්නේ නම් හෝ පුළුස්සන්නේ නම් හෝ කැමැත්තක් කරන්නේ නම් හෝ යුෂ්මතුන්ට (ඒ කොළ ආදිය) මෙසේ කියන්නාහු වෙද්ද? අප ජනතෙම ගෙනයයි කියා හෝ පුළුස්සායයි කියා හෝ සුදුස්සක් කෙරේයයි කියා හෝ කියන්නහුද?' 'ස්වාමීනි, එය එසේ නොවේ එයට හේතු කවරේද?' එය ආත්මයක් හෝ ආත්මය ඇති දෙයක් නොවන නිසයි.' 'මහණෙනි, එපරිද්දෙන්ම යමක් තොපගේ නොවේනම් එය දුරුකරව් තොපගේ ඒ දුරු කිරීම යුෂ්මතුන්ට බොහෝ කලක් හිත සුව පිණිස වන්නේය. මහණෙනි, කිසිවක් යුෂ්මතුන්ගේ නොවේ. රූපය යුෂ්මතුන්ගේ නොවේ. එය දුරුකරව්. ඒ දුරුකිරීම තොපට බොහෝ කලක් හිත සුව පිණිස පවත්නේය. වේදනාව, සඤ්ඤාව, සංස්කාරයෝ, විඤ්ඤාණය

යුෂ්මතුන්ගේ නොවේ. ඒ දුරුකිරීම තොපට බොහෝ කලක් හිත සුව පිණිස පවත්නේය යනුයි.

"ගාමණිය අමිශ්‍ර ධර්මයන්ගෙන් ඇතිවන තනි සංස්කාර සමූහය තත්වූ පරිදි බලන්නහුට බියක් නොමවේ.'

4 "තෘෂ්ණා හා දර කැබලි සමාන ලොකය යම්කලෙක නුවණින් බලන්නේද, කිසියම් අන්තැනක ප්‍රතිසන්ධියක් ප්‍රාර්ථනා නෙකෙරේ" වජිරා භික්ෂුණී පාපීවූ මාරයාට මෙය ප්‍රකාශ කළාය.

"මරුව කිම? සත්වයෙකැයි අදහයිද? මාරය, තට දෘෂ්ටියෙක් විද, මේ තනි සංස්කාර පිඬෙකි. මෙහි සත්වයා යයි ගතයුත්තක් නොලැබේ.

"අවයව රැස නිසා රථයයි ව්‍යවහාරයක් යම්සේ වේද, එසේම ස්කන්ධයන් ඇති කල්හි සත්වයයි ව්‍යවහාරවේ"

"මෙහි දුකෙක්ම පහළවේ. දුකෙක්ම සිටියි. දුක්ම විදියි. දුක් මිස අන් කිසිත් මෙහි පහළ නොවේ දුකෙන් අන්‍යවූ කිසිත් මෙහි නිරුද්ධ නොවේ" යනුයි.

5 "යමකුට මෙය මගේ යයිද අනුන්ගේයයිද කිසිවක් නැද්ද" මහණෙනි, එපරිද්දෙන්ම භික්ෂුව රූපය සොයයි. රූපයාගේ ගතිය යම්පමණද එය සොයයි වේදනාව, සඤ්ඤාව, සංස්කාරයන් විඤ්ඤාණය සොයයි. විඤ්ඤාණයාගේ ගතිය සොයයි. රූපය සොයන්නාවූ යම්පමණ රූපයාගේ ගතිය සොයන්නාවූ ඔහුට වේදනාව, සඤ්ඤාව, සංස්කාරයන්, විඤ්ඤාණයන් සොයන්නාවූ යම් පමණ විඤ්ඤාණයාගේ ගතිය සොයන්නාවූ ඔහුට 'මමය කියා හෝ මටය කියා හෝ වෙමියි කියා' හෝ යමක් ඔහුට වේද, එයද ඔහුට නොවෙයි යනුයි. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය ස්වාමීනි, ලොකය ශූන්‍යය ලොකය ශූන්‍ය යයි කියනු ලැබෙයි, කොපමණකින් ලොකය ශූන්‍යයයි කියනු ලැබේද?' ආනන්දය, යම්හෙයකින් තමාගෙන් හෝ තමා කෙරෙහි හෝ

ශූන්‍යද එහෙයින් ලොකය ශූන්‍යයයි කියනු ලැබේ. ආනන්දය, කිසිවක් තමාගෙන් හෝ තමා කෙරෙහි හෝ ශූන්‍යද, ඇස වනාහි තමාගෙන් හෝ තමා කෙරෙහි හෝ ශූන්‍යද රූපයෝ ශූන්‍යයහ චක්ෂුර් විඥානය ශූන්‍ය වෙයි. චක්ෂුසම්ඵස්සය (ඇසෙහි හැපීම) ශූන්‍යය. ඇසෙහි හැපීමේ හේතුවෙන් විඳියයුතුවූ සැපයක් හෝ දුකක් හෝ සැපදුක් දෙකම නැති බවක් හෝ උපදීද, එයද ශූන්‍ය වෙයි කණ ශූන්‍ය වෙයි. නාසය ශූන්‍ය වෙයි. දිව ශූන්‍ය වෙයි. රශයෝ ශූන්‍යයහ. ශරීරය ශූන්‍යය, ස්පර්ශය ශූන්‍යය, මනස ශූන්‍යය ධර්මයෝ ශූන්‍යයහ මනො විඤ්ඤානය ශූන්‍යය, මනො සම්ඵස්සය (සිතේ හැඟීම) ශූන්‍යය, යම් ඒ සිතේ හැපීමේ හේතුවෙන් විඳියයුතු සැපතක් හෝ දුකක් හෝ ඇද්ද සැප දුක් නොවන හැඟීමක් හෝ ඇද්ද එයද තමාගෙන් හෝ තමා කෙරෙහි හෝ ශූන්‍යය ආනන්දය, යම්සේ වනාහි තමාගෙන් හෝ තමා කෙරෙහි හෝ ශූන්‍යද එබැවින් ලොකය ශූන්‍යනම් වේ, යනුයි.

6 "හෙතෙම මමත්වයක් නොලබන්නේ" යන්නෙහි මමත්ව දෙකකි. තෘෂ්ණා මමත්වයද දෘෂ්ටි මමත්වයද යනුයි. (මෙහි (2-6) 1 (ii) (iii) ඡෙද යොදාගත යුතුයි) තෘෂ්ණා මමත්ව හැර දෘෂ්ටි මමත්වය බැහැරකොට මමත්වයක් නොවිඳින්නේ නොලබන්නේ නොපැමිණෙන්නේ යනුයි "මට (මෙය) නැතැයි ශොක නොකරයි" යනු වෙනසට පත් වස්තුවෙහිද ශොක නොකරයි, වස්තුව වෙනසට පත්වන කල්හිද ශොක නොකරයි මාගේ ඇස වෙනස් වූයේයයි ශොක නොකරයි. මාගේ කණ (10-4) 2 මාගේ දිව යන තැන සිට යොදාගත යුතුයි.) මාගේ සහලේ නෑයෝ වෙනස් වූයේයයි ශොක නොකරයි ක්ලාන්ත නොවෙයි. නොවළපියි. පපුවෙහි අත්ගසා නොහඬයි. සිහි මුළාවට නොපැමිණෙයි යනුයි.

## 15 - 18

1 "ඊර්ෂ්‍යා නැත්තෙක ගිජු නැත්තෙක, තෘෂ්ණා නැත්තෙක සියලු තන්හි සම තැනැත්තෙක යන්නෙහි ඊර්ෂ්‍යාව කවරේද?

මෙහි ඇතැම් පුද්ගලයෙක් අනුන්ගේ ලාභසත්කාර ගරුකාර බහුමාන වැඳීම් පිරීම්වල ඊර්ෂ්‍යා ඇත්තෙක් වෙයි. ඊර්ෂ්‍යාව බඳියි. මෙබඳුවූ යම් ඊර්ෂ්‍යාවක් ඊර්ෂ්‍යා කර්මයක් ඊර්ෂ්‍යා කිරීමක් ඊර්ෂ්‍යා කිරීම බවක් වේද. මෙය ඊර්ෂ්‍යාව යයි කියයි. යමෙකුගේ මේ ඊර්ෂ්‍යාව ප්‍රහීණද මුලින් සිඳුනේද ඉපදීමට අයොග්‍යවූයේද සම්පූර්ණයෙන් අභාවයට ගියේද, ඥානය නමැති ගින්නෙන් දැවුනේද හෙතෙම ඊර්ෂ්‍යා නැත්තේ යයි කියයි. "ගිජු නැත්තෙකු යන්නෙහි "ගිජු" යයි තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද ඇලීමක් ඇද්ද (10-4) 1 'එයයි' යන තැනට යොදාගත යුතුයි) අභිධ්‍යාවක් ලොභයක් අකුශල මූලයක් ඇද්ද එයයි. යමෙකුගේ මේ ගිජු කම දුරුව ගියේද මුලින් සිඳුනේද, ඉපදීමට අයොග්‍යවූයේද සම්පූර්ණ අභාවයට ගියේද ඥානය නමැති ගින්නෙන් දැවුනේද හෙතෙම ගිජුනැත්තේයයි කියයි. හෙතෙම රූපයෙහි ගිජු නොවුයේ ශබ්දයෙහි ගිජු නොවූයේ ගන්ධයෙහි රශයෙහි ස්පර්ශයෙහි ඇසූ දුටු මුත වශයෙන් ගත් දැනගත් ධර්මයන්හි ගිජු නොවූයේ නොගැටුනේ නුමුලාවූයේ නොගැලුනේ පහවූ ගිජුකම ඇත්තේ වෙන්ව ගිය ගිජුකම ඇත්තේ සන්සිඳුන ගිජුකම ඇත්තේ පහවූ රාග ඇත්තේ වෙන්ව ගිය රාග ඇත්තේ දුරහළ රාග ඇත්තේ බැහැර කළ රාග ඇත්තේ මිදුන රාග ඇත්තේ සංසිඳුන රාග ඇත්තේ තෘෂ්ණා නැත්තේ නිවුනේ සිහිල්වූයේ සැපත විඳින්නේ බ්‍රහ්මයා බඳු ආත්ම් භාවයෙන් වාසය කරයි.

2 "තෘෂ්ණා නැත්තේ සියලු තන්හි සම තැනැත්තෙක් යන්නෙහි 'කම්පාකරන්නී යයි' තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද ඇලීමක් ඇද්ද ලොභයක් අකුශල මූලයක් ඇද්ද එයයි යමෙකුගේ මේ එජා (කම්පා කරන්නී) නමැති තෘෂ්ණාව ප්‍රහීණද මුලින් සිඳුනේද ඉපදීමට අයොග්‍ය වූයේද සම්පූර්ණයෙන් අභාවට ගියේද, ඥානය නමැති ගින්නෙන් දැවුනේද, හෙතෙම අනෙජයයි කියයි හෙතෙම ලාභයෙහිද (ii) ආශා නොවෙයි අලාභයෙහිද ආශා නොවෙයි කීර්තියෙහිද ආශා නොවෙයි

අපකීර්තියෙහිද ආශා නොවෙයි. ප්‍රශංසාවෙහිද ආශානොවෙයි. නින්දාවෙහිද ආශා නොවෙයි. සැපයෙහිද ආශා නොවෙයි. දුකෙහිද ආශා නොවෙයි. නොසැලෙයි, කම්පා නොවෙයි එබැවින් අනෙජ නමි.

3 "සියලු තැන්හි සම බැව් ඇත්තේ" යන්නෙහි සියල්ල යනු ද්වාදශායතනයෝයි. ඇසද රූපයෝද කණද ශබ්යද දිවද රශයද කයද ස්පර්ශයද මනසද ධර්මයෝද යනුයි. යම් හෙයකින් ආධ්‍යාත්මික බාහිර ආයතනයන්හි ඡන්දරාගය ප්‍රහීණවූයේ වේද උදුරලන ලද මුල් ඇත්තේ වේද, අගසිඳි තල්ගසක් මෙන් කරණ ලද්දේ වේද අභාවයට පමුණුවන ලද්දේ වේද නැවත නූපදනාබවට පමුණුවන ලද්දේ වේද හෙතෙම හැමතන්හි සමවූයේයයි කියයි. හෙතෙම හැම තන්හි තෘෂ්ණා නැත්තේ හැමතන්හි මධ්‍යස්ථවූයේ හැම තන්හි උපෙක්ෂාවූයේ වෙයි. "ඒ නොසැලෙන පුද්ගලයා විචාරණ ලද්දේම මේ අනුසස් කියමි" යනු නොසැලෙන පුද්ගලයා විචාරණ ලද්දෙම් ඉල්වන ලද්දෙම් ආරාධනා කරණ ලද්දෙම් පහදවන ලද්දෙම් මේ ආනිසංස සතර කියමි හෙතෙම ඊර්ෂ්‍යා නැත්තේ ගිජු නැත්තේ තෘෂ්ණා නැත්තේ සියලු තන්හි සම බැව් ඇත්තේයයි කියමි ප්‍රකාශ කරමි යනුයි.

## 15 - 19

1 'ඒජාව නැති දත් තැනැත්තාට" යන්නෙහි ඒජායයි තෘෂ්ණාවට කියයි. යම් රාගයක් ඇද්ද ඇලීමක් ඇද්ද (10-4) 1 'එයයි' යනතැනට යොදාගත යුතුයි.) අභිධ්‍යාවක්, ලොභයක් අකුශල මූලයක් ඇද්ද එයයි. යමෙකුගේ මේ ඒජා නමැති තෘෂ්ණාව පහව ගියේද මුලින් සිඳුනේද ඉපදීමට අයොග්‍යවූයේ ඥානය නමැති ගින්නෙන් දැවුණේද හෙතෙම අනෙජයයි කියයි. තෘෂ්ණාව පහව ගිය බැවින් අනෙජ නමි. හෙතෙම ලාභයෙහිද ( (15-18) 2 (ii) ඡෙදය යොදනු) කම්පා නොවෙයි යනුයි

2 "ඒජාව නැති දත් තැනැත්තාට යන්නෙහි" දත් තැනැත්තාට යනු දැනගත් තැනැත්තාට අවබොධ කරගත්

තැනැත්තාට යනුයි. සියලු සංස්කාරයෝ අනිත්‍යයයි දුක් යයි සියලු ධර්මයෝ අනාත්මයයි යම් කිසි හේතුවකින් උපන් ධර්මයක් ඇද්ද ඒ සියල්ල නැතිවීම පිණිස පවත්නේයයි දන්නාහට අවබොධ වූවහුට යනුයි.

"කිසියම් සංස්කාරයෙක් නැත" යන්නෙහි සංස්කාරයෝයයි පුණ්‍යාභි සංස්කාර අපුණ්‍යාභි සංස්කාර අනෙඤ්ජාභි සංස්කාරයෝ කියත් යම් හෙයකින් පුණ්‍යාභි සංස්කාරයෝද අපුණ්‍යාභි සංස්කාරයෝද අනෙඤ්ජාභි සංස්කාරයෝද පහව ගියාහු වෙත්ද මුලින් උදුරණ ලද්දාහු අග සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලද්දාහු නැවත නූපදනා බවට පමුණුවන ලද්දාහු වෙත්ද මෙපමණකින් සංස්කාරයෝ නැත. ඇති නොවෙත් නොලැබෙත් පහව ගියාහු මුලින් සිඳුනාහු සංසිඳුනාහු ඉපදීමට අයොග්‍යවූවාහු ඥානය නමැති ගින්නෙන් දැවුනාහු වෙති යනුයි.

3 "සංස්කාරාදීන්ගෙන් නොඇළුනාවූ මෙතෙම" යන්නෙහි සංස්කාරයයි පුණ්‍යාභි සංස්කාරය අපුණ්‍යාභි සංස්නාරය, අනෙඤ්ජාභි සංස්කාරය කියයි. යම් හෙයකින් පුණ්‍යාභි සංස්කාරයෝද අපුණ්‍යාභි සංස්කාරයෝද ආනෙඤ්ජාභි සංස්කාරයෝද පහව ගියාහු වෙත්ද මුලින් උදුරණ ලද්දාහු අග සිඳින ලද තල්ගසක මෙන් කරණ ලද්දාහු අභාවයට පමුණුවන ලද්දාහු නැවත නූපදනා බවට පමුණුවන ලද්දාහු වෙද්ද, මෙපමණකින් සංස්කාරතෙම ඇත් වූයේ වන්නේය වෙන්වූයේ නික්මුනේ මිදුනේ සීමා නොකළ සිතින් වාසය කරයි.

4 "මෙතෙම සෑමතැන්හි අභය දකියි" යනු රාගය භය ගෙන දෙන්නේය. ද්වෙෂය භය ගෙන දෙන්නේය. මොහය ශාන්තය යනු භය ගෙනදෙන්නේය කියා වෙනස්කර (3-4) ක්‍රොධය යන තැන සිට යොදාගත යුතුයි) ක්ලේශයෝ භය ගෙන දෙන්නාහුය. භය ගෙන දෙන රාගය පහව ගිය බැවින් (මෙහි (3-4) 1 පහව ගිය බැවින්' යනු යොදා ද්වෙෂය යන තැන සිට යෙදිය යුතුයි.) භය ගෙන දෙන ක්ලේශයන් ප්‍රහීනවූ බැවින් සෑමතන්හි ආරක්ෂාව දකියි. සෑමතන්හි නිර්භය දකියි. සෑමතන්හි උවදුරු රහිත බව දකියි යනුයි.

## 15 - 20

1 "මුනිතෙම සමයන් කෙරෙහි, හීනයක් කෙරෙහි, ශ්‍රෙෂ්ඨයන් කෙරෙහි නොකියන්නේය" යන්නෙහි මුනියයි ඥානයට කියයි යම් ප්‍රඥාවක් දැනීමක් (2-4)-12 ඡෙදය යෙදිය යුතුය.) තෘෂ්ණා ජලය ඉක්මවා සිටියේද හෙතෙම මුනි නමි. මුනිතෙම ශ්‍රෙෂ්ඨවූයේ වෙමි කියා හෝ සමාන වූයෙමි කියා හෝ හීනවූයෙමි කියා හෝ නොකියයි. ප්‍රකාශ නොකරයි. ව්‍යවහාර නොකරයි යනුයි.

2 "ශාන්තවූ පහව ගිය මසුරුකම ඇති හෙතෙම" යන්නෙහි "ශාන්ත" යනු රාගයාගේ ශාන්තබව ඇතිබැවින් සන්සිඳුන බැවින් ශාන්ත නමි. ද්වෙෂයාගේ-මොහයාගේ (3-4) 1 රාගය යන තැන සිට යෙදිය යුතුයි.) සියලු අකුශල රැස් කිරීම්වල ශාන්තකම ඇති බැවින් නිවුණ බැවින් පහව ගිය බැවින් සන්සිඳුන බැවින් හෙතෙම ශාන්ත නමි "පහව ගිය මසුරුකම ඇති" යන්නෙහි මසුරුකම් පසෙකි. ආවාස මච්ඡරය (6-6) 2 (ii) ඡෙදය යෙදිය යුතුයි) ගැනීමක් ඇද්ද මෙය මසුරුකම යයි කියයි. යමෙකුගේ මේ මසුරුකම ප්‍රහිණද මුලින් සිඳුනේ ද ඉපදීමට අයොග්‍යවූයේද, සම්පූර්ණයෙන් අභාවයට ගියේද ඥානය නමැති ගින්නෙන් දැවුනේද හෙතෙම පහවූ මසුරුකම ඇත්තේයයි වෙන්ව ගිය මසුරුකම ඇත්තේයයි දුරුකරණ ලද මසුරුකම ඇත්තේ යයි බැහැර කළ මසුරුකම ඇත්තේයයි මුදන ලද මසුරුකම ඇත්තේයයි සන්සිඳුන මසුරුකම ඇත්තේයයි කියයි.

3 "(හෙතෙම) නොගන්නේය බැහැර නොකරන්නේ යයි" භාග්‍යවතුන් වහන්සේ වදාළහ යන්නෙහි 'නොගන්නේය' යනු රූපය නොගනියි. දැඩිකොට නොගනියි. පරාමර්ශ නොකරයි ඇතුල් නොවෙයි. වේදනාව, සංඥාව සංස්කාරය විඥ්ඥාණය, ගතිය, උත්පත්තිය, ප්‍රතිසන්ධිය, භවය, සංසාරය, වට්ටය නොගනියි දැඩිකොට නොගනියි. පරාමර්ශ නොකරයි. ඇතුළු නොවෙයි යනුයි "බැහැර නොකරත්' යනු රූපය දුරුනොකරයි. නොසන්සිඳුවයි. අභාවයට නොපමුණුවයි. වෙදනාව, සංඥාව

සංස්කාරයන්, විඤ්ඤාණය, ගතිය, උත්පත්තිය, ප්‍රතිසන්ධිය, භවය, සංසාරය, වට්ටය දුරුනොකරයි. බැහැර නොකරයි. නොසන්සිඳුවයි, අභාවයට නොපමුණුවයි යනුයි.

## ශාරීපුත්‍ර සූත්‍ර නිර්දෙශය

### 16 - 1

1 "මා විසින් මෙයින් පෙර නොදක්නා ලද්දේය" යනු මා විසින් ඒ භාග්‍යවතුන් වහන්සේ මේ ඇසින් මේ ආත්ම භාවයෙන් මෙයින් පෙර නොදක්නා ලද්දේය. යම් කලෙක භාග්‍යවතුන් වහන්සේ තව්තිසා භවනයෙහි පරසතු රුක්මුල පඬු ඇඹුල් සලස්නෙහි වස් විසූසේක් මධ්‍යයෙහිවූ මැණික් වලින් කළ තරප්පුවෙන් සංකස්ස නුවරට බැසීම යනුයි. මේ දර්ශනය පෙර නොදක්නාලදී යනුයි.

2 "සැරියුත් තෙරුන්වහන්සේ මෙසේ කීහ" යන්නෙහි මෙසේ යනු (i) පදසන්ධියයි. පද ගැලපීමයි. පද පිරවීමයි අකුරු සමකිරීමයි. පහසුසේ කීමට යොදන පදයයි යනුයි. 'ආයුෂ්මත්' යනු ප්‍රිය වචනයයි. "සැරියුත්" යනු තෙරුන්ගේ නාමයයි. පැනවීමයි ව්‍යවහාරයයි නාම කර්මයයි. නිරුක්තියට අයත් පද සමූහයයි. ක්ෂත්‍රියාදී කිසිවක්හුගේද ඇසීමක් නොඅසනලදී." යන්නෙහි නොයනු ප්‍රතික්ෂෙපයයි. "ද" යනු පදසන්ධියයි මෙහි (i) යොදාගතයුතුයි. කිසිවක්හුගේ යනු කිසියම් ක්ෂත්‍රියයෙකුගේ හෝ බ්‍රාහ්මණයෙකුගේ හෝ වෛශ්‍යයෙකුගේ හෝ ශුද්‍රයෙකුගේ හෝ ගෘහස්ථයෙකුගේ හෝ ප්‍රව්‍රජිතයෙකුගේ හෝ දෙවියෙකුගේ හෝ මිනිසෙකුගේ හෝ යනුයි.

3 "මෙබඳු මිහිරි තෙපුල් ඇති භාග්‍යවතුන් වහන්සේ යනු" මෙසේ මිහිරි වචන ඇති ප්‍රෙමණීය වචන ඇති හෘදයංගම වචන ඇති කොවුල් හඬ වැනි හඬක් ඇති අංග අටකින් යුත් ඝොෂයක් ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් නික්මෙයි. එනම්, විසුරුණු, සිත්අලවන, දතයුත, ඇසියයුතු ස්වල්පවූ, ඉක්මවා නොයන ගම්භීරවූ, නින්නවූ යනුයි. 'යම් පිරිසකට ඒ

භාග්‍යවතුන් වහන්සේ ස්වරයෙන් දැනුම්දෙද්ද, පිට පිරිසකට උන්වහන්සේගේ ඝෝෂය නො පැතිරෙයි. ඒ භාග්‍යවතුන් වහන්සේ බ්‍රහ්ම ස්වර ඇතිසේක. කොවුල් හඬ ඇත්තේය. මෙසේද මිහිරි වචන ඇතිසේක. 'ශාස්තෘ" යනු ශාස්තෘසේක, භාග්‍යවතුන්වහන්සේ ගැල්නායක වනසේක. ගැල් නායකතෙම යම්සේ කාන්තාරයෙන් එතර කරවයිද, දුර්භික්ෂ කාන්තාරය තරණය කරවයිද ජලය නැති කාන්තාරය තරණය කරවයිද එතරකරවයිද, නිර්භය භූමියට පමුණුවයිද, මෙපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේ ගැල් නායකසේක. සත්වයින් කාන්තාරයෙන් තරණය කරවයි. ජාති කාන්තාරය තරණය කරවයි ජරා කාන්තාරය තරණය කරවයි. ව්‍යාධිකාන්තාරය තරණය කරවයි මරණ කාන්තාරය තරණය කරවයි ශොක, වැළපීම්, කායිකදුක්, දොම්නස්, උපායාස කාන්තාරය තරණය කරවයි. රාග කාන්තාරය තරණය කරවයි. ද්වෙෂ, මොහ, මාන දෘෂ්ටි වනය, ක්ලේශවනය, තරණයකරවයි. එතරකරවයි. ක්ෂෙමය කෙළවරකොට ඇති අමෘතවූ නිර්වාණයට පමුණුවයි. මෙසේද භාග්‍යවතුන් වහන්සේ රියැදුරු (ගැල් නායක) සේක. යලිදු හෝ භාග්‍යවතුන් වහන්සේ නායක සේක. හික්මවනසේක. පනවනසේක. අවබොධ කරවනසේක. බලවනසේක පහදවන සේක මෙසේද භාග්‍යවතුන්වහන්සේ ගැල්නායකසේක යලිදු හෝ භාග්‍යවතුන්වහන්සේ නූපන් මාර්ගය උපදවනසේක. හට නොගත් මාර්ගය හටගන්වනසේක. නොකියූ මග කියනසේක. මාර්ගය දත්සේක, මාර්ගඥානය ඇතිසේක. මාර්ගයෙහි දක්ෂසේක මාර්ගය අනුව පසු ශ්‍රමණවූ ශ්‍රාවකයෝ වාසය කෙරෙති. මෙසේද භාග්‍යවතුන් වහන්සේ ගැල් නායකසේක.

4 "තුෂිත දිව්‍යලොකයෙන් ච්‍යුතව සමූහයා මැදට පැමිණියේය" යනු භාග්‍යවතුන්වහන්සේ තුෂිත දෙව්ලොවින් ච්‍යුතව සිහි ඇත්තේ මනා නුවණැත්තේ මවු කුසට බැස ගත්තේයයි මෙසේද තුෂිත දිව්‍යලොකයෙන් ච්‍යුතව සමූහයා මැදට පැමිණියේය යනුයි. නැවතද දෙවියෝයයි තුෂිත දෙවියන්ට කියත්, ඔවුහු තුටුවූවාහු සතුටුවූවාහු ප්‍රමුදිතවූවාහු

පටුන



ප්‍රීති සොම්නස් හටගත්තාහු දිව්‍ය ලොකයෙන් සමූහයා මැදට පැමිණී සේක. යනුයි. නැවතද රහතුන් වහන්සේලාට තුෂිතයෝයයි කියත්. ඔවුහු තුටුවූ සතුටුවූ ප්‍රීතිවූ සම්පූර්ණවූ සිතේ අදහස් ඇත්තෝ වෙති. රහතුන්ගේ සමූහයට පැමිණියේයයි මෙසේද තුෂිත දෙව්ලොවින් සමූහයා මැදට පැමිණියේය යනුයි "සමූහ ඇත්තේ" යනු සමූහ ඇති බැවින් භාග්‍යවතුන් වහන්සේ "ගණී" නම්. ගණාචාර්‍ය්‍ය බැවින් "ගණී" නම් සමූහයාට ශාස්තෘ බැවින් "ගණී" නම් සමූහයා පරිහරණය කෙරේනුයි "ගණී" නම්. සමූහයාට අවවාද කෙරේනුයි "ගණී" නම් සමූහයාට අනුශාසනා කෙරේනුයි "ගණී" නම්. විශාරදව සමූහයා වෙත පැමිණේනුයි "ගණී" නම්. සමූහයා උන්වහන්සේගේ වචනයට කන්දේනුයි කන් නමානුයි රහත් බවට සිත පමුණුවානුයි "ගණී" නමී සමූහයා අකුශලයෙන් නැගුටුවා කුශලයෙහි පිහිටුවානුයි "ගණී" නම්. භික්ෂු සමූහය ඇත්තේනුයි "ගණී" නම්. භික්ෂුණී සමූහය ඇත්තේනුයි 'ගණී" නම්. උපාසක සමූහය ඇත්තේනුයි "ගණී" නම් උපාසිකා සමූහය ඇත්තේනුයී "ගණී" නම් රාජ සමූහය ඇත්තේනුයි "ගණී" නම් ක්ෂත්‍රිය සමූහය බ්‍රාහ්මණ සමූහය-වෛශ්‍ය සමූහය-ශුද්‍ර සමූහය-දෙව සමූහය-බ්‍රාහ්මණ සමූහය ඇත්තේනුයි සංඝි, ගණී, ගණාචරිය නම් වන සේක. "පැමිණී සේක" යනු සංකස්ස නගරයට පැමිණී සේක යනුයි.

## 16 - 2

1 "දෙවියන් සහිත සියලු ලොකයාට" යනු දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොකයාට ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත ප්‍රජාවට දෙවිමිනිසුන්ට යනුයි. "පසැස් ඇති සර්වඥතෙම යම්සේ පෙණේද" යනු

2 යම්සේ තවුතිසා භවනයෙහි පරසතු රැකමුල පාණ්ඩු කම්බල ශෛලාසනයෙහි වැඩහිඳ ධර්මදෙශනා කරණ භාග්‍යවතුන් වහන්සේ දෙවියෝ දකිද්ද, එසේම මිනිස්සු දකිත්. යම්සේ මිනිස්සු දකිත්ද, එසේම දෙවියෝ දකිත්. යම්සේ

දෙවියන්ට පෙණෙද්ද, එසේම මිනිසුන්ට පෙණෙත්. යම්සේ මිනිසුන්ට පෙණෙද්ද, එසේම දෙවියන්ට පෙණෙත් යනුයි. යම්සේ වනාහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ නොදැමුනාහු දැමුන අයුරින් පෙණෙත්. ශාන්ත නොවූවාහු ශාන්ත වශයෙන් පෙණෙත්. උපශාන්ත නොවූවෝ උපශාන්ත වශයෙන් පෙණෙත්, නොනිවුණෝ නිවුණවුන් වශයෙන් පෙණෙත්.

3 "පාටින් පමණක් රන් රිදී ආදිය මෙන් පෙණෙන මැටියෙන් කළ කුණ්ඩලාභරණය මෙන්ද රනින් වැසූ ලොහ මසුරම මෙන්ද ලොකයෙහි ඇතුළත අශුද්ධ පිටතින් ශොභමානවූවෝ පිරිවරින් වැසුනාහු හැසිරෙත්" භාග්‍යවතුන් වහන්සේ මෙසේ නොපෙණෙත්. භාග්‍යවතුන් වහන්සේ ඇති පරිද්දෙන් සත්‍යවූ අයුරින් ස්වභාවයෙන් දැමුනේ දැමුන ආකාරයෙන්ම පෙණෙයි. ශාන්තවූයේ ශාන්තවශයෙන් පෙණෙයි. උපශාන්තවූයේ උපශාන්ත වශයෙන් පෙණෙයි නිවුනේ නිවීම වශයෙන් පෙණෙයි. භාග්‍යවත් බුදුවරයෝ හේතු සම්පත් ඇත්තාහ. අමුතුවෙන් සකස් කරගත් ඉරියව් නැත්තාහ යනුයි. භාග්‍යවතුන් වහන්සේ විශෙෂයෙන් පැන නැගි කීර්ති ඝොෂා ප්‍රශංසාවෙන් යුක්ත සේක් නාග භවනයෙහිද ගුරුළු භවනයෙහිද යක්ෂ භවනයෙහිද අසුර භවනයෙහිද ගන්ධර්ව භවනයෙහිද මහාරාජ භවනෙහිද ශක්‍ර භවනෙහිද බ්‍රහ්ම භවනෙහිද දෙව භවනෙහිද එබඳුමය. එබඳු වද එයට වඩා වැඩි වද වේ. යලිදු හෝ භාග්‍යවතුන් වහන්සේ දශ බලයෙන් යුක්තවූයේ සතර විශාරද භාවයෙන් යුක්තවූයේ ප්‍රතිසම්භිදා සතරින් යුක්තවූයේ අභිඥා සයින් යුක්තවූයේ බුද්ධ ධර්ම සයින් යුක්තවූයේ තෙජසින්ද බලයෙන්ද, ගුණයෙන්ද වීර්‍ය්‍යයෙන්ද ප්‍රඥාවෙන්ද පෙනේ. දැනේ ප්‍රකට වේ

4 "දුර වසන සත්පුරුෂයෝ හිමවත් පව්වසේ බුදු වරයන්ගේ ඥාන පථයට වදින්නාහු ප්‍රකට වෙත්. අසාධුහු වනාහි මෙහි (ලඟ) හුන්නාහුද දැඩි කළුවරැති රැයෙහි විදි ඊයක් සේ ප්‍රකට නොවෙත්" යනුයි. "පසැස් ඇති සර්වඥතෙම" යනු භාග්‍යවතුන් වහන්සේ ඇස් පසකින් ඇස් ඇත්තේය. මසැසින්ද ඇස් ඇත්තේය.

දිවැසින්ද ඇස් ඇත්තේය. පැණැසින්ද ඇස් ඇත්තේය. සර්වඥතාඥාන ඇසින්ද ඇස් ඇත්තේය.

5 "සියලු අන්ධකාරය දුරුකොට" යනු සියලු රාග අඳුර ද්වෙෂ අඳුර, මොහ අඳුර, දෘෂ්ටි අඳුර, ක්ලෙශ අඳුර දුශ්චරිත අඳුර, අන්ධකාර බව ඇස් නැති බව අඥානත්වය ප්‍රඥාව නැතිබව නිවන් පිණිස නොපැවැත්ම දුරුකොට බැහැරකොට සංසිඳුවා අභාවයට පමුණුවා යනුයි.

6 'තනි අසහායවූයේම පස්කම් සුවය අත්හැරීමේ ඇලීමට පැමිණියේය" යන්නෙහි "අසහාය" යනු භාග්‍යවතුන් වහන්සේ පැවිද්දෙන් අසහාය සේක. දෙවැන්නෙකු නැති බැවින් අසහාය සේක තෘෂ්ණාව දුරුකිරීමෙන් අසහාය සේක. ඒකාන්තයෙන් රාගය පහ කළේනුයි අසහාය සේක. ඒකාන්තයෙන් ද්වෙෂය පහ කළේනුයි අසහාය සේක. ඒකාන්තයෙන් මොහය පහ කළේනුයි අසහාය සේක. ඒ කාන්තයෙන් කෙලෙස් නැත්තේනුයි අසහාය සේක. ඒ කායන මාර්ගයට ගියේනුයි අසහාය සේක. ඒකාන්තයෙන් කෙලෙස් නැත්තේනුයි අසහාය සේක. නිරුත්තර සම්‍යක් සම්බොධියට පැමිණියේනුයි අසහායසේක කෙසේ භාග්‍යවතුන් වහන්සේ පැවිද්දෙන් අසහාය සේක්ද භාග්‍යවතුන් වහන්සේ බාල වයස් ඇත්තේ තරුණවූයේ කළු කෙසින් යුක්තවූයේ සොඳුරු යෞවනයෙන් යුක්ත වූයේ ප්‍රථම වයසෙහි මවුපියන්ගේ නොකැමැත්තෙන් කඳුළු මුසු මුහුණු ඇති හඬන වැළපෙන නෑ සමූහයා හැර සියලු ගෘහවාස පලිබොධය සිඳ, අඹුදරු පලිබොධය සිඳ, රැස් කිරීමේ පලිබොධය සිඳ කෙස් රැවුල් බැහැරකොට කසාවත් හැඳ ගිහිගෙයින් නික්ම පැවිදිව කිසිවක් නැති බවට පැමිණ තනිව හැසිරෙයි. වාසය කරයි. ඉරියව් පවත්වයි. පාලනය කරයි. යැපෙයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ පැවිද්දෙන් අසහාය සේක. "කෙසේ භාග්‍යවතුන් වහන්සේ දෙවැන්නෙකු නැති බැවින් අසහාය සේක්ද? උන්වහන්සේ මෙසේ පැවිදිවූයේම තනිවූයේ වනයෙහි දුරවූ අල්ප ශබ්ද ඇති අල්ප ඝොෂා ඇති මිනිසුන්ගේ ශබ්ද නැති මිනිසුන්ගේ රහස් කටයුතු වලට යොග්‍ය විවේකයට සුදුසු

සේනාසනයන් සේවනය කරයි. උන්වහන්සේ තනිව හැසිරෙයි. තනිවයයි. තනිව සිටියි. තනිව සයනය කරයි තනිව ගමට පිඬු පිණිස හැසිරෙයි. තනිව ආපසු එයි. තනිව රහසිගතව වැඩ හිඳියි. තනිව සක්මන අධිෂ්ඨාන කරයි. තනිව හැසිරෙයි. වාසය කරයි. පවතියි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ දෙවැන්නකු නැත්තේ අසහාය සේක. කෙසේ භාග්‍යවතුන් වහන්සේ තෘෂ්ණාව දුරු කළ බැවින් අසහාය සේක්ද මෙසේ උන්වහන්සේ තනි වූයේ දෙවැන්නකු නැත්තේ අප්‍රමාදවූයේ කෙලෙස් තවන වීය්‍ය‍ී ඇත්තේ දුරුකළ ආත්මභාව ඇත්තේ වාසය කරන්නේ නෙරඤ්ජරා නදී තෙර බෝ රුකමුල මහා වීය්‍ය‍ීය කරන්නේ තෘෂ්ණා නමුචි පමත්ත බන්ධු නම් සේනා සහිත මාරයා පරාජය කොට ජාලිනී විසත්තිකා නම් තෘෂ්ණාව දුරු කළේය.

7 "තෘෂ්ණාව දෙවැනිකොට ඇති පුරුෂතෙම ඉතා දික්වූ සසර මේ ආත්මයෙන් අනික් ආත්මයට පැමිණ හැසිරෙන්නේ එය නොඉක්මවයි"

'භික්ෂුතෙම දුක ඇති කරන්නාවූ තෘෂ්ණාවේ මේ ආදීනවය දැන පහකළ තෘෂ්ණා ඇත්තේ සිහි ඇත්තේ ඒ තෘෂ්ණාව දුරුකරන්නේය." මෙසේ භාග්‍යවතුන් වහන්සේ තෘෂ්ණාව දුරුකළ අර්ථයෙන් අසහාය සේක. "කෙසේ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්ත වීතරාග බැවින් අසහාය සේක්ද? රාගය දුරුකළ බැවින් ඒකාන්ත වීතරාගනුයි අසහායසේක. ද්වෙෂය ප්‍රහීණ බැවින් ඒකාන්තයෙන් බැහැරකළ ද්වෙෂ ඇත්තේනුයි අසහායසේක. මොහය ප්‍රහීණ බැවින් ඒකාන්ත වීත මොහ බැවින් අසහායසේක. ක්ලේශයන් ප්‍රහීණ කළ බැවින් ඒකාන්තයෙන් කෙලෙස් නැත්තේනුයි අසහායසේක කෙසේ භාග්‍යවතුන් වහන්සේ ඒකායන මාර්ගයට ගියේනුයි අසහායසේක්ද? ඒකායන මාර්ගයයයි සතර සතිපට්ඨානයෝ කියත්. සතර සම්‍යක් ප්‍රධානයෝ කියත්. සතර ඍද්ධි පාදයෝ කියත්. පඤ්චෙන්ද්‍රියයෝ, පඤ්චබලයෝ, සප්ත බොධ්‍යංගයෝ ආය්‍ය‍ී අෂ්ටාංගික මාර්ගය කියත්.

8 "හිතානුකම්පා ඇති ඉපදීම ගෙවා දමන දැකුම් ඇති භාග්‍යවතුන් වහන්සේ ඒකායන මාර්ගය දනිත් මේ මාර්ගයෙන් කාමාදී සැඩවතුර පෙර තරණය කළහ. අනාගතයෙහි තරණය කරන්නාහ දැන් තරණය කරත්."

මෙසේ භාග්‍යවතුන් වහන්සේ ඒකායන මාර්ගයට ගිය සේක්නුයි අසහායසේක. මෙසේ භාග්‍යවතුන් වහන්සේ ඒකායන මාර්ගයට ගියසේක්නුයි අසහායසේක. කෙසේ භාග්‍යවතුන් වහන්සේ අසහායසේක්ද? නිරුත්තරවූ සම්‍යක් සම්බොධියට පැමිණියේනුයි අසහායසේක බොධිය යනු සතර මාර්ගයන්හි ඥානයට කියයි. පඤ්ඤින්ද්‍රිය, පඤ්ඤාබලය, ධම්ම විචය සම්බොජ්ඣංගය, විමංසා, සම්මාදිට්ඨි යන මෙය භාග්‍යවතුන් වහන්සේ ඒ බොධිඥානයෙන් සියලු සංස්කාරයෝ අනිත්‍යයි අවබොධ කළසේක. සියලු සංස්කාරයෝ දුක්යයි අවබොධකළසේක. සියලු ධර්මයෝ අනාත්මයයි අවබොධ කළසේක. අවිද්‍යා හේතුවෙන් සංස්කාරයෝ වෙත්යයි අවබොධ කළසේක. (මෙහි (4-5) 4 "මනා කොට දැන" යනු "දැනගත් සේක" කියා වෙනස්කොට යෙදිය යුතුයි) ඒ සියල්ල ඒ බොධිඥානයෙන් අවබොධ කළසේක. අනුබොධ කළසේක ප්‍රතිබොධ කළසේක. මනාව අවබොධ කළසේක පැමිණිසේක. ස්පර්ශ කළසේක. ප්‍රත්‍යක්ෂ කළසේක. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අසහාය සේක් නිරුත්තරවූ සම්‍යක් සම්බොධිය මනාව අවබොධ කළසේක. ඇලීමට පැමිණිසේක. යන්නෙහි ඇලීම නම් වස්තුකාම ක්ලේශ කාමයන්ගෙන් වෙන්වීමේ ඇලීම විවේකයෙහි ඇලීම ශාන්තබවෙහි ඇලීමද යනුයි. එයට පැමිණිසේක. ස්පර්ශ කළසේක. ප්‍රත්‍යක්ෂ කළසේක යනුයි.

## 16 - 3

1 "තෘෂ්ණා දෘෂ්ටිය ඇසුරු නොකළ නොසෙල්වෙන ඒ බුදුරදුන් වෙත" යන්නෙහි "බුදුන්" යනු යම් ඒ භාග්‍යවතුන් වහන්සේ තෙමේම අවබොධ කළසේක් ආචාර්‍ය්‍යවරයකු නැති

සේක් පෙර අවබොධ නොකළ ධර්මයන්හි තෙමේ සත්‍යය මනාව අවබොධ කළසේක. එහිද සර්වඥත්වයට පැමිණිසේක. බලයන්හිද වශී බවට පැමිණිසේක. 'බුද්ධ" යනු කවර අර්ථයකින් බුද්ධ නම්වේද? චතුරාර්‍ය්‍ය සත්‍යය අවබොධ කළේ නුයි බුද්ධ නමි. ප්‍රජාව පිළිබඳ අවබොධය ඇත්තේනුයි බුද්ධ නමි. සර්වඥතාඥානය ලබාගත්තේනුයි බුද්ධ නමි. සියල්ල දක්නේනුයි බුද්ධ නමි. ආශ්‍රවයන් දුරුකළ බැවින් බුද්ධ නමි. උපක්ලේශ නැත්තේනුයි බුද්ධ නමි. ඒ කාන්ත වීත රාග බැවින් බුද්ධ නමි. ඒකාන්තයෙන් පහකළ රාග ඇති බැවින් බුද්ධ නමි. එකාන්තයෙන් පහකළ මොහ ඇති බැවින් බුද්ධ නමි. ඒකායන මාර්ගයට ගියේනුයි බුද්ධ නමි. තනිව නිරුත්තර සම්‍යක් සම්බොධිය අවබොධ කළේනුයි බුද්ධ නමි. අබුද්ධිය දුරුකළ බැවින් බුද්ධිය ලබනලද බැවින් බුද්ධ නමි. "බුද්ධ" යන මේ නාමය මව විසින් නොකරණලදී. පියා විසින් නොකරණලදී සහෝදරයා විසින් නොකරණලදී. සහෝදරියන් විසින් නොකරණලදී. මිත්‍රා මාත්‍යයන් විසින් නොකරණලදී. නෑ සහලේ නෑයන් විසින් නොකරණලදී. ශ්‍රමණ බ්‍රාහ්මණයන් විසින් නොකරණලදී. දේවතාවන් විසින් නොකරණලදී. යම් ඒ බුද්ධයයි පැනවීමක් වේද විමොක්ෂය කෙළවර කොට ඇති මෙය භාග්‍යවත් බුදුවරයින් වහන්සේලාගේ බෝමුල සර්වඥතාඥානය ලැබීම සමග ප්‍රත්‍යක්ෂකවූ ප්‍රඥප්තියයි.

2 "ආශ්‍රය" යනු නිශ්‍රය දෙකකි. තෘෂ්ණා නිශ්‍රය ද දෘෂ්ටි නිශ්‍රයද යනුයි. තෘෂ්ණා නිශ්‍රය කවරේද? යම් පමණ තෘෂ්ණාවෙන් සීමා කරණලද කෙළවර කරණලද වටකොට ගන්නා ලද මේ දෙය මාගේය, අර දෙය මාගේය, මෙපමණ මාගේය, මෙපමණකින් මාගේය. රූපයෝ, ශබ්දයෝ, ගන්ධයෝ, රශයෝ ස්පර්ශයෝ, ඇතිරිලි, පොරෝනා, දාසි දාසයෝ එළු බැටළුවෝ ඌරු කුකුළු ඇත් අස් ගව වෙළඹියෝ කෙත්වතු හිරණ්‍ය ස්වර්ණ ගම් නියම්ගම් රාජධානිද රටවල්ද ජනපදද ගබඩාද කොටු ගුල්ද හුදෙක් මහා පෘථිවියද මාගේයයි මමායනය කරයි. යම් පමණ එක්සිය අටක් තෘෂ්ණාවෙන් යුක්තවූයේද

මේ තෘෂ්ණා නිශ්‍රයයි. දෘෂ්ටි නිශ්‍රය කවරේද, විසි වැදෑරුම් ආත්ම දෘෂ්ටිය, දශ වැදෑරුම් මිථ්‍යා දෘෂ්ටිය, දශ වැදෑරුම් අන්තග්‍රාහික දෘෂ්ටිය, යම් මෙබඳු දෘෂ්ටියක් දෘෂ්ටි ගැන්මක් දෘෂ්ටි වනයක් දෘෂ්ටි කාන්තාරයක් දෘෂ්ටි නපුරු කටුවක් දෘෂ්ටි සැලීමක් ඇද්ද, දෘෂ්ටි සංයෝජනයක් ගැනීමක් පිළිගැන්මක් බැස ගැන්මක් පරාමර්ශයක් ඇද්ද, නරක මාර්ගයක් ඇද්ද වැරදි මාර්ගයක් ඇද්ද, වැරදි අවබොධයක් ඇද්ද, තීර්ථායතනයක් ඇද්ද, විපයඝාස ගැනීමක් ඇද්ද, විපරීත ගැනීමක් ඇද්ද, වරද නිවරදසේ වැරදි ගැනීමක් ඇද්ද, යම් පමණ දෙසැට දෘෂ්ටි ගැනීම් වෙද්ද මේ දෘෂ්ටි නිශ්‍රයයි. භාග්‍යවත් බුදුරදුන්ගේ තෘෂ්ණා නිශ්‍රය ප්‍රහීණය දෘෂ්ටි නිශ්‍රය සන්සිඳුනේය.

3 "තෘෂ්ණා නිශ්‍රය ප්‍රහීණවූ බැවින් දෘෂ්ටි නිශ්‍රය සංසිඳුන බැවින් භාග්‍යවතුන් වහන්සේ ඇසෙහි ඇලීමෙන් තොරසේක. කණ, නාසය, දිව, කය, සිත, යන මෙහි නොඇළුනේ රූපයෙහි ශබ්දයෙහි, ගන්ධයෙහි, කුලය, ගණයා, ආවාසය, ලාභය, කීර්තිය, ප්‍රශංසාව, සැපය, චීවරය, පිණ්ඩපාතය, සෙනාසනය, ගිලන්පස, බෙහෙත් පිරිකර, කාම ධාතුව, රූප ධාතුව, අරූප ධාතුව, කාම භවය, රූප භවය, අරූප භවය, සඤ්ඤාභවය, අසඤ්ඤාභවය, නෙවසඤ්ඤා නාසඤ්ඤාභවය, එකවොකාර භවය, චතුවොකාර භවය, පඤ්ච වොකාර භවය, අතීතය, අනාගතය, පවත්නා කාලය, යන මෙහි දුටු, ඇසූ, මුත වශයෙන් ගත් දැනගත යුතු ධර්මයන්හි නොඇළුනේ, කෙලෙස් දුරුකළේ, නොපැමිණියේ, නික්මුනේ, වෙන්වූයේ සීමා නොකළ සිතින් වාසය කරයි.

4 "නොසෙල්වෙන (තාදී)" යනු භාග්‍යවතුන් වහන්සේ කරුණු පසකින් තාදී නම් වනසේක. (5-8) 8 ඡෙදයේ මුල් කොටස යොදා ගත යුතුයි)

5 කෙසේ භාග්‍යවතුන් වහන්සේ තරණය කළේනුයි තාදී නම් වේද, භාග්‍යවතුන් වහන්සේ කාමොඝය එතර කළ සේක. භවොඝය එතර කළ සේක. සියලු සංසාර මාර්ගය එතර කළ සේක. ඉක්මවූ සේක. උන්වහන්සේ වැස නිම කළ වාස ඇති සේක් පුරුදු හැසිරීම් ඇතිසේක්, ගමන් කළ දීර්ඝ මාර්ග

ඇතිසේක්, ගමන්කළ දිශා ඇතිසේක්, ගමන්කළ කෙළවර ඇතිසේක්, පාලනය කරණලද බ්‍රහ්මචරියාව ඇති සේක උතුම් දෘෂ්ටියට පැමිණිසේක්, වඩන ලද මාර්ග ඇති සේක, ගෙවාදැමූ කෙලෙස් ඇති සේක්, අවබොධකළ යහපත ඇතිසේක්, ප්‍රත්‍යක්ෂ කළ නිරොධය ඇතිසේක උන්වහන්සේට දුකෙහි දැනීම ඇත්තේය. දුක ඇතිවීමේ හෙතුව ප්‍රහීණය, මාර්ගය වඩන ලදී. නිරොධය ප්‍රත්‍යක්ෂ කරණ ලදී, දැනගතයුත්ත දැනගන්නා ලදී. විශෙෂයෙන් දැනගතයුත්ත විශෙෂයෙන් දැනගන්නා ලදී ඔසවනලද දොරපළු ඇතිසේක ගොඩකළ දිය අගල ඇතිසේක. උදුරා දැමූ එළිපත ඇතිසේක. අගුළු නැතිකළ සේක. ආයඨීවූසේක. තෘෂ්ණාදියෙන් වෙන්වූ සේක. අංග පසක් දුරුකළසේක. අංග සයකින් යුක්ත සේක. එක් ආරක්ෂාවක් ඇතිසේක. සතර ආකාරයකින් මිදීම දක්වන සේක. අවබොධ කළ වෙන වෙන සත්‍යයන් ඇති සේක. නොකැළඹුන කල්පනා ඇතිසේක. සංසිඳුන කාය සංස්කාරයන් ඇතිසේක. මනාව මිදුන සිත් ඇතිසේක. මනාව මිදුන ප්‍රඥා ඇතිසේක. තනිවූසේක. වැස නිමවූසේක. උතුම් පුරුෂසේක. ඉතා උතුම් පුරුෂසේක උතුම් පැමිණීමට පැමිණිසේක. උන්වහන්සේ රැස්නොකරයි ඉවත්නොකරයි, ඉවත් නොකොට සිටිසේක් දුරුනොකරයි, රැස් නොකරයි දුරුකොට සිටිසේක. නොමසයි, නොලිහයි. ලිහා සිටිසේක, විනාශ නොකරයි. විනාශකොට සිටිසේක. අශෛක්ෂවූ (හික්මී අවසන්) ශීලස්කන්ධයෙන් යුක්ත බැවින් සිටියේනම්, අශෛක්ෂවූ සමාධිස්කන්ධයෙන් යුක්ත බැවින් සිටියේ නම්, අශෛක්ෂවූ විමුක්තිස්කන්ධයෙන් යුක්ත බැවින් සිටියේ නම් අශෛක්ෂවූ විමුක්තිඥානදර්ශන ස්කන්ධයෙන් යුක්ත බැවින් සිටියේ නම්. සත්‍යය සම්පාදනය කොට සිටිසේක. තෘෂ්ණාව ඉක්මවා සිටිසේක. කෙලෙස්ගින්න මැඩපවත්නා සිටිසේක. මතු ගමන් නොකිරීම පිණිස සිටිසේක. මිදීම සේවනය කරණ ලද බැවින් සිටිසේක. මෛත්‍රී පාරිශුද්ධිය ඇති බැවින් සිටිසේක කරුණා පාරිශුද්ධිය ඇති බැවින් සිටිසේක. මුදිතා පාරිශුද්ධිය ඇති බැවින් සිටිසේක. උපෙක්ෂා පාරිශුද්ධිය ඇති බැවින් සිටිසේක බොහෝ පාරිශුද්ධිය ඇති බැවින් සිටිසේක

මිදුන බැවින් සිටිසේක. සන්තුෂ්ටියට පැමිණ බැවින් සිටිසේක. ස්කන්ධ අවසානයෙහි සිටිසේක. ධාතු අවසානයෙහි සිටිසේක ආයතන අවසානයෙහි සිටිසේක. ගති අවසානයෙහි සිටිසේක. උත්පත්ති අවසානයෙහි සිටි සේක. ප්‍රතිසන්ධි අවසානයෙහි සිටිසේක භව අවසානයෙහි සිටිසේක. සංසාරය කෙළවර සිටිසේක. වට්ටය කෙළවර සිටිසේක. අන්තිම භවයෙහි සිටිසේක. භාග්‍යවතුන් වහන්සේ අන්තිම දෙහධාරී සේක. අන්තිම ආත්මභාවයෙහි සිටිසේක.

6 "උන්වහන්සේගේ මේ පශ්චිමවූ අවසානවූ ආත්ම භාවයයි. උන්වහන්සේට ජාති මරණ සංසාරයක් නැත. නැවත ඉපදීමක් නැත' මෙසේ භාග්‍යවතුන් වහන්සේ තරණය කළේනුයි තාදී නම්. මිදුන බැවින් භාග්‍යවතුන් වහන්සේ කෙසේ තාදී නම් වනසේක්ද, භාග්‍යවතුන් වහන්සේගේ සිත රාගයෙන් මිදුනේය. විශෙෂයෙන් මිදුනේය. මනාකොට මිදුනේය. ද්වෙෂයෙන් මොහයෙන් ක්‍රොධයෙන් බද්ධවෛරයෙන්, ගුණමකුකමින් ඊර්ෂ්‍යාවෙන්, මසුරුකමින්, රැවටිල්ලෙන්, කපටිකමින්, තද ගතියෙන්, එකට එක කිරීමෙන්, මානයෙන්, අතිමානයෙන්, මදයෙන්, ප්‍රමාදයෙන්, සියලු කෙලෙස්වලින් සියලු දුසිරිත් වලින්, සියලු පීඩා වලින්, සියලු දැවිලි වලින්, සියලු තැවීම් වලින්, සියලු අකුශලයන් රැස්කිරීමෙන් සිත මිදුනේය. විශෙෂයෙන් මිදුනේය. මනාකොට මිදුනේය මෙසේ භාග්‍යවතුන් වහන්සේ මිදුන බැවින් තාදී නම්.

7 භාග්‍යවතුන් වහන්සේ එය ප්‍රකාශිත බැවින් කෙසේ තාදීනම් වනසේක්ද? භාග්‍යවතුන් වහන්සේ ශීලය ඇති කල්හි සිල්වත්යයි එය ප්‍රකාශිත බැවින් තාදී නම්. ශ්‍රද්ධාව ඇති කල්හි ශ්‍රද්ධාව ඇත්තේයයි එය ප්‍රකාශිත බැවින් තාදී නම්. වීර්‍ය්‍යය ඇතිකල්හි වීර්‍ය්‍යවත්යයි එය ප්‍රකාශිත බැවින් තාදී නම්. සමාධිය ඇති කල්හි සංසිඳුනේයයි එය ප්‍රකාශිත බැවින් තාදී නම්. සිහිය ඇති කල්හි සිහිය ඇත්තේයයි ප්‍රකාශිත බැවින් තාදී නම්. ප්‍රඥාව ඇති කල්හි ප්‍රඥා ඇත්තේ යයි එය ප්‍රකාශිත බැවින් තාදී නම්. විද්‍යාව ඇති කල්හි ත්‍රිවිද්‍යාව ඇත්තේයයි ප්‍රකාශිත බැවින් තාදී නම්. අභිඥාව ඇති කල්හි අභිඥාසය ඇත්තේයයි ප්‍රකාශිත

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

බැවින් තාදී නම්. දශබලයන් ඇති කල්හි දශබලධාරීයයි ප්‍රකාශිත බැවින් තාදී නම්. මෙසේ භාග්‍යවතුන් වහන්සේ එය ප්‍රකාශිත බැවින් තාදී නම්. යනුයි කුහක නැති ගණාචාර්‍ය්‍යත්වයට පැමිණියාවූ යන්නෙහි "කුහක නැති" යනු කුහක වස්තු තුනක් වෙති. (10-5) 2 (ii) ඡේදය යොදා ගතයුතුයි)

8 "ගණාචාර්‍ය්‍යත්වයට පැමිණිසේක" යන්නෙහි 'ගණී යනු භාග්‍යවතුන් වහන්සේ ගණයා ඇතිසේක. ගණාචාර්‍ය්‍ය බැවින් ගණී' නම්. ගණයාට ශාස්තෘ බැවින් ගණී නම්. ගණයා පරිහරණය කෙරේනුයි ගණී නම්. ගණයාට අවවාද කෙරේනුයි ගණී නම්. ගණයාට අනුශාසනා කෙරේනුයි ගණී නම්. විශාරදව ගණයා වෙත පැමිණේනුයි ගණී නම්. ගණයා උන්වහන්සේගෙන් අසානුයි කන් යොදවානුයි රහත් ඵලයට සිත යොදවානුයි ගණී නම්. ගණයා අකුශලයෙන් නැගුටුවා කුශලයෙහි පිහිටුවානුයි ගණී නම්. භික්ෂුගණයා ඇත්තේනුයි ගණී නම්. භික්ෂුණී ගණයා ඇත්තේනුයි ගණී නම්. උපාසක ගණයා ඇත්තේනුයි ගණී නම්, උපාසිකා ගණයා ඇත්තේනුයි ගණී නම් රාජගණයා ඇත්තේනුයි ගණී නම්. ක්ෂත්‍රිය ගණයා ඇත්තේනුයි ගණී නම්. බ්‍රාහ්මණ ගණයා ඇත්තේනුයි ගණී නම්. වෛශ්‍ය ගණයා ඇත්තේනුයි ගණී නම්. ශුද්‍ර ගණයා ඇත්තේනුයි ගණී නම්. බ්‍රහ්ම ගණයා ඇත්තේනුයි ගණී නම් දෙව ගණයා ඇත්තේනුයි ගණී නම්. සංඝ ගණයා ඇත්තේනුයි ගණී නම්. ගණයා ඇති ගණාචාර්‍ය්‍යවරයා සංකස්ස නගරයට පැමිණියේය යනුයි

9 "මේ ලොව බොහෝ ශිෂ්‍යයන් අතුරෙන්" යනු බොහෝ ක්ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය, ශුද්‍ර, ගෘහපති ප්‍රව්‍රජිත දෙව් මිනිස් යන 'බැඳුණවුන්ගෙන්' යනු බැඳුන පිරිවරා සිටින ශිෂ්‍යයන් අතුරෙන් යනුයි. "වැඩ කැමැත්තාවූ මම ප්‍රශ්න අසනු කැමැත්තෙන් පැමිණියෙමි" යනු ප්‍රශ්නයෙන් ප්‍රයෝජන ඇතිව පැමිණියේ වෙමි. ප්‍රශ්න විචාරීමේ කැමැත්තෙන් පැමිණියේ වෙමි. ප්‍රශ්න ඇසීමේ කැමැත්තෙන් පැමිණියේ වෙමි යනුයි යලිදු හෝ ප්‍රශ්නයෙන් ප්‍රයෝජන ඇත්තන්ගේ ප්‍රශ්න විචාරන්නන්ගේ ප්‍රශ්න අසන්නන්ගේ පැමිණීම, ඉදිරියට ඒම,

ළඟට පැමිණීම, පයිරුපාසනය, වන්නේය මෙසේද ඇත්තේය. යලිදු හෝ ප්‍රශ්න ආගමනය ඔබට ඇත්තේය. ඔබද පොහොසත්ය. මා විසින් විචාරණ ලද්ද කීමට විසඳන්නට ඔබද සුදුසුය. මේ භාරය උසුලනු මැනව යනුයි.

## 16 - 4

1 "ජාති ජරාදිය පිළිකුල් කරන්නාවූ භික්ෂුවට" යන්නෙහි භික්ෂුවට යනු පෘථග්ජන කල්‍යාණ භික්ෂුවට හෝ ශෛක්ෂ (හික්මෙන) භික්ෂුවට හෝ යනුයි. පිළිකුල් කරන්නාවූ යනු' ඉපදීමෙන් පිළිකුල් කරන්නාවූ ජරාවෙන් ව්‍යාධියෙන් මරණයෙන් ශොකයෙන් වැළපීමෙන් කායික දුකින් තිරිසන් යොනි දුකින් ප්‍රෙත විෂයික දුකින් මානුෂික දුකින් මවුගැබට බැසගැන්මේ දුකින් ගැබ සිටීමේ දුකින් බිහිවීමේ දුකින් උපන්නහුට බන්ධනාදියෙන් ඇතිවන දුකින් උපන්නහුට අනුන්ට යටත්වීමෙන් ඇතිවන දුකින් උපන්නහුට තමාගේ උපක්‍රමවලින් ඇතිවන දුකින් අනුන්ගේ උපක්‍රම වලින් ඇතිවන දුකින් දුක්ඛ දුකින් සංසාර දුකින් (දුකින් යනු යොදා 1-4 (12) (iii) යෙදිය යුතුයි) දෘෂ්ටි ව්‍යසන දුකින් පීඩාවට පැමිණෙන්නේ, ලජ්ජාවට පැමිණෙන්නේ පිළිකුල් කරන්නේ යනුයි.

2 "විවේකවූ ආසන සේවනය කරන්නාවූ" යන්නෙහි යම්තැනක හිඳගනීද, ඇඳ, පුටුව, බිස්ස කළාල, සම්කඩ තෘණ ඇතිරිය, කොළ ඇතිරිය, පලස් ඇතිරිය යනාදී මේ ආසන නොසුදුසු රූප දැකීමෙන් හිස්වූයේ විවේකවූයේ වෙයි. නොසුදුසු ශබ්ද ඇසීමෙන් හිස්වූයේ විවේකවූයේ වෙයි. නොසුදුසු පඤ්චකාම ගුණයන්ගෙන් හිස්වූයේ විවේකවූයේ වෙයි. ඒ විවේක ආසනය භජනය කරන්නාවූ සේවනය කරන්නාවූ ප්‍රතිසේවනය කරන්නාවූ යනුයි.

3 "රුක්මුල සොහොන හෝ" යනු රුක්මුලම රුක් මුලයි. සොහොනම සොහොනයි. පර්වතයන්ගේ ගුහාවල යනු පර්වතයෝම පර්වතයෝයි. ගිරිකඳුරම ගිරිකඳුරය ගිරිගුහාවම

ගිරිගුහාවය. පර්වත අතර පිහිටි තැනට පර්වත පබ්භාරයයි කියත්.

## 16 - 5

1 උසස් පහත් සයනයන්හි යන්නෙහි උසස් පහත් හීන ප්‍රණීත ශ්‍රෙෂ්ඨ ලාමක සයනයන්හි යනුයි. සයනයයයි විහාරය, ගුරුළු පියාපත් වැනි වහලක් ඇති ගෙය, ප්‍රාසාදය, හම්මිය, ගුහාවය යන මේ තැන් සයනයයි කියයි.

2 "එහි කෙතෙක් බිය දක්වන කරුණු වෙද්ද" යන්නෙහි 'කෙතෙක්" යනු නපුරු නාදකරන්නාවූ ශබ්ද කරන්නාවූ යනුයි නැවත කෙතෙක් යනු කෙතෙක් කොපමණ විශාල ඒ භය උපදවන කරුණුද, සිංහයෝ ව්‍යාඝ්‍රයෝ දිවියෝ වලස්සු කලුහිස් වලස්සු, වෘකයෝ මීම්මු ඇත්තු සර්පයෝ ගෝනුස්සෝ පත්තෑයෝ හොරු හෝ කළ වැරදි වැඩ ඇති හෝ නැති මිනිස්සුද වෙති.

3 "භික්ෂුතෙම යම් බිය උපදවන කරුණු වලින් නො සැලෙන්නේද" යන්නෙහි 'යම්' යනු යම් බිය උපදවන කරුණු වලින් යනුයි. භයජනක කරුණු දැක හෝ අසා හෝ නොසැලෙන්නේද බිය නොවන්නේද නැති නොගන්නේද බිය නොවන්නෙක් වන්නේය. තැති නොගන්නෙක් වන්නේය දුරුකළ භය උපදවන කරුණු ඇත්තේ පහවූ ලොමහර්ෂ ඇත්තේ වාසය කරන්නේය යනුයි. භික්ෂුතෙම ඝෝෂානැති සේනාසනයෙහි යම් බිය උපදවන කරුණු වලින් නොසැලෙන්නේද, යනු අල්ප ශබ්ද ඇති අල්ප ඝොෂා ඇති මිනිසුන් ගෙන් හිස් මිනිසුන්ගේ රහස් කටයුතුවලට යොග්‍ය විවේකයට සුදුසු සේනාසනයෙහි යනුයි.

## 16 - 6

1 "ලොකයෙහි උවදුරු කොතෙක්ද" යනු (14-7) 8 ඡෙදය යෙදිය යුතුයි) 'ලොකයෙහි' යනු මනුෂ්‍ය ලොකයෙහි යනුයි.

2 "නොගියවිරූ දිශාවට යන්නාහට" යන්නෙහි නොගිය දිශාවයයි අමෘත මහා නිර්වාණයට කියයි. යම් ඒ සියලු සංස්කාරයන් සංසිඳවූ සියලු සසර ඉපදීමට හෙතුවන කෙලෙස් ආදිය බැහැරකළ තෘෂ්ණාව ගෙවා දැමූ විරාග නම් නිරොධ නම් නිර්වාණයක් වේද, ඒ දිශාවට නොගිය විරූය. මේ දීර්ඝ කාලයෙහි ඒ දිශාවට නොගිය විරූය. නොගිය විරූ දිශාව (නිර්වාණය) ප්‍රාර්ථනා කරමින් යම්සේ ගැට්ට තරමට පිරුන අඩුනොවූ තෙල් පාත්‍රයක් පරිහරණය කරන්නේද එසේ ස්වකීය සිත රක්නේය. නොගියවිරූ දිශාවට යන්නාවූ ගමන් කරන්නාවූ ඉදිරියට යන්නාවූ යනුයි.

3 "මහණතෙම යම් උවදුරු කෙනෙකුන් මැඩපවත් වන්නේද" යන්නෙහි 'යම්' යනු යම් උවදුරු මැඩපවත්වන්නේද, යටපත් කරන්නේද, මඩින්නේද යනුයි. "විවේක සේනාසන යෙහි" යනු ඈත්වූ විවේකවූ, ඉතා ඈත්වූ පර්වතාන්තයෙහි හෝ වනාන්තයෙහි හෝ ගංගාන්තයෙහි හෝ ජලාන්තයෙහි හෝ යම්තැනක සීසෑම් නොකෙරේද, නොවපුරාද මිනිස් සීමාව ඉක්මවා මිනිසුන්ගෙන් ඈත්වූ සේනාසනයෙහි යනුයි.

## 16 - 7

1 'ඔහුට කෙබඳු වචන කෙනෙක් වන්නාහුද" යනු කවර නම් වචනයන්ගෙන් යුක්තවූවෙක් වන්නේද, කවර සටහණකින් කවර ප්‍රකාරයකින් කවර සමානකමකින්දැයි වචී පාරිශුද්ධිය විචාරයි. වචී පාරිශුද්ධිය කවරීද? මෙහි මහණ තෙම මුසාවාදය හැර මුසාවාදයෙන් වෙන්වූයේවේද සත්‍යය කියන්නේ සත්‍යය ගලපන්නේ ලොකයාට නොගැලපෙන කීම් නැත්තේවේද, කේලාම් කීම අත්හැර කේලාම් කීමෙන් වෙන්වූයේ වේද, මෙතනින් අසා මොවුන්ගේ භෙදය පිණිස අසවල් තැන නොකියන්නේවේද, අසවල් තැන අසා ඔවුන් ගේ භෙදය පිණිස මොවුන්ට නොකියන්නේ වේද මෙසේ බිඳුනවුන්ගේ ගැලපීම පිණිස සමගිවූවන්ට අනුබලදීම පිණිස සමගියෙහි ඇළුනේ

සමගියට සතුටුවන්නේ සමගි කරණ වචන කියන්නේ වෙයි. නපුරු වචන හැර නපුරු වචන කීමෙන් වෙන්වූයේ වෙයි. යම් ඒ වචනයක් කණට උලක් මෙන් නොවූයේ කණට සැපවත්වූයේ ප්‍රෙමණීයවූයේ හෘදයංගමවූයේ නගර වැසියාට අයත්වූයේ බොහෝ ජනයාට ප්‍රියවූයේ බොහෝ ජනයාට මනාපවූයේද, එබඳු වචන කියන්නේ වෙයි. හිස් වචන කීම අත්හැර හිස් වචන කීමෙන් තොරවූයේ කාලයට සුදුසු වැඩගෙන දීමට සුදුසු ධර්මය කියන හික්මීම කියන හිතේ තැන්පත් කිරීමට සුදුසු සුදුසු කාලයෙහි කෙළවරක් ඇති, අර්ථයට හේතුවූ වචන කියන්නේ වේද, සතර වාග් සුචරිතයෙන් යුක්තවූ සතර දොෂයන් ගෙන් වෙන්වූ වචන කියයි. දෙතිස් තිරිසන් කථාවෙන් ඈත්වූවෙක් වන්නේය. වෙන්වූවෙක් වන්නේය. වෙන්වූයේ නික්මුනේ මිදුනේ සීමානොකළ සිතින් වාසය කරයි. දශ කථාවස්තූන් කියයි. හේ කෙසේද? අල්පවූ ආශා උපදවන කථා, සන්තොෂය ඇතිකරවන කථා, උසස් විවේකය පිළිබඳ කථා, එකතු නොවීම පිළිබඳ කථා, වීර්යාරම්භ කථා, ශීල කථා, සමාධි කථා, ප්‍රඥා කථා, විමුක්ති කථා, විමුක්ති ඥාන දර්ශන කථා, සතිපට්ඨාන කථා, සම්‍යක් ප්‍රධාන කථා, ඍද්ධි පාද කථා, ඉන්ද්‍රිය කථා, බල කථා, බොධ්‍යංග කථා, මාර්ග කථාව, ඵල කථාව, නිර්වාණ කථාව කියයි. වචනයෙහි හික්මුනේ ආරක්ෂාවූයේ සංවරවූයේ යනුයි. මේ වචනයෙහි පිරිසිදුකමයි. කෙබඳු වාග් පාරිශුද්ධියකින් යුක්තවූවෙක් වන්නේද යනුයි

2 "මෙහි කෙබඳු ගොචර කෙනෙක් වන්නාහු නම් මැනවිද" යනු මෙහි කවර හැසිරීමකින් යුක්තවූවෙක් වන්නේද කවර සටහණකින් කවර ප්‍රකාරයකින් කවර වැටහීමකින් (යුතු) හැසිරීම විචාරයිද, හැසිරිය යුත්තද නොහැසිරිය යුත්තද ඇත. අගොචරය කවරේද, මෙහි ඇතැම් කෙනෙක් වෙසඟනන් සිටින තැන හැසිරෙන්නේ වෙයි. හිමියා මළ ස්ත්‍රීන් වෙසෙන තැන, තරුණියන් වෙසෙන තැන, පණ්ඩකයන් සිටින තැන, භික්ෂුනීන් සිටින තැන, සුරාපානය කරණ තැන වෙසෙන්නේ වේද, රජුන් සමග රාජ මහාමාත්‍යයන් සමග ඇලී ගැලී සිටින්නේවේද,

තීර්ථකයන් හා තීර්ථක ශ්‍රාවකයන් හා නුවමනා එක්වීමෙන් වෙසෙන්නේ වේද, යම් ඒ කුලයෝ ශ්‍රද්ධාව නැත්තාහුද පැහැදීම් නැත්තාහුද, ආහාර පාන නැත්තාහුද භික්ෂූන්ටද භික්ෂුණීන්ටද උපාසකයන්ටද උපාසිකාවන්ටද නපුරු වචනයෙන් බණින්නාහු වෙද්ද, අනර්ථය කැමති අහිත කැමති, අපහසු කැමති වෙද්ද, නිවණ නොකැමති වෙද්ද, එවැනි කුලයන් සේවනය කරයි. භජනය කරයි. පයුරු පාසනය කරයි. මේ නුසුදුසු හැසිරීම නම්. නැවතද ඇතුළු ගමට හෝ ඇතුළු ගෙට පිවිසියේ, වීථියට පිවිසියේ නොහික්මීමෙන් යයි. ඇතුන් බලමින් අසුන් බලමින් රිය බලමින් පාබල සෙනඟ බලමින් ස්ත්‍රීන් බලමින් පුරුෂයන් බලමින්, කුමරුවන් බලමින් කුමරියන් බලමින් ආපනශාලා බලමින්, ගෙවල් ඉදිරිපස බලමින් උඩ බලමින් යට බලමින් ඒ මේ අත බලමින් යයි. මෙයද අගෝචරයයි නැවතද ඇසින් රූපය දැක නිමිති ගන්නේ වෙයි. අනුබ්‍යඤ්ජන ගන්නේ වෙයි. (14-8) 1 (ii) යනාදියයි යන තැනට යෙදිය යුතුයි.) යෙදුනාහු වෙත්. මෙයද අගෝචරය වෙයි. පඤ්ච කාම ගුණයෝ අගෝචරයෝ වෙති.

3 "මහණෙනි, පර විෂය නම්වූ (අනුන්ට අයත්) අගොචරයෙහි නොහැසිරෙව්, පර විෂය නම්වූ (අනුන්ට අයත්) අගෝචරයෙහි හැසිරෙන්නහුට මාරයා ඉඩ ලබන්නේය. මාරයා අරමුණු ලබන්නේය. භික්ෂුවට පර විෂය නම්වූ අගෝචරය කවරේද? (ii) යම් ඒ පඤ්චකාම ගුණයෝ වෙද්ද ඔවුහුයි. ඒ පස කවරේද? ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය රූපවූ කාමයන් ගෙන දෙන ඇළුම් කටයුතු ඇසින් දත යුතු රූපයෝද, කණින් ඇසිය යුතු ශබ්දයෝද, දිවෙන් විඳිය යුතු රශයෝද, කයින් විඳිය යුතු ස්පර්ශයෝද යන මෙය මහණෙනි, අගෝචරය යයි කියයි. ගෝචරය කවරේද? (මෙහි 3 (ii) 'ඡෙදය නොවන්නේද' කියා වෙනස් කොට යොදාගත යුතුයි.) සතර සතිපට්ඨාන ගෝචරයයි.

4 "මහණෙනි, ස්වකීය පියා සතු විෂය නම්වූ ගෝචරයෙහි හැසිරෙව්, ස්වකීය පියා සතු විෂය නම්වූ ගෝචරයෙහි

හැසිරෙන්නහුට මාරයා ඉඩ නොලබයි. මාරයා අරමුණ නොලබයි. මහණෙනි, භික්ෂුවට ස්වකීය පියා සතු විෂය නම් ගෝචරය කවරේද? යම් ඒ සතර සතිපට්ඨානයෝයි. කවර සතරක්ද, මහණෙනි, මෙහි මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, මනා නුවණැත්තේ සිහි ඇත්තේ දැඩි ලොභය හා දොම්නස දුරුකොට කයෙහි කය අනුව බලමින් වාසය කෙරේද, වේදනාවන්හි වේදනාව අනුව බලමින් ධර්මයෙහි ධර්මය අනුව බලමින්, සිතෙහි සිත අනුව බලමින් වාසය කෙරේද? මහණෙනි, මෙය භික්ෂුවට ස්වකීය පියා සතු ගෝචරය වෙයි. මෙයද ගෝචරයයි කියයි. මෙබඳු ගෝචරයෙන් යුක්තවූවෙක් වන්නේය.

**5** "කෙබඳු ශීල ව්‍රත කෙනෙක් වන්නාහු නම් මැනවීද" යනු කෙබඳු ශීල ව්‍රතයෙන් යුක්තවූවෙක් වන්නේද? කවර හැඩහුරු කමකින්, කවර ප්‍රකාරයකින් කවර සමානත්වයකින් දැයි ශීල ව්‍රත පාරිශුද්ධිය විචාරයි. ශීල ව්‍රත පාරිශුද්ධිය කවරීද? ශීලයද ව්‍රතයද ඇත. ( (3-3) 2 ඡේදය යොදාගත යුතුයි.)

**6** "මේ ශීල ව්‍රත පාරිශුද්ධියයි. කවර ශීල ව්‍රත පාරිශුද්ධියකින් යුක්තවූවෙක් වන්නාහු නම් මැනවිද" යනුයි. "පටන්ගත් වීර්‍ය්‍ය ඇති ඒ මහණහට" යනු උත්සාහවත් ආත්ම භාවය ඇත්තහුට යනු පටන්ගත් වීර්‍ය්‍ය ඇත්තහුට යනුයි. බලවත් උත්සාහ ඇති නොපසුබස්නා ගති ඇති, බහා නොතැබූ කැමැත්ත ඇති කුශල ධර්මයන්හි බහා නොතැබූ ධෛර්‍ය්‍ය ඇත්තාට යනුයි. යලිදු හෝ යවනලද ආත්ම භාවය ඇත්තහුට යනුයි. යමක් පිණිස යවනලද (සිත හා ධෛර්‍ය්‍යය) ආත්මාර්ථයෙහිද සත්‍ය මාර්ගයෙහිද, ලක්ෂණයෙහිද කාරණයෙහිද ස්ථාන ස්ථානයෙහිද වේනම් එයයි එනම්, සියලු සංස්කාරයෝ අනිත්‍යයයි (4-5) 4 'සියලු සංස්කාරයෝ' යන තැන සිට 'මනාකොට ධර්මය දැන' යනු යවනලද සිත් ඇත්තහුට' කියා වෙනස්කොට යොදාගත යුතුයි) පවත්නේයයි යවනලද සිත් ඇත්තහුට යනුයි භික්ෂුවට යනු පෘථග්ජන කල්‍යාණ භික්ෂුවට හෝ රහත් බවට හික්මෙන භික්ෂුවට හෝ යනුයි.

## 16 - 8

1 "මහණතෙම් කවර හික්මීමක් සමාදන්ව" යනු ඒ මහණතෙම කවර ශික්ෂාවක් ගෙන සමාදන්ව පරාමර්ශ කොට බැසගෙන යනුයි "එකගවූ සිත් ඇති පණ්ඩිතවූ සිහි ඇති" යන්නෙහි ඒ මේ අරමුණුවල නොදුවන සිත් ඇති තැන්පත් සිත් ඇති කලබල නොවූ සිත් ඇති යනුයි. සමථය, සමාධින්ද්‍රිය, සමාධි බලය, සම්මා සමාධිය යනුයි "පණ්ඩිතවූ යනු නුවණැති, ප්‍රඥාවත් බුද්ධිමත්, ඥානය ඇති, යනුයි. "සිහි ඇති" යනු කරුණු සතරකින් සිහි ඇති යනුයි. කයෙහි කය අනුව බලන සතිපට්ඨානය වඩන බැවින් සිහි ඇත්තේ වේදනාවන්හි වේදනාව අනුව බලන, සිතෙහි සිත අනුව බලන ධර්මයන්හි ධර්මය අනුව බලන සිහිය පිහිටුවීම වඩන්නේ නුයි සිහි ඇත්තේ නම් හෙතෙම සිහි ඇත්තේයයි කියනු ලැබේ.

2 "කවර ශික්ෂාවක් සමාදන්ව" යනු අධිශීල ශික්ෂාව විචාරයි. නිපක හෙවත් පණ්ඩිත යනු අධිප්‍රඥා ශික්ෂාව විචාරයි. සිහි ඇත්තේ යනු පාරිශුද්ධිය විචාරයි. යනුයි.

3 "කම්මාරයා රිදීවල මල පිඹ හරින්නාක් මෙන්" යන්නෙහි "කර්මාර" යනු රන්කරුවාට කියයි. රජතයයි රිදීවලට කියයි, යම්සේ රන්කරුවා රිදීවල ඕලාරික මල පිඹ හරිද මධ්‍යමවූ මල පිඹ හරිද, සියුම් මල පිඹ හරිද, මෙසේම භික්ෂුව තමන්ගේ ඕලාරික කෙලෙස් පිඹහරියි. මධ්‍යමවූ කෙලෙස් පිඹ හරියි සියුම් කෙලෙස් පිඹහරියි, දුරුකරයි, නූපදනාබවට පමුණුවයි. යලිදු හෝ භික්ෂුතෙම තමාගේ රාග මලය, ද්වේෂමලය, මොහ මලය, මාන මලය, දෘෂ්ටිමලය, ක්ලේශ මලය, දුශ්චරිත මලය, අන්ධබව, ඇස් නැතිබව, නොදන්නාබව, ප්‍රඥා නැතිකම, විනාශ පාක්ෂික බව නිර්වාණයට නොපවත්නා බව පිඹ හරියි, දුරුකරයි, ඈත්කරයි, නූපදනා බවට පමුණුවයි. යලිදු හෝ සම්‍යක්දෘෂ්ටියෙන් මිථ්‍යාදෘෂ්ටිය පිඹ හරියි. දුරුකරයි. ඈත්කරයි. නූපදනාබවට පමුණුවයි. යහපත් කල්පනාවෙන්, මිථ්‍යා කල්පනාව සම්‍යක් වචනයෙන්, මිථ්‍යා වචනය, සම්‍යක් කර්මාන්තයෙන් මිථ්‍යා කර්මාන්තය, සම්‍යක් ආජීවයෙන්, මිථ්‍යා ආජීවය සම්‍යක්

ව්‍යායාමයෙන් මිථ්‍යා ව්‍යායාමය, යහපත් සිහියෙන් වැරදි සිහිය. සම්‍යක් සමාධියෙන් මිථ්‍යා සමාධිය, සම්‍යක් ඥානයෙන් මිථ්‍යා ඥානය, සම්‍යක් විමුක්තියෙන් මිථ්‍යා විමුක්තිය, පිඹහරියි දුරුකරයි, ඈත්කරයි, නොඉපදීමට පමුණුවයි යනුයි.

## 16 - 9

1 "පිළිකුල් කරන්නාට යම් ඒ පහසුවක්වේද" යන්නෙහි පිළිකුල් කරන්නාට, යනු ජාතියෙන් පිළිකුල් කරන්නාට ජරාවෙන් පිළිකුල් කරන්නාට, ව්‍යාධියෙන් පිළිකුල් කරන්නාට මරණයෙන් පිළිකුල් කරන්නාට, ශොකයෙන් පිළිකුල් කරන්නාට, වැළපීමෙන් කායික දුකින්, දොම්නසින්, උපායාස යන්ගෙන්, ඥාති, භොග, රොග, ශීල, දෘෂ්ටි ව්‍යසන දුක්ඛයෙන් පිළිකුල් කරන්නහුට කරදරයට පැමිණෙන්නහුට, ලජ්ජා වන්නහුට යනුයි.

2 "යම් ඒ පහසුවක්වේද" යනු මේ පහසු විහරණයෙන් වේද, එය කියන්නෙමි. පහසුවිහරණය නම් කවරේද? සම්‍යක් ප්‍රතිපදාව, අනුලොම ප්‍රතිපදාව, අවිරුද්ධ ප්‍රතිපදාව, අන්වර්ථ ප්‍රතිපදාව, ධර්මානුධර්ම ප්‍රතිපදාව, ශීලයන් සම්පූර්ණ කරණ බව, ඉන්ද්‍රියයන්හි වසනලද දොර ඇති බව (සංවරය) භොජනයෙහි පමණ දැනීම, නිදි දුරුකිරීමේ යෙදීම, සිහිය හා මනා නුවණ ඇති බව, සතර සතිපට්ඨානයෝ, සතර සම්‍යක්ප්‍රධානයෝ සතර ඍද්ධිපාදයෝ, පඤ්චෙන්ද්‍රියයෝ, පඤ්චබලයෝ, සප්ත බොධ්‍යංගයෝ ආය්‍යීඅෂ්ටාංගික මාර්ගය, නිර්වාණය නිර්වාණ ගාමිණී ප්‍රතිපදාව යනු මේ පහසුවිහරණයයි යනුයි 'ශාරීපුත්‍රය" යනු භාග්‍යවතුන් වහන්සේ ඒ තෙරුන් වහන්සේට නාමයෙන් ආමන්ත්‍රණය කරති. 'භාග්‍යවත්' යනු ගෞරව වචනයකි (7-2 (i) භාග්‍යවතුන් වහන්සේ යනු යන තැන් සිට යොදාගත යුතුය.) 'විවේක සේනාසනයන් ඒකාන්තයෙන් සෙවුනාවූ යනු ආසන නම් යම් තැනක හිඳගනීද ඒ ආසනයයි (14-1) 4 යම්තැනක වැඩහිඳීද යන තැන සිට යොදාගතයුතුයි.) විවේක සේනාසනයන් සෙවූනාවූ ආශ්‍රය කරන්නාවූ යනුයි.

3 "සම්බෝධිය කැමැති මහණහට යම්බඳු අනුධර්මයක් වේද, යන්නෙහි 'සම්බොධි යනු සතර මාර්ගයන්හි ඥානය ප්‍රඥාව ප්‍රඥෙන්ද්‍රිය, ප්‍රඥාබලය ධර්මවිචය සම්බොධ්‍යංගය, වීමංසාව විපස්සනාව, සම්‍යක් දෘෂ්ටිය යනුයි. ඒ සම්බොධිය අවබොධ කරණු කැමැත්තහුට ප්‍රතිබොධ කරණු කැමැත්තහුට පැමිණෙනු කැමැත්තහුට ස්පර්ශ කරණු කැමැත්තහුට ප්‍රත්‍යක්ෂ කරණු කැමැත්තහුට යනුයි "යම්බඳු අනුධර්මයක්" යනු බොධියෙහි අනුධර්මයෝ කවරහුද සම්‍යක් ප්‍රතිපදාව අනුලෝම ප්‍රතිපදාව ධර්මානුධර්ම ප්‍රතිපදාව යන මොවුහු බොධියේ අනුධර්මයෝ යයි කියත්. යලිඳු හෝ සතර මාර්ගයන්ට පූර්වභාගයෙහි විදර්ශනාවයි. මේ බොධියේ අනුධර්මයෝ යයි කියත් යනුයි

4 "යම්සේ දන්නෙම්ද එය ඔබට කියන්නෙමි" යන්නෙහි "එය" යනු බොධියෙහි අනු ධර්මයයි. කියන්නෙමි යනු දෙසන්නෙමි, පනවන්නෙමි, තබන්නෙමි, විවෘත කරන්නෙමි, බෙදන්නෙමි, ප්‍රකට කරන්නෙමි, ප්‍රකාශ කරන්නෙමි. "යම්සේ දන්නෙම්ද" යනු යම්සේ දනිම්ද, යම්සේ අවබොධ කළෙම්ද මෙය මෙසේයි, මෙසේවීයයි අසා හෝ නොවේ පරම්පරාවෙන් ආවාවූ හෝ නොවේ. කොටස් වශයෙන් දැන හෝ තර්ක හේතුවෙන් හෝ නොවේ. න්‍යාය හේතුවෙන් නොවේ. ආකාරයක් සිතා හෝ නොවේ. දෘෂ්ටිය විනිවිද බැලීමෙන් නොවේ. තෙමේම තමා විසින් මනාකොට දන්නා ලද තමාට ප්‍රත්‍යක්ෂ ධර්මයක් ඇද්ද එය කියන්නෙමි යනුයි.

## 16 - 10

1 "නුවණැත්තේ පස් වැදෑරුම් භයෙන් බිය නොවන්නේය" යන්නෙහි නුවණැත්තේ යනු 'පණ්ඩිතවූ ප්‍රඥාවත් බුද්ධිමත් වීරතෙම පස් වැදෑරුම් බියෙන් බිය නොවන්නේය. ත්‍රස්ත නොවන්නේය. බිය නුවූවෙක් වන්නේය. ලොමු ඩැහැ ගත්තෙක් නොවන්නේය. ප්‍රහීණ භය හා බිය විය යුතු දේවල නැත්තෙක් වන්නේ යනුයි.

2 "සිහි ඇති (ශීල සංවරාදී) කෙළවරෙහි හැසිරෙන භික්ෂුතෙම" යන්නෙහි 'භික්ෂු" යනු පෘථග්ජන කල්‍යාණක හෝ භික්ෂුවයි. රහත් බවට හික්මෙන හෝ භික්ෂුවයි සිහි ඇත්තේ යනු කරුණු සතරකින් සිහි ඇත්තේ යනුයි. කයෙහි කය අනුව බලන සිහිය පිහිටුවන්නේයි සිහි ඇත්තේ නම්. වෙදනාවන්හි වෙදනාව අනුව බලන සිහිය ඇත්තේනුයි සිතෙහි සිත අනුව බලන ධර්මයෙහි ධර්මය අනුව බලන සිහිය පිහිටු වන්නේනුයි, සිහි ඇත්තේ නම්. හෙතෙම සිහි ඇත්තේ යයි කියයි. "කෙළවරෙහි හැසිරෙන යනු කෙළවර සතරක් වෙති. ශීල සංවර කෙළවර, ඉන්ද්‍රිය සංවර කෙළවර, භෝජනයෙහි පමණ දැනීමේ කෙළවර, නිදි දුරුකිරීමේ කෙළවර යනුයි. ශීල සංවර කෙළවර කවරේද? මෙහි මහණතෙම සිල් ඇත්තේවේ. ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවූයේ ස්වල්ප වරදෙහි භය දක්නා සුළු වූයේ ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවරවූයේ ශික්ෂාපදයන් සමාදන්ව හික්මේද ඇතුළත අපවිත්‍ර බව කල්පනා කරන්නේ ඇතුළත ශීල සංවර කෙළවර හැසිරෙයි. සීමාව නොබිඳියි. මෙය ශීල සංවර කෙළවරයි.

3 ඉන්ද්‍රිය සංවර කෙළවර කවරේද? මෙහි මහණතෙම ඇසින් රූපය දැක නිමිති නොගන්නේ වේද හැඩහුරුකම් නොගන්නේ වේද යම් හේතුවකින් මේ ඇස නමැති ඉන්ද්‍රිය අසංවරව වාසය කරන්නාවූ ඔහුට දැඩි ලොභය ආදී ලාමක අකුශල ධර්මයන් ඔහු අනුව යන්නාහුද, ඇස නමැති ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. කණින් ශබ්දය අසා නාසයෙන් සුවඳ ආඝ්‍රානය කොට දිවෙන් රශය විඳ කයින් ස්පර්ශය ස්පර්ශකොට මනසින් ධර්මය දැන නිමිති නොගන්නේ වේද, හැඩහුරුකම් නොගන්නේ වේද යම් කිසි හෙතුවකින් මනෙන්ද්‍රිය අසංවරව වාසය කරන්නහුට දැඩි ලොභය දොම්නස යන ලාමක අකුශල ධර්මයෝ ඔහු අනුව යන්නාහුද, එහි සංවරය පිණිස පිළිපදියි. මනෙන්ද්‍රිය රකියි. මනෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි "ආදිත්තපරියාය" සූත්‍රය සිහි කරමින් ඇතුළත ඉන්ද්‍රිය සංවර කෙළවර හැසිරෙයි. සීමාව නොබිඳියි මේ ඉන්ද්‍රිය සංවර

කෙළවරයි. භොජනයෙහි පමණ දැනීමේ කෙළවර කවරේද? මෙහි මහණ නුවණ මෙහෙයා සිතා ආහාරය අනුභව කරයි. ක්‍රීඩා පිණිස නොවේ. බලමද පුරුෂමද සඳහා නොවේ. අලංකාරය පිණිස නොවේ. යම්තාක් මේ ශරීරයාගේ පැවැත්ම පිණිස යැපීම් පිණිස බඩ සාදුක හරණ පිණිස බඹසර රක්නා පිණිසවෙයි. මෙසේ පරණ දුක් වේදනාව නසන්නෙමි, අළුත් දුක් වේදනාව නූපදවන්නෙමි. මාගේ සතරඉරියව්වෙහි පැවැත්මද නිවරද බැව්ද යෙහෙන් විසීමද වන්නේයයි සලකා වළඳයි. ඇගේ බෙහෙත් 'ගෑම වණය වසා බැඳීම පුත්‍ර මාංශොපමාව කල්පනා කරන්නේ ඇතුළත භොජනයෙහි පමණ දැනීමේ කෙළවරෙහි හැසිරෙයි, සීමාව නොබිඳියි, මේ භොජනයෙහි පමණ දැනීමේ කෙළවරයි. නිදි දුරු කිරීමේ කෙළවර කවරේද? මෙහි මහණ දවස සක්මනින්ද වැඩ හිඳීමෙන්ද ආවරණය කරණ (නීවරණ) ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරයි. රාත්‍රි මධ්‍යම යාමය පයින් පය ලංව තබා සිහි ඇත්තේ මනානුවණැත්තේ නැගිටිමේ සංඥාව සිතෙහි කොට දකුණු පසින් සීහ සෙයයාව කරයි. රාත්‍රියෙහි අන්තිම යාමයෙහි නැගිට සක්මනින්ද වැඩහිඳීමෙන්ද ආවරණය කරණ ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරයි. සොඳුරුවූ එකම රැයක විසීම සිතමින් ඇතුළත නිදි දුරු කිරීමේ කෙළවරෙහි හැසිරෙයි සීමාව නොබිඳියි මේ නිදි දුරු කිරීමේ කෙළවරයි. ඩැහැලේ බොන මැස්සන්ද සෙසු මැස්සන් හා පර්පයන් පිළිබඳවූද යන්නෙහි 'ඩැහැලේ බොන මැස්සෝ" යනු "ඇට මැස්සෝ වෙති. සෙසු මැස්සෝ නම් සියලුම මැසි සමූහයයි. කුමන කරුණකින් "මත්තෙහි වහන මැස්සන්යයි සියලුම මැස්සන්ට කියත්ද. ඔවුහු ඉගිලි ඉගිලී නැවත අවුත් කති. ඒකාරණයෙන් මත්තෙහි වහන මැස්සන්යයි කියති. "සිරිංසප" යනු සර්පයන්ට කියයි යනුයි. 'මිනිසුන්ගේ ස්පර්ශ පිළිබඳවූද තිරිසනුන් පිළිබඳ වූද යන්නෙහි මනුෂ්‍ය ස්පර්ශය නම් කරණලද කර්මය හෝ නොකරණ ලද කර්මය ඇති සොරු හෝ සෙසු මිනිස්සු වෙති, ඔවුහු භික්ෂුවගෙන් ප්‍රශ්න හෝ විචාරන්නාහුය, වාදයට හෝ එන්නාහුය, බණින්නාහුය, නින්දාබස් කියන්නාහුය,

කොප වෙන්නාහුය, හිංසා කරන්නාහුය, නසන්නාහුය, යම් ඒ මිනිසුන්ගේ හැපීමක් හෝ නැසීමක් වේද ඒ මනුෂ්‍ය ස්පර්ශයයි.

4 "තිරිසනුන් පිළිබඳවූද" යනු සිංහයෝ ව්‍යාඝ්‍රයෝ දිවියෝ වලස්සු කළුහිස් වලස්සු වෘකයෝ මීම්මු ඇත්තු යන මොවුහුයි. ඔවුහු මිනිසුන් මඩින්නාහුය, කන්නාහුය, පෙළෙන්නාහුය, හිංසා කරන්නාහුය, හැපෙන්නාහුය, නසන්නාහුය. තිරිසනුන්ගෙන් ඇතිවන කරදරය නම් කිසි යම් සිවුපාහයයි.

## 16 - 11

1 "පරධාර්මිකයන් පිළිබඳවූද ඔවුන්ගේ භය භෙරවයන්ගෙන් තැති නොගන්නේය" යන්නෙහි සප්ත සහ ධාර්මිකයන් හැර යම්කිසි බුද්ධ, ධම්ම, සංඝ යන රත්නත්‍රයයෙහි අප්‍රසන්නවූවෝ පරධාර්මිකයෝය කියත්. ඔවුහු භික්ෂූවගෙන් ප්‍රශ්න හෝ විචාරන්නාහුය. වාදයට හෝ එන්නාහුය. බණින්නාහුය. නින්දා කරන්නාහුය. කිපෙන්නාහුය, හිංසා කරන්නාහුය, පීඩා කරන්නාහුය, හිරිහැර කරන්නාහුය, නසන්නාහුය. ඔවුන්ගේ භය හා භය ජනක දේ දැක අසා කම්පා නොවන්නේය. තැති නොගන්නේය. බිය නොවන්නේය. බිය නුවූවෙක් වන්නේය. ලොමු ඩැහැ ඉවත්කළ භයගන්නෙක් නොවන්නේය, ඉවත දුවන්නෙක් නොවන්නේය, භෙරවයන් ඇත්තෙක් වන්නේය. පහකළ ලොමු ඩැහැගැනීම් ඇත්තෙක් වන්නේය යනුයි.

2 "තවද අන්‍යවූ මැඩිය යුතු උවදුරු මොනවට මැඩ පවත්වන්නේය" යනු තවද අන්‍යවූද මැඩපැවැත්විය යුතු යටපත් කටයුතු ඔබාතැබිය යුතු යනුයි. "උවදුරු" යනු දෙකොටසකි. ප්‍රකට උවදුරුද අප්‍රකට උවදුරුද යනුයි (14-7) 8 (9) ඡේදය යොදාගත යුතුයි) මෙසේද එහි යෙදේනුයි උවදුරු නමි.

3 "කුසල් දහම් සොයන්නේ" යනු සම්‍යක් ප්‍රතිපදාව අනුලොම ප්‍රතිපදාව, අවිරුද්ධ ප්‍රතිපදාව අනවර්ථ ප්‍රතිපදාව, ධර්මානු ධර්ම ප්‍රතිපදාව ආර්‍යයී අෂ්ටාංගික මාර්ගය,

නිර්වාණය, නිර්වාණගාමිණී ප්‍රතිපදාවද සොයන්නහු විසින් උවදුරු මැඩ පැවැත්විය යුතුය. යටපත් කළ යුතුය. ඔබා තැබිය යුතුය. යනුයි.

## 16 - 12

1 "රෝග ඇතිවීමෙන්ද බඩගින්නෙන්ද යුක්තවූයේ යන්නෙහි 'රෝග ඇතිවීම' යනු රෝගයන්ගෙන් යුක්තවූයේ වන්නේ යනුයි. ඇස් රෝගයෙන් යුක්තවූයේ වන්නේය. කන් රෝගයෙන් යුක්තවූවෙක් වන්නේය. නාසිකා රෝගයෙන් යුක්තවූවෙක් වන්නේය. දිවේ රෝගයෙන් යුක්තවූවෙක් වන්නේය. කාය රෝගයෙන් (14-6) 8 හිසේ රෝගය යනු රෝගයෙන් යනු යොදා "යන මේ රෝග" යන තැනට යොදාගත යුතුයි) ඇටමැස්සෝය, වාතය අව්වය දීර්ඝ ජාතීහුය යන මොවුන්ගේ ස්පර්ශයෙන් යුක්තවූවෙක් වන්නේය යනුයි. 'ක්ෂුධාව' යනු බඩගින්නට කියයි. බඩගින්නෙන් යුක්තවූයේ වන්නේය යනුයි.

2 "ශීතයද අධික උෂ්ණයද ඉවසන්නේය" යනු ශීත යනු කරුණු දෙකකින් ශීතය වෙයි. ඇතුළත ධාතු කෝප වශයෙන් ශීතය වෙයි. පිටත ඍතු වශයෙන් හෝ ශිතය වෙයි. උෂ්ණ යනු කරුණු දෙකකින් උෂ්ණය වෙයි. අභ්‍යන්තර ධාතු කොප වශයෙන් හෝ උෂ්ණය වෙයි. පිටත ඍතු වශයෙන් හෝ උෂ්ණය ඇතිවෙයි යනුයි. ඉවසන්නේය, ඉවසීම ඇත්තෙක් වන්නේය. ශීතය, උෂ්ණය, බඩගින්න, පිපාසය ඩැහැලේ බොන මැස්සෝය, මදුරුවෝය, වාතය අව්වය දීර්ඝ ජාතීන්ය යන මොවුන්ගේ ස්පර්ශයෙන්ද නපුරු සේ කියන ලද නපුරුසේ පැමිණෙන ලද වචනයන්ගෙන් උපන් ශාරීරික වේදනාවන්ගේද දුක්ඛ වේදනාවන්ගේද දැඩිවූ රළුවූ කටුකවූ අයහපත්වූද පණනසන්නවුන්ගේද වචන ඉවසන්නෙක් වන්නේය යනුයි.

3 'ඒ මහණතෙම ඒ රෝග ස්පර්ශාදියෙන් බොහෝසේ මඩනාලද්දේ අභිසංස්කාර විඥානාදියට ඉඩක් ඇති නොකරයි.

නොහොත් කාය දුශ්චරිතයට වාග් දුශ්චරිතයට මනස් දුශ්චරිතයට ඉඩක් ඇති නොකරයි යනුයි. "වීර්‍ය්‍ය පරාක්‍රමය දැඩි කරන්නේය" යන්නෙහි යම් චෛතසික වීර්‍ය්‍යාරම්භයක් ඇද්ද එය වීර්‍ය්‍ය පරාක්‍රමයයි. ඉදිරි ගමන, දැඩි උත්සාහය, බලවත් වෑයම, උත්සාහය, පසුනොබැසීම, ධෛර්‍ය්‍ය, ස්ථිරත්වය, ලිහිල් නොවූ උත්සාහය බහානොතැබූ කැමැත්ත, ධෛර්‍ය්‍ය මනාකොට ගැනීම, වීර්‍ය්‍ය, වීර්යෙන්ද්‍රිය, වීර්‍ය්‍ය බලය, සම්‍යක් ව්‍යායාමය, වීර්‍ය්‍ය පරාක්‍රමය, දැඩි කරන්නේය යනුයි

## 16 - 13

1 "සොරකම් නොකරන්නේය. බොරු නොකියන්නේය" යන්නෙහි සොරකම් නොකරන්නේය යනු මෙහි මහණතෙම වස්තුහිමියා නොදුන් දෙය නොගෙන සොරකම් කිරීමෙන් වෙන්වූවෙක් වන්නේය දුන් දෙය ගන්නේ දුන් දෙය කැමතිවන්නේ නොසොරකමින් ප්‍රකට ගතියෙන් තමා වසන්නේය යනු සොරකම් නොකරන්නේය යනුයි

බොරු නොකියන්නේය යනු මෙහි මහණතෙම බොරු කීම අත්හැර බොරු කීමෙන් වෙන්වූවෙක් වන්නේය. සත්‍යය කියන්නේ සත්‍යය ගලපන්නේ නොවැසුන වචන කියන්නේ ඇදහියයුතු වචන කියන්නේ ලොකයා නොරවටන්නේ යනුයි.

2 "තෘෂ්ණාව ඇති පෘථග්ජනයන්ද ස්ථිර ගති ඇති රහතුන්ද යන සකල සත්වයන් මෛත්‍රියෙන් පතුරුවන්නේය" යන්නෙහි මෛත්‍රිය නම් සත්වයන් කෙරෙහි යම් සම සිතක් වේද මෛත්‍රී ගතියක් වේද මෛත්‍රී බවක් වේද දයාවක් වේද හිතෛෂී බවක් වේද අනුකම්පාවක් වේද ව්‍යාපාද රහිත බවක් වේද කෝප නැති බවක් වේද, කුශල මූලයක් වේද එයයි. යම් කෙනෙකුන්ගේ තැතිගන්නා තෘෂ්ණාව ප්‍රහීණ නුවූවාද යමෙකුගේ බිය හා බියට හේතු ප්‍රහීණ නොවූයේද (එවිට) කුමන කරුණකින් තැතිගැනීමයයි කියද්ද, ඔවුහු ත්‍රස්ත වෙත්. විශෙෂයෙන්

ත්‍රස්තවෙත්, බිය වෙත්, තැතිගැන්මට පැමිණෙත්. ඒ කාරණයෙන් ත්‍රස්තවීම යයි කියත්. 'ස්ථිර' යනු යමෙකුන්ගේ ත්‍රස්තවන්නාවූ තෘෂ්ණාව ප්‍රහීණද, යම් කෙනෙකුන්ගේ බිය හා බියට කරුණු ප්‍රහීණද (එවිට) කුමණ කරුණකින් අස්ථිරද, ඔවුහු ත්‍රස්ත නොවෙත්. නොසැලෙත්. බිය නොවෙත්. සන්ත්‍රාසයට නොපැමිණෙත්.

3 "තෘෂ්ණාව ඇති පෘථග්ජනයන්ද ස්ථිර ගති ඇති රහතුන්ද යන සකල සත්වයන් මෛත්‍රියෙන් පතුරුවන්නේය" යනු පෘථග්ජනයන් කෙරෙහිද රහතුන් කෙරෙහිද මෛත්‍රිය පතුරුවන්නේය. මෛත්‍රී සහගත සිතින් විශාලවූ මහත්වූ අප්‍රමාණවූ වෛර නැති කෝප නැති ගතියෙන් පතුරුවා වාසය කරන්නේය.

4 "යම් කලෙක්හි සිතේ කැළඹුන බවක් දන්නේ නම්" යන්නෙහි 'යම්කලෙක' යනු යම් කලෙක යනුමය. 'සිතේ' යනු මනය, මනසය, හෘදය, පණ්ඩරය, මනායතනය, විඥ්ඥානය, විඥානස්කන්ධය තජ්ජාය මනො විඥ්ඥාණ ධාතුය යන මේ නම් ඇති සිතයි. කාය දුශ්චරිතයෙන් සිත අවුල් වෙයි. සැලෙයි, ගැටෙයි, භ්‍රාන්තවෙයි, ශාන්ත නොවෙයි. වචී දුශ්චරිතයෙන්, මනො දුශ්චරිතයෙන් රාගයෙන්, ද්වෙෂයෙන්, මොහයෙන් ක්‍රොධයෙන් බද්ධ වෛරයෙන්, ගුණමකුකමින්, ගුණවතුන් හා තමා සමකොට සිතීමෙන් ඊෂ්‍යාවෙන් මසුරුකමින්, රැවටිල්ලෙන්, කෛරාටික කමින්, තද ගතියෙන්, එකට එක කිරීමෙන් මානයෙන් අතිමානයෙන්, මදයෙන් ප්‍රමාදයෙන්, සියලු ක්ලේශයන් ගෙන්, සියලු දුශ්චරිතයන්ගෙන්, සියලු පිපාසා වලින්, සියලු දැවිලි වලින්, සියලු තැවිලි වලින්, සියලු අකුශල රැස්කිරීම් වලින් සිත කැළඹුනේ වෙයි. අවුල් වෙයි. සැලෙයි. ගැටෙයි. ශාන්ත නොවෙයි. යම් කලෙක්හි චිත්තයාගේ කැළඹුන බවක් දන්නේ නම් යනු සිතේ කැළඹීම් බව දන්නේය. මනාකොට දන්නේය. අවබොධ කරන්නේය යනුයි.

5 "මාරයාගේ පක්ෂයයයි දැන දුරුකරන්නේය යන්නෙහි 'කණ්හ' නම් යම් ඒ මාරයායි. කණ්හ අධිපති, අන්තගු නමුචී පමත්තබන්ධු යන නම් ඇති මාරයායි. කණ්හයාගේ පක්ෂයම ර පක්ෂය, මාරපාසය, මාරබිලිය, අකුශල පක්ෂය මාරාමිෂය, මාර විෂය, මාර නිවාසය, මාරගොචරය, මාර බන්ධනය දුරුකරන්නේය, සන්සිඳුවන්නේය. නූපදනා බවට පමුණුවන්නේය. මෙසේද මාරයාගේ පක්ෂය දුරු කරන්නේය. යලිදු හෝ කණ්හයාගේ පක්ෂය මාරපක්ෂය අකුශල පක්ෂය දුක දෙන්නාවූ, දුක් විපාක දෙන්නාවූ නිරයට යාමට හේතුවූ තිරිසන් යෝනියට යාමට හේතුවූ ප්‍රෙත විෂයටයාමට හේතුවූවකැයි දුරුකරන්නේය යනුයි.

## 16 - 14

1 'ක්‍රොධය හා අතිමානයාගේ වසඟයට නොයන්නේය" යන්නෙහි ක්‍රොධය නම්, යම් චිත්තයාගේ ක්‍රොධයක් ඇද්ද, වෛරයක් ඇද්ද ( (10-3) 1 ඡේදය යෙදිය යුතුයි.) චණ්ඩ ගතියක් ඇද්ද කඳුලු වැගිරීමක් ඇද්ද, සිතේ නොසතුටක් ඇද්ද එයයි අතිමානය නම් මෙහි ඇතැම් පුද්ගලයෙක් ජාතියෙන් හෝ ගෝත්‍රයෙන් හෝ කුලයෙන් හෝ ශරීර පැහැයෙන් හෝ ධනයෙන් හෝ ( (3-2) 5 (ii) යොදාගත යුතුයි) වෙනින් අනික් කරුණකින් හෝ අන්‍යයාට අවමන් කෙරේද, යනුයි "ක්‍රොධය හා අතිමානයාගේද වසඟයට නොයන්නේය" යනු ක්‍රොධය හා අතිමානයාගේ වසඟයට නොයන්නේය. ක්‍රොධය හා අතිමානය දුරලන්නේය. සන්සිඳුවන්නේය. නූපදනා බවට පමුණුවන්නේය, යනුයි.

2 "ඒවායේ මුලද උදුරා සිටින්නේය" යන්නෙහි ක්‍රොධයාගේ මුල කවරේද? නොදැනීම මුලය, නුනුවණින් මෙනෙහි කිරීම මුලය, උසස්මි' යි මානය මුලය, පවට ලජ්ජා නැතිකම මුලය, පවට බිය නැතිකම මුලය, සිතේ නොසන්සුන්කම මුලය, මේ අතිමානයාගේ මුලයි. "ඒවායේ මුලද උදුරා සිටිනේය යනු

ක්‍රොධයාගේද මානයාගේද මුල සාරා, උදුරා, උපුටා, දුරුකොට බැහැරකොට සන්සිඳුවා නූපදනා බවට පමුණුවා සිටින්නේය, යනුයි.

3 "නැවත ප්‍රිය වස්තුව හෝ අප්‍රිය වස්තුව හෝ මැඩ පවත්වන්නේ ඒකාන්තයෙන් මැඩ පවත්වන්නේය." යන්නෙහි නැවත යනු පද සන්ධියයි පද ගැලපීමයි. පද පිරවීමයි. පදයන්ගේ සිළුටු බවයි. පදයන්ගේ පිළිවෙල දැක්වීමයි. මේ "නැවත" යන්නයි. "ප්‍රියයෝ" යනු ප්‍රිය වස්තු දෙකොටසකි. සත්වයෝ හෝ සංස්කාරයෝ යනුයි. ප්‍රියවූ සත්වයෝ කවරහුද? ඔහුගේ යම්බඳු වැඩ කැමති, හිත කැමති පහසුව කැමති, නිදහස කැමති, මව හෝ පියා හෝ සහෝදරයා හෝ සහෝදරිය හෝ පුතා හෝ දුව හෝ මිත්‍රයෝ හෝ අමාත්‍යයෝ හෝ නෑයෝ හෝ සහලේ නෑයෝ හෝ යන ඔවුහු වෙද්ද, මේ සත්වයෝ ප්‍රියයෝ වෙති ප්‍රියවූ සංස්කාරයෝ කවරහුද, ප්‍රිය උපදවන රූපයෝද ශබ්දයෝද ගන්ධයෝද රශයෝද, ස්පර්ශයෝද යන මොවුහු වෙති. මේ ප්‍රියවූ සංස්කාරයෝයී "අප්‍රියයෝ" යන්නෙහි අප්‍රියයෝ දෙකොටසක් වෙති. සත්වයෝ හෝ සංස්කාරයෝ හෝ යනුයි. අප්‍රිය සත්වයෝ කවරහුද, මෙහි ඔහුගේ යම් අවැඩ කැමති, අහිත කැමති, අපහසුව කැමති, නිදහස නොකැමැති, ජීවිතය නැති කරණු කැමති ඔවුහු වෙත්ද මේ සත්වයෝ අප්‍රියයෝයි. අප්‍රිය සංස්කාරයෝ කවරහුද? අප්‍රිය රූපයෝ, ශබ්දයෝ ගන්ධයෝ රශයෝ ස්පර්ශයෝද වෙති. මේ අප්‍රිය සංස්කාරයෝයි. "ඒකාන්තයෙන්" යනු ඒකාන්ත වචනයයි. නිසැක යයි අදහස් දෙකක් නැති වචනයයි. නෛයඹානික වචන යයි. වෙනස් නොවන වචනයයි. මේ ඒකාන්තයෙන් යන්නයි. "නැවත ප්‍රිය වස්තුව හෝ අප්‍රිය වස්තුව හෝ මැඩ පවත්වන්නේ ඒකාන්තයෙන් මැඩ පවත් වන්නේය යනු ප්‍රිය අප්‍රියවූ මිහිරි අමිහිරිවූ සුවදුක්වූ සොම්නස් දොම්නස්වූ ඉෂ්ටානිෂ්ටවූ දෙය මඩින්නේ මඩින්නේය යටපත් කරන්නේ යටපත් කරන්නේය, යනුයි.

## 16 - 15

1 "කල්‍යාණ ප්‍රීතියෙන් යුක්තවූ මහණතෙම ප්‍රඥාව පෙරටුකොට" යනු යම් ප්‍රඥාවක් පජානන නම්වේද, විචය නම් වේද, පවිචය නම්වේද, ධම්මවිචය නම්වේද, අමොහය සම්මා දිට්ඨි නම් වේද එයයි ප්‍රඥාව පෙරටුකොට යනු මෙහි ඇතැම් පුද්ගලයෙක් ප්‍රඥාව පෙරටුකොට හැසිරේද, ප්‍රඥාව ධජයක් කොට ඇත්තේ ප්‍රඥාව කොඩියක් කොට ඇත්තේ ප්‍රඥාව අධිපති කොට ඇත්තේ, පරීක්ෂණය බහුලකොට ඇත්තේ. සොයා බැලීම බහුලකොට ඇත්තේ, මනාකොට සොයා බැලීම බහුල කොට ඇත්තේ, ප්‍රකටව දැනගැනීමෙහි හැසිරෙන්නේ එය චරිත කොට ඇත්තේ එය බහුලකොට ඇත්තේ එය ගරුකොට ඇත්තේ ඒ දෙසට පහත්වූයේ එයට නැමුනේ ඒ දෙසට බරවූයේ එහි ඇළුනේ එය අධිපතිකොට ඇත්තේනුයි, මෙසේද ප්‍රඥාව පෙරටුකොට යනුයි. යලිදු හෝ ඉදිරියට යාමෙහිද ආපසු ඒ මෙහිද මනා සිහි ඇත්තේ වෙයි. කෑමෙහිද, බීමෙහිද, කඩා කෑමෙහිද රශ විඳීමෙහිද මනා සිහි ඇත්තේ වෙයි. මලමූත්‍ර කිරීමෙහි මනා සිහි ඇත්තේ වෙයි. ගමනෙහිද, සිටීමෙහිද, හිඳීමෙහිද, නිදාගැන්මෙහිද නිදි දුරු කිරීමෙහිද, කීමෙහිද නිශ්ශබ්ද වීමෙහිද, මනා සිහි ඇත්තේ වෙයි. මෙසේද ප්‍රඥාව පෙරටුකොට යනුයි. "කල්‍යාණ ප්‍රීතිය යනු බුදුන් සිහි කිරීමෙන් ප්‍රීතියක් ප්‍රමොද්‍යයක් උපදීද, ධර්මය සිහි කිරීමෙන් සංඝයා සිහි කිරීමෙන්, ශීලය සිහි කිරීමෙන්, ත්‍යාගය සිහි කිරීමෙන්, දෙවතාවන් සිහි කිරීමෙන්, වේදනාවන් සිහි කිරීමෙන්, අනාපානය (ආශ්වාස ප්‍රශ්වාස) සිහි කිරීමෙන්, මරණය සිහි කිරීමෙන්, කාය ගතාසති උපසමානුස්සති වශයෙන් ප්‍රීති ප්‍රමොද්‍යය උපදියි. එය කල්‍යාණ ප්‍රීතියයි.

2 "ඒ උවදුරු දුරු කරන්නේය" යන්නෙහි උවදුරු යනු උවදුරු දෙකොටසකි. ප්‍රකට උවදුරුද අප්‍රකට උවදුරුද යනුයි. ( (14-7) (8-9) ඡෙද යොදාගත යුතුයි) මෙසේ එහි යෙදේනුයි උවදුරු නම්. "ඒ උවදුරු දුරු කරන්නේය" යනු ඒ උවදුරු දුරු කරන්නේය, මැඩපවත්වන්නේය, යටපත් වන්නෙය යනුයි.

3 "සුදුසු සේනාසනයෙහි නොඇල්ම දුරු කරන්නේය. යන්නෙහි "නොඇල්ම" නම් යම් නොඇල්මක් ඇද්ද, නොසතුටක් ඇද්ද, කළකිරීමක් ඇද්ද, ත්‍රස්තවීමක් ඇද්ද, යනුයි. සුදුසු සේනාසනයන්හි යනු සුදුසු සේනාසනයන්හි හෝ වෙනින් අනික් ධර්මයන්හි හෝ නොඇල්ම දුරු කරන්නේය. මැඩ පවත්වන්නේය. යටපත් කරන්නේය. මඩින්නේය යනුයි.

4 "සතර වැදෑරුම් වලප්නා ධර්ම දුරු කරන්නේය" යනු සතර වැදෑරුම් වලප්නා ධර්ම දුරු කරන්නේන්නේය. මැඩ පවත්වන්නේය, යටපත් කරන්නේය, යනුයි.

## 16 - 16

1 "කුමක් නම් අනුභව කරන්නෙම්ද කොතැන්හි හෝ බුදින්නෙම්ද" යන්නෙහි කුමක් අනුභව කරන්නෙම්ද යනු කුමක් බුදින්නෙම්ද බතක් හෝ පිට්ටුවක් හෝ රොටියක් හෝ මාලුවක් හෝ මසක් හෝ යන කුමක් අනුභව කරන්නෙම්ද, කොතැන්හි හෝ බුදින්නෙම්ද යනු ක්ෂත්‍රිය කුලයෙහි හෝ බ්‍රාහ්මණ කුලයෙහි හෝ වෛශ්‍ය කුලයෙහි හෝ ශුද්‍රකුලයෙහි හෝ යනුයි

2 "දුකසේ සයනය කළෙමි. අද කෙසේ සයනය කෙරෙම්ද" යන මේ රැය පෝරුවෙහි හෝ පැදුරෙහි හෝ සම් කඩෙහි හෝ තණ ඇතිරියෙහි හෝ කොළ ඇතිරියෙහි හෝ පිදුරු ඇතිරියෙහි හෝ සයනය කළෙමි. එන රැය කොතැන සුවසේ සයනය කරන්නෙම්ද ඇඳෙහි හෝ පුටුවෙහි හෝ බිස්සෙක හෝ, කොට්ට ඇතුරු යහනක හෝ විහාරයෙහි හෝ ගුරුළු පියාපත් වැනි වහල ඇති ගෙයක හෝ ප්‍රාසාදයක හෝ ඉතා උස ප්‍රාසාදයක හෝ ගුහාවක හෝ යනුයි. "වලප්නා ස්වභාව ඇති මේ විතර්කයන්" යන්නෙහි "මේ විතර්කයන්" යනු පිණ්ඩපාතය පිළිබඳ මේ විතර්ක දෙකද සේනාසනය පිළිබඳ විතර්ක දෙකද යනුයි වලප්නා ස්වභාව ඇති යනු හැඬීමේ ස්වභාවය ඇති, වැළපීමේ ස්වභාවය ඇති, යනුයි.

3 "අපලිබොධ (උවදුරු නැතිව) හැසිරෙන ශෛක්ෂ තෙමේ හික්මෙන්නේය." යන්නෙහි "ශෛක්ෂ" නම් කවර කරුණකින් ශෛක්ෂයයි කියද්ද, හික්මේනුයි ශෛක්ෂ නමි. කුමක් හික්මේද? අධිශීලයෙහිද හික්මෙයි. අධි චිත්තයෙහිද හික්මෙයි. අධි ප්‍රඥාවෙහිද හික්මෙයි. අධිශීල ශික්ෂාව කවරේද, ( (2-4) 1 (ii) 2, අධිපඤ්ඤා ශික්ෂාවයි යන තැනට යොදාගත යුතුයි.) මේ අධිප්‍රඥා ශික්ෂාවයි. මේ ශික්ෂා තුන සිහිකොට බලා හික්මේද, දැනගන්නේ බලන්නේ නුවණින් සිහි කරන්නේ සිත අධිෂ්ඨාන කරන්නේ හික්මේද, ශ්‍රද්ධාව මුදන්නේ හික්මේද, වීයර්‍ය දැඩිව ගන්නේ, සිත පිහිටුවන්නේ සිත හික්මවන්නේ නුවණින් දැනගන්නේ හික්මේද, දැනගත යුත්ත, දැනගන්නේ හික්මේද විශෙෂයෙන් දැනගත යුත්ත දැනගන්නේ හික්මේද දුරු කටයුත්ත දුරු කරන්නේ හික්මේද, වැඩිය යුත්ත වඩන්නේ ප්‍රත්‍යක්ෂ කළයුත්ත ප්‍රත්‍යක්ෂ කරන්නේ, හික්මේද හැසිරේද මනාකොට හැසිරේද සමාදන්ව හික්මේද, ඒ කාරණයෙන් " ශෛක්ෂ" යයි කියයි. ශෛක්ෂතෙම හික්මීම පිණිස, දුරු කිරීම පිණිස, ප්‍රහාණය පිණිස, සන්සිඳීම පිණිස, අධිශීලයෙහිද හික්මෙන්නේය අධි චිත්තයෙහිද හික්මෙන්නේය. අධි ප්‍රඥාවෙහිද හික්මෙන්නේය. මේ ශික්ෂා තුන සිහි කරන්නේ හික්මෙන්නේය. දැනගන්නේ හික්මෙන්නේය. දුරු කටයුත්ත දුරු කරන්නේ වැඩිය යුත්ත වඩන්නේ ප්‍රත්‍යක්ෂ කළ යුත්ත ප්‍රත්‍යක්ෂ කරන්නේ හික්මෙන්නේය හැසිරෙන්නේය. මනාකොට හැසිරෙන්නේය. සමාදන්ව සිටින්නේය, යනුයි. "අපලිබොධචාරී" යනු කෙසේ පලිබොධ චාරීවේද, මෙහි ඇතැම් පුද්ගලයෙක් කුල පලිබොධයෙන් යුක්තවේද, ගණපලිබොධ ආවාස පලිබොධයෙන්, චීවර පලිබොධයෙන් පිණ්ඩපාත පලිබොධයෙන්, සෙනාසන පලිබොධයෙන්, ගිලන්පස බෙහෙත් පිරිකර පලිබොධයෙන් යුක්තවූයේ වෙයි. මෙසේ පලිබොධචාරී වෙයි. කෙසේ අපලිබොධචාරී වේද, මෙහි මහණතෙම කුල පලිබොධයෙන් යුක්ත නොවූයේ වේද, ගණ පලිබොධයෙන්, ආවාස පලිබොධයෙන් චීවර පලිබොධයෙන් පිණ්ඩපාත පලිබොධයෙන්

සෙනාසන පලිබොධයෙන් යුක්ත නොවූයේ වේද, ගිලන්පස බෙහෙත් පිරිකර පලිබෝධයෙන් යුක්ත නොවූයේවේද, මෙසේ "අපලිබොධ චාරී" වූයේ වෙයි.

3 "මගධ රටට ගියහ. කොසොල් රටට ගියහ. ඇතැම් කෙනෙක් වැදෑ රටට ගියහ. එක තැන නොඇලී හැසිරෙන මුවන් මෙන් භික්ෂූහු පලිබොධ රහිතව වාසය කරත්" "හැසිරීම යහපත්ය. හොඳ දේ කිරීම යහපත්ය. පලිබොධ නැති හැසිරීම හැමකල්හි යහපත වැඩක් වන දේ විචාරීම, ප්‍රදක්ෂිණාකර්මය යන මේවා කෙලෙස් නැත්තහුගේ ශ්‍රමණ ධර්මයෝ වෙති. ශෛක්ෂතෙම අපලිබොධචාරී වන්නේය, යනුයි.

## 16 - 17

1 "සුදුසු කාලයෙහි ආහාරයද වස්ත්‍ර (සිවුරුද) ලැබ" යන්නෙහි "ආහාර" යනු බත් පිට්ටු රොටි, මාලු, මස් යනුයි "වස්ත්‍ර" යනු සවැදෑරුම් සිවුරුයි. පට්ටාවලින් වියූ කපු නූලෙන් වියූ කසීරට පටනූල් වලින් වියූ, කම්බිලි වස්ත්‍රයෙන් කළ, හණ නූලෙන් වියූ, භංග නමින් යුතු යන සයයි සුදුසු කාලයෙහි ආහාරද වස්ත්‍රද ලැබ යනු සිවුරු ලැබ පිණ්ඩපාතය ලැබ (මෙහි (14-0) 2 ඡේදය යෙදිය යුතුයි)

2 "මෙහි ඒ මහණතෙම සන්තොෂය පිණිස ප්‍රමාණය දන්නේය." යන්නෙහි ප්‍රමාණය දැනීම යනු කරුණු දෙකකින් ප්‍රමාණය දන්නේය, පිළිගැනීමෙන්ද පරිභොග කිරීමෙන්ද යනුයි. පිළිගැනීමෙන් කෙසේ ප්‍රමාණය දනීද, ස්වල්පයක් වුවද දෙන කල්හි කුලා'නුකම්පාවෙන් කුලයන්ට කරුණාවෙන් කුලාරක්ෂාව පිණිස පිළිගනියි. බොහෝ හෝ දෙන කල්හි කයට පරිහරණය කිරීමට ප්‍රමාණවූ සිවුරක් පිළිගනියි. කුස පරිහරණයට ප්‍රමාණවූ පිණ්ඩපාතයක් පිළිගනියි. මෙසේ පිළිගැනීමෙන් ප්‍රමාණය දනියි. කෙසේ පරිභොග කිරීමේ ප්‍රමාණය දනීද? නුවණින් පරීක්ෂාකොට සිවුරු පරිභොග කරයි. ශීත නසන පිණිස උෂ්ණය නසන පිණිස ඩැහැලේ බොන මැසි මදුරු, සුලං අව් දීර්ඝ ජාති

යන මොවුන්ගේ ස්පර්ශයන් නසන පිණිස හැමවේලේම ලජ්ජා ස්ථාන මුවහ කිරීම පිණිසද යනුවෙනි

3 "නුවණින් පරීක්ෂාකොට පිණ්ඩපාතය පරිභොග කරයි. ක්‍රීඩා පිණිස නොවේ. පුරුෂ මද වැඩීම පිණිස නොවේ. සැරසීම පිණිස නොවේ. යම්තාක් මේ ශරීරයාගේ පැවැත්ම පිණිස යැපීම පිණිස බඹසර රක්නා පිණිසද වේ. මෙසේ පරණ දුක් වේදනාව නසන්නෙමි. අලුත් දුක් වේදනාව නූපදවන්නෙමි. මාගේ සතර ඉරියව්හි පැවැත්මද නිවරද බැව්ද යෙහෙන් විසීමද වන්නේයයි සලකා පරිභොග කරයි. නුවණින් පරීක්ෂාකොට සෙනසුන් පරිභොග කරයි. ශීත නසන පිණිස, උෂ්ණය නසන පිණිස, මැසි මදුරු සුළං අව් සර්පාදී යන මොවුන්ගේ ස්පර්ශය නසන පිණිස හැම වේලෙහිම ඍතු භය උපද්‍රව නසන පිණිස සිත එකග කිරීමෙහි ඇලෙන පිණිසද යනුයි. නුවණින් පරීක්ෂාකොට ගිලන්පස බෙහෙත් පිරිකර සේවනය කරයි. හැමවේලෙහිම ශරීරයට පීඩා දෙන දුක් වේදනාවන් නසන පිණිස නිරෝගි බැව් උතුම් බැවින් ගිලන්පස බෙහෙත් පිරිකර වළඳයි යනුයි. මෙසේ පරිභොග කිරීමේ ප්‍රමාණය දනියි.

4 "ඒ භික්ෂුතෙම ප්‍රමාණය දන්නේය" යනු මේ කරුණු දෙකින් ප්‍රමාණය දන්නේය. දැනගන්නේය. අවබොධ කරන්නේය යනුයි.

"මෙහි සන්තොෂය පිණිස යනු මෙහි මහණතෙම කොයියම් හෝ ලැබෙන සිවුරකින් සතුටුවෙයි. කොයියම් හෝ ලැබෙන සිවුරින් සතුටුවීමේ ගුණ කියන්නේදවේ. සිවුරු හේතුවෙන් සුදුසු නොවූ සෙවීමකට නොපැමිණෙයි. සිවුරක් නොලැබද නොසැලෙයි සිවුරක් ලැබද ගිජුනොවූයේ නොගැලුනේ, නොබැසගත්තේ ආදීනව දක්නෙක්වූයේ නික්මීමේ ප්‍රඥාව ඇත්තේ පරිභොග කරයි.

5 ඒ කොයියම් හෝ සිවුරක් ලැබ (ii) සන්තොෂවීමේ හේතුවෙන් තමා උසස් තැන්හි නොතබයි. අනුන්ට අවමන්

නොකරයි. යම් ඒ භික්ෂුවරයෙක් එහි දක්ෂවූයේ අලස නොවූයේ මනා සිහි ඇත්තේවේද, මේ භික්ෂුව පුරාණවූ උසස්යයි දතයුතු ආර්‍ය්‍ය වංශයෙහි සිටියේ වෙයි. (iii) නැවත මහණ තෙම කොයියම් හෝ පිණ්ඩපාතයකින් හෝ සන්තෝෂ වූයේ වෙයි. (මෙහි (ii) යොදාගත යුතුයි.) නැවත මහණ තෙම කොයියම් හෝ සෙනාසනයකින් සන්තොෂවූයේ වෙයි. (මෙහි (ii) යොදාගත යුතුයි) නැවත මහණතෙම කොයියම් හෝ ගිලන්පස බෙහෙත් පිරිකරින් සන්තෝෂවූයේ වෙයි (මෙහි (ii) යොදාගත යුතුයි.)

**6** "ඒ මහණතෙම ඒ ප්‍රත්‍යයන් විෂයෙහි සංවරවූයේ ගමෙහි සංවර ගමන් ඇත්තෙක් වන්නේය" යන්නෙහි හෙතෙම ඒ ප්‍රත්‍යයන් විෂයෙහි සංවරවූයේ" යනු චීවරයෙහි පිණ්ඩපාතයෙහි සෙනාසනයෙහි ගිලන්පස බෙහෙත් පිරිකරෙහි සංවරවූයේ ආරක්ෂාවූයේ මෙසේද හෙතෙම ඒවා කෙරෙහි ආරක්ෂාවූයේ යනුයි "ගමෙහි සංවර ගමන් ඇත්තෙක් වන්නේය යනු යම්පරිද්දෙකින් ගමෙහි හික්මුනේ ආරක්ෂාවූයේ සංවරවූයේ වන්නේය යනුයි.

**7** "තවද (අන්‍යයා විසින්) අවමන් කරණලද්දේ නපුරු වචන නොකියන්නේය." යනු කොපවන ලද්දේ නින්දාකරණ ලද්දේ ගැටෙන ලද්දේ ගර්හා කරණ ලද්දේ උපවාද කරණ ලද්දේ නපුරු රළු වචනයෙන් (ඔවුන්ට) නොකියන්නේය. නොබණින්නේය. ආක්‍රොශ කරන්නහුට ආපසු ආක්‍රොශ නොකරන්නේය. කිපෙන්නහුට ආපසු නොකිපෙන්නේය. භණ්ඩනය කරන්නහුට ආපසු භණ්ඩනය නොකරන්නේය. කලහ කරන්නවුන්ට ආපසු කලහ නොකරන්නේය, භණ්ඩනය නොකරන්නේය. විග්‍රහ නොකරන්නේය. විවාද නොකරන්නේය. ඩබර නොකරන්නේය. කලහ ආරාවුල් විවාද ඩබරයන් අත්හරින්නේය. දුරුකරන්නේය. සන්සිඳුවන්නේය නූපදනාබවට පමුණුවන්නේය. කළහ ඩබර විවාද කොලාහල යන්ගෙන් ඈත්වූවෙක් වන්නේය. වෙන්වූයේ විශෙෂයෙන් වෙන්වූයේ නික්මුනේ බැහැරවූයේ සීමා නොකළ සිතින් වසන්නේය.

## 16 - 18

1 "යට බලා හෙලන ලද ඇස් ඇතියේද නුවමනා ගමන් නැත්තෙක්ද වන්නේය." යන්නෙහි කෙසේ යට බලා හෙලන ලද ඇස් ඇත්තෙක්වේද? මෙහි ඇතැම් භික්ෂුවක් නොයෙක් දේ දකිනු කැමැත්තේ වෙයි. (14-8) 1 (i) ඡේදය යොදාගත යුතුයි) කෙසේ යට බලා නොහෙලන ලද ඇස් ඇත්තෙක් වේද? (නොවෙයි කියා වෙනස්කොට (14-8) 1 (i) (ii) යොදා ගත යුතුයි) 'නුවමනා ගමන් නැත්තෙක් වන්නේද (14-11) 2 ඡේදය යොදාගත යුතුයි)

2 "ධ්‍යානයෙන් යුක්තවූයේද බොහෝකොට නිදි දුරු කරන්නේද" යන්නෙහි ධ්‍යානයෙන් යුක්තවූයේ යනු කරුණු දෙකකින් ධ්‍යානයෙහි යෙදුනේ යනුයි. නූපන් ප්‍රථම ධ්‍යානය ඉපදීමට හෝ යෙදුනේ, නියුක්තවූයේ නූපන් ද්විතීයධ්‍යානය ඉපදීමට හෝ යෙදුනේ තෘතීයධ්‍යානය, චතුර්ථ ධ්‍යානය ඉපදීම පිණිස හෝ යෙදුනේ නියුක්තවූයේ මෙසේද ධ්‍යානයෙහි යෙදුනේ යනුයි. යලිදු හෝ උපන් ප්‍රථමධ්‍යානය නිතර සේවනය කරයි වඩයි බහුල වශයෙන් වඩයි. මෙසේද ධ්‍යානයෙන් යුක්තවූයේ වෙයි උපන් හෝ ද්විතිය ධ්‍යානය, තෘතිය ධ්‍යානය, චතුර්ථධ්‍යානය නිතර සේවනය කරයි, වඩයි. බහුල වශයෙන් වඩයි. මෙසේද ධ්‍යානයෙන් යුක්ත වූයේ වෙයි. "බොහෝකොට නිදි දුරුකරන්නේද යනු මෙහි මහණ දවස සක්මනින් වැඩහිඳීමෙන් (යුක්තව) ආවරණ ධර්මයන් ගෙන් සිත පිරිසිදු කරයි. රාත්‍රී ප්‍රථම යාමය සක්මණින් වැඩහිඳීමෙන් ආවරණ ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරයි. රාත්‍රි මධ්‍යම යාමය පාදයෙන් පාදය එකට තබා සිහි ඇත්තේ මනා නුවණැත්තේ නැගිටීමේ අදහස සිතේ තබා දකුණු පසින් සීහසෙයයාව කරයි. රාත්‍රී අන්තිම යාමය නැගිට සක්මනින් වැඩහිඳීමෙන් ආවරණ ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරයි යනුයි.

3 "උපෙක්ෂාව නිසා එකඟවූ සිත් ඇත්තේ යන්නෙහි "උපෙක්ෂාව" යනු චතුර්ථධ්‍යානයෙහි උපෙක්ෂාවයි. මැදහත්

කමයි. මැදහත්ව බැලීමයි. සිතේ සම ගතිය සිතේ සන්සිඳීමයි. සිතේ මධ්‍යස්ථ ගතියයි. 'එකඟවූ සිත් ඇත්තේ යනු' සිතේ යම් නැවතීමක්වේද, තැන්පත් වීමක්, කලබල නොවීමක්, සමථයක් සමාධින්ද්‍රියක් සමාධි බලයක්, සම්‍යක් සමාධියක් වේද එයයි, " උපෙක්ෂාව නිසා එකඟවූ සිත් ඇත්තේ" යනු චතුර්ථධ්‍යානයෙහි උපෙක්ෂාව නිසා එකඟ සිත් ඇත්තේ, නොවිසුරුන සිත් ඇත්තේ, කලබල නොවූ සිත් ඇත්තේ යනුයි.

4 "විතර්කාදිය හා කාම සංඥාදියද පසු තැවිල්ල සිඳින්නේය" යන්නෙහි "විතර්ක නම්" නව විතර්කයෝයි කාම විතර්කය, ව්‍යාපාද විතර්කය, විහිංසා විතර්කය ඥාති විතර්කය ජන පද විතර්කය, අමර විතර්කය අනුන්ට දයාව දැක්වීම පිළිබඳ විතර්කය ලාභ සත්කාර ස්තුති පිළිබඳ විතර්කය නො කැමැති බව පිළිබඳ විතර්කය යන මේ නව විතර්කයෝ වෙති. කාම විතර්කයන්ගේ කාම සංඥා සිතේ පැවැත්මයි. ව්‍යාපාද විතර්කයන්ගේ ව්‍යාපාද සංඥා සිතේ පැවැත්මයි. විහිංසා විතර්කයන්ගේ විහිංසා සිතේ පැවැත්මයි. යලිදු හෝ තර්කයන්ගේ විතර්කයන්ගේ සංකල්පයන්ගේ අවිද්‍යාව සිතේ පැවැත්ම නුවණින් මෙනෙහි කිරීම සිතේ පැවැත්මයි. උසස්මියි සිතන මානය සිතේ පැවැත්මයි පවට බිය නොවීම සිතේ පැවැත්මයි. නොසන්සුන්කම සිතේ පැවැත්ම යනුයි. "කුකුස" යනු, (10-3) 4 (i) ඡේදය යොදාගත යුතුයි.)

5 "කාම විතර්කාදිය හා කාම සංඥාදියද කුක්කුච්චයද සිඳිනේය" යනු තර්කයද තර්ක සංඥාවද පසු තැවිල්ලද සිඳිනේය කපාදමන්නේය, බැහැර කරන්නේය, දුරු කරන්නේය සංසිඳුවන්නේය, නූපදනා බවට පමුණුවන්නේය යනුයි.

## 16 - 19

1 "වචනයෙන් චෝදනා කරණ ලද්දේ සිහි ඇත්තේ සතුටු වන්නේය" යන්නෙහි චෝදනා කරණ ලද්දේ යනු උපාධ්‍යායවරු හෝ ගුරුවරු හෝ සමාන උපාධ්‍යායවරු හෝ සමාන

ආචාර්‍ය්‍යවරු හෝ මිත්‍රයෝ හෝ දැක කථා කරන්නෝ හෝ ආශ්‍රය කරන්නෝ හෝ චෝදනා කරත්. (කෙසේද) ඇවැත්නි, මෙය යුතු නැත. මෙය ඔබට අයහපත්ය, මෙය තොපට අයොග්‍යය, මෙය ඔබේ ස්වභාවයට සුදුසු නොවේයයි යනුවෙනි. සිහිය උපදවා ඒ චෝදනාවට සතුටු වන්නේය. ප්‍රීති වන්නේය. අනුමෝදන් වන්නේය, කැමති වන්නේය, ප්‍රාර්ථනා කරන්නේය, යනුයි යම්සේ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ බාල වයස් ඇත්තේ තරුණවූයේ සැරසීමෙන් යුක්තවූයේ හිස පටන් නැවේ උපුල් මල් මාලාවක් හෝ ඉද්ද මල් මාලාවක් හෝ යොහොඹු මල්මාලාවක් හෝ ලැබ දෑතින් පිළිගෙන "උත්තමාංග නම්වූ හිසෙහි තබා සතුටු වන්නේය. කැමති වන්නේය බලාපොරොත්තු වන්නේය. මෙසේ සිහිය උපදවා ඒ චෝදනාවට සතුටුවන්නේය කැමති වන්නේය.

2 "අනුකම්පාවෙන් අනුන්ගේ වරද දක්නා සුලුවූ වරදට සුදුසු පරිද්දෙන් දඬුවම් කරවා අවවාද වශයෙන් කියන්නාවූ නොයෙක් රන් රුවනින් පිරුණු මහානිධානයන් තුබූ තැන් කියන්නාක්හු වැනිවූ ඥානවන්තයෙකු සේවනය කටයුතුයි. එබන්දෙකු සේවනය කරන්නාට දෙලොවට වැඩක් මිස අවැඩක් නොවන්නේය" අනුන්ට හිත කැමතිව අවවාද අනුශාසනා කරණ අකුශලයෙන් වළකා කුශලයෙහි පිහිටුවන කලණ මිතුරුතෙම සත්පුරුෂයන්ට ප්‍රියයි අසත් පුරුෂයන්ට අප්‍රියයි" යනුයි.

3 "සබ්‍රහ්මචාරීන් කෙරෙහි තද බව දුරු කරන්නේය. යන්නෙහි සබ්‍රහ්මචාරී යනු එකට සංඝ කර්‍මම කරණ බව එකට ප්‍රාතිමොක්ෂාදිය උදෙසන බව සමානවූ හික්මීම ඇති බව යනුයි. සබ්‍රහ්මචාරීන් කෙරෙහි තදබව දුරුකරන්නේය. යනු සබ්‍රහ්මචාරීන් කෙරෙහි කෝප වශයෙන් හැපුන උලක් මෙන්වූ තද හිත දුරුකරන්නේය. සිත පිළිබඳ උල් පසම දුරු කරන්නේය. රාග නමැති හුල ද්වෙෂ නමැති හුල මොහ නමැති හුල, බිඳින්නේය යනුයි. නුවණින් යුක්ත සිතින් නිපදවනලද තෙපුල් කියන්නේ කාලවේලාවද ශීල වේලාවද ඉක්මවූ වචන

නොකියන්නේය" යනු ඥානයෙන් යුක්ත වචන කියන්නේය. අර්ථයෙන් යුත් ධර්මයෙන් යුත් කාලයට සුදුසු කෙළවරක් ඇති වචන කියන්නේය. වේලා යන කාල වේලාවද ශීල වේලාවද යනුයි කාලවේලාව කවරීද? කාලය ඉක්මවූ වචන කියන්නේය වේලාව ඉක්මවූ වචන නොකියන්නේය. කාලය හා වේලාව ඉක්මවූ වචන නොකියන්නේය කාලයට නොපැමිණි වචන නොකියන්නේය. වේලාවට නොපැමිණි වචන නොකියන්නේය. කාලවේලා දෙකට නොපැමිණි වචන නොකියන්නේය.

4 ඒකාන්තයෙන් යමෙක් තෙම කාලය නොපැමිණි කල්හි කොවුලන් මෙන් අතිවේලාවෙහි යම් යම් දේ කියයිද මෙසේ හෙතෙම තමාගෙන්ම නැසුනේ වෙයි. මේ කාල වේලාවයි. ශීල වේලාව කවරීද? රාගයෙන් යුක්ත වචන නොකියන්නේය, ද්වෙෂයෙන් යුක්ත වචන නොකියන්නේය, මොහයෙන් යුක්ත වචන නොකියන්නේය, බොරු නොකියන්නේය, කේළාම් නොකියන්නේය, නපුරු වචන නොකියන්නේය, හිස් වචන නොකියන්නේය, ප්‍රකාශ නොකරන්නේය, ව්‍යවහාර නොකරන්නේය යනුයි. "ජනයාගේ නින්දා වචන ගැන නොසිතන්නේය" යන්නෙහි ජනයෝ නම් ක්ෂත්‍රියයෝද බ්‍රාහ්මණයෝද වෛශ්‍යයෝද ශුද්‍රයෝද ගෘහස්ථයෝද ප්‍රව්‍රජිතයෝද දෙවියෝද මිනිස්සුද යනුයි. (එවැනි) ජනයාගේ වාදයෙන් නින්දාවෙන් උපවාදයෙන් ගර්හාවෙන් හෝ ශීල විපත්තියෙන් හෝ ආචාර විපත්තියෙන් හෝ දෘෂ්ටි විපත්තියෙන් හෝ ආජීව විපත්තියෙන් හෝ නොසිතන්නේය. චෙතනාවක් ඇති නොකරන්නේය කල්පනාවක් ඇති නොකරන්නේය, මනසිකාරයක් නූපද වන්නේය යනුයි.

## 16 - 20

1 "ඉක්බිති අනිකක් කියමි. ලොකයෙහි රජස් පසක් වෙති" යන්නෙහි "ඉක්බිති" යනු පද ගැලපීමයි. පද එකතු කිරීමයි. පද පිරවීමයි අකුරු සමකිරීමයි. පද කීමේ පහසුවට පිළිවෙළින් ගැලපීමයි මේ ඉක්බිති යනුයි.

"රජස් පසක් යනු රූප රජස, ශබ්ද රජස ගන්ධ රජස රස රජස ස්පර්ශ රජස" යනුයි.

'රාගය රජසකි. (i) එය රේණුයයි නොකියයි රජස යනු රාගයට මේ අනිත් නමකි. නුවණැත්තෝ මෙ රජස දුරු කොට කෙලෙස් රජස් දුරුකළ බුදු රදුන්ගේ ශාසනයෙහි වෙසෙත්. "මොහය රජසකි. (මෙහි (i) මෙති මොහය යනු වෙනසයි) ලොකයෙහි යනු අපාය ලොකයෙහි මනුෂ්‍ය ලොකයෙහි දිව්‍ය ලොකයෙහි ස්කන්ධ ලොකයෙහි ධාතු ලොකයෙහි ආයතන ලොකයෙහි යනුයි

2 "සිහි ඇතිව යම් රූප රාගාදීන්ගේ දුරුකිරීම පිණිස හික්මෙන්නේ නම්" යන්නෙහි යම් කෙනෙකුන්ගේ යනු රූප රාගයාගේ, ශබ්ද රාගයාගේ, ගන්ධ රාගයාගේ, රාස රාගයාගේ, ස්පර්ශ රාගයාගේ යනුයි. සිහි ඇත්තේ යනු යම් සිහියක් නැවත නැවත සිහිකිරීමක් ඇද්ද, අනුව සිහිකිරීමක් ඇද්ද, සිහිකිරීම් බවක් ඇද්ද, දැරීම් බවක් ඇද්ද මතක් කිරීම් බවක් ඇද්ද, සිහිමුලා නොකිරීමක් ඇද්ද සතින්ද්‍රියය, සතිබලය, සම්‍යක් සතිය, සති සම්බොජ්ඣංගය, එකායන මාර්ගය නම් වේද මේ සිහිය යයි කියයි. මේ සිහියෙන් යුක්ත වූයේ, විශෙෂයෙන් යුක්තවූයේ, පැමිණියේ, ඇතිවූයේනුයි. හෙතෙම සිහි ඇත්තේ යයි කියයි. "සිහි ඇතිව යම් රූප රාගාදීන්ගේ දුරුකිරීම පිණිස හික්මෙන්නේය" යනු සිහි ඇති පුද්ගලතෙම යම් රූප රාගයාගේද ශබ්ද රාගයාගේද ගන්ධ රාගයාගේද රශ රාගයාගේද ස්පර්ශ රාගයාගේද හික්මීම පිණිස, දුරුකිරීම පිණිස, සන්සිඳීම පිණිස අධිශීලයද හික්මෙන්නේය. අධිචිත්තයද හික්මෙන්නේය. අධි ප්‍රඥාවද හික්මෙන්නේය. මේ ශික්ෂා තුන සිහිකරන්නේ හික්මෙන්නේය. දැනගන්නේ හික්මෙන්නේය. දුරුකටයුත්ත දුරු කරන්නේ වැඩිය යුත්ත වඩන්නේ ප්‍රත්‍යක්ෂ කළයුත්ත ප්‍රත්‍යක්ෂ කරන්නේ හික්මෙන්නේය, සමාදන්ව සිටින්නේය, යනුයි.

3 "රූපයන්හිද ශබ්දයන්හිද තවද රශයන්හිද ගන්ධයන්හිද ස්පර්ශයන්හිද රාගය මඩින්නේය" යනු රූපයන්හිද ශබ්දයන්හිද ගන්ධයන්හිද රශයන්හිද ස්පර්ශයන්හිද රාගය මඩින්නේය, අභිභවනය කරන්නේය යනුයි

## 16 - 21

1 "මේ ධර්මයන්හි කැමැත්ත දුරුකරන්නේය." යන්නෙහි මේ ධර්මයන්හි යනු රූපයන්හි ශබ්දයන්හි ගන්ධයන්හි රශයන්හි ස්පර්ශයන්හි යනුයි. කැමැත්ත යනු කාමයන්හි යම් කාමයට කැමැත්තක් ඇද්ද, කාම රාගයක් ඇද්ද, කාමයට බැඳීමක් ඇද්ද, කාම තෘෂ්ණාවක් ඇද්ද, කාම ස්නේහයක් ඇද්ද, කාම දැවිල්ලක් ඇද්ද, කාම මූර්ඡාවක් ඇද්ද කාම ගිලගැන්මක් ඇද්ද, කාම සැඩ වතුරක් ඇද්ද, කාම උත්සාහයක් ඇද්ද, කාමය දැඩිව අල්ලා ගැනීමක් ඇද්ද කාමච්ඡන්ද නීවරණයක් ඇද්ද එයයි.

2 "මේ ධර්මයන්හි කැමැත්ත දුරුකරන්නේය" යනු මේ රූපාදී ධර්මයන්හි කැමැත්ත දුරුකරන්නේය, සංසිඳුවන්නේය නූපදනා බවට පමුණුවන්නේය යනුයි. 'සිහි ඇති මොනවට මිදුන සිත් ඇති ඒ භික්ෂුතෙම" යන්නෙහි භික්ෂු යනු පෘථග්ජන කල්‍යාණක හෝ භික්ෂුවයි. ශෛක්ෂ හෝ භික්ෂුවයි. 'සිහි ඇත්තේ' යනු යම් සිහියක් ඇද්ද අනුස්මෘතියක් ඇද්ද සම්‍යක් සතියක් ඇද්ද, සති සම්බොජ්ඣංගයක් ඇද්ද, එකායන මාර්ගයක් ඇද්ද මෙය සිහියයයි කියයි. මේ සිහියෙන් යුක්තවූයේ මනාකොට යුක්තවූයේ හෙතෙම සිහි ඇත්තේයයි කියයි. "සිහි ඇති මොනවට මිදුන සිත් ඇති ඒ භික්ෂුතෙම" යනු ප්‍රථමධ්‍යානයට පැමිණියහුට (මෙහි (7-1) (iv) ඡේදය, විවේකවූයේ වෙයි, යන්නට මිදුනේවෙයි කියා යොදාගත යුතුයි)

3 "සුදුසු කාලයෙහි හෙතෙම මනාකොට සංස්කාර ධර්මය හාත්පසින් විමසන්නේ" යන්නෙහි කාලය නම් විසුරුණ සිත ඇති කල්හි සමාධියට කාලයයි. සිත සමාධි ගත කල්හි විදර්ශනාවට කාලයයි.

"කාලය දැනීමේ දක්ෂ ඒ යෝගීතෙම සුදුසු කාලයෙහි සිත උත්සාහවත් කරයි. නැවත අනික් කාලයෙක්හි නිග්‍රහ කරයි. කලෙක සිත සතුටු කරයි. කලෙක සිත තැන්පත් කරයි. කලෙක මධ්‍යස්ථවෙයි. "යෝගියාගේ සිත උත්සාහවත් කිරීම කවර කාලයකද, නිග්‍රහ කිරීම කවර කාලයකද, සතුටුකිරීම කවර කාලයකද, තැන්පත්කිරීම කවර කාලයකද, කෙසේ දැක්වේද?"

සිත අලසවූ කල්හි උත්සාහවත් කිරීමයි. උඩඟු (විසුරුන) කල්හි නිග්‍රහයයි. ආශ්වාද රහිත සිත එකෙනෙහිම සතුටු කරන්නේය. යම්කලෙක සිත සතුටුවූයේද අලස නුවූයේ වෙයි. නොවිසුරුණේ වෙයි. සිත අධ්‍යාත්මයෙහි රමණය කරන්නේද සමථ නිමිත්තට ඒ කාලයයි.

**4** "මේ උපායෙන් යම් කලෙක එකඟවූයේ වේද, එකඟ වූ සිත දැන එකෙනෙහි මධ්‍යස්ථ වන්නේය. කාලයෙහි දක්ෂ වූ කාලය දන්නාවූ නුවණැත්තේ කලින්කල සිතට නිමිති වෙන්කොට බලන්නේය. "සුදුසු කාලයෙහි හෙතෙම මනා කොට සංස්කාර ධර්මය හාත්පසින් විමසන්නේ" යනු සියලු සංස්කාරයෝ අනිත්‍යයයි, මනාකොට සංස්කාර ධර්මය විමසන්නේ සියලු සංස්කාරයෝ දුක්යයි මනාකොට සංස්කාර ධර්මය විමසන්නේ සියලු ධර්මයෝ අනාත්මයයි මනාකොට සංස්කාර ධර්මය විමසන්නේ යම්කිසි හේතු ප්‍රත්‍යයකින් උපන් ධර්මයක් ඇද්ද ඒ සියල්ල නැතිවීම පිණිස පවත්නේ යයි මනාකොට විමසන්නේ, යනුයි.

**5** "සමාධිමත් වූයේ හෙතෙම අන්ධකාරය නසන්නේ යයි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක යන්නෙහි, සමාධිමත් වූයේ යනු එකඟ සිත් ඇත්තේ නොවිසුරුණ සිත් ඇත්තේ නොකැළඹුන සිත් ඇත්තේ සංසිඳුනේ සමාධින්ද්‍රිය, සමාධි බලය, සම්‍යක් සමාධිය යන මෙයින් යුක්තවූයේනුයි සමාධිමත් නම්.

**6** "හෙතෙම අන්ධකාරය දුරු කරන්නේ" යනු රාගාන්ධකාරය, ද්වෙෂාන්ධ කාරය, මොහාන්ධකාරය, දෘෂ්ටි අන්ධකාරය, මාන අන්ධකාරය, ක්ලෙශාන්ධකාරය,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දුශ්චරිතාන්ධකාරය, අන්ධ කිරීම, ඇස් නැති කිරීම, නොදත් බැව් කිරීම ප්‍රඥාව නැති කිරීම, නැති කිරීමේ පක්ෂය නම්වූ නිර්වාණය නැති කරණ අන්ධකාරය දුරු කරන්නේය. සංසිඳවන්නේය. බැහැර කරන්නේය. නූපදනා බවට පමුණුවන්නේය. යනුයි. "භාග්‍යවත්" යනු ගෞරව නාමයකි. (7-2) (i) භාග්‍යවත් යන්නට ලියූ නිර්දෙශය මෙතනට යොදාගත යුතුයි.)

**නිද්දෙස පාලි නිමි.**